වාර්ෂික වාර්තාව 2019/20

# The Potent Power of a Leader

# නායකයෙකුගේ ප්‍රබල ශක්තිය



PEOPLE'S LEASING
පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்

# නායකයෙකුගේ ප්‍රබල ශක්තිය

බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි නායකයෙක් ලෙස, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. පක්ෂපාතී සහ ඉහළ දක්ෂතා සහිත සේවකයින්, ආයතනිකගත දැනුම් පදනමක සහ විස්තීර්ණ ව්‍යාපාර විචක්ෂණභාවයක සිට උසස් ඩිජිටල්කරණීය සේවය සහිත ව්‍යාපාර අවස්ථාවන් සහ දිවයින පුරා ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන දක්වා දක්ෂතා සහ ගුණාංගයන්ගෙන් පරිපූර්ණව සිය ස්ථානගතවීම තහවුරු කර ඇත. අනෙකුත් වැදගත් සාධක අතර – පීපල්ස් ලීසිං යනු ඉහළ හැකියාව සහ සාර්ථකත්වය සමඟ අභියෝගවලට මුහුණදීමට සහ කළමනාකරණය කර ගැනීමට සමාගමට ඉඩ ලබාදෙන ප්‍රබල ශක්තිය පිළිබඳ සුරක්ෂිතාගාරයකි.

PLC PEOPLE'S LEASING
පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்

# පටුන


## 4

## මෙම වාර්තාව පිළිබඳ

## 5

## පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව

## 67

## කළමනාකාරිත්වය

68 අධ්‍යක්ෂ මණ්ඩලය
72 ආයතනික කළමනාකරණය
75 අනුකූලතා කළමනාකරණය
77 ආයතනික පාලනය
112 සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
118 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව
120 පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව
122 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව
124 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
127 අවදානම් කළමනාකරණය






# 8

## වැදගත් සිදුවීම්

# 9

## පණිවිඩ

සභාපතිතුමාගේ පණිවිඩය 10
ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය 12

# 15

## ව්‍යාපාර ආකෘතිය

ව්‍යාපාර ආකෘතිය 16
මෙහෙයුම් පරිසරය 20
පාර්ශ්වකරුවන් 22
ප්‍රමාණාත්මකභාවය 26
අපගේ ක්‍රමෝපාය 27

# 139

## මූල්‍ය වාර්තා

මූල්‍ය දින දර්ශනය 140
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 141
ස්වාධීන සහතික කිරීමේ වාර්තාව 142
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 143
ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීම් ප්‍රකාශය 144
ස්වාධීන විගණකගේ වාර්තාව 145
මූල්‍ය ප්‍රකාශන - පටුන 148
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 149
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 150
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 151
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 152
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 154
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 155

# 28

## කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මූල්‍ය ප්‍රාග්ධනය 29
නිෂ්පාදිත ප්‍රාග්ධනය 34
බුද්ධිමය ප්‍රාග්ධනය 38
මානව ප්‍රාග්ධනය 41
සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය 46
ස්වභාවික ප්‍රාග්ධනය 60

# 289

## අතිරේක තොරතුරු

ආයෝජක සම්බන්ධතා 290
කාර්තුමය විශ්ලේෂණ 297
දස වසරක සාරාංශය 299
රැස්වීමේ නිවේදනය 301
ආයතනික තොරතුරු 302
ඇමුණුම්
පෙරකලාසි පත්‍රය

# මෙම වාර්තාව පිළිබඳව

## මෙම වාර්තාව විවිධ මාධ්‍යයන්ගෙන් ලබාගත හැකියි



මුද්‍රිත වාර්තාව




http://plc2019-20.annualreports.lk

මෙය අපගේ හත්වැනි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව වේ. අපගේ පාර්ශ්වකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලමින් 2019/20 හි අපගේ කාර්යයන් සහ අපගේ කාර්යසාධනය පිළිබඳ සමබර විස්තරාත්මක දළ විශ්ලේෂණයක් මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරයි.

මෙම වාර්තාව තුළ අපගේ බලපෑම සහ වටිනාකම නිර්මාණය පිළිබඳව තොරතුරු සමන්විත වන අතර, සමාලෝචිත වසර තුළ අපගේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අපගේ පාර්ශ්වකරුවන්ට අදහසක් ලබා දේ. එමෙන්ම අපගේ ව්‍යාපාර ආදර්ශය විස්තර කරන අතර අපගේ ක්‍රමෝපාය, කාර්යසාධනය, පාලනය සහ අනාගත කටයුතු පිළිබඳ සාකච්ඡාවක් එයට ඇතුළත්ය.

## වාර්තාකරණ කාලසීමාව

මෙම වාර්ෂික වාර්තාව තුළින් 2019 අප්‍රේල් 1 දිනෙන් ආරම්භව 2020 මාර්තු 31 දක්වා වූ මූල්‍ය වසර සඳහා සමාගමේ කාර්යසාධනයට අදාළව වැදගත් තොරතුරු ආවරණය කරයි. (අපගේ වඩාත් මෑතකාලීන වාර්තාව 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්තාවය).

## වාර්තාකරණ සීමාව

වෙනස් ආකාරයකින් දක්වා ඇතිනම් මිස ශ්‍රී ලංකා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ("සමාගම" හෝ "පීපල්ස් ලීසිං") හි ව්‍යාපාර මෙහෙයුම් බොහෝදුරට ආවරණය කරයි. මූල්‍ය වාර්තාවලින් පීපල්ස් ලීසිං සහ එහි පරිපාලිත සමාගම් හය ("සමූහය") ආවරණය කරයි.

## නැවත ප්‍රකාශන සහ වෙනස්වීම්

පසුගිය වාර්තාවලින් ලබාදෙන ලද තොරතුරු පිළිබඳ නැවත ප්‍රකාශනයන් සිදු නොකරනු ලබන අතර, පෙර වාර්තාකරණ කාලසීමාවන්ගේ වැදගත් වෙනස්වීම් කිසිවක් විෂයපථය සහ සීමාවන් තුළ වාර්තා නොකෙරේ. කෙසේවෙතත් පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ, ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය වඩාත් යහපත් අයුරින් ඉදිරිපත් කිරීම සහ පවත්නා වසර සමඟ සැසඳීම සඳහා අදාළවන අවස්ථාවේදී සංශෝධනය කෙරේ.

## අනුකූලතාව

මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේදී, පහත සඳහන් සංකල්ප, මූලධර්ම සහ මාර්ගෝපදේශ අපි ලබා ගනිමු.

- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ සභාවේ (IIRC) <IR> වැඩරාමුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා මහ බැංකුව
- කොළඹ කොටස් හුවමාරුව
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs)
- 2007 අංක 07 දරන සමාගම් පනත

## බාහිර සහතික කිරීම

අදාළ සටහන් සහිත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලද අතර ඔහුගේ සහතික කිරීමේ වාර්තාව පිටු අංක 145 සිට 147 දක්වා දක්වේ. විගණකාධිපති විසින් ආයතනික පාලන උපදෙස් සමඟ සමාගමේ අනුකූලතාව සඳහා බාහිර සහතිකයක් නිකුත් කර ඇත. මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය විගණකාධිපති විසින් සමාලෝචනය කර ඇති අතර ඒ සම්බන්ධ ඔහුගේ මතය 142 පිටුවේ දක්වේ.

## විමසීම්

මෙම 2019/20 ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සහ ඉන් ඉදිරිපත්කරන තොරතුරු පිළිබඳ යම් ප්‍රශ්න සහ විමසීම් පහත ලිපිනයට යොමු කළ යුතුය:

**ප්‍රධාන කළමනාකරු – මූල්‍ය**
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී., අංක 1161, මරදාන පාර, කොළඹ 8, ශ්‍රී ලංකාව.
තැපැල් කේතය: 00800
දුරකථනය: +94 11 263 1631

## සංචාලන අයිකන දර්ශකය

**ප්‍රාග්ධනය**

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

**ක්‍රමෝපායික විධි**

- තිරසාර වර්ධනය හඹායාම
- ගනුදෙනුකාර අත්දැකීම වැඩිකිරීම
- ක්‍රියාත්මක කිරීමේ අනර්ඝත්වය අත්කර ගැනීම
- කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය
- වගකීම්සහගත කළමනාකරණය ඇති කිරීම

**පාර්ශ්වකරුවන්**

- ආයෝජකයින්
- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්
- ප්‍රජාව සහ පරිසරය
- රජය සහ නියාමන ආයතන

## ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශන

මෙම වාර්තාව තුළ අපගේ ව්‍යාපාර මෙහෙයුම් සහ අනාගත ක්‍රමෝපාය පිළිබඳ ඉදිරිය දකින ප්‍රකාශන සමන්විත වේ. මූල්‍ය තත්ත්වය, ව්‍යාපාර ක්‍රමෝපාය, කළමනාකරණ සැලසුම් සහ අනාගත මෙහෙයුම් සඳහා පරමාර්ථ ඇතුළුව ඓතිහාසික සාධක පිළිබඳ ප්‍රකාශන හැර සියලුම ප්‍රකාශන මෙයට ඇතුළත්ය.

අපගේ ප්‍රකාශන වර්තමාන දත්ත මත පදනම් වගකීම්සහගත උපකල්පන සහ අපේක්ෂාවන් වන බැවින්, විශේෂයෙන් කොවිඩ්-19 වසංගතය පැතිරීම සහ ගෝලීය සමාජ-ආර්ථික පරිසරය පිළිබඳ ඇතිවන අවිනිශ්චිතතාවය සහිත වර්තමාන තත්ත්වය යටතේ අනාගත ප්‍රතිඵල පිළිබඳ සහතික කිරීමක් ඉන් අපේක්ෂා නොකෙරේ.

නිසි අවධානය සහිතව මෙම තොරතුරු සලකා බලන මෙන් සහ තීරණ ගැනීමේ දී ප්‍රක්ෂේපිත දත්ත පිළිබඳව අනවශ්‍ය විශ්වාසය නොතබන මෙන් පාඨකයින් වෙත උපදෙස් දෙනු ලැබේ. නව තොරතුරු, අනාගත සිදුවීම් හෝ වෙනත් ආකාරයක ප්‍රතිඵලයක් ලෙස ඉදිරිය දකින ප්‍රකාශන යාවත් කිරීමට හෝ සමාලෝචනය කිරීමට අපි අපේක්ෂා නොකරන අතර ම යම් බැඳීමක්ද භාර නොගනිමු.

මෙම වාර්තාව පිළිබඳව
<< පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු


# පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව

අපගේ දැක්ම, මෙහෙවර සහ සාරධර්ම මත ගමන්කරමින්, වගකීම්සහගත මූල්‍ය සේවා සපයන්නෙක් ලෙස, අදාළ නීති පිළිපදිමින්, ව්‍යාපාර මෙහෙයුම්වලට පාරිසරික සමාජ සහ පාලන (ESG) නිර්ණායක ඒකාබද්ධ කරමින් අපි වගකීම්සහගත ණය සහ මූල්‍ය ආරක්ෂණ විසඳුම් පිරිනමන අතර අපගේ නිරීක්ෂිත ක්‍රියාවලි, කැපවූ කාර්ය මණ්ඩලය සහ නවීන තාක්ෂණය තුළින් අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකම නිර්මාණය කරමු.



## අපගේ දැක්ම

ගනුදෙනුකරුවන් සඳහා හිතකාමී, නිර්මාණාත්මක සහ පූර්ණ නව්‍යකරණ විසඳුම් සපයන්නකු ලෙස මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.



## අපගේ මෙහෙවර

තිරසර තරඟකාරී ප්‍රතිලාභ පවත්වා ගනිමින් ආයතනික සේවා විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීම උදෙසා අගය එක් කළ තරඟකාරී සේවා සැපයුමකට කැපවීම.



## සන්නාම ශක්තිය

අප රු. බිලියන 8.79ක සන්නාම අගයක් සහිත ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු නොවන මූල්‍ය ආයතනයකි. (NBFI)




මහජන බැංකුවට හිමිකාරීත්වය

### මව් සමාගම තුළින් හිමිවන දෑ

- විශ්වසනීයත්වය
- ප්‍රාග්ධනය
- ද්‍රවශීලතාව
- ස්ථාවරත්වය

### ශක්තිමත් ණය ශ්‍රේණිගතකරණය

ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් විසින් ලබා දී ඇති [A+] (lka) ඉහළ ණය ශ්‍රේණිගතකරණය සමාගමේ විශ්වසනීයත්වය පිළිබඳ පිළිබිඹුවකි.

### අන් තරගකරුවන් අතරින් අප ආයතනය වෙනස් වන ප්‍රධාන තීරකයන්




### ආයතනික සංස්කෘතිය, සදාචාර සහ සාරධර්ම:



# පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව


මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව >>
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු


## සමූහයේ ව්‍යුහය




| පරිපාලිත සමාගම් | පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | පීපල්ස් මයික්‍රෝ – කොමර්ස් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | ලන්කන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් |
|---|---|---|---|---|---|---|
| හිමිකාරීත්වය | 75% | 100% | 100% | 100% | 100% | 51% |
| ප්‍රධාන කටයුතු | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම | සම්ප්‍රදායික බැංකුකරණයට සහ ක්ෂුද්‍ර ව්‍යවසායන්ට පිවිසීම රහිත පුද්ගලයින්ට බැංකු-නොවන මූල්‍ය සේවා ලබාදීම | ෆ්ලීට් මැනේජ්මන්ට්, රථවාහන තක්සේරුව, රථවාහන අලෙවිය, රක්ෂණය, රථවාහන අලුත්වැඩියාව | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සහ දේපල සංවර්ධන කටයුතු කරගෙනයාම | කාර්යාල සංකීර්ණයක් මෙහෙයවීම | චංචල සහ නිශ්චල දේපල සඳහා කල්බදු ලබාදීම හා ණය ලබාදීම |
| සංස්ථාපිත රට | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | බංග්ලාදේශය |

## පරිපාලිත සමාගම්වල වැදගත් සිදුවීම්

### පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.

2019 දෙසැම්බර් 31

| මූල්‍යමය සිදුවීම් | රු. මිලියන |
|---|---|
| ශුද්ධ ඉපයුම් වාරිකය | 5,262 |
| බදු පෙර ලාභය | 912 |
| බදු පසු ලාභය | 648 |
| මුළු වත්කම් | 9,580 |
| ස්කන්ධය මත ඉපයීම (%) | 18.27 |

### පීපල්ස් මයික්‍රො-කොමර්ස් එල්ටීඩී

2020 මාර්තු 31

| මූල්‍යමය සිදුවීම් | රු. මිලියන |
|---|---|
| පොළී ආදායම | 842 |
| බදු පෙර ලාභය | 49 |
| බදු පසු ලාභය | 25 |
| මුළු වත්කම් | 2,871 |
| ස්කන්ධය මත ඉපයීම (%) | 11.51 |

### පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්

2020 මාර්තු 31

| මූල්‍යමය සිදුවීම් | රු. මිලියන |
|---|---|
| පිරිවැටුම | 238 |
| බදු පෙර ලාභය | 39 |
| බදු පසු ලාභය | 27 |
| මුළු වත්කම් | 449 |
| ස්කන්ධය මත ඉපයීම (%) | 9.13 |

### පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්

2020 මාර්තු 31

| මූල්‍යමය සිදුවීම් | රු. මිලියන |
|---|---|
| මුළු ආදායම | 445 |
| බදු පෙර ලාභය | 313 |
| බදු පසු ලාභය | 243 |
| මුළු වත්කම් | 2,662 |
| ස්කන්ධය මත ඉපයීම (%) | 15.22 |

### පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්

2020 මාර්තු 31

| මූල්‍යමය සිදුවීම් | රු. මිලියන |
|---|---|
| ආදායම | 219 |
| බදු පෙර ලාභය* | 50 |
| බදු පසු ලාභය | 50 |
| මුළු වත්කම් | 2,682 |
| ස්කන්ධය මත ඉපයීම (%) | 4.34 |

### ලන්කන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ්

2020 මාර්තු 31

| මූල්‍යමය සිදුවීම් | රු. මිලියන |
|---|---|
| දළ ආදායම | 498 |
| බදු පෙර ලාභය | 155 |
| බදු පසු ලාභය | 83 |
| මුළු වත්කම් | 4,484 |
| ස්කන්ධය මත ඉපයීම (%) | 3.19 |

*සමාගම BOI බදු නිදහස් කාලසීමාව යටතේ පවතී.

# පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව

## අපගේ ගමන්මග

මේ දක්වා අපගේ ගමන්මග වැදගත් සිදුවීම්වලින් සමන්විතය. 1995 දී ස්ථාපිත කරන ලද පීපල්ස් ලීසිං සමාගම 2012 වසරේදී 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

**1995** – ආරම්භය

**2000/2001** – පොදු සීමිත වගකීම් සමාගමක් බවට සමාගම වෙනස්කරන ලදී

**2011/2012** – කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත කරන ලදී



### ශාඛා

1995 – 1

**2020 – 103**



### සේවකයින්

1995 – 3

**2020 – 2,401**



### ප්‍රාග්ධනය

1995 – රු. මිලියන 10

**2020 – රු. බිලියන 30.25**



### නිෂ්පාදන පරාසය

1995
- කල්බදු
- කුලීපිට මිලදීගැනීම්

**2020**

**ණය නිෂ්පාදන**
- කල්බදු (හිතකාමී කල්බදු)
- ෆාස්ට් ට්‍රැක්
- මෝටර්රථ ණය
- සෙල්ෆි කෑෂ්
- ක්ෂණික මුදල්
- රන් ණය
- ව්‍යාපාර ණය *(ශක්ති)*
- අධ්‍යාපන ණය *(ශාස්ත්‍ර)*
- නිවාස ණය *(සැනසුම් පියස)*



### තැන්පතු

1995 – ශුන්‍ය

**2020 – රු. බිලියන 106.70**



### පරිපාලිත සමාගම්

1995 – නැත

**2020 – 6**

**ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්**
- ස්ථාවර තැන්පතු
- ස්ථාවර තැන්පතු ජ්‍යෙෂ්ඨ පුරවැසි
- ප්‍රිමියර් රිවෝර්ඩ් ප්ලෑන්
- ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම්
- සෙනෙහස බාලවයස්කාර ඉතුරුම් ගිණුම

**ඉස්ලාමීය ණය නිෂ්පාදන**
- ඉජාරා
- මුරබා
- මුෂාරකා

**වෙනත්**
- ආන්තික වෙළෙඳාම
- ණය සාධ්‍යකරණය

**ඉස්ලාමීය තැන්පතු නිෂ්පාදන**
- මුධාරබා ඉතුරුම් ගිණුම
- යුස්හ්‍රා බාලවයස්කාර ඉතුරුම් ගිණුම
- මාස 12 මුධාරබා ආයෝජන ගිණුම
- කෙටි කාලීන මුධාරබා ආයෝජන ගිණුම

## අපගේ ස්ථාවරය

පීපල්ස් ලීසිං සමාගම මෙරට බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි අග්‍රගාමී ස්ථානයක සිටී.

### ව්‍යාපාර පරිමාවන්

පීපල්ස් ලීසිං සමාගම බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයේ තැන්පතුවලින් 14.10%ක්, ණය සහ අත්තිකාරම්වලින් 13.40%ක් සහ මුළු වත්කම්වලින් 11.98%ක් සඳහා දායක වේ.

### ලාභදායිතාව

පීපල්ස් ලීසිං ක්ෂේත්‍රයේ සාමාන්‍ය වත්කම් මත ඉපයීම සහ ස්කන්ධය මත ඉපයීම ඉහළ අගයක් සහිත වඩාත් ලාභදායී ආයතනයකි.

### අරමුදල් මූලාශ්‍රය

දිගු කාලීන ක්‍රමෝපායක් මත පදනම් අවධානිත ප්‍රවේශය තුළින් 5.57%ක් වන ක්ෂේත්‍රයේ වර්ධනයට සාපේක්ෂව 20.75%ක වාර්ෂික වර්ධනයක් සහිත තැන්පතු පදනම පෙන්නුම් කෙරේ.

### වත්කම්වල ගුණාත්මකභාවය

7.62%ක ශුද්ධ අක්‍රිය ණය අනුපාතය 10.59%ක් වන ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළ අගයක් ගනී.

# වැදගත් සිදුවීම්



| | 2019/20 | 2018/19 |
|---|---|---|
| **මූල්‍ය ප්‍රාග්ධනය** | | |
| ශුද්ධ පොළී ආදායම (රු. බිලියන) | **15.67** | 15.19 |
| බදු පෙර ලාභය (රු. බිලියන) | **2.94** | 4.42 |
| ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් (රු. බිලියන) | **4.75** | 1.95 |
| මුළු වත්කම් (රු. බිලියන) | **171.66** | 172.54 |
| කොටස්හිමියන්ගේ අරමුදල් (රු. බිලියන) | **30.25** | 28.60 |
| තැන්පතු (රු. බිලියන) | **106.70** | 88.37 |
| ණය සහ ලැබීම් කළඹ (රු. බිලියන) | **147.75** | 151.71 |
| වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | **19.86** | 21.17 |
| කොටසකට ශුද්ධ වත්කම් (රු.) | **18.58** | 18.10 |
| අවසන්වරට විකුණන ලද කොටස් මිල (රු.) | **12.20** | 13.40 |
| ලාභාංශ ගෙවීම් අනුපාතය (%) | **65.57** | 44.72 |
| **නිෂ්පාදිත ප්‍රාග්ධනය** | | |
| ශාඛා (ගණන) | **103** | 103 |
| සේවා මධ්‍යස්ථාන (ගණන) | **101** | 101 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| සන්නාම වටිනාකම (රු. බිලියන) | **8.79** | 8.72 |
| අස්පෘශ්‍ය වත්කම් (රු. මිලියන) | **257.58** | 324.91 |
| සේවකයින්ගේ සමුච්ඡිත සේවය (අවුරුදු) | **15,000 ට වැඩි** | 13,000 ට වැඩි |
| **මානව ප්‍රාග්ධනය** | | |
| මුළු සේවකයින් (ගණන) | **2,401** | 2,329 |
| රඳවාගැනීමේ අනුපාතය (%) | **90.82** | 88.90 |
| නව බඳවාගැනීම් (ගණන) | **334** | 492 |
| **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය** | | |
| ණය ගනුදෙනුකරුවන් (ගණන) | **126,715** | 121,129 |
| තැන්පතු ගනුදෙනුකරුවන් (ගණන) | **282,944** | 248,587 |
| නැවත පැමිණෙන සේවාදායකයින් (%) | **44.22** | 43.47 |
| මෝටර් රථ සැපයුම්කරුවන් (ගණන) | **32,406** | 28,661 |
| ප්‍රසම්පාදිත මෝටර් රථ සැපයුම්කරුවන්ගේ මුළු වටිනාකම (රු. බිලියන) | **60.62** | 66.80 |
| දේශීය ප්‍රජාවන් තුළ ආයෝජනය (රු. මිලියන) | **55.53** | 120.29 |
| ආයතනික පුරවැසි වගකීම් වැඩසටහන් (ගණන) | **79** | 155 |
| **ස්වභාවික ප්‍රාග්ධනය** | | |
| පුහුණුකළ නව කාර්ය මණ්ඩලය | **334** | 492 |
| කාබන් පියසටහන ($tCO_2eq$) | **7,955.83** | 6,113.66 |
| හරිත ණයවල පරිමාව (රු. බිලියන) | **1.87** | 5.48 |
| පාරිසරිකමය වැඩසටහන් (ගණන) | **12** | 31 |
| ස්වභාවික පරිසරය තුළ ආයෝජනය (රු. මිලියන) | **3.32** | 1.94 |

# ආයතනිකගත දැනුම් පදනම

ආයතනිකගත දැනුම ක්ෂේත්‍රය තුළ අසමසම තරඟකාරී වාසියක් ලබා දේ.



## පණිවිඩ


**10**
සභාපතිතුමාගේ පණිවිඩය

**12**
ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

# සභාපතිතුමාගේ පණිවිඩය


මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
**පණිවිඩ >>**
ව්‍යාපාර ආකෘතිය
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු




"නව සාමාන්‍යයට" අනුවර්තනය වීමේ අපගේ හැකියාව, අපගේ ඔරොත්තු දීමේ හැකියාව සහ අපගේ ධනාත්මක ආකල්පය අභියෝගාත්මක පරිසරයක් හමුවේවුවත් අපගේ මෙහෙයුම් ශක්තිමත් කිරීමට අපට උපකාරී විය.

ලෝකය ගෝලීය වසංගතයකට මුහුණ දී සිටී. කොටස් වෙළෙඳපොල පහත වැටෙමින් පවතින අතර විරැකියාව ඉහළ යමින් පවතී. ප්‍රමුඛ පෙළේ ආර්ථිකයන් පීඩාවට පත්වෙමින් සිටී. එවැනි අර්බුදවලට ක්‍රියාශීලී, තීරණාත්මක ප්‍රතිචාර දැක්වීම සැබෑ නායකත්වය සලකුණු කරයි. පීපල්ස් ලීසිං සමාගම බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ ස්ථානයක් දිගුකාලීනව භුක්ති විඳ ඇත. එම නිසා, ආදර්ශය තුළින් මෙහෙයවීම අපගේ වගකීම විය. මූල්‍ය වර්ෂය තුළ පෙර නොවූ විරූ අභියෝගවලට අපි සාමූහිකව මුහුණදෙනු ලැබූවත්, මෙම බාධකවලට විචක්ෂණශීලීව මුහුණදීම සඳහා අපගේ සියලුම සම්පත් සහ අපගේ ප්‍රධාන ශක්තීන් අපි භාවිතාකළ බව වාර්තා කිරීමට ලැබීම පිළිබඳ මම ආඩම්බර වෙමි.

දේශීය සහ බාහිර සන්දර්භයන්ගේ අභියෝග තුළින් ඇතිකරන ලද කැලඹිලි සහිත කාලවාකවානුවල ක්‍රියාත්මක වෙමින්, දුෂ්කර මූල්‍ය වසරක් අපි අත්වින්දෙමු. වසරේ මුල් භාගය පාස්කු ප්‍රහාර හේතුවෙන් පසුබෑමකට ලක් වූ අතර එහි ප්‍රතිසාධනය නොවැම්බර් මස ජනාධිපතිවරණය දක්වා ක්‍රියාත්මක විය. පාස්කු ප්‍රහාරවල ආර්ථික බලපෑම ආර්ථිකය පසුබැසීමට හේතු වූ අතර එය ගනුදෙනුකරුවන්ගේ වැයකළ හැකි ආදායම සහ ව්‍යාපාර පරිමාව අඩුකිරීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ක්ෂේත්‍රය තුළ අක්‍රිය ණයවල ඉහළයාමක් පැවතින. කෙසේවෙතත්, ජනාධිපතිවරණයෙන් පසුව, පෙර පැවති දේශපාලන අවිනිශ්චිතතාව අඩු වූ අතර ව්‍යාපාර සහ මෙහයුම් හිතකර සංඥා පෙන්නුම් කළේය. එහෙත්, 2020 දී කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ, සමාජ ආර්ථික බලපෑම් ඉහළ යමින් තිබුණි. ශ්‍රී ලංකාවේ වසංගතය ව්‍යාප්තිය සහ ඉන් ඇති වූ සංචරණ සීමා කිරීම (Lockdown) වසර තුළ අපගේ මෙහෙයුම් සහ අපගේ සමස්ත මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපාන ලදී. මාර්තු මැද සංචරණ සීමා කිරීම අපගේ එදිනෙදා මෙහෙයුම්වලට බලපාන ලදී. කොවිඩ්-19 හා සම්බන්ධ සිදුවීම්වලින් යථා තත්ත්වයට පත්වීමේ දුෂ්කරතා හේතු කොට ගෙන, මාර්තු මාසය තුළ ඉහළ හානිකරණ අයකිරීම් ඇතිකරමින් අපගේ ණයවල ගුණාත්මකභාවය කෙරෙහි පීඩනයක් අපි අත්වින්දෙමු. එතෙකුදු වුවත්, නව සාමාන්‍යයට අනුවර්තනය වීමේ හැකියාව, අපගේ ඔරොත්තු දීමේ හැකියාව සහ ධනාත්මක ආකල්ප අභියෝගාත්මක පරිසරයක් හමුවේවුවත්, අපගේ මෙහෙයුම් ශක්තිමත් කිරීමට අපට උපකාරී විය. අපගේ පළමු ප්‍රමුඛතාවය වූයේ අපගේ කැපවූ ශ්‍රම බළකාය සහ සමාජයේ සෑම අංශයකින්ම පැමිණෙන අපගේ විශ්වාසවන්ත ගනුදෙනුකාර පදනමේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කිරීමයි. අදාළ බලධාරීන් විසින් නිර්දේශ කරන ලද සෞඛ්‍යය සහ ආරක්ෂිත මාර්ගෝපදේශ අපි ක්‍රියාත්මක කළ අතර සංචරණ සීමා කාලය තුළ මෙහෙයුම් ආරම්භ කිරීමේදී අනුගමනය කිරීම සඳහා උපදෙස් දක්වමින් කොවිඩ්-19 ප්‍රතිචාරාත්මක මාර්ගෝපදේශයක් සකස් කළෙමු. අපගේ ගනුදෙනුකරුවන් ඔවුන්ට අවශ්‍ය අවස්ථාවේදී අතරමං නොකරන බව සහතික කිරීම සඳහා සියලුම රෙගුලාසි අනුගමනය කරමින් අපගේ ශාඛා සහ ගනුදෙනුකාර සහය සේවා මෙහෙයවන ලදී. වසංගතයෙන් බරපතල ලෙස පීඩාවට පත්කරන ලද පුද්ගලයින්ට සහයවීම සඳහා අපි කාලීන ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර විශේෂයෙන් අපගේ සුළු හා මධ්‍ය පරිමාණ සේවාදායකයින්ගේ ජීවනෝපාය යථා තත්ත්වයට ගෙන ඒම පිණිස ඔවුන්ට සහය විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසි අනුගමනය කරමින්, අප වෙත ලැබී ඇති අයදුම්පත් ඇගයීම අපි සම්පූර්ණ කර ඇති අතර, සුදුසුකම් ලබන පුද්ගලයින් සඳහා විලම්බන කාලසීමාව ලබාදීමේ ක්‍රියාවලිය තුළ දැනට නිරතව සිටිමු.

විශේෂයෙන් අප විසින් ක්‍රියාත්මක කළ ශක්තිමත් පදනම නිසා මෙම අර්බුද කාලසීමාව තුළ එයට ඔරොත්තුදීමට අපට හැකිවිය. අපගේ ව්‍යාපාර ආදර්ශය සහ ක්‍රමෝපාය බාහිර කම්පන අවශෝෂණය කරගතහැකි ආකාරයෙන් ව්‍යුහගත කෙරේ. බාහිර පරිසරයට අනුවර්තනය වීමේ අපගේ සුචල්‍යතාව පාස්කු ප්‍රහාර කාලසීමාව තුළ සහ ඉන්පසු පෙන්නුම් කරන ලදී. තොරතුරු තාක්ෂණය තුළ පෙර ආයෝජන සහ නවීන තාක්ෂණය ප්‍රහාරවලින් පසු ඇති වූ තත්ත්වය කළමනාකරණය කර ගැනීමට අපට උපකාරි විය. අවශ්‍ය සියලුම ආරක්ෂක රෙගුලාසිවලට අනුකූල වෙමින් කොවිඩ්-19 වසංගතය තුළ අපගේ මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට එම පද්ධති සහ ක්‍රියාවලි භාවිතා කරනු ලැබේ. අපගේ ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සේවා ලබාදීම සඳහා සංචරණ සීමා කාලය තුළ අපගේ ඇමතුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරන ලදී.

# සභාපතිතුමාගේ පණිවිඩය

අපගේ ක්‍රමෝපායට අනුව, පීපල්ස් ලීසිං හි ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශය නැවත ණය අයකර ගැනීමේදී සංවේදී ප්‍රවේශයක් යොදා ගනු ලැබීය. එය අපගේ ගනුදෙනුකරුවන්ගේ යෝග්‍යතාව මත පදනම් වී නියාමකයින් විසින් නියමකළ සියලුම සහන ඔවුන් වෙත ලබාදෙමින් අවශ්‍ය මූල්‍ය සහය සමඟ නැවත ඔවුන්ට ගොඩනැගීමට අපගේ සහය අපි තවදුරටත් ලබා දෙන්නෙමු. එමෙන්ම අපි දේශීය ප්‍රජාව සවිබලගැන්වීම සහ පරිසරය සංරක්ෂණය සඳහා රු. මිලියන 58.85ක් ආයෝජනය කළෙමු. තවද, අර්බුදකාරී කාලය තුළදී අයවැයගත මට්ටම්වලට පහළ මට්ටමක මෙහෙයුම් වියදම් පවත්වා ගැනීමත්, පිරිවැය පාලනය කෙරෙහිත්, අපගේ මෙහෙයුම් වඩාත් ශක්තිමත් කිරීම තුළින් අවධානය යොමු කරන ලදී. කෙසේවෙතත්, මෙම වාර්තාව නිකුත් කරන අවස්ථාවේදී පවා පවතින වසංගතය සහ අවිනිශ්චිතතාව හමුවේ, 2020/21 සඳහා නියම කළ ව්‍යාපාර ඉලක්ක සහ ක්‍රමෝපායන් අපි නැවත සලකා බැලුවෙමු. මෙහෙයුම් වෙනස්වීම්, අපේක්ෂිත ප්‍රතිඵල සහ වසර තුළ ගනු ලැබූ විශේෂිත ක්‍රියාමාර්ග ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනය තුළ තවදුරටත් සාකච්ඡා කෙරේ.

පීපල්ස් ලීසිං මෙම වසර සඳහා රු. මිලියන 2,942.51ක බදු පසු ලාභයක් වාර්තා කරන ලද අතර එය පෙර වසරේ වාර්තා කරන ලද රු. මිලියන 4,416.12ට සාපේක්ෂව 33.37%ක අඩුවීමකි. සමූහ මට්ටමේදී, 2018/19 දී රු. මිලියන 5,011.27ට සාපේක්ෂව බදු පසු ලාභය රු. මිලියන 3,591.72ක් වූ අතර එය බදු පසු ලාභයෙහි 28.33%ක අඩුවීමකි. මෙය මෙහෙයුම් පරිසරය තුළ ඉහත සඳහන් කළ සාධක හේතු කොට ගෙන ක්ෂේත්‍රය පුරා පවත්නා ප්‍රවණතාවයකි. මුළු මෙහෙයුම් ආදායම වැඩිවීමට ඉහළ ශුද්ධ පොළී ආදායම හා ගාස්තු සහ කොමිස් ආදායම දායක වූ නමුත්, අභියෝගාත්මක මෙහෙයුම් සන්දර්භය හේතු කොට ගෙන 192.89%කින් ඉහළ ගිය හානිකරණ වෙන්කිරීම මගින් එම වැඩි වීම හිලව් විය. තැන්පතු රු. බිලියන 100 පසුකළ අතර වසර අවසානයේදී රු. බිලියන 106.70 සලකුණු කරන ලදී. මෙය 20.75%ක සැලකියයුතු වර්ධනයකි. ක්ෂේත්‍රය තුළ විශාලතම තැන්පතු පදනම මෙන්ම විශාලතම ණය සහ ලැබීම් කළඹ අප සතු වේ. දුෂ්කර සන්දර්භයක් තුළ ක්‍රියාත්මක වෙමින් තැන්පතු පදනම වාර්තා කළ මෙම සැලකියයුතු වර්ධනය සමාගම කෙරෙහි ශ්‍රී ලාංකිකයින් තබා ඇති විශ්වාසය සහ පැහැදීම පිළිබඳ සාක්ෂියකි. සමාගමේ මුළු වත්කම් 2019 මාර්තු 31 දිනට පැවති රු. බිලියන 172.54 සිට 2020 මාර්තු 31 දිනට රු. බිලියන 171.66 දක්වා සුළු පහත වැටීමක් වාර්තා කළ අතර, සමූහයේ මුළු වත්කම් නොවෙනස්ව පැවතිණ. බදු පසු ලාභය පෙන්නුම් කළ ප්‍රවණතාවය අනුව වත්කම් මත ඉපයීම සහ ස්කන්ධය මත ඉපයීම අනුව ලාභදායිතාව පිළිවෙළින් පසුගිය වසරේ පැවති 3.95% සහ 15.88% සිට 2.64% සහ 10.00% දක්වා අඩු විය.

වසර තුළ පීපල්ස් ලීසිං සමාගම විවිධ සම්මාන සහ පිළිගැනීම්වලින් ඇගයීමට ලක් වූ අතර, එය අපගේ යහපාලනය පිළිබඳ සාක්ෂියක් වන බව වාර්තා කිරීමට ලැබීම සම්බන්ධයෙන් මම සතුටු වෙමි. මෙරට විශිෂ්ටතම ආයතනික පුරවැසියන් දහයෙන් එක් පුරවැසියෙක් ලෙස අපිව නම් කරන ලද අතර, ලංකා වාණිජ මණ්ඩලය විසින් පවත්වන ලද විශිෂ්ටතම ආයතනික පුරවැසි තිරසාරාත්මක සම්මාන තුළ ප්‍රජා සම්බන්ධතා වර්ගීකරණයෙහි ජයග්‍රහකයා ලෙස පිළිගන්නා ලදී. ජපාන ශ්‍රී ලංකා තාක්ෂණික සහ සංස්කෘතික සංගමය (JASTECA) විසින් ඉදිරිපත් කළ විශිෂ්ටතම සමාජ සත්කාරක/තිරසාරාත්මක ව්‍යාපෘති දහයේ ජයග්‍රහකයා ලෙස ද අප පිළිගනු ලැබීය. පීපල්ස් ලීසිං වාර්ෂික වාර්තාව 2018/19 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වන වාර්ෂික වාර්තා සම්මාන, ARC ජාත්‍යන්තර වාර්ෂික වාර්තා සම්මාන සහ SAFA විශිෂ්ටතම වාර්ෂික වාර්තා සම්මානවලදී දේශීය සහ ජාත්‍යන්තර සම්මාන කිහිපයක් අත්කර ගනු ලැබීය. එමෙන්ම, බිස්නස් ටුඩේ ටොප් 30 වාර්ෂික ලැයිස්තුගතකරණය තුළ අප ආයතනය 13 වැනි ස්ථානයේ ස්ථානගත කරන ලදී. තවද, (ආයතනික වාර්තාකරණය තුළ විනිවිදභාවය සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් විසින්) පීපල්ස් ලීසිං සමාගම බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි ප්‍රථමයා ලෙසත් ඉහළම ආයතන 50න් තෙවැනියා ලෙසත් නම්කරනු ලැබීය. මෙය ආයතනික වාර්තාකරණය තුළ විනිවිදභාවය පිළිබඳ මෙතෙක් ශ්‍රී ලංකාවේ පළමු ඇගයීමයි.

සමාගමේ නුදුරු අනාගතය කෙරෙහි කොවිඩ්-19 වසංගතය විසින් ඇතිකළ බාධා කිරීම් බලපානු ලබන අතර එහි සමාජ-ආර්ථික බලපෑම ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකය කෙරෙහි පවතිනු ඇත. විශේෂයෙන්, වසංගතය අඛණ්ඩව පවත්නා බැවින්, සමාජ-ආර්ථික පරිසරය ආකුල කිරීමේ අවිනිශ්චිතතාවන් බොහොමයක් පවතී. එසේ වුවද, නව සාමාන්‍ය පිළිගැනීමට අපි සූදානම් වන අතර අපි ඉදිරි වර්ෂයන් හි ව්‍යාපාර අඛණ්ඩතාව සඳහා ක්‍රියාමාර්ග දැනටමත් ක්‍රියාත්මක කර ඇත. අපගේ කෙටි කාලීන අරමුණු වන්නේ ද්‍රවශීලතාව ආරක්ෂා කිරීම, ණය අලාභ අවමකිරීම, මෙහෙයුම් පිරිවැය අඩුකිරීම සහ අපගේ කාර්යමණ්ඩලය සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමයි. ඩිජිටල්කරණය තුළ අපගේ අඛණ්ඩ ආයෝජනය නව සාමාන්‍යයට මුහුණ දීම සඳහා අත්‍යවශ්‍ය වත්කමක් වනු ඇත.

අවසාන වශයෙන්, මෙම දුෂ්කර අවස්ථාවේදී වුවත් සමාගම සඳහා කැපවීම සහ මෙහෙයවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ස්තුතිය පුදකිරීමට මම කැමැත්තෙමි. එමෙන්ම අප වෙත දෙන ලද සහයෝගය, මාර්ගෝපදේශ සහ සහය වෙනුවෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ නිලධාරීන් වෙතද මාගේ ස්තුතිය පිරිනමමි. තවද, අර්බූදයේ බලපෑම ඵලදායිව කළමනාකරණය කිරීම වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරී, ඒ.එස්. ඊබ්‍රහිම් මහතා ඇතුළු කළමනාකරණ කණ්ඩායම වෙත මාගේ ඇගයීම ප්‍රකාශ කර සිටිමි. එමෙන්ම මෙම දුෂ්කර අවස්ථාවේදී සේවා ප්‍රමිතීන් පවත්වා ගනිමින් කටයුතු කළ සමාගම වටා පෙළ ගැසුණු අපගේ කැපවූ සහ ඉහළ දක්ෂතා සහිත සේවකයින් සහ කළමනාකරණය මාගේ ඇගැයීමට ලක් කරමි. අවසාන වශයෙන්, අපගේ සමාගම කෙරෙහි විශ්වාසය තබන ලද ගනුදෙනුකරුවන්ට සහ කොටස්හිමියන්ට, අඛණ්ඩ සහය වෙනුවෙන් හවුල්කරුවන්ට සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ට මාගේ කෘතඥතාව පළකර සිටිමි.



**සුජීව රාජපක්ෂ**
**සභාපති**

2020 ජූලි 8

**අපගේ කෙටි කාලීන අරමුණු වන්නේ ද්‍රවශීලතාව ආරක්ෂා කිරීම, ණය අලාභ අවමකිරීම, මෙහෙයුම් පිරිවැය අඩුකිරීම සහ අපගේ කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමයි.**

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය



අපගේ සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව ඉහළම ප්‍රමුඛතාව බවට පත්කරමින් අපගේ මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සඳහා මඟ පාදමින් බලධාරීන් විසින් නියම කරන ලද සෞඛ්‍යය රෙගුලාසි කැමැත්තෙන් යොදා ගනිමින් ස්ථිර ආකාරයකින් කොවිඩ්-19 අර්බුදයට අපි ඉතා ඉක්මණින් ප්‍රතිචාර දක්වන ලදී.

2019/20 වසර පීපල්ස් ලීසිං ඉතිහාසය තුළ වඩාත් ආකූල වසරක් වන අතර, අපගේ සම්පත්, ශක්තිය පිළිබඳ සීමාවන් සහ අපගේ ව්‍යාපාර ආකෘතිය සහ ක්‍රමෝපායෙහි පවතින සුචල්‍යතාව සහ අප ආයතනයේ ඔරොත්තුදීමේ හැකියාව ඉන් පරීක්ෂා කරන ලදී. එහෙත්, සභාපතිතුමා විසින් ඔහුගේ පණිවිඩය තුළ උචිත ලෙස දක්වා ඇති පරිදි, මෙම අභියෝග මධ්‍යයේ මෙම ක්ෂේත්‍රය තුළ අපගේ ප්‍රමුඛ ස්ථානය තුළින් හිමි වූ ප්‍රබල ශක්තිය විදහා දැක්විණ.

2019 දී පාස්කු ප්‍රහාර, ජනාධිපතිවරණය දක්වා පැවති දේශපාලන අවිනිශ්චිතතාව සහ කොවිඩ්-19 වසංගතය වැනි පෙර නොවූ විරූ අභියෝග අපගේ මෙහෙයුම් සහ ලාභය කෙරෙහි බරපතල ලෙස බලපාන ලදී. එම නිසා, අපගේ පාලනය තුළ ඇති කරුණු කෙරෙහි අපි අවධානය යොමු කළේ අනුවර්තනයවීමට සහ නොපසුබට උත්සාහයට පමණක් නොව මෙම අර්බුදයට සක්‍රියව ප්‍රතිචාර දැක්වීම සඳහාය. වර්ෂය තුළ අපගේ මෙහෙයුම් ශක්තිමත් වූ අතර, අපගේ තැන්පතු පදනම රු. බිලියන 100 ඉක්මවූ අතර එය ක්ෂේත්‍රයේ විශාලතම පදනම විය. ඉන් පීපල්ස් ලීසිං කෙරෙහි මහජන විශ්වාසය පමණක් නොව බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රය තුළ අපගේ නායකත්ව ස්ථානය ද පිළිබිඹු කරයි. අපගේ සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව ඉහළම ප්‍රමුඛතාව බවට පත්කරමින් අපගේ මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සඳහා මඟ පාදමින් බලධාරීන් විසින් නියම කරන ලද සෞඛ්‍යය රෙගුලාසි කැමැත්තෙන් යොදා ගනිමින් ස්ථිර ආකාරයකින් කොවිඩ්-19 අර්බුදයට අපි ඉතා ඉක්මණින් ප්‍රතිචාර දක්වන ලදී. එමෙන්ම කොවිඩ්-19 සහන කෙරෙහි රජයේ උපදෙස්වලට අපි සහය දැක්වූ අතර, වසංගතය මගින් බරපතල ලෙස පීඩාවට පත් අපගේ ගනුදෙනුකරුවන් සුරක්ෂිත කරන ලදී. මෙහෙයුම් සන්දර්භය තුළ ඇති වූ අභියෝග මධ්‍යයේ, වසර තුළදී අපගේ ප්‍රධාන අවධානය යොමුකළ ක්ෂේත්‍ර වූයේ අපගේ වෙළෙඳපොල කොටස ආරක්ෂාකරගැනීම, අක්‍රීය ණය මට්ටම්වල වර්ධනය අවම කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිකිරීම සහ අපගේ රන් ණය සේවාව පුළුල් කිරීමයි.

## දුෂ්කර අවස්ථාවන්හිදී පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම

පාස්කු ප්‍රහාර සහ කොවිඩ්-19 වසංගතය අප අතර අපගේ පවුල සහ අපට සමීප පුද්ගලයින් සහ අපගේ ස්වභාවික වටපිටාව සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමේ වැදගත්කම අප වෙත උගන්වන ලදී. අපගේ පළමු ප්‍රමුඛතාව වූයේ අපගේ සේවකයින්, ගනුදෙනුකරුවන් සහ සියලුම පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමයි. එබැවින් ශ්‍රී ලාංකීය සමාජයේ සෑම අංශයකින්ම පැමිණෙන අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සේවය කිරීම සඳහා අපගේ මෙහෙයුම් බොහෝ දුරට සාමාන්‍ය මට්ටමකින් ප්‍රතිසංස්ථානය කිරීම සඳහා අපි පියවර ගත්තෙමු.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සිටින අපගේ ගනුදෙනුකරුවන්ගෙන් බහුතරයක් මෙම අර්බුදයෙන් බරපතල ලෙස පීඩාවට පත්විය. අවශ්‍ය අවස්ථාවේදී මූල්‍ය සහය සහ අදාළ මූල්‍ය ප්‍රවීනත්වය ලබාදෙමින් අපි ඔවුන්ට අඛණ්ඩව සහය ලබා දුන්නෙමු. පාස්කු ප්‍රහාරවලින් පසු, සමාගම ගනුදෙනුකරුවන්ගේ සැබෑ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා පුද්ගලික මට්ටමින් ඔවුන් දෙස බලන ලද අතර, ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාව පරිදි ඔවුන්ට ගැලපෙන විසඳුම් හඳුන්වාදෙනු ලැබීය. අපගේ ගනුදෙනුකරුවන් මත යම් අමතර බරක් තැබීම වැළැක්වීම සඳහා, අපි ඔවුන්ගේ දඩ පොළිය කපා දැමුවෙමු. අවශ්‍ය ගනුදෙනුකරුවන්ට සහයවීම සඳහා ප්‍රතිසාධන ක්‍රියාවලිය සංශෝධනය කරන ලද අතර, තීරණයකට ලඟාවීමට පෙර ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික සහ මූල්‍ය තත්ත්වය සලකාබලන මෙන් අපගේ සේවකයින්ට උපදෙස් ලබාදෙන ලදී. අපගේ ගනුදෙනුකරුවන්ට පහසුකම් ඇති කිරීම සඳහා සංචරණ සීමා (Lockdown) කරන ලද කාලසීමාව තුළ පවා සෞඛ්‍යය බලධාරීන්ගේ දැඩි මාර්ගෝපදේශ අනුගමනය කරමින් අපගේ ශාඛා ක්‍රියාත්මක කරන ලදී. ණය පහසුකම් සහ නව කල්බදු ලබා දීම අපි අවම නොකළ අතර, ගනුදෙනුකරුවන්ට කාරක ප්‍රාග්ධන අරමුදල් අවශ්‍යතා අඛණ්ඩව ලබා දුන්නෙමු. ගනුදෙනුකරුවන්ගෙන් 50%ට වැඩි කොටසක් රජය විසින් හඳුන්වා

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

දෙන ලද සහන සඳහා සුදුසුකම් ලබයි. විලම්බන කාලසීමාව සඳහා ලද අයදුම්පත් ඇගැයීම අපි සම්පූර්ණ කර ඇති අතර දැනට සුදුසුකම්ලත් පුද්ගලයින් සඳහා සහන ලබාදීමේ ක්‍රියාවලිය තුළ නිරත වී සිටිමු. අපගේ අවබෝධය, නව්‍යකරණය සහ සුරක්ෂිත සහ ආරක්ෂිත සේවය සහිතව අපගේ ගනුදෙනුකරුවන් සමඟ අපට ඇති සම්බන්ධතාව ශක්තිමත් කිරීම අපි අඛණ්ඩව සිදුකරමු.

පාස්කු ප්‍රහාරවලින් පසු, අර්බුදයේ විපාකවලට මුහුණදීම සඳහා අපගේ මෙහෙයුම් සංශෝධනය කිරීමට අපගේ ඩිජිටල් හැකියාව වැඩිදියුණු කිරීමට කටයුතු කළෙමු. එම නිසා, වසංගතය පැතිරීමත් සමඟ, පහසුව සහිත ඩිජිටල් අවකාශය කරා අපගේ මෙහෙයුම් සංක්‍රමණය කිරීමට අපි සූදානම් වී සිටියෙමු. අපගේ දැනට ක්‍රියාත්මක නවීනතම තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම අපගේ මෙහෙයුම් ඩිජිටල් අනුසාරයෙන් පවත්වා ගැනීමට අපට ඉඩකඩ සලසා දෙන ලද අතර, අපගේ සේවකයින් සහ ගනුදෙනුකරුවන් හැකි පමණින් ඩිජිටල් මාර්ග භාවිතා කිරීම සඳහා දිරිගන්වන ලදී. අපගේ සේවකයින්ට නිවසේ සිට සේවය කිරීමට හැකියාව ඇති කරන ලද අතර අවශ්‍ය අවස්ථාවේදී, සේවය පිණිස කාර්යාලයට පැමිණීම සඳහා අපගේ සේවකයින් වෙත ආරක්ෂිත ක්‍රියාමාර්ග සහ ප්‍රවාහන සේවා ලබාදෙන ලදී. කොවිඩ්-19 පැතිරීම සිදුවිය හැකි වාතාවරණය යටතේ ව්‍යාපාර අඛණ්ඩතා සූදානම්වීමේ සැලැස්මක් කාර්ය මණ්ඩලය අතර බෙදාහරින ලදී. සේවක පුහුණු වැඩසටහන් වසර තුළ පවත්වන ලද අතර, එක් සේවකයෙකුට පුහුණු පැය 8.72ක සාමාන්‍යයක් සමඟ වසර තුළ පුහුණු සහ සංවර්ධනය සඳහා රු. මිලියන 3.38ක් ආයෝජනය කරන ලදී.

වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස, අපගේ ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීම ඇතිකරන අපගේ මූල්‍ය විසඳුම් තුළින් අපි තිරසරභාවය ඇතුළත් වර්ධනය ඉදිරියට ගෙන යන්නෙමු. එමෙන්ම අපි එක්සත් ජාතීන්ගේ ගෝලීය තිරසර සංවර්ධන අරමුණුවලට සමගාමීව අවධානිත ක්‍රමෝපායික තිරසාරත්මක/ආයතනික සමාජීය වගකීම් වැඩසටහන් තුළ ආයෝජනය කරමින් අපගේ දේශීය ප්‍රජාවන් අපි තවදුරටත් සවිබලගන්වමු. දිවයින පුරා ශාඛා ජාලයේ සේවකයින්ගේ ස්වෙච්ඡා සහභාගිත්වයක් සමඟ රු. මිලියන 58.85 ක් ආයෝජනය කරමින් 2019/20 තුළ සවිබල ගැන්වීමේ වැඩසටහන් 91ක් තුළ අපි ආයෝජනය කළෙමු.

වසංගතය පවතින වාතාවරණය තුළ, කොවිඩ්-19 පැතිරීම අවම කිරීම අරමුණු කළ කටයුතු ශක්තිමත් කිරීම සඳහා "ඉටුකම" කොවිඩ්-19 සෞඛ්‍යාරක්ෂාව සහ සමාජ ආරක්ෂණ අරමුදලට අපි දායක වීමෙන් අදාළ සමාජ සුභසාධන වැඩසටහන්වලට සහයවිය. මෙම අරමුදලට දායක වූ පළමු ආයතන අතර අපි සිටිමු.

## ස්ථාවර කාර්යසාධනයක්

පීපල්ස් ලීසිං සමාගම රු. මිලියන 2,942.51 ක බදු පසු ලාභයක් වාර්තාකරන ලද අතර එය දුෂ්කර මෙහෙයුම් සන්දර්භයක් තුළ අත්කරගනු ලැබීය. මූල්‍ය වසර අවසානයේදී, පීපල්ස් ලීසිං සමාගමට සහ සමූහයට පිළිවෙළින් රු. මිලියන 171,660.19ක් සහ රු. මිලියන 185,997.29ක් වූ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ වත්කම් පදනමක් අයත් විය. ක්ෂේත්‍රය තුළ තරඟකරුවන්ගෙන් බොහොමයක් බරපතල ලෙස පිඩාවට පත්වුවද, පීපල්ස් ලීසිං රු. මිලියන 106,701.03 දක්වා 20.75%කින් එහි තැන්පතු පදනම වැඩිකර ගැනීමට සමත් වූ අතර එය බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි විශාලතම තැන්පතු පදනම වේ. එසේවුවත්, නව ව්‍යාපාර අවස්ථාවන් අඩුවීම හේතුකොටගෙන සමාගම සහ සමූහය සඳහා ණය සහ ලැබීම් පිළිවෙළින් රු. මිලියන 147,747.51ක් සහ රු. මිලියන 154,134,93ක් දක්වා වසර අවසානයට සෘණාත්මක වර්ධනයක් දක්නට ලැබුණි. එසේ වුවත්, ක්ෂේත්‍රය තුළ විශාලතම ණය සහ ලැබීම් කළඹ අප සතු විය. අපගේ ණය ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ලද සහන සමඟ, ශුද්ධ පොළී ආන්තිකය පෙර වසරේ පැවති 9.70% සිට 9.68% දක්වා සුළු වශයෙන් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ ශුද්ධ පොළී ආදායම වසර තුළ වර්ධනය වූයේ 3.18%කින් පමණි. කෙසේවෙතත්, ගාස්තු සහ කොමිස් ආදායම 12.26%ක වර්ධනයක් වාර්තා කළ අතර, මුළු මෙහෙයුම් ආදායම 4.23%ක වර්ධනයක් වාර්තා කිරීමට එය හේතු විය. මේ සමඟ මෙහෙයුම් වියදම්වල සුපරීක්ෂාකාරී කළමනාකරණය තුළින් පසුගිය වසරේ 37.81%ක් වූ පිරිවැයට ආදායම් අනුපාතය 36.53% දක්වා අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

ක්ෂේත්‍රය තුළ නිරීක්ෂිත ප්‍රවණතාව අනුව ආර්ථිකයේ පහත වැටීමත් සමඟ අපගේ ගනුදෙනුකරුවන් විසින් මුහුණපාන ලද දුෂ්කරතා හේතුවෙන් අපගේ දළ අක්‍රීය ණය (NPA) අනුපාතය 2019 මාර්තු 31 දිනට පැවති 3.91% සිට 7.62% දක්වා ඉහළ යන ලදී. එතෙකුදුවුවත්, අපගේ දළ අක්‍රීය ණය (NPA) අනුපාතය ක්ෂේත්‍රයේ සාමාන්‍ය වන 10.59%ට වඩා පහළ අගයකි. අනෙකුත් කරුණු අතර, අක්‍රීය ණය අනුපාතයේ වර්ධනය අඩුකිරීම කිසිදු සැකයකින් තොරව වසර තුළ පැවති ප්‍රධාන අභියෝගවලින් එකක් විය.

**අපගේ දැනට ක්‍රියාත්මක නවීනතම තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම අපගේ මෙහෙයුම් ඩිජිටල් අනුසාරයෙන් පවත්වා ගැනීමට අපට ඉඩකඩ සලසා දෙන ලද අතර, අපගේ සේවකයින් සහ ගනුදෙනුකරුවන් හැකි පමණින් ඩිජිටල් මාර්ග භාවිතා කිරීම සඳහා දිරිගන්වන ලදී.**

සමූහයක් ලෙස, අපගේ දිවයින පුරා විහිදුන පුළුල් ශාඛා ජාලය සහ වෙළෙඳපොළ කරා විශ්වාසය ඇතිකරන හුවමාරු සේවාවන් තුළින් සාමූහිකව අපගේ කාර්යසාධනය වර්ධනය කිරීම පිණිස අපගේ සහක්‍රියාකාරකම්වල වාසිය අපි ලබා ගන්නා අතර, එය අපගේ පරිපාලිත සමාගම්වල වෙළෙඳපොල පදනම ශක්තිමත් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ඇත. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත අපගේ රක්ෂණ පරිපාලිත සමාගම වන පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම පීපල්ස් ලීසිං හි අතිවිශාල සේවාදායක පදනමින් වාසි ලබමින් සාර්ථක ප්‍රතිඵල අත්කොටගෙන ඇත. පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සහ පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් යන අපගේ අනෙකුත් පරිපාලිත සමාගම්වල කාර්යසාධනය අභියෝගාත්මක වෙළෙඳපොල පරිසරය හමුවේ වසර තුළ පහත වැටී ඇත. කෙසේවෙතත්, විදේශීය පරිපාලිත සමාගම වන, ලන්කන් ඒලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් එහි මෙහෙයුම්වල දෙවැනි වසර තුළ සිටියද පසුගිය වසරට සාපේක්ෂව මෙම වසර තුළ එහි කාර්යසාධනය වර්ධනය කරගෙන ඇත.

## ඉදිරිය සඳහා ඩිජිටල්කරණය සහ තිරසාරභාවය

නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ සමාගම තුළ අපගේ සේවකයින්ගේ ඩිජිටල් සාක්ෂරතාව වර්ධනය කිරීම තුළ අපගේ ආයෝජනවල ලාභාංශ අපි දැන් ලබාගනිමින් සිටිමු. ඩිජිටල් හැකියාවන් ඇඳිරිනීති සහ සංචරණ සීමාවන් පනවන ලද කාලසීමාවන් තුළ අපගේ දෛනික මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා ඩිජිටල් අවකාශ කරා ඉතා ඉක්මණින් සංක්‍රමණය වීමට අපට හැකියාව ලබාදී ඇත. ඉ-මෙමෝ පද්ධතිය, අනුකූලතා කළමනාකරණ පද්ධතිය, ස්ථාවර වත්කම් පද්ධතිය, ඉතුරුම් ආයෝජන සැලැස්ම, ඇගයීම් උපකරණ පුවරුව, පාරිසරික කළමනාකරණ පද්ධතිය වැනි නව පද්ධති වසර තුළ හඳුන්වා දෙන ලදී. වසර තුළ අපගේ ශාඛා ජාලය පුළුල් කිරීමට පවතින ලද  වාතාවරණය හෝ අවශ්‍යතාවක් ඇතැයි අපි කල්පනා නොකළෙමු. කෙසේවෙතත්, ශාඛාවන් හී අපගේ රන් ණය ඒකක පුළුල් කිරීම සම්බන්ධ ඉහළ විභවතාවයක් අපි දකිමු.

වගකීම් සහගත සහ සියල්ල ඇතුළත් මූල්‍ය සේවා සපයන්නෙක් ලෙස, ජනතාවට මූල්‍ය නිෂ්පාදන සහ සේවා සඳහා වඩා යහපත් පිවිසීම ඇති බව සහතික කිරීම අපට අවශ්‍ය වන අතර ඒ තුළින් ජාතියේ ආර්ථික සංවර්ධනය කරා අපට සහයවීමට සහ ජීවනෝපායන් වර්ධනය කිරීම සඳහා දායක වීමට අපට හැකි වේ. සමාජය සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සහයවීම පිණිස අපගේ ණයදීමේ තීරණ සහ ව්‍යාපාර පරිචයන්ට සමාජ, ආර්ථික සහ පාරිසරිකමය ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් කිරීමට අපි අරමුණු කරමු. තවද, අනාගතයේදී කාලගුණ සුහුරු මූල්‍ය විසඳුම් සමඟ කාලගුණ ප්‍රත්‍යස්ථිතිය වැඩි කිරීමට ද අපි අරමුණු කරමු.

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය



## අනාගත දැක්ම

අපගේ පද්ධති සහ ක්‍රියාවලීන් හි ශක්තිමත්භාවය, අපගේ ක්‍රමෝපාය සහ ව්‍යාපාර ආකෘතියේ සුචලතාව, අපගේ සේවකයින්ගේ කැපවීම සහ ක්ෂේත්‍රය තුළ නායකයෙක් ලෙස අපට ඇති  ශක්තිය සහ ස්ථාවරත්වය හේතු කොට ගෙන ගෝලීය වසංගතයේ පළමු රැල්ල තුළින් අපි ශක්තිමත්ව ඉදිරියට ගමන්කර ඇත. එහෙත්, වසංගතය තවමත් පවත්නා අතර ආසන්න අනාගතය සඳහා අවිනිශ්චිතතාවක් පවතී. සමාගමක් ලෙස සහ රටක් ලෙස වසංගතයෙන් පසු ඇතිවන සමාජ-ආර්ථික අභියෝගවලට මුහුණ දීම සඳහා අපි සූදානම් විම අවශ්‍යය. එබැවින් ද්‍රවශීලතාව ආරක්ෂාකිරීම, ණය අලාභ අවම කිරීම, මෙහෙයුම් වියදම් අවමකිරීම සහ අපගේ සේවකයින්ගේ සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම වැනි ගැටළු ආමන්ත්‍රණය කරමින් කෙටිකාලය කෙරෙහි අපි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළෙමු. අපගේ අගනා සේවාදායකයින්ගේ මූල්‍යකරණය සඳහා පිවිසුම වර්ධනය කරමින්, කොවිඩ්-19 වසංගතය වැනි අර්බුදයක් තුළ මෙහෙයුම් ඇති කිරීමට නවීන ඩිජිටල් තාක්ෂණයේ වාසිය අඛණ්ඩව අපි ලබා ගන්නෙමු.

## ප්‍රණාමය

මෙම අර්බුදකාරී අවස්ථාව තුළ මඟ පෙන්වීම සහ දූරදර්ශීභාවය ලබාදීම වෙනුවෙන් සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට මාගේ ස්තුතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එමෙන්ම, වසංගතය තුළ මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට යෝජිත නව්‍යකරණ විසඳුම් සමඟ කටයුතු කරන අවස්ථාවේදී සැබැවින්ම නැගී සිටි ආයතනික කළමනාකරණය සහ අපගේ කැප වූ ශ්‍රමබලකායේ එක් එක් සාමාජිකයින්ට ප්‍රශංසා කිරීමටද මම කැමැත්තෙමි. එමෙන්ම අඛණ්ඩ පක්ෂපාතිත්වය වෙනුවෙන් ගනුදෙනුකරුවන්, අප කෙරෙහි විශ්වාසය තැබීම වෙනුවෙන් අපගේ සැපයුම්කරුවන් සහ හවුල්කරුවන්, ස්ථිර විශ්වාසය තබන ලද ආයෝජකයින් සහ කොටස්හිමියන් වෙත සහ සහයෝගය සහ නියාමන මග පෙන්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත මාගේ ස්තුතිය පුද කර සිටිමි.



**ඒ.එස්. ඊබ්‍රහිම්**
ප්‍රධාන විධායක නිලධාරී

2020 ජූලි 8

**සමාජය සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සහයවීම පිණිස අපගේ ණයදීමේ තීරණ සහ ව්‍යාපාර පරිචයන්ට සමාජ, ආර්ථික සහ පාරිසරිකමය ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් කිරීමට අපි අරමුණු කරමු.**

# දිවයින පුරා පිවිසුම් ස්ථාන

ශාඛා, සේවා මධ්‍යස්ථාන සහ මාර්ගගත පිවිසුම් ස්ථානවලින් සමන්විත පුළුල්ව පැතිරුණු සේවා ජාලය සහ සේවා කුටි තුළින්, අපගේ මූල්‍ය විසඳුම් කරා පහසුවෙන් පිවිසීමට අපගේ ගනුදෙනුකරුවන්ට හැකියාව ලබා දී ඇත.



## ව්‍යාපාර ආකෘතිය


**16**
ව්‍යාපාර ආකෘතිය

**20**
මෙහෙයුම් පරිසරය

**22**
පාර්ශ්වකරුවන්

**26**
ප්‍රමාණාත්මකභාවය

**27**
අපගේ ක්‍රමෝපාය

# තිරසාර අගය නිර්මාණය සඳහා ව්‍යාපාර ආකෘතිය

දැක්ම

- ආර්ථික ස්වශක්තතාව

මෙහෙයුම් පරිසරය (පීපල්ස් ලීසිං ව්‍යාපාර මෙහෙයුම් සඳහා සන්දර්භය සහ දෘෂ්ටිකෝණය ලබාදේ)

තෙවැදැරුම් සීමාව

අපගේ මෙහෙයුම්වලට අදාළ SDGs

## තිරසාර අගය නිර්මාණය

## ප්‍රාග්ධන යෙදවුම්

### මූල්‍ය

**මූල්‍ය ප්‍රාග්ධනය**
- ස්කන්ධ ප්‍රාග්ධනය
- ගනුදෙනුකාර තැන්පතු
- ණයගැනීම්
- ද්‍රවශීලතා කළමනාකරණ ක්‍රම
- ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රම
- ආසන්නව කොටස්හිමියන් 9,000
- ලාභාංශ ප්‍රතිපත්තිය
- කොටස්හිමිකාර සහභාගිත්වය
- වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රු. බිලියන 21.17

### මූල්‍ය නොවන

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**
- දේපළ, පිරියත හා උපකරණ
- නවීන මධ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධති
- නව්‍යකරණ ඩිජිටල් මාර්ග
- අංග සම්පූර්ණ ශාඛා 103 ක් සහිත දිවයින පුරා පැවැත්ම
- අස්පෘශ්‍ය වත්කම්
- පොදු යටිතල පහසුකම්

**බුද්ධිමය ප්‍රාග්ධනය**
- ආයතනිකගත දැනුම
- ශක්තිමත් ආයතනික සන්නාම ප්‍රතිරූපය සහ වටිනාකම
- යහපාලන වැඩරාමුව
- ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමය
- සදාචාර ව්‍යාපාර හැසිරීම
- ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව
- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු
- අවංකකම
- ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි
- දත්ත විශ්ලේෂණ
- මනා පරිචයන්

**සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය**

ගනුදෙනුකරු
- 300,000ට අධික ගනුදෙනුකරුවන්
- යහපත් සේවාදායක සම්බන්ධතා
- ඵලදායී සන්නිවේදන මාර්ග
- වගකීම්සහගත අලෙවිකරණය
- ගනුදෙනුකාර මැසිවිලි නිරාකරණ යාන්ත්‍රණය

ව්‍යාපාර හවුල්කරුවන්
- 29,000ට අධික සැපයුම්කරුවන්
- ශක්තිමත් සහ දිගුකාලීන සම්බන්ධතා
- මෝටර් රථ අලෙවිකරුවන් සමග ක්‍රමෝපායික සම්බන්ධතා
- විනිවිද ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය

ප්‍රජාව
- ස්ථර තුන කෙරෙහි අවධානිත ආයතනික සීමා වගකීම් රාමුව
- තිරසාර මෙහෙයුම් කරා ESG ප්‍රතිෂ්ඨාවන්
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDG's) ප්‍රවර්ධනය
- GRI ප්‍රමිතිවලට අනුකූලතාව
- සමාජීය වගකීම්සහගත ණයදීම පිළිබඳ ව්‍යාපාර

**මානව ප්‍රාග්ධනය**
- 2,000කට වැඩි විවිධ තත්ත්වයෙන් යුත් ශ්‍රමබලකාය
- කාර්ය මණ්ඩලයේ සමුච්චිත පළපුරුද්ද වසර 13,000ට වැඩිය
- නිපුණතා සහ හැකියාවන්
- කාර්යසාධනය පදනම් සංස්කෘතිය
- කාර්යසාධනය සම්බන්ධ ප්‍රධාන ව්‍යූහය
- කැපවීම
- බඳවාගැනීමේ ප්‍රතිපත්තිය
- නව්‍යකරණය

**ස්වභාවික ප්‍රාග්ධනය**
- හරිත ණය නිෂ්පාදන
- වගකීම්සහගත අයුරින් අපද්‍රව්‍ය මෙහෙයවීම
- කඩදාසි රහිත මූල්‍යකරණය සඳහා කැපවීම
- පාරිසරික කළමනාකරණය සඳහා ස්ථර හතරේ ප්‍රවේශය

## ක්‍රමෝපායික විධික්‍රියා

1. තිරසාර වර්ධනය
2. ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීම
3. ක්‍රියාත්මක කිරීමේ අනර්ඝත්වය අත්කර ගැනීම
4. කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය
5. වගකීම්සහගත කළමනාකරණය ඇති කිරීම

## ව්‍යාපාර කටයුතු

### පාලනය සහ අවදානම් කළමනාකරණය
- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්ති
- අධ්‍යක්ෂ මණ්ඩලය
- යොමු නිර්දේශ
- කළමනාකරණ කමිටුව
- චර්යා සංග්‍රහය
- සාංගමික ව්‍යවස්ථාවලිය
- වත්කම් සහ වගකීම් කමිටුව
- පාරිශ්‍රමික කමිටුව
- විගණන කමිටුව
- සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ සමාලෝචන කමිටුව
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
- අවදානම් කළමනාකරණ රාමුව

### ප්‍රධාන කටයුතු

මූල්‍ය අතරමැදිකරණය

කල්පිරීම් පරිනාමනය

### සහය කටයුතු
- අලෙවිය/සන්නාමකරණය
- දක්ෂතා කළමනාකරණය
- අයකරගැනීම්
- කළමනාකරණ තොරතුරු පද්ධතිය
- මූල්‍ය වාර්තාකරණය
- භාණ්ඩාගාර මෙහෙයුම්
- නීතිමය සේවා
- තොරතුරු තාක්ෂණය
- අභ්‍යන්තර විගණනය
- අනුකූලතාව
- නිෂ්පාදන සංවර්ධනය
- ප්‍රසම්පාදනය

- ඒකාබද්ධ චින්තනය
- ව්‍යාපාර ආකෘතිය හඳුනාගැනීම/නැවත සකස් කිරීම
- ක්‍රමෝපායික සංවර්ධනය
- කාර්යසාධනය ඇගයීම

දේශපාලන | ආර්ථික | සමාජ | තාක්ෂණික | පාරිසරික | නෛතික

මෙහෙවර → සාරධර්ම

- සමාජීය වගකීම
- පාරිසරික තිරසාරභාවය

ධනාත්මක ප්‍රතිඵල වැඩි කිරීම සහ ඍණාත්මක ප්‍රතිඵල කළමනාකරණය

## උත්පාදිත නිමැවුම්

**අපේක්ෂිත නිෂ්පාදන සහ සේවා:**
- කල්බදු
- ණය
- තැන්පතු
- ආන්තික වෙළෙඳාම
- ණය සාධාකරණය
- ඉස්ලාමීය මූල්‍ය සේවා

**අනපේක්ෂිත අතුරු නිෂ්පාදන/ඍණාත්මක බයිෂ්කරණ:**
- විමෝචන
- ඉ-අපද්‍රව්‍ය
- අපද්‍රව්‍ය

ප්‍රාග්ධනයේ ආර්ථිකය සහ අවසාන ශක්තිවය සඳහා කරුණාකර පිටු අංක 18 සහ 19 හි ප්‍රාග්ධන ශක්තිව ප්‍රකාශනය බලන්න

## ප්‍රතිඵල



**මූල්‍ය ප්‍රාග්ධනය**
- ව්‍යාපාර පරිමාවන්, ආදායම සහ ලාභවල වර්ධනය
- වත්කම්වල ගුණාත්මකභාවය
- මනාව ප්‍රාග්ධනීකරණය වීම
- ප්‍රශස්ථ ද්‍රවශීලතාව
- ප්‍රශස්ථ තෝලන මට්ටම
- ප්‍රශස්ථ අවදානම් පැතිකඩ
- සැලකියයුතු කොටස්හිමිකාර ප්‍රතිඵල

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**
- බහුමාර්ගවල පැවැත්ම
- සම්පත් කාර්යක්ෂම භාවිතය
- වැඩිකළ ඵලදායිතාව
- තාක්ෂණික නව්‍යකරණ වාසිය ලබාගැනීම

**බුද්ධිමය ප්‍රාග්ධනය**
- නැවත ශක්තිමත් කළ සන්නාම අනන්‍යතාව
- නියාමකයින් සමග විශිෂ්ට සබඳතාව

**සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය**

ගනුදෙනුකරු
- බහුමාර්ගවල පැවැත්ම
- සම්පත් කාර්යක්ෂම භාවිතය
- වර්ධිත ගනුදෙනුකාර තෘප්තිය
- ගනුදෙනුකාර පදනමේ වර්ධනය
- ගනුදෙනුකාර සම්බන්ධතාවල වැඩිකළ ප්‍රමාණය
- හඳුන්වාදෙන ලද නව නිෂ්පාදන

ව්‍යාපාර හවුල්කරු
- සුහද සම්බන්ධතා

ප්‍රජාව
- ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ වැඩසටහන්
- අධ්‍යාපනය නගාසිටුවීම
- දේශීය ප්‍රජාව සවිබලගැන්වීම පිළිබඳ වැඩසටහන්
- ඒකාබද්ධ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්

**මානව ප්‍රාග්ධනය**
- ආරක්ෂිත සේවා පරිසරය
- නව්‍යකරණය
- උසස් නායකත්ව වැඩසටහන
- සේවා මට්ටම් ඒකාග්‍රතා
- මෙහෙයුම් අනර්ඝත්වය
- මෙහෙයුම් කාර්යක්ෂමතාව

**ස්වාභාවික ප්‍රාග්ධනය**
- හරිත වැඩසටහන්
- අවම පාරිසරික බලපෑම
- පුනර්ජනනීය බලශක්තිය කරා විතැන්වීම
- ඉ-අපද්‍රව්‍ය සහ කසළ වගකීම්සහගතව බැහැර කිරීම

## පාර්ශ්වකරුවන් කෙරෙහි බලපෑම

**ආයෝජකයින්**
- තිරසාර වර්ධනය
- ආයෝජන අවස්ථා
- දිගු කාලීන දක්ම ලබාගන්නා ආයෝජකයින්

**ගනුදෙනුකරුවන්**
- ණය ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය
- අසමාන කල පහසුව
- පෙර නොවූ විරූ තේරීම
- මූල්‍ය සාක්ෂරතාව සහ විනය
- මූල්‍ය ආරක්ෂාව
- ඉතුරුම් පුරුද්ද ඇති කිරීම
- ව්‍යවසායකත්ව සංවර්ධනය

**සේවකයින්**
- සේවා අවස්ථාවන් බිහිවීම
- වෘත්තීය සහ පෞද්ගලික ජීවිත සමබරව පවත්වා ගැනීම
- වෘත්තීය ප්‍රගතිය සහ සංවර්ධනය
- වගවීම
- කාර්මික සාමය
- සවිබලගැන්වීම

**සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්**
- වෙළෙඳ සහ ක්ෂේත්‍රය තුළ වර්ධනය
- නව්‍යකරණ
- දිගු කාලීන ජයග්‍රාහී සම්බන්ධතා
- විනිවිදභාවය

**රජය සහ නියාමන ආයතන**
- මූල්‍ය අංශයේ ස්ථාවරත්වය
- නිෂ්පාදන සංවර්ධනය හා මූල්‍ය සම්පත්
- කාර්යක්ෂම ප්‍රාග්ධන සැකසීම
- දරිද්‍රතාවයේ අඩුකළ මට්ටම
- අඩුකළ විරැකියාව
- අවිධිමත් මූල්‍ය අංශවල අඩුවීම බලපෑම
- කාර්යක්ෂම ප්‍රාග්ධන වෙන්කිරීම
- යටිතල පහසුකම් සංවර්ධනය

**ප්‍රජාව සහ පරිසරය**
- මූල්‍ය අන්තර්කරණය
- SDGs සඳහා දායකත්වය
- ජීවන තත්ත්වයෙහි වර්ධනයන්
- අඩුකළ GHG විමෝචන
- ආර්ථික සංවර්ධනය

- ක්‍රියාවලි හඳුනාගැනීම සහ සම්පත් වෙන්කිරීම
- කාර්ය සැලසුම්කරණය සහ නියාමනය
- ඒකාබද්ධ වාර්තාකරණය

නියාමන | සංස්කෘතික | ජනවිකාශ | තරඟය | මැඩලිය නොහැකි බලය

## ප්‍රාග්ධන තත්ත්ව ප්‍රකාශය

### (ප්‍රාග්ධනය මත ප්‍රතිඵල මගින් ප්‍රකාශ වන පරිදි අගය නිර්මාණය)

| ප්‍රාග්ධනය | දර්ශකය | 2020 මාර්තු 31 දිනට/දිනෙන් අවසන් වූ වසර සඳහා | 2019 මාර්තු 31 දිනට/දිනෙන් අවසන් වූ වසර සඳහා | වර්ධනය |
|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | දළ ආදායම (රු. මිලියන) | **33,599.31** | 32,735.64 | 2.64% |
| | බදු පසු ලාභය (රු. මිලියන) | **2,942.51** | 4,416.12 | (33.37%) |
| | මුළු වත්කම් (රු. මිලියන) | **171,660.19** | 172,541.28 | (0.51%) |
| | වත්කම් මත ඉපයීම (%) | **2.64** | 3.95 | (1.31) |
| | ස්කන්ධය මත ඉපයීම (%) | **10.00** | 15.88 | (5.88) |
| | කොටසකට ශුද්ධ වත්කම් (රු.) | **18.58** | 18.10 | 2.65% |
| | පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය (%) | **15.12** | 14.36 | 0.76 |
| | මුළු ප්‍රාග්ධන අනුපාතය (%) | **15.99** | 15.20 | 0.79 |
| | වෙළෙඳපොළ ප්‍රාග්ධනකරණය (රු. මිලියන) | **19,857.98** | 21,170.16 | (6.18%) |
| | පොතේ අගයට මිල (වාර) | **0.66** | 0.74 | (10.81%) |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | දේපල, පිරියත සහ උපකරණ (PPE) (රු. මිලියන) | **1,143.93** | 1,098.29 | 4.16% |
| | වසර තුළ PPE හි ආයෝජනය (රු. මිලියන) | **213.93** | 147.67 | 44.87% |
| | ශාඛා ජාලය | **103** | 103 | – |
| | රන් ණය ඒකක | **14** | 6 | 8 |
| බුද්ධිමය ප්‍රාග්ධනය | සන්නාම වටිනාකම (රු. මිලියන) | **8,786** | 8,719 | 0.77% |
| | අස්පෘශ්‍ය වත්කම් (රු. මිලියන) | **257.58** | 324.91 | (20.72%) |
| | හඳුන්වාදෙන ලද නව නිෂ්පාදන (ගණන) | **1** | 6 | (5.00) |
| | සයිබර් ආරක්ෂාව සඳහා කළ වියදම සහ සහතික කිරීම් ලබාගැනීම සඳහා දරණ ලද වියදම (රු. මිලියන) | **1.39** | 0.55 | 152.73% |
| | සේවකයින්ගේ සමුච්චිත සේවය (අවුරුදු) | **15,000 ට වැඩි** | 13,000 ට වැඩි | 2000 ට වැඩි |
| | එක් සේවකයෙකුගේ සාමාන්‍ය පළපුරුද්ද | **වසර 6 ට වැඩි** | වසර 5 ට වැඩි | වසර එක |
| | ණය ශ්‍රේණිගතකරණ | **A+(lka) ෆිට්ච් රේටින් ලංකා ලිමිටඩ් B–ෆිට්ච් රේටින් ඉන්ටර්නැෂනල්*** | AA-(lka) ෆිට්ච් රේටින් ලංකා ලිමිටඩ් විසින් B–ෆිට්ච් රේටින් ඉන්ටර්නැෂනල් | |

*2020 අප්‍රේල් 30 වන දින සිට ෆිට්ච් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමෙන් ඉවත් විය.

# ව්‍යාපාර ආකෘතිය

| ප්‍රාග්ධනය | දර්ශකය | 2020 මාර්තු 31 දිනට/දිනෙන් අවසන් වූ වසර සඳහා | 2019 මාර්තු 31 දිනට/දිනෙන් අවසන් වූ වසර සඳහා | වර්ධනය |
|---|---|---|---|---|
| **සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය** | | | | |
| ගනුදෙනුකරු | ගනුදෙනුකරුවන් මුළු ගණන | **339,798** | 311,135 | 9.21% |
| | – ණය ගනුදෙනුකරුවන් | **126,715** | 121,129 | 4.61% |
| | – තැන්පතු ගනුදෙනුකරුවන් | **282,944** | 248,587 | 13.82% |
| | නව ගනුදෙනුකරුවන් ගණන | **29,537** | 32,848 | (10.08%) |
| | නැවත පැමිණෙන ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිශතය (%) | **44.22** | 43.47 | 0.75% |
| | ණය සහ ලැබීම් කළඹ (රු. මිලියන) | **147,747.51** | 151,707.90 | (2.61%) |
| | තැන්පතුවල වෙළෙඳපොළ කොටස (%) | **14.10** | 12.33 | 1.77 |
| | මුළු වත්කම්වල වෙළෙඳපොළ කොටස (%) | **11.98** | 12.05 | (0.07) |
| | මුළු තැන්පතුවලට ඉතුරුම් (%) | **6.35** | 6.04 | 0.31 |
| ව්‍යාපාර හවුල්කරු | මෝටර් රථ සැපයුම්කරුවන් ගණන | **32,406** | 28,661 | 13.07% |
| | ප්‍රසම්පාදිත මෝටර් රථ සැපයීම්වල මුළු වටිනාකම (රු. මිලියන) | **60,616.17** | 66,800.57 | (9.26%) |
| ප්‍රජාව | දේශීය ප්‍රජාවන්හී ආයෝජනය (රු. මිලියන) | **55.53** | 120.29 | (64.76%) |
| | පුහුණුකළ/දැනුවත්කළ ව්‍යවසායකයින් ගණන | **101** | 1,710 | (94.09%) |
| | ව්‍යවසාය සංවර්ධනය කෙරෙහි මුළු ආයෝජනය (රු. මිලියන) | **3.05** | 8.15 | (62.58%) |
| **මානව ප්‍රාග්ධනය** | සේවක සංඛ්‍යාව | **2,401** | 2,329 | 3.09% |
| | සේවකයෙකුට පුහුණු පැය ගණන (පැය) | **8.73** | 17.90 | (9.17) |
| | පුහුණු වියදම (රු. මිලියන) | **3.38** | 12.93 | (73.86%) |
| | සේවකයෙකුට බදු පසු ලාභය (රු. මිලියන) | **1.24** | 2.00 | (38.00%) |
| | සේවක රඳවාගැනීමේ අනුපාතය (%) | **90.82** | 88.90 | 2.16 |
| **ස්වාභාවික ප්‍රාග්ධනය** | පාරිසරික වැඩසටහන්වල ආයෝජනය (රු. මිලියන) | **3.32** | 1.94 | 71.13% |
| | කාබන් පාසටහන ($tCO_2eq$) | **7,955.83** | 6,113.66 | 30.13% |
| | බලශක්ති පරිභෝජනය (කි.වොට්) | **$14.5x10^6$** | $4.5x10^6$ | $9.95x10^6$ |
| | හරිත පහසුකම් (රු. මිලියන) | **1.87** | 5.48 | (65.88%) |

# මෙහෙයුම් පරිසරය



## 2019/20 හි ලෝක ආර්ථිකය

ලෝක ආර්ථික දළ විශ්ලේෂණයට අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2.9% ක් වූ අතර එය පසුගිය දශකය තුළ වාර්තාකළ අඩුම වර්ධන අනුපාතය වේ. වසර තුළ වෙළෙඳ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව, භූගෝලීයමය ආතතීන් සහ නැගීඑන ප්‍රධාන වෙළෙඳපොල ආර්ථිකයන් හී විශේෂිත පීඩනය පෙන්නුම්කළ අතර විශේෂයෙන් නිෂ්පාදන සහ වෙළෙඳ අංශයන්හී ගෝලීය ආර්ථික නිමැවුම් කෙරෙහි එය බලපාන ලදී.

ලෝකයේ විශාලතම ආර්ථිකයන් වන, එක්සත් ජනපදය, යුරෝ ප්‍රදේශය සහ චීනය 2019 දී කාර්යයන්හි සැලකියයුතු පහළ වැටීමකට මුහුණ දෙන ලදී. ලොව වටා රටවල් තුළ ආර්ථික කටයුතු කෙරෙහි මින් බලපෑමක් ඇත.

2018 දී ඇති වූ චීනය සහ ඇමෙරිකාව අතර වෙළෙඳ ආරාවුල 2019 දෙසැම්බර් ඉවත් විය. බ්‍රෙක්සිට් පිළිබඳ සැකසහිත බව වසර තුළ විශාල කාර්යභාරයක් ඉටු කරන ලදී. කෙසේවෙතත්, බ්‍රෙක්සිට් වටා අවිනිශ්චිතතාව සංක්‍රාන්ති කාලසීමාව නියම කිරීමෙන් පසු 2020 ජනවාරි 31 දින යුරෝ සංගමයෙන් ඉවත්වන බව එක්සත් රාජධානිය ප්‍රකාශ කිරීමත් සමඟ එය ඉවත් විය.

2020 දී ලොව පුරා කොවිඩ්-19 වසංගතය පැතිරීම ගෝලීය වර්ධනය සහ ලොව වටා ආර්ථිකයන් කෙරෙහි පෙර නොවූ විරූ සහ කලින් දනගත නොහැකි බලපෑමක් ඇති කරනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වසංගතයට පෙර 2020 සඳහා 3.3%ක වර්ධනයක් තක්සේරු කළ අතර, එතැන් පටන් එය විශාල ලෙස සංශෝධනය කර ඇත. මෙම වාර්තාව නිකුත් කරන අවස්ථාවේදී පවා වසංගතය අඛණ්ඩව පවත්නා බැවින්, සමස්තයක් ලෙස ඉන් ගැඹුරු බලපෑමක් ඇතිවනු ඇත.

## ශ්‍රී ලාංකීය ආර්ථිකය

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2015 සිට පහත වැටෙන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, 2018 දී වාර්තාකළ 2.3%ට සාපේක්ෂව 2019 දී 3.3%ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී. මෙය 2001 සිට අඩුම වර්ධනය වේ.

උදාසීන ආර්ථික කටයුතු සමඟ පාස්කු ප්‍රහාර සහ අහිතකර කාලගුණ තත්ත්වයන් නිසා ඇති වූ කෘෂිකර්මාන්තයේ අඩු කාර්යසාධනය මෙයට ප්‍රධාන හේතුව විය.

ආර්ථිකයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වියහැකි දුර්වලවීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාවේ අනාගත දැක්ම පහළට සංශෝධනය කළත්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ශ්‍රේණිගතකරණය 2019 දී ප්‍රධාන ජාත්‍යන්තර ශ්‍රේණිගතකරණ ආයතන විසින් තහවුරු කරන ලදී. ෆිට්ච් රේටින් සහ එස් ඇන්ඩ් පී ග්ලෝබල් රේටින් විසින් 2019 දෙසැම්බර් හි ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගතකරණ "B" ලෙස තහවුරු කරන ලද අතර මූඩීස් ඉන්වෙස්ටර්ස් සර්විසස් (මූඩීස්) 2019 දී එය "B2" ලෙස තහවුරු කරන ලදී.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) යන ද්විත්වයෙන් මනින ලද උද්ධමනය මැදි තනි අංක මට්ටමක රඳවාගැනීම හමුවේ 2019 දී පිළිවෙළින් 4.8% සහ 6.2% දක්වා ඉහළ ගියේය.

## බැංකු නොවන මූල්‍ය ආයතන අංශය [NBFI]

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2019 වාර්ෂික වාර්තාව අනුව, වෙළෙඳපොල කොන්දේසි සහ සමාජ-දේශපාලනික බලපෑම් හමුවේ ශ්‍රී ලංකාව තුළ බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා අභියෝගාත්මක වසරක් විය. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (LFCs) සහ විශේෂ කල්බදු සමාගම් (SLCs) අංශය වත්කම් පදනම් තුළ සුළු ව්‍යාප්තියක් පමණක් පෙන්නුම්කළ අතර, අංශයේ කාර්යසාධනය සෘණාත්මක ණය වර්ධනය සමඟ පිරිහීමට ලක්විය. මෙය ලාභදායිතාව අඩුකිරීමට සහ අක්‍රීය ණය වැඩිවීමකට හේතු විය. කෙසේවෙතත්, සමස්තයක් ලෙස මෙම අංශය අවම නියාමන මට්ටම්වලට වඩා ඉහළ ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වාගන්නා ලදී.

2019 දී, මෙම අංශයේ දිගු කාලීන තිරසාරභාවය සහතික කිරීම පිණිස තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමට උත්සාහ ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව දැඩි නියාමන පියවර සහ ආරක්ෂිත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය. අංශයේ මුළු වත්කම් පදනම වසර තුළ සුළු වශයෙන් පුළුල් වූ අතර, අංශයේ ණය වර්ධනය 2019 දී සෘණාත්මකව පැවතුණි. ආයෝජන කළඹ සැලකියයුතු වැඩිවීමක් වාර්තාකළ අතර ඒ සඳහා ණය සඳහා සීමිත ඉල්ලුම සහ අංශය විසින් ණයදීමේදී පරීක්ෂාකාරී ප්‍රවේශය හමුවේ වුවත් රජයේ සුරැකුම්පත්, ස්කන්ධ, ඒකක, සහ අනෙකුත් ණය උපකරණ හා නිශ්චල දේපලවල වැඩිකළ ආයෝජය හේතු විය. අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය තුළ පිරිහීම 2019 දී අක්‍රිය ණය අනුපාතයේ වැඩිවීම මගින් පිළිබිඹු කරන ලදී. ඒ අතරම, මෙම අංශය 2018 දී වාර්තාකළ ලාභයට සාපේක්ෂව බදු පසු ලාභය තුළ සැලකියයුතු පහත වැටීමක් වාර්තාකළ අතර ඒ සඳහා පොළී නොවන වියදම් සහ ඉහළ ණය අලාභ වෙන්කිරීම් ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළ වත්කම් මත ඉපයීම සහ ස්කන්ධය මත ඉපයීම තුළ අඩුවීම මගින් ලාභදායිතාව කෙරෙහි පීඩනයේ සංඥා ද පිළිබිඹු කරන ලදී. රක්ෂණ අංශය එහි වත්කම් පදනමේ වර්ධනයක් වාර්තා කරමින් 2019 තුළ මධ්‍යස්ථ ලෙස පුළුල් විය. සේවක අර්ථ සාධක අරමුදල (EPF) සහ සේවක අරමුදල (ETF) විසින් තහවුරුකළ ගිවිසුම්ගත ඉතුරුම් ආයතන ද සාමාජිකත්වයට සැලකියයුතු ධනාත්මක සැබෑ ප්‍රතිඵල ලබාදෙමින් මධ්‍යස්ථ කාර්යසාධනය වාර්තා කරන ලදී.

## කොවිඩ්-19 හි බලපෑම

මෙම අංශය කොවිඩ්-19 වසංගතය පැතිරීමට පෙර පවා විවිධ අභියෝගවලට මුහුණදෙමින් ලාභදායිතාව දුර්වලව පැවතිණ. ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 රෝගීන්ගේ රෝග නිශ්චයෙන් පසු, 2020 මාර්තු මැද සිට ඉදිරියට, රජය විසින් වයිරසය මැඩ පැවැත්වීම සඳහා දුරදක්නා ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. පොදු ජනතාව සඳහා "නිවසේ සිට වැඩකිරීම" මෙන්ම "අත්‍යවශ්‍ය සේවා" සඳහා හැර සියලුම අංශ සහ සේවා සඳහා 2020 මාර්තු 20 සිට දිවයින පුරා ඇඳිරි නීතිය පැනවීම මෙයට ඇතුළත්ය. රට තුළ ඇඳිරි නීති සීමාවන් ක්‍රමානුකූලව වැඩිකර ඇත. 1 කාර්තුව තුළ මෙම අංශයේ ප්‍රතිසාධනයක් පැවති අතර, වසංගතය සහ ඉන් ඇති වූ මූල්‍ය බලපෑම් සහ සීමාවන් සහ රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අංශයේ ලාභය සඳහා දැඩිලෙස බලපාන ලදී.

## මූල්‍ය වසර තුළ පීපල්ස් ලීසිං

### 2019 – 2 කාර්තුව

පාස්කු ප්‍රහාර දේශීය ආර්ථිකය, බැංකු නොවන මූල්‍ය අංශය සහ සමාගම කෙරෙහි දැඩි ලෙස බලපාන ලද අතර, එයට ව්‍යාපාර අවස්ථාවන්ට හා අයකර ගැනීම්වලට වූ බලපෑම ප්‍රධානය. කෙසේවෙතත්, අර්බුදයට මුහුණ දීමේදී සහ මෙම දුෂ්කර කාලසීමාව තුළ පැහැර හැරීමේ සහන සහ අනුග්‍රහක කාලසීමාවන් ආකාරයෙන් වඩාත් අවශ්‍ය සහන අපගේ ගනුදෙනුකරුවන්ට පිරිනැමීමේදී අපි සක්‍රිය විය. ගනුදෙනුකාර මැසිවිලි නිරාකරණය කිරීම සඳහා සමාගම සැමටම පොදු පදනම් ප්‍රතිපත්තියක් වෙනුවට, සිද්ධියෙන් සිද්ධිය සැලකිල්ලට ගෙන සේවාදායකයින්ට පැහැරහැරි පොළී 100%කින් කපාහැරීම ඇතුළත් සහන ලබාදීමට අපි ශාඛාවලට ඉඩ ලබා දුන්හ.

### 2019 – 3 කාර්තුව සහ 4 කාර්තුව

දේශපාලන අස්ථාවරත්වය ජනාධිපතිවරණය මෙන්ම බදු වෙනස්වීම්, පොළී සංශෝධන ඇතුළත් වෙනස්වීම් සහ අනෙකුත් මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම් ක්ෂේත්‍රය සහ සමාගම කෙරෙහි බලපාන ලදී. [ඉහත සඳහන් ක්ෂේත්‍රයේ දළ විශ්ලේෂණය බලන්න].

### 2020 – 1 කාර්තුව

ලෝකය සහ ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 පැතිරීම ආර්ථිකය, බැංකු නොවන මූල්‍ය අංශය සහ සමාගම වෙත දැඩි ලෙස බලපාන ලදී. සමාගමට ශ්‍රී ලංකා මහ බැංකුව සහ මූල්‍ය විමර්ශන ඒකකය (FIU) විසින් නිකුත් කරන ලද විලම්බන කාලය සහ අනෙකුත් මඟපෙන්වීම් සම්බන්ධයෙන් නියාමන බලපෑම කළමනාකරණය කර ගත යුතු තිබුණි. 2020 මාර්තු මැද සිට අඩු වූ ව්‍යාපාර පරිමාවන් සහ ණය නැවත අයකර ගැනීමේ අනුපාත සමඟ මෙහෙයුම් කෙරෙහි සුවිශාල බලපෑමක් තිබුණු අතර එය සමාගමේ ලාභ පහත වැටීමකට හේතු විය.

## කොවිඩ්-19 ට අපගේ සක්‍රිය ප්‍රතිචාරය

අපේක්ෂා නොකළ අභියෝග හමුවේ, විචක්ෂණශීලී ආකාරයෙන් වසංගතයට මුහුණදීම සඳහා සක්‍රිය ක්‍රියාමාර්ග අපි ගත්තෙමු. තීරණාත්මක කාර්යයන් හඳුනාගනු ලැබූ අතර අභ්‍යන්තර පද්ධති සංවර්ධනය කරන ලදී. එය හදිසි අවස්ථාවන් හිදී ක්‍රියාත්මක වීම සඳහා සේවකයින්ට ඉඩ ලබා දෙන ලදී. කළමනාකරණය විසින් තීරණාත්මක කාර්යයන් සඳහා නිවසේ සිට වැඩකිරීම සඳහා පහසුකම් සලසන ලදී. එමෙන්ම අර්බුදය කළමනාකරණය කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ලැබීය:

- පාස්කු ප්‍රහාරවලින් පසු අර්බුද කළමනාකරණ පද්ධති සහ ප්‍රාරම්භක ක්‍රියාමාර්ග ස්ථාපිත කරන ලද අතර එමනිසාම, පහසුවෙන් හදිසි ක්‍රියාපටිපාටිවලට මාරුවීමට අපට හැකිවිය.
- අතින් සිදුකළ සමහර ක්‍රියාවලි කෙටි කාලසීමාවක් තුළ පද්ධතිගත කරන ලදී.
- ජාතික නිරෝධායන මඟ පෙන්වීම් අනුගමනය කරමින්, සමාගම විසින් වහාම සනිපාරක්ෂක සහ ස්වස්ථතා අවශ්‍යතාවන් යොදා ගනු ලැබූ අතර ඉන් තෝරාගත් දිස්ත්‍රික්කවල ඇඳිරිනීති සීමාවන් ඉවත්කළ විට මෙහෙයුම් සිදුකිරීමට ඉඩ ලබාදෙන ලදී.
- මෙම ගෝලීය අර්බුද කාලය තුළ, අපගේ මූලික පරමාර්ථය වූයේ අපගේ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන් අපහසුතාවයට පත් නොකර සිටීමයි. මූල්‍ය සහන ලබාදීමට පියවර ගනිමින්, කාර්ය මණ්ඩලයේ අඩු සංඛ්‍යාවක් සමඟ වුවද අපි සෑම අවශ්‍යතාවක්ම සලසන ලදී.
- නවීන තොරතුරු තාක්ෂණය වෙනුවෙන් කළ පසුගිය ආයෝජනවලින් සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ශක්තිය තුළින් සමාගම විශාල වශයෙන් ප්‍රතිලාභ ලැබීය.

## කොවිඩ්-19 තුළ අපගේ සමාජීය වගකීම

- අපගේ අගනා සේවකයින් සහ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන් ඇතුළත් සියලුම පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය සහ සුභසාධනය අපගේ ඉහළම ප්‍රමුඛතාව විය.
- අපගේ බොහෝ ගනුදෙනුකරුවන් විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැඩි ලෙස පීඩාවට පත්විය. අර්බුදය අවසාන වන තුරු ඔවුන්ගේ ජීවනෝපායන් නැවත නගා සිටුවීම සඳහා ඔවුන්ට සහයවීමේදී අපගේ වගකීම් අපි අවබෝධ කර ගතිමු.
- මහ බැංකුවේ රෙගුලාසිවලට අනුව පීඩාවට පත් වූ පුද්ගලයින්ට සහයවීම සඳහා විලම්බන කාලසීමා ක්‍රියාවලිය ඵලදායීව කළමනාකරණය කර ගනිමින් මෙම ව්‍යාපාර සහ පුද්ගලයින් වෙත සහය වෙමින් අපගේ සැබෑ වගකීම අපි පෙන්නුම් කළෙමු.



# පාර්ශ්වකරුවන්



## පාර්ශ්වකරුවන් හඳුනාගැනීම, පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය, ප්‍රමාණාත්මක අනුරූපිතය සහ අපගේ වඩාත් අගනා පාර්ශ්වකරුවන්ට ප්‍රතිචාර දැක්වීම

පාර්ශ්වකරුවන් යනු අපගේ මෙහෙයුම් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති පුද්ගලයින් හෝ කණ්ඩායම් වේ. අපගේ පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ පැහැදිලි, විනිවිද, අනුරූප සහභාගිත්වයේ වැදගත්කම අපි අවබෝධ කරගන්නා අතර, ඔවුන්ගේ අපේක්ෂාවන් සපුරාලීමට ක්‍රමෝපායන් ක්‍රියාත්මක කර ඇත. අපගේ පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ සම්බන්ධතාව පවත්වා ගැනීමට විධිමත් යාන්ත්‍රණ ගණනාවක් අපි පවත්වා ගන්නෙමු. ඊට අමතරව, අපගේ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ සෑම අවස්ථාවකදීම ආයතනය පුරා එකී සම්බන්ධතාව වෙනුවෙන් වගකීම අපි හුවමාරු කර ගනිමු.

## පාර්ශ්වකරුවන් හඳුනාගැනීම

වගකීම් සහගත සහ සියල්ල ඇතුළත් මූල්‍ය විසඳුම් සපයන්නෙක් වශයෙන්, ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට අපි උත්සාහ ගනිමු. අපගේ දැක්ම, මෙහෙවර, අරමුණ සහ අපගේ සදාචාර සංග්‍රහය අනුව, අපගේ වඩාත් වටිනා පාර්ශ්වකරුවන් කරා වගකීමෙන් කටයුතු කිරීමට අපගේ බැඳීම අපි රඳා පවත්වා ගනිමු.

අපගේ පාර්ශ්වකරුවන් වන්නේ අපගේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සහ අපගේ ව්‍යාපාර කටයුතු අපි පවත්වන ආකාරය කෙරෙහි සැලකියයුතු ලෙස බලපාන හෝ සැලකියයුතු බලපෑම් කළ හැකි පුද්ගලයින්, කණ්ඩායම් සහ ආයතන වේ.

**ආයෝජකයින්**

**ගනුදෙනුකරුවන්**

**සේවකයින්**

**සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්**

**ප්‍රජාව සහ පරිසරය**

**රජය සහ නියාමන ආයතන**

## අපගේ මෙහෙයුම් පරිසරය තුළ නිරීක්ෂිත ප්‍රවණතා

පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබාදීම කෙරෙහි අපි අවධානය යොමු කරන බැවින්, අපට ධනාත්මක බලපෑමක් කළහැකි යයි අප විශ්වාස කරන වැදගත් මාතෘකා හඳුනාගැනීම අපට අවශ්‍ය වේ. මෙම මාතෘකා අපගේ ප්‍රධාන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අපගේ මෙහෙයුම් පරිසරය තුළ නිරීක්ෂිත පහත සඳහන් ප්‍රවණතා හඳුනාගැනීම මගින් තීරණය කෙරේ.

- මූල්‍ය අන්තරකරණය වැඩිවෙමින් පවත්නා ජාතික අවශ්‍යතාවයකි
- දේශපාලන අස්ථාවරත්වය
- තාක්ෂණික නව්‍යකරණය
- නියාමන සංවර්ධනයන්
- ඩිජිටල් මූල්‍යකරණය තුළ ආරක්ෂාව සහ රහස්‍යතා පාලනය
- ඉහළ බලපෑම් සහිත කාලගුණ අවස්ථා
- අනපේක්ෂිත රෝග පැතිරීම
- කාලගුණ වෙනස
- තරඟකරුවන් සහ නව ඩිජිටල් සේවා සපයන්නන්ගෙන් වැඩි වූ තරඟය
- වේගයෙන් වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන් සහ හැසිරීම්
- කෘතීම බුද්ධිය සඳහා ඉල්ලුම

## පාර්ශ්වකාර සහභාගිත්වය

වසර පුරාම විමධ්‍යගත පාර්ශ්වකාර සහභාගිත්ව ප්‍රවේශයක් තුළින් අපගේ පාර්ශ්වකරුවන් සමඟ අපි කටයුතු කරන අතර එක් එක් පාර්ශ්වකාර කණ්ඩායම්වල අවශ්‍යතාවන්ට අනුව විවිධ සහභාගිත්ව අවකාශ අපි භාවිතා කරමු.

අපගේ තිරසාර වර්ධනය අප නිර්මාණය කරන වටිනාකම පිළිබඳ අපගේ ප්‍රධාන පාර්ශ්වකාර අවබෝධය මත රඳා පවතින බව අපි අවබෝධ කර ගනිමු. එබැවින්, පහත සඳහන් මාර්ග තුළින් අපගේ පාර්ශ්වකරුවන් සමඟ නිරත වෙමින් ලබා ගන්නා වටිනාකම පිළිබඳ ඔවුන්ගේ අදහස් සහ අවබෝධය පිළිබඳව ඔවුන්ගේ ප්‍රතිචාර අපි අගය කරමු.

## පාර්ශ්වකාර සහභාගිත්වය, වාරගණන, ඔවුන්ගේ ගැටලු, සහ අපගේ ප්‍රතිචාරය



# පාර්ශ්වකරුවන්

| පාර්ශ්වකරු | සහභාගිත්ව රටාව | වාර ගණන | ප්‍රධාන ගැටලු | අපගේ ප්‍රතිචාර |
|---|---|---|---|---|
| **ආයෝජකයින්** | වාර්ෂික වාර්තාව<br>අතුරු මූල්‍ය ප්‍රකාශ<br>වාර්ෂික මහ සභා රැස්වීම<br>කොළඹ කොටස් හුවමාරුව වෙත අනාවරණ සහ නිවේදන<br>ආයතනික වෙබ් අඩවිය<br>විද්‍යුත් ලිපින සහ දුරකථනය<br>ලිඛිත සන්නිවේදනය<br>පුවත් නිවේදන<br>මුහුණට මුහුණ සාකච්ඡා | වාර්ෂිකව<br>කාර්තුමය<br>වාර්ෂිකව<br>අවශ්‍ය පරිදි<br>අඛණ්ඩව<br>අඛණ්ඩව<br>අවශ්‍ය පරිදි<br>අවශ්‍ය පරිදි<br>අවශ්‍ය පරිදි | තුළනය කළ කාර්යසාධනය, විනිවිදභාවය<br>අනුරූප ලාභ මාර්ගය<br>ව්‍යාපාර අඛණ්ඩතාව<br>ESG ගැටලු<br>ඩිජිටල් මාර්ග කරා සංක්‍රමණය<br>කීර්තිනාමය, විශ්වසනීයත්වය සහ සන්නාම ප්‍රතිරූපය<br>අවම මෙහෙයුම් වියදම්<br>වත්කම්වල ගුණාත්මකභාවය, අඩුකළ අක්‍රීය ණය<br>වර්ධනය සඳහා සැලසුම් | ඒකාබද්ධ කාර්යසාධනය පිළිබඳ තොරතුරු මුදාහැරීම සහ ප්‍රසිද්ධකිරීම<br>කාර්යසාධනය පදනම් සංස්කෘතිය<br>විචක්ෂණ අවදානම් කළමනාකරණ ව්‍යවහාර/ආයතනික පාලන රාමුව<br>ප්‍රශස්ථ සම්පත් භාවිතය<br>ඩිජිටල් මාර්ග සංවර්ධනයට අභ්‍යන්තර සංවර්ධකයින් තුළ ආයෝජනය සහ දිරිගැන්වීම<br>ස්වාධීන ආයතන/ශ්‍රේණිගතකරණ ආයතන විසින් පිළිගැනීම් සහ ශ්‍රේණිගතකරණය<br>ඵලදායී සම්පත් ප්‍රශස්ථකරණය, කාර්යසාධනය පදනම් ප්‍රදාන<br>දැඩි පිරිවැය කළමනාකරණ ක්‍රම<br>ගනුදෙනුකාර උපදේශන සේවා<br>තිරසාර වටිනාකම ලබාදීමේ ක්‍රමෝපායන් |
| **ගනුදෙනුකරුවන්** | මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය<br>ලිඛිත සන්නිවේදන<br>ඇමතුම් මධ්‍යස්ථානය, ශාඛා ජාලය<br>තාක්ෂණය පදනම් අවකාශ<br>ගනුදෙනුකරුවන් හමුවීම<br>දෛනික ව්‍යාපාර මැදිහත්වීම්<br>ආයතනික වෙබ් අඩවිය<br>පුවත් නිවේදන<br>දැන්වීම්/ප්‍රචාරණ වැඩසටහන්<br>CSR වැඩසටහන්<br>මුහුණට මුහුණ සාකච්ඡා | අඛණ්ඩව<br>අවශ්‍ය පරිදි<br>24×7, ව්‍යාපාර පැය<br>අඛණ්ඩව<br>අඛණ්ඩව<br>අඛණ්ඩව<br>අඛණ්ඩව<br>අවශ්‍ය පරිදි<br>අවශ්‍ය පරිදි<br>අවශ්‍ය පරිදි<br>අවශ්‍ය පරිදි | සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය<br>නිෂ්පාදන/සේවා අදාළ තොරතුරු<br>පිවිසිය හැකි බව, පහසුව<br>ඩිජිටල් මාර්ගවලට සංක්‍රමණය<br>මූල්‍ය සාක්ෂරතාව, උපදේශන, සම්බන්ධතා කළමනාකරණය<br>ණයගැනීම් පිරිවැය, ROI<br>කඩිනම් සේවය<br>පැමිණිලි<br>ස්ථාවර ශ්‍රේණිගතකරණය<br>සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුභසාධනය<br>ගනුදෙනුකාර රහස්‍යතාව | නව නිෂ්පාදන සහ ආයතන පුවත් පිළිබඳ සමාජ සහ මුද්‍රිත මාධ්‍ය කෙරෙහි වැඩි වූ පැවැත්ම<br>අඛණ්ඩ ත්‍රෛභාෂා පැහැදිලි සන්නිවේදනය<br>වැඩිවන පිවිසීම කරා තාක්ෂණය මත පදනම් මූල්‍ය අවකාශය වන "PLC මාර්ගගත" ප්‍රවර්ධනය කිරීම<br>ඩිජිටල් මාර්ග පිළිබඳ කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ කාර්යස්ථ පුහුණුව<br>පුහුණු කාර්ය මණ්ඩලය තුළින් අඛණ්ඩ ගනුදෙනුකාර මූල්‍ය උපදේශනය<br>ගනුදෙනුකාර ආදායම් රටාව/ආයෝජන සැලැස්මට ගැලපෙන නිෂ්පාදන අඛණ්ඩව පිරිනැමීම<br>ඉ-මෙමෝ ක්‍රමය තුළින් තීරණ ගැනීම සඳහා ගනු ලැබූ කාලය අඩුකිරීම<br>ගනුදෙනුකාර පැමිණිලි විසඳුම් ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම<br>විධිමත් ගනුදෙනුකාර පැමිණිලි විසඳුම් ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම<br>අපගේ සම්බන්ධිත ස්ථානවල කොවිඩ්-19 අදාළ ආරක්ෂිත ක්‍රියාමාර්ග හඳුන්වාදීම<br>පද්ධති පදනම් පාලනය තුළින් ගනුදෙනුකාර දත්තවල රහස්‍යතාව ශක්තිමත් කිරීම |

# පාර්ශ්වකරුවන්



| පාර්ශ්වකරු | සහභාගිත්ව රටාව | වාර ගණන | ප්‍රධාන ගැටලු | අපගේ ප්‍රතිචාර |
|---|---|---|---|---|
| **සේවකයින්** | කළමනාකරණ කමිටු රැස්වීම් | අවශ්‍ය පරිදි | ප්‍රමාණාත්මක ගැටලු<br>තිරසාර වර්ධනය සඳහා සැලසුම්<br>ව්‍යාපාර අඛණ්ඩතාව<br>සේවක දැනුවත්භාවය<br>මෙහෙයුම් වෙනස්වීම්<br>කාර්ය මණ්ඩලය අනාගතයට සූදානම් කිරීම<br>සේවක ඇගයීම සහ ජයග්‍රහණ<br>නිපුනතා ඉහළ දැමීම සහ වෘත්තීය ප්‍රගතිය<br>සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව<br>ව්‍යාපාර සදාචාර<br>පාරිශ්‍රමික සහ අනෙකුත් ප්‍රතිලාභ | පාස්කු ප්‍රහාරවලින් පසු සහ කොවිඩ්-19 අතරතුර ව්‍යාපාර මෙහෙයුම් අඛණ්ඩතාව<br>සමාගම වෙනුවෙන් ක්‍රමෝපායික සැලැස්ම සැකසීම සඳහා විවිධ මට්ටමේ කාර්ය මණ්ඩලය සහභාගිත්වය<br>කාර්යසාධන සමාලෝචන සහ මෙහෙයුම් පරිසරය තුළ ඇති අවිනිශ්චිතතාව මත පදනම් මෙහෙයුම් වෙනස් වීම්.<br>නවීන සංවර්ධනයක් පිළිබඳ කාර්ය මණ්ඩලය පොලඹවීම සහ කාර්ය මණ්ඩලය යාවත් කිරීම<br>කොවිඩ්-19 තුළ නිවසේ සිට වැඩකිරීමේ පහසුව, සුහසාධන උත්සව, සේවක දක්ෂතා ප්‍රවර්ධනය කිරීමේ ක්‍රීඩා උත්සවවලදී ඔහුන්ට සහයවීම<br>කාර්ය මණ්ඩලයේ දැනුම, දක්ෂතා සහ හැකියාවන් සංවර්ධනය<br>කැපීපෙනෙන සේවක කාර්යසාධනය හඳුනාගැනීමට සහ ඇගයීම සඳහා "ප්‍රිමියර් අවෝර්ඩ්ස්" සංවිධානය කිරීම.<br>සේවක ගැටලු මතුකිරීමට අවකාශයක් ස්ථාපිත කිරීම<br>අපගේ සම්බන්ධිත ස්ථානවලදී කොවිඩ්-19 අදාළ ආරක්ෂිත ක්‍රියාමාර්ග හඳුන්වාදීම<br>වගකීම්සහගත ව්‍යාපාර නිර්ණායක පිළිබඳ ස්වේච්ඡා අනුකූලතාව ප්‍රවර්ධනය<br>බාධාකාරී මෙහෙයුම් හමුවේ ආයතනික කළමනාකරණය කාර්ය මණ්ඩලය දිරි ගැන්වීම සඳහා ප්‍රතිලාභ ලබාදීම |
| | ක්‍රමෝපායික සැලසුම් සැසිය | වාර්ෂිකව | | |
| | විද්‍යුත් ලිපින/චක්‍රලේඛ හරහා ආයතනික සන්නිවේදනය | අවශ්‍ය පරිදි | | |
| | සමාජ මාධ්‍ය කණ්ඩායම් සහ පාඨ පණිවිඩ | කලින් කල | | |
| | තාක්ෂණය පදනම් කරගත් අවකාශ | කලින් කල | | |
| | මාර්ගගත ඉගෙනුම, කාර්යස්ථ පුහුණුව, ටෝස්ට්මාස්ටර්ස් ක්ලබ් | අඛණ්ඩව | | |
| | වාර්ෂික සේවක ඇගයීමේ සම්මාන | අඛණ්ඩව | | |
| | පීපල්ස් ලීසිං සේවක සංගමය | අඛණ්ඩව | | |
| | මෙහෙයුම් මාර්ගෝපදේශ | අඛණ්ඩව | | |
| | සේවක මැසිවිලි | අඛණ්ඩව | | |
| **සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්** | සෘජු සාකච්ඡා | අවශ්‍ය පරිදි | සදාචාර මූලාශ්‍ර තුළින් මිලට ගැනීම<br>ලාභදායිතාව<br>නව ව්‍යාපාර අවස්ථා<br>සාධාරණ මිල<br>කාලීනව ලබාදීම<br>අනුකූලතාව<br>වගකීම්සහගත ශ්‍රම යොදාගැනීම<br>වගකිම්සහගත පාරිසරික ව්‍යවහාර | කාර්යසාධනය නියාමනය කිරීමට සැපයුම්කරුවන් සමඟ නිරන්තර සහභාගිත්වය<br>වගකිම්සහගත ව්‍යාපාර පරිචයන් සඳහා සැපයුම්කරුවන් නිරීක්ෂණය<br>සදාචාර සැපයුම්කරුවන් තෝරාගැනීමට සාක්ෂිපත් සමාලෝචනය සහ යාවත් කිරීම<br>විශ්වාසවන්ත සැපයුම්කරුවන් සඳහා නව්‍යකරණය දිරිගැන්වීම<br>ව්‍යාපාර පුළුල් කිරීමට සැපයුම්කරුවන් දිරි ගැන්වීම<br>සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගෙන් අඛණ්ඩව සේවය ලබා ගැනීම<br>අඛණ්ඩ සාධාරණ මූලාශ්‍ර ව්‍යවහාර<br>සැපයුම්කරුවන්ට වර්ධනය සඳහා සහාය වීමට උපදේශන සේවා ලබාදීම |
| | සැපයුම්කරුවන් ඇගයීම | වාර්ෂිකව | | |
| | සැපයුම්කරුවන් ලියාපදිංචිය | වාර්ෂිකව | | |
| | ක්ෂේත්‍ර චාරිකා | කලින් කල | | |
| | අවබෝධතා ගිවිසුම් | අවශ්‍ය පරිදි | | |
| | සේවා ගිවිසුම් | වාර්ෂිකව | | |
| | ලිඛිත සන්නිවේදන (ලිපි/විද්‍යුත් ලිපි) | අවශ්‍ය පරිදි | | |
| | දුරකථන සාකච්ඡා | අවශ්‍ය පරිදි | | |

# පාර්ශ්වකරුවන්

| පාර්ශ්වකරු | සහභාගිත්ව රටාව | වාර ගණන | ප්‍රධාන ගැටලු | අපගේ ප්‍රතිචාර |
|---|---|---|---|---|
| **ප්‍රජාව සහ පරිසරය** | ආයතනික වෙබ් අඩවිය | අඛණ්ඩ | සමාජ විරෝධී කටයුතුවල සහභාගිත්වය | අපගේ මෙහෙයුම්වල අවම සෘණාත්මක සෘජු සමාජීය බලපෑම සහතික කිරීම |
| | සෘජු සන්නිවේදනය | අවශ්‍ය පරිදි | යටිතල පහසුකම් අවශ්‍යතා සපුරා නැතිකම/අඩුවෙන් සපුරාලීම | පොදු යටිතල පහසුකම් සංවර්ධනය තුළ ආයෝජනය |
| | ආයතන, ප්‍රජා නායකයින් සහ ප්‍රජාව පදනම් ආයතන (CBOs) සමඟ සාකච්ඡාව | අවශ්‍ය පරිදි | පොදු සේවා වර්ධනය | පොදු යටිතල සේවා වර්ධනය තුළ ආයෝජනය |
| | පොදු උත්සව සහ පුහුණු කිරීමේ/දැනුවත් කිරීමේ වැඩසටහන් | අවශ්‍ය පරිදි | මූල්‍ය සාක්ෂරතාව නොමැතිකම | මූල්‍ය සාක්ෂරතාව ඇති කිරීම |
| | CSR වැඩසටහන්වල ප්‍රතිඵල | CSR සැලැස්ම පරිදි | ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ මග පෙන්වීම | මූල්‍ය උපදේශන ලබාදීම |
| | ක්ෂේත්‍ර චාරිකා සහ ණය ඇගයීම් | අවශ්‍ය පරිදි | වෘත්තීය අධ්‍යාපනය තුළ සීමාවන් | වෘත්තීය අධ්‍යාපනයට සහයවීමට අඛණ්ඩ වෘත්තීය ශිෂ්‍යත්ව |
| | පුවත් නිවේදන | අවශ්‍ය පරිදි | වගකීම්සහගත ණයදීම | SDGs ඉහළ නැංවීම සඳහා දායකවීම |
| | සමාජ මාධ්‍ය | විධිමත් පදනමක් මත | තිරසාර සංවර්ධන අරමුණු (SDGs) ඉහළ නැංවීම | කොවිඩ්-19 වැළැක්වීම පිළිබඳ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම |
| | අනුග්‍රහකත්ව | අවශ්‍ය පරිදි | සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුබසාධනය | ප්‍රජාව පදනම් ජාතික ප්‍රමුඛතා විසඳීමට සහයවීම |
| | දුරකථන සාකච්ඡා සහ ලිඛිත සන්නිවේදනය | අඛණ්ඩ | ප්‍රජා සවිබලගැන්වීම සහ හැකියා වර්ධනය | අපගේ මෙහෙයුම්වල අවම සෘණාත්මක සෘජු පාරිසරික බලපෑම සහතික කිරීම |
| | පාරිසරික කළමනාකරණ ක්‍රමය | වාර්ෂිකව | පරිසරයට අදාළ නීති කඩකිරීම | පරිසර හිතකාමී ව්‍යාපාර පරිචයන් පිළිබඳ කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් අඛණ්ඩව දැනුවත් කිරීම |
| | කාබන් පා සටහන, දත්ත හඹායාමේ ව්‍යවහාර | අවශ්‍ය පරිදි | අනාගත අවදානම් සහිත ගනුදෙනු | වගකීම්සහගත ණයදීම පිළිබඳ ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය සඳහා ඉ-ඉගෙනුම සහ අභ්‍යන්තර පුහුණුව ලබාදීම |
| | පරිසරයට අදාළ දැනුවත් කිරීමේ/පුහුණු වැඩසටහන් | අවශ්‍ය පරිදි | සම්පත් භාවිතය ප්‍රශස්ථ කිරීම | 7වැනි වරට කාබන් පා සටහන් ගණනය කිරීම/සමාජීය බලපෑම් සහිත හරිත CSR වැඩසටහන්වල රු. මිලියන 3.32ක් ආයෝජනය |
| | | | වගකීම්සහගත මූලාශ්‍රකරණය | රු. මිලියන 1.87ක් වටිනා හරිත වාහන පහසුකම් බෙදාහැරීම |
| | | | පාරිසරික දූෂණය | කි.ග්‍රෑ. 3.55ක් වටිනා උපද්‍රව සහිත ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වගකීමෙන් බැහැර කිරීම |
| | | | වන ආවරණය පහත වැටීම | හඳුනාගත් පාරිසරික අවදානම් අවම කිරීමට ගනුදෙනුකරුවන් සමඟ සාමූහිකව කටයුතු කිරීම |
| | | | කාලගුණ වෙනස | |
| **රජය සහ නියාමන ආයතන** | ශ්‍රී ලංකා මහ බැංකුව මගින් එතැන් පරීක්ෂණය | අවශ්‍ය පරිදි | අනුකූලතාව සහ යහපාලනය | පාලන නීතිකරණ, රෙගුලාසි, නියමයන් සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම |
| | ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නියාමකයින් සමඟ සාකච්ඡාව | අවශ්‍ය පරිදි | සයිබර් ආරක්ෂාව, මූල්‍ය අපරාධවලට එරෙහි පියවර ගැනීම | අපගේ සම්බන්ධිත අවස්ථාවන්හිදී කොවිඩ්-19 ට අදාළ ආරක්ෂිත ක්‍රියාමාර්ග හඳුන්වාදීම |
| | පුවත් නිවේදන | අවශ්‍ය පරිදි | නව රෙගුලාසි | ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ අදහස් සහ තාක්ෂණික ප්‍රවීනත්වය හුවමාරුව. |
| | උපදෙස් සහ චක්‍රලේඛ | අවශ්‍ය පරිදි | SMEs වෙත සහයවීම සහ ආර්ථික වර්ධනය | සදාචාර සම්පන්න ව්‍යාපාර සංවර්ධනයට සහයවීම |
| | ආයතනික වෙබ් අඩවිය | අඛණ්ඩ | ස්වෙච්ඡා අනුකූලතාව | මනා පරිච සංග්‍රහය සමඟ ස්වේච්ඡාවෙන් අනුකූලවීම |
| | සමාලෝචන රැස්වීම් | අවශ්‍ය පරිදි | බදු/ගාස්තු/අයකිරීම් ගෙවීම් | ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය දුෂ්කරතාවලදී විකල්ප ගෙවීම් සැලසුම් පවත්වා ගැනීම |
| | අනුකූලතා වාර්තා | අවශ්‍ය පරිදි | දූෂණයෙන් වැලකීම | විනිවිද වාර්තාකරණය සමඟ අනුකූලවීම |

# ප්‍රමාණාත්මකභාවය



## ප්‍රමාණාත්මක සිතියම්කරණය

අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ට වඩාත් වැදගත්වන කරුණු සහ අප ක්‍රියාත්මක පරිසරයේ පවත්නා ආර්ථික, සමාජ සහ පාරිසරික සන්දර්භය තුළ වටිනාකම නිර්මාණය කිරීමට අපට ඇති හැකියාව කෙරෙහි බලපෑමක් ඇති කරුණු අපගේ වැදගත් ගැටලු වේ.

නිරීක්ෂිත ප්‍රවණතා සහ පාර්ශ්වකරුවන්ගේ අදහස් මත පදනම් වී, පහත සඳහන් වැදගත් මාතෘකා පහත පරිදි අදාළ තිරසාර සංවර්ධන අරමුණුවලට සමගාමීව ප්‍රමුඛතාවයට පත්කරන ලදී:

| ප්‍රමුඛතාව | වැදගත් මාතෘකා | මාතෘකාවේ අදාළත්වය | තිරසාර සංවර්ධන අරමුණු සමග ගැලපීම |
|---|---|---|---|
| 1 | **තිරසාර වර්ධනය** | අපගේ පාර්ශ්වකරුවන්ට හුවමාරු කරගත හැකි වටිනාකමක් නිර්මාණය කරමින් තිරසාර ව්‍යාපාර වර්ධනය සහතික කිරීම අපට අවශ්‍යය | 1 NO POVERTY; 4 QUALITY EDUCATION; 10 REDUCED INEQUALITIES |
| 2 | **සියල්ල ඇතුළත් මූල්‍යකරණය** | පැවැත්ම පිළිබඳ අපගේ අරමුණ | 1 NO POVERTY |
| 3 | **ගනුදෙනුකාර අත්දැකීම** | අපගේ ගනුදෙනුකරුවන් අපගේ තිරසාර වර්ධනයට දායක වේ | 1 NO POVERTY; 10 REDUCED INEQUALITIES; 4 QUALITY EDUCATION |
| 4 | **සදාචාර සම්පන්න බව, අවංකකම සහ අනුකූලතාව** | අදාළ සියලුම නීති, රෙගුලාසි සහ ප්‍රමිතිවලට අපගේ අනුකූලතාව ක්‍රියාත්මකවීම සඳහා අපගේ සමාජීය බලපත්‍රය ආරක්ෂා කරයි | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS; 17 PARTNERSHIPS FOR THE GOALS |
| 5 | **මානව දක්ෂතා සංවර්ධනය** | අපගේ සේවකයින් අපගේ වගකීම්සහගත සහ සදාචාර සම්පන්න සේවයේ තානාපතිවරුන් වෙති | 8 DECENT WORK AND ECONOMIC GROWTH |
| 6 | **සම්පත් ප්‍රශස්ථකරණය** | සම්පත් හිඟ ලෝකයක අපගේ පිරිවැය අඩුකිරීම | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES; 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION |
| 7 | **ඩිජිටල්කරණය** | සම්පත් හිඟවන බැවින් අනාගතයට යෝග්‍යවීම සඳහා පිවිසීම වැඩිකිරීමට සහ ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට ඩිජිටල් තාක්ෂණය සමඟ ව්‍යාපාර කටයුතු පරිනාමනය කිරීම | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE |
| 8 | **සයිබර් ප්‍රත්‍යස්ථිතිය සහ ගනුදෙනුකාර රහස්‍යතාව** | සයිබර් ප්‍රහාරවලින් තර්ජන ඇතිවන බැවින් අවංකව සහ අභ්‍යන්තර පාලනය සමඟ ගනුදෙනුකාර රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම අනිවාර්යය | 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION; 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS; 17 PARTNERSHIPS FOR THE GOALS |
| 9 | **නව්‍යකරණය** | වෙනස්වන, අවිනිශ්චිත, සංකීර්ණ සහ සැකසහිත (VUCA) ලෝකය තුළ, නිෂ්පාදන සංවර්ධනය තුළ ප්‍රවණතා ඇතුළත්කිරීම, ස්ථාවර වීමට සහ අපගේ ව්‍යාපාරය රඳාපවත්වා ගැනීමට නව්‍යකරණ ව්‍යාපාර ආදර්ශ | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE |
| 10 | **කාලගුණ මූල්‍යකරණය** | කාලගුණ වෙනසින් පීඩාවට පත් ව්‍යාපාර වලට සහයවීම, මූල්‍ය සේවා සපයන්නෙක් ලෙස අපගේ හැකියාව යොදාගෙන එයට දායකවීම සහ සහභාගිත්ව මූල්‍ය ආයතනයක් ලෙස අඩු කාබන් ආර්ථිකයක් ගොඩ නැගීම | 13 CLIMATE ACTION; 17 PARTNERSHIPS FOR THE GOALS |

## අපගේ වඩාත් වටිනා පාර්ශ්වකරුවන්ට ප්‍රතිචාර දැක්වීම

අපගේ ක්‍රමෝපාය/ව්‍යාපාර ආකෘතිය වෙනස්කිරීම, වර්ධනය සඳහා අවශ්‍ය වෙනස්වීම් සහ විශේෂිකරණය සඳහා අවස්ථාවන් හඳුනාගනිමින් අපගේ පාර්ශ්වකරුවන්ගේ ගැටලුවලට අපි ප්‍රතිචාර දක්වමු.

මෙම ප්‍රවේශය තුළින් ක්‍රියාත්මක වීම සඳහා අපගේ නෛතිකභාවය සහ සමාජීය බලපත්‍රය ශක්තිමත් කර, විශ්වාසය ගොඩ නගමින් සමාජීය වශයෙන් අදාළ සහ වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස අපගේ තිරසාර වර්ධනය සහතික කරයි. අපගේ ක්‍රමෝපාය සහ ව්‍යාපාර ආදර්ශය සියලුම වැදගත් ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබයි.

# අපගේ ක්‍රමෝපාය

අපගේ ක්‍රමෝපාය තුළින් ශක්තිමත් වටිනාකම් ගොඩ නගමින්, මෙහෙයුම් පරිසරය පිළිබඳ අපගේ තියුණු අවබෝධය පිළිබිඹු කරමින්, සහ පාර්ශ්වකාර ගැටලු, අවදානම් සහ අවස්ථා සහ වැදගත් කරුණු ආමන්ත්‍රණය කරයි. එහි සමස්ත අරමුණ වන්නේ අපගේ සියලුම පාර්ශ්වකරුවන් වෙත තිරසාර වටිනාකම ලබාදීමයි.

අපගේ ක්‍රමෝපාය, ක්‍රමෝපායික විධි හතරක් මත පදනම් වේ. එක් එක් ක්‍රමෝපායික විධිය යටතේ, අපි කෙටි කාලීන සහ දිගුකාලීන අරමුණු හඳුනාගෙන ඇති අතර, ඒවා වටිනාකම නිර්මාණය සඳහා සමාගම මෙහෙයවීමට සහයවනු ඇත.

## අපගේ ක්‍රමෝපායික විධි

### 1 තිරසාර වර්ධනය හඹායාම

- මේ දක්වා ආවරණය නොකළ වෙළෙඳපොල කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපාර පරිමාව වැඩි කිරීම
- ගනුදෙනුකාර කළඹ නියාමනය ශක්තිමත් කිරීමත් සමඟ අයකරගැනීමේ පියවර වැඩි කිරීම
- සමූහයේ සහක්‍රියාකාරකම් ප්‍රශස්ථ කිරීම
- ආයතනික සන්නාම ප්‍රතිරූපය ස්ථානගතකිරීම සහ ගොඩ නැගීම

### 2 ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීම

- දිවයින පුරා ජාලය තුළින් පැවැත්ම වැඩි කිරීම
- ගනුදෙනුකරුවන් අංශ අතර නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය
- දීර්ඝ කාලීන ගනුදෙනුකාර සම්බන්ධතා සහ තෘප්තිමත් මට්ටම් වර්ධනය
- විවිධ මාර්ගයන් ඔස්සේ නව පහසුකම් හඳුන්වාදීම
- වගකීම්සහගත සන්නිවේදනය තුළින් ගනුදෙනුකාර දැනුවත්කම වැඩි කිරීම

### 3 ක්‍රියාත්මක කිරීමේ අනර්ඝත්වය අත්කර ගැනීම

- මෙහෙයුම් ක්‍රියාවලි වර්ධනය
- අනර්ඝත්වය සඳහා හවුල්වීම
- වඩාත් සුදුසු දක්ෂයින් ආකර්ෂණය සහ රඳවාගැනීම
- දක්ෂ, සේවයේ නිරත සහ අභිප්‍රේරිත කණ්ඩායමක් ගොඩනැගීම

### 4 කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය

- අවදානමට අනුව ප්‍රතිඵල ප්‍රශස්ථ කිරීමට ඵලදායී ආකාරයකින් අරමුදල් භාවිතා කිරීම
- ද්‍රවශීලතාව කළමනාකරණය කරමින් අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය
- වත්කම් කළඹ සහ අරමුදල් පදනමේ කල්පිරීම්වල නොගැලපීම් අඩුකිරීම
- වර්ධනය සහ ලාභදායිතාව සඳහා ප්‍රාග්ධනය කළමනාකරණය

### 5 වගකීම්සහගත කළමනාකරණය යොදා ගැනීම

- සදාචාර සම්පන්න, විවෘත, සහ විනිවිද ව්‍යාපාර පරිසරයක් පවත්වා ගැනීම
- යහපත් ආයතනික පාලන පුරුදු පවත්වා ගැනීම
- තිරසාර හුවමාරු වටිනාකමක් නිර්මාණය කිරීමට ජාතික සහ දේශිය සමාජීය ප්‍රමුඛතා ආමන්ත්‍රණය
- පරිසරය කෙරෙහි අපගේ සෘජු බලපෑම කළමනාකරණය සහ ප්‍රශස්ථකරණය

# විශ්වාසවන්ත, ඉහළ දක්ෂතා සහිත සේවකයින්

අපගේ කණ්ඩායමට ආකර්ෂණීය සේවා පරිසරයක් නිර්මාණය කරන අතරම අපගේ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය සේවක පුහුණු අවස්ථා අපි පිරිනමමු.



## කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ


**29** මූල්‍ය ප්‍රාග්ධනය

**34** නිෂ්පාදිත ප්‍රාග්ධනය

**38** බුද්ධිමය ප්‍රාග්ධනය

**41** මානව ප්‍රාග්ධනය

**46** සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

**60** ස්වාභාවික ප්‍රාග්ධනය



# මූල්‍ය ප්‍රාග්ධනය

මූල්‍ය සමාගමක් ලෙස, මූල්‍ය ප්‍රාග්ධනය අපගේ ව්‍යාපාරයේ ජීවනාලිය වන අතර, එය අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය තුළ අනෙකුත් සියලුම ප්‍රාග්ධනය සමඟ ඍජුවම සම්බන්ධ වේ. කොටස්හිමියන් විසින් ලබාදෙන ලද අරමුදල්වලින් සහ ලාභයේ කොටසක් රඳවාගනිමින් වසර කිහිපයක් පුරා ගොඩනගන ලද සංචිත මෙන්ම ණය සුරැකුම්පත්වල ආයෝජකයින්ගෙන් ලබාගත් අරමුදල්, බැංකුවලින් ණයගැනීම් සහ ගනුදෙනුකරුවන්ගේ තැන්පතුවලින් එය සමන්විත වේ. මූල්‍ය අතරමැදි කාර්යයක් ක්‍රියාත්මක කරමින්, තිරසාර ප්‍රතිඵල උත්පාදනය කිරීමට මෙම අරමුදල් ණය සහ අත්තිකාරම් සහ වෙනත් ආයෝජන තුළ අපි ආයෝජනය කරන අතර සමාගමේ සියලුම පාර්ශ්වකරුවන් අතර එම ප්‍රතිඵල බෙදාගැනේ.

**ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම්වලින් 13.40% ක් සඳහා දායක විය**

## වැදගත් සිදුවීම්

- බැංකු නොවන මූල්‍ය අංශය තුළ විශාලතම ණය සහ අත්තිකාරම් කළඹට හිමිකම් කීම
- බැංකු නොවන මූල්‍ය අංශය තුළ විශාලතම තැන්පතු පදනම වන **රු. බිලියන 106.70ක්** හිමිවීම
- ශක්තිමත් ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත

## සම්බන්ධිත පාර්ශ්වකරුවන්

- ආයෝජකයින්
- ගනුදෙනුකරුවන්
- සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්

## අදාළ ක්‍රමෝපායික විධි

- තිරසාර වර්ධනය හඹායාම
- ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීම
- ක්‍රියාත්මක කිරීමේ අනර්ඝත්වය අත්කරගැනීම
- කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය



# මූල්‍ය ප්‍රාග්ධනය


මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ >>
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු


## සමාගමේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ දළ විශ්ලේෂණය

අපගේ සමාගමේ ඉතිහාසය තුළ වඩාත් අභියෝගාත්මක වර්ෂයක් තුළ, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. රු. මිලියන 2,942.51ක බදු පසු ලාභයක් සහිතව 2019/20 මූල්‍ය වසර අවසන් කරන ලදී. පාස්කු ඉරිදා ප්‍රහාර සහ කොවිඩ්-19 ගෝලීය වසංගතයෙන් පසුව ආර්ථිකය තුළ සමස්ත පහත වැටීම රටතුළ ප්‍රධාන ව්‍යාපාර අංශ මත සෘණාත්මක බලපෑම් ඇති කරන ලද අතර, අපගේ ගනුදෙනුකරුවන්ගේ වැයකළ හැකි ආදායම් මට්ටම අඩුකරන ලදී. ඊට අමතරව, අඩු වර්ධන අනුපාත සහිත අභියෝගාත්මක ආර්ථික සැකැස්ම, වසර පුරා පැවති LTV නියමයන්හි බලපෑම සහ රුපියලේ බාහිර වටිනාකම අඩුවීම වසර තුළ රටේ කල්බදු අංශයේ මූල්‍ය කාර්යසාධනය මත සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

අප්‍රේල් පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු වසරේ මන්දගාමී ආරම්භයකින් පසුව, සමාගමේ කාර්යසාධනය වර්ධනය වීම ආරම්භ වූ අතර, 2020 පෙබරවාරි මස දක්වා මාස එකොළහක කාලසීමාව තුළ එහි මුල් පුරෝකථනය කළ ප්‍රතිඵලවලින් 90%ක් අත්කරගනු ලැබීය. කෙසේවෙතත්, රට තුළ කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ, සමාගමේ මාර්තු කාර්යසාධනය කෙරෙහි ඉහළ හානිකරණ අයකිරීම් සහ අලාභ බැහැරකිරීම අහිතකර ලෙස බලපාන ලද අතර එය 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වාර්තා කළ මුළු ලාභයෙහි අඩුවීමකට හේතු විය.

## වසර තුළ සමාගමේ කාර්යසාධනය

(රු. මිලියන)




සමාලෝචිත වසර තුළ අපගේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් පහත දැක්වේ:

### ශුද්ධ පොළී ආදායම

පොළී ආදායමේ වාර්ෂික වර්ධනය 2.0%ට සීමා වූ අතර ඒ සඳහා පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු අයවැයගත ව්‍යාපාර පරිමාවන් අත්කරගැනීම පහතවැටීම සහ කොවිඩ්-19 වසංගතය නිසා ගනුදෙනුකරුවන්ගේ නැවත ගෙවීම් ප්‍රමාදවීම හේතු විය. මෙම පසුබැසීම තුළ, පොළී උපයන මුළු වත්කම් 2019 මාර්තු 31ට සාපේක්ෂව සුළු අඩුවීමක් පෙන්නුම් කරන ලදී. පොළී ආදායම සහ ශුද්ධ පොළී ආදායම අවසාන කාර්තුව තුළ සැලකියයුතු පහත වැටීමකට මුහුණ පාන ලද අතර ඒ සඳහා කොවිඩ්-19 පැතිරීම නිසා 2020 මාර්තු මැද සිට ව්‍යාපාර කටයුතු සීමාකිරීම සහ මූල්‍ය වසරේ අවසාන කොටසේදී පොළී අනුපාතවල අඩුවීම හේතු විය.

### කාර්තුමය පොළී අනුපාතය

(රු. මිලියන)




පොළී වියදම්වල වර්ධනය අඩු පොළී අනුපාත වාතාවරණය සහ පොළී දරන වගකීම්වල අඩුවීම නිසා සීමා වූ නමුත් SLFRS 16 – "කල්බදු" නව ගිණුම්කරණ ප්‍රමිතිය යොදා ගැනීමත් සමඟ 2019/20 වසර තුළ හඳුනාගත් රු. මිලියන 238.58ක මෙහෙයුම් කල්බදු වගකීම් සඳහා පොළී අයකිරීම නිසා 0.90%ක සුළු වැඩිවීමක් දක්නට විය.

2.02%කින් පොළී ආදායමෙහි වර්ධනය සහ පොළී වියදම තුළ වර්ධනය 0.90% දක්වා සීමාවීම 2018/19 මූල්‍ය වසරේ රු. මිලියන 15,190.20ට සාපේක්ෂව රු. මිලියන 15,672.52 දක්වා 3.18%කින් ශුද්ධ පොළී ආදායම වර්ධනයට දායක විය. කෙසේවෙතත්, ශුද්ධ පොළී ආන්තිකය (NIM) 2018/19 දී වාර්තා කළ 9.70% සිට 2019/20දී 9.68% දක්වා සුළු වශයෙන් අඩුවිය.

### ශුද්ධ පොළී ආදායම සහ ශුද්ධ පොළී ආන්තිකය

(රු. මිලියන) (%)




### වෙනත් ආදායම්

ගාස්තු සහ කොමිස් ආදායම, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ දී මූල්‍ය වත්කම් මත ශුද්ධ ඉපයීම් (අලාභ) සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්වලින් සමන්විතවන වෙනත් ආදායම රු. මිලියන 2,140.21 දක්වා පසුගිය වසරට වඩා 12.68%ක වර්ධනයක් පෙන්නුම් කරන අතර එයට ප්‍රධාන වශයෙන් පරිපාලිත සමාගම්වලට ලබාදෙන සේවාවන්හි වැඩිවීමත් සමඟ වැඩි වූ හුවමාරු ආදායම සහ ගාස්තු මත පදනම් වූ ආදායමේ වැඩිවීම හේතු විය.

### මෙහෙයුම් වියදම්

ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල වියදම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම්වලින් සමන්විත මෙහෙයුම් වියදම් පසුගිය මූල්‍ය වසරේ වූ රු. මිලියන 6,462.19 හා සැසඳීමේදී රු. මිලියන 6,506.65 දක්වා 0.69% කින් තරමක් වර්ධනය වී ඇත. මෙහෙයුම් වියදම්වලින් සැලකිය යුතු කොටසක් නියෝජනය කරන කාර්ය මණ්ඩල වියදම් පෙර මූල්‍ය වසරට සාපේක්ෂව සේවක සංඛ්‍යාව වැඩිවීම සහ 2019 ඔක්තෝබර් මස ලබාදෙන ලද වාර්ෂික වැටුප් වර්ධකය සමඟ පෙර වසරට සාපේක්ෂව 7.66%ක වර්ධනයක් වාර්තා කරන ලදී.

### මෙහෙයුම් වියදම්වල සංයුතිය




නව ගිණුම්කරණ ප්‍රමිතිය වන SLFRS 16 – "කල්බදු" බලාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස, අනෙකුත් මෙහෙයුම් වියදම්වල ඇතුළත් කුලී ගෙවීම්, භාවිතයට අයිතිය ඇති වත්කම්වල ක්‍රමක්ෂය සහ මෙහෙයුම් කල්බදු වගකීම් මත පොළී වියදම ලෙස ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එමගින් මෙහෙයුම් වියදම් පසුගිය වසරට සාපේක්ෂව 26.58%ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

කෙසේවෙතත්, සමස්ත මෙහෙයුම් වියදම්වල වර්ධනය 4.23%ක් වූ මුළු මෙහෙයුම් ආදායම් වර්ධනයට වඩා පහළ අගයක් වූ අතර එය 2019/18 මූල්‍ය වසරේ 37.81%ට සාපේක්ෂව 36.53%ක පිරිවැයට ආදායම අනුපාතයක් සඳහා හේතු විය.

### පිරිවැයට ආදායම් අනුපාතය

(%)



# මූල්‍ය ප්‍රාග්ධනය

## හානිකරණ වියදම් සහ වත්කම්වල ගුණාත්මකභාවය

පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු ආර්ථික කටයුතුවල පහතවැටීම සහ 2020 මාර්තු මැද ඇරඹි කොවිඩ්-19 වසංගතය හමුවේ අයකරගැනීම් සම්බන්ධයෙන් මුහුණ පාන ලද දුෂ්කරතා ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන ක්ෂේත්‍රය පුරා අත්විඳි තත්ත්වය තුළ මෙම මූල්‍ය වසර තුළ සමාගමේ ණයවල ගුණාත්මකභාවය පීඩනය යටතේ පැවතිණ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ දළ අක්‍රිය ණය අනුපාතය (NPA) 2019 මාර්තුවල පැවති 3.91%ට සාපේක්ෂව 2020 මාර්තු මස අවසානය වන විට 7.62% දක්වා ඉහළ ගියේය. කෙසේවෙතත්, මෙම අනුපාතය තවමත් 2019 දෙසැම්බර් මස වාර්තාකළ 10.6% ක් වූ මෙම අංශයේ සාමාන්‍ය අනුපාතයට වඩා පහළින් පැවතුනි. (ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පරිදි අංශයේ සාමාන්‍ය)

### අක්‍රීය ණය අනුපාතය

(%)




අඩු වූ අයකිරීම්වල ප්‍රතිඵලයක් ලෙස, 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ණය සහ ලැබීම් සඳහා හානිකරණ වියදම් සහ අනෙකුත් අලාභ පසුගිය වසරේ රු. මිලියන 1,586.51ට සාපේක්ෂව රු. මිලියන 4,646.68 දක්වා ඉහළයාමක් දක්නට ලැබූ අතර ඉන් වසර සඳහා සමාගමේ ලාභදායිතාව කෙරෙහි සෘජු බලපෑමක් තිබුණි. කොවිඩ්-19 වසංගත තත්ත්වය මාර්තු මස මූල්‍ය දත්තයන්වලට බලපාන ලද බැවින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයට අනුව, සමාගම 2020 මාර්තු මස 31 දිනට ගෙවීම් පැහැරහැරීමේ සම්භාවිතාව ගණනය කිරීම සඳහා මාර්තු මස ගනුදෙනුකරුවන්ගේ නියමිත දින කල්පසු වූ දින ගණන (DPD) වෙනුවට ආර්ථික සාධක ගැලපුම් සඳහා වෙනස් කරන ලද 2020 පෙබරවාරි මස පැවති නියමිත දින කල්පසු වූ දින ගණන සලකනු ලැබීය.

## බදු

සමාලෝචිත වසර තුළ 35.36%ක ඵලදායී බදු අනුපාතයක් වාර්තා කරමින් සමාගමේ ආදායම් බදු වියදම රු. මිලියන 1,609.32ක් විය. 24%ක නව අනුපාතය මූල්‍ය වසරේ මාස තුනක් පමණක් සඳහා අදාළවන බැවින් සහ අනුපාතය මේ දක්වා පනවා නොමැති බැවින්, මූල්‍ය වසර සඳහා ආදායම් බදු වෙන්කිරීම සඳහා සමාගම 28% භාවිතා කරන ලදී. ඒ අනුව, අවසාන කාර්තුව සඳහා අනුපාතය අඩුකිරීමේ ධනාත්මක බලපෑම සැලකිල්ලට ගෙන නොමැත. අඩුකළ අනුපාතය බදු ගෙවන අවස්ථාවේදී සැලකිල්ලට ගනු ලැබේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කළ දැන්වීම් පරිදි, ණය ගෙවීමේ බදු (DRL) සහ ආර්ථික සේවා ගාස්තු (ESC) 2020 ජනවාරි මස 1 දින සිට අවලංගු කරන ලද අතර, ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) 2019 දෙසැම්බර් මස 1 දින සිට අවලංගු කරන ලදී. එබැවින්, මූල්‍ය සේවා සැපයීමට අදාළවන අගය එකතුකිරීම මත මූල්‍ය වසරේ පළමු මාස නවය සඳහා පමණක් 7% කින් DRL අයකරනු ලැබ ඇත. ජාතිය ගොඩනැගීමේ බද්ද අවලංගු කිරීමට පෙර 2%ක් වූ අතර සමාගම ගනුදෙනුකරු වෙනුවෙන් බදු වියදම දරනු ලබන බැවින් මින් ධනාත්මක බලපෑමක් ඇත. මෙම වෙනස්වීම්වලට අමතරව, එකතුකළ අගය මත බදු (VAT) අනුපාතයද 2020 ජනවාරි මස 1 දින සිට 15% සිට 8% දක්වා සංශෝධනය කරන ලදී.

සමාලෝචිත වසර තුළ සමාගම විසින් ගෙවන ලද මුළු සෘජු බදු 2018/19 මූල්‍ය වසරේ රු. මිලියන 2,942.05ට සාපේක්ෂව රු. මිලියන 5,711.95 දක්වා වැඩි වූ අතර 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වන වසර තුළ සමාගම විසින් ගෙවන ලද වක්‍ර බදු ප්‍රමාණය රු. මිලියන 1,312.90ක් විය.

## ලාභදායිතාව – බදු පෙර ලාභය හා බදු පසු ලාභය

අතිශයින් අභියෝගාත්මක ව්‍යාපාර වටපිටාව යටතේ වැඩි වූ හානිකරණ වියදම් සහ අඩු වූ ආදායම් මට්ටම හේතුකොට ගෙන, සමාගමේ බදු පෙර ලාභය සහ බදු පසු ලාභය පිළිවෙලින් රු. මිලියන 4,551.83 සහ රු. මිලියන 2,942.51 ක් දක්වා අඩුවිය.

ලාභදායිතාව අඩුවීමත් සමඟ, 2019/20 මූල්‍ය වසර තුළ සමාගමේ වත්කම් මත ඉපයීම (ROA) සහ ස්කන්ධය මත ඉපයීම් (ROE) පිළිවෙළින් 2.64% සහ 10.00% දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, එම අනුපාත වසර සඳහා මෙම අංශයේ සාමාන්‍ය අනුපාත වන 2.2% සහ 7.5% ට වඩා ඉහළ අගයන්හි පැවතුණි. (ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පරිදි අංශයේ සාමාන්‍ය).

### ලාභදායිතාව




## ණය සහ අත්තිකාරම් කළඹ

2020 මාර්තු මස 31 දිනට සමාගමේ දළ ණය සහ අත්තිකාරම් කළඹ 2019 මාර්තු මස 31 දින පැවති රු. මිලියන 156,652.24ට සාපේක්ෂව රු. මිලියන 156,497.75ක් විය. තනි තනි සහ සාමූහික හානිකරණය ගණනය කිරීමෙන් පසු ශුද්ධ කළඹ 2020 මාර්තු මස 31 දිනට රු. මිලියන 147,747.51ක් විය. මෙම අගය මෙරට බැංකු නොවන මූල්‍ය අංශයේ ඉහළම ණය සහ අත්තිකාරම් කළඹ වේ. සමාගමේ මුළු වත්කම්වලින් 86.07%ක් නියෝජනය කරන මෙම කළඹ තුළ 2.61%ක සුළු වාර්ෂික පහත වැටීමක් පිළිබිඹු කරයි. වෙළෙඳපොළ තුළ පැවති මන්දගාමී තත්ත්වය අනුව, වසර සඳහා නව ව්‍යාපාර පරිමාව පසුගිය මූල්‍ය වසර තුළ රු. මිලියන 95,282.60 ට සාපේක්ෂව රු. මිලියන 70,696.89 දක්වා පහත වැටුණි. කල්බදු/ඉජාරා ලැබීම් මුළු දළ කළඹ සඳහා ඉහළම දායකයා ලෙස පවත්නා නමුත් පසුගිය මූල්‍ය වසරට සාපේක්ෂව තරමක අඩුවීමක් සඳහන් වේ.

අපගේ නිෂ්පාදිත කළඹෙහි ඇති නවතම නිෂ්පාදනය වන රන් ණය වසර තුළ ඉතා ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරමින් 2020 මාර්තු 31 වන දින වන විට රු. මිලියන 895.70 ක කළඹක් වාර්තා කරන ලදී.

වසර මුළුල්ලේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ සෘණාත්මක පසුබිම හමුවේ වුවද අපගේ ආන්තික වෙළෙඳ ලැබීම්වල පසුගිය වසරට වඩා 8.47%ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර එය 2020 මාර්තු මස 31 දිනට රු. මිලියන 2,232.78 දක්වා ලඟා විය.

### කළඹ තුළ සංයුතිය



# මූල්‍ය ප්‍රාග්ධනය

## ආයෝජන මුසුව

අපගේ මුළු වත්කම්වලින් 7.37%ක් ණය සහ ලැබීම් නොවන පොළී උපයන වත්කම් තුළ ආයෝජනය කළෙමු. මෙම ආයෝජන ප්‍රධාන වශයෙන් බැංකු සහ මූල්‍ය ආයතනවල ස්ථිර සහ ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම යටතේ ඇති සුරැකුම්පත්වලින් සමන්විත වන අතර, 2020 මාර්තු මස 31 දිනට එම ආයෝජන රු. මිලියන 12,649.87ක් වේ. නැවත මිලදී ගැනීමේ ගිවිසුම යටතේ ඇති සුරැකුම්පත්වල සමාගමේ ආයෝජනය සහ ඒකක භාර තුළ ආයෝජනය සහ පසුගිය වසරට සාපේක්ෂව සැලකියයුතු වර්ධනයක් වාර්තාකරන ලදී. කෙසේවෙතත්, වසර තුළ කොළඹ මුදල් වෙළෙඳපොල තුළ පැවති මන්දගාමී කාර්යසාධනය අනුව, ලැයිස්තුගත ස්කන්ධ සුරැකුම්පත් තුළ සමාගමේ ආයෝජනයේ වෙළෙඳපොල වටිනාකම පසුගිය මූල්‍ය වසර අවසානයේ පැවති රු. මිලියන 23.19 සිට රු. මිලියන 13.55 දක්වා පහත වැටුණි.

## තැන්පතු පදනම

සමාලෝචිත වසර තුළ, ඉස්ලාමීය තැන්පතු ද ඇතුළත් ස්ථිර සහ ඉතුරුම් තැන්පතුවලින් සමන්විත අපගේ තැන්පතු පදනම රු. බිලියන 100 සීමාව පසුකරමින් රු. මිලියන 106,701.03 දක්වා ළඟා වූ අතර මෙය 2019 මාර්තු මස 31 දින තැන්පතු පදනමට සාපේක්ෂව 20.75%ක වැඩිවීමකි. මෑත කාලය තුළ මූල්‍ය ක්ෂේත්‍රය වටා ජනතා අවිශ්වාසය ඉහළයාම හමුවේ වුවත්, පීපල්ස් ලීසිං සමාගම ක්ෂේත්‍රය තුළ විශාලතම තැන්පතු පදනම වාර්තා කරගෙන ඇත. මෙම වේගවත් වර්ධනය සමඟ, පසුගිය මූල්‍ය වසරේ 64.54%ක්ව පැවති අපගේ ණය ගැනීම් මුසුවේ තැන්පතුවල නියෝජනය 80.15%ක් විය.

අපගේ ඉතුරුම් පදනම 26.91%ක සැලකියයුතු වාර්ෂික වර්ධනයක් සමඟ රු. බිලියන 6 පසුකරන ලද අතර 2020 මාර්තු මස 31 දිනට රු. මිලියන 6,770.64 දක්වා ළඟා විය.

## ණය මුසුව







සමාගමේ දිගු කාලීන ණය කළඹ සමඟ ගැලපීම සඳහා වඩා දීර්ඝ කල්පිරීම් සහිත තැන්පතු සෙවීමේදී තවමත් දුෂ්කරතාවන්ට මුහුණ දේ. එහි ප්‍රතිඵලයක් ලෙස, තැන්පතු පදනම මාස හය සහ දොළහා අතර කල්පිරීම් වෙත තවදුරටත් නැඹුරු වී ඇත.

## තැන්පතු කල්පිරීම මත පදනම්ව

(රු. මිලියන)




## ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව

2020 මාර්තු මස 31 දිනට, ප්‍රාග්ධනය, රඳවාගත් ඉපයීම් සහ අනෙකුත් සංචිතවලින් සමන්විත මුළු ස්කන්ධය රු. මිලියන 30,246.63ක් වූ අතර එය පසුගිය වසරට වඩා 5.75%ක වැඩිවීමකි. කොටස් ලාභාංශ ආකාරයෙන් 2018/19 මූල්‍ය වසර සඳහා අවසාන ලාභාංශ ගෙවීම හේතු කොට ගෙන, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය 1,627,703,388ක් වූ මුළු කොටස් සංඛ්‍යාවක් සමඟ රු. මිලියන 13,915.41 දක්වා ඉහළ ගියේය.

පිළිවෙළින් 15.12% සහ 15.99%ක් වන අපගේ පළමු පෙළ සහ මුළු ප්‍රාග්ධන අනුපාත 2018 අංක 03 දරන මූල්‍ය ව්‍යාපාර පනත් නියෝගය තුළ දක්වා ඇති නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතවලට වඩා ඉහළින් පවතින අතර එය ශක්තිමත් මූල්‍ය තත්ත්වයක පිළිබිඹුවකි.

| | 2019/20 | 2018/19 |
|---|---|---|
| පළමු පෙළ ප්‍රාග්ධනය (රු. මිලියන) | **29,269.43** | 26,517.79 |
| මුළු ප්‍රාග්ධනය (රු. මිලියන) | **30,941.75** | 28,065.76 |
| අවදානම මත බරතබන ලද මුළු වත්කම් ගණන (රු. මිලියන) | **193,545.73** | 184,636.04 |
| පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය – අවමය 7% (අවමය 6% – 2018/19) (%) | **15.12** | 14.36 |
| මුළු ප්‍රාග්ධන අනුපාතය – අවමය 11% (අවමය 10% – 2018/19) (%) | **15.99** | 15.20 |

සමාගම 2020 මාර්තු මස 31 දිනට රු. මිලියන 14,459.38ක ද්‍රවශීල වත්කම් සමඟ යහපත් ද්‍රවශීල තත්ත්වයක් පවත්වා ගනු ලැබූ අතර, එය 111.51ක අනුපාතයක් වාර්තා කිරීමට හේතු වූ අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති අවම ද්‍රවශීලතා අවශ්‍යතාවන්ට වඩා ඉහළින් පැවතුණි.

## සමූහයේ ප්‍රතිඵල දළ විශ්ලේෂණය

පීපල්ස් ලීසිං සමූහය 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළ වාර්තා කළ රු. මිලියන 5,011.27ට සාපේක්ෂව 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළ රු. මිලියන 3,591.75ක බදු පසු ලාභයක් වාර්තා කරන ලදී. සමූහය 2018/19 මූල්‍ය වසරට සාපේක්ෂව 2019/20 මූල්‍ය වසර තුළ ශුද්ධ පොළී ආදායම තුළ 5.07%ක වැඩිවීමක් වාර්තා කරන ලදී. සමස්ත ආර්ථික පසුබෑස්ම සමූහයේ කාර්යසාධනය කෙරෙහි සෘණාත්මකව බලපාන ලදී.

සමූහයේ මුළු වත්කම් 2019 මාර්තු මස 31 දිනට මුළු වත්කම්වලට සාපේක්ෂව තරමක වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර 2020 මාර්තු 31 දිනට රු. මිලියන 185,997.29 දක්වා ළඟා විය. මුළු ශුද්ධ ණය සහ ලැබීම් කළඹ තුළ 1.8%ක පහත වැටීමක් පෙන්නුම් කළ අතර 2019 මාර්තු මස 31 පැවති කළඹට සාපේක්ෂව 2020 මාර්තු මස 31 දින රු. මිලියන 154,134.93 දක්වා ළඟා විය.

| දර්ශකය (සමූහය) | 2019/20 | 2018/19 |
|---|---|---|
| වත්කම් මත ඉපයීම (%) | **3.07** | 4.26 |
| ස්කන්ධය මත ඉපයීම් (%) | **10.71** | 16.21 |
| කොටසකට ඉපයීම් (රු.) | **2.11** | 3.05 |
| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.) | **20.25** | 19.44 |

## උත්පාදනය කළ සහ බෙදාහරින ලද වටිනාකම

මූල්‍ය ප්‍රාග්ධනය ඵලදායි ලෙස භාවිතය තුළින් උත්පාදනය කළ මූල්‍ය වටිනාකම අනාගත වර්ධනය සඳහා අවශ්‍ය කොටස රඳවා ගැනීමෙන් පසු සමාගමේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ බෙදා හරිනු ලබයි නැතිනම් හුවමාරු කරගනු ලබයි. නමුත්, වැඩි වූ හානිකරණ වියදම් සහ කොවිඩ්-19 පැතිරීමේ බලපෑම සමඟ ආදායම් වර්ධනය තුළ අඩුවීම හේතු කොට ගෙන, සමාගමේ ආර්ථික වටිනාකම් බෙදාහැරීම උත්පාදනය කළ ආර්ථික වටිනාකම ඉක්මවා තිබුණි.

| | 2019/20 රු. මිලියන | 2018/19 රු. මිලියන |
|---|---|---|
| **උත්පාදනය කළ සෘජු ආර්ථික වටිනාකම** | | |
| පොළී ආදායම | **31,459.11** | 30,836.30 |
| ගාස්තු සහ කොමිස් ආදායම | **1,694.01** | 1,508.95 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | **446.20** | 390.39 |
| **උත්පාදනය කළ ආර්ථික වටිනාකම** | **33,599.32** | 32,735.64 |
| **බෙදාහරින ලද ආර්ථික වටිනාකම** | | |
| ප්‍රාග්ධනය සැපයුම්කරුවන් වෙත | | |
| ස්කන්ධහිමියන් වෙත ලාභාංශ | **1,929.32** | 1,974.83 |
| ණයගැනීම් මත පොළිය | **4,256.40** | 6,963.55 |
| තැන්පත් දරන්නන් වෙත පොළිය | **11,530.60** | 8,682.55 |
| | **17,716.32** | 17,620.93 |
| **සේවකයින් වෙත** | | |
| වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ | **3,701.39** | 3,438.17 |
| | **3,701.39** | 3,438.17 |
| **රජය වෙත** | | |
| ආදායම් බදු වියදම | **2,822.84** | 3,351.43 |
| මූල්‍ය සේවා මත බදු | **2,002.46** | 2,087.21 |
| ගෙවන ලද වෙනත් බදු | **266.54** | 241.41 |
| | **5,091.84** | 5,680.05 |
| **ප්‍රජාව වෙත** | | |
| ආයතනික සමාජ වගකීම (CSR) සහ පරිත්‍යාග | **58.85** | 122.23 |
| | **58.85** | 122.23 |
| **මෙහෙයුම් පිරිවැය** | | |
| ක්ෂයකිරීම සහ ක්‍රමක්ෂය | **717.02** | 179.61 |
| ණය සහ ලැබීම් සහ වෙනත් අලාභ සඳහා හානිකරණ වියදම් | **4,751.80** | 1,954.88 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | **1,808.64** | 2,572.16 |
| | **7,277.46** | 4,706.65 |
| **බෙදාහැරි ආර්ථික වටිනාකම** | **33,845.86** | 31,568.03 |
| **රඳවාගත් ආර්ථික වටිනාකම** | **(246.54)** | 1,167.60 |

## එකතුකළ ආර්ථික වටිනාකම

එකතුකළ ආර්ථික වටිනාකමින් තම ආයෝජන මත කොටස්හිමියන් සඳහා නිර්මාණය කළ අතිරික්ත වටිනාකම පෙන්නුම් කරයි.

| වසර සඳහා එකතුකළ ආර්ථික වටිනාකම | 2019/20 රු. මිලියන | 2018/19 රු. මිලියන |
|---|---|---|
| කොටස්හිමියන්ගේ අරමුදල් | **30,246.63** | 28,603.36 |
| එකතුකළා: හානිකරණ වියදම් සඳහා සමුච්චිත වෙන් කිරීම | **8,750.24** | 4,944.34 |
| එකතුකළා: සමුච්චිත වෙළෙඳපොල ගොඩනැගීමේ වියදම් | **696.75** | 885.95 |
| | **39,693.62** | 34,433.65 |
| **ලාභය බෙදාහැරීම:** | | |
| කොටස්හිමියන් | **2,942.51** | 4,416.12 |
| එකතුකළා: වසර සඳහා වෙළෙඳපොල ගොඩනැගීමේ වියදම් | **196.56** | 324.81 |
| එකතුකළා: හානිකරණ වියදම් | **3,805.90** | 993.22 |
| එකතුකළා: වසර සඳහා විලම්බිත බදු අයකිරීම | **(1,213.52)** | (1,182.29) |
| | **5,781.45** | 4,551.96 |
| ආර්ථික පිරිවැය % (සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 2% අවදානම් වාරිකය) (%) | **10.22** | 10.73 |
| ආර්ථික පිරිවැය | **3,787.90** | 3,508.66 |
| **ආර්ථික වටිනාකම් එකතුව** | **1,948.55** | 1,043.30 |

## එකතුකළ වෙළෙඳපොල වටිනාකම

වසර පුරා ප්‍රාග්ධන වෙළෙඳපොලේ පැවති දුර්වල කාර්යසාධනය අනුව, වසර තුළ සමාගමේ කොටස් මිල පහත වැටුණ අතර පසුගිය වසරට සාපේක්ෂව 2020 මාර්තු 31 දිනට එකතුකළ වෙළෙපොල වටිනාකම තුළ අඩුවීමකට එය හේතු විය.

| වසර සඳහා | 2019/20 රු. මිලියන | 2018/19 රු. මිලියන |
|---|---|---|
| වෙළෙඳපොල ප්‍රාග්ධනකරණය/ ස්කන්ධයේ වෙළෙඳපොල වටිනාකම | **19,857.98** | 21,170.16 |
| අඩුකළා: කොටස්හිමියන්ගේ අරමුදල් | **30,246.63** | 28,603.36 |
| එකතුකළ වෙළෙඳපොල වටිනාකම | **(10,388.65)** | (7,433.20) |

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

පීපල්ස් ලීසිං සමාගමේ නිෂ්පාදිත ප්‍රාග්ධනය දිවයින පුරා විහිදුන ශාඛා ජාලයක්, තොරතුරු තාක්ෂණ සන්නිවේදන යටිතල පහසුකම් සහ අපගේ මෙහෙයුම්වල යොදා ගෙන ඇති අනෙකුත් දේපල පිරියත සහ උපකරණවලින් සමන්විත වේ. නිෂ්පාදිත ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම සෘජුවම කාර්යක්ෂමතාව, ගනුදෙනුකාර තෘප්තිය, ලාභදායිතාව සහ වර්ධනය කෙරෙහි බලාපන බැවින් එය ආයතනයේ සාර්ථකත්වය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

**රන් ණය ඒකක ශාඛා 14ක විවෘත කරන ලදී**

## වැදගත් සිදුවීම්

- ශාඛා 103ක සහ සේවා මධ්‍යස්ථාන 101 ක් දක්වා පුළුල්ව පැවතීම
- ISO 27001 අළුත් කිරීම
- පැමිණිලි කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

## අදාළ ක්‍රමෝපායික විධි

- ගනුදෙනුකාර අත්දැකිම වැඩි කිරීම
- ක්‍රියාත්මක කිරීමේ අනර්ඝත්වය අත්කර ගැනීම

## අදාළ පාර්ශ්වකරුවන්

- ගනුදෙනුකරුවන්
- සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්



## දිවයින පුරා ශාඛා ජාලයක් තුළින් අපගේ ප්‍රවේශය

දිවයින පුරා විහිදුන අපගේ භෞතික පිවිසුම් ස්ථාන හරහා ශක්තිමත් ගනුදෙනුකාර අත්දැකීමක් අපි අඛණ්ඩව ලබා දෙන්නෙමු. නවීන තාක්ෂණය එකතු කරමින් සෑම වසරකම මෙවැනි පිවිසුම් ස්ථාන අපි වැඩි දියුණු කරමු. අපගේ ගනුදෙනුකරුවන්ට අපගේ නිෂ්පාදන කළඹ වෙත පහසු පිවිසීම ලබාදීම පිණිස, ශාඛා 103ක් සහ සේවා මධ්‍යස්ථාන 101ක් දක්වා අපගේ ප්‍රවේශය අපි පුළුල් කර ඇත.




*රන් ණය මධ්‍යස්ථාන 2020 ජූලි 8 දිනට වේ.

අපගේ ශාඛා ජාලය පිළිබඳ විස්තර මාර්ගගතව සොයාගත හැකිය
https://plc.lk/index.php/en/contact-us-main/branch-locator

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## අපගේ භෞතික පැවැත්ම පුළුල් කිරීම

වසර මුළුල්ලේ පැවති අභියෝගාත්මක ව්‍යාපාර වාතාවරණය සැලකිල්ලට ගැනීමෙන්, සමාගම නව ශාඛා විවෘත කිරීම පිළිබඳ අවධානය යොමු කර නැත. ඒ වෙනුවට අපි දැනට පවත්නා ශාඛාවල කාර්යසාධනය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමු.

අපගේ සේවාවන් ලබාදීම අඛණ්ඩව වර්ධනය කිරීමේ අපගේ වැඩපිළිවෙළ තුළ, අපගේ ගනුදෙනුකරුවන්ට වඩා පහසුව සහතික කිරීම සඳහා ශාඛා හතරක් නැවත ස්ථානගත කරන ලදී. එමෙන්ම අපගේ ගනුදෙනුකරුවන්ට වඩා යහපත් අයුරින් සේවය කිරීම සඳහා දැනට පවත්නා යටිතල පහසුකම් වර්ධනය කිරීමට කටයුතු කරමු. අපගේ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා අපගේ මව් සමාගම වන මහජන බැංකුව සමඟ අපි සහයෝගීව කටයුතු කර ඇත.

මෙම වසරේ, ශාඛා 14ක් තුළ රන් ණය ඒකක විවෘත කිරීම මගින් අපගේ නව නිෂ්පාදනය වන "රන් ණය" පුළුල් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු.

## නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වර්ධනය

ICT දෙපාර්තමේන්තුව ව්‍යාපාර ක්‍රමෝපායන් යථාර්ථයක් බවට පත්කිරීමට නව නිෂ්පාදන සහ විශේෂාංග තුළින් සමාගමේ කාර්යසාධනය කෙරෙහි විශාල වශයෙන් දායක වී ඇත. එය සමස්ත ව්‍යාපාර පරිමාව වැඩි කරයි. ගනුදෙනුකරුවන් පදනම පුළුල් කර සමාගමේ සමස්ත ලාභදායීත්වය වැඩිදියුණු කරයි. ICT දෙපාර්තමේන්තුව සියලුම මෙහෙයුම්වලදී අනෙකුත් අංශ සමග සහයෝගයෙන් කටයුතු කරයි.

## සක්‍රීය කාලීන ICT ක්‍රමෝපාය

අපගේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන (ICT) ක්‍රමෝපාය ප්‍රධාන වශයෙන් ව්‍යාපාර ක්‍රමෝපාය යටතේ ඇති අතර මෙහෙයුම් පරිසරයෙන් පැනනැගෙන කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගනී. එයට සියලුම මෙහෙයුම් ඇතුළත් අතර අපගේ අභ්‍යන්තර පද්ධති සහ ක්‍රියාවලිවලට ඒකාබද්ධ කෙරේ. නිදසුනක් ලෙස, නිෂ්පාදන සංවර්ධන අදියර තුළ, විසඳුම්, යෙදුම් සහ සහය ඇතුළුව අවශ්‍ය ICT යටිතල පහසුකම්. නවීන දෘඩාංග මෙන්ම යම් අවශ්‍යතා මෙහෙයවීමේ හැකියාවන්ගෙන් සන්නද්ධ පුහුණු සම්පත් දායකයින් අපි භාවිතා කරමු. වඩා පුළුල් පිරිසක් වෙත ළඟාවීමේ අපගේ අලෙවිකරණ උත්සාහය තුළ අපි තාක්ෂණයේ වාසිය ලබා ගනිමු. අලෙවිකරණ අංශය සමහර ගනුදෙනුකාර අංශ ආමන්ත්‍රණය සඳහා මුහුණු පොත් පිටුවක් සහ වයිබර් කණ්ඩායම් පවත්වාගෙන යයි.

## සයිබර් ප්‍රහාර වැළැක්වීම

වර්තමානයේදී මතුවන තර්ජනයක් වන්නේ සයිබර් අපරාධවල වැඩිවන අනුපාතයයි. අපගේ ගනුදෙනුකරුවන් තාක්ෂණයෙන් ඇතුළත් අවදානම හඳුනාගෙන ඇත. අපගේ ගනුදෙනුකරුවන්ගේ රහස්‍යතාව උපරිම ප්‍රමුඛතාවයෙන් අපි සැලකිල්ලට ගන්නා අතර සංවේදී දත්තවල ආරක්ෂාව සහතික කිරීමට සෑම පියවරක්ම ගෙන ඇත.සයිබර් තර්ජන වැළැක්වීමේ අභ්‍යන්තර පාලන පද්ධතියට අමතරව ෆයර්වෝල් සහ අදාළ යාවත්කිරීම් මත අපි බෙහෙවින් ආයෝජනය කර ඇත. පහත රූපසටහනින් අපගේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය විස්තර කරයි.

අපගේ සිදුවීම් කළමනාකරණ ක්‍රියාවලිය තුළින්, ඕනෑම සේවකයෙකුට ආරක්ෂාව සම්බන්ධ වියහැකි සහ සිදුවූ කඩකිරීම් පිළිබඳව ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී වෙත වාර්තා ගොනු කළ හැකිය. ආරක්ෂිත පරිසරයන් තුළ අභ්‍යන්තර සහ බාහිර උපස්ථ සමඟ දත්ත ආරක්ෂාවට අදාළ වන අංශ ඇතුළුව සමාගමේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය කරන ආපදා ප්‍රතිසාධන සැලැස්මක් අප සතුය. දත්ත ආරක්ෂිතව උපස්ථ කර ඇති බව සහ යම් අපේක්ෂා කළ නොහැකි විපතකින් මෙහෙයුම් ප්‍රතිසාධනය සඳහා විධිවිධාන ප්‍රමාණවත් බව සහතික කිරීම සඳහා තොරතුරු ආරක්ෂණ කණ්ඩායම සමඟ හයෝගිත්වයෙන් වසරකට වරක් හෝ වැඩි වශයෙන් ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම පරීක්ෂාවට ලක් කෙරේ.

## 2020 දී ක්‍රියාත්මක වූ වැඩසටහන්

වසර තුළ, අපගේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන යටිතල පහසුකම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස අපි පියවර ගණනාවන් ගෙන ඇත. අපගේ ක්‍රමෝපායික විධි ක්‍රියාත්මක කිරීමට සමාගමේ අනෙකුත් සියලුම ව්‍යාපාර අංශයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර එය මූලිකවම ගනුදෙනුකාර අත්දැකීම, අභ්‍යන්තර ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව උසස් කිරීම සහ සේවාවන්ගේ ගුණාත්මකභාවය ප්‍රමිතිගතකරණය සඳහා සම්බන්ධ වේ. වසර තුළ පහත සඳහන් පියවර ගනු ලැබීය.

අපගේ ව්‍යාපාර ක්‍රියාවලින් තුළට කෘතීම බුද්ධිය (AI) යොදාගැනීමේ ක්‍රියාවලියක අපි නිරත වෙමු. අපගේ අවශ්‍යතාවන් තීරණය කිරීමේ හැකියාවත් වෙළෙඳුන් වෙත ඉදිරිපත් කිරීමේ මූලික පියවර අපි රැගෙන ඇත. කෘතීම බුද්ධි ක්‍රියාවලිය තුළ මාරු කරනු ලබන මෙහෙයුම් දෙවන අදියරේදී හඳුනාගනු ලබන අතර ඉන්පසු තෙවැනි පියවරේදී එය ක්‍රියාත්මක කරනු ඇත. මෙය දැනට කරගෙන යන වැඩසටහනක් වන අතර ආසන්න අනාගතය තුළ මෙම අපේක්ෂාවන් ඉටු කරනු ඇත.

එමෙන්ම, අපගේ දත්ත මධ්‍යස්ථානය උසස් කිරීමේ දෙවන අදියරට අපි පිවිස ඇත. පසුගිය වසරේදී, දත්ත මධ්‍යස්ථානය සඳහා නවීනතම IBM බල පද්ධති තුළ අපි ආයෝජනය කළෙමු. අපගේ අතථ්‍යකරණ ක්‍රියාවලිය උසස් කිරීමට අපි බලාපොරොත්තු වන අතර පරිගණක දෘඩාංග සහ මේස පරිගණකකරණය වඩා කාර්යක්ෂමව භාවිතා කිරීමට ඉන් අපට ඉඩ ලබා දෙනු ඇත. මෙම උසස් කිරීම තුළින් ඉහළ කාර්යසාධනය, අඩු අන්තර්හිතතාව සහ ඉහළ උපයෝජ්‍යතාව සමඟ අපගේ ප්‍රධාන ව්‍යාපාර අවශ්‍යතා පහසුකරනු ඇත.

### තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය

විශේෂයෙන් විද්‍යුත් දත්ත ඇතුළුව තොරතුරු අනවසරයෙන් භාවිතා කිරීමෙන් සමාගම ආරක්ෂා කර ගැනීම අප සියල්ලටම ප්‍රධාන වැදගත්කමකි.



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

වසර තුළ ගනු ලැබූ අනෙකුත් පියවර පහතින් දැක්වේ

- ඊ-මෙමෝ පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- පැමිණිලි කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- PIL හි ක්‍රියාත්මක කළ ස්ථාවර වත්කම් ක්‍රමය
- ඉජාරා, මුෂාරකා පාවෙන අනුපාත වෙනස් කිරීම
- නියමු කළමනාකරණ විසඳුම් වැඩි කිරීම
- ලොතරැයි දිනුම් ඇදීමේ ක්‍රියාවලිය
- අයකිරීම් දිනපොත
- වංචා අවම කිරීම සඳහා නව තාක්ෂණය
- සෙල්ෆි කෑෂ් සහතික අඩුකිරීමේ විකල්පය
- රඳවා ගැනීමේ බදු වෙනසට අදාළව පද්ධති නවීකරණය
- පොදු විද්‍යුත් අරමුදල් මාරුකිරීමේ ස්විචය (CEFTS) ක්‍රියාත්මක කිරීම
- රන් ණය ක්‍රමය ශාඛා 14ක ක්‍රියාත්මක කිරීම
- ISO 27001 තොරතුරු ආරක්ෂක කළමනාකරණ ක්‍රමය සහතික කිරීම අලුත් කිරීම

## අනාගත දැක්ම

දැනට පවත්නා ශාඛා ජාලයේ සේවාවන් වැඩි කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන අතර තවදුරටත් ශාඛා ව්‍යාප්තිය පිළිබඳ උනන්දු නොවෙමු. ඒ වෙනුවට, අපගේ ගනුදෙනුකරුවන්ට වඩාත් පහසුව පිරිනැමීම සඳහා ඇගයීමකින් පසු ශාඛාවල රන් ණය ඒකක අපි ව්‍යාප්ත කරමු. තවද, පාස්කු ප්‍රහාර සහ කොවිඩ්-19 වසංගතයෙන් පසු වුවද සමාගම ඵලදායිව කටයුතු කළ ආකාරය විසින් පෙන්වා දුන් පරිදි අපගේ මෙහෙයුම් සඳහා පහසුකම් සලසන ලද අපගේ තොරතුරු තාක්ෂණ හැකියාවන් අපි සංවර්ධනය කරන්නෙමු. ඉදිරි වර්ෂවලදී පහත සඳහන් තොරතුරු තාක්ෂණ වැඩිදියුණුකිරීම් අපි හඳුන්වා දෙන්නෙමු.

- නායක සහ අලෙවි බලකාය කළමනාකරණ විසඳුම
- ප්‍රවීනයින්ගේ මැදිහත්වීම අඩු කරමින් ණය ඇගයීම ක්‍රමවත් කිරීම
- නව පැහැරහැරීම් කළමනාකරණ විසඳුමක්
- සමස්ත ණය ලියවිලි මුද්‍රණ ක්‍රියාවලිය ඩිජිටල්කරණය

**අපගේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන (ICT) ක්‍රමෝපාය ප්‍රධාන වශයෙන් ව්‍යාපාර ක්‍රමෝපාය යටතේ ඇති අතර මෙහෙයුම් පරිසරයෙන් පැනනැගෙන කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගනී.**



# බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය අපගේ ආයතනය සහ වටිනාකම නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවන බලවේගය ලෙස සලකනු ලැබිය හැකිය. එය විශාල වශයෙන් වටිනාකම නිර්මාණය කිරීමට අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වන (නොවන) ආයතනිකගත දැනුම, සන්නාමය, ආයතනික සදාචාර සහ සංස්කෘතිය, ප්‍රමිති සහ ප්‍රතිපත්ති වැනි අස්පෘශ්‍ය සංරචකවලින් සමන්විත වේ. එමෙන්ම එය ක්‍රමෝපායික හැකියාව ඇති කරන්නා වන අතර, අපගේ ක්‍රමෝපායික විධි සකස් කිරීමේදී  බුද්ධිමය ප්‍රාග්ධනයේ කාර්යභාරය සැලකිල්ලට ගනී. මෙම කොටස තුළ, පීපල්ස් ලීසිං හි බුද්ධිමය ප්‍රාග්ධනය තරඟකාරී වාසිය, අනාගත යෝග්‍යතා සහ පාර්ශ්වකරුවන් නිරතකිරීමේ හැකියාව කෙරෙහි බලපාන ආකාරය අනුව අපි ඒ දෙස බලමු.

**පරිගණක මෘදුකාංග තුළ ආයෝජනය**

**75.32%**

**කින් වැඩි කරන ලදී**

## වැදගත් සිදුවීම්

බිස්නස් ටුඩේ ටොප් 30 –
**13 වැනි ස්ථානය**

ශ්‍රී ලංකාව තුළ විශිෂ්ටතම ආයතනික පුරවැසියන් දහයෙන් එකකි

ආයතනික වාර්තාකරණය තුළ විනිවිදභාවය තුළ
**අංක 03 ස්ථානය**

## අදාළ ක්‍රමෝපායික විධි



තිරසාර වර්ධනය හඹායාම



ක්‍රියාත්මක කිරීමේ අනර්ඝත්වය අත්කර ගැනීම

## අදාළ පාර්ශ්වකරුවන්

ගනුදෙනුකරුවන්

සේවකයින්

ආයෝජකයින්



## විශ්වාසී සන්නාමයක්

1995 දී ස්ථාපිත කළ, පීපල්ස් ලීසිං සමාගම ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුවට 75%ක් අයත් පරිපාලිත සමාගමකි. මෙයට පෙර පී.එල්.සී. යනුවෙන් හඳුන්වන ලද මෙම සමාගම එහි මව් සමාගම සමඟ සම්බන්ධය පිළිබිඹු කිරීමට සහ සමාගමේ අනන්‍යතාව ඉදිරියට ගෙන යාමට එහි සන්නාමය පීපල්ස් ලීසිං ලෙස වෙනස්කරන ලදී.

මෙරට ඉහළම බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලෙස, ඉහළ තරඟකාරි පරිසරයක් තුළ අපි නායකත්ව ස්ථානයක සිටිමු. වෙළෙඳපොල සංදර්භය සහ අපගේ ගනුදෙනුකරුවන් මෙන්ම සමස්තයක් ලෙස මෙම අංශය විසින් අපව තේරුම් ගන්නා ආකාරය අවබෝධ කර ගැනීමට පර්යේෂණ සහ සංවර්ධන අංශයක් අපි ස්ථාපිත කොට ඇත. සම්ප්‍රධායික නොවන තරඟකරුවන්ගෙන් ඇතිවන තරඟය සමඟ වර්තමාන සන්දර්භය තුළ ක්‍රියාත්මක අභියෝගවල නිමක් නැත.

අපගේ සන්නාම ස්ථානය පහත පැහැදිලි කරන පරිදි සමාලෝචිත වසර තුළ ශක්තිමත්ව පැවතුණි. ෆිට්ච් රේටින් ලංකා විසින් ශ්‍රී ලංකාව තුළ ඉහළම ශ්‍රේණිගත මූල්‍ය සමාගමක් බවට පත්කරමින් A+(lka) ණය ශ්‍රේණිගතකරණයක් සමාගමට නියම කරන ලදී.

මෙම අවස්ථාවේදී තරඟකාරී අනුපාතවලට විදේශීය අරමුදල් මූලාශ්‍ර ලබාගත නොහැක යන සාධකය සලකා බලමින්, සමාගම 2020 අප්‍රේල් 30 දින සිට ඉදිරියට ෆිට්ච් ඉන්ටර්නැෂනල් රේටින්වලින් ඉවත්වීමට තීරණය කරන ලදී.

## සන්නාම වටිනාකම

(රු. බිලියන)




## සන්නාම ශ්‍රේණිගතකරණය

ශ්‍රේණිගතකරණ

| මාර්තු 31 දිනට | 2020 | 2019 | 2018 | 2017 | 2016 |
|---|---|---|---|---|---|
| ෆිට්ච් රේටින් ලංකා | **A+(lka)** | AA-(lka) | AA-(lka) | AA-(lka) | AA-(lka) |
| ෆිට්ච් රේටින් ඉන්ටර්නැෂනල් | **B-** | B | B | B | B+ |
| ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් | **නවත්වන ලදී** | නවත්වන ලදී | B+/B | B+/B | B+/B |

## ආයතනික සංස්කෘතිය

අපගේ ආයතනික සංස්කෘතිය දැක්ම, මෙහෙවර සහ අපගේ මූලික සාරධර්ම මගින් තහවුරු කරනු ලබයි. නව්‍යකරණයට සහයවන දැනුම් හුවමාරුව පෝෂණය කරන සහ සියල්ල ඇතුළත් සංස්කෘතියක් එහි පවතී. තීරණ ගැනීමේදී වඩා ඉහළ සේවක සහභාගිත්වය සහ රාමුවෙන් පිටත නව්‍යකරණ චින්තනය සඳහා අපි අවස්ථා නිර්මාණය කර ඇත.

අපගේ සංස්කෘතිය සෑම වසරකම පුහුණු සහ සංවර්ධන වැඩසටහන් තුළ අපගේ ආයෝජන මගින් පෙන්වා ඇති පරිදි දැනුම සහ පළපුරුද්ද ප්‍රමුඛතාවයට ලක් කරයි.

ඊට අමතරව, අපගේ ආයතනය තුළ සේවයෙහි නිරත කාර්යසාධනය පදනම් සංස්කෘතියක් ඇති අතර එය අපගේ සේවකයින්ට ඉලක්ක සපුරාලීමට, ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීමට සහ පළපුරුද්ද ලබාගැනීමට ඉඩ සලකනු ලබයි. එබැවින් මෙය අනාගත හැකියාවන් පෝෂණය කරමින් අපගේ ක්‍රමෝපායික විධි අත්කර ගැනීමට සහ නායකත්ව ස්ථානයක් පවත්වා ගැනීමට සහය වනු ඇත.

## අපගේ ප්‍රධාන වටිනාකම්

පීපල්ස් ලීසිං වගකිම්සහගත ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීමේදී අපගේ සෑම සේවකයෙක්ම ඔවුන්ගේ කොටස උපරිමයෙන් සිදුකරන බව අපි විශ්වාස කරමින්, අපගේ සේවකයින් සමඟ අනුනාදවන මූලික වටිනාකම් හයක් අපි හඳුනාගෙන ඇත්තෙමු.



# බුද්ධිමය ප්‍රාග්ධනය



## ආයතනිකගත දැනුම

කර්මාන්තය තුළ නායකයෙක් ලෙස, අනෙක් ආයතනවලින් අපව වෙන්කරන සාධක ගණනාවක් අප සතුය. අපගේ ආයතනයේ සාර්ථකත්වය සඳහා ඉතා උසස් තත්ත්වයකට පත්වීමට අපගේ ආරම්භයේ සිට රැස්කරගෙන ඇති ආයතනිකගත දැනුම අපි සැලකිල්ලට ගනිමු සුළු හා මධ්‍ය පරිමාණ අංශය පිළිබඳ ශක්තිමත් දැනුමක් අප සතුවන අතර, අපගේ බුද්ධිමය සහ මානව ප්‍රාග්ධනය ක්ෂේත්‍රයේ සහ එහි අවශ්‍යතා පිළිබඳ ප්‍රවීන දැනුම ලබා දේ.

සුදුසුකම්ලත් සහ මනා පුහුණු ශ්‍රමබලකායක් අවශ්‍යවන බවත්, එය අපගේ මෙහෙයුම්වල ප්‍රධාන රුකුල සකස් කරන බවත් අපි විශ්වාස කරමු. ආයතනිකගත දැනුම ක්ෂේත්‍රය තුළ අසමසම තරඟකාරී වාසියක් අප වෙත ලබා දේ.

අපගේ විශ්වාසවන්ත ශ්‍රමබලකාය වසර ගණනාවක් පුරා ආයතනය සමඟ සිටි ඉහළ පළපුරුදු කාර්ය මණ්ඩලයකින් සහ අළුතින් බඳවාගත් තරුණයින්ගෙන් සමන්විත වේ. ආයතනය තුළ දැනුම ආරක්ෂා කරන බව අපගේ ඉහළ රඳවාගැනීමේ අනුපාතය සහතික කරයි. පළපුරුදු සේවකයින් උපදේශකයින් ලෙස කටයුතු කරන අතර කැමැත්තෙන්ම ඔවුන්ගේ දැනුම සහ පළපුරුද්ද අනෙකුත් සේවකයින් සමඟ හුවමාරු කර ගනී.

### සම්මාන සහ පිළිගැනීම



**පීපල්ස් ලීසිං වාර්ෂික වාර්තාව 2018/19**

**ජාත්‍යන්තර ARC සම්මාන – 2019**

- රන්: මූල්‍ය දත්ත: මූල්‍ය සේවා: පොදු
- රන්: සම්ප්‍රදායික නොවන වාර්ෂික වාර්තාව: මූල්‍ය සේවා: පොදු
- රිදී: සභාපතිගේ ලිපිය: මූල්‍ය සේවා: පොදු
- ලෝකඩ: කවරයේ ඡායාරූප නිර්මාණය: මූල්‍ය සේවා: පොදු
- ලෝකඩ: ලිඛිත පාඨය: මූල්‍ය සේවා: පොදු
- ලෝකඩ: ඇතුළත නිර්මාණය: මූල්‍ය සේවා: පොදු
- ලෝකඩ: මුද්‍රණය සහ නිෂ්පාදනය: මූල්‍ය සේවා: පොදු
- ගෞරව: ඡායාරූපය: මූල්‍ය සේවා: පොදු

**CA ශ්‍රී ලංකා විසින් සංවිධානය කළ 55 වැනි වාර්ෂික වාර්තා සම්මාන – 2019:**

- ලෝකඩ සම්මානය – මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් (රු. බිලියන 20ට ඉහළ මුළු වත්කම)
- රිදී සම්මානය – ඒකාබද්ධ වාර්තාකරණය: ව්‍යාපාර ආකෘතිය පිළිබඳ විශිෂ්ට අනාවරණය

**SAFA විශිෂ්ට ලෙස ඉදිරිපත්කළ වාර්ෂික වාර්තා සම්මාන:**

- පීපල්ස් ලීසිං වාර්ෂික වාර්තාව SAFA විශිෂ්ට ලෙස ඉදිරිපත්කළ වාර්ෂික වාර්තා සම්මාන, ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන සහ ආයතනික පාලනය වාර්තාකරණය ඇගයීම 2018 සඳහා SAARC සාංවත්සරික සම්මානවලදී හවුල් ජයග්‍රහකයා බවට පත්විය.

**CMA ඒකාබද්ධ වාර්තාකරණයේ විශිෂ්ටත්වය සඳහා වන සම්මාන උළෙල – 2019**

ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය (CMA ශ්‍රී ලංකා) විසින් සංවිධානය කළ ඒකාබද්ධ වාර්තාකරණසම්මාන තුළ විශිෂ්ටත්වය සඳහා කුසලතා සහතිකය

**බිස්නස් ටුඩේ ටොප් 30 වාර්ෂික ලැයිස්තුගත කිරීම් – 13 ස්ථානය**

**LMD 100 – 2019 – 32 වැනි ශ්‍රේණිය**

## සමූහ සහක්‍රියාකාරකම්

ඉහළ තරඟකාරී පරිසරයක් තුළ, තරඟය මත වාසියක් අපට ලබාගැනීම සඳහා අපගේ සමූහය තුළ ශක්තීන් සහ සහක්‍රියාකාරකම් අපි ඵලදායීව භාවිතා කරමු. අපගේ මව් සමාගම වන මහජන බැංකුව අපට අයත් සන්නාමය සහ කීර්තිනාමයට ශක්තිය එකතු කර ඇත. මහජන බැංකුවේ දිවයින පුරා පැවැත්ම ශාඛා තුළ සේවා මධ්‍යස්ථාන විවෘත කරමින් රට තුළ එහි පැවැත්ම සවිබලගැන්වීමට පීපල්ස් ලීසිං ශක්තිමත් කර ඇත. අපගේ ජාලය පුළුල් කිරීමේ මෙම පිරිවැය ඵලදායී ක්‍රමය සුවිශාල ගනුදෙනුකාර පදනමක් කරා ගමන් කිරීමට අපට උපකාරී වේ.

ලංකන් ඵලායන්ස් ෆයිනෑන්ස් ලිමිඩඩ් තුළින්. අපි ශ්‍රී ලංකා වෙරළෙන් ඔබ්බට බංග්ලාදේශය කරා ගමන් කර ඇත. මෙම ව්‍යාපාරය අපගේ පුළුල් කිරීමේ උත්සාහයන් හි ප්‍රතිඵලයක් විය. බංග්ලාදේශය තුළ ඉහළ තරඟකාරී වෙළෙඳපොලක් තුළ අප ක්‍රියාත්මක වන බැවින්, අපගේ සමාගම අනාගත වර්ධනය සඳහා ඉහළ විභවතාව අඛණ්ඩව පෙන්වයි. කල්බදු, වාර ණය, සහ කාරක ප්‍රාග්ධන ණය ඇතුළත් අපගේ නිෂ්පාදන පිරිනැමීම අපගේ ප්‍රධාන වෙනස්කරු වන අතර එය අනෙක් ආයතනවලින් අප වෙනස් කරනු ලබයි. ව්‍යාපාරය තුළ අපි අඛණ්ඩව ආයෝජනය කරන අතර තවදුරටත් සමාගම සංවර්ධනය කිරීමට අපගේ සමූහය තුළ සහක්‍රියාකාරකම් භාවිතා කරමු.

අපගේ පරිපාලිත සමාගම් හය සදාචාර ව්‍යාපාර ක්‍රියාවලි භාවිත කරමින් අපගේ ගනුදෙනුකරුවන්ට විවිධ ණය කළඹ පිරිනැමීමට අවස්ථාවක් අප වෙත ලබා දේ. හුවමාරු බෙදාහැරීම් ජාලයක් වඩා යහපත් සමාජීය බලපෑමක් ලබාදෙන අතර වඩා අඩු පොදු කාර්ය පිරිවැය ව්‍යූහයක් පවත්වා ගැනීමට සහය වේ. හුවමාරු ප්‍රසම්පාදනය සැපයුම්කරුවන් සමඟ මිල සහ තත්ත්වය පිළිබඳ සාකච්ඡා තුළ වඩා ඉහළ ප්‍රතිලාභ සඳහා ඉඩ ලබා දේ.

## අනාගත දැක්ම

අපගේ අනාගත සාර්ථකත්වය සඳහා අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය ආරක්ෂා කිරීම අපට අත්‍යවශ්‍යයෙන්ම වැදගත් වේ. අපගේ සේවකයින්ගේ නොබිඳුණු දැනුම පෝෂණය කරන බව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක පද්ධති සහ ක්‍රියාවලි ශක්තියෙන් ශක්තියට අප ගෙනයන බව අපට විශ්වාසය.



# මානව ප්‍රාග්ධනය

පීපල්ස් ලීසිං හි, අපගේ සේවකයින් අපගේ සාරධර්ම මගින් සේවයේ නිරත කර මෙහෙයවන බව අපි සහතික කරමු. සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්තිය අපගේ ආයතනික ක්‍රමෝපාය සමග සමීපව පෙළගැසී ඇති අතර මෙහෙයුම් සන්දර්භය තුළ නවීන සංවර්ධනයන් ඉන් පිළිබිඹු කරයි. අපගේ සේවකයින් අනෙකුත් තරගකරුවන්ගෙන් අප වෙනස් කරන ඉහළම වත්කම වන බව අපි අවබෝධ කර ගනිමු. අපගේ ක්‍රමවත් බඳවාගැනීමේ ක්‍රියාවලිය, අපට සුදුසු පරිදි සකස්කළ හැකියා ගොඩනැගීම, පුහුණු වැඩසටහන් සහ අපගේ වෘත්තීය සංවර්ධන අවස්ථා තුළ මෙය පිළිබිඹු කෙරේ. අපගේ මෙහෙයුම් ඩිජිටල්කරණය වීම ද හේතුකොටගෙන අපගේ සේවකයන්ට ඩිජිටල් මූලික පරිසරයක් තුළ සේවය කිරීම ඉතා වැදගත් සාධකයක් කොට ඇත.

**සේවක රඳවා ගැනීමේ අනුපාතය**

**90.82%**

**දක්වා වර්ධනය කරන ලදී**

## වැදගත් සිදුවීම්

සේවක පදනම
**2,401**

නව බඳවාගැනීම්
**334**

පුහුණු පැය
**20,955**

## අදාළ පාර්ශ්වකරුවන්

සේවකයින්

## අදාළ ක්‍රමෝපායික විධි

තිරසාර වර්ධනය හඹායාම

ක්‍රියාත්මක කිරීමේ අනර්ඝත්වය අත්කරගැනීම

වගකීම්සහගත කළමනාකරණය මූර්තිමත් කිරීම



# මානව ප්‍රාග්ධනය



## අපගේ කණ්ඩායම

මුළු සේවක ශක්තිය 2020 මාර්තු මස 31 දිනට 2,401ක් වූ අතර ඉන් 2,111ක් ස්ථිර සේවකයින් වූ අතර 315 ක් පරිවාස, පුහුණු, අනියම් සහ කොන්ත්‍රාත් සේවකයින්ය. වසර තුළ, අපගේ සමාගම හා එක් වූ නව බඳවාගැනීම් මුළු ගණන 334 ක් විය. අපගේ රඳවාගැනීමේ අනුපාතය අපගේ සේවකයින් අප කෙරෙහි තබා ඇති විශ්වාසය, පක්ෂපාතිත්වය පිළිබිඹු කරමින් 90.82% ක් විය.

අපගේ ඉහළම වත්කම වන්නේ අපගේ පළපුරුදු සේවකයින්ගේ සමුච්චිත දැනුමයි. දීර්ඝ කාලසීමාවක් සමාගම සමඟ සිටි සේවකයින්ගෙන් සමන්විත ශ්‍රමබලකායක් අපි සතුවන අතර ඔවුන් අපගේ ආයතනික සංස්කෘතියේ භාරකරුවන් වේ. ඒ අනුව ඔවුන් අපගේ අලුතින් බඳවාගනු ලැබූවන් වෙත උපදෙස් ලබා දී දැනුවත් කිරීම කරන අතර එය අපගේ වටිනාකම් සහ ආයතනික සංස්කෘතියේ අඛණ්ඩතාව ඉදිරියට ගෙන යනු ලබයි.

2019/20 දී අපගේ ශ්‍රමබලකායේ විස්තරාත්මක සංඛ්‍යාලේඛන පහත දැක්වේ:

## මුළු ශ්‍රමබලකාය

(ගණන.)




## ස්ත්‍රී පුරුෂභාවය අනුව මුළු ශ්‍රමබලකාය




අපි සේවකයින් තාවකාලික හෝ අර්ධකාලින පදනමක් මත බඳවා නොගනිමු. සියලුම බඳවාගැනීම් පරිවාස කාලසීමාවකට යටත් කෙරෙන අතර මෙම කාලසීමාව සාර්ථක ලෙස අවසන් කරන පුද්ගලයින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහනය කෙරේ.

### ජනවර්ගය අනුව සේවක සංයුතිය

| ජනවර්ගය | 2019/20 | | | |
|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | එකතුව | % |
| සිංහල | 1,608 | 535 | 2,143 | 89 |
| දෙමළ | 139 | 25 | 164 | 7 |
| මුස්ලිම් | 82 | 12 | 94 | 4 |
| **මුළු ගණන** | **1,829** | **572** | **2,401** | **100** |

පරිපූර්ණ විවිධත්වයෙන් යුත් ශ්‍රමබලකායක් අප සතුවන අතර ඉන් විවිධ ජනවර්ග නියෝජනය කරමින් සියලුම භූගෝලීය කලාපයන්ගේ සිටින අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධත්වය පිළිබිඹු කරයි. මෙම, ක්ෂේත්‍රය තුළ පවතින සාමාන්‍ය ස්වභාවය අනුව අපගේ ස්ත්‍රී පුරුෂ සංයුතිය තුළ පුරුෂ ප්‍රතිශතය වැඩි අගයක් ගනී. කෙසේවෙතත්, ස්ත්‍රීපුරුෂභාවය, ජනවර්ගය, වයස හෝ කායික ආබාධිතතාව මත පදනම් වී වෙනස් ලෙස නොසලකන සමාන අවස්ථා ලබාදීම මගින් ස්ත්‍රීපුරුෂ අනුපාතය සහ ජනවර්ග සංයුතිය වර්ධනය කිරීමට අපි උත්සාහ ගනිමු. අපගේ සේවකයින් ශ්‍රී ලංකාවේ සැම කලාපයකින්ම පැමිණෙන බැවින්, ප්‍රධාන කාර්යාලය සහ ශාඛා අතර ඵලදායි සන්නිවේදනය සහතික කිරීම සඳහා සන්නිවේදන මාර්ග අපි ස්ථාපිත කර ඇත.

### සේවක වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය සහ වයස අනුව මුළු ශ්‍රමබලකාය

| සේවක වර්ගය | ස්ත්‍රී පුරුෂභාවය | 2019/20 | | | | | | 2018/19 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වයස විශ්ලේෂණය (අවුරුදු) | | | | | මුළු ස්ත්‍රී පුරුෂභාවය විශ්ලේෂණ (ගණන) | වයස විශ්ලේෂණය (අවුරුදු) | | | | | මුළු ස්ත්‍රී පුරුෂභාවය විශ්ලේෂණ (ගණන) |
| | | > 60 | 50-59 | 40-49 | 30-39 | <= 29 | | > 60 | 50-59 | 40-49 | 30-39 | <= 29 | |
| ජ්‍යෙෂ්ඨ නායකත්වය | පිරිමි | 1 | 13 | 19 | 1 | – | 34 | 2 | 11 | 19 | 2 | – | 34 |
| | ගැහැණු | – | 1 | 1 | – | – | 2 | – | 1 | 1 | – | – | 2 |
| මැදපෙළ කළමනාකරුවන් | පිරිමි | – | 6 | 31 | 4 | – | 41 | – | – | – | – | – | – |
| | ගැහැණු | – | – | 2 | 1 | – | 3 | – | – | – | – | – | – |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | පිරිමි | – | 6 | 64 | 50 | – | 120 | 1 | 7 | 86 | 57 | – | 151 |
| | ගැහැණු | – | – | 12 | 12 | – | 24 | – | – | 13 | 12 | – | 25 |
| විධායක නිළධාරීන් | පිරිමි | 1 | 8 | 67 | 297 | 18 | 391 | 1 | 7 | 60 | 275 | 29 | 372 |
| | ගැහැණු | – | 3 | 41 | 52 | 6 | 102 | – | 1 | 36 | 52 | 4 | 93 |
| විධායක නොවන නිළධාරීන් | පිරිමි | 10 | 5 | 31 | 407 | 690 | 1,143 | 1 | 1 | 26 | 349 | 754 | 1,131 |
| | ගැහැණු | 2 | – | 5 | 149 | 283 | 439 | 1 | 1 | 4 | 118 | 296 | 420 |
| කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | පිරිමි | – | 8 | 19 | 31 | 42 | 100 | – | 6 | 20 | 35 | 38 | 99 |
| | ගැහැණු | – | 2 | – | – | – | 2 | – | 1 | 1 | – | – | 2 |
| **මුළු ගණන** | | **14** | **52** | **292** | **1,004** | **1,039** | **2,401** | 6 | 36 | 266 | 900 | 1,121 | 2,329 |

# මානව ප්‍රාග්ධනය

සේවක සන්නිවේදනයේ විධිමත් ක්‍රමවලට පහත දෑ අතුළත්ය:

- අභ්‍යන්තර ජාලය
- සේවක චක්‍රලේඛ
- අභ්‍යන්තර සංදේශ
- විද්‍යුත් ලිපි
- ප්‍රතිපත්ති
- සේවක රැස්වීම්

## බඳවා ගැනීම

ඉතා ඉහළ සහභාගිත්වයක් සහිත අංශයක තරඟකාරී වාසියක් ලබාගැනීම් පිණිස, විශිෂ්ට දක්ෂයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට අපි කටයුතු කරමු. බඳවා ගැනීම මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන අභියෝගය ලෙස සලකනු ලැබිය හැකිය. මෙම අභියෝගය ජයගැනීම සඳහා, විධිමත් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් අපි ක්‍රියාවට නංවා ඇති අතර ඉන් සමාගම තුළ උසස්වීම් සහ ඇබෑර්තු සඳහා අභ්‍යන්තර අපේක්ෂකයින් ප්‍රමුඛතාවයට ලක් කරයි. එමෙන්ම අපි අඩු පළපුරුද්ද සහිත බඳවා ගැනීම් ද සිදුකරන අතර අපගේ පුළුල් වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින් ඔවුන්ව පුහුණු කරනු ලබයි. අපගේ අළුතින් බඳවා ගනු ලැබූවන්ගේ සම්පූර්ණ පසුබිම් පරීක්ෂණ අපි පවත්වන අතර ඒ තුළින් අපගේ සංස්කෘතිය සහ වටිනාකම් සමඟ පෙළගැසිය හැකි වටිනාකම් ඔවුන් සතුද යන්න තීරණය කරයි.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සමාගමේ ක්‍රමෝපාය සහ ආයතනික ව්‍යුහයට අනුගත වෙමින් සියලුම දෙපාර්තමේන්තුවල ඉදිරියේ ඇතිවිය හැකි ඇබෑර්තු සහ පළපුරුද්ද ඇති පරතර හඳුනා ගනු ලබයි. ශාඛා කළමනාකරු, දෙවැනි නිලධාරී වැනි ශාඛා මෙහෙයුම්වල ප්‍රධාන කාර්යභාරයන් සඳහා අනුප්‍රාප්තික සැලසුම්කරණය සිදුකරන ලදී. ක්ෂේත්‍රය තුළ නායකත්ව ස්ථානයක් පවත්වා ගැනීමට අවශ්‍ය කරන භූමිකාවන් පිළිබඳ පැහැදිලි දැක්මක් මින් මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලබා දේ. ඉහළට ගමන්කොට දීර්ඝකාලීනව සමාගමේ වත්කමක් බවට පත්වීමේ හැකියාව ඇති තරුණ සහ ක්‍රියාශීලී සේවකයන් අපි බඳවා ගනී. වසර තුළ සේවයට බැඳුණු නව සේවකයින් ගණන 334ක් විය.

## ස්ත්‍රී පුරුෂභාවය අනුව බඳවා ගැනීම

(ගණන)




## අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය

අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය ඉහළ තරඟකාරී පරිසරයක් තුළ අපගේ සාර්ථකත්වය සඳහා ප්‍රමුඛ වේ. අපගේ වර්ධනයට සේවක පුහුණු අවස්ථා අත්‍යවශ්‍ය වන බවත් එය අපගේ කණ්ඩායමට අගනා ප්‍රතිඵල ඉටුකරදෙන සේවා පරිසරයක් ලබාදෙන බවත් අපි අවබෝධ කර ගනිමු. සමාගමට පුහුණුවේ ඇති වැදගත්කම අමතර අධ්‍යාපනය සහ පුහුණුව ලබාගැනීමට සේවකයින් වෙත ලබාදෙන දිරිමත් කිරීම තුළින් තවදුරටත් සනාථ වේ. සේවකයින් විසින් පිළිගත් ආයතනවලින් වෘත්තිය පිළිගැනීම සහ සහතික ලබාගන්නා අවස්ථාවල ඔවුන්ගේ පිරිවැය ප්‍රතිපූරණය කරනු ලැබේ. සේවකයින්ට අදාළ ක්ෂේත්‍රයන් හි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මෙන්ම අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව ඇතුළත් අභ්‍යන්තර කේන්ද්‍රය හේතු කොට ගෙන ඔවුන්ට ඉතා පහසුවෙන් තොරතුරු වෙත පිවිසීමට හැකියාව ඇත. සියලුම සේවකයින් වෙනුවෙන් පුහුණු පැය 20,955ක් වාර්තාවෙන අතර වසර තුළ පුහුණු හා සංවර්ධනය සඳහා සමාගම රු. මිලියන 3.38 ක් ආයෝජනය කර ඇත.

වසර තුළ, නව සහ දැනට පවත්නා නිෂ්පාදන, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි පිළිබඳ ඉදිරි පෙළ සේවකයින් සංවර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර පුහුණු පැය ගණන සමාගම විසින් වැඩි කරන ලදී. අයකරගැනීම, අවදානම සහ පාලනය සහ අලෙවිකරණ කාර්ය මණ්ඩලය සඳහා හරස් කාර්යාත්මක පුහුණුව සහ රැකියා විවර්ධනය ආරම්භ කරන ලදී.

සේවක පුහුණුව සහ සංවර්ධනය තුළින් පහත සඳහන් මාතෘකා රාශියක් ආවරණය කරයි:

- නිෂ්පාදන දැනුම
- පද්ධති සහ ක්‍රියාවලි
- මෙහෙයුම්
- මූල්‍යකරණය
- තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ ලේඛනගත දක්ෂතා
- වෙළෙඳපොළ විමර්ෂණ සහ විශ්ලේෂණ
- ගැටලු විසඳීම සහ තීරණ ගැනීම
- ණය සහ ගනුදෙනුකරු ඇගයීම යෝජනා සකස් කිරීම
- කාර්යාල කළමනාකරණය සහ සේවකයින් මෙහෙයවීම
- නායකත්ව කුසලතා සහ තීරණ ගැනීම
- ඉදිරිපත් කිරීමේ සහ සන්නිවේදන දක්ෂතා
- ගනුදෙනුකාර සේවය

**තනතුර අනුව එක් සේවකයෙකු වෙත සාමාන්‍ය පුහුණු පැය ගණන**

| වර්ගය | ස්ත්‍රී පුරුෂභාවය | පුහුණු වැඩසටහන් (ගණන) | | | | මුළු කාර්ය මණ්ඩලය පුහුණු (ගණන) | ස්ත්‍රී පුරුෂභාවය අනුව ලබාගත් පුහුණුව % | සාමාන්‍ය (පැය) | පුහුණු (පැය) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අභ්‍යන්තර | බාහිර | විදේශීය | එකතුව | | | | |
| ජ්‍යෙෂ්ඨ නායකත්වය | පිරිමි | 1 | 8 | 1 | 10 | 22 | 91.67 | 10.75 | 236.50 |
| | ගැහැණු | – | 2 | – | 2 | 2 | 8.33 | 14.00 | 28.00 |
| මධ්‍යම කළමනාකරුවන් | පිරිමි | 2 | 4 | – | 6 | 35 | 92.11 | 6.54 | 229.00 |
| | ගැහැණු | 1 | 2 | – | 3 | 3 | 7.89 | 11.33 | 34.00 |
| ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් | පිරිමි | 5 | 12 | – | 17 | 97 | 87.39 | 6.84 | 663.00 |
| | ගැහැණු | 1 | 10 | – | 11 | 14 | 12.61 | 9.96 | 139.50 |
| විධායක නිලධාරීන් | පිරිමි | 10 | 10 | – | 20 | 469 | 94.37 | 7.60 | 3,563.00 |
| | ගැහැණු | 7 | 8 | – | 15 | 28 | 5.63 | 8.23 | 230.50 |
| විධායක නොවන නිලධාරීන් | පිරිමි | 10 | 3 | – | 13 | 1,334 | 91.00 | 9.98 | 13,318.50 |
| | ගැහැණු | 5 | 7 | – | 12 | 132 | 9.00 | 15.34 | 2,025.00 |
| කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | පිරිමි | 2 | – | – | 2 | 21 | 100.00 | 23.24 | 488.00 |
| | ගැහැණු | – | – | – | – | – | – | – | – |
| **මුළු ගණන** | පිරිමි | 30 | 37 | 1 | 68 | 1,978 | 91.70 | 9.35 | 18,498.00 |
| | ගැහැණු | 14 | 29 | – | 43 | 179 | 8.30 | 13.73 | 2,457.00 |
| **මුළු එකතුව** | **පිරිමි + ගැහැණු** | 44 | 66 | 1 | 111 | 2,157 | 100.00 | 9.71 | 20,955.00 |

## සේවක පිරිවැටුම

අපි ධනාත්මක, යහපත් සහ ආරක්ෂිත සේවා පරිසරයක් නිර්මාණය කර ඇති අතර එය සේවක රඳවාගැනීම, නොපැමිණියාව අඩුකිරීම සහ ඵලදායිතාව වැඩිකිරීම සඳහා ප්‍රධාන වේ. කෙසේවෙතත්, ඉතා තරඟකාරී ක්ෂේත්‍රයක් බැවින්, සේවක පිරිවැටුම අප සමඟ පොර බදින යථාර්තයකි.

සමාලෝචිත වසර තුළ සේවක පිරිවැටුම් අනුපාතය 9.18%ක් වූ අතර ඉන් පසුගිය වසර තුළ වාර්තාකළ 11.15% සිට අඩුවීමක් පෙන්නුම් කරයි.

**ස්ත්‍රී පුරුෂභාවය සහ පළාත අනුව සේවක පිරිවැටුම**

| | 2019/20 | | | 2018/19 | | |
|---|---|---|---|---|---|---|
| පළාත | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව |
| බස්නාහිර පළාත | **73** | **26** | **99** | 80 | 46 | 126 |
| මධ්‍යම පළාත | **20** | **2** | **22** | 16 | 2 | 18 |
| නැගෙනහිර පළාත | **13** | **3** | **16** | 21 | 4 | 25 |
| උතුරු පළාත | **11** | **1** | **12** | 9 | 3 | 12 |
| දකුණු පළාත | **17** | **4** | **21** | 17 | 3 | 20 |
| සබරගමුව පළාත | **9** | **1** | **10** | 7 | 2 | 9 |
| ඌව පළාත | **7** | **2** | **9** | 11 | 1 | 12 |
| උතුරු මැද පළාත | **11** | **2** | **13** | 4 | 2 | 6 |
| වයඹ පළාත | **14** | **1** | **15** | 16 | 2 | 18 |
| **එකතුව** | **175** | **42** | **217** | 181 | 65 | 246 |

## ප්‍රසූත නිවාඩුවෙන් පසු සේවක රඳවාගැනීම

ප්‍රසූත නිවාඩු ලබා ගැනීමෙන් පසු සේවයට ආපසු පැමිණෙන සේවිකාවන්ගේ ගණන 2019/20 දී 10.81%කින් වැඩිවිය. 2019/20 වසර සඳහා ප්‍රසූත නිවාඩුවෙන් පසු සේවයට පැමිණීමේ අනුපාතය සහ රඳවාගැනීමේ අනුපාතය පිළිවෙළින් 85.42%ක් සහ 65.96%කි.

| විස්තරය | 2019/20 | 2018/19 |
|---|---|---|
| ප්‍රසූත නිවාඩු සඳහා හිමිකම ඇති | **572** | 542 |
| ප්‍රසූත නිවාඩු මත සිටින | **48** | 47 |
| ප්‍රසූත නිවාඩුවෙන් පසු සේවයට පැමිණීම | **41** | 37 |
| ප්‍රසූත නිවාඩුවෙන් ආපසු සේවයට පැමිණීමෙන් පසු පසුගිය මාස 12 සේවක කළ | **31** | 23 |

## ප්‍රදාන සහ පිළිගැනීම

අපගේ සේවකයින්ට සාධාරණ, තරඟකාරී සහ ආකර්ෂණීය පැකේජ පිරිනැමීමට අමතරව, ඔවුන් සේවයේ නිරතව තබාගැනීම සඳහා කාර්යසාධනය මත පදනම් ප්‍රදාන සහ අනෙකුත් මූල්‍ය සහ මූල්‍යමය නොවන ප්‍රතිලාභ අපි පිරිනමමු. අපගේ යෝජනා ක්‍රමය සේවකයින් රඳවා ගැනීම සඳහා විශේෂ වූ කාර්යභාරයක් ඉටු කරයි.

සියලුම සේවකයින්ගේ සේ.අ.අ සහ සේ.භා.අ (EPF and ETF) සහ පාරිතෝෂික ගෙවීම් නිසි වේලාවට ගෙවන බවට සහ ඒවා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වන බව අපි සහතික කරමු. පීපල්ස් ලීසිං EPF වෙත 12%ක් සහ ETF වෙත 3%ක් දායක වන අතර සේවකයින් 8%කින් EPF වෙත දායක වේ.

තම රාජකාරිය යටතේ වසර පහක් හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත සේවකයින් වෙත විශ්‍රාම ගැනීම හෝ ඉල්ලා අස්වීම මත සම්පූර්ණකළ එක් එක් වසර සඳහා මාසික වැටුපෙන් භාගයකට සමාන පාරිතෝෂිකයක් ගෙවනු ලැබේ. ශාඛා තරඟ සංවිධානය කරන අතර ඒ තුළින් සුදුසුකම් ලබන ශාඛා සේවකයින් වෙත ප්‍රදාන ලබා දේ.

වසර තුළ, අලෙවිකරණ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ට වෙන් වූ ඉලක්ක අත්කරගැනීම මත පදනම් වී නව දීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම මගින් "කාර්යසාධනය සඳහා ගෙවීම්" සංස්කෘතිය අපි තවදුරටත් ශක්තිමත් කළෙමු.

සියලුම කාන්තා සේවකයින් වෙත සාප්පු සහ කාර්යාල සේවක පනත තුළ විධිවිධානයන්ට අනුකූලව ප්‍රසූත නිවාඩු ලබා දේ.

අපගේ ශුභසාධන යෝජනා ක්‍රමය තුළින් පහත සඳහන් අමතර ප්‍රතිලාභ ලබා දේ –

- අදාළ කාණ්ඩවල මෝටර් රථ මිලදී ගැනීම සඳහා සහනදායක ණය යෝජන ක්‍රමය
- සහනදායක නිවාස ණය යෝජන ක්‍රමය
- ජංගම දුරකථන පිරිවැය මත ප්‍රතිපූරණය
- කලත්‍රයාගේ පවුල ඇතුළුව සේවකයා සහ ඔවුගේ ආසන්න පවුල වෙත මරණ ප්‍රතිලාභ
- විභාග ගාස්තු ප්‍රතිපූරණයන්
- මරදාන, මහරගම සහ බණ්ඩාරවෙල නිවාඩු බංගලා සඳහා සහනදායක මිල

එමෙන්ම අපි ස්ථිර සේවකයින් සඳහා රක්ෂණ ප්‍රතිලාභ රාශියක් ලබාදෙන අතර පහත සඳහන් ප්‍රතිලාභ ලබාදෙමින් නීරෝගී ජීවන රටාවක් සඳහා  උපදෙස් ලබාදේ:

- වෛද්‍ය, අනතුරු සහ ජීවිත රක්ෂණය
- වෛද්‍ය රක්ෂණයෙන් ආවරණය නොවන රෝග සඳහා බරපතල රෝග අරමුදල
- ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන අංගසම්පූර්ණ ශරීර යෝග්‍යතා මධ්‍යස්ථානය
- සෞඛ්‍යය, පෝෂණය සහ බරපතල රෝග පිළිබඳ නිවාරණය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණුව

**සේවක ප්‍රතිලාභ**

| ප්‍රධාන ප්‍රතිලාභ | 2019/20 රු.මිලියන | 2018/19 රු.මිලියන |
|---|---|---|
| වැටුප් සහ ප්‍රසාද දීමනා | **2,443.61** | 2,209.74 |
| සේවක අර්ථසාධක අරමුදල (EPF) | **182.75** | 163.15 |
| සේවා භාරකාර අරමුදල (ETF) | **45.67** | 40.78 |
| අතිකාල දීමනා | **50.38** | 41.99 |
| නිවාඩු දීමනා | **60.67** | 51.43 |
| දීමනා සහ දිරි දීමනා | **652.58** | 690.61 |
| අනියම් වැටුප් | **5.11** | 4.00 |
| වෛද්‍ය රක්ෂණය | **149.33** | 145.88 |
| පාරිතෝෂිකය | **111.28** | 90.59 |
| **එකතුව** | **3,701.38** | 3,438.17 |

## 2019/20 ක්‍රියාත්මක වැඩසටහන්

වසර තුළ, අපගේ සේවකයින් තවදුරටත් අභිප්‍රේරණය කිරීමට පහත වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කළෙමු:

- ඉලක්ක පදනම් දිරි දීමනා ඉලක්ක හා සෘජුවම සම්බන්ධකර මාස තුන වෙනුවට මාසිකව සමාලෝචන කිරීම
- බඳවා ගැනීම: සෑම විටම අභ්‍යන්තර සේවකයින් සඳහා ප්‍රමුඛතාව ලබාදෙන ලදී. සියලුම ප්‍රධාන කාර්යභාරයන් අභ්‍යන්තර සේවකයින්ගෙන් පුරවන ලදී.
- අදියර 1, ආයතනික කළමනාකරණය සඳහා ඊකියා විස්තර ලබාදීම ආරම්භ කරන ලදී
- ශාඛා මෙහෙයුම්වල ප්‍රධාන කාර්යභාරයන් (කළමනාකරු, දෙවැනි නිලධාරී) සඳහා අනුප්‍රාප්ත සැලැස්ම
- ශාඛා කළමනාකරණයේ කළමනාකරු, දෙවැනි නිලධාරීන් සඳහා නිෂ්පාදන, ක්‍රියාවලි/ක්‍රියාපටිපාටි පිළිබඳ පුහුණුව
- අවශ්‍ය නිෂ්පාදන සහ සේවා පුහුණු සහය ලබාදීම

## සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව

අපගේ සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ සැලකිල්ලට ගැනීම පීපල්ස් ලීසිං හි ප්‍රමුඛ අවධානයකි. හොඳ සේවා පරිසරයක් සඳහා විශිෂ්ට කොන්දේසි සහතික කිරීමට වැඩසටහන් රාශියක් දැනටමත් ක්‍රියාවට නංවා ඇත. පීපල්ස් ලීසිං සමාගම සේවකයින් වෙත නොමිලේ වෛද්‍ය චැනල් සේවාව ආරම්භ කරන ලදී. පෙරවරු 8 සිට පස්වරු 12 දක්වා සතියකට වරක් වෛද්‍යවරයා සමාගම වෙත පැමිණේ. වැඩකරන කාලයන් තුළ එක් මාර්ග අනතුරක් සමාගමින් වාර්තා වූ අතර, මේ නිසා අහිමි වූ දින ගණන පසුගිය වසරේ පැවති 29 සිට 10 දක්වා අඩුවී ඇත,

| | 2019/20 | 2018/19 |
|---|---|---|
| වැඩකරන කාලයන් තුළ මාර්ග අනතුරු | **1** | 2 |
| මෙම අනතුරු නිසා අහිමි වූ දින ගණන | **10** | 29 |

කොවිඩ්-19 වසංගතය තුළ, රජයේ රෙගුලාසිවලට අනුව අපගේ සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීමට අපි දැඩි ක්‍රියාමාර්ග අරගත්තෙමු. සංචරණ සීමාවන් පනවන ලද කාලසීමාව තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග කිහිපයක් පහත ලැයිස්තු ගත කර ඇත:

- නිවසේ සිට වැඩ කිරීම
- සේවා මුර පදනම
- සේවා ස්ථානයේ සියලුම ආරක්ෂිත ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී උදා: සනීපාරක්ෂක යාන්ත්‍රණය
- පොදු ප්‍රවාහනය භාවිතා කරන්නන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම
- රජයේ සහ සෞඛ්‍යය බලධාරීන්ගේ මඟ පෙන්වීම් දැඩි ලෙස අනුගමනය කිරීම

## සේවා ජීවිත තුලනය

අපගේ සේවකයින් වඩාත් සේවයේ නිරත කිරීමට ඉඩසලසන සේවා ජීවිත තුලනය කෙරෙහි අපි අවධානය යොමු කරන අතර එය සේවක තෘප්තිය සහ රඳවාගැනීම සඳහා මඟපාදයි. විනෝද චාරික සහ නම්‍යශීලී සේවා වැඩපිළිවෙළ සඳහා අනග්‍රහය දක්වමින් එවැනි අවස්ථාවන් අපගේ සේවකයින්ට පිරිනැමීමට අපි සහය වෙමු. සේවා ජීවිත තුලනය ප්‍රවර්ධනය කිරීමට පහත සඳහන් පියවර ගනු ලැබුවෙමු:

- පුළුල් රක්ෂණ ආවරණ පිරිනැමීම
- වෘත්තීමය තුවාල සහ රෝගාබාධ අවම කිරීමට ආරක්ෂිත සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග යොදා ගැනීම
- ක්‍රීඩා උත්සව පැවැත්වීම සහ බාහිර අනුග්‍රාහක උත්සවවලට සහභාගිවීම
- ප්‍රධාන කාර්යාලයේ පුහුණු සහය සහිත අංග සම්පූර්ණ සරඹ ශාලාව

## සේවක මැසිවිලි නිරාකරණය

යම් ගැටලුවක් තවදුරටත් වැඩිවීමට පෙර ආරම්භක අවස්ථාවේදී එය වැළැක්වීම සඳහා මැසිවිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාවට නංවා ඇත. සේවකයින්ට තම මැසිවිල්ල නිර්ණාමිකව හෝ කළමනාකරණයේ ඕනෑම සාමාජිකයෙක් වෙත විවෘත ප්‍රතිපත්තිය තුළින් වාර්තා කළ හැකිය. මානව සම්පත් දෙපාර්තමේන්තුව එවැනි මැසිවිලි නිරාකරණය කිරීමට සූදානම් කර ඇති අතර සමාගම එහි සේවකයින්ගේ ආචාර සම්පන්න නොවන හෝ නීතිවිරෝධි හැසිරීම නොඉවසයි. විනය සංග්‍රහයක් ක්‍රියාත්මකව ඇති අතර මෙම සංග්‍රහය තුළ දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූල නොවන ආකාරයෙන් හැසිරෙන පුද්ගලයින් සම්බන්ධයෙන් විනිවිද ක්‍රියාවලියක් අනුගමනය කරමින් ඒ අනුව කටයුතු කෙරේ.

## අනාගත දැක්ම

ක්ෂේත්‍රය තුළ මනා පරිචයන් හා සමගාමීවීම සඳහා අපගේ මානව සම්පත් පරිචය තුළ වැඩිදියුණු කිරීම් අප සිදුකරන්නෙමු, ඉදිරි අනාගතයේ මූලික ගැටලුව වන්නේ කොවිඩ්-19 වසංගතය සමඟ කටයුතු කිරීම සහ බලධාරීන් විසින් නිකුත් කළ අවශ්‍ය සියලුම රෙගුලාසි පිළිපදිමින් අවශ්‍ය සියලුම සෞඛ්‍යය සහ ආරක්ෂක ක්‍රියාමාර්ග අනුගමනය කරමින් අපගේ සේවකයින් ආරක්ෂා කිරීමයි. එමෙන්ම, සෞඛ්‍යයමය සීමාකිරීම් හේතු කොට ගෙන මාර්ගගත ඉගෙනුම දිරිගැන්වීමට අපි අපේක්ෂා කරමු. මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඊකියා පොල වෙත යාම, දේශීය විශ්ව විද්‍යාල සහ වෘත්තිය ආයතන සමඟ සම්බන්ධතා ඇතිකරගැනීම වැනි නව බඳවා ගැනීමේ ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබේ. තවද, විශිෂ්ට මානව සම්පත් පරිචයන් සහ නීතිමය අනුකූලතා පිළිබඳ දැනුම් හුවමාරුව සඳහා ජාතික ආයතන සහ සංවිධාන සමඟ අපට සමීප සම්බන්ධතා ඇත. සමාගමේ ක්‍රමෝපායික උපදේශය අනුගමනය කරමින්, ව්‍යාපාර තීරණ සඳහා වටිනා දර්ශනය ලබාදීම සඳහා මානව සම්පත් විශ්ලේෂණ භාවිතා කරමින් පීපල්ස් ලීසිං හි කාර්යසාධනය පදනම් සංස්කෘතියක් අපි නිර්මාණය කරන්නෙමු.

- ඉදිරි වසර තුන තුළ, සේවක අභිප්‍රේරණය සඳහා පහත කරුණු කෙරෙහි අපි අවධානය යොමු කරමු.
  - අදියර 2: මැදපෙල කළමනාකරුවන් සඳහා ඊකියා විස්තර
  - අදියර 3: ප්‍රධාන කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා ඊකියා විස්තර
  - තීරණාත්මක කාර්යභාරයන් හඳුනා ගැනීම
  - සමාගමේ ක්‍රමෝපායික පරමාර්ථවලට සහයවීමට අවධානය යොමුකළ පුහුණු වැඩසටහන්
  - ශාඛා කළමනාකරණ ඇබෑර්තු (අභ්‍යන්තර සහ බාහිර) සඳහා හැකියා සංචිතයක් නිර්මාණය
  - ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා ඊකියා විස්තර නැවත බැලීම/සංවර්ධනය
  - ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා මූලික කාර්යසාධන දර්ශක සංවර්ධනය
  - දක්ෂ, නිරත සහ අභිප්‍රේරිත කණ්ඩායමක් ගොඩ නැගීම
  - මානව සම්පත් විශ්ලේෂණ පිළිබඳ සංස්කෘතියක් නිර්මාණය
  - ප්‍රධාන කාර්යාලය/ශාඛා කළමනාකරණය සඳහා නායකත්ව සංවර්ධන වැඩසටහන

# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

වගකීම්සහගත ආයතනික පුරවැසියෙකු වශයෙන් සියලුම පාර්ශ්වකරුවන් සමඟ අප පවත්වාගන්නා සම්බන්ධතාවන් තුළින් ආයතනයක් ලෙස ක්‍රියාත්මකවීම සඳහා අපගේ සමාජ සහ නෛතික බලපත්‍රය ලැබෙන බව අපි විශ්වාස කරමු. අපගේ ආරම්භයේ සිට එකක් අනෙකකට බැඳුණු වටිනාකම නිර්මාණය කර බෙදාහැරීමට අපගේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ දීර්ඝ කාලීන අන්‍යෝන්‍යව ප්‍රතිලාභී සම්බන්ධතා අපි ගොඩ නගා ඇත. මෙවැනි සම්බන්ධතා අපගේ ක්‍රමෝපාය සකස් කිරීමට සහ අපගේ තීරණ ගැනීම දැනුම්දීමට දායක වේ. අපගේ ප්‍රධාන කණ්ඩායම් වන ආයෝජකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන් සහ ප්‍රජාව සහ පරිසරය සමඟ අපි කටයුතු කරන ආකාරය පහත කොටසින් විස්තර කෙරේ.

**නව ගනුදෙනුකරුවන්ගෙන් 89% ක් පීපල්ස් ලීසිං සමඟ ඔවුන්ගේ සබඳතා අඛණ්ඩව ඉදිරියට ගෙන යයි**

## වැදගත් සිදුවීම්

සක්‍රීය ව්‍යාපාර හවුල්කරුවන් **40,910**

මහජන සෞඛ්‍යාරක්ෂාව සඳහා **රු. මිලියන 22.90ක්** වටිනා ආයෝජනය

සන්නාම වාර්ෂික 2020 – **වඩාත් වටිනා පාරිභෝගික සන්නාමය සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ වඩාත් ආදරණීය සන්නාමය**

## අදාළ ක්‍රමෝපායික විධි

තිරසාර වර්ධනය හඹායාම

ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීම

වගකීම්සහගත කළමනාකරණය මූර්තිමත් කිරීම

## අදාළ පාර්ශ්වකරුවන්

- ආයෝජකයින්
- ගනුදෙනුකරුවන්
- සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්
- ප්‍රජාව සහ පරිසරය

# ව්‍යාපාර හවුල්කරුවන් >>

ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම මගින් තහවුරු කරමින් සහ මෙරට නීති, ක්ෂේත්‍රයේ නියමයන්, නියාමන අවශ්‍යතාවන් සහ ව්‍යාපාර සදාචාර පිළිපදිමින්, අපගේ ව්‍යාපාර මෙහෙයුම් වගකීම්සහගත ආකාරයෙන් අපි පවත්වා ගනිමු. අපගේ ව්‍යාපාර හවුල්කරුවන් අපගේ මෙහෙයුම් තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරන අතර අපගේ වටිනාකම සහ ප්‍රතිපත්තිවලට එකඟ හවුල්කරුවන් සමඟ වගකීම්සහගත ව්‍යාපාර සම්බන්ධතා අපි ස්ථිර කර ඉදිරියට ගෙන ගොස් ඇත.

ඊට අමතරව, අපි මූල්‍ය සේවා සපයන්නන්, අනුරූප බැංකු, දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ අපගේ සම්බන්ධතා පෝෂණය කරගෙන ඇත. අපි අපගේ ණය බැඳීම් නිසිකලට පියවා ඇති අතර ඒ තුළින් මෙවැනි හවුල්කරුවන්ගේ විශ්වාසය අප වෙත ලබාගෙන ඇත. මෙය අභ්‍යන්තර සහ බාහිර ගනුදෙනුකරුවන්ට ඵලදායී බාධා රහිත සේවා ලබාදීම සහතික කර ඇත.

තවද, දේපල, උපකරණ නඩත්තුව, පද්ධති සහ මෘදුකාංග විසඳුම්, බලශක්තිය සහ ප්‍රචාරණය වැනි විවිධ අංශවල හවුල්කරුවන් සමඟ අපි සම්බන්ධතා පවත්වාගෙන ඇත.

## මෝටර්රථ සපයන්නන් සමඟ අපගේ සම්බන්ධතා

2020 මාර්තු මස 31 දිනට, අපගේ මෝටර් රථ සපයන්නන්ගේ ගණන 32,406ක් වූ අතර සමාලෝචිත වසර තුළ අප විසින් ඔවුන්ට ගෙවන ලද මුදල් රු. මිලියන 60,616ක් විය. එය අපගේ සැපයුම්කරුවන් වෙත සිදුකරන මුළු ගෙවීම්වලින් 70.34ක් නියෝජනය කරයි.

වසර තුළ, මෝටර්රථ වෙළෙන්ඳන් සහ ආනයනකරුවන් සමඟ ක්‍රමෝපායික සම්බන්ධතා කිහිපයකට අප ඇතුළත් විමු. මෙම හවුල්කාරත්වයන් තුළින් අපගේ ගනුදෙනුකරුවන් සඳහා ප්‍රතිලාභ පහත පරිදි වේ:

- මෝටර්රථ නොමිලේ ලියාපදිංචිය
- නොමිලේ ආදායම් බලපත්‍රය
- මෝටර්රථ සඳහා සම්පූර්ණ සේවාව
- අඩවශයෙන් ප්‍රාග්ධන නිරවුල් කිරීම
- මෝටර් රථයේ මුල් මිල ගණන මත වට්ටම
- ප්‍රවර්ධන අයිතම

| | 2019/20 |
|---|---|
| සක්‍රීය ව්‍යාපාර හවුල්කරුවන් (ගණන) | **40,910** |
| මෝටර්රථ සැපයුම්කරුවන් (ගණන) | **32,406** |
| ප්‍රසම්පාදන වියදම් (:රු. මිලියන) | **88,788.44** |

## අපගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය

ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය මත කටයුතු කරමින්, අප ප්‍රසම්පාදන අත්පොතක් සකස් කර ඇති අතර, එය සමාගම විසින් යොදා ගනු ලබන යහපත් ව්‍යාපාර පරිචයන්ට දායක වන විස්තරාත්මක ලියවිල්ලකි. සමාගම තුළ ක්‍රියාත්මක කරන සියලුම ප්‍රසම්පාදන සඳහා උපදෙස් ලබාදීමට එය සැලසුම් කෙරේ. අත්පොතෙහි ක්‍රියාපටිපාටි විනිවිදභාවය, වගවීම සහ සාධාරණය පිළිබඳ වටිනාකම්වලට අනුකූල වන අතර සමාගමේ පොදු යහපත සඳහා තීරණ ගැනිමට තීරණ ගන්නන් මෙහෙයවනු ලබයි.

තීරණ ගැනීමේ ඒකකය (DMU) අනුමත අනුකෘතිය පරිදි සමාගමේ භාණ්ඩ සහ සේවා ප්‍රසම්පාදනය අනුමත කිරීමේ බලධාරියා ලෙස කටයුතු කිරීමට වගකීම දරන අතරම ඒ සඳහා බලය ද හිමිවේ.

ගුණාත්මකභාවය සහ රෙගුලාසි පිළිබඳ අවශ්‍ය සියලුම ප්‍රමිතිවලට අනුකූල වෙමින් කාලීන ආකාරයකින් භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කරන බවත් සහ සැපයුම්කරුවන් තෝරගැනීම විනිවිද ක්‍රියාවලියක් බවත් මෙම අත්පොත සහතික කරයි.

දේපල අත්කර ගැනීම සහ බැහැර කිරීමේ ප්‍රතිපත්තියක් අප සතුවන අතර, ඒ මගින් ඉඩම් සහ ගොඩනැගිලි අත්කරගැනිම, කළමනාකරණය සහ බැහැර කිරීම මෙන්ම ඒවායේ නෛතික තත්ත්වයන් සඳහා ප්‍රවේශය දක්වා ඇත. අපගේ ප්‍රධාන ශාඛාවේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව මෝටර් රථ, උපකරණ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දෘඩාංග සහ මෘදුකාංග, වැනි ප්‍රධාන ප්‍රසම්පාදන මෙහෙයවයි. තාක්ෂණික ඇගයීම් කමිටුව සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා වගකීමට බැඳී සිටී. අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පහත රූපසටහනින් විස්තර කෙරේ:



මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
**කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ >>**
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු


**ව්‍යාපාර අඛණ්ඩතා සේවාවන් පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

**සැපයුම්කරුවන් පරීක්ෂාව සහ තේරීම**

- **ප්‍රධාන කාර්යාලය**
- **ශාඛා මට්ටම** – ප්‍රධාන කාර්යාලයේ සියුම් පරීක්ෂාව සහ බලයලත් සීමාව තුළ
- **මිල ගණන් කැඳවීම (RFQ)** – දැනට සිටින සහ පහසු සැපයුම්කරුවන්
- ප්‍රසම්පාදන නිර්ණායක මත පදනම් වී
- **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම** – නිතර සිදුවන මිලදීගැනීම් සඳහා අර්ධ වාර්ෂිකව; නිතර සිදුනොවන මිලදීගැනීම් සඳහා වාර්ෂිකව

→ **ප්‍රසම්පාදනය**

- **ප්‍රධාන ප්‍රසම්පාදනය ප්‍රධාන කාර්යාල මට්ටම**
- **ශාඛා මට්ටමේ පරිභෝජන භාණ්ඩ**

→ **නිකුතුව සහ ගබඩා නඩත්තුව**

- ඉ-රිම්ස් තුළින්*

→ **අඛණ්ඩව සිදුවන නියාමනය හා පද්ධති වැඩිදියුණු කිරීම**

*ඉ-රිම්ස් යනු මනා සංවිධාන දෙපාර්තමේන්තුවෙන් සැපයීම් ඉල්ලා සිටීමට භාවිතා කරන මාර්ගගත ක්‍රමයකි.

## සැපයුම්කරුවන් තේරීම

පහත ලක්ෂණ මත පදනම් වී සැපයුම්කාර තෝරා ගැනීමේ නිර්ණායක අප ක්‍රියාවට නංවා ඇත:

- ගුණාත්මක ප්‍රමිති
- පිරිවැය-තරඟකාරීත්වය
- නියමිත වේලාවට සැපයුම
- විශ්වසනීයත්වය
- උපයෝජ්‍යතාව
- ක්ෂේත්‍රයේ පෙර පළපුරුද්ද
- සැපයුම්කාර හැකියාව
- අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව
- අදාළ බලපත්‍ර, සහතික කිරීම් සහ ප්‍රමිතිවලට අනුකූලතාව
- අමු ද්‍රව්‍ය ලබාගැනීමේ තිරසාර ක්‍රියාවලින්
- පාරිසරික සහ සමාජීය රෙගුලාසිවලට අනුකූලතාව
- ශ්‍රම කළමනාකරණ ක්‍රියාවලින්

## හවුල් වී ඇති සාමාජිකත්ව සහ සංවිධාන

අපගේ ව්‍යාපාර ආයතන සමඟ දැනුම හුවමාරුකිරීමට සහ සම්බන්ධතා ගොඩනැගීමට දායක වන විවිධ ව්‍යාපාර සංවිධාන සමඟ සාමාජිකත්වයන් අපි රැකගෙන ඇත. මෙම සම්බන්ධතා ක්ෂේත්‍රයේ එක්සත්කම සහ ජාලකරණය ඇතිකරන අතර ක්ෂේත්‍රයේ ප්‍රමිති ශක්තිමත් කර සංවිධාන මගින් පිරිනමන කටයුතුවලින් ප්‍රතිලාභ ලැබීමට සේවකයින් සඳහා අවස්ථාවන් ලබා දේ. පහත සඳහන් ආයතන සමඟ සාමාජිකත්ව අපි පවත්වා ගනිමු:

- බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමය
- ෆයිනෑන්ස් හවුස් ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලංකා
- මූල්‍ය ඔම්බුඩ්ස්මන් – ශ්‍රී ලංකා
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
- ආන්තික සැපයුම්කරුවන්ගේ සංගමය
- ජෛව විවිධත්ව ශ්‍රී ලංකා (අනුශාසක සාමාජික)

## අනාගත දැක්ම

අපගේ සැපයුම්කරුවන් සමඟ දැනට පවත්නා සම්බන්ධතා ශක්තිමත් කිරීමට සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සුරක්ෂිත කර ගැනිමට, අනාගතය තුළ වඩාත් ක්‍රමෝපායික සම්බන්ධතා අපි සොයන්නෙමු.

# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

## ගනුදෙනුකරුවන් >>

අපගේ ගනුදෙනුකරුවන් අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව වන අතර ශ්‍රී ලාංකීය සමාජයේ සියලුම පංතිවලින් විවිධාංගීකරණය වූ ගනුදෙනුකාර පදනමක් අපට ඇත. අපගේ ප්‍රධාන අවධානය වන්නේ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සහ ගනුදෙනුකාර අත්දැකීම වැඩිකරන විවිධ නිෂ්පාදන කළඹක් මෙන්ම සුපිරි සේවාවක් පිරිනැමීම තුළින් ඔවුන්ගේ මූල්‍ය ශුභසාධනය ඉහළ නැංවීමයි. අපගේ ගනුදෙනුකරුවන් සමඟ ශක්තිමත් සහ අර්ථවත් සම්බන්ධතා ගොඩනැගීමට අපි උත්සාහ ගන්නා අතර එය අපගේ ව්‍යාපාර සාර්ථකත්වය සඳහා ප්‍රධාන වේ.

ගනුදෙනුකරුගේ හඬට සවන්දීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමට අවකාශයක් අපි නිර්මාණය කර ඇත. අපගේ ප්‍රධාන ක්‍රමෝපායික විධියක් වන්නේ ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීම වන අතර, එය අප කරන සෑම දෙයකදීම ගනුදෙනුකරු ඉතා උසස්කොට තබාගැනීමේ අපගේ උත්සාහයන් පිළිබඳ සාක්ෂියකි.

තවද, අප සමග ඇති සෑම මැදිහත්වීමක්ම ඉතා වටිනා සහ ඔවුන්ගේ අපේක්ෂාවෙන් ඔබ්බට ගිය හැඟීමක් ඔවුන්ට ඇති කිරීමට අප උත්සහ කරමු. මහජන බැංකු ශාඛාවල අපට අයත් සේවා මධ්‍යස්ථාන සහ මාර්ගගත පිවිසුම් ස්ථානවලින් සමන්විත පුළුල්ව පැතිරුණු ශාඛා ජාලය සහ අලෙවි කුටි තුළින්, අපගේ මූල්‍ය විසඳුම් කරා පහසු පිවිසීම සහ සමාගමට පහසුවෙන් ඔවුන් සමඟ ජාලගතවීමට පහසුකම් ඇති කරයි.

## අපගේ ගනුදෙනුකරුවන්

මහජන බැංකුව (රජයට අයත් අතිදැවැන්ත බැංකුව වන මහජන බැංකුව ජනහද හඳුනන බැංකුව ලෙස ප්‍රසිද්ධ අතර පසුගිය වසර 59 තුළ ශ්‍රී ලංකා පුරවැසියන්ගේ විශ්වාසය දිනාගෙන ඇත) විසින් 75%ක් හිමිකාරත්වය දරන බැවින් පීපල්ස් ලීසිං කෙරෙහි ජනතාවට ආවේනික විශ්වාසයක් ඇත. මෙය රු. බිලියන 6.77ක ඉතුරුම් තැන්පතු ඇතුළුව බැංක නොවන මූල්‍ය ආයතන අංශයේ විශාලතම තැන්පතු පදනම වන රු. බිලියන 106.70 අත්කර ගැනීමට සමාගමට දායක වී ඇත.

## අපගේ ගනුදෙනුකාර පදනමේ සංයුතිය

හරස් විකුණුම් ඉවත් කිරීමෙන් පසු අපගේ ගනුදෙනුකාර පදනමෙන් තුනෙන් දෙකක් තැන්පතුකරුවන්ගෙන් සමන්විත වන අතර ඉතිරිය ණය ගනුදෙනුකරුවන්ය. තැන්පතු ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව අනුව, ඔවුන්ගෙන් බහුතරය ඉතුරුම් තැන්පතු තුළ ආයෝජනය කර ඇති අතර, මෙම තැන්පතු සාපේක්ෂව සමාග මට අඩු පිරිවැය වන බැවින් සහ අඩු පොළී සංවේදී ස්ථාවර අරමුදල් වන බැවින්, සමාගමට යහපත් තත්ත්වයන් පෙන්නුම් කරයි. ණය ගනුදෙනුකරුවන්ට පොළිය ගෙනඑන ප්‍රධාන නිෂ්පාදනය කල්බදු වන අතර, එය මුළු ණය ගනුදෙනුකරුවන්ගෙන් 71%ක් සඳහා දායක වේ.

### ගනුදෙනුකරුවන් භූගෝලීය ලෙස වෙන්කිරීම

| පළාත | තැන්පතුකරුවන් ගණන | ණය ගනුදෙනුකරුවන් | ශාඛා | සේවා මධ්‍යස්ථාන |
|---|---|---|---|---|
| මධ්‍යම | 28,533 | 15,115 | 12 | 8 |
| නැගෙනහිර | 14,374 | 6,059 | 9 | 11 |
| උතුරු මැද | 15,855 | 7,222 | 5 | 9 |
| වයඹ | 21,450 | 11,728 | 10 | 10 |
| උතුරු | 7,177 | 4,125 | 5 | 11 |
| සබරගමුව | 19,265 | 8,143 | 9 | 12 |
| දකුණු | 32,839 | 19,438 | 15 | 17 |
| ඌව | 23,482 | 9,250 | 6 | 7 |
| බස්නාහිර | 119,969 | 45,635 | 32 | 16 |
| **එකතුව** | **282,944** | **126,715** | **103** | **101** |

*හරස් විකුණුම් පවතී.




*හරස් විකුණුම් පැවතීම නිසා මුළු ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව එක් එක් නිෂ්පාදනයන්ට අදාළ ගනුදෙනුකරුවන්ගේ එකතුවට වඩා අඩුයි.




**ඉස්ලාමීය සම්මාන**

"වසරේ කල්බදු සමාගම (ඉජාරා කළඹ මත)" සඳහා ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකුකරණ හා මූල්‍ය ආයතනයේ (SLIBFI) රිදී සම්මානය, පීපල්ස් ලීසිං "අල්-සෆා" ඉස්ලාමීය මූල්‍ය ඒකකය "සමාජය නගාසිටුවීම" සම්මාන පන්තිය සඳහා SLIBFI රන් සම්මානය.

IFFSA සම්මාන 2019 – "වසරේ කල්බදු සමාගම" සඳහා දකුණු ආසියාවේ ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකුකරණ සංසදය – රිදී සම්මානය

සන්නාම වාර්ෂික 2020 – සියලුම වර්ගයන් හී වඩාත් වටිනාම සන්නාමය යටතේ 21 වැනි ස්ථානය හිමිකර දීම- මූල්‍ය ක්ෂේත්‍රය තුළ වඩාත් වටිනා පාරිභෝගික සන්නාමය ලබාගැනීම සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ වඩාත් වටිනා ආදරණීය සන්නාමය ලබාගැනීම

# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

## ගනුදෙනුකරුවන් >>



### අපගේ සේවාවන්

සමාජයේ විවිධ අංශවලින් පැමිණෙන ගනුදෙනුකරුවන්ගේ සියලුම අවශ්‍යතා සපුරාලන පුද්ගලගත නිෂ්පාදන සහ සේවා අපි පිරිනමමු. විස්තීර්ණ අලෙවිකරණ ක්‍රමෝපායක් අනුගමනය කරමින්, ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට කාර්යක්ෂමව ප්‍රතිචාර දක්වමින් සහ තෘප්තිමත් කරමින් අපි නව නිෂ්පාදන දියත් කළෙමු.

පීපල්ස් ලීසිං හි නිෂ්පාදන ප්‍රතිපත්තිය ගනුදෙනුකරුවන්ගේ හඳුනාගත් අවශ්‍යතා මූලිකවම තෘප්තිමත් කිරීමට ක්‍රියාත්මක කර පසුව එහි ප්‍රවේශය පුළුල් කිරීමට කටයුතු කරමින් පවත්නා සේවා ප්‍රමිති වර්ධනයකර, නව නිෂ්පාදන සංවර්ධනය කරමින් ගනුදෙනුකරුවන් අතර සම්බන්ධතා ගොඩනගයි.

### සේවා ප්‍රමිති

අපගේ සේවා ලබාදීමේ ආකෘතිය සමාගමේ අරමුණු සහ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් හා සම්බන්ධ කෙරේ. අප සපයන සේවා මට්ටමට වැදගත් ලෙස බලපෑ හැකි සාධක පහත දක්වා ඇත:

**ගනුදෙනුකරුවන්ගේ සේවා මට්ටම**

**ප්‍රවේශය**
රටතුළ මූල්‍ය සේවාවන්හි පුළුල් ආවරණය ගනුදෙනුකරුවන්ට ලබාදීම

**වාතාවරණය**
මෙම ක්ෂේත්‍රය තුළ ඉහළට යාමේ තරඟය අපි ජයගනිමු

**සේවය ලබාදීමේ වේගය**
අපගේ ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතාවන්ට ඉක්මන් විසඳුම් අපි ලබාදෙමු.

**ඉදිරි පෙළ නිලධාරීන්ගේ තත්ත්වය සහ සේවා ප්‍රමිති**
අපි ගනුදෙනුකරුවන්ට සවන් දෙන අතර ඔවුන්ගේ ප්‍රතිචාර මත කටයුතු කිරීමේදී ඉක්මණින් ඒවා යොදා ගනී

### විවිධ අංශයන් කෙරෙහි දායකත්වය (දළ කළඹ රු. මිලියන)

| අංශය | රු. මිලියන |
|---|---|
| මූල්‍ය සේවා | 4,881.76 |
| කෘෂිකර්මය, වන සහ ධීවර | 30,535.23 |
| නිෂ්පාදනය | 9,267.97 |
| සංචාරක | 4,337.27 |
| ප්‍රවාහනය සහ ගබඩා | 35,230.79 |
| ඉදිකිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය | 11,861.23 |
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 18,168.98 |
| සෞඛ්‍යාරක්ෂාව, සමාජ සේවා සහ සහය සේවා | 18,588.70 |
| පරිභෝජනය | 8,982.85 |
| වෙනත් | 2,191.79 |
| කලාව, සංග්‍රහය සහ විනෝදය | 1,198.41 |
| අධ්‍යාපනය | 1,790.15 |
| තොරතුරු තාක්ෂණය සහ සන්නිවේදනය | 1,419.85 |
| වෘත්තීමය, විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතු | 8,042.77 |

## අපගේ නිෂ්පාදන කළඹ

### ණයදීම

#### කල්බදු

අපගේ ප්‍රධාන නිෂ්පාදනය වන කල්බදු රු.මිලියන 85,815.37ක දළ කළඹක් සහ ගනුදෙනුකරුවන් 156,229ක් සමඟ මනාව ක්‍රියාත්මක වේ. පසුගිය වසරේ, පොළී අනුපාතය සහ කාලසීමාව අනුව ගනුදෙනුකරුවන්ට වඩා ඉහළ නම්‍යතාව ලබාදෙමින් පුද්ගලයින් සහ ව්‍යාපාර ව්‍යවසාය සඳහා විචල්‍ය පොළි කල්බදු අපි හඳුන්වා දී ඇත.

#### ණය

ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට හැකිවන පරිදි විවිධ වර්ගයේ ණය පහසුකම් ලබාගත හැකිය. අළුතින් හඳුන්වා දෙනලද රන් ණය නිෂ්පාදනය රු. මිලියන 896 දක්වා ළඟා වූ කළඹක් සමඟ ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කරයි. රන් ණය මගින් ගනුදෙනුකරුවන්ට හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා කඩිනම් විසඳුමක් පිරිනමයි. අප රඳවා ගන්නා පුද්ගල අයිතම මුදාගැනීමේ විකල්ප සමඟ ණය ලබාදෙමින්, අපි නම්‍යතාවය සහ පහසුව ද ලබා දේ.

### තැන්පතු

අපගේ තැන්පතු නිෂ්පාදන කළඹ ගනුදෙනුකරුවන්ගේ ජීවිතයේ විවිධ අවස්ථා සඳහා විවිධ අවශ්‍යතාවන්ට ගැලපෙන සහ සියලුම වයස් කාණ්ඩවලට ලබාදෙන නිෂ්පාදන රාශියකින් සමන්විත වේ. ඒවාට බාලවයස්කරුවන් සඳහා බලාවයස්කාර ඉතුරුම් ගිණුම්, තරුණ හා මැදි වයසේ අය සඳහා සුපර් සේවිංස්, ප්‍රිමියර් රිවෝඩ් ප්ලෑන් සහ වැඩිහිටියන් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම් ඇතුළත්ය. ක්ෂේත්‍රය තුළ පවතින අයහපත් තත්ත්වය හමුවේ, තැන්පතු 20.75%ක සැලකියයුතු වර්ධනයක් අත්කරගත් අතර රු. මිලියන 106,701.03ට ළඟා විය. ගනුදෙනුකාර විශ්වාසය පිළිබිඹු කරමින්, පීපල්ස් ලීසිං රු. මිලියන 6,770.64ක ඉතුරුම් පදනමක් ඇතිව බැංකු නොවන මූල්‍ය ආයතන අංශය තුළ විශාලතම තැන්පතු පදනමට හිමිකම් කියන අතර එය ක්ෂේත්‍රයේ විශාලතම තැන්පතු පදනම් වේ.

### අනෙකුත් නිෂ්පාදන

#### ආන්තික වෙළෙඳාම සහ සාධකකරණය

ආන්තික වෙළෙඳාම සහ සාධකකරණ කටයුතු දිගු කලක සිට අපගේ නිෂ්පාදන සහ සේවා කළඹ තුළ ප්‍රධාන තැනක් ගනී. පළමුවැන්න මගින් ආයෝජනය අනුව පහසුකමක් ලබාගැනීමට, ආයෝජකයින්ට තවදුරටත් තම කළඹ ගොඩ නැගීමට සහ අමතර සුරැකුම්පත්වල වෙළෙඳාම් කිරීමට අවස්ථාව ස්කන්ධ සහ ණය වෙළෙඳපොල ආයෝජකයින්ට ලබාදේ. දෙවැන්න මගින් ලැබීම් කළමනාකරණය කර ගැනීමට කැප වූ කණ්ඩායමක් ගනුදෙනුකරුවන්ට ලබාදෙමින් ප්‍රාග්ධන විසඳුම්, අවදානම් මාරු කිරීම සහ විකුණුම් ලෙජර කළමනාකරණය පිරිනමයි. ආන්තික වෙළෙඳාම රු. මිලියන 310.70ක පොළි ආදායමක් සමඟ රු. මිලියන 2,232.78ක කළඹකින් සමන්විත වේ. සාධකකරණ කටයුතු සඳහා, රු. මිලියන 616.56ක පොළී ආදායමක් සමඟ රු. මිලියන 3,142.70 දක්වා අපගේ දළ කළඹ ළඟා විය.

Details of Our product portfolio can be found online
https://www.plc.lk/index.php/en/

## සමාජීය සහ පාරිසරිකමය වගකීම් සහගත නිෂ්පාදන

මෙහෙයුම්වල සෘණාත්මක සමාජ සහ පාරිසරික බලපෑම් ආමන්ත්‍රණය කර අවම කිරීමට විස්තරාත්මක ආරක්ෂක යාන්ත්‍රණයක් තුළින් අපගේ නිෂ්පාදන පරීක්ෂා කෙරේ. අපගේ ණය ප්‍රතිපත්තිය අපට ණය ලබාදිය හැකි ව්‍යාපාර සහ ගනුදෙනුකරුවන් පැහැදිලිව විස්තර කරයි. මෙම ප්‍රතිපත්තිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් සහ පාලන අධීක්ෂණය යටතේ අවදානම සහ පාලනය පිළිබඳ විශේෂිත කණ්ඩායමක් මගින් කලින් කල සමාලෝචනය කෙරේ. අනුමත ණය ගොනු සසම්භාවීව මාසික පදනමක් මත සියුම් පරීක්ෂාවට ලක්කර විෂමතා පවතී නම් ඒ සඳහා හේතු විශ්ලේෂණය කර නිවැරදි කිරීමේ පියවර ගනී. සෑම නව නිෂ්පාදනයක් සමඟ, අපගේ පාරිසරක පාසටහන් අඩු කිරීම සඳහා හැකි සෑම තැනකදීම කඩදාසි රහිත ක්‍රියාවලි ප්‍රවර්ධනය කරමු.

පරිසරය කෙරෙහි රථවාහන විමෝචනවල බලපෑම අවමකර හිලව් කිරීම සඳහා විශේෂික ක්‍රියාපටිපාටි ගණනාවක් අපි අරගනිමු. අපි පිළිවෙලින් හරිත වාහනවල කල්බදු සහ වඩා හරිත ව්‍යාපාර මෙහෙයුම් ප්‍රවර්ධනය කරමු.

## ගනුදෙනුකාර සහභාගිත්වය සහ තෘප්තිය

තරඟකරුවන් විසින් සමාන නිෂ්පාදන සහ සේවා පිරිනමමින් සිටින ඉහළ සංතෘප්ත වෙළෙඳපොලක් තුළ, අපගේ ගනුදෙනුකරුවන් රඳවා ගැනීම සඳහා ප්‍රත්‍යක්ෂ පියවර ගෙන ඇති අතර ගනුදෙනුකාර රඳවාගැනීම සහතික කරන සුපිරි අත්දැකීම ලබා දේ. මෙම ප්‍රවේශය තුළින්, අපගේ ගනුදෙනුකරුවන් සමඟ දිගු කාලීන අන්‍යෝන්‍ය ප්‍රතිලාභී සම්බන්ධතා අපි ගොඩ නගා ඇත.

## ගනුදෙනුකාර සතුටු කිරීමේ සමීක්ෂණය

ගනුදෙනුකරුවාගේ හදගැස්ම අවබෝධ කරගැනීම පිණිස, 2019 දී ගනුදෙනුකාර තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණයක් අපි පැවැත්වූවෙමු. සම්ක්ෂණයේ සොයාගැනීම්වලින් ATL ප්‍රචාරණ වැනි ප්‍රචාරණ මාධ්‍ය සහ සමාජ මාධ්‍ය අප සන්නාමය පිළිබඳව දැනුවත්භාවය පුළුල්කිරීමට අපේක්ෂා කළ තරම් දායක වී නොමැති බව පෙන්නුම් කරන ලදී. නව ගනුදෙනුකරුවන් අතර පවත්වන ලද සමීක්ෂණයේ ප්‍රධාන සොයා ගැනීම් මෙහි දැක්වේ:

**89%**
සේවා කාලය සමඟ තෘප්තිමත් වීම

**91%**
අලෙවිකරණ නිලධාරීන් සමඟ සම්බන්ධවීමේ පහසුකම සමඟ තෘප්තිමත්භාවය

**90%**
සමස්ත කාර්ය මණ්ඩලයේ සේවය පිළිබඳව තෘප්තිමත්භාවය

**89%**
ණය ගනුදෙනුකරුවන් පීපල්ස් ලීසිං සමඟ තම සම්බන්ධතාවය දිගටම පවත්වා ගැනීම

## සයිබර් ආරක්ෂාව සහ ගනුදෙනුකාර රහස්‍යතාව

සයිබර් ආරක්ෂාව ඉහළම ප්‍රමුඛතාවයේ ලා අපි සලකනු ලබන බැවින් සිදුවියහැකි සයිබර් තර්ජන වැළැක්වීමට සහ ගනුදෙනුකාර රහස්‍යතාව ආරක්ෂා කිරීමට අපි සෑම පියවරක්ම ගෙන ඇත. දත්ත ආරක්ෂාව සහ ගනුදෙනුකාර රහස්‍යතාව කඩවීමක ප්‍රතිවිපාක අපි අවබෝධ කර ගනිමු. එවැනි විශ්වාසය කඩකිරීමක් ගනුදෙනුකරුට අනර්ථයක් වන අතරම අපගේ හැකියාව පිළිබඳ පාර්ශ්වකාර විශ්වාසයට බලපෑම් කරනු ඇත.

අපගේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ක්‍රමය ISO 27001 න් සහතික කරන අතර ඉන් අපගේ මෙහෙයුම් පද්ධතිවල තත්ත්වය පිළිබඳ විශ්වාසය අපගේ ගනුදෙනුකරුවන් වෙත ලබා දේ. ICT ප්‍රතිපත්තිය අනුගමනය කරමින්, අපගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ශාඛා කළමනාකරුවන් දත්ත ආරක්ෂාව සඳහා වගකීම ගන්නාබව සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන් යොදා ගන්නා බව සහ උවදුරු ඇගයීම් සිදුකර ගනුදෙනුකාර රහස්‍යතාව කඩවීම් පසුවිපරම සහතික කරයි. දත්ත ආරක්ෂාව අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී විසින් පාලනය කෙරේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ICT අවශ්‍ය පරිදි පද්ධති නවීකරණ සහ තාක්ෂණ සහ තොරතුරු ආරක්ෂණ අවදානම් අවම කිරීම සඳහා නිර්දේශ සිදුකරමින් පුද්ගලික දත්ත ආරක්ෂාව සහ වගකිම්සහගත ගබඩාකිරීම සහතික කිරීමට නිරන්තර ඇගයීම් පවත්වනු ලබයි.

2019/20 දී, ගනුදෙනුකාර රහස්‍යතාව කඩවීම් හෝ ගනුදෙනුකාර දත්ත අහිමිවීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් වාර්තා වී නොමැත.

## ගනුදෙනුකරුට ප්‍රතිචාර දැක්වීම

අපගේ ගනුදෙනුකරුවන්, ඔවුන්ගේ ජීවන රටා සහ මූල්‍ය අවශ්‍යතා සහ ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල් සඳහා දීප්තිමත් අනාගතයක් සුරක්ෂිත කර ගැනීමට ඔවුන්ට අවශ්‍ය විසඳුම් පිළිබඳ අප සතු ගැඹුරු අවබෝධයේ ප්‍රතිඵලයක් ලෙස නව නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කෙරේ.

ආයතනික දැනුම මත පමණක් රඳාපැවතීම අපව අනතුරේ හෙළීමක් වන අතර – එය අප භාරගැනීමට අකැමැති අවදානමකි.

ගනුදෙනුකාර පැමිණිලි කරා කඩිනමින් සහ කාර්යක්ෂමව ලඟාවීමේ ක්‍රමය සහතික කිරීම සඳහා, ගනුදෙනුකාර සත්කාර සහ පැමිණිලි නිරාකරණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරිම අපි ආරම්භ කර ඇත. එහි අරමුණ වන්නේ සියලුම ගනුදෙනුකාර මැසිවිලිවලට පහසුවන පළමු අවස්ථාවේදීම නිසි සත්කාරය සහ අවධානය ලබාදෙන බව සහතික කිරීමයි.

## ගනුදෙනුකාර පැමිණිලි

| | |
|---|---|
| සෘජු පැමිණිලි | 20 |
| CBSL හරහා ලද පැමිණිලි | 19 |
| මූල්‍ය ඔම්බුඩ්ස්මන් හරහා ලද පැමිණිලි | 39 |

## අලෙවිකරණය සහ සන්නිවේදනය

අපගේ අලෙවිකරණ දෙපාර්තමේන්තුව නිරන්තරයෙන්ම අප ආයතනයේ සේවාවන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය සන්නාම ගොඩනැගීමේ ක්‍රියාකාරකම්වල නිරත වේ. 2019/20 දී සිදුකරන ලද වැඩසටහන් කිහිපයක් මෙහි දැක්වේ:

- ආයතනික සන්නාම දැනුවත් කිරීම සහ නිෂ්පාදන දැනුවත් කිරීමේ ව්‍යාපාරය – "හිමි තැන පළමුතැන රට හැමතැන" 2019 අගෝස්තු 24 දින පවත්වන ලදි.
- අපගේ ප්‍රධාන නිෂ්පාදන කළඹ ආදායම් උත්පාදන අරමුණු සඳහා ප්‍රධාන වශයෙන් රථවාහන නියෝජනය කරන අතර, පරිසරය කෙරෙහි අවම බලපෑමක් සහිතව, වගකීමෙන් යුතුව අප ආයතනයේ කල්බදු පහසුකම් ලබාගත් විශ්වාසවන්ත ගනුදෙනුකරුවන් මෙන්ම නව ගනුදෙනුකරුවන් හඳුනාගෙන ඔවුන් ඇගයීම සඳහා "පෙට්‍රල් පෙරලිය" වැඩසටහන දියත්කරන ලදී.
- ශ්‍රී ලාංකිකයින් අතර ඉතුරුම් පුරුද්ද ඇති කිරීම සඳහා ඉහළ ප්‍රතිඵල සහිත පී.එල්.සී. ප්‍රිමියර් රිවෝඩ් ප්ලෑන් (ආයෝජන සැලැස්මක්) දියත් කරන ලදී.
- නිෂ්පාදන සහ සේවා සහ මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ අලෙවිකරණ කාර්ය මණ්ඩලය සහ ශාඛා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට සහ නවතම කාර්යස්ථ පුහුණු සංකල්පයක් හඳුන්වා දෙන ලදී.
- ගනුදෙනුකාර පැමිණිලි සහ මැසිවිලි නිරාකරණය පිළිබඳ ස්වයංක්‍රීය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී ගනුදෙනුකාර පැමිණිලි යම් ගැටලුවලට කාලීන ප්‍රතිචාර සඳහා කළමනාකරණය වෙත සෘජුවම යොමු කරන ලදී.

## සමාගමේ සමාජ මාධ්‍ය ක්‍රමෝපාය

නිශ්චල සහ වීඩියෝ භාවිතයෙන් බොහෝ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාවට නංවමින් වැඩි ගනුදෙනුකාර සහභාගිත්වයන් කෙරෙහි අවධානය සහ ඒ තුළින් වෙළෙඳපොල අත්කරගැනීම වැඩි කිරීම සහ පහත දක්වා ඇති සමාජ මාධ්‍ය අවකාශ භාවිතා කරමින් නිෂ්පාදන හා සේවා සක්‍රියව ප්‍රවර්ධනය කිරීම. ඒවානම් මුහුණු පොත, ලින්ක්ඩින්, යූ ටියුබ් සහ වට්ස්ඇප්/වයිබර් සන්නිවේදන යෙදුම්.

# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



## නියාමන පරිසරය තුළ සන්නිවේදනය

ප්‍රචාරණය සහ අනෙකුත් මහජන නිවේදන පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නීති සහ රෙගුලාසි අපි අනුගමනය කරන අතර අපගේ සියලුම අලෙවිකරණ සන්නිවේදන රෙගුලාසි තුළ පවතින බව සහතික කරමු. වාර්තාකරණ වසර තුළ, අපගේ අලෙවිකරණ සන්නිවේදන හෝ නිෂ්පාදන සහ සේවා තොරතුරු ලේබල්කරණය සම්බන්ධයෙන් අනුකූල නොවූ කිසිදු අවස්ථාවක් වාර්තා වී නොමැත. එමෙන්ම, දැනුවත් තීරණ ගැනීම සඳහා අපගේ ගනුදෙනුකරුවන්ට භාෂා ත්‍රිත්වයෙන් (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ) නිෂ්පාදන සහ සේවා පිළිබඳ අදාළ තොරතුරු අපි අනාවරණය කරමු.

## ඩිජිටල් මාධ්‍ය තුළින් ගනුදෙනුකරුවන්ට සේවා සැලසීම

තරගකාරීත්වය තුළ ඉදිරියෙන් සිටීමට සහ ඉතා ඉහළ ගනුදෙනුකාර සේවාවක් ලබාදීමට ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නවෝත්පාදන සහ තාක්ෂණික සංවර්ධනයන් තුළින් තරගකරුවන් හා එක පෙලට සිටීමට අපි සෑම පියවරක්ම ගනිමු. වඩාත් සුදුසු මාධ්‍ය භාවිතා කරමින්, ආයෝජන මත ප්‍රතිඵල කරා නව දැක්මක් මත පදනම් වී අලෙවිකරණය සහ ප්‍රචාරණය පිළිබඳ ක්‍රමෝපායික සේවා සැපයුමකට ඉඩ ලබා දේ.

ඩිජිටල් යටිතල පහසුකම් මත අපගේ පුළුල් ආයෝජනය සහ ඩිජිටල් අවකාශ තුළින් මෙහෙයුම් අඛණ්ඩව කරගෙනයාමේ හැකියාව කොවිඩ්-19 තත්ත්වය තුළ යහපත් ප්‍රතිචාර දැක්වීමට හේතු විය. ඩිජිටල් තාක්ෂණය භාවිතය තුළින් මෙහෙයුම් කරගෙන යාමට සහ අපගේ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට අපට හැකි විය. සංචරණ සීමා කාලය තුළ අපගේ මෙහෙයුම් හැසිරීම අපගේ ඩිජිටල් සූදානමෙන් තහවුරු වූ අතර යම් අර්බුද අවස්ථාවකට අනුවර්තනය වීම සඳහා අප සතු හැකියාව එහිදී අනාවරණය විය.

නව තාක්ෂණය සඳහා ආයෝජනය කිරීමට අමතරව, අපගේ වෙළෙඳපොළ අවකාශය තුළ ඩිජිටල් සහ දත්ත විශේෂඥයින්ගේ ඉහළ යාමත් සමඟ තරඟ කිරීමට නව්‍යකරණයෙහි හිද අපි ආයෝජනය කරමින් සිටිමු. අපගේ අභ්‍යන්තර ප්‍රවීණයින් නැග එන ඉල්ලුම සහ ගනුදෙනුකාර අපේක්ෂාවන් සපුරාලීමට සේවා නව්‍යකරණ සහ පුළුල් කිරීම් සංවර්ධනයන් සඳහා සැමවිටම වගකීම දරයි. එමෙන්ම ඔවුන් අපගේ ව්‍යාපාර ආකෘතිය ශක්තිමත් කර ප්‍රශස්ථ කිරීම සඳහා මාර්ග සොයනු ලබයි.

## දූෂණ පිටුදැකීම

විනිවිදභාවයකින් සහ සදාචාරාත්මක ලෙස ව්‍යාපාර කරගෙනයාම අපගේ හර පද්ධතීන් හා විශ්වාසනීයත්වය තුළ ගැබ්ව ඇත. ක්‍රියාත්මක ආචාර ධර්ම සංග්‍රහයක් අපි සතුවන අතර, ගනුදෙනුකරුවන් සමඟ මෙන්ම අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීම ඇතුළුව සියලුම ව්‍යාපාර කටයුතුවල සහ ගනුදෙනුවල දී මෙම ආචාරධර්ම අපි අනුගමනය කරමු. ආචාර ධර්ම සංග්‍රහය සදාචාර විරෝධී ව්‍යාපාර පරිචයන්ගෙන් අපගේ ගනුදෙනුකරුවන් සුරක්ෂිත කිරීමට ස්ථාපනය කළ යාන්ත්‍රණයකි. මෙම මඟපෙන්වීම් තවදුරටත් ශක්තිමත් කිරීමට, සිදුවන අවිධිමත් කටයුතු වැළැක්වීමට යහපත් අභ්‍යන්තර පාලන ක්‍රම අපි ස්ථාපිත කර ඇත්තෙමු. ශ්‍රේණිය මත පදනම් වූ අනුමත කිරීමේ ක්‍රියාවලියක් සහ වගකීම්සහගත ක්‍රමවේදයක් පවතී. අපගේ තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය "විසිල්බ්ලෝවිං" තවත් එක් අභ්‍යන්තර පාලනයක් වන අතර ඒ තුළින් යම් පිළිගැනීමක් නොමැතිව දූෂණය හෝ වංචාව සම්බන්ධ තොරතුරු අනාවරණය සඳහා පහසුකම් ඇති කරයි. මෙසේ, සදාචාර හැසිරීම සමාග මේ සංස්කෘතිය තුළ පුහුණු කරනු ලබයි. මෙම සංස්කෘතිය සමාගමේ ඉහළින් ව්‍යුත්පන්න වන අතර එයට සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී සහ ආයතනික කළමනාකරණය ඇතුළත් වේ.

ඊට අමතරව, ක්‍රියාත්මක යාන්ත්‍රණ පවත්නා අතර සමාගමේ මෙහෙයුම් ඒකක දූෂණ පිටුදැකීම අනුව ඒවා විමර්ෂණය කිරීමට රේඛීය වාර්තා හරහා විගණනය කරන අතර නුසුදුසු හෝ දූෂණ ව්‍යාහාර පිළිබඳ පැමිණිලි හෝ චෝදනා ඇත්නම් නිවැරදි කිරීමේ පියවර ගනු ලැබේ.

අපගේ අනුල්ලංඝනීය බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනාගත දූෂණ අවස්ථා වැළැක්වීමට ක්‍රියාත්මක කෙරෙන අතර එහිදී (සේවකයෙක්) බඳවා ගැනීමට පෙර අපි පසුබිම් පරීක්ෂාවන් සිදු කරමු. නියෝජිතයින්, අතරමැදියන්, සැපයුම්කරුවන්, සහයකයින්, සහ උපදේශකයින් ඇතුළත් අපගේ හවුල්කරුවන් එයට සමාන නිවාරණ ක්‍රියාවලියකට යටත් වේ. අපගේ සමාගමේ වටිනාකම් සමඟ පෙළ ගැසෙන හවුල්කරුවන් සමඟ අපි කටයුතු කරන බව මින් සහතික කරයි. සෑම දෙයටම ඉහළින් අපි විනිවිදභාවය අගය කරන අතර අපගේ ගනුදෙනුකරුවන් වෙත අපගේ සියලුම ව්‍යාපාර ව්‍යවහාර සහ සේවා ලබාදීම තුළ විනිවිදභාවය අපි සහතික කරමු.

විෂමාචාර වැළැක්වීම සඳහා තෙවැනි පාර්ශ්ව සමඟ කටයුතු කිරීමේදී පහත සඳහන් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නියම කෙරේ:

- පීපල්ස් ලීසිං තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය "විසිල්බ්ලෝවිං"
- දේපළ අත්කරගැනීමේ සහ බැහැර කිරීමේ ප්‍රතිපත්තිය
- ව්‍යාපාර මෙහෙයුම් සේවා බාහිරින් ලබාගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු මඟපෙන්වීම
- මුදල් විශුද්ධිකරණය පිළිබඳ විරෝධය (AML) සහ (ඔබගේ) ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC) ප්‍රතිපත්තිය
- තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්තිය, ජංගම දේපළ ඇගැයීම සහ පරීක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය
- මුදල් අයකිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රතිපත්තිය
- ගනුදෙනුකාර පැමිණිලි සහ මැසිවිලි නිරාකරණ ප්‍රතිපත්තිය
- ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය
- ටෙන්ඩර් ක්‍රියාපටිපාටි අත්පොත

වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලත් විගණක කණ්ඩායමක අධීක්ෂණය යටතේ, අපගේ මෙහෙයුම් ඒකක දූෂණ විරෝධයට අනුව (මාර්ගගත) වාර්තා හරහා විගණනය කෙරේ. තවද, යම් වංචාකාරී ක්‍රියාවලට එරෙහිව පළපුරුදු මනාව පුහුණුව ලත් පළපුරුදු ක්ෂේත්‍ර විගණන කාර්ය මණ්ඩලයක් විසින් ශාඛා භෞතිකව විගණනයට ලක්කෙරේ. ශාඛා සහ අදාළ කලාප ප්‍රධානීන් විසින් ලබාදෙන ලද ප්‍රතිපෝෂණ වාර්තාවලට අනුව ශාඛා ප්‍රමුඛතාවයට ලක් කරන අතර අභ්‍යන්තර අවදානම් තක්සේරු කිරීම, අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් ස්වාධීනව සිදුකරනු ලැබේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තුන් සහ ශාඛා ජාලය දූෂණ විරෝධයට අනුව වසර දෙකක හෝ ඊට අඩු වාර ගණනකදී ආවරණය කරන බවට සහතික වේ.

## අනාගත දැක්ම

පුද්ගලයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, විශාල ආයතන යනාදී වශයෙන් පසුගිය වසර 25 තුළ ශ්‍රී ලාංකීය සමාජයේ සියලුම අංශයන් ආවරණය කරමින් සහ ඉහළ මට්ටමේ සේවාවන් පිරිනමමින් ගනුදෙනුකරුවන් වෙත අපි සේවය කරමු. වෙළෙඳපොල තරගකාරීත්වය තුළ, ගනුදෙනුකාර පක්ෂපාතීත්වය සහ රඳවාගැනීමේ සෑම වසරකම අප මුහුණ දෙන විශාලතම අභියෝග වේ. මෙසේ, දැනට පවත්නා ගනුදෙනුකාර පදනම ශක්තිමත් කිරීම මෙන්ම තරගකාරීත්වය තුළ පීපල්ස් ලීසිං සුවිශේෂී වෙනස් ලෙස දක්වන ඉහළ පෙළ සේවාවක් පිරිනැමීම මගින් නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අපගේ නිරන්තර අවධානය යොමු කෙරේ.

පීපල්ස් ලීසිං මෙම ආයතනය පවතින අර්බුදකාරී වාතාවරණයෙන් ගොඩඒම සඳහා ගනුදෙනුකරුවන්ට සහය වේ. රජය විසින් හඳුන්වා දෙන ලද ණය සහන කාලය සුදුසු සියලුම ගනුදෙනුකරුවන් වෙත ලබා දෙනු ලැබේ.

පාස්කු ඉරිදා ප්‍රහාරවලින් මෙන්ම කොවිඩ්-19 වසංගත කාලසීමාවන්ට මුහුණ දීමේදී තාක්ෂණය මත සිදුකරන ආයෝජනය තීරණාත්මක බව සනාථ විය. නවීන තාක්ෂණය යොදා ගැනීමට ආයෝජන සිදුකරන බවට අපි සහතික වෙමු. අපගේ සමීක්ෂණ සහ සංවර්ධන ඒකකය ඉදිරි වර්ෂයන් හීද නව නිෂ්පාදන හඳුන්වාදීම ගවේෂණය කරනු ඇත.

# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



## ප්‍රජාව >>

ශ්‍රී ලංකාවේ වගකීම්සහගත සහ සියලුම මූල්‍ය සේවා එක වහලක් යට සපයන්නෙක් ලෙස, සමාජය තුළ අත්‍යවශ්‍ය සේවාවක් ලෙස අප ඉටුකරන කාර්යභාරය අපි නිසි පරිදි අවබෝධකර ඇත්තෙමු. එක වහලක් යට සියලුම මූල්‍ය විසඳුම් සැපයීම තුළින් අපි සමාජය බල ගන්වන අතර ජනතාවට ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවා ගැනීමට සහය වෙමු. දිවයින පුරා අපගේ ශාඛා ජාලය හරහා මූල්‍ය මෙන්ම මූල්‍ය සාක්ෂරතාව සඳහා අවස්ථාව අපට ලබා දෙන අතර කාන්තාවන් සහ තරුණ ප්‍රජාව ඇතුළු ව්‍යවසායකයින්ට සහය වෙමු.

අපගේ අනුබද්ධිත ආයතනයක් වන පීපල්ස් මයික්‍රෝකොමස් සමාගම ක්ෂුද්‍ර ව්‍යාපාර අවස්ථාවන්ට මූල්‍ය විසඳුම් පිරිනැමීමට අපට සහය වන යාන්ත්‍රණය වේ. ප්‍රධාන කාර්යාලයේ සියලුම ක්‍රමෝපායික ව්‍යාපාර ඒකක සහ ශාඛා ජාලය විසින් අපගේ ව්‍යාපාර මෙහෙයුම් වගකීම්සහගත ආකාරයකින් සිදුකිරීමට බැඳී සිටියි.

එමෙන්ම, ශාඛා මට්ටමේ කාර්ය මණ්ඩලයේ සේවකයන්ගේ ස්වේච්ඡා සහභාගිත්වයෙන් සහ හඳුනාගත් හවුල්කරුවන් සමඟ එක්ව එක්සත් ජාතින්ගේ (UN) තිරසර සංවර්ධන අරමුණු (SDGs) අභිවර්ධනය සමඟ සමගාමීව ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහන් සඳහා අපි වාර්ෂිකව ආයෝජනය කරමු.

### ප්‍රජා ප්‍රතිපත්තිය

පීපල්ස් ලීසිං සමාගම ප්‍රජාව කෙරෙහි එහි ව්‍යාපාර මෙහෙයුම්වලින් ඇති යම් ඍණාත්මක බලපෑම අවම කිරීම සඳහා සැලකිලිමත් වේ. අපගේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්ට ප්‍රතිචාරාත්මක ලෙස, පීපල්ස් ලීසිං දේශීය ප්‍රජාවගේ තිරසාර සංවර්ධනයට දායකවීමට කැපවී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ, පිපල්ස් ලීසිං ආයතනික සමාජීය වගකීම් අංශය හරහා සමාගමේ ශුද්ධ ලාභයෙන් 2.5ක් ඒ සඳහා වෙන් කරන අතර ක්‍රමෝපායිකව ප්‍රමුඛ අවධානිත ක්ෂේත්‍ර තුළ අදාළ ලාභ කොටස් සහ පුණ්‍යාධාර අරමුදල හරහා ආයෝජනය කරයි. 2013/14 මූල්‍ය වර්ෂය තුළ නිශ්චය කළ ක්‍රමෝපායික ප්‍රමුඛ අවධානිත ක්ෂේත්‍ර පහ අතරින් අධ්‍යාපනය නගාසිටුවීම, දේශීය ප්‍රජාව සවිබලගැන්වීම සහ පරිසර සංරක්ෂණය යන ක්ෂේත්‍ර ඔස්සේ වැඩි අවධානයකින් හා තීව්‍රතාවයකින් සිදුකිරීම සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර තුනක් සම්පීඩනය කරන ලදී. මෙසේ පීපල්ස් ලීසිං සමාගම දේශීය ප්‍රජාවට ඔවුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කර ගැනීමට, ඔවුන්ගේ ඉතුරුම් වර්ධනයට සහ පොදු යටිතල පහසුකම් සහ සේවාවන් ගොඩනැගීමට සහයවීමෙන් ඔවුන් සඳහා වටිනාකම් නිර්මාණය කරයි. සිදුකරන ලද ප්‍රගතිය, කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය, සමාගමේ මූල්‍ය යෙදවුම් සහ ස්වේච්ඡා සේවය වාර්තා කරන ලදී. 2019/20 සඳහා ප්‍රජා සහ පාරිසරික ආයෝජනය රු. මිලියන 58.85ක් විය.

### දේශීය ප්‍රජාව වෙනුවෙන් අපගේ ආයෝජනය:

| | 2019/20 | 2018/19 |
|---|---|---|
| **සමස්තය** | | |
| ප්‍රාදේශීය ප්‍රජාව වෙනුවෙන් ආයෝජන (රු. මිලියන) | **55.53** | 120.29 |
| ප්‍රාදේශීය ප්‍රජාව පදනම් වැඩසටහන් (ගණන) | **79** | 155 |
| ප්‍රතිලාභින් (ආසන්න වශයෙන් ගණන) | **33,868** | 62,370 |
| **අධ්‍යාපනය නගාසිටුවීම (මුල්ළමාවිය සංවර්ධනය, පාසල් අධ්‍යාපනය, ව්‍යවසායකත්ව සංවර්ධනය)** | | |
| මුල්ළමාවිය සංවර්ධන වැඩසටහන් (ගණන) | **38** | 118 |
| මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය (රු. මිලියන) | **1.24** | 8.73 |
| පාසල් අධ්‍යාපනය නගාසිටුවීමේ වැඩසටහන් (ගණන) | **6** | 8 |
| පාසල් අධ්‍යාපනය නගාසිටුවීම සඳහා ආයෝජනය (රු. මිලියන) | **3.53** | 8.71 |
| අධ්‍යාපනික ශිෂ්‍යත්ව සඳහා ආයෝජනය (රු. මිලියන) | **7.07** | 17.99 |
| අධ්‍යාපනික ශිෂ්‍යත්ව තුළින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් (ගණන) | **353** | 1,077 |
| ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් (ගණන) | **2** | 22 |
| පුහුණුකළ/දැනුවත්කළ ව්‍යවසායකයින් (ගණන) | **101** | 1,710 |
| ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා මුළු ආයෝජනය (රු. මිලියන) | **3.05** | 8.15 |
| අධ්‍යාපනය නගාසිටුවීම සඳහා මුළු ආයෝජනය (රු. මිලියන) | **14.33** | 11.94 |
| **ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබලගැන්වීම** | | |
| ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබලගැන්වීමේ වැඩසටහන් (ගණන) | **38** | 43 |
| පොදු යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය (රු. මිලියන) | **1.65** | – |
| මහජන සෞඛ්‍යාරක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය (රු. මිලියන) | **22.90** | 27.14 |
| ආගමික සහ සංස්කෘතික උත්සව වලදී ධනාත්මක ප්‍රජා සහභාගිත්වය සඳහා ආයෝජනය (රු. මිලියන) | **13.61** | 13.49 |
| දේශීය ප්‍රජාව සවිබලගැන්වීම සඳහා මුළු ආයෝජනය (රු. මිලියන) | **38.16** | 54.45 |

## එක්සත් ජාතීන්ගේ තිරසර ඉලක්ක අභිවර්ධනය සඳහා පීපල්ස් ලීසිං හි දායකත්වය

| ප්‍රධාන අවධානිත ක්ෂේත්‍ර | | |
|---|---|---|
| **අධ්‍යාපනය නගාසිටුවීම**<br>– මුල්ළමාවිය සංවර්ධනය<br>– පාසල් අධ්‍යාපනය නගාසිටුවීම<br>– ව්‍යවසායකත්ව සංවර්ධනය | අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනය තිරසර සහ පරිපූර්ණ සමාජයක් කරා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ ප්‍රධාන ධාවකයා වේ.<br>• මුල් අවධියේ සිදුකරන ආයෝජන රටක ඉදිරි උන්නතිය සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙයි.<br>• පාසල් මගින් විධිමත් අධ්‍යාපනයේ ප්‍රධාන කොටස සපයන අතර එය සමාජයක ජීවත්වීම සඳහා පුද්ගලයින් හට අවශ්‍ය මූලික පසුබිම සකසයි.<br>• වෘත්තීය අධ්‍යාපනය, මූල්‍ය සාක්ෂරතාව සහ ව්‍යවසායකත්ව සංවර්ධනය ජාතියක රැකියා නිර්මාණයේ ප්‍රගතියට සහ දිළිඳුකම තුරන් කිරීමට දායක වේ. |  |
| **ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබලගැන්වීම** | රජයේ අයවැය වෙන්කිරීම් සීමාසහිත වූ සන්දර්භයක් තුළ, සෞඛ්‍යාරක්ෂාව සංවර්ධනය ඇතුළුව අත්‍යවශ්‍ය පොදු යටිතලපහසුකම්/සේවා සංවර්ධනය වැනි අංශ සඳහා ආයතනික මැදිහත්වීම් ප්‍රජාවන් සවිබලගැන්වීම සහ ප්‍රාදේශීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ආධාර ලබා දෙයි. |  |

### ආයතනික සමාජ සත්කාරයන්හි කාර්ය මණ්ඩල සහභාගිත්වය

අනුස්ථාපන සැසි සහ ආයතනික පුහුණු කිරීම් තුළින් අප සමාගමේ අරමුණු සහ මූල්‍ය සේවා සපයන ආයතනයක් ලෙස සැබෑ ආයතනික සමාජීය වගකීම පිළිබඳ අපගේ කාර්ය මණ්ඩලය දැනුවත් කෙරේ. කාර්ය මණ්ඩල ස්වේච්ඡා ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන් පිළිබඳ යාවත් කිරීම් සෙසු නිලධාරීන්ට ද අනුගත වීම සඳහා දිරිදෙමින් අභ්‍යන්තර ජාලය හරහා මෙන්ම සමාජ මාධ්‍ය තුළින්ද ප්‍රසිද්ධ කෙරේ.

වගකීම්සහගත සහ සදාචාර මූල්‍ය සේවා සපයන්නෙකු ලෙස ණයදීමේ තිරණ ගැනීමේදී සමාජීය අවදානම හඳුනාගැනීම ඇතුළුව වගකීම්සහගත ණය දීමේ මූලධර්ම පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කෙරේ.

එමෙන්ම, පළමු වරට, පීපල්ස් ලීසිං සමාගම විසින් කාර්ය මණ්ඩලයේ දායකත්වය ඇගයීමට ලක්කරන වාර්ෂික "ප්‍රිමියර් සම්මාන 2019" දී බාණ්ඩ 2ක් යටතේ වගකීම්සහගත ව්‍යාපාර කාර්යසාධනය අගයනු ලැබීය. එහිදී "විශිෂ්ටතම සමාජීය බලපෑම් සහිත CSR වැඩසටහන" පිළිගැනීම වෙනුවට, ශාඛාවල සමබර කාර්යසාධනය ඇගයීම සඳහා හඳුන්වාදෙන ලද විස්තරාත්මක අයදුම්පත මත පදනම් වී "වඩාත් වගකීම්සහගත ශාඛාව" ලෙස ඇගයීමට ලක් කිරීමෙනි.




මහරගම සහ මිනුවන්ගොඩ ශාඛා වාර්ෂික ඇගයීමේ උළෙලේදී වර්ගීකරණ බාණ්ඩ දෙකක් යටතේ "වඩාත් වගකීම්සහගත ශාඛා" ලෙස ඇගයීමට ලක්කරන ලදී.

### කොවිඩ්-19 කාලය තුළ සමාජීය වගකීම

කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ, පීපල්ස් ලීසිං සමාගම විසින් අපගේ පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීමට පියවර ගෙන ඇත.

රජයේ සෞඛ්‍ය රෙගුලාසිවලට අනුකූලව ආරක්ෂිත සේවා පරිසරයක් තුළ අත්‍යවශ්‍ය සේවාවක් ලෙස අපගේ සේවා අඛණ්ඩව ලබා දෙමින් අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට අපි සේවා ලබා දුන්නෙමු.

කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් සඳහා වෛරසයෙන් තමන් සහ අන් අය ආරක්ෂා කිරීම සඳහා දෑත් සේදීම, ශ්වසන ස්වස්ථතාව සහ පුද්ගල දුරස්ථභාවය පිළිබඳව නිසි පරිදි දැනුවත් කිරීම් සිදුකරන ලදී.

අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සමඟ නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම ලබාදීම සහ අවම කාර්ය මණ්ඩලයක් සමඟ සීමිත මෙහෙයුම් හරහා අඛණ්ඩ සේවා ලබා දෙන ලදී.

වසංගතය නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වැඩි වශයෙන් බලපෑම් කර ඇති බැවින් අපගේ ගනුදෙනුකරුවන් පිළිබඳ විධිමත්ව පසුවිපරම් කර, ඔවුන්ගේ මූල්‍ය අසීරුතාවලට සවන් දෙමින් ඔවුන්ගේ ජීවනෝපායන් යථා තත්ත්වයට පත්කර ගැනීමට ඔවුන්ට සහය වෙමින් අපගේ කාර්යභාරය අපි ඉටු කළෙමු.

ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසිවලට අනුකූලව සැබැවින්ම පීඩාවට පත්වූවන්ට සහය වෙමින් ණය සහන ලබා දීමේ ක්‍රියාමාර්ගය අනුගමනය කරමින් පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට සහය දීම සඳහා අවශ්‍ය පියවර අපි ගෙන ඇත්තෙමු. පද්ධති සහ ක්‍රියාවලි ඩිජිටල්කරණය කිරීම තුළින් වසංගතයට මුහුණ දීමට අපට හැකි විය.

**කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන් වෛරසයෙන් තමන් සහ අන් අය ආරක්ෂා කිරීම සඳහා දෑත් සේදීම, ශ්වසන ස්වස්ථතාව සහ සමාජ දුරස්ථභාවය පිළිබඳව නිසි පරිදි දැනුවත් කිරීම් සිදුකරන ලදී.**

මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
**කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ >>**
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු


## ව්‍යවසායකත්ව සංවර්ධනය





ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ එක්ව පවත්වන ලද නව ව්‍යවසාය ආරම්භ කිරීමේ වැඩසටහන යටතේ තෝරාගත් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා හඳුන්වා දුන් මූල්‍ය දීමනාව සඳහා අයදුම්කරන තරුණ කණ්ඩායමක්

දෙමුහුන් තාක්ෂණයෙන් ක්‍රියාත්මක වන වාහන පිළිබඳව තම වෘත්තිය අධ්‍යාපනය කරගෙන යන තරුණ කණ්ඩායමක්:- පීපල්ස් ලීසිං එවැනි තරුණයින් 21 දෙනෙකු සඳහා වෘත්තිය අධ්‍යාපනය කරගෙන යාම සඳහා ශිෂ්‍යත්ව ලබාදෙන ලදී.

**"ව්‍යවසාය සඳහා තරුණ ප්‍රජාව සවිබලගැන්වීමේදී අපගේ තාක්ෂණික සහය තුළින් පීපල්ස් ලීසිං සමඟ එක්ව කටයුතු කිරීමට ලැබීම පිළිබඳ අපි සතුටු වෙමු."**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් රටක සමාජ, ආර්ථික සංවර්ධනය වේගවත් කරන යාන්ත්‍රණය වේ. ස්ථාවර සහ ශක්තිමත් ව්‍යවසාය අංශයක් පෝෂණය කිරීම පිණිස ඔවුන්ට නිසි මඟ පෙන්විය යුතුය. අවස්ථා සෙවීමට, සමුච්චිත අවදානම් ගැනීමට සහ වටිනාකම එකතුකළ හැකි නිෂ්පාදන කිරීමට සහ සේවා නවෝත්පාදනය කිරීමට ඔවුන් දිරි ගැන්විය යුතුය.

ව්‍යවසාය සඳහා තරුණ ප්‍රජාව සවිබලගැන්වීමේදී ඔවුන්ගේ ධාරිතා සංවර්ධන හවුල්කරුවෙක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන අංශයේ, වාණිජ පීඨයේ ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුවේ, ව්‍යවසායකත්වය සහ නවෝත්පාදන මධ්‍යස්ථානය හරහා පීපල්ස් ලීසිං සමාගම සමඟ සම්බන්ධ වීමට ලැබීම අපට සතුටකි. කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා තරුණයින්ගේ හැකියා සංවර්ධනය කිරීම සහ අවශ්‍ය ප්‍රතිපාදන ඔවුන්ට ලබාදීම සඳහා පීපල්ස් ලීසිං සමාගම රු. මිලියන 1.7ක් ආයෝජනය කරන ලදී. නැගී එන ව්‍යවසායකයින්ට මූල්‍ය කළමනාකරණය, අලෙවිකරණ ක්‍රමෝපායන්, ව්‍යාපාර කළමනාකරණය, ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම වැනි ක්ෂේත්‍ර ආවරණය කරමින් නිපුණතා සංවර්ධන පුහුණුව ලබාදෙන ලදී. අපගේ ව්‍යවසායකත්වය සහ නවෝත්පාදන මධ්‍යස්ථානය තුළ නොමිලේ කාර්යාල ඉඩකඩ ලබා දෙමින් අවශ්‍ය යටිතල පහසුකම් සමඟ තරුණ පිරිසකට සහය වීමට ද අප විශ්ව විද්‍යාලයට හැකි විය. අපගේ සහයෝගය සාර්ථකත්වයට පත් කරමින්, අනාගත ව්‍යවසායකයින් 80 දෙනෙකුගේ ව්‍යවසාය කුසලතා දියුණු කිරීමට අවස්ථාව ලබා දුන් අතර, ඉන් 21 දෙනෙක් වෙත තම ව්‍යවසායන් සඳහා ආරම්භක හෝ තම ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී.

මෙම සාමූහික ප්‍රයත්නයේදී පීපල්ස් ලීසිං විශ්වාසවන්ත හවුල්කරුවකු වූ අතර, එවැනි සහයෝගිත්වයක් සඳහා ආරාධනා කිරීම වෙනුවෙන් පීපල්ස් ලීසිං සමාගම වෙත අපගේ අවංක කෘතඥතාව අපි පළකර සිටිමු.



**ආචාර්ය රුක්මල් වීරසිංහ**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුව, කළමනාකරණ පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සභාපති, ව්‍යවසායකත්වය සහ නවෝත්පාදන මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

## පාසල් අධ්‍යාපනය නගාසිටුවීම

අප එකම දරුවා පූර්ණ ශ්‍රවණාබාධිතයි. සුළු ව්‍යාපාරයක නියැලෙන මා වසර 15ක පටන් දියවැඩියා රෝගී තත්ත්වයෙන් පෙළෙන අතර දරුවාගේ මව ද වසර 2ක සිට පිළිකාවකට ගොදුරුව පීඩා විඳියි. අප තිදෙනාගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා විශාල මුදලක් දැරීමට සිදුව තිබේ. දුෂ්කරතා හමුවේ වුවද දරුවා ඉතා කැපවීමෙන් අධ්‍යාපන කටයුතු සිදුකරන අතර 2019 වර්ෂයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් "ඒ" සාමාර්ථ 8 ක් සහ "බී" සාමාර්ථයක් ලබා ගැනීමට සමත් විය. පුතු ලද එකම අධ්‍යාපන පිළිසරණ මෙම දිගු කාලීන ශිෂ්‍යත්වයයි. මෙතෙක් ඔබ ආයතනයෙන් දැක් වූ එම උපකාරයට හදවතින්ම ස්තුතිය පිරිනමමු.

ශිෂ්‍යත්වලාභී දරුවෙකුගේ පියා විසින් පීපල්ස් ලීසිං සමාගම සිදුකළ පසු විපරමකට පිළිතුරු වශයෙන් එවන ලද ලිපියෙන් උපුටා ගත්තකි.

எங்கள் குழந்தைக்கு காது கேளாமை. நான் ஒரு சிறு வியாபாரத்தில் ஈடுபட்டுள்ளேன். கடந்த 15 ஆண்டுகளாக நீரிழிவு நோயால் பாதிக்கப்பட்டுள்ளேன். குழந்தைகளின் தாய்க்கும் 2 ஆண்டுகளுக்கு முன்பு புற்றுநோய் இருப்பது கண்டறியப்பட்டுள்ளது. எங்கள் மூன்று பேருக்குமான மருத்துவ செலவு தாங்க முடியாதது. கஷ்டங்கள் இருந்தபோதிலும் எங்கள் குழந்தை கல்வியில் நன்றாக முன்னேறுகிறது அவர் க.பொ.த. (சா/த) – 2019 ல் 8 "A" மற்றும் "B" சித்தியைப் பெற்றுள்ளார். இந்த நீண்ட கால உதவித்தொகை அவரது கல்விக்கு பெரும் உறுதியாக உள்ளது. எங்கள் மகனின் கல்விக்கு உதவியதற்காக பீப்பள்ஸ் லீசிங் கம்பனிக்கு மனமார்த நன்றிகள்.

பீப்பள்ஸ் லீசிங்கின் அவ்வப்போது மதிப்பாய்வு செய்வதற்கு உதவித்தொகை பெறுனரின் தந்தை அனுப்பிய கடிதத்தில் இருந்து எடுக்கப்பட்டது.

## පාසල් අධ්‍යාපනය නගාසිටුවීම (ඉතිරි කොටස)

**"මගේ පුතා වෙත පිරිනැමූ ශිෂ්‍යත්වය සහ මගේ කුඩා ව්‍යාපාරය සංවර්ධනය කර ගැනීමට ලබාදුන් මූල්‍ය සහය පිළිබඳව මම බෙහෙවින් කෘතඥ වෙමි."**

මගේ පුතා, පීපල්ස් ලීසිං සමාගම විසින් 20 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් 2017 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද "පීඑල්සී සෙනෙහෙස" අධ්‍යාපනික ශිෂ්‍යත්ව වැඩසටහනේ ප්‍රතිලාභියෙකි. විජය ළමා පුවත්පතේ අපි දුටු දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් අප ඉදිරිපත්කළ අයදුම්පත මත පදනම් වී මාගේ පුතා ශිෂ්‍යත්වය සඳහා තෝරා ගන්නා ලදී. අප විසින් සපයන ලද තොරතුරු ස්වාධීන මණ්ඩලයක් විසින් පරීක්ෂාවට ලක් කළ අතර මාතර, පිටබැද්ද ප්‍රදේශයේ අප පදිංචි වන බැවින් පීපල්ස් ලීසිං මාතර ශාඛාවේ නියෝජිතයින් අප නිවසට පැමිණ අප ලබාදුන් තොරතුරුවල සත්‍යතාව පරීක්ෂා කළහ. මගේ ස්වාමිපුරුෂයා හෘදයාබාධයක් නිසා වසර 10කට පෙර මියගිය අතර, ගෘහණියක් වූ මා හට බොහෝ දුෂ්කරතා මැද මගේ දරුවන් දෙදෙනා ඉහළට ගැනීම සැබැවින්ම මට අභියෝගයක් විය. එහෙත්, කෙසේ හෝ මගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙමින් ඔවුන්ට නැඟීසිටීම සඳහා සහය වීමට මම සිතා ගත්තෙමි. මා අසල්වැසි කඩ කිහිපයකට ඉදිආප්ප සැපයීම ආරම්භ කළෙමි. පීපල්ස් ලීසිං සමාගම විසින් මගේ පුතාගේ පාසල් අධ්‍යාපනය අවසන් වන තුරු මාසයකට රු. 3,500ක් බැගින් ශිෂ්‍යත්වයක් ඔහු වෙත ලබා දීමට කටයුතු කළා. මාතර ශාඛාවේ නිලධාරීන් විසින් ප්‍රගතිය විමසීමේ කාඩ්පතක් තුළින් වරින්වර අධ්‍යාපනික ප්‍රගතිය විමසා බලයි. මාගේ පුතා 2018 දී "ඒ" සාමාර්ථ 9 ක් සමඟ අ.පො.ස. (සා.පෙ) විභාගය සමත් විය. ඔහු ගණිත විෂය ධාරාවෙන් උසස් පෙළ හදාරයි. මා ස්නායු ආබාධයකින් පෙළෙන බැවින්, බොහෝ දුෂ්කරතා මැද මාගේ ව්‍යාපාරය කරගෙන යන අතර, පීපල්ස් ලීසිං සමාගම විසින් ව්‍යවසායකත්වය පිළිබඳ නොමිලේ පාඨමාලාවක් මා හට පිරිනැමීමට කටයුතු කරමින් මාගේ ජීවනෝපායට ද සහය විය. එමෙන්ම ඔවුන් මාගේ ව්‍යාපාරය වඩාත් හොඳින් පහසුවෙන් කරගෙන යාම සඳහා කාර්මික ඉදි ආප්ප සාදනයක් මිලදී ගැනීමට මට සහය විය. මාගේ සෞඛ්‍යය ගැටලුව හමුවේ වුවද, මෙම සහය සමඟ මාගේ ව්‍යාපාරය වර්ධනය කර ගැනිමට මට හැකි විය. මගේ පුතා වෙත ශිෂ්‍යත්වය පිරිනැමීම සහ මගේ කුඩා ව්‍යාපාරය සංවර්ධනය කර ගැනිමට ලබා දෙන ලද සහය පිළිබඳව මම බෙහෙවින් කෘතඥ වෙමි.

**ශිෂ්‍යත්ව ප්‍රතිලාභියෙකුගේ මව**
(අනන්‍යතාව ආරක්ෂා කිරීමට නම ප්‍රකාශයට පත් නොවේ.)

## මුල් ළමාවිය සංවර්ධනය



2019 ජූනි මාසයේදී කඩවත "ඉන්ද්‍රා හොටෙල්" හිදී පවත්වන ලද පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහනට සහභාගිවූවන් ලියාපදිංචි කිරීමේ නියැලෙන අපගේ කැලණිය ශාඛාවේ කාර්ය මණ්ඩලය



2019 අප්‍රේල් මස 5 දින කොළඹ, අශෝකාරාමයේදී පවත්වන ලද "යහපත් දෙමව්පියකරණය" පිළිබඳ දැනුවත් කිරීමේ සැසියකට සහභාගි වූ පෙර පාසල් වියේ පසුවන දරුවන්ගේ දෙමව්පියන් කණ්ඩායමක්



පීපල්ස් ලීසිං දිගන ශාඛාව විසින් කුණ්ඩසාලේ "පිපෙන කැකුළු" මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ළමා මිතුරු ඉගෙනුම් පරිසරය ඉහළ නැංවීම සඳහා පිරිනැමූ බාහිර සෙල්ලම් උපකරණ භාවිතා කරන දරුවන් පිරිසක්

**"ක්ෂේත්‍ර අධීක්ෂණයේදී, පුහුණුව තුළින් ලබාගත් නව දැනුම ගුරුවරුන් භාවිතයේ යොදා ගන්නා ආකාරය අපි දුටුවෙමු"**

ක්‍රියාකාරකම් පදනම් ඉගෙනුම් සැලසුම්කරණය තුළින් දරුවකුගේ සාකල්‍ය සංවර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ කාර්යභාරය පිළිබඳ ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට දුන් දායකත්වය වෙනුවෙන් අපි පීපල්ස් ලීසිං සමාගමට ස්තුතිය පුද කර සිටිමු. එම ධාරිතා සංවර්ධන වැඩමුළුව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ විශේෂඥ දැනුමෙන් හා පළපුරුද්දෙන් යුතු ජාතික මට්ටමේ සම්පත් දායකයින්ගෙන් ලැබීම දුෂ්කර ප්‍රදේශවල පෙර පාසල් ගුරුවරුන් සඳහා දුර්ලභ මහඟු අවස්ථාවකි. ඒ පිළිබඳව ගුරුවරුන්ගෙන් ප්‍රසාදය සහ යහපත් ප්‍රතිපෝෂණයත් අප වෙත ලැබුණි. ක්ෂේත්‍ර අධීක්ෂණවලදී පුහුණුව තුළින් ලබා ගත් නව දැනුම ගුරුවරුන් විසින් ප්‍රායෝගිකව යොදා ගන්නා ආකාරය අපි දුටුවෙමු. පීපල්ස් ලීසිං කඹුරුපිටිය ශාඛාවේ කළමනාකාරතුමිය සහ කාර්ය මණ්ඩලය විසින් මෙම උත්සාහය මැනැවින් සම්බන්ධීකරණය කළ අතර සපයන ලද පහසුකම් මින් පෙරද සහභාගි වූ පෙර පාසල් ගුරුභවතුන් විසින් බොහෝ ඇගයීමට ලක් කරන ලදී. එමෙන්ම 2018 ලෝක ළමා දිනය සම්බන්ධ උත්සවයට ද සත්කාර වෙමින් ශාඛාවේ කණ්ඩායම අපි වෙත සහය විය. මොළයේ සංවර්ධනයෙන් 80%ක් වයස අවුරුදු 5 ට පෙර සිදුවන බව පර්යේෂණ අනාවරණය කර ඇති අතර මෙවැනි ආයතනික මැදිහත්වීම් අප ජාතියේ මානව සම්පත සංවර්ධනය කරා වඩාත් අර්ථවත් අයුරින් සිදුකිරීමට මුල් ළමාවිය සේවා සපයන්නන්ට මහත් රුකුලකි.



**හිමාලි කුරුප්පු**
මුල් ළමාවිය සංවර්ධන නිලධාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කඹුරුපිටිය

මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
**කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ >>**
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු


## ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම



2019 ජූනි මසදී වඩාත් නිවැරදිව සහ ඉහළ සාර්ථකත්වයකින් හෘද ශල්‍යකර්ම සිදුකිරීමට කොළඹ ජාතික රොහලේ හෘදරෝග ඒකකයට නවීන ඉකෝ කාර්ඩියෝග්‍රැෆික් යන්ත්‍රය ලබාදීම.



2019 අප්‍රේල් මසදී ගර්භණී මවුවරුන් සඳහා රෝහල් පහසුකම් වැඩිකරමින්, ද සොයිසා රෝහලේ 5 වාට්ටුව තිර රෙදි යොදා ප්‍රසන්න රෝහල් පරිසරයක් ගොඩනැගීමට දායක වීම.



2019 නොවැම්බර් මසදී කුඩා දරුවන්ට හිතකර රෝහල් පරිසරයක් නිර්මාණය කරමින් ළමා රෝගීන් සඳහා පහසුකම් ඉහළ නංවමින් ඇල්පිටිය මූලික රෝහලේ ළමා වාට්ටුව නවීකරණය කිරීම.

**"බරපතල ලෙස රෝගී වූ නවජ ජීවිත බේරාගැනීමට පීපල්ස් ලීසිං නවීන ජීවිත සුරැකුම් උපකරණ පිටුවහලක් විය"**

ද සොයිසා කාන්තා රෝහලේ නවජ දැඩි සත්කාර ඒකකය (NICU), ජීවිත බේරා ගැනීම සඳහා අතිශයින් නිවැරදි නියාමනය සමඟ විශේෂිත වෛද්‍ය සහය අවශ්‍ය නවජ ළදරුවන්ට සේවය සලසන තෘතීක මට්ටමේ යොමු කිරීම් මධ්‍යස්ථානයකි. දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම නවජ ළදරු රෝගීන් මෙම ඒකකයට යොමු කෙරේ. විශේෂිත වෛද්‍ය පහසුකම් අවශ්‍ය ඉහළ අවදානමේ සිටින ගර්භණී මව්වරුන්ගේ ළදරුවන් ද මෙයට ඇතුළත්ය. ඉපදීමේදී වඩාත් ඉහළ අවදානමේ පසුවන ළදරුවන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා NICU වෙත ඇතුළත් කෙරේ. සති 23ක සිට ඉහළට උපදින නවජ ළදරුවන් සඳහා අපි ප්‍රතිකාර කරමු. විශේෂිත වෛද්‍ය පහසුකම් සඳහා අපගේ නවජ ඒකකය (NICU) සහ විශේෂ ළමා ආරක්ෂක ඒකකය වෙත වර්ෂයකට ඇතුළත් කිරීම් 950 - 1,000ක් පමණ ලැබේ. ළදරුවා සම්පූර්ණයෙන් සුව වනතුරු ජීවිත සුරැකුම් යන්ත්‍රයෙන් ළදරුවෙකුගේ සම්බන්ධය විසන්ධි කිරීමට අපට නොහැකි බැවින් ළදරුවන් සඳහා නිතරම පොරොත්තු ලේඛණයක් පවතී. ඉහළ ඉල්ලුම හමුවේ, ඉතා සීමිත සම්පත් සමඟ අපි මෙම ඒකකය ක්‍රියාත්මක කරන අතර ඒකකය තුළ ලබා දෙන වෛද්‍ය පහසුකම් වර්ධනය සඳහා දැනට තිබෙන ඇතැම් නවීන උපකරණ වැඩි දියුණු කිරීම් සමඟ නවීකරණය කළ යුතුව ඇත. රු. මිලියන 5.9ක් වටිනා නවීන ජීවිත සුරැකුම් උපකරණය ලබාදෙමින් බරපතල ලෙස රෝගී නවජ දරුවන්ගේ ජීවිත බේරා ගැනීමට සහයවීම වෙනුවෙන් පීපල්ස් ලීසිං සමාගමට අප බෙහෙවින් ස්තුතිවන්ත වෙමු.



**වෛද්‍ය නලින් ගමාතිගේ**
නවජ ළමාරෝග විශේෂඥ,
ද සොයිසා කාන්තා රෝහල
කොළඹ 10.




**ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් පිරිනමන විශිෂ්ටතම ආයතනික පුරවැසි/තිරසර සම්මාන 2019**
– ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනික පුරවැසියන් දහයෙන් එක් ආයතනයක් ලෙස (7 වැනි වරට)
– ප්‍රජා සම්බන්ධතා වර්ගීකරණය තුළ ජයග්‍රාහකයා

ජපන් ශ්‍රී ලංකා තාක්ෂණික සහ සංස්කෘතික සංගමය විසින් පිරිනමන
**– ඉයන් ඩයන් අබේසිංහ අනුස්මරණ JASTECA CSR – තිරසර සම්මාන 2019**
විශිෂ්ටතම CSR/තිරසර ව්‍යාපෘති දහය අතරේ ආයතනයක් ලෙස

STING උපදේශකයින් විසින් ප්‍රකාශයට පත්කරන STING ආයතනික වගකීම් දර්ශකයේ
– රන් ශ්‍රේණිගතකරණය – (2011 සිට)

*සම්මාන ප්‍රදානෝත්සවය කොවිඩ්-19 හේතු කොට ගෙන කල්යන ලදී.

**ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන් පිළිබඳ කාර්යමණ්ඩලය යාවත්කරණය හා සෙසු කාර්යමණ්ඩල සාමාජිකයන්ට ද ඒවාට ස්වෙච්ඡාවෙන් දායකත්වය ලබා දීම සඳහා දිරිගන්වමින් ඒ පිළිබඳ පුවත් අභ්‍යන්තර ජාලයට මෙන්ම සමාජ මාධ්‍යවල ද ඉදිරිපත් කෙරේ.**

## 2019/20 ක්‍රියාත්මක කළ ප්‍රධාන ප්‍රජා මූලික ආයතනික සමාජ සත්කාර වැඩසටහන් සමහරක්:

| වැඩසටහනේ නම | 2019/20 වසරේ පිරිවැය (රු. මිලියන) |
|---|---|
| නවජ දැඩි සත්කාර ඒකකය වෙත නවජ ඉන්කිව්බේටරය, මල්ටිපැරා මොනිටර් සහ නවජ සහ ළමා වෙන්ටිලේටර් ඇතුළුව තීරණාත්මකව අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාදීම සහ ද සොයිසා රෝහලේ වාට්ටු අංක 5 සහ 15 සඳහා තිරරෙදි යොදමින් ගර්භණී මව්වරුන් සඳහා වෛද්‍ය පහසුකම් වර්ධනය කරමින් ප්‍රසූතිකාගාරය සඳහා වායුසමීකරණ යන්ත්‍රයක් ලබාදීම | 5.94 |
| කොළඹ, ජාතික රෝහලේ හෘද රෝගී ඒකකය වෙත ඉකෝ කාර්ඩියෝග්‍රැෆික් යන්ත්‍රයක් ලබා දීම | 13.57 |
| දෙමුහුන් තාක්ෂණය පිළිබඳ වෘත්තීය අධ්‍යාපනය කරගෙන යාමට වයඹ කාර්මික විද්‍යාලයේ සිසුන් 21 ක් සඳහා මාසිකව ශිෂ්‍යත්ව පිරිනැමීම | 1.16 |
| අනාගත ව්‍යවසායකයින් 80ක් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුව සමග එක්ව ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය පිළිබඳ වැඩමුළු මාලාවක් පැවැත්වීම සහ ව්‍යාපාර සැලැස්ම සමාලෝචනය මත ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීමට, පුළුල් කිරීමට ව්‍යවසායකයින් 21ක් සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දීම | 1.88 |
| මාතෘ සෞඛ්‍යය ආරක්ෂන වැඩසටහන – පීපල්ස් ලීසිං අනුරාධපුර ශාඛාව | 0.30 |
| ඇල්පිටිය රෝහලේ ළමා වාට්ටුව නවීකරණය – පීපල්ස් ලීසිං ඇල්පිටිය ශාඛාව | 0.43 |
| ලේඩි රිජ්වේ ආර්යා ළමා රෝහලේ අනතුරු සහ හදිසි සේවාව සහ දේශන ශාලාව නවීකරණ කටයුතු සිදුකිරීම | 0.83 |
| දියතලාව මූලික රෝහලට තීරණාත්මකව අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාදීම – පීපල්ස් ලීසිං බණ්ඩාරවෙල ශාඛාව | 0.14 |
| සෙයින්දමරුදු ප්‍රාදේශීය රෝහලේ කාන්තා වාට්ටුව නවීකරණය – පීපල්ස් ලීසිං, කල්මුණේ ශාඛාව | 0.24 |
| දිවයින පුරා ආසන්නතම පීපල්ස් ලීසිං ශාඛාවන්හි සහභාගිත්වය ඇතිව "ලිට්ල් ස්ටෙප්ස්" නමින් ඌන සංවර්ධිත පෙර පාසල්වල ළමා මිතුරු පරිසරය ඉහළ නැංවීම | 1.07 |
| පීපල්ස් ලීසිං ශාඛා ජාලය සම්බන්ධ කරගනිමින් පසුවිපරම සිදුකරමින් සිසුන් 353ක් සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්ව පිරිනැමීම | 7.07 |
| පෙර පාසල් ළමුන්ගේ සාකල්‍ය සංවර්ධනය අරමුණු කරමින් ක්‍රියාකාරකම් තුළින් ඉගැන්වීම් සැලසුම්කරණය පිළිබඳ පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන් සිදු කිරීම | 2.07 |
| පීපල්ස් ලීසිං, යුනියන් පෙදෙස ශාඛාව විසින් යුනියන් පෙදෙස බාද් උද්-දීන් මහමුද් විද්‍යාලයේ සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 0.71 |
| රථවාහන පොලිසිය වෙත මාර්ග කේතු ලබාදීම | 0.25 |

## සැලසුම්කළ වැඩසටහන්

ඉදිරි වර්ෂවල දී පහත දෑ ක්‍රියාත්මක කිරීමට අපි සැලසුම් කරමු:

- මූල්‍ය සාක්ෂරතාව සමඟ කුඩා ව්‍යාපාරවලට තවදුරටත් සහය වීම සහ ඔවුන් හට තිරසර ව්‍යවසායකයින් වීමට අවශ්‍ය සම්පත් කරා පිවිසීමට මූල්‍ය සාක්ෂරතාව සහ සහය ලබාදීම.
- පීපල්ස් ලීසිං සමාගම් සංස්කෘතිය තුළ වගකීම්සහගත ආයතනික පුරවැසියකු බවට පත්වීමේ සංකල්පය නිලධාරි මණ්ඩලය අතර තවදුරටත් ප්‍රවර්ධනය කිරීම.
- මෙහෙයුම් කටයුතු සදාචාරාත්මකව පවත්වාගෙන යාම තුළ ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර සදාචාරාත්මක සහ වගකීම්සහගත ව්‍යාපාරකරණය ප්‍රවර්ධනය.
- පීපල්ස් ලීසිං සමාගම මගින් සමාජයට සෘණාත්මක බලපෑමක් ඇතිකළ හැකි සදාචාර විරෝධී සමාජ කටයුතු වළකාලමින් වගකීම්සහගත ණයදීමේ මූලධර්ම සමාගම තුළ ප්‍රචලිත කිරීම.
- එක්සත් ජාතීන්ගේ ඉලක්ක අභිවර්ධනය කරා රටේ ප්‍රමුඛතාවන්ට සමගාමීව අපගේ ක්‍රමෝපායික ප්‍රජා සත්කාරයන්හි ව්‍යාපෘති අඛණ්ඩව ආයෝජනය
- සමාජයට මැනිය හැකි ධනාත්මක වෙනසක් කිරීමට වඩාත් ක්‍රමෝපායික හවුල්කරුවන් සමඟ සහයෝගීතාව තහවුරු කර ගැනීම.



# ස්වාභාවික ප්‍රාග්ධනය

දේශගුණික විපර්යාස මෙකල තුළ තීරණාත්මක අභියෝගයක්ව පවතින බැවින්, අනාගත පරපුර සඳහා ස්වභාවික පරිසරය සංරක්ෂණය ගෝලීය ප්‍රමුඛතාවක් බවට පත්ව ඇත. වගකීම්සහගත මූල්‍ය සේවා සපයන සමාගමක් ලෙස, පීපල්ස් ලීසිං ශ්‍රී ලංකාවේ පවතින නෛතික හා නියාමන අවශ්‍යතාවන් පිළිපැදීමට කැප වී සිටින අතර තිරසර වාර්තාකරණය පිළිබඳ දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ද ස්වේච්ඡාවෙන් පිළිගනී.

පාරිසරික කළමනාකරණය, අපගේ සේවකයින්, ගනුදෙනුකරුවන්, ව්‍යාපාර හවුල්කරුවන්, සහ රාජ්‍ය/පුද්ගලික ආයතන සමඟ සහයෝගීත්වයෙන් පරිසරය රැකගැනීම සඳහා අපි කටයුතු කරමු. අපගේ තිරසාර සම්පත් භාවිතය ප්‍රශස්ථ කිරීමට පමණක් නොව අපගේ පරිසරය සහ අවසාන වශයෙන් සමාජය මත සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා අපගේ ගනුදෙනුකරුවන් දිරිමත් කරමින් ඔවුන් අතර තිරසාර ව්‍යාපාර ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීමට අපි උත්සාහ ගනිමු. එමෙන්ම, අපගේ ආයතනික සමාජීය වගකීම්සහගත (CSR) උත්සාහයන්ගේ ප්‍රධාන අවධානිත ක්ෂේත්‍රයක් ලෙස අපගේ පාරිසරික තිරසාරභාවය අපි සැලකිල්ලට ගනිමු.

**පරිසරය කෙරෙහි අපගේ සෘජු බලපෑම ඵලදායීව කළමනාකරණය කිරීමට පද්ධති පදනම් පාරිසරික කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම**

## වැදගත් සිදුවීම්

**හරිත දැනුවත්භාවය**

සමාගමේ කාබන් පතුල් සටහන අඩුකිරීම සඳහා පළමු වරට සෑම ව්‍යාපාර ඒකකයකම කාබන් පතුල් සටහන පිළිබඳ අදාළ ශාඛා නිලධාරීන් දැනුවත් කරන ලදී.

**හරිත මෙහෙයුම්**

සියලුම ව්‍යාපාර ඒකක හරහා තිරසර සම්පත් ප්‍රශස්ථකරණය සඳහා අභ්‍යන්තර පාරිසරික කළමනාකරණ පද්ධතියක් එළිදක්වන ලදී.

**වගකීම්සහගත මූල්‍යකරණය**

පාරිසරික වගකීම් ඇතුළුව වගකීම්සහගත ව්‍යාපාර මෙහෙයුම් සඳහා තම කැපවීම පිළිබඳ ශාඛා 46ක් ස්වේච්ඡාවෙන්ම ප්‍රතිචාර දක්වන ලදී.

**හරිත බලපෑම් සහිත ප්‍රජා සත්කාර**

හරිත සාක්ෂරතාව ඇති කිරීමට හා තරුණ පරම්පරාව අතර පාරිසරික දැනුවත්භාවය ඉහළ නැංවීමට "පීඑල්සී හරිත සිතුවම" සමස්ත ලංකා පෝස්ටර් චිත්‍ර තරඟය සාර්ථකව පවත්වන ලදී.

## අදාළ ක්‍රමෝපායික විධි

- වගකීම්සහගත කළමනාකරණය මූර්තිමත් කිරීම
- කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය

## අදාළ පාර්ශ්වකරුවන්

- කාර්ය මණ්ඩලය
- ගනුදෙනුකරුවන්
- සැපයුම්කරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන්
- ප්‍රජාව සහ පරිසරය



# ස්වාභාවික ප්‍රාග්ධනය

අපගේ පාරිසරික වගකීම වටිනාකම එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණුවලට (SDGs) සමගාමී වන අතර අපගේ වගකීම්සහගත සහ පරිසර හිතකාමී ව්‍යාපාර ව්‍යවහාර තුළින් අප රටේ තිරසර සංවර්ධනය කරා වඩා ඵලදායි අයුරින් දායකවීමේ ගමන් මගෙහි අපි ඉදිරියට යමින් සිටිමු.

එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල මගපෙන්වීම සහ කලින්කල සමාලෝචනය කර අපගේ පාරිසරික ප්‍රතිපත්තියට අනුකූලව, වගකීම්සහගත ව්‍යාපාර ව්‍යවහාර සමාගම තුළ ප්‍රවර්ධනය කෙරේ. පරිසරය කේන්ද්‍රීය තීරණ ගැනීම කුළුණු හතරේ ක්‍රමෝපායක් තුළින් අපගේ හරිත සාක්ෂරතාවය, මෙහෙයුම්, මූල්‍ය සේවා, සහ පරිසරය පදනම් වූ සමාජ සත්කාර කටයුතු තුළ ඇතුළත් වේ.

## පරිසර ආරක්ෂණය වෙනුවෙන් අපගේ ආයෝජනය:

| | 2019/20 | 2018/19 |
|---|---|---|
| **හරිත සාක්ෂරතාවය: අපගේ පාර්ශ්වකරුවන් අතර හරිත දැනුම ප්‍රවර්ධනය කිරීම** | | |
| හරිත පුහුණු වැඩසටහන් (ගණන) | **18** | 30 |
| හරිත ව්‍යාපාර ව්‍යවහාර පිළිබඳ දැනුවත් වූ කාර්යමණ්ඩලය (ගණන) | **35** | ආසන්න 300 |
| දැනුවත් වූ නව කාර්යමණ්ඩලය (ගණන) | **334** | 492 |
| **හරිත මෙහෙයුම් : පරිසරය කෙරෙහි අපගේ සෘජු බලපෑම කළමනාකරණය සහ ප්‍රශස්ථකරණය** | | |
| ඉවත දමන කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය කිරීම (කි.ග්‍රෑ) | **7,150** | 6,970 |
| බලශක්ති භාවිතය (කි.වො.) | **$14.5 \times 10^6$** | $4.5 \times 10^6$ |
| ප්‍රතිචක්‍රීයකරණය කළ හානිකර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය (කි.ග්‍රෑ) | **3,558** | – |
| කාබන් පතුල සටහන ($CO_2$ සමාන ටොන් වලින්) | **7,955.83** | 6,113.66* |
| **වගකීම්සහගත මූල්‍යකරණය: පීපල්ස් ලීසිං විසින් ලබාදෙන මූල්‍ය සේවාවල හරිත බලපෑම ප්‍රශස්ථකරණය** | | |
| හරිත මූල්‍ය පහසුකම් (ගණන) | **850** | 2,185 |
| හරිත මූල්‍ය පහසුකම්වල වටිනාකම (රු. බිලියන) | **1.87** | 5.48 |
| **හරිත සමාජ සත්කාර: පරිසරය සංරක්ෂණය** | | |
| රෝපණය කළ නව පැළ ගණන (ගණන) | **4,517** | 14,625 |
| තිරසර මෙහෙයුම් පිළිබඳ දැනුවත්කළ පාර්ශ්වකරුවන් (ගණන) | **ආසන්න 7,000** | 1,105 |
| පරිසරයට අදාළ ප්‍රජා සත්කාරක වැඩසටහන් (ගණන) | **12** | 31 |
| පරිසරයට අදාළ ආයෝජනය (රු. මිලියන) | **3.32** | 1.94 |
| මුළු සෘජු ප්‍රතිලාභීන් (ආසන්න ගණන) | **7,934** | 2,150 |

*අතිරේක ගොඩනැගිලි ඇතුළු කාබන් පා සටහන් වටිනාකම 2018/19 වසරේදී සිදුකළ කාබන් පතුල් සටහන් අගය – ප්‍රධාන කාර්යාලයේ පරිපූරක ගොඩනැගිල්ල ද ඇතුළත්ව

## කුළුණු හතරේ පාරිසරික ක්‍රමෝපාය






# ස්වාභාවික ප්‍රාග්ධනය



## හරිත දැනුවත්භාවය

### ව්‍යාපාරයේ තිරසර හා වගකීම්සහගතභාවය පිළිබඳ දැනුම

පාරිසරික වගකීම සඳහා අපගේ මධ්‍ය වටිනාකම පිළිබඳ අපගේ සේවක මණ්ඩලය සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් අපි දැනුවත් කරමු. වසර පුරාම, අපගේ නව කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පරිසරය කරා ඔවුන්ගේ තනි පුද්ගල සහ කණ්ඩායම් වගකීම පිළිබඳව ද දැනුවත් කරමු.

අපගේ ව්‍යාපාරය තුළ පරිසරියට අදාළ මූලික කාර්යසාධන දර්ශක (KPIs) හඳුනාගැනීම තුළින් ස්වාභාවික ප්‍රාග්ධනය කෙරෙහි අපගේ සෘජු බලපෑම කළමනාකරණයේදී සමූහය පුරා සේවක දැනුවත්භාවය කරා මග පදා ඇත. දත්ත පරීක්ෂා කිරීමේ අභ්‍යාසයෙන් ඉදිරියට යමින්, පාරිසරික වගකීමෙන් යුතුව ව්‍යාපාරය සිදුකරන ව්‍යාපාර ඒකක ප්‍රධානීන් සහ හඳුනාගත් තිරසර නායකයින් විසින් ව්‍යාපාර ඒකක මට්ටමේදී එදිනෙදා තීරණ ගැනීමට මූලික කාර්යසාධන දර්ශක ගනු ලැබේ.

2019/20 දී, පළමු වරට සමාගම විසින් ස්වකීය කාබන් පතුල් සටහන පිළිබඳ සෑම ශාඛා කාර්යාලයක්ම දැනුවත් කරන ලදී. දැනුවත් භාවයෙන් වගකීම්සහගත තේරීම් සමඟ ඉදිරි වසර වලදී කාබන් පතුල් සටහන අඩු කිරීමට නිර්දේශ සමඟ ශාඛාවල කාබන් පතුල් සටහන අඩු කිරීමට දායක වන තීරක පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී.

අපගේ කාර්ය මණ්ඩලය ණය දීමේ ක්‍රියාවලිය සඳහා පාරිසරිකමය නිසි පිළිවෙළ පිළිබඳ දැනුවත් කරන ලද අතර එයට නිතරම ක්ෂේත්‍ර විපරමක් සහ ගනුදෙනුකාරහවතුන්ගේ පාරිසරික වාර්තා සහ ලබාගෙන ඇති බලපත්‍ර/සහතික කිරීම් ඇතුළත්ය. තවද, ජෛව විවිධත්වයට අදාළ අවදානම් වලට එරෙහිව මූල්‍ය විසඳුම් නිවාරණය නොකිරීම නිසා සිදුවියහැකි සෘජු සෘණාත්මක බලපෑම පිළිබඳවද අපගේ සේවක මණ්ඩලය දැනුවත් කෙරේ. අපගේ මෙහෙයුම් ස්ථානවලට අනුව ආරක්ෂිත ප්‍රදේශ සහ ඉහළ ජෛව විවිධත්ව වටිනාකමක් ඇති ප්‍රදේශ පිළිබඳව සේවක මණ්ඩලය දැනුවත් කර ඇති අතර, ජෛව විවිධත්වය කෙරෙහි බලපෑම් අවම වන සේ කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන් දිරිගන්වමු.

පරිසරය කෙරෙහි කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය වැඩි වීමට පරිසරය ආශ්‍රිත සමාජ සත්කාර වැඩසටහන් හි අපගේ කාර්ය මණ්ඩලය නිරත වීම ද හේතු වේ.

**"අඛණ්ඩ දැනුවත්භාවය සමඟ, අපගේ දෛනික ව්‍යාපාර කටයුතුවලදී පරිසරය ඇතුළත් කර ගනිමු."**

"මා විසින් සිදුකරන දෛනික කාර්යයන්ට අමතරව මගේ ශාඛාවේ පාරිසරික කාර්යසාධනය පිළිබඳ සොයා බලා කටයුතු කිරීම මා හට පවරන ලදී. මම එම අමතර කාර්යය උද්යෝගයෙන් සිදු කරමි. මගේ ශාඛා කළමනාකාරතුමාගේ මඟපෙන්වීම යටතේ වගකීම්සහගතව සම්පත් භාවිතය තුළින් අපට පිරිවැය ඉතුරු කරගත හැකි ආකාරය සහ ඉහළ මට්ටමේ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයක් ලබාගන්නා ආකාරය අපි සාකච්ඡා කරමු. කට වචනය, සමාජ මාධ්‍ය සහ විද්‍යුත් ලිපි තුළින් අඛණ්ඩව දැනුවත්භාවය ඉහළ නංවමින්, නාස්තිය අඩුකිරීම, බලශක්තිය කාර්යක්ෂමතාව හා විනය සහ වගකීම්සහගත ණය දීම ඇතුළු විෂයයන් පිළිබඳ අපගේ එදිනෙදා ව්‍යාපාර තීරණ ගැනීමේදී අපි සංවේදී වෙමු. අපගේ මෙහෙයුම් ක්‍රමානුකූලව ඉහළ නැංවීමේදී සහ අපගේ ශාඛා සංස්කෘතිය පරිණාමයේදී අපගේ කාර්ය මණ්ඩලයේ සහය අගය කළ යුතුය. එසේම අපගේ කාර්ය මණ්ඩලය හරිත සමාජ සත්කාර ව්‍යාපෘතිවල නිරත වන අතර, කැප වූ උප කණ්ඩායම් තුළින් ඔවුන්ගේ සක්‍රීය සහභාගිත්වය අප සහතික කරමු. අපි සේවක ප්‍රතිපෝෂණය අගය කරන අතර එක් එක් සේවකයින්ට ඔවුන් දායකවන දේ සඳහා හිමිකාරත්වය ලබා දෙන්නෙමු. වර්තමානයේ අපගේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ක්‍රියාවන්හි පාරිසරිකමය බලපෑම වඩා හොඳින් අවබෝධකර ගනී. මෙය ගනුදෙනුකරුවන් සහ ප්‍රජාව අතර අපගේ ශාඛාවේ ප්‍රතිරූපය ඉහළ නංවා ඇත. පාරිසරික දැනුවත්කම අපගේ ව්‍යාපාර සාර්ථකත්වයේ කොටසක් ලෙස අපි සැබැවින්ම සලකමු."



**අන්වර් හසන්**
මූදල් නිලධාරී
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.
බදුල්ල ශාඛාව



බදුල්ල ශාඛාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක් ස්වේච්ඡාවෙන් පරිසර පද්ධතිය යථා තත්ත්වයට ගෙන ඒමට දායක වෙමින් බදුල්ල, අලුගොල්ල විනාශ වූ තණබිමක ප්‍රතිස්ථාපනය කිරීමේ පියවරක් තබමින්.

## හරිත මෙහෙයුම්

### තිරසර සම්පත් ප්‍රශස්තකරණය

දිවයින පුරා අපගේ ව්‍යාපාර ඒකක තුළ බලශක්ති සංරක්ෂණයේ සිට වගකීම්සහගත අපද්‍රව්‍ය කළමනාකරණය දක්වා, පරිසරය මත අපගේ සෘජු කාබන් පතුල් සටහන අඩුකිරීම සඳහා අපි සක්‍රීයව කටයුතු කරමු. 2014 දී අපි පරිසරයට අදාළ ප්‍රධාන දර්ශක පරීක්ෂා කිරීම හඳුන්වා දුන්නෙමු. එතැන් පටන්, අපගේ ව්‍යාපාර ඒකක විසින් මෙම දර්ශක පරීක්ෂා කර පසු විපරම් කිරීම මෙන්ම අනාගත අහිතකර පාරිසරික බලපෑම් හඳුනාගනිමින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය අවස්ථාවලදී ගෙන ඇත.

ISO 14,064-1: 2018 රාමුවේ අවශ්‍යතාවන් අනුව අදාළ විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් අපගේ කාබන් පතුල් සටහන් අපි ගණනය කරමු. අපගේ කාබන් පා සටහන අඩු කිරීම සමාගමේ ප්‍රධාන පාරිසරික කාර්යසාධන දර්ශකවලින් එකකි. 2019/20 දී, 6 වන වරටත් කාබන් පතුල් සටහන ගණනය කරන ලද අතර සමූහයේ කාබන් පතුල් සටහන $CO_2$ සමාන ටොන් 7,955.83ක් ලෙස වාර්තා විය. එය $CO_2$ සමාන ටොන් 1,842.17ක වැඩිවීමකි. මේ වැඩි වීම සඳහා ව්‍යාපාර ආශ්‍රිත ගමන් – (සෘජු විමෝචන) වර්ගය සහ විදුලිය සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේදී සිදු වූ අලාභ (වක්‍ර විමෝචන) ප්‍රධාන වශයෙන් හේතු විය.

2019/20 දී, තොරතුරු තාක්ෂණ පද්ධති පදනම් වූ පාරිසරික කළමනාකරණ ක්‍රමයක් (EMS) සමාගම් තුළ අභ්‍යන්තරව සංවර්ධනය කරන ලදී. ඒ හරහා පරිසර යාවත්කරණය පහසු කරන ලදී. ISO 14064-1: 2018 ට අනුකූලව, පරිසර දත්ත වාර්තාකරණය සහ පසු විපරම ශක්තිමත් වූ අතර, කාබන් පතුල් සටහන අඩු කිරීමට තත්‍ය කාල තීරණවලට සහය නව EMS මගින් අපේක්ෂා කෙරේ. එසේම වසර තුළ පාරිසරික කාර්යසාධන දත්ත රැස්කිරීමේදී සහ පරිසර විගණනවල පාරිසරික මූලික කාර්ය දර්ශක නිවැරදිව පරීක්ෂා කිරීමට ඉන් සහය ලැබේ.

# ස්වාභාවික ප්‍රාග්ධනය

**වගකීම්සහගත කඩදාසි භාවිතය**

කඩදාසි වලින් තොර විද්‍යුත් ප්‍රකාශන, කඩදාසි රහිත ගනුදෙනු ඇතුළු කඩදාසි රහිත කටයුතු ප්‍රවර්ධනය කරන සේවා අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී. ඉ-මෙමෝ පද්ධතිය 2019/20 දි කඩදාසි රහිත සේවා පරිසරයක් කරා ක්‍රියාත්මක වූ සැලකිය යුතු සංධිස්ථානයක් විය.

**වගකීම්සහගත ඉන්ධන භාවිතය**

ව්‍යාපාර ගමන් තුළ ඉන්ධන භාවිතය අඩුකිරීමට, අපි ඵලදායි ගමන් මාර්ග සැලසුම්කරණය, සැලසුම්කළ ප්‍රවාහනය සහ අපගේ ගමන් මාර්ග සඳහා හරිත වාහන භාවිතය අපි භාවිතයේ යොදවමු. ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ව්‍යාපාර ගමන්වල ඵලදායීත්වය වැඩි කිරීමට 2019/20 දී තොරතුරු තාක්ෂණ පද්ධතියක් හඳුන්වාදෙන ලදී.

**වගකීම්සහගත බලශක්තිය භාවිතය**

අපගේ ප්‍රධාන බලශක්ති ප්‍රභවය විදුලිය වන අතර කාර්යක්ෂම වායු සමීකරණ පද්ධති, විදුලි පහන් සහ කාර්යාල උපකරණ අපි භාවිතා කරමු. 2019/20 දී බලශක්ති පරිභෝජනය කිලෝ වොට් $9.95x10^{6}$ කින් වැඩි වූ අතර, මේ සඳහා සේවක ව්‍යාපාර ආශ්‍රිත ගමන් – ගොඩබිම (ඍජු විමෝචන) වර්ගය සහ විදුලිය සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේදී වූ විමෝචන අලාභ (වක්‍ර විමෝචන) ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගකීම්සහගත අපද්‍රව්‍ය කළමනාකරණය**

උපද්‍රව සහිත ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය මෙන්ම වඩා ඉහළ ගෝලීය උණුසුම් විභවයන් ඇති ආහාර අපද්‍රව්‍ය වගකීම් රහිත බැහැර කිරීමේ වැදගත්කම අපි අවබෝධ කර ඇත්තෙමු. සේවා මණ්ඩලයේ සහය සමඟ 2011 සිට අපද්‍රව්‍ය වෙන් කිරීම ආයතනය තුළ ක්‍රියාත්මක කෙරේ. අපගේ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) ලියාපදිංචි අපද්‍රව්‍ය රැස්කිරීමේ විසඳුම් සපයන්නන් විසින් සිදුකරන අතර අපගේ කාර්ය මණ්ඩලය විසින් ගනු ලබන සාමූහික උත්සාහය අපද්‍රව්‍ය උත්පාදනය අඩු කිරීමට හේතු විය. වාර්ෂිකව පවත්වන සනීපාරක්ෂක කාර්ය මණ්ඩලය ඇගයීමේ වැඩසටහන ද පිරිසිදු සහ හරිත සේවාස්ථානයක් ප්‍රවර්ධනය කරයි.

2019/20 දි, මෙතෙක් සිදුකළ විශාලතම උපද්‍රව සහිත ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය බැහැර කිරීම බාහිර ඉලෙක්ට්‍රොනික ඉ-අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ විසඳුම් සපයන ආයතන දෙකක් හරහා වගකීම්සහගත ලෙස ප්‍රතිචක්‍රීයකරණය සඳහා යවන ලදී. අපගේ කි.ග්‍රෑ. 7,150 ප්‍රතිචක්‍රීයකරණ උත්සාහයන් සම්පූර්ණයෙන් වැඩුණු ගස් 122ක් සුරැකි අතර හරිතාගාර වායු විමෝචන අඩු කිරීමට දායක වී ඇත.



2020 ජනවාරි මස ලියාපදිංචි ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ සේවා සපයන ආයතනයක් හරහා බැහැරලූ උපද්‍රව සහිත ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය වගකීම්සහගතව බැහැර කිරීමේදී සංවේදී දත්ත ආරක්ෂාව සහතික කරගනිමින්.

අපගේ සැපයුම් ප්‍රතිපත්තිය අනුව, අපගේ මධ්‍යම පරිපාලන දෙපාර්තමේන්තුව සහ අදාළ ව්‍යාපාර ඒකක විසින් අපගේ සැපයුම් දාමය දැනුවත් කළ අතර, පාරිසරික අනුකූලතාව ඇතුළුව අපගේ ආයතනික ආචාරධර්ම සපුරාලීමට ඔවුන්ට මඟපෙන්වනු ලැබේ. වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචියේදී මධ්‍යම සැපයුම්කාර ගිවිසුම්වල පරිසරයට අදාළ වගන්ති මගින් අපගේ සැපයුම්කරුවන් පාරිසරික වශයෙන් වගකීම් සහගත ව්‍යාපාර ව්‍යවහාරවලට අනුකූල වීම සහතික කරයි.



2020 ජනවාරි මසදී ප්‍රධාන කාර්යාලයේ සනීපාරක්ෂක කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට රැකියාව තුළ පාරිසරික වගකීම සහ ප්‍රීතිමත් දිවිය පිළිබඳ දැනුවත් කිරීම.

**"කඩදාසි පදනම් වූ සාම්ප්‍රදායික "මෙමෝ" ක්‍රමය වෙනුවට කඩදාසි රහිත ඉලෙක්ට්‍රොනික් මෙමෝ ක්‍රමවේදයක් දැන් අප සතුය."**

"අප ආයතනය 2018 ජූනි මස ඉ-මෙමෝ ක්‍රමය සංවර්ධනය කිරීමේදී ඊට දායක වීමට හැකිවීම පිළිබඳ මම බෙහෙවින් සතුටු වෙමි. අදියර තුනක් යටතේ සිදුවූ මෙම ක්‍රියාවලි ශාඛා ජාලය, කළමනාකරණ සහ අදාළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල ඇතුළුව සෑම මට්ටමකදීම ඇතිවිය හැකි ගැටලු හඳුනාගනිමින් ICT ප්‍රවීණයින් සිදුකළ සංකීර්ණ කාර්යයක් විය. කඩදාසි පදනම් වූ මෙමෝ බෙදාහැරීමේ ක්‍රමය වෙනුවට මනාව ගලපන ලද කඩදාසි රහිත ක්‍රමවේදයක් දැන් අප සතුය. මෙම ස්වයංක්‍රීය ක්‍රියාවලිය නිසා, අවම කාලයකදී අපගේ ගනුදෙනුකරුවන්ට සේවය ලබා දීමට අපි ශක්තිමත් වී ඇත. අපගේ දත්ත ඇතුළත් කිරීමේ ස්ථාන තුළ දත්ත ඇතුළු කිරීමේදී සිදුවිය හැකි දෝෂ ද අවම කරයි. මෙම පහසුකම අපගේ දැනට පවත්නා ලේඛන කළමනාකරණ පද්ධතිය සමඟ සම්බන්ධ කර ඇති බැවින් නැවත පිටපත් කිරීමක් නොමැතිව දත්ත සුරක්ෂිතතාවය තහවුරු කරමින් ගනුදෙනුකාරභවතුන්ගේ ලියකියවිලිවල දත්ත ආරක්ෂාව සහතික කරයි. කඩදාසි රහිත පරිසරයක් කරා අපගේ ගමන තුළ මෙය සැබැවින්ම සන්ධිස්ථානයකි. ඒ අපි සෑම මට්ටමකදිම කඩදාසි සුරකිමින් අප අංශය තුළ පමණක් 76.6% ක සැලකියයුතු මාසික අඩුකිරීමක් කර ඇති බැවිනි."



**මහේෂා පෙරේරා**

ලේඛන අංශ ප්‍රධානී
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය

# ස්වාභාවික ප්‍රාග්ධනය



## වගකීම්සහගත මූල්‍යකරණය

### තිරසාරාත්මක මූල්‍යකරණය

පාර්ශ්වකරුවන්ගේ ඉහළ යන අපේක්ෂාවන්ට සමගාමීව, ණය දීමේ තීරණ ගැනීමේදී අපි පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ප්‍රතිෂ්ඨාවන් ප්‍රවර්ධනය කරමු. ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර මෙහෙයුම්වල ඍණාත්මක පාරිසරික බලපෑම් අවම කිරීමට ඔවුන් සමඟ කටයුතු කිරීම ද මෙයට ඇතුළත්ය.

2019/20 දී, ගනුදෙනුකරුවන් හෝ තෙවැනි පාර්ශ්ව විසින් පරිසරයට අදාළ නීති කඩකිරීමෙන් ආරක්ෂා කිරීම පිළිබඳ ගනුදෙනුකාර දැනුවත්කම මදවීම හා බැඳුණු අවදානම් වැදගත් ගැටලුවක් ලෙස හඳුනාගනු ලැබිය. තවද, ගුණාත්මක සහ වගකීම්සහගත ණය ප්‍රවර්ධනය කරන අනාගත හැකියා ගොඩනැගීමේ වැඩසටහන් තුළ ස්වභාවික ජෛව පද්ධතිය පිළිබඳ බලපෑම් තුරන් නොවේනම් එය අවම කිරීම පිළිබඳ කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය වර්ධනය කිරීමට අපි සැලසුම් කරමු.

අපගේ ගනුදෙනුකාර හවතුන්ට සේවය කිරීම අප ඔවුන්ගේ අදාළ ව්‍යාපාර සඳහා ස්වභාවික ආපදාවන් තුළින් වියහැකි අවදානම් සහ උවදුරුවලට මුහුණ දීමට අපි උදව් කරමු.

2019 ඔක්තෝබර් මසදී, ස්වේච්ඡාවෙන් සහභාගි වූ ශාඛාවල සමබර කාර්යසාධනය ඇගයුම්පතක් හරහා වගකීම්සහගත ව්‍යාපාර ව්‍යවහාර සහ SDGs හි අභිවර්ධනය සමඟ පෙළගැසීම හඳුනාගෙන, ප්‍රධාන පිරිනමන ලදී. මේ සඳහා ශාඛා ජාලයෙන් 46ක් සක්‍රියව සහභාගි විය.

"ඉලක්කම් වලින් ඔබ්බට ගොස්, වගකීම්සහගත මූල්‍යසේවා තුළින් වටිනාකම ගෙන ඒමට අපි උත්සාහ ගනිමු."

"කණ්ඩායමක් ලෙස, දිනපතා සේවයට පැමිණීමේ අරමුණක් අපි දකින අතර ජාතික තිරසාර ප්‍රගතියට සහයවීමේදී අප විසින් ඉටුකළයුතු කාර්යභාරයක් අප සතුව ඇති බව අපි විශ්වාස කරමු. මූල්‍ය ආයතනයක් ලෙස අපගේ ගණුදෙනුකරුවන් හරහා වුවද රටේ නීතිය කඩකිරීමේ ප්‍රතිවිපාත පිළිබඳ අප කාර්යාලය මනාව දැනුවත්ය. එබැවින්, ඉලක්කම් වලින් ඔබ්බට ගොස්, වගකීම්සහගත මූල්‍යසේවා තුළින් වටිනාකම ගෙන ඒමට සහ අපගේ අනාගත සහ දැනට සිටින ගනුදෙනුකරුවන් පිළිබඳ නිරතුරු පසුවිපරම් කිරීමට අපි කටයුතු කරමු. සාපරාධී වරදකට පවා ඇතුලත් විය හැකි නීති විරෝධී සහ සමාජ විරෝධී කටයුතුවලින් ආරක්ෂා වන ආකාරය පිළිබඳ අපගේ ගනුදෙනුකාරහවතුන් අපි දැනුවත් කරමු. අප සපයන මූල්‍ය සේවාවල ගුණාත්මකභාවය සමඟ වගකීම්සහගතව තම ව්‍යාපාර මෙහෙයවීම සඳහා අපි ඔවුන් දිරිගන්වා එයට මඟපෙන්වමු. දීර්ඝකාලීනව අපගේ ගනුදෙනුකාරහවතුන්ගේ විශ්වාසවන්තභාවය දිනා ගැනීමට මෙය අපට සහය වේ. ඒකාබද්ධ පද්ධති සහ ව්‍යාපාර ආචාරධර්ම සමගින් වගකීම් සහගත මූල්‍ය සමාගමක් ලෙස අනාගතයේදී තිරසර මූල්‍ය අරමුදල් ආකර්ෂනය කළ හැකි බවද අපි දනිමු. "



**කුෂාන් හේරත්**
ශාඛා කළමනාකරු
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.
නාරම්මල ශාඛාව

**2019/20 දී, ගනුදෙනුකාරහවතුන් හෝ තෙවැනි පාර්ශ්ව විසින් පරිසරයට අදාළ නීති කඩකිරීමෙන් ආරක්ෂා කිරීම පිළිබඳ ගනුදෙනුකාරහවතුන් සතු දැනුවත්භාවය මදවීම හා බැඳුණු අවදානම් වැදගත් ගැටලුවක් ලෙස හඳුනාගනු ලැබීය.**



**ණය ගනුදෙනුකාරහවතුන් සඳහා පාරිසරික සහ සමාජීය වශයෙන් වග වෙමින් ණය ලබා දීමේ පියවර**

වගකීම්සහගත මූල්‍ය සේවා සපයන ආයතනයක් වශයෙන් අප විසින් ණය ලබාදීමේදී අපගේ ගනුදෙනුකාරහවතුන් සඳහා මූල්‍ය ශක්‍යතා අධ්‍යනයක් සිදුකරන අතර එහිදී ලබා දෙන ණය පහසුකම් හරහා ඇති විය හැකි පාරිසරික සහ සමාජීය අවදානම් අවම කිරීමට අප බැඳී සිටිමු. ඒ සඳහා, ණය ලබා දීමේ දී ගනුදෙනුකාරහවතුන්ගේ ආදායම් තත්ත්වය, ආපසු ගෙවීමේ හැකියාව මෙන්ම ලබා දෙන ණය හරහා පරිසරය හෝ සමාජය කෙරෙහි පවතින හෝ ඇති විය හැකි ඍණාත්මක බලපෑම් අවම කිරීම සඳහා පහත සඳහන් ආරක්ෂණ පියවර අප අනුගමනය කරමු.

1) අප රටේ නීති, සමාගමේ ණය ප්‍රතිපත්තිය, චක්‍රලේඛ සහ මෙහෙයුම් මාර්ගෝපදේශ වලට අනුකූලව ගනුදෙනුකාරහවතුන් සඳහා වගකීම්සහගත ණය විසඳුම් ලබා දීම.
2) අදාළ නෛතික හා නියාමන වලට අනුකූලව වගකීම්සහගතව අපගේ මූල්‍ය සේවා අලෙවිකරණය.
3) යම් පුද්ගලයෙකු ණය පහසුකමක් ලබා ගැනීම සඳහා අප වෙත පැමිණි විටකදී, මූල්‍ය තත්ත්වය (ආදායම් තත්ත්වය, වර්තමාන ආදායම, ආදායම් රටාව, සිදුකරන ව්‍යාපාරයේ ස්වභාවය සහ අපේක්ෂිත ණය පහසුකම හරහා වන/විය හැකි පාරිසරික සහ සමාජීය අවදානම්) පිළිබඳව ද ප්‍රශ්න අසමින් ණය ලබා දීම සඳහා මූලික යෝග්‍යතාව පිරික්සීම.
4) ණය ලබා දීමේදී අනුගමනය කරන බැහැර කිරීමේ ලැයිස්තුව (Exclusion List) පිළිබඳවත් ඒ අනුව ණය ඉල්ලුම්කරුවෙකු විසින් දැන හෝ නොදැන නීති සහ රෙගුලාසි කඩ කිරීමකදී ඇති විය හැකි අහිතකර නෛතික ප්‍රතිවිපාක පිළිබඳවත් දැනුවත් කිරීම.
5) තවදුරටත් ණය ලබා ගැනීම පිළිබඳව විමසීම් සිදුකරමින් එම අරමුණ හා බැඳුණු සෘජු සහ වක්‍ර බලපෑම් තිබේ දැයි සොයා බැලීම.
6) ණය ඉල්ලුම්කරු විසින් ලබාදෙන ලද තොරතුරු වල නොගැලපීම් සහ ප්‍රමාණවත් නොවීම් පිළිබද දැනුවත් වීම සඳහා තවදුරටත් විමසීම් සිදුකිරීම.
7) ණය ලබා දීමේ දී වඩාත්ම යෝග්‍ය අන්‍යෝන්‍ය වශයෙන් එකග වූ ණය පහසුකම් ආපසු ගෙවීමේ සැලසුම් ද සමගින් ණය ඉල්ලුම්කරුට හඳුන්වා දීම.
8) ණය ඉල්ලුම්කරුගේ ණය පහසුකම් සකසයනය කිරීම සඳහා ඊට අදාළ ලියවිලි, අවශ්‍ය බලපත්‍ර හෝ අවසරපත් මෙන්ම අවශ්‍ය විටකදී තෙවැනි පාර්ශවයකට යොමු කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂාවකින් අනතුරුව ඒ හා බැඳුණු පාරිසරික සහ සමාජීය අවදානම් ද අවම බව තහවුරු කර ගනිමින් ණය පහසුකම් ලබාදීම.
9) ණය ලබා දීමෙන් පසුවද ගනුදෙනුකාරහවතුන්ගේ පශ්චාත් ණය හැසිරීම් (Post Borrowing Behavior) පිළිබඳව ක්ෂේත්‍ර නිරීක්ෂණය, පසුවිපරම, සටහන් තබා ගැනීම මෙන්ම සමගින් අපගේ මූල්‍ය උපදේශන කාර්යභාරය මැනවින් ඉටු කිරීම.
10) යහපත් ණය ඉතිහාසයක් (Good Credit History) පවත්වා ගැනීමට සහය වෙමින් අපගේ ණය ගනුදෙනුකාරහවතා සමග අඛණ්ඩ සන්නිවේදනය තුළින් වගකීම්සහගතව නිග ණය වාරික ආපසු අයකර ගැනීමට කටයුතු කිරීම.
11) අපගේ ණය ගනුදෙනුකාරහවතකු සත්‍ය වශයෙන් මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණ පා ඇති අවස්ථාවක දී (ආදායමේ වෙනස්වීම, රෝගාතුරවීම, ව්‍යාපාර මුදල් ප්‍රවාහ අඩුවීම, ස්වභාවික ආපදා වැනි හදිසි අවස්ථා වලදී) සහකම්පනයෙන් එයට සවන්දීම සහ එම ගනුදෙනුකාරහවතාට නැවතත් මූල්‍ය යහපැවැත්ම අත්කර ගැනීමට සහය වෙමින් අන්‍යෝන්‍ය වශයෙන් එකග වූ සුදුසු විකල්ප ණය ගෙවීමේ පහසුකම් හෝ අවස්ථානුකූලව සහන සේවා ලබා දීම.
12) ගනුදෙනුකාරහවතුන්ට සමව සැලකීම සහ සේවා හඳුන්වාදීමේදී අපගේ නියාමන හා කොන්දේසි පැහැදිලිව සහ විනිවිදභාවයෙන් සන්නිවේදනය කිරීම.
13) අපගේ ගනුදෙනුකාරහවතුන්ගේ මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කරමින් ඔවුන්ට වගකීම්සහගත මූල්‍ය තීරණ ගැනීම සඳහා උපදේශන සේවා ලබා දීම.
14) සම්පත් ප්‍රශස්තව උපයෝජනය කරමින් අපගේ ගනුදෙනුකාරහවතුන් සඳහා ඩිජිටල් මූල්‍ය සේවා ඇතුළු මූල්‍ය විසඳුම් වෙත පිවිසුම් පහසුකම් (Accessibility ) ඉහළ නැංවීම.
15) අපගේ ගනුදෙනුකාරහවතුන්ගේ තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳ අයිතියට ගරු කරමින් ඔවුන්ගේ සංවේදී දත්තවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

## හරිත සමාජ සත්කාර

### හරිත බලපෑම් සහිත සමාජ සත්කාර තුළින් පාරිසරික වගකීම

අපගේ පාරිසරික වගකීම ඉටු කිරීමේදී හරිත වායු විමෝචනය අඩු කිරීම අරමුණු කරමින්, දිගු කාලීන නැවත වනවගා/ පැල රෝපණ වැඩසටහන් සිදුකළ අතර එහිදී පැල 4,517ක් රෝපණය කළ පරිසර 7 ක් ඇතුළත්ය. ශාඛා මට්ටමේ එවැනි උත්සාහයන් හි පාර්ශ්වකරුවන් සහ ස්වේච්ඡා කාර්ය මණ්ඩලය ස්වේච්ඡාවෙන් දායක විය.

බයෝඩයිවර්සිටි ශ්‍රී ලංකා විසින් විවිධ පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගනිමින් ඔිපාත, කන්නෙලිය ප්‍රදේශයේ කාබන් තිරකිරීමේ ව්‍යාපෘතියක් ලෙස "ජීවිතය" නමින් දියත් කළ ව්‍යාපෘතියේ පීපල්ස් ලීසිං සමාගමද දිගු කාලීන අනුග්‍රාහකයෙක් වශයෙන් කටයුතු කරයි.

### ජෛව විවිධත්වය සුරැකීමට අඛණ්ඩ බැඳී සිටීම

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සහ පරිසර සංරක්ෂණය වෙනුවෙන් පුද්ගලික අංශයේ දායකත්වය ප්‍රවර්ධනය කිරීමට ස්ථාපිත කරන ලද පුද්ගලික අංශය විසින් ක්‍රියාත්මක වන ජාතික වේදිකාවක් වන, ජෛව විවිධත්ව ශ්‍රී ලංකා හි පීපල්ස් ලීසිං 2013 සිට ආයතනික සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

"සොබාදහම සමගින් ව්‍යාපාර අභියෝග තබාගැනීමේ වැදගත්කම" යන තේමාවෙන් "මිහිතල දිනය" තුළ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට අපි බයෝඩයිවර්සිටි ශ්‍රී ලංකා සමග පීපල්ස් ලීසිං හවුල් වූ අතර එය ව්‍යාපාර ප්‍රජාව දැනුවත් කිරීමට බොරැල්ල පීපල්ස් ලීසිං ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. මේ සඳහා විවිධ ව්‍යාපාර ආයතන නියෝජනය කරමින් 40කට වැඩි පිරිසක් සහභාගි විය.

# ස්වාභාවික ප්‍රාග්ධනය



ජෛව විවිධත්ව ශ්‍රී ලංකා ආයතනය සමගින් පාරිසරික වගකීම පිළිබඳ ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමට පීපල්ස් ලීසිං ප්‍රධාන කාර්යාලයේදී "මිහිතල දිනය" සැමරීමට පීපල්ස් ලීසිං විසින් සහයදුන් දැනුවත් කිරීමේ වැඩසටහන

පීපල්ස් ලීසිං විසින් පාරිසරික තිරසාරභාවයට ඇති අභියෝග සහ කාබන් අඩු අනාගතයක් සඳහා හරිත ක්‍රියාමාර්ගය ආවරණය කරමින් උප තේමා හයක් යටතේ පරිසර සංරක්ෂණය පිළිබඳ දරු දැරියන් වෙනුවෙන් "පීඑල්සී හරිත සිතුවම" නමින් දිවයින පුරා පෝස්ටර් චිත්‍ර තරඟයක් පවත්වන ලදී. නිර්මාණ 7,000කට වඩා ලැබුණු අතර සමස්ත ලංකා මට්ටමින් ජයග්‍රහකයින් 96ක් සහ ඔවුන්ගේ දෙමව්පියන් සහභාගි වූ උත්සවයකදී ඇගයීමට ලක් විය. කුසලතා ජයග්‍රාහකයින් 588ක් ද ශාඛා ජාලයේ සහභාගිත්වයෙන් කලාපීය වශයෙන් ඇගයීමට ලක් විය.

සහභාගිත්වය සඳහා සහතිකපත් අනෙකුත් අයදුම්කරුවන් වෙත ඔවුන්ගේ නිර්මාණශීලිබව දිරිගැන්වීම සඳහා පිරිනමන ලදී.



කොළඹ 5 පීපල්ස් ලීසිං ගොඩනැගිලි ශ්‍රවණාගාරයේදී 2020 පෙබරවාරි මසදී පවත්වන ලද පරිසර සංරක්ෂණය සහ කාබන් අඩු අනාගතයක් සඳහා හරිත ක්‍රියා ප්‍රවර්ධනය කිරීමට "පීඑල්සී හරිත සිතුවම" නමින් දීප ව්‍යාප්ත පෝස්ටර් චිත්‍ර තරඟයේ සම්මාන පිරිනැමීමේ උත්සවය සඳහා සහභාගී වූ ජයග්‍රාහී දරු දැරියන්

**"පීපල්ස් ලීසිං සමාගම විසින් පරිසර සංරක්ෂණය, සහභාගී වූ පාර්ශ්වකරුවන් සඳහා මහජන විශ්වාසය දිනාගත් සාමූහික වගකීමක් බවට පත්කරන ලදී."**

"දේශගුණ විපර්යාස යනු මිනිසා ගහකොළ ඇතුළු සමස්ත සත්ත්ව ප්‍රජාව මුහුණ දී ඇති අභියෝගාත්මකම පාරිසරික ප්‍රශ්නය වී ඇති වකවානුවකදී "පීඑල්සී හරිත සිතුවම් 2019" නමින් දීප ව්‍යාප්ත පෝස්ටර් චිත්‍ර තරඟාවලියක් පීපල්ස් ලීසිං සමාගම විසින් සංවිධානය කිරීම ඉතා කාලෝචිත බව මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන් මම සතුටින් සඳහන් කරමි. වගකීම්සහගත අපද්‍රව්‍ය කළමනාකරණය, ජෛව විවිධත්වය රැකීම, අනාගතයේදී බිහිවන හරිත නගර වැනි වැදගත් කේෂ්ත්‍රයන් ආවරණය කරමින් අයදුම්කරුවන් හට සිය වයස් සීමා වලට අනුව යෝග්‍ය මාතෘකා හයක් ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා තිබිණි. පීපල්ස් ලීසිං සමාගම විසින් දරුවන්ගේ හරිත දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ නංවා ගැනීමට මෙන්ම වර්තමාන පාරිසරික ගැටලු වල බරපතලකම වටහා ගැනීමටත් ඒවා සඳහා අනාගත විසඳුම් සංකල්පනය සඳහා දරුවන් දිරිමත් කිරීමටද මෙමඟින් කටයුතු කර ඇත. තිරසරත්වය සඳහා පවතින අභියෝග අවම කිරීමේදී මෙන්ම අනාගතයේදී සිදු කිරීමට සිදුවන හරිත නවෝත්පාදන සඳහා අභිප්‍රේරණයද දරු පරපුරට මෙවැන්නකින් ලබා ගත හැකිය. පාර්ශ්වකරුවන් ගණනාවක් සම්බන්ධ කර ගනිමින් සිදුකරන ලද මෙම වැඩසටහන පීපල්ස් ලීසිං සමාගම විසින් පරිසර සංරක්ෂණය, සහභාගී වූ පාර්ශ්වකරුවන් සඳහා මහජන විශ්වාසය දිනාගත් සාමූහික වගකීමක් බවට පත්කරන ලදී."



**ලක්මිණී රාධිකා**
සහකාර අධ්‍යක්ෂ
පරිසර ආරක්ෂණ ඒකකය
මධ්‍යම පරිසර අධිකාරිය




**"පීඑල්සී හරිත සිතුවම්" සඳහා දිවයින පුරා දරු දැරියන් විසින් එවූ නිර්මාණ 7,000කට වඩා ලැබුණි.**

"සමාධියට සෙවන" යනු බදුල්ල, අලුගොල්ල අක්කර තුනක තෘණ භූමිය යථා තත්ත්වයට පත් කිරීමට පිපල්ස් ලීසිං බදුල්ල ශාඛාව විසින් හවුල්කාරත්වය දක් වූ විවිධ පාර්ශ්වකරුවන් සම්බන්ධ දිගු කාලින රුක්රෝපණ වැඩසටහනකි. මෙම ව්‍යාපෘතිය 2019 නොවැම්බර් මසදී රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන සහ ප්‍රජාවගේ සක්‍රිය සහභාගිත්වය ඇතිව ශාඛාව විසින් පෙරමුණ ගෙන ඇත. එතැන් සිට, බදුල්ල ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් රෝපිත පැලවල ඉහළ අනුපාතයක් සහතික කිරීම සඳහා නිරන්තර පසුවිපරම් සිදු කරනු ලබයි.



"සමාධියට සෙවනක්" 2020 පෙබරවාරි මස බදුල්ල අලුගොල්ල අක්කර තුනක තෘණබිමක පීපල්ස් ලීසිං ශාඛාව විසින් පාර්ශ්වකරුවන් රාශියක් සම්බන්ධ කරගනිමින් දීර්ඝ කාලීන රුක්රෝපණ වැඩසටහන.

## අනාගත දැක්ම

ඉදිරි වසරවලදී, පීපල්ස් ලීසිං විසින් සිය ව්‍යාපාර කටයුතුවලින් විය හැකි පරිසර බලපෑම අවම කිරීමටත් පරිසරය සංරක්ෂණයටත් පහත දෑ සැලසුම් කරයි:

- ගනුදෙනුකාරහවතුන් සඳහා ඉහළ උපදේශන සේවා සමඟ වගකීම්සහගත මූල්‍ය විසඳුම් ප්‍රවර්ධනය පිළිබඳ කාර්යමණ්ඩලයේ හැකියාව තවදුරටත් ගොඩනැගීම
- අවශ්‍ය තාක්ෂණික අභිවර්ධනයන් තුළ ආයෝජනය සහ තිරසාර සම්පත් ප්‍රශස්ථකරණය ඉදිරියට ගෙන යාමට දැනට සමාගම සතු පාරිසරික කළමනාකරණ පද්ධතිය වර්ධනය කිරීම.
- වගකීම්සහගත මූල්‍යකරණය සහ කාබන් අඩු අනාගතයක් සඳහා දේශගුණ සුහුරු මූල්‍ය සේවා ලබා දීම සඳහා කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය සහ කුසලතා වැඩි කිරීම.
- වඩාත් ක්‍රමෝපායික හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් සහ SDGs අභිවර්ධනය සඳහා සහය වෙමින් කාබන් අඩු ආර්ථිකයක් කරා රටක් වශයෙන් ඉදිරියට යාමට ක්‍රමෝපායික ජාතික ප්‍රමුඛතාවන් හි අඛණ්ඩ ආයෝජනය.

# උසස් ඩිජිටල් ආකාරයෙන් සේවය කරන ව්‍යාපාර අවස්ථා

ඩිජිටල් යටිතල පහසුකම්වල අපගේ විස්තීර්ණ ආයෝජන සහ ඩිජිටල් අවකාශ තුළින් මෙහෙයුම් කරගෙන යාම අපගේ කොවිඩ්-19 ප්‍රතිචාරයට ඉහළින් පහසුකම් සලකන ලදී.



## කළමනාකාරිත්වය


**68**
අධ්‍යක්ෂ මණ්ඩලය

**72**
ආයතනික කළමනාකරණය

**75**
අනුකූලතා කළමනාකරණය

**77**
ආයතනික පාලනය

**112**
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

**118**
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

**120**
පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව

**122**
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

**124**
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

**127**
අවදානම් කළමනාකරණය

# අධ්‍යක්ෂ මණ්ඩලය





**සුජීව රාජපක්ෂ මහතා**

**සභාපති – විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ**

සුජීව රාජපක්ෂ මහතා 2020 පෙබරවාරි මස 19 වන දින සමාගමේ සභාපති ලෙස පත්කරන ලදී.

**සුදුසුකම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (FCA) අධි සාමාජිකත්වය මෙන්ම ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (FCMA) අධි සාමාජිකත්වය ලබා ඇත. රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ව්‍යාපාර පරිපාලනය (MBA) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි.

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

දශක හතරකට ආසන්න කාලයක් පුරා ඔහුගේ වෘත්තිය මාර්ගය තුළ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CA Sri Lanka), සභාපති, උප සභාපති සහ සභා සාමාජික යන ගෞරවනීය තනතුරු දරා ඇති අතර CA Sri Lanka හි විගණන ප්‍රමිති කමිටුවේ හිටපු සභාපතිවරයාද විය. ශ්‍රී ලංකා වෘත්තිය ගණකාධිකාරිවරුන්ගේ සංසදයේ සභාපති, ශ්‍රී ලංකා ක්‍රිකට් හි භාණ්ඩාගාරික, 2011 ක්‍රිකට් ලෝක ශූරතාවය සඳහා භාණ්ඩාගාරික, දකුණු ආසියාතික ගණකාධිකාරීන්ගේ සංසදයේ (SAFA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ තාක්ෂණික උපදේශක, ආසියා පැසිෆික් ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ (CAPA) තාක්ෂණික උපදේශක යන තනතුරු දරා ඇත. එමෙන්ම ඔහු නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී., එන්.ඩී.බී. කැපිටල් ලිමිටඩ් – බංග්ලාදේශය සහ ද ෆිනෑන්ස් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කර ඇත.

**දැනට දරන තනතුරු**

සුජීව රාජපක්ෂ මහතා ලෝකයේ පස්වන විශාලම ගිණුම්කරණ ජාලය වන BDO හි දේශීය නියෝජිතයා වන BDO පාට්නර්ස් කළමනාකරණ හවුල්කරුවෙකි. වර්තමානයේ ඔහු මහජන බැංකුවේ සභාපති, හේකාබ් පී.එල්.සී., ඩිප්ඩ් ප්‍රොඩක්ට් පී.එල්.සී., හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්, යුනි ඩිල් පැකේජින් ලිමිටඩ්, යුනි ඩිල් පැකේජින් ඇන්ඩ් සොලුෂන්ස් ලිමිටඩ් හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ සහ සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. හි නියෝජ්‍ය සභාපති ලෙසද කටයුතු කරයි. රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සභා සාමාජිකයෙක් වන අතර, ලන්කන් අලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් – බංග්ලාදේශය හි අධ්‍යක්ෂවරයෙක් ද වේ.

ඔහුගේ ප්‍රවීණත්වයට සියලුම ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සහ පරිචයන්, මූල්‍ය විනය සහ සදාචාරවලට අදාළ රජයේ රෙගුලාසි, රාජ්‍ය සහ පුද්ගලික අංශයේ මානව සම්පත් කළමනාකරණය සහ සමස්ත කළමනාකරණ ව්‍යවහාර සහ මූලධර්ම ඇතුළත්ය.



**රොහාන් පතිරගේ මහතා**

**විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ**

රොහාන් පතිරගේ මහතා 2019 ජූලි මස 10 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලදී.

**සුදුසුකම්**

නීතිඥයෙක් වන පතිරගේ මහතාට කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධියක් සහ නවසීලන්තයේ මැසේ විශ්ව විද්‍යාලයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද සතු වේ. එමෙන්ම ඔහුට බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද ඇත.

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

මහජන බැංකුවට අදාළ මානව සම්පත්, නීති සහ පරිපාලනය පිළිබඳ වසර 24ක පළපුරුද්ද ඔහුට ඇත. මෙයට පෙර මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුර 2010 අගෝස්තු සිට 2019 මාර්තු දක්වා දරන ලදී. පතිරගේ මහතා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි විවිධ අනුකමිටුවලට අදාළ සියලුම කරුණුවලදී පරිපාලන සහය ලබා දී ඇත. මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුර දරන කාලය තුළ, ඔහු යහපාලනය පිළිබඳ මනා ව්‍යවහාර ඇති කිරීමට ප්‍රධාන කාර්යභාරයක් ඉටුකර ඇත.

**දැනට දරන තනතුරු**

පතිරගේ මහතා වර්තමානයේ මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා නීති) වේ. ඔහුගේ වෘත්තීය කාර්භාරය තුළ, බැංකුවේ 10,000ට වැඩි ශක්තිමත් ශ්‍රමබලකාය පාලනය කරමින් එහි මානව සම්පත් අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් බැංකුවේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී බඳවාගැනීම් කළමනාකරණය කරයි. ඊට අමතරව, බැංකුවේ නීති කණ්ඩායමේ සාමාජිකයින් 70 මෙහෙයවනු ලබයි. සභාපති – පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්, අධ්‍යක්ෂ – පීපල්ස් මයික්‍රෝකොමර්ස් ලිමිටඩ්, අධ්‍යක්ෂ – ලන්කන් අලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් – බංග්ලාදේශය, යන තනතුරු ද හොබවයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය



**අසාම් ඒ අහමට්**

**විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ**

අසාම් ඒ අහමට් මහතා 2019 දෙසැම්බර් මස පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කරන ලදී.

**සුදුසුකම්**

ඔහු වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) අධි සාමාජිකයෙක් මෙන්ම වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) අධි සාමාජිකයෙක්ද වේ. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක්ද වේ. ඔහු අවදානම් කළමනාකරණ ආයතනයේ (එක්සත් රාජධානිය) තාක්ෂණික විශේෂඥයෙකු මෙන්ම සහතිකලත් වෘත්තිය ගණකාධිකාරිවරයෙකි (AUST.) ඔහු වරලත් සුරැකුම් හා ආයෝජන ආයතනයේ (එක්සත් රාජධානිය) සාමාජිකයෙක්ද වේ.

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

අහමට් මහතාට දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ක්‍රමෝපායික මූල්‍ය කළමනාකරණය, විකල්ප ආයෝජන සහ අවදානම පිළිබඳ වසර 18කට ආසන්න පළපුරුද්ද ඇත. ඔහුගේ පෙර සේවායෝජකයින්ට මහාපරිමාණ බහුජාතික සමාගම් සහ මූලික ප්‍රාග්ධන සේවා සම්පාදකයන් රැසක් ඇතුළත් වේ.

**දැනට දරන තනතුරු**

අහමට් මහතා 2017 ජනවාරි මස 3 වන දින සිට මහජන බැංකුවේ මූල්‍ය ප්‍රධානී ලෙස කටයුතු කරයි. ඔහු – ලන්කන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් – බංගලාදේශය හි අධ්‍යක්ෂවරයෙකි.



**සුදර්ශන් අහංගම මහතා**

**විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ**

සුදර්ශන් අහංගම මහතා 2020 පෙබරවාරි මස 19 වන දින අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලදී.

**සුදුසුකම්**

සුදර්ශන් අහංගම මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකි.

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

පසුගිය වසර 15 තුළ MAS හෝල්ඩින්ග්ස් අධ්‍යක්ෂ මණ්ඩලයේ සමූහ මූල්‍ය අධ්‍යක්ෂ ලෙස ඔහු කටයුතු කර ඇත. විවිධ කලාපයන් තුළ රටවල් 17 ක මූල්‍ය කාර්යයන් සඳහා වගකීම ඔහු සතු විය. ඒකාබද්ධ කිරීම් සහ අත්කරගැනීම්, දේශසීමා අතර ගනුදෙනු, ව්‍යාපාර ප්‍රාග්ධන ආයෝජන සහ ආයතනික ව්‍යුහගත කාර්යය තුළ පරිපූර්ණ පළපුරුද්ද ඔහුට ඇති අතර, සමූහය වෙනුවෙන් මූල්‍යකරණය තුළ ඔහුගේ කාර්යභාරයට අමතරව මෙම කාර්යයන් මෙහෙයවා ඇත.

මෙයට පෙර ඔහු වසර 14ක කාලසීමාවක් සඳහා ජෝන් කීල්ස් සමූහය සමඟ සේවය කර ඇත. ඔහු ජෝන් කීල්ස් කොටස් තැරැව්කරුවන්ගේ කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස සේවය කර ඇති අතර ජෝන් කීල්ස් සමූහයේ මූල්‍ය සේවා මණ්ඩල කිහිපයක සාමාජිකයෙක් ද විය. එමෙන්ම ඔහු ජෝන් කීල්ස් හි මෘදුකාංග බාහිරින් ලබාගැනීම සහ එයට අදාළ කටයුතු සැකසීම සඳහා වගකීමට ද බැඳී තිබුණි.

**දැනට දරන තනතුරු**

අධ්‍යක්ෂ – මහජන බැංකුව, අධ්‍යක්ෂ – ලන්කන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් – බංගලාදේශය සහ MAS සමූහයේ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවලද කටයුතු කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## ක්ලයිව් ෆොන්සේකා

**විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ**

ක්ලයිව් ෆොන්සේකා මහතා 2020 පෙබරවාරි මස 19 වන දින අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලදී.

### සුදුසුකම්

ක්ලයිව් ෆොන්සේකා මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක්ද වේ. ACI ඩීලින්ග් ස්ර්ටිෆිකට් විභාගයේදී විශිෂ්ට සාමාර්ථයක් ලබා ඇත. එමෙන්ම ඔහු ඕස්ට්‍රේලියාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහතිකලත් (CMA) සාමාජිකයෙකි.

### කලින් දැරූ තනතුරු/පළපුරුද්ද

භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳ වසර 26 කට වැඩි පළපුරුද්ද ඔහු සතුවේ. 2002 දී මහජන බැංකුවට එක්වීමට පෙර, ඔහු ඇමෙරිකන් එක්ස්ප්‍රස් බැංකුව සහ ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ සේවය කර ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ IABF/DABF විභාග සඳහා බැංකුකරුවන්ගේ ආයතනයේ ප්‍රධාන පරීක්ෂකවරයෙක් ලෙසද සේවය කර ඇත.

### දැනට දරන තනතුරු

ඔහු දැනට මහජන බැකුවේ භාණ්ඩාගාර සහ ආයෝජන බැංකුකරණ ප්‍රධානී ලෙස කටයුතු කරයි. 2018 ජූලි මස ප්‍රාථමික වෙළෙඳුන්ගේ සංගමයේ සභාපති ලෙස පත්කරන ලද අතර, වර්තමානයේ මෙම තනතුරේ කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික ගෙවීම් සභාවේ සහ මූල්‍ය පද්ධති ස්ථාවර උපදේශන කමිටුවේ සාමාජිකයෙකි. ඔහු පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් හි සභාපතිවරයා වේ.



## චනුර විජේතිලක මහතා

**විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ**

චනුර විජේතිලක මහතා 2020 පෙබරවාරි මස 19 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලදී.

### සුදුසුකම්

විජේතිලක මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර ජාත්‍යන්තර වෘත්තීය කළමනාකරුවන්ගේ සංගමයේ (UK) ආශ්‍රිත සාමාජිකයෙක්ද වේ. එමෙන්ම ඔහු ඉන්දියාවේ ICFAI විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ලබාගෙන ඇත.

### කලින් දැරූ තනතුරු/පළපුරුද්ද

චනුර විජේතිලක මහතාට බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 35කට අධික පළපුරුද්ද ඇත. එයින් වසර 14ක් ණයදීම, අනුකූලතාව සහ ශාඛා පරිපාලනය යන ක්ෂේත්‍ර ආවරණය කරමින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ ආයතනික කළමනාකරණය තුළ කටයුතු කර ඇත. ඔහු බැංකුවේ අවදානම් පදනම් අනුකූලතා රාමුව සහ අවදානම පදනම් අනුකූලතා විගණන පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී මූලික වී ඇත.

තවද, ඔහු වසර 5 කට වැඩි කාලයක් බැංකුවේ විශාලතම කලාප 2ක් තුළ විකුණුම් සහ ලාභ වර්ධනය උපරිම කිරීමට ක්‍රමෝපායන් සාර්ථකව සංවර්ධනය කර ක්‍රියාත්මක කර ඇත. ණය ලබාදීම පිළිබඳ ශාඛා කළමනාකරුවන් සහ ණය නිලධාරීන් වෙනුවෙන් පවත්වන පුහුණු වැඩසටහන් සඳහා බැංකුවේ අභ්‍යන්තර සම්පත් පහසුකමේ සාමාජිකයෙක් ද වේ.

ඔහු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ඔහුගේ දීර්ඝ කාලීන වෘත්තිය තුළ සිංගප්පූරුව, බංග්ලාදේශය, චීනය සහ ජර්මනිය යන රටවල බැංකුව නියෝජනය කරමින් පුහුණු වැඩසටහන් ගණනාවකට සහභාගි වී ඇත. එමෙන්ම ඔහු කොමර්ෂල් බැංකුව වෙතින් විශ්‍රාම ගැනීමෙන් පසු සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී.එල්.සී. හි සහකාර සාමාන්‍යාධිකාරී – අනුකූලතා ලෙස කටයුතු කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## අශෝක බණ්ඩාර මහතා

**විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ**

අශෝක බණ්ඩාර මහතා 2020 පෙබරවාරි මස 19 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලදී.

**සුදුසුකම්**

ඔහු අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (CIM-UK), සහ MBA (කොළඹ විශ්ව විද්‍යාලය) උසුලයි.

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

අශෝක බණ්ඩාර මහතාට බහුජාතික සමාගම්වල සහ ප්‍රමුඛ පෙළේ දේශීය ආයතනවල ඉල්ලුම උත්පාදන කාර්යය සහ ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ වසර 30කට අධික පළපුරුද්ද ඇත. ඔහු නෙස්ලේ ලංකා පී.එල්.සී. හි MANCOM සාමාජිකයෙක් වූ අතර ඩෙල්මේජ් ෆෝසයිත් සමූහ සමාගම්වල සමූහ කළමනාකාර අධ්‍යක්ෂවරයාද විය. ඔහුගේ ප්‍රධාන දක්ෂතාවන්ට සන්නාම සහිත ව්‍යාපාර ගොඩ නැගීම සහ වාණිජමය නියමයන් සංවර්ධනය ඇතුළත් වේ.

**දැනට දරන තනතුරු**

ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්, ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්, බිල්ඩ්මාර්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ වේ. දැනට ප්‍රධාන පෙළේ දේශීය සම්පිණ්ඩිත සමාගම සඳහා කළමනාකරණ උපදේශන සේවා ක්‍රියාත්මක කරයි. පුහුණුකරුවෙක් ලෙස, කණ්ඩායම් නායකත්වය සංවර්ධනය කිරීම සහ පුද්ගල සංවර්ධනය පිළිබඳ විශේෂත්වයක් දක්වන අතර, නායකත්වය, ක්‍රමෝපායික කළමනාකරණය සහ උසස් අලෙවිකරණය සහ විකුණුම් කළමනාකරණය වැනි මාතෘකා පිළිබඳ MBA ඉගැන්වීම් හරහා ඔහුගේ දැනුම බෙදාගනී. ඔහුගේ ගැටලු කළමනාකරණ කුසලතා යොදාගනිමින් ප්‍රධාන පෙළේ කර්මාන්ත ආයතන එදිරිව ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර ප්‍රධාන මැදිහත්කරුවකු වශයෙන් කටයුතු කරයි.



## කොරලි පීටරස් මහත්මිය

**විධායක නොවන ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂිකා**

කොරලි පීටර්ස් මහත්මිය 2020 පෙබරවාරි මස 19 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලදී.

පත්වීමේ බලාත්මක දිනය 2020 මාර්තු මස 1 දින වේ.

**සුදුසුකම්**

කොරලි පීටර්ස් මහත්මිය එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවක් ද වේ. සසෙක්ස් විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් මෙන්ම එඩින්බර්ග් හැරියට්-වොට් විශ්ව විද්‍යාලයේ MBA උපාධිය ද ඇය සතු වේ.

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

කොරලි පීටර්ස් මහත්මිය ෆින්ලේ කලම්බු ලිමිටඩ්, හපුගස්තැන්න ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. සහ උඩපුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. හි මූල්‍ය අධ්‍යක්ෂිකාව ලෙස කටයුතු කර ඇත.

**දැනට දරන තනතුරු**

සෙලාන් බැංකුව පී.එල්.සී. සහ බෝගල ග්‍රැෆයිට් ලංකා පී.එල්.සී., කොම්පාස් ඇඩ්වසරි සර්විසස් පී.එල්.සී. සහ තම්බපණ්නි ඇකඩමික් පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අධ්‍යක්ෂ මණ්ඩල වල ඇය ස්වාධීන අධ්‍යක්ෂිකාවක් ලෙස කටයුතු කරයි. එමෙන්ම ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සභාවේ සාමාජිකාවකි.



## ලක්මිණි දිල්රුක්ෂි කෝට්ටේගොඩ මහත්මිය

**සමාගම් ලේකම්**

ලක්මිණි කෝට්ටේගොඩ මහත්මිය 2018 ජූලි මස 30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට සමාගමේ ලේකම් ලෙස පත්කරන ලදී.

**සුදුසුකම්**

නීතිය පිළිබඳ උපාධිය සහිත නීතිඥවරියකි.

**දැනට දරන තනතුරු**

පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සහ පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හී සමාගම් ලේකම් ලෙස කටයුතු කරයි.

* 2020 ජූලි මස 8 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය

# ආයතනික කළමනාකරණය





**සබ්‍රි
ඊබ්‍රහිම් මහතා**

**ප්‍රධාන විධායක
නිලධාරී/සාමාන්‍යාධිකාරී**

ඊබ්‍රහිම් මහතා 2017 ජූලි මස පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ලෙස පත් කරන ලදී.

**සුදුසුකම්**

ගෞරව උපාධිය (BSc) (කොළඹ), FCIB (එක්සත් රාජධානිය),

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

මෙයට පෙර මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, තොග බැංකුකරණය (2016 ඔක්තෝබර් සිට 2016 සැප්තැම්බර් මස දක්වා) සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, අවදානම් කළමනාකරණ (2007 අගෝස්තු මස සිට 2014 ඔක්තෝබර් මස දක්වා) යන තනතුරු දරා ඇත. හැටන් නැෂනල් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, භාණ්ඩාගාර ප්‍රධානී, ආයතන බැංකුකරණ සහ අයකිරීම් ප්‍රධානී, ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන ණය නිලධාරී (2004 සිට 2007 ජූලි මස දක්වා). ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුවේ ණය ප්‍රධානී සහ GSAM (2002 සිට 2004) එච්එන්බී සිකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ (2005 සිට 2007) සහ පීපල්ස් මර්චන්ට් බැන්ක් පී.එල්.සී. (2009 සිට 2011)

**පළපුරුද්ද**

ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර කළමනාකරණය සහ අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි 37 වසරක බැංකුකරණ පළපුරුද්ද ඇත.

**දැනට දරන තනතුරු**

පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., පීපල්ස් මයික්‍රෝ කොමර්ස් එල්.ටී.ඩී., පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සහ ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ.



**සංජීව
බණ්ඩාරනායක මහතා**

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**

බණ්ඩාරනායක මහතා 2007 ජූලි මස පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා එක්වී ඇත.

**සුදුසුකම්**

FCA, FCMA (ශ්‍රී ලංකාව), FCMA (ඕස්ට්‍රේලියාව), CIMA අවසන් අදියර (එක්සත් රාජධානිය),

**කලින් දැරූ තනතුරු/පළපුරුද්ද**

ආසියානු මූල්‍ය සේවා සංගමයේ (AFSA) උප සභාපති, ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු කමිටු සාමාජික සහ ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ (SLICM) හිටපු සභා සාමාජික, පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. හි හිටපු ප්‍රධාන විධායක නිලධාරී.

**පළපුරුද්ද**

මූල්‍ය ක්ෂේත්‍රය තුළ ඉතා ඉහළ මට්ටමක වසර 26 ක පශ්චාත් සුදුසුකම්ලත් පළපුරුද්ද.

**දැනට දරන තනතුරු**

ශ්‍රී ලංකා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමයේ සභාපති, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ෆයිනෑන්ස් හවුස් ඇසෝසියේෂන් හි සභා සාමාජික, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ, මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථාවර උපදේශක කමිටුවේ සාමාජික.



**ලයනල්
ප්‍රනාන්දු මහතා**

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**

ප්‍රනාන්දු මහතා 1995 දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා එක්වී ඇති අතර, පීපල්ස් ලීසිං සමස්ත සේවාකාලය තුළ, මෙහෙයුම් කටයුතුවල නිරත විය. පීපල්ස් ලීසිං හා එක්වීමට පෙර ඔහු මහජන බැංකුවේ සේවය කළේය.

**සුදුසුකම්**

ACA, AIB (ශ්‍රී ලංකාව), ACMA (ශ්‍රී ලංකාව). ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (CA ශ්‍රී ලංකා).

**පළපුරුද්ද**

බැංකුකරණය සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ වසර 31කට අධික පළපුරුද්ද.

**දැනට දරන තනතුරු**

පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී, ජාතික දුම්රිය කෞතුකාගාර (ඇප) සමාගමේ අධ්‍යක්ෂ, අල්-සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ප්‍රධානී. රන්ණය මෙහෙයුම් පාලනය.

# ආයතනික කළමනාකරණය



## රොහාන් තෙන්නකෝන් මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ අවදානම් සහ පාලනය**

රොහාන් තෙන්නකොන් මහතා 1998 දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා එක් වී ඇත.

**සුදුසුකම්**

MBA (කොළඹ), MSc (කළමනාකරණ) (ශ්‍රී ජයවර්ධනපුර), BSc – ව්‍යාපාර පරිපාලන (2 වන පන්තිය ඉහළ/ ශ්‍රී ජයවර්ධනපුර), AIB (ශ්‍රී ලංකාව) සහ APBSL සාමාජික, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික සහතිකපත්ධාරියෙකු වේ.

**කලින් දරූ තනතුරු**

අඛණ්ඩව වසර හයක් SLIM – NASCO හි ජූරි සභාවේ සේවය කරන ලදී.

**පළපුරුද්ද**

කල්බදු අංශය සමග එකතුවීමට පෙර ගිණුම්කරණය, නිෂ්පාදනය, අපනයනය සහ බැංකුකරණය වැනි විවිධ ක්ෂේත්‍රයන් හි වසර 30ක පළපුරුද්ද, අලෙවිකරණය සහ ව්‍යාපාර සංවර්ධනය, ශාඛා මෙහෙයුම්, ණය සහ වර්තමානයේ අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුවේ පළපුරුද්ද, ඉස්ලාමීය මූල්‍ය සේවා ප්‍රධානී ලෙස කටයුතු කිරීම හා මූල්‍ය ඔම්බුඩ්ස්මන් හි බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමයේ නියෝජිතයකු ලෙස පෙනී සිටීම.

**දැනට දරන තනතුරු**

ශ්‍රී ලංකා ෆයිනෑන්ස් හවුස් ඇසෝසියේෂන් හි කළමනාකරණ සභාවේ සමාගමේ නියෝජනය සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අනුකූලතා නිලධාරී.



## දමිත් මලවිතන්තිල මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අයකිරීම් සහ පරිපාලනය**

මලවිතන්තිල මහතා 1996 දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා එක් වී ඇති අතර, වසර 10ක කාලයක් අයකරගැනීම් ප්‍රධානී ලෙස කටයුතු කරන ලදී.

**සුදුසුකම්**

CA ශ්‍රී ලංකා හි අවසන් අදියර සහ IBSL හි අන්තර්මාධ්‍ය අදියර සපුරා ඇත.

**පළපුරුද්ද**

බැංකුකරණය සහ මූල්‍යකරණය පිළිබඳ වසර 35කට අධික පළපුරුද්ද සහ විගණනය සහ ගිණුම්කරණය පිළිබඳ වසර ගණනක පළපුරුද්ද. පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී ලෙස වසර 8කට අධික කාලයක් සේවය කර ඇත. එමෙන්ම, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි වසර 10ක කාලයක් අයකිරීම් ප්‍රධානී ලෙස සේවය කළ අතර පසුව 2007 දී ශාඛා මෙහෙයුම් අංශයට එකතු වී දිවයින පුරා ආවරණය කරමින් ශාඛා මෙහෙයවන ලදී. වර්තමානයේ අයකරගැනීම් සහ පරිපාලන ප්‍රධානී ලෙස කටයුතු කරයි.

**දැනට දරන තනතුරු**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි පූර්ණ හිමිකාරීත්වයක් පවතින පරිපාලිත සමාගමක් වන පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරයි.



## ලක්සඳ ගුණවර්ධන මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අලෙවිකරණය**

ගුණවර්ධන මහතා 2002 දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා එක් වී ඇති අතර, වසර 10ක කාලයක් ආයතනික කල්බදු ප්‍රධානී ලෙස කටයුතු කරන ලදී.

**සුදුසුකම්**

MBA, MSc (ක්‍රමෝපායික කළමනාකරණය පිළිබඳ), AICM-SL, SLICM වෙතින් ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, CMA (ඕස්ට්‍රේලියාව), CPM (ආසියාව), SLIM හි සහතිකලත් සාමාජික, SLID සාමාජික, CPM ශ්‍රී ලංකා සාමාජික.

**පළපුරුද්ද**

ණය, අලෙවිකරණය. අයකරගැනීම්, ශාඛා සංවර්ධනය, සහ මෙහෙයුම් යන ක්ෂේත්‍රවල ආයතනික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අරමුදල්කරණය තුළ වසර 25කට අධික පළපුරුද්ද.

**දැනට දරන තනතුරු**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි පූර්ණ හිමිකාරීත්වයක් පවතින පරිපාලිත සමාගමක් වන පීපල්ස් මයික්‍රෝ කොමර්ස් එල්.ටී.ඩී. හි අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරයි.

# ආයතනික කළමනාකරණය





**ප්‍රභාත් ගුණසේන මහතා**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – තොරතුරු සන්නිවේදනය තාක්ෂණ (ICT) (සමූහය)**

ප්‍රභාත් ගුණසේන මහතා 1999 දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා එක් වී ඇති අතර, වසර 21 ක කාලයක් තොරතුරු සන්නිවේදනය තාක්ෂණ ප්‍රධානී ලෙස කටයුතු කරන ලදී.

**සුදුසුකම්**

MBA (බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලය), පරිගණක පද්ධති සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාව – NIBM (ශ්‍රී ලංකාව), තොරතුරු පද්ධති සඳහා ව්‍යාපෘති කළමනාකරණය, පද්ධති විද්‍යා ආයතනය, සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලය, බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජික.

**පළපුරුද්ද**

පීපල්ස් ලීසිං සමූහය තුළ වසර 21 කට අධික පළපුරුද්ද.



**උදේශ් ගුණවර්ධන මහතා**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අභ්‍යන්තර විගණන**

උදේශ් ගුණවර්ධන මහතා 1999 දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා එක් වී ඇත.

**සුදුසුකම්**

ACA, ACMA (ශ්‍රී ලංකාව), IPFM හි ආශ්‍රිත සාමාජික (එක්සත් රාජධානිය), IIA හි සාමාජික, භාණ්ඩාගාර, ආයෝජන සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (IBSL).

**කලින් දැරූ තනතුරු**

අනුයුක්ත පදනම මත ලංකන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් – බංග්ලාදේශය ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ සමාගම් ලේකම් ලෙස සේවය කර ඇත.

**පළපුරුද්ද**

ගිණුම්කරණය, විගණනය, මූල්‍ය කළමනාකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ විශේෂ අවධාරණය සහිතව මූල්‍යකරණ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටම්වල වසර 20කට අධික පළපුරුද්ද.

**වෙනත් තනතුරු**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.



**රනිල් පෙරේරා මහතා**

**සහකාර සාමාන්‍යාධිකාරී – අයකරගැනීම්**

රනිල් පෙරේරා මහතාට පීපල්ස් ලීසිං සමූහය තුළ වසර 20 කට අධික පළපුරුද්ද ඇත.

**සුදුසුකම්**

කලාපීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කොළඹ), MBA (මනිපාල්), ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ), වාණිජවේදී (විශේෂ) ජාත්‍යන්තර වෙළෙඳාම (ශ්‍රී ජයවර්ධනපුර), CIM (එක්සත් රාජධානිය) සහ CA ශ්‍රී ලංකා හි අර්ධ සුදුසුකම්.


ආයතනික කළමනාකරණය සහ කළමනාකරණ කණ්ඩායම පිළිබඳ වැඩිදුර තොරතුරු මාර්ගගතව ලබාගත හැක

ආයතනික කළමනාකරණය
https://www.plc.lk/index.php/en/about/management/corporate-management

කළමනාකරණ කණ්ඩායම
https://www.plc.lk/index.php/en/about/management/senior-management

# අනුකූලතා කළමනාකරණය

අනුකූලතා කළමනාකරණය හෝ අනුකූලතා අවදානම් කළමනාකරණය යනු ආයතනයට අදාළ වන්නා වූ නීති, රෙගුලාසි, ප්‍රමිති, ප්‍රතිපත්ති සහ චර්යා සංග්‍රහයන් අප විසින් පිළිපදින ආකාරයයි.

අභ්‍යන්තර ප්‍රතිපත්ති රෙගුලාසි, නීති හෝ ක්ෂේත්‍රයේ ප්‍රමිති මගින් දක්වා ඇති නියමයන් සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව සකස් කෙරේ. මෙය කාර්යක්ෂම කිරීම සඳහා, අනුකූලතා දෙපාර්තමේන්තුව අනුකූල නොවීම හා බැඳුණු අවදානම් අඩු කිරීමට ඒවා හඳුනාගෙන, කළමනාකරණය කර නියාමනය කරයි. අපගේ ප්‍රතිපත්තිවලින් නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම සඳහා අපව වඩාත් හොඳින් සූදානම් කිරීම පිණිස, මූල්‍යමය, පාරිසරිකමය, තොරතුරු සහ දත්ත ආරක්ෂාව, සේවක සම්බන්ධතා සහ අනෙකුත් ව්‍යාපාර කටයුතු තුළ හිතකර, සදාචාර සහ ආරක්ෂිත හැසිරීම් සඳහා පෙළඹවීම් ඇති කරයි.

ඒ අනුව, අනුකූලතාව පිළිබඳ වඩා පුළුල් දැක්මක් සඳහා අවශ්‍යතාවට අපි එකඟවන අතර අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළට අනුකූලතා අවදානම් නිරාවරණය ඇතුළත් කර ඇත.

## අනුකූලතා සංස්කෘතිය

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි, අපගේ කාර්ය මණ්ඩලය සමාගමේ කීර්තිනාමය ආරක්ෂා කර පෝෂණය කිරීමට කැපවී සිටින අතර, සදාචාර, අවංකකම, විනිවිදභාවය සහ වගවීම තුළ සෑම දිනකම සෑම අවස්ථාවකම කටයුතු කරයි.

සමාලෝචිත වසර තුළ, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටියන්ට බොහෝ වෙනස්වීම් කළ අතර ඒවා වෙනස්වන ව්‍යාපාර පරිසරය සමඟ ක්‍රියාත්මක කර ඇත. අපගේ අනුකූලතා පදනම් සංස්කෘතිය මෙවැනි වෙනස්වීම් මහත් කැමැත්තෙන් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට සහ ඒ අනුව ඒවා යොදා ගැනීමට සේවකයින්ගේ කැමැත්ත තුළින් පිළිබිඹු කෙරේ. එමෙන්ම, අපගේ ව්‍යාපාර චර්යා සංග්‍රහය සහ සදාචාර තුළින් සියලුම නීති, නියමයන් සහ රෙගුලාසිවලට අනුකූලවීම නියම කරයි. මෙම අනුකූලතා සංස්කෘතිය සේවකයින්ගේ එදිනෙදා කාර්යයන් ඉටු කිරීමේදී තම වගකීමේ හිමිකාරත්වය ගැනීමට සහ ව්‍යාපාරයට වර්තමානයේ අදාළ වන්නා වූ සියලුම නීති හා රෙගුලාසිවලට අනුකූලවීමට හේතු වේ.

අනුකූල නොවීමේ යම් අවස්ථා සඳහා සමාලෝචිත වසර තුළ නියාමකයින් විසින් ක්‍රියාත්මක කළ කිසිදු දඩයකට යටත් වී නොමැති බවට වාර්තාවක් සමාගම අඛණ්ඩව පවත්වා ගනී.

## අනුකූලතා කාර්යය

අනුකූලතා නිලධාරී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත සෘජුවම වාර්තා කරන අතර, එම කමිටුව සමාගමේ ව්‍යාපාර හෝ අනෙකුත් සහය කාර්යයන්ගෙන් සැලකියයුතු ඉහළ මට්ටමක ස්වාධීනත්වය සහතික කරයි.

සමාලෝචිත වසර තුළ, අනුකූලතා නිලධාරී එහි එක් එක් රැස්වීමේදී සමාගමේ අනුකූලතාව පිළිබඳ තත්ත්වය සම්බන්ධව තත්ත්ව වාර්තා ඉදිරිපත් කරන ලදී.

අපගේ සාකල්‍ය ප්‍රවේශය මූලික සංරචක හයක් කෙරෙහි අවධානය යොමු කරයි. ඒවානම් ශක්තිමත් අනුකූලතා සංස්කෘතිය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, පුහුණුව සහ සන්නිවේදනය, ප්‍රධාන ක්‍රියාවලි, සමාලෝචනය සහ නියාමනය සහ ආයතනය තුළ එකතුකර ඇති අනුකූලතා වගකීම් සහිත සංසක්ති සහ කාර්යක්ෂම අනුකූලතාවයක් සාමුහිකව ලබාදෙන අවශ්‍ය සම්පත් වේ.

ප්‍රධාන අනුකූලතා අවශ්‍යතා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ නියාමනයට යටත් කෙරේ. සමාගම අනුකූලතාව නියාමනය සඳහා අදාළ නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාව සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කර ඇත. අනුකූලතා දෙපාර්තමේන්තු සහ අනෙකුත් දෙපාර්තමේන්තු කිහිපයක් මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ කෙරේ. එය දැනුම යාවත් කිරීම, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාලෝචනය සහ නියාමනය, පුහුණුව, සන්නිවේදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්ථාවර චක්‍රයකි.




අප මූල්‍ය සමාගමක් බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපව නියාමනය කරන අතර, අප ලැයිස්තුගත සමාගමක් බැවින්, කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම්පත හා විනිමය කොමිෂන් සභාව විසින් අපව නියාමනය කරයි. මෙම නියාමන බලධාරීන් විසින් නිකුත් කරන රෙගුලාසි සමඟ නිසි අනුකූලතාව සහතික කිරීමේදී. උපදෙස් සහ මාර්ගෝපදේශ අනුකූලතා දෙපාර්තමේන්තුවේ වැදගත් කාර්යයක් සකස් කරයි.

සමාගමේ එක් එක් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර ප්‍රතිපත්ති, චක්‍රලේඛ, මාර්ගෝපදේශ, නියාමන උපදෙස් හා මඟපෙන්වීම් මෙන්ම අදාළ දේශීය නීති අනුගමනය කරන බවට සහතික වීම සඳහා වගකීමට බැඳී සිටී. එක් එක් කාර්තුව අවසානයේදී අනුකූලතාව පිළිබඳ සහතික කිරීමක් ඔවුන් විසින් ලබාදිය යුතු අතර යම් ප්‍රතිපත්ති උල්ලංඝන සහ නීති/රෙගුලාසි කඩකිරීම් IRMC වෙත වාර්තා කෙරේ.

අභ්‍යන්තර විගණනය නිරන්තරව අවශ්‍ය විමර්ෂණ කටයුතු සිදුකර, අනුකූලතාව නියාමනය කරමින්, මාර්ගගත පරීක්ෂණ ඇතුළුව සසම්භාවී පරීක්ෂණ කරනු ලබයි.

මෙම කටයුතුවලට අදාළ නිර්දේශ අදාළ අංශ ප්‍රධානීන් විසින් ක්‍රියාත්මක කරනු ලබයි. විනය ක්‍රියාවකට හේතුවන නිර්දේශ සම්බන්ධයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරයි. මෙම ක්‍රියාවලි සම්පූර්ණ අනුකූලතා කළමනාකරණ ක්‍රමයක් පිළිබඳ සංකල්පයට අනුව සමීපව එකිනෙකට සම්බන්ධ කෙරේ.

## අනුකූලතා පාලනයන්

ඵලදායි පාලනයන් අනුකූලතාව සඳහා සිදුකරන සෑම දෙයකම ජීවනාලිය වේ. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි අභ්‍යන්තර පාලනයන් සකස් කර ඇත්තේ සියලුම ආයතනික අනුකූලතා බැඳීම් සපුරාලන බව සහතික කිරීම සඳහාය. ප්‍රතිපත්ති හැරුනු විට. ක්‍රියාපටිපාටි අත්පොත්, අභ්‍යන්තර චක්‍රලේඛ, ක්‍රියාවලි පුහුණු, සම්පූර්ණයෙන්ම පාලනය වන්නේ (ආයතනික ප්‍රමුඛතා පිළිබඳ ආයතනික කළමනාකරණ මාර්ගෝපදේශය) නිශ්චිත ස්වයංක්‍රිය පද්ධති පාලන තුළින් වන අතර ඒවා අනවශ්‍ය ප්‍රතිඵලවල අවදානම හෝ අවස්ථාව අඩුකිරීමට ද යොදා ගනී.

# අනුකූලතා කළමනාකරණය

එමෙන්ම, වංචාව සහ සදාචාර විරෝධී කටයුතු සිදුවේයැයි සැකසහිත ක්ෂේත්‍රවල නිරන්තර පදනමත් මත විගණනය පවත්වමින් ආයතනය තුළ අනුකූලතාව සහතික කිරීමේදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහය කාර්යභාරයක් ඉටු කරයි. මෙම විගණනවල සොයාගැනීම් ඇගයීම සහ අදාළ අවස්ථාවල නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ.

සමාගම ව්‍යාපාර චර්යා සංග්‍රහය සහ සමාගමේ සදාචාර තුළින් සදාචාර හැසිරීම ප්‍රවර්ධනය කරන අතර, සමාගමේ තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය අපගේ ව්‍යාපාර කටයුතුවල සදාචාර හැසිරීම සහ ශක්තිමත් සහ ඵලදායි අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින් සිදුවියහැකි අවදානම් සහ නීතිවල විශේෂ කඩකිරීම් පිළිබඳ තොරතුරුවල වටිනා මූලාශ්‍රයක් ලෙස කටයුතු කරයි. සමාලෝචිත වසර තුළ, තොරතුරු දැනුම්දෙන්නන් විසින් මතුකරන ලද ගැටළු විධිමත් පරිදි නිරවුල් කරන ලදී.

සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්තිය ද ඉහළ මට්ටමේ අවංක සේවකයින් බඳවාගැනීම මගින් සහ සේවකයින් කලින් කල මාරුකරන ප්‍රතිපත්තියක් යොදා ගනිමින් සමාගම තුළ සදාචාර සංස්කෘතිය ඇති කිරීම සඳහා පදනම දමනු ලබයි.

## අනුකූලතා තාක්ෂණය

අනුකූලතා නියාමනය, ගනුදෙනුකාර නිවාරණය සහ ක්ෂේත්‍රයේ පවත්නා ව්‍යවහාරවලට අනුකූලව අනුකූලතා පාලනය සඳහා තාක්ෂණය භාවිතා කෙරේ.

## අනුකූලතා පුහුණුව

සමාගම සේවක පුහුණු අවශ්‍යතා හඳුනාගන්නා අතර, අවශ්‍ය අවස්ථාවලදී පුහුණුව ලබා දේ. සමාලෝචිත වසර තුළ තෝරාගත් සේවකයින් බාහිර වැඩසටහන්වලට සහභාගි වූ අතර මුදල් විශුද්ධිකරණ විරෝධය සහ ත්‍රස්තවාදී අරමුදල්කරණය වැළැක්වීම, සයිබර් ආරක්ෂක අනුකූලතාව, සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා නියාමන වාර්තාකරණය අවශ්‍යතා පිළිබඳ සැසි එම පුහුණුවලට ඇතුළත් විය.

මෙයට අමතරව, සියලුම නව සේවකයින් සමාගමේ ක්‍රියාවලිය සම්බන්ධ අවශ්‍ය දැනුම ලබාගැනීම සඳහා ප්‍රේරණ පුහුණු වැඩසටහන්වලට යොමු කෙරේ.

**අපගේ සාකල්‍ය ප්‍රවේශය මූලික සංරචක හයක් කෙරෙහි අවධානය යොමු කරයි. ඒවානම් ශක්තිමත් අනුකූලතා සංස්කෘතිය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, පුහුණුව සහ සන්නිවේදනය, ප්‍රධාන ක්‍රියාවලි, සමාලෝචනය සහ නියාමනය සහ ආයතනය තුළ එකතකුකර ඇති අනුකූලතා වගකීම් සහිත සංසක්ති සහ කාර්යක්ෂම අනුකූලතාවයක් සාමූහිකව ලබාදෙන අවශ්‍ය සම්පත් වේ.**

# ආයතනික පාලනය

## ආයතනික යහපාලනය සඳහා අපගේ කැපවීම




අනුකූලතාව තුළ දක්වා ඇති ආයතනික පාලනය සමඟ අනුකූලවීමට අපි උත්සාහ ගෙන ඇත.

වසර තුළ 2008 අංක 04 සහ 2013 අංක 06 උපදෙස් මගින් සංශෝධිත 2008 අංක 03 දරන මූල්‍ය සමාගම (ආයතනික පාලනය) උපදේශයේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ විධිවිධානවලට සහ කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලැයිස්තුගත නියමයන් හි දක්වා ඇති ආයතනික පාලන නියමයන්ට

මෙම වාර්තාවේ මින්පසු දක්වා ඇති ප්‍රමාණයට සමාගම අනුකූල වී ඇති බව සහතික කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කරයි.

එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනීමේ හා විශ්වාසය මත 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ අවශ්‍යතාවන්ට සමාගම අනුකූල වී ඇති බවත්, රජයට හා ව්‍යවස්ථාපිත/නියාමන ආයතනවලට සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් බැඳීම් සපුරා ඇති බවත් සහතික කිරීමට අපේක්ෂා කරයි.

අපගේ පාලන ප්‍රඥප්ති, ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, සහ පැහැදිලිව නිශ්චයකළ වගකීම් තුළ ඇතුළත්කර ඇති ඉහළම ආයතනික පාලන ප්‍රමිතිවලට අපගේ කැපවීම තුළින් ප්‍රශස්ථ කොටස්හිමි වටිනාකම ලබාදීමට අපි අඛණ්ඩව උත්සාහ ගනිමු. සමාගමේ පරමාර්ථ නියමකරන සහ අත්කරගන්නා ආකාරය, සහ අවදානම නියාමනය කර, තුලනය කර අගයනු ලබන සහ කාර්යසාධනය ප්‍රශස්ථ කරන ආකාරය අපගේ ආයතනික පාලන ව්‍යුහය තුළ පිළිබිඹු කරන අතර තිරසාර පාර්ශ්වකාර වටිනාකමක් ලබාදෙන බව සහ රටේ මූල්‍ය පද්ධතියට විශ්වාසී, ධනාත්මක සහ බලපැම්කළහැකි නායකත්වයක් ලබාදීමේ අවසාන පරමාර්ථය සමඟ සමාගමේ ශක්තිමත් සහ තුලනාත්මක ආර්ථික සංවර්ධනය ස්ථාපිත කරන බව සහතික කරයි.

## අනුකූලතා ප්‍රකාශය

අපගේ ආයතනය තුළ ආයතන පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට නිරන්තරව අපි කැපවී සිටින අතර, අපගේ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීම, කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය කෙරෙහි නිරන්තරව අවධානය යොමු කරමින් සමාගමේ වත්කම් පවත්වාගෙන වර්ධනය කිරීම සහා කොටස්හිමිකාර වටිනාකම වැඩිකිරීම සඳහා අත්‍යවශ්‍ය වන බව අපි විශ්වාස කරමු. පාලන ප්‍රඥප්ති, ප්‍රතිපත්ති, ලියවිලි, වැදගත් සිදුවීම් සහ මෙම වාර්තාවේ ඉදිරි කොටස්වල විස්තර කරන

## ආයතනික පාලන රාමුව

බාහිර මිනුම් සාධකවලින් නියාමනය වන පසුතලයක සහ අභ්‍යන්තර මිනුම් සාධකවලින් බලපෑම, ඇති සෑම මට්ටමකදීම ස්වාධීනත්වය සහ විනිවිදභාවය සහතික කරමින් පාර්ශ්වකාර බැඳියාවන් ආරක්ෂා කිරීම පිළිබඳ අවධානය යොමු කරන කාර්යක්ෂම යාන්ත්‍රණයක් සමඟ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල ශක්තිමත් පරාසයක් සහිත ගතික ආයතනික පාලන රාමුවක් අපි ක්‍රියාවේ යොදවන්නෙමු.




| නියාමනය හා පාලනය | ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි | නෛතික හා නියාමන රාමුව |
|---|---|---|
| මූල්‍ය සමාගම්වල ආයතනික පාලන නීතිවලට අනුකූලතාවය පිළිබඳ බාහිර විගණනවරුන්ගේ සහතික කිරීම.<br>• බාහිර විගණනය<br>• අභ්‍යන්තර විගණනය<br>• තිරසාරාත්මක විගණනය<br>• අනුකූලතාව | • සංගමික ව්‍යවස්ථාවලිය<br>• ආයතනික පාලන ප්‍රඥප්තිය<br>• ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය<br>• සන්නිවේදන ප්‍රතිපත්තිය<br>• මෙහෙයුම් ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ අත්පොත්<br>• තොරතුරු දැනුම් දෙන්නන් ආරක්ෂණ ප්‍රතිපත්තිය<br>• අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි<br>• අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි<br>• මුදල් විශුද්ධිකරණ විරෝධය/KYC ප්‍රතිපත්තිය | • CA ශ්‍රී ලංකා විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය<br>• CBSL විසින් නිකුත් කළ මූල්‍ය සමාගම් (ආයතන පාලනය) උපදෙස්<br>• CSE හි ලැයිස්තුගත නියමයන්<br>• 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත<br>• 2007 අංක 07 දරන සමාගම් පනත<br>• 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත)<br>• තිරසාරභාවය පිළිබඳ GRI මාර්ගෝපදේශ |

# ආයතනික පාලනය



## අපගේ අභ්‍යන්තර පාලන රාමුව

අපගේ අභ්‍යන්තර පාලන රාමුව ඵලදායි අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයක් සහ අනුකූලතාවය හා සම්බන්ධ තිරසාරාත්මක හැසිරීම සහතික කරමින් පාලන, වගවීම සහ දැනුවත් තීරණ ගැනීම සහිත යහපාලනය සඳහා ශක්තිමත් පදනමක් ලබා දේ.



# ආයතනික පාලනය

## අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනුකමිටු

### අධ්‍යක්ෂ මණ්ඩලය

පාර්ශ්වකරුවන්ගේ අඛණ්ඩ තෘප්තිය සහතික කිරීමට සදාචාර සහ කාර්යක්ෂම ආකාරයකින් සමූහයේ ක්‍රමෝපාය අත්කර ගැනිම සඳහා ආයතනික පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම අත්‍යවශ්‍ය අංගයකි.

ආයතනික පාලනයේ ධාවකයින් ලෙස, සියලුම අධ්‍යක්ෂවරුන් සැලකියයුතු අවධානයක් ගන්නා අතර රැස්වීම්වලට සහභාගිවීමට සහ ක්‍රමෝපාය, කාර්යසාධනය, අවදානම් කළමනාකරණය, පාලනය සහ ව්‍යාපාර චර්යාවට අදාළ කරුණු පිළිබඳ ස්වාධීන විනිශ්චය ලබාදීමට කාලය යොදවනු ලබයි.

වාර්ෂික වාර්තාව ආයතනික පාලන ව්‍යවහාර සහ පාර්ශ්වකරුවන්ට බලපෑ හැකියයි අපේක්ෂා කරන වැදගත් කරුණු පිළිබඳ තුලනාත්මක සහ නිවැරදි දැක්මක් නියෝජනය කරන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී.

සමාලෝචිත වසර තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය 2019 දෙසැම්බර් මස 30 වන දින සහ 2020 පෙබරවාරි මස 19 වන දින ලෙස දෙවරක් ප්‍රතිව්‍යුහගත කරන ලදී. අධ්‍යක්ෂවරුන්ගේ පත්කිරීම සහ ඉල්ලා අස්වීම් පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර පිටු අංක 80 සහ 81 බලන්න.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ මූල්‍ය නිපුනත්වය

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය සුදුසුකම්ලත් වෘත්තිකයින් අට (8) දෙනෙකුගෙන් සමන්විත වන අතර, බැංකුකරණය, ගිණුම්කරණය හා මූල්‍යකරණය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණ උපදේශනය, අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය, සහ නීතිය ඇතුළුව විවිධ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ දක්ෂතාව ඔවුන් සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් අට දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, ඔවුන්ගෙන් සාමාජිකයින් තිදෙනෙක් ස්වාධීන වේ. මෙසේ, ගතික ව්‍යාපාර පරිසරියක් සමඟ තරඟ කිරීමේ හැකියාව මනාව සමබර අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සහතික කෙරේ.

සභාපති ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් හතරක් වරලත් ගණකාධිකාරිවරු වන අතර ඔවුන්ට මූල්‍යකරණයට අදාළ කරුණුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට මඟපෙන්වීම ලබාදිමට මූල්‍යකරණය පිළිබඳ මනා දැනුම සතුය. ගිණුම්කරණ සහ නියාමන ප්‍රමිති පිළිබඳව සාමාජිකයින් අඛණ්ඩව යාවත් කෙරේ.

## පළපුරුද්ද පිළිබඳ විවිධත්වය




A – ගිණුම්කරණය හා මූල්‍යකරණය
B – බැංකුකරණය
C – කළමනාකරණ උපදේශනය
D – ව්‍යාපාර පරිපාලනය
E – අලෙවිකරණය
F – මානව සම්පත් කළමනාකරණය
G – නීතිය

## වයස




● 50 ට අඩු ● 50-60 ● 60 ට ඉහළ

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාලය




● මාස 5 ට පහළ ● මාස 5-9
● මාස 9 ට ඉහළ

## ස්වාධීන/ස්වාධීන නොවන




● ස්වාධීන
● ස්වාධීන නොවන

**2019/20 මූල්‍ය වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්ෂේත්‍ර**

| | |
|---|---|
| පාලනය | • භාණ්ඩාගාර ප්‍රතිපත්තිය සමාලෝචනය<br>• ලාභාංශ ප්‍රතිපත්තිය අනුමැතිය<br>• ප්‍රතිශෝධිත හානිකරණ ක්‍රියාපටිපාටි අත්පොත අනුමත කිරීම<br>• අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රතිශෝධනය<br>• අභ්‍යන්තර විගණන අත්පොත ප්‍රතිශෝධනය<br>• වත්කම් සහ වගකීම් කමිටුවේ යොමු නිර්දේශ සමාලෝචනය |
| ක්‍රමෝපාය සහ ව්‍යාපාර | • කාර්තුමය ව්‍යාපාර සැලැස්ම සමාලෝචනය<br>• කාර්තුමය ලෙස ප්‍රමුඛ මූල්‍ය සමාගම්වලට අනුව සමාගමේ මූල්‍ය කාර්යසාධනය සලකා බැලීම<br>• ක්‍රමෝපායික බලපෑම් සහිත CSR වැඩසටහන් සඳහා අවධානිත ක්ෂේත්‍ර සමාලෝචනය<br>• ශාඛා ව්‍යාප්ති සැලැස්ම අනුමැතිය |
| අවදානම සහ පාලනය | • මුදල් භාරගැනීමේ ක්‍රියාවලියේ සංශෝධිත මාර්ගෝපදේශ අනුමැතිය<br>• සංශෝධිත ණය ප්‍රතිපත්තිය අනුමැතිය |
| පාර්ශ්වකාර සහභාගිත්වය | • 2018/19 සඳහා මහ සභා රැස්වීම කැඳවීම<br>• ලාභාංශ ගෙවීම අනුමැතිය |

# ආයතනික පාලනය



## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

ක්‍රමෝපාය, මූල්‍ය අවදානම, පාලනය සහ අනුකූලතාවය යන ක්ෂේත්‍ර සාකච්ඡා කිරීමට සහ එය ආවරණය කරමින් සුදුසු තීරණ ගැනීමට නිරන්තර පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සැලකියයුතු කරුණු පිළිබඳ විශේෂ සාකච්ඡාවන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවනු ලබන අවස්ථාවන් හැර මාසයක කාලයක් තුළ පවත්වනු ලැබේ. මාසික රැස්වීමේදී, ආර්ථික, පාරිසරික සහ සමාජීය අංග, සහ ඒ තුළින් ඇති වන අවස්ථා සහ ආශ්‍රිත අවදානම්වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය කාර්යසාධනය සමාලෝචනය කරයි. සමාගම් ලේකම්ගේ සහයෝගය ඇතිව සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය සකස් කරයි.

## රැස්වීම්වල ඵලදායිත්වය කළමනාකරණය

### රැස්වීමට පෙර

- රැස්වීම පිළිබඳ පූර්ව නිවේදනය යැවීම
- න්‍යාය පත්‍රය සකස් කර සංවර්ධනය
- අධ්‍යක්ෂවරුන් සමඟ උපදේශකත්වයෙන් රැස්වීම් අවශ්‍යතා තීරණය කිරීම
- න්‍යාය පත්‍රයට ඇතුළත් අයිතම පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබාදීම
- අධ්‍යක්ෂවරයෙක් රැස්වීමකට සහභාගිවීමට අපොහොසත් වන අවස්ථාවක විකල්ප අධ්‍යක්ෂවරයෙක් පත්කිරීම සඳහා විධිවිධානය
- අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය අවස්ථාවලදී ස්වාධීන උපදෙස් ලබාගැනීම සඳහා විධිවිධානය

### රැස්වීම අතර

- සභාපති විසින් සාකච්ඡාවන් සඳහා සහභාගිවීමට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දිරිමත් කරයි
- ප්‍ර.වි.නි. විසින් ව්‍යාපාර මෙහෙයුම්, මූල්‍ය කාර්යසාධනය, ක්ෂේත්‍රයේ ප්‍රවණතා සහ සංවර්ධනයන් පිළිබඳව සම්පූර්ණ සහ විස්තරාත්මක යාවත් කිරීම් ඉදිරිපත් කරයි.
- අධ්‍යක්ෂ මණ්ඩලයට වෙළෙඳපොළ තත්ත්වයන්, නියාමන රාමුවේ වෙනස්වීම් සහ සමාගමේ කටයුතුවලට බලපාන අනෙකුත් සාධක පිළිබඳ නිරන්තරව යාවත්කිරීම ලබාදේ
- අදාළ ව්‍යාපාර ඒකක ප්‍රධානීන්ට රැස්වීමට සහභාගි වී ව්‍යාපාරයට අදාළ කරුණු සාකච්ඡා කිරීමට අවස්ථාව
- සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සහභාගිවන අතර අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලවන බව සහතික කරයි.

### රැස්වීමට පසු

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට යොමුකළ කරුණු පිළිබඳ කමිටු විසින් පසුවිපරම
- අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍යතාව මත කළමනාකරණය විසින් පසු විපරම සහ අමතර තොරතුරු/ලියවිලි සකස් කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මතුකළ ප්‍රධාන ගැටලු පිළිබඳ කළමනාකරණය විසින් ස්වාධීන සාකච්ඡා

## රැස්වීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම

2019 අප්‍රේල් මස 1 සිට 2019 දෙසැම්බර් මස 31 දක්වා

| අධ්‍යක්ෂවරයාගේ නම | පත්වීමේ දිනය | විශ්‍රාම ගැනීම/ ඉල්ලා අස්වීම | විධායක/විධායක නොවන | ස්වාධීන/ස්වාධීන නොවන | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් | පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටු රැස්වීම් | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු රැස්වීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. හේමසිරි ප්‍රනාන්දු මහතා | 2015 අප්‍රේ. 8 | 2015 ඔක්. 12 | විධායක නොවන | ස්වාධීන නොවන | 6/6 | – | – | – | – |
| 2. ප්‍රදීප් අමිර්තනායගම් මහතා | 2015 අප්‍රේ. 8 | 2020 පෙබ. 19 | විධායක නොවන | ස්වාධීන | 7/8 | 3/4 | 2/2 | 3/4 | 2/2 |
| 3. අනිස් රිස්වාන් මහතා | 2015 අප්‍රේ. 8 | 2019 දෙසැ. 30 | විධායක නොවන | ස්වාධීන | 8/8 | 4/4 | 2/2 | – | 2/2 |
| 4. ජොන්සන් ප්‍රනාන්දු මහතා | 2015 අප්‍රේ. 8 | 2019 දෙසැ. 30 | විධායක නොවන | ස්වාධීන නොවන | 7/8 | – | – | 4/5 | 0/2 |
| 5. ජෙහාන් අමරතුංග මහතා | 2015 අප්‍රේ. 8 | 2019 දෙසැ. 30 | විධායක නොවන | ස්වාධීන නොවන | 8/8 | 4/4 | – | 5/5 | – |
| 6. රසිත ගුණවර්ධන මහතා | 2016 අගෝ. 29 | 2020 ජූනි 25 | විධායක නොවන | ස්වාධීන නොවන | 8/8 | – | 2/2 | 1/1 | – |
| 7. ආචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා | 2018 ඔක්. 9 | 2019 දෙසැ. 30 | විධායක නොවන | ස්වාධීන | 8/8 | – | – | – | – |
| 8. එඩ්වඩ් වීරසිංහ මහතා | 2018 ඔක්. 9 | 2019 දෙසැ. 30 | විධායක නොවන | ස්වාධීන | 7/8 | – | – | – | – |
| 9. රොහාන් පතිරගේ මහතා | 2019 ජූලි 10 | | විධායක නොවන | ස්වාධීන නොවන | 5/5 | – | – | – | 1/1 |

2019 දෙසැම්බර් මස 31 සිට 2020 පෙබරවාරි මස 19 දක්වා

| අධ්‍යක්ෂවරයාගේ නම | පත්වීමේ දිනය | විශ්‍රාම ගැනීම/ ඉල්ලා අස්වීම | විධායක/ විධායක නොවන | ස්වාධීන/ ස්වාධීන නොවන | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් | පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටු රැස්වීම් | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු රැස්වීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ප්‍රදීප් අමිර්තනායගම් මහතා | 2015 අගෝ. 8 | 2020 පෙබ. 19 | විධායක නොවන | ස්වාධීන | 1/1 | – | – | – | – |
| 2. රසිත ගුණවර්ධන මහතා | 2016 අගෝ. 29 | 2020 ජුනි 25 | විධායක නොවන | ස්වාධීන නොවන | 1/1 | – | – | – | – |
| 3. රොහාන් පතිරගේ මහතා | 2019 ජූලි 10 | | විධායක නොවන | ස්වාධීන නොවන | 1/1 | – | – | – | – |
| 4. බොනිෆස් සිල්වා මහතා | 2019 දෙසැ. 30 | 2020 පෙබ. 19 | විධායක නොවන | ස්වාධීන නොවන | 1/1 | – | – | – | – |
| 5. රංජිත් කොඩිතුවක්කු මහතා | 2019 දෙසැ. 30 | 2020 පෙබ. 19 | විධායක නොවන | ස්වාධීන නොවන | 1/1 | – | – | – | – |
| 6. අසාම් ඒ අහමට් මහතා | 2019 දෙසැ. 30 | | විධායක නොවන | ස්වාධීන නොවන | 1/1 | – | – | – | – |

2020 පෙබරවාරි 19 සිට

| අධ්‍යක්ෂවරයාගේ නම | පත්වීමේ දිනය | විශ්‍රාම ගැනීම/ ඉල්ලා අස්වීම | විධායක/ විධායක නොවන | ස්වාධීන ස්වාධීන නොවන | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් | පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටු රැස්වීම් | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු රැස්වීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. සුජීව රාජපක්ෂ මහතා | 2020 පෙබ. 19 | | විධායක නොවන | ස්වාධීන නොවන | 2/2 | – | – | – | – |
| 2. රසිත ගුණවර්ධන මහතා | 2016 අගෝ. 26 | 2020 ජුනි 25 | විධායක නොවන | ස්වාධීන නොවන | 2/2 | – | – | – | – |
| 3. රොහාන් පතිරගේ මහතා | 2019 ජූලි 10 | | විධායක නොවන | ස්වාධීන නොවන | 2/2 | – | – | – | – |
| 4. සුදර්ශන් අහංගම මහතා | 2020 පෙබ. 19 | | විධායක නොවන | ස්වාධීන නොවන | 2/2 | – | – | – | – |
| 5. ක්ලයිව් ෆොන්සේකා මහතා | 2020 පෙබ. 19 | | විධායක නොවන | ස්වාධීන නොවන | 2/2 | – | – | – | – |
| 6. චතුර විජේතිලක මහතා | 2020 පෙබ. 19 | | විධායක නොවන | ස්වාධීන | 2/2 | – | – | – | – |
| 7. අශෝක බණ්ඩාර මහතා | 2020 පෙබ. 19 | | විධායක නොවන | ස්වාධීන | 1/2 | – | – | – | – |
| 8. අසාම් ඒ අහමට් මහතා | 2019 දෙසැ. 30 | | විධායක නොවන | ස්වාධීන නොවන | 2/2 | – | – | – | – |
| 9. කොරලී පීටර්ස් මිය | 2020 මාර්තු 1 | | විධායක නොවන | ස්වාධීන | – | – | – | – | – |

## සභාපතිවරයාගේ කාර්යභාරය

ආයතනික පාලනයේ ඉහළ ප්‍රමිති පවත්වා ගැනීමේදී සභාපතිවරයා සැලකියයුතු කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවමින්, ඔහු ප්‍රධාන විධායක නිලධාරි සහ කළමනාකරණය මෙහෙයවන අතර අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සහ අධ්‍යක්ෂවරුන්ගේ සමස්ත ඵලදායිත්වය සහතික කරයි. එමෙන්ම, සෑම අධ්‍යක්ෂවරයෙක්ටම තිරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වීමට සහ ඔහුගේ ස්වාධීන විනිශ්චය ක්‍රියාවට නැංවීමට අවස්ථාව ලබාදෙන බව සහතික කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල කාර්යසාධනය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇති මාර්ගෝපදේශයන් තුළින් සකස් කරගත් ආකෘතියක් තුළින් වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇගැයීම්වල සොයා ගැනීම් විශ්ලේෂණය කර සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි. 2019/20 මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල ඇගයීම් 2020 ජුනි මස ආරම්භ කරන ලද අතර සොයා ගැනීම් 2020 ජුලි මස පවත්වන ලද රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරියේ සභාගත කරන ලදී. සොයාගැනීම් මත පදනම් වී, අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු සමාලෝචිත වසර තුළ ඵලදායීව කටයුතු කර ඇති බව විධිමත්ව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වර්ධනය කළයුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර ඒවා ආමන්ත්‍රණය කිරීමට සුදුසු පියවර ක්‍රියාත්මක කරන බවට එකඟතාවයක සිටී.

## ස්වාධීනත්වය සහතික කිරීම

මූල්‍ය සමාගම් (ආයතනික පාලනය) උපදෙස්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය සහ CSE හි ලැයිස්තුගත නියමයන්හි දක්වා ඇති අනුකූලතා නිර්දේශ මත පදනම් වී අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ වාර්ෂික ඇගයීම 2020 ජුනි මස සිදුකරන ලද අතර ඒවායේ ප්‍රතිඵල 2020 ජූලි මස පවත්වන ලද රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල ඉදිරියේ සභාගත කරන ලදී.

ස්වාධීනත්වය ඇගයීමේදී, සමූහය සමග, කළමනාකරණයේ සාමාජිකයින් සමඟ සහ සමාගමේ සැලකියයුතු කොටස්හිමියන් සමඟ අධ්‍යක්ෂවරයාගේ සම්බන්ධතාවය සහ සේවාකාලයේ ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩල අඛණ්ඩතාව

අධ්‍යක්ෂ මණ්ඩලයේ අඛණ්ඩතාව යහපාලනය තුළ අත්‍යවශ්‍ය කොටසක් ලෙස අපි විශ්වාස කරමු. එමනිසා, ආර්ථික, පාරිසරික සහ සමාජීය සාධක ආවරණය කරන ක්ෂේත්‍ර ඇතුළුව විවිධ කාර්මික දැනුම, නිපුනතාව, පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදිය හැකි ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ස්ථාපිත කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් පත්කිරීම පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව විසින් සිදුකරන නිර්දේශ මත පදනම් වී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජිත සාමාජිකයින්ගේ යෝග්‍යතාව පිළිබඳ පුළුල් සාකච්ඡාවකින් පසු සිදුකරනු ලබයි. අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම සහ පත්කිරීමේ ක්‍රියාවලිය ආයතනික පාලන ප්‍රඥප්තියට සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සඳහා ලබාදේ.

# ආයතනික පාලනය



## ප්‍රේරණ සහ අඛණ්ඩ පුහුණුව

අධ්‍යක්ෂවරුන් අඛණ්ඩව සංවර්ධනය කිරීම ඔවුන්ගේ ප්‍රවීනත්වය ගොඩනැගීම තුළින් සහතික කරන අතර ව්‍යාපාරය පිළිබඳ සහ මෙහෙයුම් වෙළෙඳපොළ පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඇති කරයි. අධ්‍යක්ෂවරුන් වෙත ව්‍යාපාර, මෙහෙයුම්, මූල්‍ය කටයුතු, සමූහයේ වටිනාකම, පාලන රාමුව සහ සමාගමේ ක්‍රමෝපායික තත්ත්වය පිළිබඳ ඵලදායි දැනුම ලබාදීමට ප්‍රාරම්භක පුහුණුවක් ලබා දේ. එමෙන්ම, අධ්‍යක්ෂවරුන්ට ආයතනික පාලන ප්‍රඥප්තියේ සඳහන් වන පරිදි අධ්‍යක්ෂවරුන් ලෙස ඔවුන්ගේ වගකීම් හුරුකර ගැනීමට අවස්ථාවක් ලබා දේ.

තවද, ආර්ථික, සමාජීය සහ පාරිසරික අංශ ඇතුළත් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරමින් සමූහයට බලපෑ හැකි අදාළ නීතිකරණ, රෙගුලාසි සහ ආයතනික පාලන සහ අංශයේ සංවර්ධනයන් හි යම් වෙනසක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවේ රැස්වීමේදී සහ සුදුසු පරිදි සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයට යාවත් කෙරේ.

## අධ්‍යක්ෂ මණ්ඩල කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් සමන්විත අනුකමිටුවලට සමහර කාර්යයන් පවරා ඇත. අනුකමිටුවල අධීක්ෂණය යටතේ පවත්නා අදාළ විෂය කරුණු පිළිබඳ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ පරික්ෂාකාරී ඇගයීම් පදනම් කරගෙන මෙම අනුකමිටුවලට සාමාජිකයින් පත් කරනු ලබයි. මේ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට කමිටුවේ විෂයපථය තුළ කටයුතු කිරීමට ප්‍රමාණවත් කාලය වෙන් කිරීමට හැකිවේ. නියාමන සහ පාලන රාමුව තුළ සංවර්ධනයන්ට සමගාමීව කමිටුවේ විධිනියෝග කලින් කල සමාලෝචනය කෙරේ. එක් එක් කමිටුව එයට අදාළව විධිනියෝගය අනුව එයට පවරන ලද රාජකාරී ඉටු කිරීම සඳහා පියවර ගැනීමට, නියාමනය කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් ලබාදීමට සහ නිර්දේශ සිදුකිරීම සඳහා වගකීමට බැඳී සිටී. මේ අනුව, කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අගය සහ විනිවිදභාවය එකතු කිරීමට වගකීම දරයි. කමිටුවේ සභාපති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අදාළ කමිටුවේ කටයුතු පිළිබඳව

අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර කමිටුවේ ඵලදායි ක්‍රියාකාරිත්වය සඳහා වගවීමට බැඳී සිටී.

| අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව | සංයුතිය | ප්‍රධාන අවධානිත ක්ෂේත්‍ර | වසරේ වැදගත් සිදුවීම් |
|---|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) | • සාමාජිකයින් තිදෙනෙකි<br>• සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති<br>• සභාපති ඇතුළුව සාමාජිකයින් දෙදෙනෙක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ය | • මූල්‍ය වාර්තාකරණය<br>• අභ්‍යන්තර හා බාහිර විගණනය<br>• නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාව<br>• අභ්‍යන්තර පාලන සහ පාලනය | • අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව සඳහා 118 සහ 119 පිටු බලන්න |
| අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) | • සාමාජිකයින් හත්දෙනෙකි<br>• විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් හතරක්<br>• සභාපති විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි | • අවදානම් පාලනය<br>• අවදානම් රුචිය<br>• අවදානම් ප්‍රතිපත්ති රාමුව<br>• අවදානම් කළමනාකරණය<br>• අවදානම් නියාමනය සහ අනුකූලතාව | • අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව සඳහා 124 සිට 126 පිටු බලන්න |
| පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව (RNC) | • සාමාජිකයින් තිදෙනෙකි<br>• සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති<br>• සභාපති ඇතුළුව සාමාජිකයින් දෙදෙනෙක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ය | • ආයතනික ව්‍යුහය<br>• පාරිශ්‍රමික ප්‍රතිපත්තිය<br>• අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරාගැනීම<br>• අනුප්‍රාප්ත සැලැස්ම | • පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටු වාර්තාව සඳහා 120 සහ 121 පිටු බලන්න |
| සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) | • සාමාජිකයින් තිදෙනෙකි<br>• සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති<br>• සභාපති ඇතුළුව සාමාජිකයින් දෙදෙනෙක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ය | • සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි<br>• බැඳියා පිළිගැටුම් වැළැක්වීම | • සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව සඳහා 122 සහ 123 පිටු බලන්න |

## සමාගම් ලේකම්

සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම ලේකම් හමුවිය හැකිය. සමාගම් ලේකම් සභාපතිගේ උපදේශකත්වය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය සකස් කිරීමේදී සහයවන අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධීකරණය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා සකස් කර පවත්වා ගනී.

දීර්ඝ කාලීන පාර්ශ්වකාර බැඳියාවන් වැඩි කිරීමට සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන් හි අදාළ විධිවිධාන, නීති සහ රෙගුලාසි, සමාගම් පනත, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම සඳහා ආයතනික පාලන රාමුව ක්‍රියාත්මක කිරීමේදී සමාගම් ලේකම් සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලය, එහි කමිටු සහ කළමනාකරණය තුළ තොරතුරු සන්නිවේදනය සහතික කරයි.

## පාලනය සහ ආචාරධර්ම

### තිරසරභාවයට අපගේ බැඳීම

සමාගමේ මෙහෙවර සහ දීර්ඝ කාලීන තරගකාරිබව අත්කර ගැනීමට වඩාත් අත්‍යවශ්‍ය සාධකවලින් එකක් ලෙස අපි තිරසාරභාවය හඳුනාගන්නා අතර තිරසාරභාවය අපගේ වාණිජමය සාර්ථකත්වයේ උත්ප්‍රේරකය බව අපි විශ්වාස කරමු.

සමාගමේ තිරසාර ක්‍රමෝපාය කෙරෙහි අවධානය යොමු කරන විශේෂිත CSR දෙපාර්තමේන්තුවක් අප සතුය. ආයතනයේ විවිධ මට්ටම්වල ගනු ලබන තිරසාර වැඩසටහන් සම්බන්ධීකරණය සහ නියාමනය CSR දෙපාර්තමේන්තුව වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති අතර එම දෙපාර්තමේන්තුව තිරසාර පාලන මෙහෙයුම් කමිටුව සමඟ උපදේශකත්වයෙන් සමාගමේ මෙහෙයුම්, එහි අවදානම් සහ අවස්ථාවන් කෙරෙහි බලපාන ආර්ථික, සමාජීය සහ පාරිසරික සාධක හඳුනාගැනීමේදී කොටස්කරුවන් සමඟ නිරත වේ.

CSR දෙපාර්තමේන්තුව විසින් වර්තමාන තිරසාර වැඩසටහන්, ව්‍යාපාරය කෙරෙහි බලපාන විවිධ ආර්ථික, සමාජීය සහ පාරිසරික සාධක තුළින් ඇතිවන අවදානම් සහ අවස්ථා සහ පාර්ශ්වකාර ගැටලු පිළිබඳ ප්‍රගති වාර්තා ඇතුළු පුළුල් ක්ෂේත්‍රයක් සම්බන්ධව නිරන්තර වාර්තා කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

# ආයතනික පාලනය

## පාලනය පිළිබඳ කළමනාකරණයේ කාර්යභාරය

කළමනාකරණ මට්ටමේදී සකස් කරනු ලබන විධායක මට්ටමේ කමිටු මගින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සදාචාර සහ පාලන පරාමිති තුළ ව්‍යාපාර මෙහෙයුම් කරගෙන යන බව සහතික කරයි. මෙම කළමනාකරණ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන අතර සියලුම පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වර්ධනය සහතික කිරීමට සමාගමේ ව්‍යාපාර සහ කටයුතු කළමනාකරණය කරයි.

## බැඳියා පිළිගැටුම් කළමනාකරණය

සමාගමේ සියලුම අධ්‍යක්ෂවරු සහ සේවකයින් විසින් ඔහු හෝ ඇය වෙනුවෙන් හෝ යම් තෙවැනි පාර්ශ්වයක මූල්‍ය හෝ වෙනත් ආකාරයේ ප්‍රතිලාභයක් වෙනුවෙන් තම තනතුර හෝ රහසිගත හෝ මිල සංවේදී තොරතුරු භාවිතා කිරීමෙන් වැළැක්විය යුතු බවට අපගේ ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහයෙන් නියම කරයි.

අධ්‍යක්ෂවරුන් ඔහුගේ හෝ ඇයගේ ස්වාධීන විනිශ්චයට හානි පමුණුවන යම් වියහැකි බැඳියා පිළිගැටුම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට අනාවරණය කිරීම අවශ්‍ය වේ. අධ්‍යක්ෂවරයෙකුගේ බැඳියා පිළිගැටුමකට අදාළ කරුණක් සැලකිල්ලට ගැනීමේදී, එකී බැඳියාව ප්‍රකාශ කිරීමෙන් පසු, එම අධ්‍යක්ෂ එකී කරුණ සාකච්ඡාව තුළ ඔහු හෝ ඇය එයට සහභාගී වීමෙන් වැළකී සිටිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඡන්දය දීමෙන්ද වැළකී සිටිය යුතුය. සමාගම් ලේකම් වාර්තාව තුළ එවැනි නොපැමිණීම් විධිමත්ව වාර්තා කරයි.

සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියට අනුව සමාගමට සම්බන්ධිත පාර්ශ්ව ලෙස සලකා බැලිය හැකි පාර්ශ්වයන් සහ පුද්ගලයින්ගේ වර්ගීකරණය සම්බන්ධයෙන් පැහැදිලි උපදෙස් සපයනු ලබයි. සම්බන්ධිත පාර්ශ්ව පිළිබඳ ස්වයං ප්‍රකාශන අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගන්නා අතර එය කලින්ම සම්බන්ධිත පාර්ශ්ව මනාව හඳුනාගැනීමට හැකියාව ඇති කරයි. අපගේ පද්ධතිය සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමනය සහ වාර්තාකරණය සඳහා පහසුකම් ඇති කරයි.

| කළමනාකරණ කමිටුව | කමිටුවේ කාර්යභාරය | වසර තුළ ගනුලැබූ ප්‍රධාන පියවර |
|---|---|---|
| වත්කම් සහ වගකීම් කමිටුව | • විෂයපථය සමාලෝචනය – සමාගමේ වත්කම් සහ වගකීම් කාර්යයන්<br>• වාර්තාකරණ මාර්ග – නිර්දේශිත පිළියම් කාර්යය සමඟ තීරණ සහ බරපතල ගැටලු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ | • කමිටුවේ යොමු නිර්දේශ සමාලෝචනය කිරීම<br>• හඳුනාගත් ඉහළ අවදානම් වත්කම් සඳහා නිරාවරණ සීමා අඩුකිරීම (අභ්‍යන්තර LTVS) |
| විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | • විෂයපථය සමාලෝචනය – ණය ආශ්‍රිත අවදානම් මෙහෙයුම් අවදානම්<br>• වාර්තාකරණ මාර්ගය – අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත | • අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධිත ණය ඇගයීමේ යාන්ත්‍රණය සමාලෝචන කිරීම<br>• හඳුනාගත් ඉහළ අවදානම් වත්කම් සඳහා ණය අනුමත කිරීම් කේන්ද්‍රගත කිරීමට තීරණය කරන ලදී. |
| තිරසාර පාලන මෙහෙයුම් කමිටුව | • විෂයපථය සමාලෝචනය – තිරසාර කාර්යසාධනය<br>• වාර්තාකරණ මාර්ගය – ක්‍රමෝපායික තිරසාර වැඩසටහන් ප්‍ර.වි.නි. හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කෙරේ | • CSR වැඩසටහන් සඳහා ක්‍රමෝපායික අවධානිත ක්ෂේත්‍ර සමාලෝචනය.<br>• පාරිසරික කළමනාකරණ ක්‍රමය සංවර්ධනය<br>• ගෝලීය තිරසාර සංවර්ධන අරමුණු අභිවර්ධනයට සහයවීමේදී රජයේ ආයතන වලින් වඩා ක්‍රමෝපායික ආයතනික හවුල්කරුවන් සමඟ සහයෝගීවීම |




ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත ඉහළම සමාගම් 50 ඇගයීමට ලක්කළ ආයතනික වාර්තාකරණය පිළිබඳ විනිවිදභාවය (TRAC) තුළ අංක 03 හි ශ්‍රේණිගතකරන ලදී

# ආයතනික පාලනය



## ප්‍ර.වි.නි. ගේ කාර්යභාරය

ප්‍රධාන විධායක නිලධාරී යනු කළමනාකරණයේ සහය සමඟ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීමේ වගකීම් දරමින් සමාගමේ ඉතා ඉහළම මට්ටමේ විධායක තනතුර වේ. අවදානම කළමනාකරණය කර තක්සේරු කිරීමට සුදුසු අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කර ඇති බව සහතික කිරීමට සමාගමේ ක්‍රමෝපාය සහ එහි පසුකාලින ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීමට ප්‍රධාන විධායක නිලධාරී වගකීමට බැඳේ. ඔහු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී කළමනාකරණය නියෝජනය කරයි.

## ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීගේ ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දක්වා ඇති මූල්‍යමය සහ මූල්‍යමය නොවන ඉලක්ක අත්කර ගැනීමට හැකිවන ආකාරයකින් ව්‍යාපාර මෙහෙයවීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී වගකීමට බැඳී සිටී. ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ කාර්යසාධනය මූල්‍ය වසර අවසානයේදී මෙන්ම ඉලක්ක අනුව එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කෙරේ.

## කළමනාකරණය සඳහා අනුප්‍රාප්ත සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව අනුප්‍රාප්ත සැලසුම්කරණයේ සහ නායකත්ව සංවර්ධන සැලසුම්වල වැදගත්කම හඳුනාගෙන ඇත. සමාගමේ ප්‍රධාන තනතුරුවලට අනාගත අනුප්‍රාප්තිකයින්ගේ වෘත්තීය සංවර්ධනය සහ නායකත්ව සංවර්ධනය සහතික කිරීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සමාගමේ වර්තමාන අනුප්‍රාප්ත සැලැස්ම සමාලෝචනය කෙරේ.

## අනුකූලතාව සඳහා අපගේ ප්‍රවේශය

මනා ආයතන පාලන ව්‍යහාර ආයතනගත කිරීමට, විනිවිද සහ ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියට සහයවීමට හා පවත්වා ගැනීමට මෙන්ම අවදානම හා අනුකූලතාව කළමනාකරණය කර ගැනීමට සැලසුම්කළ ශක්තිමත් අනුකූලතා ප්‍රතිපත්ති සහ අභ්‍යන්තර ප්‍රඥප්ති අප ශක්තිමත් කර ඇත.

## අභ්‍යන්තර විගණනය

අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමාගම තුළ ක්‍රියාවලි සහ පාලනයන් මත ස්වාධීන අවදානම් පදනම් පාලනයක් ලබාදිමට අභ්‍යන්තර විගණනය වගකීමට බැඳී සිටී.

අවදානම් පදනම් සමාලෝචන පැවැත්වීමට කාලානුරූපව සුදුසුකම්ලත් සහ මනාව පළපුරුදු සේවකයින් කණ්ඩායමක් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා අතර මේ මගින් මූල්‍යමය, මෙහෙයුම්ගත සහ තොරතුරු තාක්ෂණ කාර්යයන් පිළිබඳ සහතිකයක් ලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත විගණන ප්‍රඥාප්තිය අභ්‍යන්තර විගණනය සඳහා බලය සහ අධිකාරිය ලබා දේ.

## අභ්‍යන්තර පාලනය

අපගේ අභ්‍යන්තර පාලන ක්‍රමය මගින් සමූහයට බලපාන අවදානම් හඳුනාගැනීම, ඇගයීම් සහ කළමනාකරණය සිදුකරයි. මෙම අභ්‍යන්තර පාලනයන් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරන අතර එයට මූල්‍ය, මෙහෙයුම්, අනුකූලතාව සහ තොරතුරු තාක්ෂණ පාලනයන්, අවදානම් කළමනාකරණ පාලනයන් සහ යාන්ත්‍රණ ඇතුළත් වේ.

අභ්‍යන්තර පාලනයේ ඵළදායිත්වය සහ අදාළත්වය අධ්‍යක්ෂ මණ්ඩල, විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහයෝගය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අභ්‍යන්තර පාලන පද්ධති මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගනුලැබූ ක්‍රියාවලිය මත බාහිර විගණකයින්ගෙන් සහතික කිරීමක් අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගෙන ඇත.

## අවදානම් කළමනාකරණය

ආයතනය තුළ අවදානම් හඳුනාගැනීම සහ පාලනය සහතික කිරීමට විස්තරාත්මක අවදානම් කළමනාකරණ රාමුවක් තුළින් එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම් සහ ක්‍රමෝපායික සැලසුම්කරණය තුළ අපි අවදානම් කළමනාකරණ ඇතුළත් කර ඇත.

සමූහය තුළ තනි සමාගම් විසින් මෙන්ම සමස්ත සමූහය විසින් මුහුණපාන අවදානම් මට්ටම හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය, නියාමනය සහ වාර්තාකරණය සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් ක්‍රියාවට නංවා ඇත.

## අනුකූලතා කාර්යය

දැනට පවතින සහ ඇතිවන රෙගුලාසි සමඟ තවදුරටත් අනුකූලතාව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කරන වෙන් වූ අනුකූලතා කාර්යයක් අපි ස්ථාපිත කර ඇත.

විස්තරාත්මකව අනුකූලතාව පිළිබඳ සොයා බැලීමට 85 සිට 111 දක්වා පිටු බලන්න.

## තොරතුරු තාක්ෂණය පාලනය සහ සයිබර් ආරක්ෂාව

තොරතුරු තාක්ෂණ (IT) යනු ක්‍රමෝපායික වත්කමක් වන අතර, මනාව ස්ථාපිත තොරතුරු තාක්ෂණ (IT) පාලන ව්‍යුහයක් තුළ තරඟකාරී ප්‍රතිලාභ ලබාදේ.

තොරතුරු තාක්ෂණ (IT) පද්ධතියේ රහස්‍යතාව, අවංකකම සහ ලබාගතහැකිවීම සහතික කිරීමට අභ්‍යන්තර විගණකවරුන් විසින් නිරන්තරව තොරතුරු ආරක්ෂක විගණන පවත්වනු ලබයි.

තොරතුරු තාක්ෂණ (IT) පාලන රාමුව ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩව නියාමනය කරයි. තොරතුරු සන්නිවේදන තාක්ෂණ (සමූහය) ප්‍රධානී තොරතුරු තාක්ෂණ (IT) පාලන රාමුව සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාවට නැංවීම සඳහා වගකීමට බැඳී සිටින අතර වැදගත් තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සහ අදාළ කරුණුවල තත්ත්වය පිළිබඳ නිරන්තර යාවත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දේ. සමාගමේ ප්‍රධාන තොරතුරු නිලධාරී ලෙස තොරතුරු සන්නිවේදන තාක්ෂණ (සමූහය) ප්‍රධානී පත්කර ඇත.

## පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය

අපගේ පාලන සංස්කෘතිය සියලුම කොටස්කරුවන්ට සාධාරණව සහ සමානව සැලකීම ප්‍රවර්ධනය කිරීමට කැප වී ඇත. ඒ අනුව සෑම අවස්ථාවකදීම කොටස්හිමියන්ගේ අයිතිවාසිකම්වලට ගරුකරමින් ආරක්ෂා කරමු. මෙසේ, අපගේ වාණිජමය ස්වශක්තතාව අත්කර ගැනීමට යහපත් පාර්ශ්වකාර සම්බන්ධතා පවත්වා ගැනීම අපි සහතික කරන්නෙමු.

## වාර්ෂික මහ සභා රැස්වීම (AGM) ප්‍රයෝජනවත්ව භාවිතා කිරීම

වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය එය පැවැත්වීමට වැඩකරන දින 15කට පෙර කොටස්හිමියන්ට පුද්ගලිකවම සන්නිවේදනය කරන අතර එකී නිවේදනයට රැස්විමේදී සාකච්ඡා කරනු ලබන කරුණුවල ස්වභාවය ඇතුළත්ය. කොටස්හිමියෙකුට රැස්වීමට පැමිණීමට නොහැකිනම්, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය කොටස්හිමියා වෙනුවෙන් රැස්වීමේදී ඡන්දය ලබාදීමට බලය ඇති පෙරකලාසිකරුවෙක් පත්කිරීමට ඉඩ දී ඇති අතර පෙරකලාසිකරුවෙක් පත්කිරීම රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට අවම වශයෙන් පැය 48කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දිය යුතුය. වාර්ෂික මහ සභාවේදී සමාගමේ කාර්යසාධනය සහ එයට අදාළ කරුණු පිළිබඳ සාකච්ඡාව තුළ සක්‍රියව නිරතවීමට කොටස්හිමියන්ට හැකියාව ඇත.

# ආයතනික පාලනය

## ආයතන පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය සමඟ අනුකූලතාව

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කළ මනා පරිච සංග්‍රහය (සංග්‍රහය) සමඟ අනුකූලතාව – 2017

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **සමාගම** | | | |
| **A අධ්‍යක්ෂවරු** | | | |
| A.1 | **අධ්‍යක්ෂ මණ්ඩලය**<br>පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) හි අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුකරණය, ගිණුම්කරණය සහ මූල්‍යකරණ, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණ උපදේශනය, මානව සම්පත් කළමනාකරණය සහ නීති වැනි විවිධ විෂයයන්ගේ කීර්තිමත් වෘතිකයින් නවදෙනෙකුගෙන් සමන්විත වන අතර සමාගම එහි පරමාර්ථ අත්කර ගන්නා බව සහතික කිරීමට ක්‍රියාත්මකව කැපවී සිටී. සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගමට නායකත්වය ලබාදීමට අවංකවීමේ ඉහළ හැඟීමෙන් සහ ස්වාධීන විනිශ්චය සමඟ අනුපූරණය වන නිපුනතාව, පළපුරුද්ද සහ දැනුම සතු වේ. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය |
| A.1.1 | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම**<br>සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල කාර්යසාධනය සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසික පදනමක් මත පවත්වන අතර මූල්‍ය වසර තුළ රැස්වීම් 11ක් පවත්වා ඇත. සියලුම පාර්ශ්වකරුවන්ගේ යහපත සහ අපේක්ෂාවන් සමඟ සමාගම සහ සමූහයේ ක්‍රමෝපායන් සහ මෙහෙයුම් පෙළගැසීමට සුදුසු සහ කඩිනම් පියවර ගනු ලැබූ බව සහතික කරමින් පාලන සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ සමාගමේ ක්‍රමෝපාය, කාර්යසාධනය, අවදානම් පැතිකඩ සහ අනුකූලතාව ඇගයීම තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සැලකියයුතු කාලයක් යොමු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයට තොරතුරු ඉදිරිපත් කිරීමේ ව්‍යූහය සහ ක්‍රියාවලිය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ආයතනික පාලන ප්‍රඥප්තියේ ලේඛනගත කෙරේ.<br>2020 මාර්තු මස 31 සඳහා නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම කොවිඩ්-19 වයිරසය පැතිරීමේ තර්ජනයට අනුව රජය විසින් පනවන ලද දිවයින පුරා ඇඳිරි නීතිය හේතු කොට ගෙන අවලංගු කරන ලදී. මෙම විධිවිධානයට අනුකූල නොවීම සම්බන්ධයෙන් සමාගම මත පනවන ලද නියාමන සම්බාධක නොමැති බව ශ්‍රී ලංකා මහ බැංකුව තහවුරු කරන ලදී. | ✓ | CG – අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම |
| A.1.2 | **අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම් සහ රාජකාරි සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇති අතර ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ අවශ්‍යතා සපුරාලීමට යාවත් කෙරේ. | ✓ | |
| A.1.3 | **රටේ නීතියට අනුකූලව කටයුතු කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය තනි තනිව සහ සාමූහිකව සමාගමට අදාළ වන්නා වූ රටේ නීතියට අනුකූල වී ඇත.<br>සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය සහ ව්‍යාපාර සහ සදාචාර සංග්‍රහය පැහැදිලිව සකස් කරනු ලැබ ඇති අතර, අවශ්‍යයයි සලකනු ලබන අවස්ථාවල අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන වෘත්තීය උපදේශ ලබාගැනීම සඳහා ක්‍රියාත්මක අවස්ථාව අනුමත කරන ලදී. | ✓ | |
| A.1.4 | **සමාගම් ලේකම්ගේ සේවය කරා පිවිසීම සහ සමාගම් ලේකම් ඉවත් කිරීම**<br>සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම් කරා පිවිසිය හැකි අතර ඇය වෘතියෙන් නීතිඥවරියකි. සමාගම් ලේකම් පත්කිරීම හෝ ඉවත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. | ✓ | CG – සමාගම් ලේකම් |
| A.1.5 | **අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන විනිශ්චය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායි සහ සංශක්ති ඒකකයක් ලෙස කටයුතු කරන අතර, එක් පුද්ගලයෙක් කෙරෙහි අනවශ්‍ය විශ්වාසය නොතබමින් එක් එක් අධ්‍යක්ෂවරයාගේ ශක්තිය මත එය කටයුතු කරයි. මෙලෙස, සියලුම අධ්‍යක්ෂවරුන්ට ක්‍රමෝපාය, කාර්යසාධනය, සම්පත් වෙන්කිරීම සහ ව්‍යාපාර කරගෙනයාම සම්බන්ධ ගැටලු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ තුළ ස්වාධීන විනිශ්චය ලබාදීමට නිදහස ඇත. | ✓ | CG – අධ්‍යක්ෂ මණ්ඩලය<br>CG – බැදියා පිළිගැටුම් කළමනාකරණය |
| A.1.6 | **අධ්‍යක්ෂ මණ්ඩල කරුණු කෙරෙහි ප්‍රමාණවත් කාලය සහ උත්සාහය යෙදවීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සමාගම සඳහා ඔවුන්ගේ රාජකාරි සහ වගකීම් ඵලදායි අයුරින් මුදාහරින බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු රැස්වීම්වලට ප්‍රමාණවත් කාලය සහ උත්සාහය යොදවනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, කමිටු පත්‍රිකා, සහ වාර්තා අධ්‍යක්ෂවරු වෙත රැස්වීමට නියමිත වේලාවට පෙර බෙදාහරිනු ලැබේ. | ✓ | CG – අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්<br>CG – 2019/20 මූල්‍ය වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන අවධානිත ක්ෂේත්‍ර |

# ආයතනික පාලනය



| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| A.1.7 | **සමාගමේ මනා යහපත උදෙසා අධ්‍යක්ෂවරු විසින් යෝජනා කැඳවීම**<br>සමාගමේ මනා යහපත සඳහා අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් එකකට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු යෝජනාවක් සඳහා කැඳවිය හැකිය.<br>කෙසේවෙතත්, සමාලෝචිත වසර තුළ එවැනි අවස්ථා ඇති නොවුණි. | ✓ | |
| A.1.8 | **අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ප්‍රේරණය සහ පුහුණුව**<br>අධ්‍යක්ෂ මණ්ඩලයට පළමුවෙන් පත්කරනු ලබන විට, සියලුම අධ්‍යක්ෂවරුන් වෙත ප්‍රේරණයක් ලබාදෙන අතර මූල්‍ය ක්ෂේත්‍රය සහ නව රෙගුලාසිවල නව සංවර්ධනයන් පිළිබඳ කළමනාකරණය අධ්‍යක්ෂවරුන් යාවත් කරයි. ඊට අමතරව, අධ්‍යක්ෂවරු ඔවුන්ට අදාළ ක්ෂේත්‍රය තුළ අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය තුළ නිරත වේ. | ✓ | CG – ප්‍රේරණය සහ අඛණ්ඩ පුහුණුව |
| A.2 | **සමාගමේ ව්‍යාපාර කළමනාකරණය සඳහා විධායක වගකීමෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු විභජනය**<br>සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ රාජකාරි පැහැදිලිව නිර්වචනය කරන අතර එහිදී සභාපති ක්‍රමෝපායික දැක්ම ඉදිරියට ගෙනයාමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිත්වය සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීමේ වගකීම පැවරෙන අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ සහයෝගයෙන් සමාගමේ ව්‍යාපාර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ මූලික කාර්යභාරය ලෙස සලකනු ලැබේ. | ✓ | CG – සභාපතිගේ කාර්යභාරය සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය |
| A.2.1 | **සභාපතිතුමාගේ කාර්යභාරය සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ කාර්යභාරය වෙන් කිරීම**<br>සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි අතර තනතුරුවල පැහැදිලි වෙන්කිරීමක් ඇත. සභාපති විධායක නොවන ස්වාධීන නොවන සභාපතිවරයෙක් ලෙස කටයුතු කරන අතර ප්‍රධාන විධායක නිලධාරී කළමනාකරණය සමඟ සහයෝගයෙන් සමාගමේ ව්‍යාපාර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට මූලික වගකීම සහිත ඉහළම විධායක නිලධාරියා වේ. | ✓ | |
| A.3 | **ආයතන යහපාලනය ආරක්ෂා කිරීමේදී සභාපතිගේ කාර්යභාරය**<br>සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය සඳහා වගකීමට බැඳී සිටින අතර, ආයතන යහපාලනය ආරක්ෂා කරමින් සියලුම අංගයන්හි දී එහි ඵදායිත්වය සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු පිළිබඳ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ දායකත්වය ලබාදීම සිදුකරයි එමෙන්ම ඔහු සමාගම සඳහා උචිත නායකත්වය ලබාදෙමින් සහ කොටස්හිමියන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ අදහස් අවබෝධ කර ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමට බැඳ සිටී. | ✓ | CG – සභාපතිගේ කාර්යභාරය |
| A.3.1 | **අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු විධිමත් ආකාරයෙන් පැවැත්වීම සඳහා සභාපතිගේ වගකීම්**<br>යහපාලනය ආරක්ෂා කිරීම සඳහා සහ ක්‍රමවත් සහ කාර්යක්ෂම ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම සඳහා සභාපතිගේ කාර්යභාරය සහ වගකීම් සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කෙරේ. | ✓ | |
| A.4 | **මූල්‍ය විචක්ෂණභාවය සහ දැනුම සහිත තැනැත්තන් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සිටීම**<br>2019/20 වසර තුළ, බැංකුකරණ, ගිණුම්කරණය සහ මූල්‍යකරණ, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණ උපදේශනය, මානව සම්පත් කළමනාකරණය සහ නීතිය අංශ තුළ උගත් සහ වෘත්තීමය සුදුසුකම් සහිත සාමාජිකයින්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය. | ✓ | CG – අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ මූල්‍ය විචක්ෂණභාවය |
| A.5 | **අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ තුලනයක් තිබීම**<br>සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති. | ✗ | |
| A.5.1 | **අධ්‍යක්ෂ මණ්ඩලයට සම්පූර්ණ අධ්‍යක්ෂවරුන්ගෙන් අවම වශයෙන් තිදෙනෙක් හෝ තුනෙන් එකක් යන දෙකෙන් වැඩි අගය විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම.**<br>2019/20 වසර තුළ, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වූ අතර ඔවුන්ට විවිධ මාතෘකා ගණනාවක් ආවරණය කරන දැනුම් සංචිතයක් සහ පළපුරුද්ද ඇත. ඔවුන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ කෙරෙහි සැලකියයුතු ලෙස බලපා ඇත.<br>සභාපති ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සියලු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති. | ✓ | CG – අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ මූල්‍ය විචක්ෂණභාවය |
| A.5.2 | **විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අවම වශයෙන් තිදෙනෙක් හෝ තුනෙන් දෙකක් යන දෙකෙන් වැඩි දෙනා ස්වාධීන අධ්‍යක්ෂවරුන් වීමේ අවශ්‍යතාව**<br>2020 මාර්තු මස 31 වන දිනට අධ්‍යක්ෂවරුන් නවදෙනාගෙන් තිදෙනෙක් පමණක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස සලකනු ලබයි. | ✗ | |

# ආයතනික පාලනය

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| A.5.3 | **අධ්‍යක්‍ෂවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීම**<br>2019/20 වසර තුළ, සමාගමේ සියලුම ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය (සංග්‍රහය) ඇතුළුව අදාළ නීති සහ රෙගුලාසිවල දක්වා ඇති ස්වාධීනත්වය සඳහා වන නිර්ණායක සපුරා ඇති අතර කළමනාකරණයෙන් නිදහස් ලෙස සලකනු ලබන අතර ඔවුන්ගේ නිදහස් සහ ස්වාධීන විනිශ්චය ක්‍රියාත්මක කිරීම සමඟ සැලකියයුතු ලෙස මැදිහත්වන ව්‍යාපාර හෝ අනෙකුත් සම්බන්ධතාවන්ගෙන් නිදහස්ය. | ✓ | CG – ස්වාධිනත්වය ඇගයීම |
| A.5.4 | **අධ්‍යක්‍ෂවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රකාශය**<br>සමාලෝචිත වසර තුළ, අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව තම ස්වාධීනතා තත්ත්වය ප්‍රකාශ කරමින් එක් එක් විධායක නොවන අධ්‍යක්‍ෂවරයා විසින් ස්වයං ප්‍රකාශ ඉදිරිපත් කරන ලදී. | ✓ | CG – ස්වාධිනත්වය ඇගයීම |
| A.5.5 | **එක් එක් විධායක නොවන අධ්‍යක්‍ෂවරයාගේ ස්වාධීන හෝ ස්වාධීන නොවන බවට අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්ෂික ඇගයීම**<br>අධ්‍යක්‍ෂවරුන් විසින් ඉදිරිපත් කළ වාර්ෂික ඇගයීම් මත පදනම් වී, අදාළ රෙගුලාසි සහ සංග්‍රහයේ අවශ්‍යතාවන්ට අනුකූලව ස්වාධීනත්වය තීරණය කිරීම සඳහා වන නිර්ණායක සමඟ අනුකූලතාව සහතික කිරීමට විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගේ ස්වාධීනත්වය වාර්ෂිකව ඇගයීමට ලක් කරනු ලබයි. | ✓ | |
| A.5.6 | **එම නිර්ණායක සපුරාලීමට විධායක නොවන හෝ ස්වාධීන අධ්‍යක්‍ෂවරුන් විසින් විකල්ප අධ්‍යක්‍ෂවරයෙක් පත් කිරීම**<br>කිසිදු විකල්ප අධ්‍යක්‍ෂවරයෙක් 2019/20 වසර තුළ පත් කර නැත. | අදාළ නැත | |
| A.5.7 | **සභාපති ස්වාධීන නොවන අවස්ථාවක දී ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙක් පත්කිරීම**<br>මූල්‍ය සමාගම් (ආයතනික පාලන) විධානයන්ට අනුකූලව, සමාගම විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙක් ජ්‍යෙෂ්ඨ ස්වාධින අධ්‍යක්‍ෂවරයා ලෙස පත්කර ඇත. එබැවින්, ස්වාධීන, විධායක නොවන අධ්‍යක්‍ෂ, එම්.පී. අමිර්තනායගම් මහතා 2019 ඔක්තෝබර් මස 25 දින සමාගමේ සභාපති ලෙස පත්කරන තුරු සමාගමේ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙක් ලෙස කටයුතු කරන ලදී.<br>සුජීව රාජපක්ෂ මහතා නව ස්වාධීන නොවන සභාපති ලෙස පත්කිරීමට පසුව 2020 මාර්තු මස 1 දින සිට ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්‍ෂ ලෙස එම්. කොරලි පීටර්ස් මහත්මිය පත්කරන ලදී. | ✓ | |
| A.5.8 | **ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්‍ෂ අනෙකුත් අධ්‍යක්‍ෂවරු සමඟ සාකච්ඡාවලට සහභාගිවීම**<br>මූල්‍ය සමාගම් (ආයතනික පාලන) විධානයන්ට අනුකූලව පත්කරන ලද ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්‍ෂවරයා ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විධිමත් පරිදි සැලකිල්ලට ගෙන නොමැති බවට විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් විශ්වාස කරන යම් ගැටලු සම්බන්ධයෙන් අනෙකුත් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් සමඟ සාකච්ඡාවන් සඳහා සහභාගි වියයුතු අතර අවශ්‍යනම් ඔහුගේ ඇයගේ මතය අනුව විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගේ රැස්වීමක් කැඳවිය යුතුය.<br>ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්‍ෂ සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීමට සහභාගි වන බවට සහතික කළ යුතු අතර එහිදී සියලුම කොටස්හිමියන්ට ඔවුන්ගේ ගැටලු පිළිබඳ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්‍ෂ සමඟ අදහස් ප්‍රකාශ කිරීමට සහ ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දේ. | ✓ | |
| A.5.9 | **අවම වශයෙන් වසරකට වරක් විධායක නොවන අධ්‍යක්‍ෂවරු සමඟ සභාපති රැස්වීම් පැවැත්වීම**<br>2019/20 වසර තුළ, අධ්‍යක්‍ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගෙන් පමණක් සමන්විත වූ බැවින් මෙම අවශ්‍යතාව පැණ නොනැගිණි. | අදාළ නැත | |
| A.5.10 | **අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාවල ඒකමතිකව විසඳීමට නොහැකි වූ කරුණු වාර්තා කළ යුතුවීම**<br>නොවිසඳුණු කරුණුවලට අදාළ අධ්‍යක්‍ෂවරුන්ගේ අදහස් සාකච්ඡා කර ප්‍රමාණවත් විස්තර සමඟ අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාවල සමාගම් ලේකම් විසින් වාර්තා කරනු ලබයි. මෙවැනි කරුණු පිළිබඳ වැඩිදුර සාකච්ඡා ඒවා විසඳීමේ අදහස ඇතිව ඉදිරි අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කෙරේ.<br>කෙසේවෙතත්, එවැනි ගැටලු කිසිවක් සමාලෝචිත වසර තුළ මතු නොවීය. | ✓ | |
| A.6 | **තොරතුරු සැපයීම**<br>විස්වාසී සහ කාලින තොරතුරු සමාගම තුළ තිරණ ගන්නන් අතර විශ්වාසය වැඩි කරන බව සහ ව්‍යාපාර වර්ධනය, ලාභදායිතාව සහ තිරසාරභාවයට සෘජුවම බලපාන යහපත් ව්‍යාපාර තිරණ ගැනීමට ඉන් ඔවුන්ට හැකියාව ඇති කරන බව සමාගම විශ්වාස කරයි. | ✓ | |

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| A.6.1 | **අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සුදුසු සහ කාලීන තොරතුරු ලබා දීමට කළමනාකරණයේ බැඳීම**<br>සමාලෝචනය කිරීම සහ සාකච්ඡාව සඳහා සූදානම්වීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් සහිතව සෑම මාසයකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර කාලීන, නිවැරදි, අදාළ සහ සම්පූර්ණ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සපයනු ලැබූ බව කළමනාකරණය සහතික කර සිටී. අවශ්‍ය තැන්වලදී කළමනාකරණයෙන් අමතර තොරතුරු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විමසීම් කර ඇත.<br>එමෙන්ම, සියලුම අධ්‍යක්ෂවරුන් වෙත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු වූ ගැටලු පිළිබඳ ප්‍රමාණවත් අයුරින් පැහැදිලි කළ බව සභාපති සහතික කරන ලදී. | ✔ | |
| A.6.2 | **අවම වශයෙන් රැස්වීමට දින හත (7) කට පෙර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා අවශ්‍ය වාර්තා, න්‍යාය පත්‍රය සහ පත්‍රිකා ලබාදීමේ අවශ්‍යතාව**<br>න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සතියකට පෙර බෙදාහරින ලදී.<br>සාමාන්‍යයෙන් රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමග ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අවම වශයෙන් සතියකට පෙර අධ්‍යක්ෂවරු වෙත ලබා දේ. | ✔ | |
| A.7 | **අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලයට නව සාමාජිකයින් තෝරාගැනීම සහ බඳවාගැනීමට අදාළ වන්නා වූ විධිමත්, විනිවිද සහ සවිස්තරාත්මක ක්‍රියාපටිපාටියක් සාංගමික ව්‍යවස්ථාවලියේ සහ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. | ✔ | |
| A.7.1 | **නව අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් පිළිබඳ නිර්දේශ කිරීමට නාමයෝජනා කමිටුව ස්ථාපිත කිරීම**<br>පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුවක් ස්ථාපිත කර ඇත. | ✔ | පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව |
| A.7.2 | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය වාර්ෂිකව තක්සේරු කිරීම**<br>වාර්ෂික ස්වයං ඇගයීම් ක්‍රියාවලිය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පළපුරුද්ද සහ අනාවරණය සමාගම විසින් මුහුණ දෙන ක්‍රමෝපායික ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වේද යන්න තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සමස්තයක් ලෙස එයට අයත් සංයුතිය ඇගයීමට ලක් කරන අතර මෙම ඇගයීම්වල සොයා ගැනීම් නව අධ්‍යක්ෂවරු පත්කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ. | ✔ | CG – අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයීම |
| A.7.3 | **අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරු පත්කිරීම් කොටස්හිමියන්ට අනාවරණය කළ යුතුවීම**<br>සමාලෝචිත වසර තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය දෙවරක් නැවත පිහිටුවනු ලැබූ අතර එම අවස්ථා දෙක පිළිබඳ කොළඹ කොටස් හුවමාරුව තුළින් ඉක්මන් අනාවරණය සමඟ කොටස්හිමියන් දැනුවත් කරන ලදී. සමාලෝචිත වසර තුළ මේ අනුව, අධ්‍යක්ෂවරුන්ගේ නව පත්කිරීම් නවයක් සිදුවිය. | ✔ | |
| A.8 | **නැවත - පත්කිරීම**<br>සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 27 (2) වගන්තිය අනුව, වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබ ඇති සියලුම අධ්‍යක්ෂවරු ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීමේදී විශ්‍රාම ගන්නා අතර කොටස්හිමියන් විසින් නැවත-පත්කිරීම සඳහා ඔවුන් සුදුසුකම් ලබයි. | ✔ | |
| A.8.1 | **විධායක නොවන අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීමට යටත්ව විශේෂිත කාලයක් සඳහා පත්කළ යුතුය**<br>විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂිත කාලසීමාවක් සඳහා පත් කරනු නොලැබුවත්, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්ති සහ අධ්‍යක්ෂවරයෙක් ඉවත් කිරීමට අදාළව සමාගම් පනතේ විධිවිධානවලට අනුව වාර්ෂික මහ සභා රැස්වීමේදී නැවත පත්කරනු ලැබීමට යටත් වේ. | ✔ | |
| A.8.2 | **සභාපති ඇතුළුව සියලුම අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්කිරීමෙන් පසු පළමු අවස්ථාවේදී සහ නිරන්තර කාල තුළ කොටස්හිමියන්ගේ තෝරා ගැනීමට යටත් වේ.**<br>සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 27 (2) වගන්තිය අනුව, සභාපති ඇතුළුව සියලුම අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්කිරීමෙන් පසු පළමු අවස්ථාවේදී කොටස්හිමියන්ගේ තෝරා ගැනීමට යටත් වේ.<br>ඒ අනුව, වාර්ෂික වාර්තාවේ දිනයට අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනට සිටින සාමාජිකයින් ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීමේදී නැවත පත්කිරීම සඳහා අවස්ථාව පිරි නැමේ. | ✔ | |

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| A.8.3 | **ඉල්ලා අස්වීම සඳහා හේතු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දීම**<br>සමාලෝචිත වසර තුළ, සභාපති, හේමසිරි ප්‍රනාන්දු මහතා වයස අවුරුදු 70ට ලඟාවීම මත 2019 ඔක්තෝබර් මස 12 දින විශ්‍රාමයන ලදී. ජෙහාන් ප්‍රසන්න අමරතුංග මහතා, ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතා, මොහමඩ් රිස්වාන් මොහමඩ් අනීස් මහතා, ආචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා, එන්.ඩබ්ලිව්.ඒ.එම්.යූ.කේ.කේ.ඊ. වීරසිංහ මහතා යන අයගේ ඉල්ලා අස්වීම් 2019 දෙසැම්බර් මස 30 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද අතර, ප්‍රදීප් අමිර්තනායගම් මහතා, රංජිත් කොඩිතුවක්කු මහතා, එම්.ඒ. බොනිෆස් මහතා යන අයගේ ඉල්ලා අස්වීම් 2020 පෙබරවාරි මස 19 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලදී.<br>රසිත ගුණවර්ධන මහතාගේ ඉල්ලා අස්වීම 2020 ජූනි මස 25 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලදී.<br>ඔවුන්ගේ ඉල්ලා අස්වීමේ ලිපි සාකච්ඡාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරියේ සභාගත කරන ලද අතර අනුමැතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඉල්ලා අස්වීම්වලට අදාළ හදිසි අනාවරණ කොළඹ කොටස් හුවමාරුව තුළින් ජනතාව වෙත සිදු කරන ලදී. | ✓ | |
| A.9 | **අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ භාරකාර වගකීම් ඔවුන් සපුරාලන්නේද සහ පාර්ශ්වකරුවන්ට අගය එකතු කරන්නේද යන්න සමාලෝචනය කිරීම සඳහා වැදගත් අවස්ථාවක් ඔවුන් වෙත ලබාදීමට ඔවුන්ගේ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව ඇගයීමට ලක්කරයි. | ✓ | CG – අධ්‍යක්ෂ මණ්ඩල කාර්යාධනය ඇගයීම |
| A.9.1 | **අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු ප්‍රධාන වගකීම් මුදා හැරීමේදී එහි කාර්යසාධනය පිළිබඳ වාර්ෂික ඇගයීම**<br>සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියට අනුකූලව, 2020 ජූනි මස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කාර්යසාධනය සහ එහි කමිටු පිළිබඳ සම්පූර්ණ ඇගයීමක් සිදුකරන ලදී.<br>අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීමේ සම්පූර්ණ ප්‍රතිඵල සමාගමේ ලේකම් විසින් විශ්ලේෂණය කර සොයා ගැනීම් 2020 ජූලි මස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී | ✓ | |
| A.9.2 | **අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිළිබඳ වාර්ෂික ස්වයං- ඇගයීම**<br>2019/20 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකළ ස්වයං-ඇගයීමට සමස්තයක ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙන්ම එහි කමිටුවල කාර්යසාධනය පිළිබඳ ඇගයීමක් ඇතුළත් විය. | ✓ | |
| A.9.3 | **නැවත තෝරා ගැනීමේදී අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය, දායකත්වය සහ නිරතවීම පිළිබඳ සමාලෝචනය**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ අරමුණු සහ ඉලක්ක පැහැදිලිව දක්වා ඇති අතර එක් එක් වසර අවසානයේදී ඇගයීමට ලක් කෙරේ. | ✓ | |
| A.9.4 | **කාර්යසාධන ඇගයීම් පවත්වා ඇති ආකාරය වාර්ෂික වාර්තාවේ සඳහන් කිරීම**<br>2019/20 දී සිදුකළ අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය සභාපති විසින් මෙහෙයවන ලද අතර සමාගම් ලේකම් විසින් සහය විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇගයීම්වල සම්පූර්ණ ප්‍රතිඵල පසුව විශ්ලේෂණය කර 2020 ජූලි මස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. ඒ තුළින් සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු ඵලදායි අයුරින් ක්‍රියාත්මක වී ඇති බව විධිමත්ව සහතික කරයි. | ✓ | |
| A.10 | **අධ්‍යක්ෂවරු සම්බන්ධ තොරතුරු අනාවරණය කිරීම**<br>දැනුවත් තීරණ ගැනීමට හැකියාව ඇති කරමින් කොටස්හිමියන් වෙත අදාළ සියලුම තොරතුරු කාලීනව අනාවරණය කිරීමට සමාගම සැලකියයුතු වැදගත්කම දක්වා ඇත. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය |
| A.10.1 | **අධ්‍යක්ෂවරු සම්බන්ධ විශේෂ තොරතුරු වාර්ෂික වාර්තාවේ අනාවරණය කිරීම**<br>අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම්, ප්‍රවීනත්වය, පළපුරුද්ද සහ අධ්‍යක්ෂධූර දැරීම, අධ්‍යක්ෂවරුන්ගේ තත්ත්වය, අධ්‍යක්ෂ මණ්ඩල සහ එහි කමිටු රැස්වීම්වලට පැමිණීම, ඔවුන්ගේ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු හෝ සමාන තනතුරු සහ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර මෙම වාර්තාව තුළ ලබාගහැක. | ✓ | CG – අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල පැමිණීම – සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ |
| A.11 | **ප්‍රධාන විධායක නිලධාරී (CEO) ඇගයීම**<br>සමාගමේ ඉහළම විධායක නිලධාරී වන ප්‍රධාන විධායක නිලධාරී වෙත සමාගමේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ සුදුසු අවදානම් පරාමිතිවලට අනුකූලව සමාගමේ එදිනෙදා මෙහෙයුම් කරගෙන යාමට අවශ්‍ය බලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදී ඇති අතර වාර්ෂිකව ඇගයීමට ලක් කෙරේ. | ✓ | CG – ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ ඇගයීම් |

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| A.11.1 | **අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී සමඟ උපදේශකත්වයෙන් ප්‍රධාන විධායක නිලධාරී විසින් සපුරාලිය යුතු මූල්‍ය සහ මූල්‍ය නොවන ඉලක්ක සකස් කිරීම**<br>සමාගමේ කෙටි, මධ්‍ය සහ දිගු කාලීන පරමාර්ථ සහ සමස්ත ක්‍රමෝපායික සැලැස්මට අනුකූලව එක් එක් මූල්‍ය වසර ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරී සමඟ උපදේශකත්වයෙන් සියලුම මූල්‍ය සහ මූල්‍ය නොවන ඉලක්ක සකස් කරනු ලබයි. | ✓ | |
| A.11.2 | **එක් එක් මූල්‍ය වසර අවසානයේදී ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීම**<br>ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කිරීම අඛණ්ඩ ක්‍රියාවලියකි. මූල්‍ය වසර ආරම්භයේදී නියම කරන මූල්‍ය සහ මූල්‍ය නොවන ඉලක්ක සමඟ සමාගමේ කාර්යසාධනය සසඳමින් ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය එක් එක් මූල්‍ය වසර අවසානයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කෙරේ. | ✓ | |
| **B අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික** | | | |
| B.1 | **පාරිශ්‍රමික ක්‍රියාපටිපාටිය**<br>සිදුවියහැකි බැඳියා පිළිගැටුම් වැළැක්වීම සඳහා ඵලදායි පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක විධිමත් සහ විනිවිද පාරිශ්‍රමික ක්‍රියාපටිපාටියක් සමාගම ස්ථාපිත කර ඇත. යොමු නිර්දේශ සහිතව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත පාරිශ්‍රමික කමිටුවක් ද සමාගම ස්ථාපිත කර ඇත.<br>2019/20 වසර තුළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොසිටි අතර එමනිසා, ඔවුන්ගේ පාරිශ්‍රමිකය සඳහා සභාපති/හෝ ප්‍රධාන විධායක නිලධාරීට උපදෙස් ලබාදීමේ අවශ්‍යතාව පැන නොනැගිණ. | ✓ | පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව |
| B.2 | **පාරිශ්‍රමිකයේ මට්ටම සහ සකස් කිරීම**<br>සමාගමේ පාරිශ්‍රමික රාමුව කාර්යසාධනය අභිප්‍රේරණය කිරීමට සහ ප්‍රදාන ලබාදීමට ප්‍රමාණවත් වන අතර නියාමන අවශ්‍යතා සහ පාර්ශ්වකාර අපේක්ෂාවන්ට අනුකූල වේ.<br>සමාලෝචිත වසර තුළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොසිටි අතර එබැවින් එවැනි අධ්‍යක්ෂවරුන් සඳහා ආකර්ෂණීය යෝජනා සහ කාර්යසාධනය පදනම් පාරිශ්‍රමික සඳහා අවශ්‍යතාව අදාළ නොවේ.<br>එසේවුවත්, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය තුළින් වෙළෙඳපොළ අපේක්ෂාවන් පිළිබිඹු විය යුතු බව සහ සමාගම මෙහෙයවීමට සහ එහි දිගු කාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලයේ තත්ත්වය ආකර්ෂණය කර රඳවා ගැනීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලය දැණුවත්ය.<br>එමනිසා, සමාගමේ පාරිශ්‍රමික ව්‍යුහය ක්ෂේත්‍රය තුළ තරඟකරුවන්ගේ පාරිශ්‍රමික සමඟ සසඳමින් කලින් කල සමාලෝචනය කරනු ලබයි.<br>සමූහය තුළ අනෙකුත් සමාගම්වල ප්‍රමාණය සහ පරිමාණය සාපේක්ෂව කුඩාවීම හේතු කොට ගෙන, වැටුප් වැඩිවීමේ මට්ටම් පිළිබඳ තීරණය කිරීමේදී ක්ෂේත්‍රයේ සමානකමට බර තබනු ලැබේ. කෙසේවෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය තුළ පාරිශ්‍රමිකය පිළිබඳ දැඩි ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමට සමූහය උත්සාහ ගනී.<br>වර්තමානයේ, අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සඳහා කොටස් විකල්ප යෝජනා ක්‍රමයක් නොමැත. | ✓ | |
| B.3 | **පාරිශ්‍රමික පිළිබඳ අනාවරණය**<br>සමාගම එහි පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සාධාරණ සහ තරඟකාරී විය යුතුය සහ ව්‍යාපාරයේ කාර්යසාධනය පිළිබිඹු විය යුතුය යන මූලධර්මය අඛණ්ඩව යොදාගෙන ඇත.<br>පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සහ සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර පිළිබඳ ප්‍රකාශයක් මෙම වාර්තාවේ විස්තර කෙරේ. | ✓ | සම්බන්ධිත පාර්ශ්ව නිරාවරණ අනුපාතය |
| **C කොටස්හිමියන් සමඟ සම්බන්ධතාවය** | | | |
| C.1 | **වාර්ෂික මහ සභා රැස්වීම (AGM) ප්‍රයෝජනවත්ව භාවිතා කිරීම සහ සාමාන්‍ය රැස්වීම් පැවැත්වීම**<br>සමූහයේ කාර්යසාධනය කොටස්හිමියන් වෙත දැනුම්දීමට සහ ඔවුන්ගේ සක්‍රිය සහභාගිත්වය දිරිගැන්වීමට සමාගම වාර්ෂික මහ සභා රැස්වීම උපයෝගී කර ගනී. රැස්වීමේ නිවේදනය ඇතුළත් වාර්ෂික වාර්තාව නීතියෙන් අවශ්‍ය කරන පරිදි වාර්ෂික මහ සභා රැස්වීමේන් වැඩකරන දින 15 කට පෙර පෙරකලාසිපත්‍රයේ ආකෘතිය සමඟ කොටස්හිමියන් වෙත යවනු ලැබේ. | ✓ | CG – කොටස්හිමියන් සමඟ සහභාගිත්වය |

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| | එක් එක් කරුණ සඳහා වෙනම ඡන්දය ලබාදීමට අවස්ථාව කොටස්හිමියන් වෙත ලබාදෙමින් සැලකියයුතු ලෙස වෙනස්වන එක් එක් ගැටලුව පිළිබඳ සමාගම වෙනස් යෝජනා සිදුකරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව, සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ එහි ඇතුළත් විගණකවරුන්ගේ වාර්තාව සම්මත කිරීම වෙනම යෝජනාවක් ලෙස සලකනු ලබයි.<br><br>වාර්ෂික මහ සභා රැස්වීමේදී කොටස්හිමියන්ගේ ඡන්ද සමඟ එකට පෙරකලාසිකරුගේ ඡන්ද එක් එක් යෝජනාව සඳහා සමාගම විසින් සලකනු ලබයි.<br><br>එක් එක් යෝජනාව මත පෙරකලාසිකරු ගොනුකළ පෙරකලාසිවල මට්ටම සහ එකී යෝජනාවට පක්ෂව සහ විපක්ෂව ඇති ඡන්ද ගණන සභාපති වෙත දැනුම් දීම සඳහා සියලුම පෙරකලාසි ඡන්ද සමාගම වාර්තා කරයි.<br><br>"අත්හිටවූ චන්ද" යෝජනාවට පක්ෂව සහ විපක්ෂව ඇති ඡන්ද කොටස ගණනය සඳහා ගණන් කරනු නොලැබේ.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සභාපතිවරු සහ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂක කොටස්හිමියන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදිම සඳහා පැමිණ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සහතික කරයි.<br><br>2020 පෙබරවාරි මස 19 වන දින සංයුක්ත කිරීමට පෙර, හිටපු ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂක සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සභාපතිවරු 2019 ජූලි මස 31 දින පැවති වාර්ෂික මහ සභා රැස්වීමට පැමිණි අතර කොටස්හිමියන් විසින් කිසිදු ප්‍රශ්නයක් ඉදිරිපත් නොකරන ලදී. | | |
| C.2 | **කොටස්හිමියන් සමඟ සන්නිවේදනය**<br>පාර්ශ්වකරුවන් සමඟ දෙයාකාර සන්නිවේදනයේ වැදගත්කම හඳුනාගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය එහි කොටස්හිමියන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය පාලනය කරන පුළුල් ප්‍රතිපත්තියක් සොයාගෙන ඇත. කාර්යක්ෂමතාව, විනිවිදභාවය, පැහැදිලිකම සහ සංස්කෘතික දැනුම සහ ප්‍රතිපෝෂණය යන මූලධර්ම හතර මත සන්නිවේදන ප්‍රතිපත්තිය පදනම් වේ.<br><br>සමාගම් ආයතනික පාලන ප්‍රඥප්තියේ අත්‍යවශ්‍ය කොටසක් සාදන සන්නිවේදන ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමත කෙරේ.<br><br>සමාගම් ලේකම් සහ ආයතන කටයුතු අංශය කොටස්හිමියන්ගෙන් ලැබෙන සියලුම ලිපිගනුදෙනු වාර්තා පවත්වාගන්නා අතර විසඳීම සඳහා සුදුසු මාර්ගවලට ඒවා යොමු කෙරේ.<br><br>කොටස්හිමියන්ගේ සියලුම ප්‍රධාන ගැටලු සහ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කෙරේ.<br><br>ඉහත සඳහන් පරිදි යොමු කරන ලද ගැටලු සහ අදහස් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් අදාළ පාර්ශ්වයකින් උපදෙස් ලබා ගැනීමෙන් පසු, සමාගම් ලේකම් සහ ආයතන කටයුතු අංශය අදාළ කොටස්හිමියා වෙත සුදුසු ප්‍රතිචාරයක් යවනු ලබයි.<br><br>කොටස්හිමියන්ට තමන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් සමාගම් ලේකම් ඇමතිය හැකි අතර, ඇයගේ විස්තර පහතින් දැක්වේ.<br><br>**ලක්මිණී කෝට්ටෙගොඩ මිය**<br>සමාගම් ලේකම්<br>පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.<br>1161, මරදාන පාර,<br>කොළඹ 8<br>ශ්‍රී ලංකාව<br><br>දුරකථනය : +94 11 263 1103<br>ෆැක්ස් : +94 11 248 1500<br><br>සාමාන්‍ය මාර්ගවලින් විසඳාගත නොහැකි ප්‍රධාන ගැටලු පිළිබඳ කොටස්හිමියන්ට සාකච්ඡා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ ඇමතිය හැකිය. | ✓ | CG – කොටස්හිමියන් සමඟ සන්නිවේදනය සහ සම්බන්ධතාවය |
| C.3 | **ප්‍රධාන සහ වැදගත් ගනුදෙනු**<br>හිමිකාරත්වයේ අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීමට ශක්තිමත් විනිවිද අනාවරණය කොටස්හිමියන්ට වැදගත් වන බව අධ්‍යක්ෂ මණ්ඩල හඳුනාගනී.<br><br>වසර තුළ, 2007 අංක 07 දරන සමාගම් පනතේ 185 වගන්තිය තුළ දක්වා ඇති පරිදි සමාගම විසින් නිරත වූ හෝ බැඳුණු ප්‍රධාන හෝ වැදගත් ගනුදෙනු කිසිවක් නොමැත. | ✓ | |

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **D** | **වගවීම සහ විගණනය** | | |
| D.1 | **මූල්‍යමය සහ ව්‍යාපාර වාර්තාකරණය (වාර්ෂික වාර්තාව)**<br>සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ අභියෝග, අවස්ථා සහ අනාගත කටයුතු පිළිබඳ තුලනාත්මක සහ අවබෝධ කරගත හැකි තක්සේරු ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ගේ වගකීම පිළිබඳ අධ්‍යක්ෂවරු දැනුවත්ය.<br>වාර්ෂික වාර්තාව තුළ සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල වන බව සහ නියමිත කාලසීමාවක් තුළ අතුරු මූල්‍ය වාර්තා නිකුතුව සහ නියාමන වාර්තා නිසි දිනවල ගොනු කරන ලද බව සහතික කිරීමට නිසි අවධානය යොමුකර ඇත. කිසියම් මූල්‍ය කාලපරිච්ඡේදයක් ආවරණය කරන මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර, ප්‍රධාන විධායක නිලධාරීගෙන් සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීගෙන් මූල්‍ය වාර්තාකරණය සඳහා ඔවුන්ගේ වගකීම සම්බන්ධයෙන් ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගනී.<br>සමාගම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු (RPT) ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවා ඇති අතර එය ප්‍රමාණවත් පරිදි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අනාවරණය කරයි.<br>පීපල්ස් ලීසිං හි ව්‍යාපාර සහ ආචාරධර්ම සංග්‍රහය (සංග්‍රහය) තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් පුද්ගලික සම්බන්ධතා, බාහිර සංවිධානවලින් ඇතිවන වියහැකි හෝ සැබෑ බැඳියා පිළිග ැටුම් සහ ඔහුගේ/ඇයගේ ස්වාධීන විනිශ්චය මත සම්බන්ධයක් තිබිය හැකි වැදගත් කරුණු තුළ බැඳියාවන් ඔහුට/ඇයට තිබේද යන්න තීරණය කිරීම අවශ්‍ය වේ. එමෙන්ම මෙම සංග්‍රහයෙන් වියහැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් ඇති අධ්‍යක්ෂවරුන් විසින් තමන් ඒ පිළිබඳ දැනගත් වහාම අධ්‍යක්ෂ මණ්ඩලයට එය අනාවරණය කිරීමට අවශ්‍ය වන අතර ඒ සම්බන්ධ වාර්තා බැඳියා ලේඛනය තුළ සමාගම් ලේකම් විසින් පවත්වා ගනී. | ✓ | සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව<br>මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම<br>මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය<br>ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව<br>කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ<br>සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව<br>සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය (සටහන) |
| D.2 | **අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ක්‍රමෝපායික පරමාර්ථ අත්කර ගැනීම සඳහා අවදානම් රුචිය තීරණය කිරීමට වගකීමට බැඳී සිටින අතර එහි ඵලදායිතාව සමාලෝචනය කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් සමාගම පවත්වා ගනි.<br>සමාගමේ අභ්‍යන්තර පාලනය සමාගමට බලපාන අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණයට සහයවීමට සැලසුම් කෙරේ. මේවායින් මූල්‍යමය, ක්‍රියාවන්ට සම්බන්ධ අනුකූලතාවය සහ තොරතුරු තාක්ෂණ පාලනයන් මෙන්ම අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ යාන්ත්‍රණ ආවරණය කෙරේ.<br>අවදානම් සහ පාලනයන් හී අදාළත්වය සහ ඵලදායිත්වය සඳහා නිරන්තරව සමාලෝචනය කර නියාමනය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.<br>එමෙන්ම, එයට අයත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ඇත. සමාගමේ මෙම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සහ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ නිරන්තර සමාලෝචන සිදුකරන අතර ඒවායේ සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරයි. එම කමිටුව ඉන්පසුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් එකී පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරාත්මක නියාමනය සහ සමාලෝචනයක් සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වාර්තා සහ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ කාර්යයන් පිළිබඳ කමිටුමේ සොයාගැනීම් කලින් කල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඉදිරිපත් කෙරේ. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව<br>මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය |
| D.3 | **විගණන කමිටුව**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර සහ බාහිර විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයන් සහ කාර්යයන් පිළිබඳ එහි පාලනය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟත්වය ඇතිව කලින් කල සමාලෝචනය කර ප්‍රතිශෝධනය කරන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය පැහැදිලිවම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ යොමු නිර්දේශ නියම කරයි. මෙම ප්‍රඥප්තිය තුළින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ සංග්‍රහය සහ විධානයන්ට අනුකූල බව පෙන්නුම් කරයි.<br>2020 මාර්තු මස 31 දිනට, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන් සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරු විය. කමිටුවේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු විය. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව |

# ආයතනික පාලනය

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| | විගණන කමිටුවේ වර්තමාන සභාපති, මිරියම් කොරලී පීටර්ස් මහත්මිය විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරියක් ලෙස 2020 මාර්තු මස 1 දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ඇත. ඇය එංගලන්තය සහ වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවක්ද වේ. පුද්ගලික සහ රාජ්‍ය අංශය තුළ ක්ෂේත්‍ර කිහිපයක් තුළ විගණනය, මූල්‍යකරණය සහ ගිණුම්කරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වසර 25කට වැඩි පුළුල් වූ පළපුරුද්ද ඇය සතුය.<br><br>ඇයගේ පත්කිරීමට පෙර, ජෙහාන් අමරතුංග මහතා විගණන කමිටුවේ සභාපති වූ අතර ඔහු 2019 දෙසැම්බර් මස 30 දින සිට ඉල්ලා අස් වී ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් ද වේ. ඔහුට මූල්‍යකරණය සහ කළමනාකරණය පිළිබඳ වසර 30කට අධික පළපුරුද්ද ඇත.<br><br>සමාගමේ බාහිර විගණක වන්නේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 55 වගන්තියට අනුව විගණකාධිපතිවරයාය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) (අ) වගන්තියේ විධිවිධාන යටතේ විගණකාධිපති විසින් 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වන වසර සඳහා සමාගමේ විගණනය පැවැත්වීමට සහයවීම සඳහා අර්නස්ට් ඇන්ඩ් යන්ග් විගණකවරුන් පත් කර ඇත. | | |
| D.4 | **සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව**<br>ශ්‍රීලංගිප්‍ර 24 (LKAS 24) හි දක්වා ඇති පරිදි සමාගමේ කිසිදු "සම්බන්ධිත පාර්ශ්වයකට" සාමාන්‍ය ව්‍යාපාර රටාව තුළ තෙවැනි පාර්ශ්වයන්ට ලබාදෙන දෙයකට වඩා හිතකර සැලකීමක් ලබා නොදෙන බව සහතික කිරීමේ ක්‍රියාපටිපාටිය දක්වා ඇති සම්පූර්ණ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අත්පොතක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.<br><br>සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පාලනය කිරීමට සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් ස්ථාපිත කර ඇත.<br><br>2020 මාර්තු මස 31 දිනට, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන් සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරු විය. කමිටුවේ සභාපති ඇතුළුව කමිටුවේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු විය.<br><br>සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පැහැදිලිව නිශ්චිත යොමු නිර්දේශ තුළ ක්‍රියාත්මක වේ. යොමු නිර්දේශ තුළ දක්වා ඇති පරිදි කමිටුවේ රාජකාරි සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ සංග්‍රහය සහ විධානයන්ට අනුකූල වේ. | ✓ | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව |
| D.5 | **ව්‍යාපාර චර්යා සහ සදාචාර සංග්‍රහය**<br>සමාගමට වටිනාකම් ඇතුළත් ශක්තිමත් ආයතනික සංස්කෘතියක් ඇති අතර එය සියලුම පාර්ශ්වකරුවන් කරා එහි හැසිරීම පිළිබඳ ප්‍රධාන ප්‍රතිජ්ඨාව සකස් කරයි. මෙම වටිනාකම්, වටිනාකම පිළිබඳ ලිඛිත ප්‍රකාශනයක ඇතුළත් කරන අතර එය සමාගමේ ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය ලෙස කටයුතු කරන අතර අඛණ්ඩව සවිබල ගන්වයි.<br><br>සමාගමේ සියලුම අධ්‍යක්ෂවරුන්ට සහ සේවකයින්ට අදාළ වන විස්තරාත්මක ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහයක් සමාගම ක්‍රියාවට නංවා ඇත. මෙම සංග්‍රහය සියලුම අධ්‍යක්ෂවරුන්ට සහ සේවකයින්ට බෙදාහැර ඇති අතර ඒ සමඟ දැඩි අනුකූලතාව සහතික කිරීමට සමාගමේ අභ්‍යන්තර ජාලය තුළ ප්‍රකාශයට පත් කර ඇත. ආයතනික වටිනාකම් ඇතුළත් ව්‍යාපාර චර්යා සහ සදාචාර සංග්‍රහය නිර්දේශිත මනා පරිචයන්ට අනුකූලව සමාලෝචනය කර යාවත් කෙරේ.<br><br>සමාගමේ යම් අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ අයෙක් විසින් ව්‍යාපාර චර්යා සහ සදාචාර සංග්‍රහයේ විධිවිධානවල යම් ප්‍රමාණාත්මක කඩකිරීම් කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.<br><br>මිල සංවේදී තොරතුරු ලෙස ප්‍රත්‍යක්ෂ වියහැකි තොරතුරු හඳුනාගැනීම සඳහා අදාළ නියාමන බලධාරීන් වෙත ඒවා කඩිනමින් අනාවරණය කිරීමට ඵලදායි යාන්ත්‍රණයක් සමාගම ක්‍රියාවට නංවා ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අත්පොත තුළ විස්තරාත්මකව දක්වා ඇති සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමනය සහ නිරාවරණය සඳහා ස්ථාපිත ක්‍රියාවලියක් සමාගම ක්‍රියාවට නංවා ඇත.<br><br>එමෙන්ම, ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය තුළ සමාගමේ කොටස් තුළ අධ්‍යක්ෂවරු, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ සේවකයින් පාලනය කරන සම්පූර්ණ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලියක කොටසක් එයට ඇතුළත් කර ඇත. | ✓ | සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව |

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| D.6 | **ආයතනික පාලන අනාවරණ**<br>ආචාරධර්ම සහ විනිවිද භාවයෙන් ක්‍රියාත්මක කිරීමේ සහ එහි පාර්ශ්වකරුවන්ට වගවීම සඳහා ඇති කැපවීම තුළ සමාගම ස්ථිරව සිටී. ආයතනික පාලනය ගමනාන්තයක් පමණක් නොව තිරසාර වටිනාකම නිර්මාණය තුළ අඛණ්ඩ ප්‍රගතිය සඳහා ගමන් මාර්ගයක් බව සමාගම විශ්වාස කරයි. | ✓ | ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයට අනුකූලතාව |

## කොටස්හිමියන්

### E ආයතනික ආයෝජකයින්

| | | | |
|---|---|---|---|
| E.1 | **කොටස්හිමි ඡන්ද**<br>කොටස්හිමියන්ගේ අදාළ පරමාර්ථ අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කර ගැනීමට පහසුකම් ඇති කිරීම පිණිස ඵලදායී, විවෘත, විනිවිද, සහ නිරන්තර සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීමට සමාගම බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය ආයතනිකගත සහ පුද්ගලික ආයෝජකයින් කරා පිවිසීමට උත්සාහ ගන්නා අතර සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීමට සහභාගිවීම සඳහා සියලුම කොටස්හිමියන් සක්‍රීයව දිරිගන්වයි.<br>වාර්ෂික මහ සභා රැස්විම (AGM) සාමාන්‍ය සාමාජිකයින්ට අදාළවන කරුණු සම්බන්ධව කොටස්හිමියන් සමඟ ව්‍යූහගත සහ විෂය මූලික සාකච්ඡා ඇති කිරීම සඳහා සංසදයක් ලෙස භාවිතා කරයි.<br>ඊට අමතරව, ආයතනිකගත කොටස්හිමියන් සමඟ සාකච්ඡා සහ රැස්වීම් පිළිබඳ අඛණ්ඩ වැඩසටහනක් සමාගමට ඇති අතර එහිදී අදාළ කරුණු පිළිබඳ පුළුල් වශයෙන් සාකච්ඡා කෙරේ. | ✓ | |
| E.2 | **පාලන අනාවරණ ඇගයීම**<br>අනාවරණය ශක්තිමත් ආයතනික පාලන රාමුවක අත්‍යවශ්‍ය අංගයක් වන අතර ඉන් කොටස්හිමියන්ට, පාර්ශ්වකරුවන්ට සහ අනාගත ආයෝජකයින්ට ප්‍රාග්ධනය වෙන්කිරීම, ආයතනික ගනුදෙනු සහ මූල්‍ය කාර්යසාධනය නියාමනයට අදාළ දැනුවත් තීරණ ගැනීම සඳහා පදනම ලබා දේ.<br>ආයතනිකගත ආයෝජකයින්ගේ බැඳියාවන් සඳහා ප්‍රමාණවත් අවධානය ලබා දී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහයට හා සංයුතියට අදාළ යෝජනා පිළිබඳ තම ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ට නිසි බර තැබීම කළ යුතුයි. | ✓ | |

### F වෙනත් ආයෝජකයින්

| | | | |
|---|---|---|---|
| F.1 | **ආයෝජනය/ආපසු පැවරුම් තීරණය**<br>සමාගම එක සමානව ආයතනිකගත ආයෝජකයින් සහ පුද්ගලික ආයෝජකයින් සමඟ යහපත් සම්බන්ධතා සහ සන්නිවේදන පවත්වා ගැනීමේ වැදගත්කම කෙරෙහි ඉහළ අගයක් තබා ඇති අතර ඔවුන්ගේ ආයෝජන අගය කිරීමට අවශ්‍ය තීරණාත්මක තොරතුරු ඔවුන්ට ලබාදීම පිණිස සමාගමේ සැලකියයුතු සංවර්ධනයන් පිළිබඳ ඔවුන් දැනුවත් කරන බවට සහතික වේ.<br>තනිපුද්ගල කොටස්හිමියන්ට ප්‍රමාණවත් විශ්ලේෂණ කරගෙන යාමට හෝ ඔවුන්ගේ ආයෝජන තබාගැනිමට හෝ ආපසු ගැනීම පිළිබඳ ස්වාධින උපදේශය සඳහා නිදහස ඇත. | ✓ | |
| F.2 | **කොටස්හිමි ඡන්දය**<br>අධ්‍යක්ෂ මණ්ඩලයට ආයෝජකයින් මුණගැසීමට සහ සභාපතිට ආයතනයේ ප්‍රගතිය පැහැදිලි කිරීමට මෙන්ම එහි හිමිකරුවන් වන කොටස්හිමියන්ගෙන් ප්‍රශ්න ලබාගැනීම සඳහා මහ සභා රැස්වීම් ප්‍රධාන අවස්ථාව ලබා දේ.<br>තනිපුද්ගල කොටස්හිමියන් මහ සභා රැස්වීමට සහභාගි කරවීමට සහ ඔවුන්ගේ ඡන්දය ලබාදීම සඳහා දිරිගන්වනු ලබයි. | ✓ | |

# ආයතනික පාලනය

| සංග්‍රහය යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **G** | **අන්තර්ජාලය සහ සයිබර් ආරක්ෂාව** | | |
| | පීපල්ස් ලීසිං සමූහයේ සමාගම විසින් පාලනය කරනු ලබන තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිවලින් තොරතුරු තාක්ෂණ විනය, බලපත්‍රලාභී මෘදුකාංග භාවිතය, අන්තර්ජාලය, විද්‍යුත් තැපැල සහ මේල් සහ විද්‍යුත් තැපැල් සර්වර් භාවිතය සම්පව නියාමනය සහ වයිරස් විරෝධී සහ ෆයර්වෝල් සර්වර් සහ මෘදුකාංග භාවිතය සම්පූර්ණයෙන්ම ආවරණය කරයි.<br>ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියාගේ කාර්යයන් පීපල්ස් ලීසිං සමූහයේ තොරතුරු තාක්ෂණ ප්‍රධානි වෙත පවරා ඇත.<br>සයිබර් ආරක්ෂාවෙන් ඇතිවන දෑ ඇතුළුව තොරතුරු තාක්ෂණ කරුණුවලට අදාළ අවදානම් අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලබයි.<br>ප්‍රවීන උපදෙස් අවශ්‍ය යයි කල්පනා කරනු ලබන අවස්ථාවලදී තොරතුරු තාක්ෂණ විගණකවරුන් භාවිතා කෙරේ. තොරතුරු තාක්ෂණය පිළිබඳ සමාලෝචනය බාහිර උපදේශකයින් මගින් නිරන්තරව පවත්වනු ලැබීය. | ✔ | CG – IT පාලනය සහ සයිබර් ආරක්ෂාව |
| **H** | **පාරිසරික, සමාජීය සහ පාලනය (ESG)** | | |
| H.1 | **ESG වාර්තාකරණය**<br>ආයතනික තිරසාර වාර්තාකරණයෙන් සමාගමේ කොටස් තුළ හිමිකමක් ඇති සහ සමාගමේ ක්‍රියාවන්ට යම් ආකාරයකින් බලපෑම් කරනු ලැබිය හැකි ආයෝජකයින්ට, ගනුදෙනුකරුවන්ට, සේවකයින්ට සහ අනෙකුත් අදාළ කණ්ඩායම්වලට තීරණ ගැනීමේ වටිනාකම ලබා දෙන ආකාරයකින් තොරතුරු ලබාදීමට අරමුණු කෙරේ.<br>පාරිසරික, සමාජ සහ පාලන (ESG) අංග සමාගමේ වටිනාකම්වල වැදගත් කොටසක් ලෙස සලකනු ලබන අතර එකී අංග සමාගමේ ක්‍රමෝපාය සමඟ සම්පව සම්බන්ධ බවට සහතික කිරීම සඳහා ඇති වගකීම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ය.<br>සමාගමේ ESG වාර්තාකරණය සමාගම කටයුතු කර ඇති, දිගුකාලීන ආර්ථික වටිනාකම අත්කරගෙන ඇති, ආයතනික වගකීම පිළිගෙන ඇති සහ තිරසාර සංවර්ධනයට දායක වී ඇති ආකාරය පිළිබඳ පිළිබිඹුවකි. මෙසේ, මෙම වාර්ෂික වාර්තාව ඒකාබද්ධ වාර්තාවක් ආකාරයෙන් පිළියෙල කර ඇති අතර ඉන් තිරසාර වාර්තාකරණ පාරාමිති ආවරණය කරයි. | ✔ | මූල්‍ය ප්‍රාග්ධනය<br>ස්වභාවික ප්‍රාග්ධනය<br>සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය<br>පාර්ශ්වකාර සහභාගිත්වය |

## මූල්‍ය සමාගම් පනත් නියෝගය සමඟ අනුකූලතාව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ 2008 අංක 03 දරන මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනත් නියෝගය සහ 2008 අංක 04 සහ 2013 අංක 06 දරන මූල්‍ය සමාගම් (ආයතනික පාලන - සංශෝධන) පනත් නියෝගවලින් විශේෂයෙන් දක්වා ඇති සංශෝධනවලට අනුකූලතාව.

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **A** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්** | | |
| 2 (1) | **සමාගමේ ආරක්ෂාව සහ අඛණ්ඩතාව ශක්තිමත් කිරීම** | | |
| (a) | **ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම සහ පාලනය**<br>සමාගමේ ක්‍රමෝපායික පරමාර්ථ සමාගමේ දැක්ම, මෙහෙවර ප්‍රකාශයන් මත ප්‍රකාශ කරන අතර සමාග මේ ආයතනික වටිනාකම් ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය තුළ ඇතුළත් කරන අතර එය සෑම මට්ටමකම සේවකයින්ට සන්නිවේදනය කර ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ක්‍රමෝපායික පරමාර්ථ සකස් කිරීමේදී ශක්තිමත් කාර්යභාරයක් ඉටුකරමින් එය සමාගමේ දැක්ම සහ මෙහෙවර ක්‍රියාවක් බවට හැරවීම කෙරෙහි අවධානය යොමුකරන බවට සහතික කරයි.<br>අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කළමනාකාරිත්වය වෙත නිශ්චිත අරමුණු/පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය පවරා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය යම් පසුබෑසීම් හඳුනා ගැනීමේදී සක්‍රීය වෙමින් ඉලක්කවලට අනුව සමාගමේ කාර්යසාධනය නිරන්තරව නියාමනය සහ සමාලෝචනය කරයි. | ✔ | |
| (b) | **අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණ ක්‍රියාපටිපාටි ඇතුළුව සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය අනුමත කිරීම**<br>මූල්‍ය වසර තුනක් සඳහා ක්‍රමෝපායික සැලැස්මක් 2021 දක්වා 2018 දී අනුමත කරන ලදී. ඉදිරි වසර තුන 2022-2024 ආවරණය කරන ක්‍රමෝපායික සැලැස්මක් සකස් කිරීමේ ක්‍රියාවලියේ නිරත වේ. | ✘ | |
| (c) | **අවදානම් කළමනාකරණය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ සමස්ත අවදානම් රාමුව සඳහා මූලික වශයෙන් වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් හඳුනාගෙන අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමට සහ කාර්තුමය පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමට සුදුසු ක්‍රම ක්‍රියාවට නැංවීම සහතික කරයි. | ✔ | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව<br>අවදානම් කළමනාකරණය |
| (d) | **පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය**<br>එහි පාර්ශ්වකරුවන් සමඟ ද්විපාර්ශ්වීය සන්නිවේදනයේ වැදගත්කම හඳුනාගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය සවිස්තරාත්මක ප්‍රතිපත්තියක් යොදා ගෙන ඇති අතර, ඉන් එහි කොටස්හිමියන් සහ තැන්පත්කරුවන්, ණයහිමියන්, ණයගැතියන්, සැපයුම්කරුවන්, සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය සහතික කරයි. | ✔ | |
| (e) | **අභ්‍යන්තර පාලන ක්‍රමය සහ කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) සමාලෝචනය කිරීම**<br>සමාගම ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගන්නා බව සහතික කිරීම සහ එහි ඵලදායිත්වය සමාලෝචනය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර පාලනය පිළිබඳ විස්තරාත්මක නියාමනය සහ සමාලෝචනය භාරගන්නා අතර කාර්තුමය පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) ඒවායේ නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය සමාලෝචනය සඳහා සමාගමේ MIS ක්‍රියාපටිපාටි දළසැලැස්ම/මාර්ගෝපදේශ සමාලෝචනය. | ✔ | |
| (f) | **ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMP)**<br>සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු සහ අනුකූලතා නිලධාරී සමාගමේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ලෙස හඳුනාගෙන නම් කර ඇත. | ✔ | |
| (g) | **අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා බලය සහ වගකීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරීගේ මූලික රාජකාරි සහ වගකීම් සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ගේ ප්‍රධාන කාර්යයන්/වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකර අනුමත කරනු ලැබ ඇති අතර ඔවුන්ට අදාළ රැකියා විස්තරවල ඇතුළත් කර ඇත.<br>ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ගේ අදාළ බෙදාහරිනලද බලතල සීමා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකර ඇත. | ✔ | |

# ආයතනික පාලනය

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| (h) | **ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩලය විසින් සමාගමේ කටයුතු පාලනය**<br>සමාගමේ කටයුතු මාසික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර සහ සාකච්ඡා කෙරේ. මෙවැනි රැස්වීම්වලදී ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී විසින් නියෝජනය කරන අතර ඔහු නියමිත ඉලක්කවලට අනුව සමාගමේ මෙහෙයුම් සහ කාර්යසාධනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරයි.<br>සමාගමේ කටයුතු කළමනාකරණ මට්ටමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් සමාලෝචනය කර සාකච්ඡා කෙරේ. | ✓ | |
| (i) | **පාලන ව්‍යවහාරවල ඵලදායිත්වය ඇගයීම**<br>සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සහ ආයතනික පාලන ප්‍රඥප්තිය සමාගමේ අධ්‍යක්ෂවරු තෝරාගැනීම සහ පත්කිරීමට අදාළ පොදු ක්‍රියාපටිපාටිය සපයයි. වර්තමානයේ, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු හැර සමාගමේ අධ්‍යක්ෂවරු මව් සමාගම, මහජන බැංකුව මගින් නිර්දේශ කරන අතර සාංගමික ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබයි. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ පත්කිරීම් ප්‍රධාන විධායක නිලධාරීගේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය සිදු කරනු ලබයි.<br>බැඳියා පිළිගැටුම් කළමනාකරණය කාලීන ආකාරයකින් ආමන්ත්‍රණය කෙරේ. සමාගමේ ව්‍යාපාර සහ ආචාරධර්ම සංග්‍රහය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් පුද්ගලික සම්බන්ධතා, බාහිර සංවිධානවලින් ඇතිවන වියහැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් සහ ඔහුගේ/ඇයගේ ස්වාධීන විනිශ්චය මත සම්බන්ධයක් තිබිය හැකි වැදගත් කරුණු තුළ බැඳියාවන් ඔහුට/ඇයට තිබේද යන්න තීරණය කිරීම අවශ්‍ය වේ. ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයාට වගකීමක් ඇත. සාකච්ඡාව යටතේ කරුණක් තුළ බැඳියාවක් ඇති අධ්‍යක්ෂවරු ඒ සම්බන්ධ ඔහුගේ/ඇයගේ බැඳියාව අනාවරණය කළයුතු අතර එම කරුණ සාකච්ඡා වීම තුළ සහ ඡන්දය ලබාදීම තුළ නිරතවීමෙන් වැළකිය යුතුය.<br>වියහැකි බැඳියා පිළිගැටුම් පිළිබඳ ස්වයං-ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම කරනු ලබන අවස්ථාවේදී සහ ඉන්පසුව අවශ්‍යවන අවස්ථාවලදී අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගනී. මෙවැනි ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂවරුන් විසින් අනාවරණය කළ බැඳියාවන් සමඟ ඵලදායි ආකාරයක් තුළ ගැටුම් (ඇත්නම්) කළමනාකරණය කිරීමට සමාගමට සහය වේ.<br>අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් පාලන ව්‍යවහාරවල ඵලදායිත්වය එහි දුර්වලතා පිළිබඳ තිරණය කිරීම ද ඇතුළත්ව 2020 ජූනි මස සිදුකරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං-ඇගයිම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක්කරන ලදී. | ✓ | |
| (j) | **ප්‍රධාන කළමනාකරණ කාර්යමණ්ඩලය සඳහා අනුප්‍රාප්ත සැලැස්ම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය 2018 ඔක්තෝබර් මස ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්ත සැලැස්මක් අනුමත කරන ලදී. | ✓ | |
| (k) | **ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ නිරන්තර රැස්වීම්**<br>සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය නියෝජනය කරන අතර ඔවුන්ගේ රැස්විම්වලදී ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් මතුකරන අදහස්/බරපතල ගැටලු අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමට ලක් කරයි.<br>තවද, අදාළ තැන්වලදී, ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමට, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීමට සහ ආයතනික පරමාර්ථ කරා ප්‍රගතිය නියාමනය කිරීමට ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු රැස්වීම්වලට සහභාගිවීමට ආරාධනය කෙරේ. | ✓ | |
| (l) | **නියාමන පරිසරය අවබෝධකර ගැනීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය සමූහයේ වටිනාකම්, ව්‍යාපාර මෙහෙයුම්, මූල්‍ය කටයුතු, පාලන රාමුව සහ සමාගමේ ක්‍රමෝපායික ස්ථානය සමඟ මනාව දක්ෂතා පෙන්වයි.<br>අදාළ නීතිකරණ, රෙගුලාසි සහ ආයතනික පාලනයට අදාළ වෙනස්වීම් මත නිරන්තර යාවත්කිරීම් මෙන්ම ආර්ථික, සමාජීය සහ පාරිසරික අංග ඇතුළත් මාතෘකා රාශියක් ආවරණය කරමින් සමූහය සහ එහි මෙහෙයුම් කෙරෙහි බලපෑ හැකි ක්ෂේත්‍රයේ සංවර්ධනයන් එක් එක් රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවලට සහ අවශ්‍ය පරිදි සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දේ.<br>නියාමන අවශ්‍යතා සහ අදාළ අනුපාත පිළිබඳ අන්තර්ගතයේ සාරාංශයක් නියාමන පරිසරය සම්බන්ධයෙන් සමාගමේ පැවැත්ම පිළිබඳ දැනුවත්භාවය සඳහා නිරන්තර පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ. | ✓ | |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| (m) | **බාහිර විගණකවරු පත්කිරීම සහ පාලනය**<br>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 55 වගන්තියට අනුව සමාගමේ බාහිර විගණක වන්නේ විගණකාධිපතිවරයාය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) (අ) ව්‍යවස්ථාව යටතේ 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූන වසර සඳහා සමාගමේ විගණන කටයුතු සිදු කිරීමට අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් විගණකවරුන් විගණකාධිපති විසින් පත් කර ඇත. | ✓ | |
| 2 (2) | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත්කිරීම සහ ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් නියමකිරීම සහ අනුමත කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත්කර ඇත. ඔවුන්ගේ කාර්යභාරය වෙන්කර ඇති අතර සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ විස්තර කර ඇත. | ✓ | |
| 2 (3) | **අධ්‍යක්ෂවරුන් විසින් ස්වාධීන වෘත්තිය උපදෙස් ලබා ගැනීම**<br>සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය මගින් අධ්‍යක්ෂවරුන්ට සමාගමේ වියදමෙන් තම රාජකාරි සහ වගකිම් ක්‍රියාත්මක කිරීමට අදාළව සමාගම් ලේකම්ගේ සහ අනෙකුත් ස්වාධීන වෘත්තිකයින්ගේ උපදෙස් ලබාගැනීමට අවස්ථාව ඇති කරයි. කෙසේවෙතත්, 2019/20 මූල්‍ය වසර තුළ එවැනි උපදෙස් අධ්‍යක්ෂවරුන් විසින් ලබාගෙන නොමැත. | ✓ | |
| 2 (4) | **බැඳියා පිළිගැටුම් කළමනාකරණය**<br>සමාගමේ ව්‍යාපාර සහ ආචාරධර්ම සංග්‍රහයට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයාට ඔහුගේ/ඇයගේ ස්වාධීන විනිශ්චයට බලපෑමක් තිබිය හැකි වැදගත් කරුණු තුළ පුද්ගල සම්බන්ධතා, බාහිර සම්බන්ධතාවලින් ඇතිවන වියහැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් තිබේද යන්න තීරණය කිරීමට ඔහුට/ඇයට වගකීමක් ඇත. සාකච්ඡාව යටතේ ඇති කරුණක් කෙරෙහි යම් බැඳියාවක් ඇති අධ්‍යක්ෂවරයෙක් ඒ සම්බන්ධ ඔහුගේ/ඇයගේ බැඳියාව අනාවරණය කළ යුතු අතර එම කරුණ පිළිබඳ සාකච්ඡාව තුළ නිරතවීමෙන් සහ එයට අදාළව ඡන්දය ලබාදීමෙන් වැළකී සිටිය යුතුය. තීරණවලදී එවැනි සහභාගිවීම් වාර්තා තුළ සමාගම් ලේකම් විසින් විධිමත්ව වාර්තා කරනු ලබයි. | ✓ | |
| 2 (5) | **අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විශේෂයෙන් වෙන්කළ කරුණු පිළිබඳ විධිමත් උපලේඛන ලබාගතහැකිවීම**<br>සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ අධ්‍යක්ෂවරුන් සඳහා විශේෂයෙන් වෙන්කළ කරුණු සහ එහි තිරණ පිළිබඳ විධිමත් උපලේඛනයක් අඩංගු වේ. | ✓ | |
| 2 (6) | **වියහැකි බුන්වත්භාව ගැටලු අනාවරණය**<br>2019/20 මූල්‍ය වසර තුළ එවැනි අවස්ථා පැනනොනැගිණි. තවද, සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සතිපතා පදනමක් මත බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කෙරේ. | ✓ | |
| 2 (7) | **පනත් නියෝගයට අනුකූලතාව පිළිබඳ වාර්ෂික වාර්තාව තුළ ආයතනික පාලනය ප්‍රකාශයට පත්කිරීම**<br>පනත් නියෝගයට අනුකූලව ආයතන පාලන පිළිබඳ වාර්ෂික වාර්තාවක් සමාගමේ වාර්ෂික වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළත් කරයි. | ✓ | මූල්‍ය සමාගම් පනත් නියෝගයට අනුකූලතාව |
| 2 (8) | **අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයීම**<br>එක් එක් අධ්‍යක්ෂ විසින් වාර්ෂිකව සිදුකළයුතු ස්වයං ඇගයීම් යෝජනා ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය යොදාගෙන ඇති අතර මෙම ක්‍රියාපටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ විස්තර කර ඇත. එයට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය 2020 ජුනි මස එහි කාර්යසාධනය සහ කමිටු පිළිබඳ විස්තරාත්මක ඇගයීමක් සිදු කරන ලදී.<br>2020 මාර්තු මස 1 සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලද සහ එමනිසාම 2019/20 මූල්‍ය වසර තුළ රැස්වීම්වලට සහභාගි නොවූ කොරලි පීටර්ස් මහත්මිය හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා ඔහුගේ/ඇයගේ ඵලදායිත්වය මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිළිබඳ ස්වයං-ඇගයීමක් සිදුකරන ලදී.<br>අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම්වල සම්පූර්ණ ප්‍රතිඵල සමාගම් ලේකම් විසින් විශ්ලේෂණය කර 2020 ජූලි මස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. | ✓ | |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **B** | **අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රැස්වීම්** | | |
| 3 (1) | **නිරන්තර අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්**<br>ව්‍යාපාර අවදානම් තත්ත්වය විසින් වඩා කෙටි කාලයක් තුළ රැස්වීම් කැඳවීම ඉල්ලා ඇත්නම් මිස අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් මසකට වරක් සාමාන්‍යයෙන් පවත්වනු ලැබේ.<br>අධ්‍යක්‍ෂ මණ්ඩලය 2019/20 මූල්‍ය වසර තුළදී එකොලොස් වාරයක් මුණගැසුණ අතර සංසරණය තුළින් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කැමැත්ත ලබාගැනීම අවස්ථා හයක අවමයකට තබා ගනු ලැබීය.<br>2020 මාර්තු මස 31 දින පැවැත්වීමට නියමිත වූ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම කොවිඩ්-19 වයිරසය පැතිරීමේ තර්ජනය නිසා රජය විසින් දිවයින පුරා පනවන ලද ඇඳිරි නීතිය හේතු කොට ගෙන අවලංගු කරන ලදී. | ✗ | |
| 3 (2) | **න්‍යාපත්‍රය තුළ කරුණු සහ යෝජනා අධ්‍යක්‍ෂවරුන් ඇතුළත් කිරීම**<br>සියලුම අධ්‍යක්‍ෂවරුන්ට නිරන්තර රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය තුළ ව්‍යාපාර ප්‍රවර්ධනය සහ අවදානම් කළමනකරණය සඳහා යෝජනා ඇතුළත් කිරීමට සමාන අවස්ථාවක් ලබා දේ. මේ සඳහා අදාළ ක්‍රියාපටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ විස්තර කර ඇත. | ✓ | |
| 3 (3) | **අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේ නිවේදනය**<br>ඉදිරි අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් දිනය පිළිබඳව පූර්ව අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම තුළ පැමිණි සාමාජිකයින් විසින් සාමූහිකව එකඟ වන අතර ඉන්පසුව රැස්වීමක් පිළිබඳ අවම වශයෙන් දින 7ක නිවේදනය ලබාදුන් බව සහතික කිරීමට හැකි පරිදි සියලුම අධ්‍යක්‍ෂවරුන්ට සන්නිවේදනය කෙරේ. යම් වෙනත් විශේෂ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ නිවේදනයක් ලබා දේ. | ✓ | |
| 3 (4) | **අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වල අධ්‍යක්‍ෂවරුන්ගේ පැමිණීම**<br>කිසිදු අධ්‍යක්‍ෂවරයෙක් අඛණ්ඩව රැස්වීම් තුනකට නොපැමිණ නැත. | ✓ | CG – අධ්‍යක්‍ෂ මණ්ඩල සහ අධ්‍යක්‍ෂ මණ්ඩල කමිටු රැස්වීම් සඳහා පැමිණීම |
| 3 (5) | **සමාගම් ලේකම් පත්කිරීම**<br>ප්‍රමාණවත් පළපුරුද්ද සහිත නීතිඥවරියක් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සමාගම් ලේකම් ලෙස පත්කර ඇත.<br>සමාගම් ලේකම් අධ්‍යක්‍ෂ මණ්ඩලයට උපදෙස් දෙන අතර සමාගම් පනත, අධ්‍යක්‍ෂ මණ්ඩල ක්‍රියාපටිපාටියට සම්බන්ධ කරුණු සහ අනෙකුත් අදාළ නීති සහ රෙගුලාසි අනුගමනය කරන බව සහතික කරයි. | ✓ | |
| 3 (6) | **සමාගම් ලේකම්ට වගකීම් පැවරීම**<br>සභාපති විසින් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සමාගම් ලේකම් වෙත පවරා ඇති අතර ඒ අනුව, සමාගම් ලේකම් ඒ සඳහා වගකීමට බැඳී සිටී. | ✓ | |
| 3 (7) | **සමාගම් ලේකම්ගේ සේවය සහ උපදේශය සඳහා පිවිසීම**<br>සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ විස්තර කර ඇති පරිදි, සියලුම අධ්‍යක්‍ෂවරුන්ට වෘත්තියෙන් නීතිඥවරයෙක් වන සමාගම් ලේකම් වෙත පිවිසිය හැකිය. | ✓ | |
| 3 (8) | **අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා නඩත්තුව**<br>සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ දක්වා ඇති ක්‍රියාපටිපාටියට අනුව, සමාගම් ලේකම් විසින් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ප්‍රමාණවත් විස්තර සමඟ පවත්වාගන්නා අතර ඒවා අධ්‍යක්‍ෂවරුන්ගේ පරීක්ෂණය සඳහා ලබාගත හැකිය. | ✓ | |
| 3 (9) | **අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ප්‍රමාණවත් විස්තර සමඟ වාර්තා කිරීම**<br>මෙම නියමය තුළ දක්වා ඇති සියලුම අවශ්‍යතාවන් සපුරාලමින් ප්‍රමාණවත් විස්තර සමඟ සමාගම් ලේකම් විසින් රැස්වීම්වල කටයුතු සහ ඒවායේදී ගනු ලැබූ තීරණ වාර්තා කරයි. | ✓ | |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **C** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය** | | |
| 4 (1) | **අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු ගණන**<br>2019/20 අවසානයට, අවශ්‍යතාවය සපුරාලමින් අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු නව දෙනෙකුගෙන් සමන්විය විය. | ✔ | |
| 4 (2) | **අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය**<br>2019/20 තුළ සියළුම අධ්‍යක්ෂවරුන්ගේ සේවා කාලය වසර නවයට වඩා අඩුය. | ✔ | |
| 4 (3) | **සේවකයෙකු අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කිරීම, තෝරා ගැනීම සහ නම් කිරීම**<br>සමාගම සතුව විධායක අධ්‍යක්ෂවරු නොමැත. | ✔ | |
| 4 (4) | **අධ්‍යක්ෂ මණ්ඩලයේ තුලනය සහ ස්වාධීනත්වය සඳහා නිර්ණායක**<br>2019/20 අවසානයට විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වූ අතර ඔවුන් මෙම නියමය තුළ දක්වා ඇති ස්වාධීනත්වය සඳහා නිර්ණායක හතරෙන් එකක් සපුරා ඇත.<br>මෙම නියමය තුළ නිර්ණායක අනුව, ස්වාධීන ලෙස නම්කිරීම සඳහා ඔවුන්ගේ යෝග්‍යතාව තහවුරු කරමින් සියලුම විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් ස්වයං-ඇගයීම් ලබාගන්නා ලදී.<br>2019 දෙසැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කිරීමෙන් පසු, 2020 පෙබරවාරි 19 දින නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරන තුරු අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් පමණක් සිටියේය. සමාගමේ ඉල්ලීම මත, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 පෙබරවාරි 15 දක්වා මෙම විධිවිධානයට අනුකූලවීමට දීර්ඝකිරීමක් ලබාදෙන ලදී. | ✔ | |
| 4 (5) | **විකල්ප අධ්‍යක්ෂක**<br>වසර තුළ කිසිදු විකල්ප අධ්‍යක්ෂවරයෙක් පත්නොකරන ලදී. | ✔ | |
| 4 (6) | **විෂයානුගත විනිශ්චයක් ලබාදීමට විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගේ දක්ෂතාව සහ පළපුරුද්ද**<br>අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ට විවිධ ක්ෂේත්‍ර තුළ වෘත්තීය සුදුසුකම් ඇත. දක්ෂතාව සහ ව්‍යාපාර පළපුරුද්ද තුළ ඔවුන්ගේ මුසුව අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටුවල මනා ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රධාන දායකත්වයකි. | ✔ | අධ්‍යක්ෂ මණ්ඩලය |
| 4 (7) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දී ගණපූරණය**<br>2019/20 වසර තුළ, සමාගමේ සියළුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වූ බැවින් වසර සඳහා කැඳවන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අවශ්‍ය ගණපූරණය (විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් භාගයක්) සපුරාලන ලදී. | ✔ | |
| 4 (8) | **ආයතනික පාලන සන්නිවේදන සහ වාර්ෂික වාර්තාව තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පිළිබඳ අනාවරණය**<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් අවශ්‍ය තැන්වලදී ආයතනික සන්නිවේදනය තුළ ඒ අනුව හඳුනා ගනී. | ✔ | |
| 4 (9) | **නව අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා විධිමත් සහ විනිවිද ක්‍රියාපටිපාටිය**<br>සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සහ ආයතනික පාලන ප්‍රඥප්තිය සමාගමේ අධ්‍යක්ෂවරු තෝරාගැනීම සහ පත්කිරීමට අදාළ වන්නා වූ පොදු ක්‍රියාපටිපාටිය ලබා දේ. සමාගමේ අධ්‍යක්ෂවරු ලෙස පත් කිරීම සඳහා "යෝග්‍ය සහ සුදුසු" වූ නම්කළ තැනැත්තන් මත, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය ඒ සඳහා ලබා ගනී.<br>2019/20 වසර තුළ, අධ්‍යක්ෂ මණ්ඩලයට සිදුකළ සියලුම පත්වීම් ඉහත ක්‍රියාපටිපාටිය අනුකූල විය. | ✔ | |
| 4 (10) | **තාවකාලික ඇබෑර්තුවක් පිරවීමට පත්කළ අධ්‍යක්ෂවරු නැවත පත්කිරීම**<br>සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 27 (2) වගන්තිය අනුව, තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂවරු ද ඇතුළුව සියලුම අධ්‍යක්ෂවරු ඔවුන්ගේ පත්කිරීමෙන් පසු පළමු වාර්ෂික මහ සභා රැස්වීමේදී කොටස්හිමියන් විසින් නැවත පත්කිරීමට යටත් වේ. | ✔ | |

# ආයතනික පාලනය

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| 4 (11) | **අධ්‍යක්ෂවරු ඉල්ලා අස්වීම/ඉවත්කිරීම පිළිබඳ අනාවරණ**<br>අධ්‍යක්ෂවරුන්ගේ සියලුම ඉල්ලා අස්වීම්/ඉවත්කිරීම් සහ පත්කිරීම් කොළඹ කොටස් හුවමාරුව වෙත කඩිනම් දැනුම්දීම හරහා ප්‍රමාණවත් විස්තර සමඟ කොටස්හිමියන් වෙත දැනුම් දෙනු ලබයි. අදාළ රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව එසේ කරනු ලැබේ. | ✓ | |
| **D** | **අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ උචිතබව** | | |
| 5 (1) | **අධ්‍යක්ෂවරු වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය**<br>වයස අවුරුදු 70 ඉක්ම වූ කිසිදු අධ්‍යක්ෂවරයෙක් සමාගම තුළ නොමැත. හේමසිරි ප්‍රනාන්දු මහතා (විධායක නොවන ස්වාධීන නොවන සභාපති) 2019 ඔක්තෝබර් මස 12 දින වයස අවුරුදු 70 ට ළඟා වූ අතර එම දිනයේ සිට සමාගමේ සභාපති තනතුරින් විශ්‍රාමගන්නා ලදී. | ✓ | |
| 5 (2) | **සමාගම් 20ට වඩා තනතුරු දැරීම**<br>සමාගම් 20ට වඩා අධ්‍යක්ෂවරයෙක් ලෙස තනතුර දරන අධ්‍යක්ෂවරු නොමැත. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය |
| **E** | **කාර්යයන් පැවරීම** | | |
| 6 (1) | **අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පැවරීම**<br>සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 29 (2) වගන්තිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හෝ සුදුසුයයි සලකනු ලබන වෙනත් පුද්ගලයෙකු වෙත පැවරීම සඳහා බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඇති අතර එය අදාළ නීතිය අනුව පැවරීම සඳහා ඉඩදී තිබිය යුතුය.<br>ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය එහි වගවීම ආරක්ෂාකර ගනිමින් පැහැදිලිව නිශ්චිත විධි නියෝග සහ බලතල සහිතව එහි බලය අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සහ කළමනාකාරිත්වය වෙත පවරා ඇත. | ✓ | |
| 6 (2) | **කලින් කල පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පැවරීම සමාලෝචනය**<br>ආයතනයේ ප්‍රමාණය සහ එහි විශේෂිත මෙහෙයුම් සංදර්භය සැලකිල්ලට ගනිමින්, සීමාවන් සුදුසු අයුරින් පවතින බව සහතික කිරීම සඳහා බලතල පැවරීමේ රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල සමාලෝචනය කරනු ලබයි. | ✓ | |
| **F** | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී** | | |
| 7 (1) | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරයන් වෙන්කිරීම**<br>සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ (CEO) තනතුරු බලය සහ අධිකාරියේ තුලනය සහතික කිරීම සඳහා වෙන්කර ඇත. | ✓ | |
| 7 (2) | **සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් නොවන අවස්ථාවක ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ලෙස ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් නම්කිරීම**<br>සභාපති මව් සමාගම වන මහජන බැංකුවේ සභාපති ධූරය දරන බැවින් ඔහු ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස සලකනු ලැබේ.<br>එම නිසා, 2019 ඔක්තොබර් මස 25 දින ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ එම්.පී. අමිර්තනායගම් මහතා සමාගමේ සභාපති ලෙස පත්කරන තුරු සමාගමේ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන ලදී. සුජීව රාජපක්ෂ මහතා නව ස්වාධීන නොවන සභාපති ලෙස පත්කිරීමෙන් අනතුරුව 2020 මාර්තු මස 1 දින සිට ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ ලෙස එම්. කොරලි පීටර්ස් මහත්මිය පත් කර ඇත. | ✓ | |
| 7 (3) | **සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් අතර සම්බන්ධතා අනාවරණය**<br>තමන් විසින් ප්‍රකාශ කළ පරිදි, තමන්ට අදාළ කාර්යභාරයන් වෙන්වන, සභාපති/ප්‍රධාන විධායක නිලධාරී සහ/හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් අතර මූල්‍යමය, ව්‍යාපාර, පවුල් හෝ අනෙකුත් වැදගත් සම්බන්ධතා ඇතුළුව කිසිදු ආකාරයක සම්බන්ධතා නොමැත. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය |

# ආයතනික පාලනය



| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| 7 (4) | **සභාපතිගේ කාර්යභාරය**<br>සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය සභාපතිවරයාගේ වගකීම් විදහා පෙන්වන අතර එයට අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම සහ එහි ඵලදායි ක්‍රියාකාරිත්වය සහතික කිරීම ඇතුළත්ය. | ✓ | සභාපතිගේ කාර්යභාරය |
| 7 (5) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේදී සභාපතිගේ කාර්යභාරය**<br>සභාපති විසින් න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සමාගම් ලේකම් වෙත පවරා ඇත. | ✓ | |
| 7 (6) | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මතුකරන කරුණු පිළිබඳ ප්‍රමාණවත්ව සහ කාලීනව සියලුම අධ්‍යක්ෂවරු දැනුවත් කරන බවට සහතික කිරීම**<br>රැස්වීමකට පෙරාතුව සියලුම අධ්‍යක්ෂවරයින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඉස්මතු වන කාරණා පිළිබඳව මනාව දැනුවත් වීම සඳහා න්‍යාය පත්‍රය සහ සාකච්ඡාවට ගනු ලබන ලේඛන පරීක්ෂාවට ප්‍රමාණවත් කාලයක් ලබා දී යවනු ලබන බවට සභාපති වගබලාගනු ලබයි. | ✓ | |
| 7 (7) | **අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු තුළ සක්‍රීය දායකත්වය ලබාදීමට සියලුම අධ්‍යක්ෂවරු දිරි ගැන්වීම**<br>සභාපති අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවල න්‍යාය පත්‍රය, රටාව සහ ස්වරය සකස් කරන අතර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තීරණ ගැනීම තුළ සුදුසු පරිදි සලකා බලන බව සහ ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩල කටයුතුවලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ දායකත්වය ප්‍රවර්ධනය කරන බව සහතික කරයි. | ✓ | |
| 7 (8) | **විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය සහ විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර සම්බන්ධතාවය දිරිගැන්වීම**<br>සමාගම තුළ විධායක අධ්‍යක්ෂවරුන් නොමැත.<br>එසේවුවත්, අධ්‍යක්ෂ මණ්ඩල කටයුතුවලට සක්‍රීයව සහභාගිවීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාන අවස්ථාව ලබාදීම මගින් සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර අර්ථවත් වූ සම්බන්ධතාවයක් ඇති බවට සභපතිවරයා සහතික කරයි.<br>සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටුවල කාර්යසාධනය සම්බන්ධයෙන් සියලුම අධ්‍යක්ෂවරුන්ගේ අදහස් විමසා සිටින වාර්ෂික ස්වයං ඇගයීම් මගින් මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරයි. | ✓ | |
| 7 (9) | **ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සෘජු අධීක්ෂණයට සම්බන්ධවන කටයුතු සහ සභාපති විධායක රාජකාරි තුළ නිරතවීමෙන් වැළකීම**<br>සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහු සමාගමේ විධායක රාජකාරි කිසිවක් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සෘජු අධීක්ෂණය තුළ සෘජුවම සම්බන්ධ නොවේ. | ✓ | |
| 7 (10) | **කොටස්හිමියන් සමඟ ඵලදායි සන්නිවේදනය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය කොටස්හිමියන් සමඟ ප්‍රයෝජනවත් සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා සැලකියයුතු වැදගත්කමක් යොමු කරන අතර සමාගම සහ කොටස්හිමියන් අතර සාකච්ඡාව සහ සන්නිවේදනය සඳහා වාර්ෂික මහ සභා රැස්වීම සහ අනෙකුත් මහ සභා රැස්වීම් විධිමත් අවස්ථා බවට සැලකිල්ලට ගනී. ඒ අනුව, මෙම රැස්වීම්වලින් අධ්‍යක්ෂ මණ්ඩලයට කොටස්හිමියන් මුණගැසීමට සහ සභාපතිවරයාට සමාගමේ ප්‍රගතිය පහදා දීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය වෙත කොටස්හිමියන් යොමුකරන කරුණු පැහැදිලි කර දීමට වැදගත් අවස්ථාවක් ලබාදේ. | ✓ | CG – වාර්ෂික මහ සභා රැස්වීම (AGM) ප්‍රයෝජනවත් භාවිතය |
| 7 (11) | **ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය**<br>සමාගමේ ඉහළම විධායක නිලධාරී වන ප්‍රධාන විධායක නිලධාරී (CEO) වෙත සමාගමේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ප්‍රතිපත්ති සවිස්තර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ සුදුසු අවදානම් පරාමිතිවලට අනුකූලව සමාගමේ එදිනෙදා මෙහෙයුම් කරගෙන යාමට අවශ්‍ය බලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදී ඇත. ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ විස්තර කෙරේ. | ✓ | CG – ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **G** | **අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ කමිටු** | | |
| 8 (1) | **අධ්‍යක්ෂ මණ්ඩලය කමිටු පිහිටුවීම, එහි කාර්යයන් සහ වාර්තාකරණය**<br>සමාගම අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරන අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් පත්කර ඇත. ඒවානම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC), අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව (R&NC) සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) වේ. මෙම කමිටු අදාළ නිති හා රෙගුලාසිවලට අනුකූලව පිහිටුවා ඇත.<br>එක් එක් කමිටුවට ලේකම්වරයෙක් සිටින අතර ඔහු/ඇය එහි රැස්වීම් සූදානම් කර, වාර්තා පවත්වා ගනිමින් අදාළ කමිටුවේ සභාපතිගේ අධීක්ෂණය යටතේ අනෙකුත් ලේකම් කාර්යයන් සිදු කරනු ලබයි. | ✔ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව<br>පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව<br>සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව |
| 8 (2) | **විගණන කමිටුව** | | |
| (a) | **විගණන කමිටුවේ සභාපති** | ✔ | |
| අධි | විගණන කමිටුවේ වර්තමාන සභාපති, මීරියම් කොරලි පීටර්ස් මහත්මිය විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරියක් ලෙස 2020 මාර්තු මස 1 දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ඇත. ඇය එංගලන්තය සහ වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවක්ද වේ. පුද්ගලික සහ රාජ්‍ය අංශය තුළ ක්ෂේත්‍ර කිහිපයක් තුළ විගණනය, මූල්‍යකරණය සහ ගිණුම්කරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වසර 25කට වැඩි පුළුල් වූ පළපුරුද්ද ඇය සතුය.<br>ඇයගේ පත්කිරීමට පෙර, ජෙහාන් අමරතුංග මහතා විගණන කමිටුවේ සභාපති වූ අතර ඔහු 2019 දෙසැම්බර් මස 30 දින සිට ඉල්ලා අස් වී ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් ද වේ. ඔහුට මූල්‍යකරණය සහ කළමනාකරණය පිළිබඳ වසර 30කට අධික පළපුරුද්ද ඇත. | | |
| (b) | **විගණන කමිටුවේ සංයුතිය**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සිටින සාමාජිකයින් තිදෙනා විධායක නොවන අධ්‍යක්ෂවරු වන අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු විය. | ✔ | |
| (c) | **විගණන කමිටුවේ කාර්යයන්**<br>2018 අංක 19 දරන ජාතික විගණන පනතට අනුව, විගණකාධිපති විසින් හෝ විගණකාධිපති විසින් පත්කරනු ලබන යම් පුද්ගලයෙක් විසින් විගණනය සිදුකරනු ලබන බව විගණකාධිපති විසින් දන්වා ඇත. සමාගමේ විගණනය ඉටුකිරීම සඳහා සහයවීමට විගණකාධිපති විසින් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් විගණකවරුන් පත් කර ඇති බව සහ 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වුන වසර සඳහා විගණන ගාස්තු තීරණය කර ඇති බව විගණකාධිපති විසින් වැඩිදුරටත් සමාගමට දන්වා ඇත. එමනිසා, බාහිර විගණකවරුන්ගේ සහභාගිත්වය තුළ ඉටුකිරීමට කිසිදු කාර්යභාරයක් කමිටුවට නොමැත.<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව එහි රැස්වීම්වලදී අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ ප්‍රමිති යොදා ගැනීම පිළිබඳ සාකච්ඡා කරයි. | ✔ | |
| (d) | **බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ විෂය මූලිකත්වය මෙන්ම විගණන ක්‍රියාවලියේ ඵලදායිත්වය සමාලෝචනය කර නියාමනය කිරීම**<br>සමාගමේ විගණක විගණකාධිපතිවරයා වන බැවින් මෙය අදාළ නොවේ. | ✔ | |
| (e) | **බාහිර විගණකවරුන්ගේ විගණන නොවන සේවා පිළිබඳ විධිවිධාන**<br>සමාගමේ විගණක විගණකාධිපතිවරයා වන බැවින් මෙය අදාළ නොවේ. | ✔ | |
| (f) | **විගණනයේ විෂයපථය තීරණය කිරීම**<br>බාහිර විගණනයේ විෂයපථය විගණකාධිපතිවරයා විසින් තීරණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු නැවත සකස් කිරීම සහ කොවිඩ්-19 වසංගත අවස්ථාව හේතු කොට ගෙන, විගණන කමිටුවට 2020 මාර්තු මස 1 දිනට පෙර බාහිර විගණකවරුන් මුණගැසීමට නොහැකි විය. කෙසේවෙතත්, කමිටුව මෙම අරමුණ සඳහා 2020 ජූනි මස බාහිර විගණකවරුන් මුණ ගැසුණි. | ✔ | |

# ආයතනික පාලනය



| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| (g) | **විගණන කමිටුව විසින් සමාගමේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් මූල්‍ය අනාවරණවල සම්පූර්ණත්වය නියාමනය කිරීම පිණිස සමාගමේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරනු ලබයි.<br>සමාගමේ වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර කමිටුව සමාලෝචනය කර ඇත. | ✓ | |
| (h) | **අතුරු සහ අවසන් විගණන තුළින් ඇතිවන ගැටලු, ප්‍රශ්න සහ වෙන්කිරීම් පිළිබඳ බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු නැවත සකස් කිරීම සහ කොවිඩ්-19 වසංගත අවස්ථාව හේතු කොට ගෙන, විගණන කමිටුවට 2020 මාර්තු මස 31 දිනට පෙර බාහිර විගණකවරුන් මුණගැසීමට නොහැකි විය. කෙසේවෙතත්, කමිටුව 2020 ජූනි මස බාහිර විගණකවරුන් මුණ ගැසුණ අතර, ගැටලු, ප්‍රශ්න සහ වෙන්කිරීම් පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාව ඔවුන්ට ලබාදෙන ලදී. | ✓ | |
| (i) | **බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකරණ ප්‍රතිචාර සමාලෝචනය කිරීම**<br>2018/19 වසර සඳහා බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපිය සහ ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ ප්‍රතිචාර කමිටුව සමාලෝචනය කරන ලදී. | ✓ | |
| (j) | **බාහිර විගණකවරුන්ගේ කාර්යය සමාලෝචනය කිරීම**<br>ක්‍රියාවට නංවාඇති අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂයපථය සහ කාර්යය මෙන්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධානීගේ සහ කාර්යය මණ්ඩලයේ අවශ්‍ය බලය ආවරණය කරයි<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව 2019/20 මූල්‍ය වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර අනුමත කර ඇත. මෙම සැලැස්ම සම්පත් ලබාගතහැකිවීමේ හැකියාව මත පදනම් වී සකස් කරන ලද අතර අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාවට නැංවීම සහතික කර ඇත.<br>කමිටුව 2019 පෙබරවාරි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානිගේ සහ කාර්යය මණ්ඩලයේ කාර්යසාධනය සමාලෝචනය කරන ලදී.<br>පසුගිය වසර දෙක තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩල සාමාජිකයින්ගේ හෝ බාහිර සේවා සපයන්නන්ගේ පත්කිරීම හෝ ඉවත් කිරීම් කිසිවක් සිදු වී නොමැත.<br>බාහිර විගණක කාර්යය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සෘජුවම වාර්තා කරන බැවින් ඔවුන් ස්වාධීන වේ. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය ආමන්ත්‍රණය කරයි.<br>විගණන කටයුතු අපක්ෂපාතිව, ප්‍රවීනතාව සහ නිසි වෘත්තිය ආරක්ෂාව සමඟ ඉටුකර ඇති බව සහතික කිරීමට අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය ක්‍රියාවට නංවා ඇත. | ✓ | |
| (k) | **අභ්‍යන්තර විමර්ෂණ සහ කළමනාකරණ ප්‍රතිචාරවල ප්‍රධාන සොයා ගැනීම්**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණන විමර්ශන සහ එයට කළමනාකරණ ප්‍රතිචාරවල ප්‍රධාන සොයාගැනීම් සැලකිල්ලට ගනී. | ✓ | |
| (l) | **විගණන කමිටු රැස්වීම්වල සහභාගිත්වය**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට විධායක අධ්‍යක්ෂවරු ඇතුළත් නොවේ. | ✓ | |
| (m) | **විගණන කමිටුවේ බලය සහ සම්පත්**<br>විගණන කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත යොමු නිර්දේශ එහි පාලනය යටතේ යම් කරුණක් විමර්ශනය කිරීමට පැහැදිලි අධිකාරි බලය ලබා දේ. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව |
| (n) | **විගණන කමිටු රැස්වීම්**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමාලෝචිත මූල්‍ය වසර තුළ හතර වරක් හමු වී ඇත. කෙසේවෙතත්, කමිටු රැස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු නැවත සකස් කිරීම හේතු කොට ගෙන මූල්‍ය වසරේ අවසන් කොටස තුළ විධිමත් නොවීය. | ✓ | |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| (o) | **වාර්ෂික වාර්තාව තුළ අනාවරණ**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්<br>• 2019/20 මූල්‍ය වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු<br>• වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ රැස්වීම් ගණන<br>• කමිටුවේ රැස්වීම්වලදී සාමාජිකයින්ගේ පැමිණීම විස්තර කරයි | ✔ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව |
| (p) | **රැස්වීම් වාර්තා වාර්තාකරණය සහ පවත්වා ගැනීම**<br>යොමු නිර්දේශවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස අභ්‍යන්තර විගණන කාර්යයන් හී ප්‍රධානී ප්‍රමාණවත් විස්තර වාර්තා කර පවත්වා ගනී. | ✔ | |
| (q) | **තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය සහ බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධතාව**<br>සමාගම තොරතුරු දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් යොදා ගෙන ඇති අතර ඉන් සේවකයින්ට විශ්වාසයෙන් නීති, නියමයන් සහ රෙගුලාසි කඩකිරීම සහ සදාචාර විරෝධී චර්යාවන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කිරීමට හැකියාව ඇති කරයි. සියලුම සේවකයින්ගේ දැනගැනීම සඳහා මෙය සමාගමේ අභ්‍යන්තර ජාලයේ ප්‍රකාශයට පත් කර ඇත. | ✔ | |
| 8 (3) | **අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව** | | |
| (a) | **අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන්, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් – මෙහෙයුම් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් සහ පාලන යන අයගෙන් සමන්විත වන අතර ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම වැනි පුළුල් අවදානම් වර්ගීකරණ අධීක්ෂණය කරයි.<br>පරිපාලිත සමාගම්වල ප්‍රධාන අවදානම් හිමිකරුවන්, අභ්‍යන්තර විගණන ප්‍රධානී, අනුකූලතා නිලධාරී, ආරාධනය මත අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම්වලට සහභාගී වේ.<br>කරුණාකර වැඩිදුර තොරතුරු සහ කමිටුවේ කාර්යයන් පිළිබඳ දැනගැනීම සඳහා අංක 124 සිට 126 දක්වා පිටුවල පවතින "අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව" බලන්න. | ✔ | |
| (b) | **අවදානම් තක්සේරු කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමාගම සහ එහි පරිපාලිත සමාගම් සඳහා ස්ථාපිත සුදුසු අවදානම් දර්ශක තුළින් ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් නියාමනය කරයි. අවදානම් කළමනාකරණය අවශ්‍ය අවස්ථාවලදී සමාගම් පදනමක් මත සහ සමූහ පදනමක් මත කරගෙන යනු ලබයි.<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමාගම සහ එහි පරිපාලිත සමාගම්වල අවදානම් උපකරණ පුවරු වාර්තා සමාලෝචනය කරන අතර යම් අවදානම් ස්ථාපිත අවදානම් ඉවසුම් සීමාව ඉක්මවා යන අවස්ථාවක එවැනි විශේෂ අවදානම්වල සෘණාත්මක බලපෑම් අවම කිරීමට හා නිවැරදි කිරීමේ පියවර අරගනිමු. | ✔ | |
| (c) | **විධායක මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය**<br>සමාගමේ වත්කම් සහ වගකීම් කමිටුව (ALCO) අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ස්ථාපිත ඉවසුම් සීමාව මත පදනම් වී ද්‍රවශීලතාව අවදානම සහ වෙළෙඳපොළ අවදානම සමාලෝචනය කර නියාමනය කරයි. යොමු නිර්දේශවල දක්වා ඇති විෂයපථයට අනුව වත්කම් සහ වගකීම් කමිටුවේ කාර්යසාධනයේ ඵලදායිත්වය පිළිබඳ වාර්ෂික ඇගයීමක් කමිටුව සිදුකරයි.<br>පහසුකමේ අවදානම සහ ප්‍රමාණය මත පදනම් වී ගනුදෙනුකරුවන්ගේ අයදුම්පත් ඇගැයීම සඳහා නියමිත ණය අනුමත සීමා සහිත ණය බලතල මට්ටම් සමාගම ස්ථාපිත කර ඇත. සමාගම ණය කමිටුවක් වෙනුවට ණය අනුමත කිරීම් සඳහා මෙම ණය බලතල මට්ටම් යොදා ගනී. | ✔ | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| (d) | **කමිටුව විසින් තීරණය කරන ලද විචක්ෂණ මට්ටම ඉක්මවන අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් ඉවසුම් සීමාව තීරණය කර ඇති අතර සමාගමේ අවදානම් පැතිකඩ තුළ එක් එක් අවදානම වර්ගය කමිටුව විසින් එහි රැස්වීම්වලදී එවැනි අවදානම් ඉවසුම් මට්ටම්වලට අනුව සමාලෝචනය කෙරේ. අවදානම් මට්ටම් ස්ථාපිත අවදානම් සීමාවෙන් ඉදිරියට ගොස් ඇති බව සහතික වන අවස්ථාවල කමිටුව අවශ්‍ය තිරණ ලබා දී ඇත. | ✓ | |
| (e) | **රැස්වීම්වල වාර ගණන**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව 2019/20 මූල්‍ය වසර තුළ අවස්ථා දෙකකදී මුණ ගැසී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (“BIRMC” හෝ “කමිටුවේ”) යොමු නිර්දේශවලට TOR අනුව, කමිටුව සෑම වසරකම හතර (04) වරක් හමුවිය යුතුය. කෙසේවෙතත්, ඉහත සඳහන්කළ හේතු නිසා කමිටුවේ රැස්වීම් දෙවරක් (02) පමණක් කැඳවන ලදී.<br>2019 ඔක්තෝබර් 25 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් BIRMC නැවත සකස් කර විධායක නොවන ස්වාධින නොවන අධ්‍යක්ෂ, ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතා, විධායක නොවන ස්වාධින අධ්‍යක්ෂ, ආචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා සහ විධායක නොවන ස්වාධින නොවන අධ්‍යක්ෂ, රසිත ගුණවර්ධන මහතා පිළිවෙළින් සභාපති සහ කමිටුවේ සාමාජිකයින් ලෙස පත් කරන ලදී.<br>ඉන්පසුව, කමිටු සභාපති සහ කමිටු සාමාජික ලෙස විධායක නොවන ස්වාධින නොවන අධ්‍යක්ෂ, ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතා, විධායක නොවන ස්වාධින අධ්‍යක්ෂ, ආචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා 2019 දෙසැම්බර් මස මුලදී සමාගමේ අධ්‍යක්ෂක තනතුරින් ඔවුන්ගේ ඉල්ලා අස්වීම් පිළිවෙළින් ලබාදෙන ලදී. ඒ අනුව, කමිටුවට නව අධ්‍යක්ෂවරුන් පත්කරන තුරු රැස්වීමක් කැඳවීමට අපට නොහැකි විය. අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කිරීමෙන් පසු, 2020 පෙබරවාරි මස 20 දින BIRMC නැවත පිහිටුවන ලද අතර 2020 මාර්තු මස රැස්වීමක් පැවැත්වීමට නියම කරන ලදී. කෙසේවෙතත්, ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගතය පැතීරීම හේතු කොට ගෙන ඇති වූ වාතාවරණය හමුවේ, එකී රැස්වීම කල්දැමීමට අපට සිදු වූ අතර එම රැස්වීම 2020 ජූනි මස 19 දින පවත්වන ලදී. | ✗ | |
| (f) | **විශේෂිත අවදානම් හඳුනාගැනිමට අපොහොසත් නිලධාරීන්ට එරෙහි ක්‍රියාමාර්ගය සහ කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ වත්කම් සහ වගකීම් කමිටුව විසින් සාමුහිකව අවදානම් හඳුනාගන්නා අතර ඒ සම්බන්ධ තීරණ සාමුහිකව අරගනී. | ✓ | |
| (g) | **අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීමකින් ආසන්නතම සතියක් තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවදානම් තක්සේරු වාර්තා ඉදිරිපත් කරයි. | ✓ | |
| (h) | **අනුකූලතා කාර්යයන් ස්ථාපිත කිරීම**<br>නීති, රෙගුලාසි සහ නියාමන මගපෙන්වීම්වලට සමාගමේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත.<br>ජ්‍යේෂ්ඨ කළමනාකරණ සේවක කණ්ඩායම තුළ නීතිඥයෙක් විසින් අනුකූලතා කාර්යය මෙහෙයවනු ලබන අතර ඔහු සාජුවම නීති, රෙගුලාසි, උපදෙස්, නියමයන්, නියාමන මගපෙන්වීම් සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාගමේ අනුකූලතාව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි<br>ඔහුගේ ඉල්ලා අස්වීමෙන් පසු, අදාළ පුරප්පාඩුව සපුරන තුරු කළමනාකරණ සේවක කණ්ඩායම තුළ සිටින නීතිඥයෙක් වන පුද්ගලයෙක් වැඩබලන අනුකූලතා නිලධාරී ලෙස පත්කරන ලදී. | ✓ | අනුකූලතා කළමනාකරණය |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| **H** | **සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු** | | |
| 9 (2) | **බැඳියා පිළිගැටුම් වැළැක්විම**<br>සමාගම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් (RPT) ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව, "සම්බන්ධිත පාර්ශ්ව" ලෙස සලකනු ලබන පුද්ගල වර්ගීකරණ හඳුනාගෙන ඇත. RPT ප්‍රතිපත්තියට අනුකූලව, එක් එක් අධ්‍යක්ෂ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් ඔවුන්ට අදාළ සම්බන්ධිත පාර්ශ්ව හඳුනා ගැනීමේ අරමුණ සඳහා ස්වයං ඇගයීම් ලබාගනී. මෙවැනි ප්‍රකාශයන් හි ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම් වී, සමාගමේ ජාලය පුරා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ දත්ත සොයා ලබාගැනීමට සමාගමට හැකියාව ඇති කරන ක්‍රමයක් සමාගම සකස් කර ඇත.<br>සමාගමේ ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය (සංග්‍රහය) තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් පුද්ගලික සම්බන්ධතා, බාහිර සංවිධානවලින් ඇතිවන වියහැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් සහ ඔහුගේ/ඇයගේ ස්වාධීන විනිශ්චය මත සම්බන්ධයක් තිබිය හැකි වැදගත් කරුණු තුළ බැඳියාවන් ඔහුට/ඇයට තිබේද යන්න තීරණය කිරීම අවශ්‍ය වේ.<br>එමෙන්ම මෙම සංග්‍රහයෙන් වියහැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් ඇති අධ්‍යක්ෂවරුන් විසින් තමන් ඒ පිළිබඳ දැනගත් වහාම අධ්‍යක්ෂ මණ්ඩලයට එය අනාවරණය කිරිමට අවශ්‍ය වේ.<br>සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව තවදුරටත් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ඵලදායි කළමනාකරණය සහ පාලනය ශක්තිමත් කරයි. | ✓ | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව |
| 9 (3) | **පනත් නියෝගය තුළ ආවරණය වන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**<br>සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය තුළින් සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ස්වභාවය සහ වටිනාකම නොසලකා සම්බන්ධිත පාර්ශ්ව සමඟ සියලුම ගනුදෙනු ආවරණය කරයි. | ✓ | |
| 9 (4) | **යම් පාර්ශ්වයකට "වඩා හිතකර සැලකීම" ක් ලබාදෙන ආකාරයකින් සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ ගනුදෙනුවල නිරතවීම තහනම්ය.**<br>අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් මෙම නියමය තුළ යම් පාර්ශ්වයන්ට "වඩා හිතකර සැලකිම"ක් ලබාදෙන ආකාරයකින් සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ සමාගම ගනුදෙනුවල නිරත නොවන බව සහතික කිරීමට ක්‍රියාපටිපාටිය සපයයි.<br>මෙය දැනට පවත්නා මාර්ගගත වැලැක්වීමේ පද්ධතිය තුළින් තවදුරටත් සහතික කරනු ලබන අතර එම ක්‍රමය සමාගමට සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමනය කර වාර්තා කිරීමට සහ සමාගමේ ජාලය තුළ එයට අදාළ දත්ත සොයා ලබා ගැනීමට හැකියාව ඇති කරයි. | ✓ | |
| **I** | **අනාවරණයන්** | | |
| 10 (1) | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අනාවරණ**<br>2019/20 වසර සඳහා සමාගමේ විගණනය කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සහ කාල පරාසයන් තුළදී ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශ නියාමන අධීක්ෂණ බලධාරීන් විසින් නියමකළ ආකෘති සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ප්‍රකාශයට පත් කරන ලද බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.<br>ඉහත 10 (1) (අ) රීතියේ සඳහන් කරන මූල්‍ය ප්‍රකාශ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගේ සංක්ෂිප්ත ආකාරයකින් ප්‍රකාශයට පත්කළ බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. | ✓ | |
| 10 (2) | **වාර්ෂික වාර්තාව තුළ සුදුසු අනාවරණ සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම** | ✓ | |
| (a) | විගණනය කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ විශේෂ අනාවරණ සමඟ අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම.<br>විගණනය කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ විශේෂ අනාවරණ සමඟ අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. | ✓ | මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම<br>ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව |

| රීති යොමුව | මූලධර්මය සහ අනුකූලතාව | අනුකූලතා තත්ත්වය | වාර්තාවට යොමුව |
|---|---|---|---|
| (b) | **සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රම වාර්තා කිරීම**<br>මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශ්වාසය සහ භාරය සම්බන්ධයෙන් සාධාරණ සහතික කිරීමක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රම සැලසුම් කර ඇති බව, සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්මවලට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇති බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. | ✓ | මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය |
| (c) | අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායිත්වය පිළිබඳ බාහිර විගණකවරුන්ගේ සහතික කිරීම.<br>මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ බාහිර විගණකවරුන්ගේ සහතිකය අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගෙන ඇත. | ✓ | |
| (d) | අධ්‍යක්ෂවරුන්ගේ නම්, සමාගම සමඟ ගනුදෙනු ඇතුළුව ඔවුන්ගේ විස්තර<br>අධ්‍යක්ෂවරුන්ගේ නම්, සමාගම සමඟ ගනුදෙනු ඇතුළුව ඔවුන්ගේ විස්තර ප්‍රමාණවත් ලෙස අනාවරණය කර ඇත. | ✓ | සටහන 58.2 – ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ හා ඔවුන්ගේ පවුල් සාමාජිකයින් |
| (e) | සමාගම විසින් අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමිකය<br>අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවන ලද මුළු පාරිශ්‍රමිකය පිළිබඳ විස්තර ප්‍රමාණවත් ලෙස අනාවරණය කර ඇත. | ✓ | සටහන 58.2 – ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ (KMP) පාරිශ්‍රමිකය |
| (f) | සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස එක් එක් සම්බන්ධිත පාර්ශ්වය සම්බන්ධයෙන් ගෙවිය යුතු ශුද්ධ අනුග්‍රහය.<br>එක් එක් සම්බන්ධිත පාර්ශ්වය සම්බන්ධයෙන් මුළු ශුද්ධ අනුග්‍රහය පිළිබඳ විස්තර සහ සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස එක් එක් සම්බන්ධිත පාර්ශ්වය සම්බන්ධයෙන් ගෙවිය යුතු ශුද්ධ අනුග්‍රහය පිළිබඳ විස්තර ප්‍රමාණවත් ලෙස අනාවරණය කරනු ලබයි. | ✓ | සටහන 58.3 – ශුද්ධ අනුග්‍රහය සහ ප්‍රාග්ධන අරමුදල් වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ අනුග්‍රහය |
| (g) | ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට ගෙවන ලද පාරිශ්‍රමිකය ඔවුන් යම් ගනුදෙනුවල එකතුකළ වටිනාකම.<br>2019/20 මූල්‍ය වසර තුළ සමාගම විසින් එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට ගෙවන ලද පාරිශ්‍රමිකවල එකතුකළ වටිනාකම් පිළිබඳ විස්තර සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ සමාගමේ ගනුදෙනුවල එකතුකළ වටිනාකම් ප්‍රමාණවත් ලෙස අනාවරණය කරනු ලබයි. | ✓ | මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 58.2 |
| (h) | අනුකූලතාවය පිළිබඳ සහතිකය.<br>2019/20 මූල්‍ය වසර තුළ විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ සමාගමේ අනුකූලතාව පිළිබඳ විස්තර මෙම වාර්තාව තුළ පැහැදිලි කෙරේ.<br>මෙම වාර්තාව තුළ අනාවරණය කරන ප්‍රමාණය සහ ඉහත සඳහන් කරන සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව හැර, 2019/20 මූල්‍ය වසර තුළ විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්ට සැලකියයුතු අයුරින් අනුකූල නොවූ අවස්ථා නොමැත. | ✓ | සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව<br>ආයතනික පාලන වාර්තාව |
| (i) | නියාමන සහ අධීක්ෂණ ගැටලු පිළිබඳ ප්‍රකාශය.<br>සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රමය තුළ දෝෂ හෝ මූල්‍ය ව්‍යාපාර පනත සහ නියමයන් සහ ඒ යටතේ මුදල් මණ්ඩලය විසින් ජනතාවට අනාවරණය කළ යුතුය යන විධානවලට අනුකූල නොවීම සම්බන්ධව සැලකියයුතු අධීක්ෂණ ගැටලු නොතිබුණි. | ✓ | |
| (j) | අනුකූලතාව පිළිබඳ බාහිර විගණකවරුන්ගේ සහතික කිරීම.<br>ආයතනික පාලන විධානවල අනුකූලතා අවශ්‍යතා සපුරාලීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (SLSRS 4750) විසින් නිකුත් කළ සම්බන්ධිත සේවා 4750 පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති ක්‍රියාපටිපාටි බාහිර විගණක විසින් ඉටුකර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ආමන්ත්‍රණය කළ ඔවුන්ගේ වාර්තාව තුළ ඉදිරිපත් කරන ඔවුන්ගේ සොයාගැනීම් ඉහත අනාවරණය කළ කරුණු සමඟ අනුකූල වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත වාර්තා කළ කරුණු සමඟ වැදගත් නොගැලපීම් හඳුනාගෙන නැත. අවශ්‍ය අවස්ථාවලදී විගණක විසින් සිදුකළ නිර්දේශ පෙර සිදුකළ පරිදි 2020/21 ක්‍රියාත්මක කරනු ලැබේ. | ✓ | |
| **J** | **සංක්‍රාන්තිමය විධිවිධාන** | | |
| 11 | **සංක්‍රාන්තිමය සහ වෙනත් විධිවිධාන** | ✓ | |

## කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් (ලැයිස්තුගත නියමයන්) 7.6 හි වාර්ෂික වාර්තාවේ අන්තර්ගතයේ අවශ්‍යතා සමඟ අපගේ අනුකූලතාවය, නියමයන් 7.10 හි ආයතනික පාලනය පිළිබඳ අවශ්‍යතා සහ නියමයන් 9.3.2 හි වාර්ෂික වාර්තාව තුළ අනාවරණ (Listing Rules)

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් 7.6 ට අනුව, වාර්ෂික වාර්තාවේ අන්තර්ගතයන් පිළිබඳ අනුකූලතාවයේ තත්ත්වය පහත වගුවෙන් නිරූපණය වේ.

| රීති අංකය | අනාවරණය කළයුතු තොරතුරු | අනුකූලතා තත්ත්වය | පිටු යොමුව |
|---|---|---|---|
| 7.6 (i) | මූල්‍ය වසර තුළ තනතුරු දරන ලද අධ්‍යක්ෂවරුන්ගේ නම් | ✓ | 80 සහ 81 |
| 7.6 (ii) | වසර තුළ සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ප්‍රධාන කටයුතු සහ එහි යම් වෙනස්වීම් | ✓ | 6, 112 සහ 155 |
| 7.6 (iii) | ඡන්ද හිමි සහ ඡන්ද අහිමි කොටස්වල විශාලතම හිමිකම දරන 20 දෙනාගේ නම් සහ කොටස් ගණන සහ මූල්‍ය වසර අවසානයේදී දරන ලද එකී කොටස්වල ප්‍රතිශතය | ✓ | 294 |
| 7.6 (iv) | ජනතාව දරන ප්‍රතිශතය | ✓ | 293 |
| 7.6 (v) | මූල්‍ය වසර ආරම්භයේදී සහ මූල්‍ය වසර අවසානයේදී සමාගමේ කොටස් තුළ අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන විධායක නිලධාරී දරන කොටස් ගණන | ✓ | 294 සහ 295 |
| 7.6 (vi) | දැකියහැකි වැදගත් අනාගත සාධකවලට අදාළ වැදගත් තොරතුරු | ✓ | 127-138 |
| 7.6 (vii) | සේවක සහ කාර්මික සම්බන්ධතාවලට අදාළ වැදගත් ගැටලු පිළිබඳ විස්තර | සමාලෝචිත වසර තුළ, සේවක සහ කාර්මික සම්බන්ධතාවලට අදාළ වැදගත් ගැටලු නොමැත. | 41-45 |
| 7.6 (viii) | මූල්‍ය වසර අවසානයේදී අයත් ඉඩම්වල ගොඩනැගිලි ප්‍රමාණ, ස්ථාන, ඇගයීම් සහ ගණන සහ ආයෝජන දේපල | ✓ | 224 |
| 7.6 (ix) | මූල්‍ය වසර අවසානයේදී ප්‍රකාශිත ප්‍රාග්ධනය නියෝජනය කරන කොටස් ගණන | ✓ | 245-291 |
| 7.6 (x) | එක් එක් පන්තියේ ස්කන්ධ සුරැකුම්පත්වල හිමිකරුවන් ගණන පිළිබඳ බොදාහැරීම් උපලේඛනය සහ ඔවුන්ගේ මුළු අයිතියේ ප්‍රතිශතය | ✓ | 293 |
| 7.6 (xi) | පහත දෑ පිළිබඳ අනුපාත සහ වෙළෙඳපොල මිල තොරතුරු: | | |
| | **ස්කන්ධය:** කොටසක ලාභාංශය, ලාභාංශ ගෙවීම් අනුපාතය, කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම, කොටසක වෙළෙඳපොල වටිනාකම (මූල්‍ය වසර තුළ සහ මූල්‍ය වසර අවසානයේදී ඉහළම සහ පහළම වටිනාකම්) | ✓ | 290 සහ 291 |
| | **ණය:** වසර තුළ රජයේ සුරැකුම්පත්වලට සමාන වන පොළී අනුපාතය, ණය/ස්කන්ධ අනුපාතය. පොළී ආවරණය, ක්ෂණික වත්කම් අනුපාතය, වෙළෙඳපොල මිල ගණන් සහ ඉපයීම (ඉහළම සහ පහළම මිල සහ අවසාන වරට විකුණන ලද මිල) | ✓ | 295 සහ 296 |
| | ණය ශ්‍රේණිගතකරණයේ යම් වෙනස්වීම් | ✓ | 300 |
| 7.6 (xii) | වසර අවසානයේදී පොතේ වටිනාකමින් සැලකියයුතු අයුරින් වෙනස් වන්නේනම් සමාගමේ හෝ එහි පරිපාලිත සමාගම්වල ස්ථාවර වත්කම් සහ ඉඩම්වල වෙළෙඳපොල මිලෙහි සැලකියුතු වෙනස්වීම් | ✓ | 220-225 |
| 7.6 (xiii) | වසර තුළ මහජන නිකුතුව, හිමිකම් නිකුතුව සහ පුද්ගලික ස්ථාපන තුළින් ලබාගත් අරමුදල්වල විස්තර | වසර තුළ මහජන නිකුතුව, හිමිකම් නිකුතුව සහ පුද්ගලික ස්ථාපන තුළ අපි අරමුදල් රැස් නොකළෙමු | අදාළ නැත |
| 7.6 (xiv) | සේවක කොටස්හිමිකාරත්වය සහ කොටස් විකල්ප යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු | සේවක කොටස්හිමිකාරත්වය සහ කොටස් විකල්ප යෝජනා ක්‍රම වර්තමානයේ සමාගමට නොමැත | අදාළ නැත |

| රීති අංකය | අනාවරණය කළයුතු තොරතුරු | අනුකූලතා තත්ත්වය | පිටු යොමුව |
|---|---|---|---|
| 7.6 (xv) | ලැයිස්තුගත නියමයන් 7 වගන්තියේ 7.10.3, 7.10.5 (c) සහ 7.10.6 (c) අනුව ආයතනික පාලන ව්‍යවහාරවලට අදාළ අනාවරණ | ✔ | 110 |
| 7.6 (xvi) | විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයේ ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම්වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු | මෙම කොටස තුළට වැටෙන ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන වලට සටහන් 58.2 – සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු යටතේ අනාවරණය කර ඇත. මෙම ගනුදෙනු ව්‍යාපාරවල සාමාන්‍ය රටාව තුළ මූල්‍ය වසර පුරා සිදු වී ඇත. | 262 |

## ලැයිස්තුගත නියමයන් 7.10 හි ආයතනික පාලනය පිළිබඳ අවශ්‍යතා අනුව දක්වා ඇති අනුකූලතාව

| රීති අංකය | අනාවරණ අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය | විස්තර |
|---|---|---|---|
| 7.10.1 (a) | අධ්‍යක්ෂවරුන්ගෙන් දෙදෙනෙක් හෝ තුනෙන් එකක් යන දෙකෙන් වඩාත් ඉහළ අගයට අනුකූලව විධායක නොවන අධ්‍යක්ෂවරු සමන්විත විය යුතුය. | ✔ | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත විය. |
| 7.10.2 (a) | විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් දෙදෙනෙක් හෝ තුනෙන් එකක් යන දෙකෙන් ඉහළ අගයට අනුකූලව අධ්‍යක්ෂවරුන් ස්වාධීන විය යුතුය. | ✔ | 2020 මාර්තු මස 31 දිනට සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් නවයක් සිටි අතර තිදෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු විය. |
| 7.10.2 (b) | එක් එක් විධායක නොවන අධ්‍යක්ෂවරයා නියමිත ආකෘතිය තුළ ස්වාධීනත්වය/ස්වාධීන නොවීම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. | ✔ | සියලුම විධායක නොවන අධ්‍යක්ෂවරු අවශ්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. |
| 7.10.3 (a) | ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නම් වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කළ යුතුය. | ✔ | පිටු අංක 68 සිට 71 හි අධ්‍යක්ෂ මණ්ඩලය සහ පිටු අංක 80 සහ 81 ආයතනික පාලනය පරිශීලනය කරන්න. |
| 7.10.3 (b) | අධ්‍යක්ෂවරයෙක් ආයතන පාලනය පිළිබඳ නියමයන් පරිදි ස්වාධීනවීමට සුදුසුකම් නොලබන අවස්ථාවකදී වුවත් එම අධ්‍යක්ෂ ස්වාධීන බවට අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන අවස්ථාවක, වාර්ෂික වාර්තාව තුළ තීරණය කිරීමේ පදනම විශේෂයෙන් දැක්විය යුතුය. | අදාළ නැත | සමාගමේ සියලුම ස්වාධීන අධ්‍යක්ෂවරුන් විශේෂ නිර්ණායක සපුරා ඇති බැවින්, එවැනි කිසිදු තීරණය කිරීමක් අවශ්‍ය නොවුණි. |
| 7.10.3 (c) | එක් එක් අධ්‍යක්ෂවරයා පිළිබඳ ඔහුගේ හෝ ඇයගේ නිපුන ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ඇතුළත්ව කෙටි විස්තරයක් වාර්ෂික වාර්තාව තුළ ප්‍රකාශයට පත් කළ යුතුය. | ✔ | පිටු අංක 68 සිට 71 හි අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර පරිශීලනය කරන්න. |
| 7.10.3 (d) | අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලද නව අධ්‍යක්ෂවරයන් පිළිබඳ කෙටි විස්තරයක් ජනතාවට දැනුවත් කිරීම සඳහා කොටස් හුවමාරුව වෙත ලබාදිය යුතුය. | ✔ | 2019/20 මූල්‍ය වසර තුළ දෙවරක් අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කිරීමට අදාළව, අධ්‍යක්ෂවරු නව දෙනෙක් සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලදී. ඒ පිළිබඳ සාරාංශ ජනතාවට දැනුවත් කිරීම සඳහා කොටස් හුවමාරුව වෙත ලබා දෙන ලදී. |
| 7.10.5 | ලැයිස්තුගත සමාගමකට පාරිශ්‍රමික කමිටුවක් තිබිය යුතුය. | ✔ | පිටු අංක 120 සහ 121 හි අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික නාමයෝජනා කමිටු වාර්තාව විස්තර පරිශීලනය කරන්න. |
| 7.10.5 (a) | පාරිශ්‍රමික කමිටුව අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් හෝ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් බහුතරය යන දෙකෙන් ඉහළ අගයෙන් සමන්විත විය යුතුය. | ✔ | 2020 මාර්තු මස 31 දිනට, අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික නාමයෝජනා කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් ස්වාධීන විය. කමිටුවේ සභාපති විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි.<br>පිටු අංක 120 සහ 121 හි පාරිශ්‍රමික නාමයෝජනා කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |
| 7.10.5 (b) | පාරිශ්‍රමික කමිටුවේ කාර්යයන් වන්නේ ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය නිර්දේශ කිරීමයි. | ✔ | පිටු අංක 120 සහ 121 හි අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික නාමයෝජනා කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |

| රීති අංකය | අනාවරණ අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය | විස්තර |
|---|---|---|---|
| 7.10.5 (c) | වාර්ෂික වාර්තාව තුළ: | | |
| | (i) පාරිශ්‍රමික කමිටුව සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ නම් | ✔ | පිටු අංක 120 සහ 121 හි අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික නාමයෝජනා කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |
| | (ii) පාරිශ්‍රමික ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශයක් | ✔ | පිටු අංක 120 සහ 121 හි අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික නාමයෝජනා කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |
| | (iii) විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද එකතුකළ පාරිශ්‍රමිකය ඇතුළත් විය යුතුය | ✔ | පිටු අංක 174 හි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 15 පරිශීලනය කරන්න. |
| 7.10.6 | ලැයිස්තුගත සමාගමකට විගණන කමිටුවක් තිබිය යුතුය. | ✔ | පිටු අංක 118 සහ 119 හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |
| 7.10.6 (a) | විගණන කමිටුව අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් හෝ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් බහුතරය යන දෙකෙන් ඉහළ අගයෙන් සමන්විත විය යුතුය. | ✔ | විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් ස්වාධීන විය. කමිටුවේ සභාපති විධායක නොවන ජ්‍යෙෂ්ඨ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකි. |
| | ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වෙති. | ✔ | ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී යන දෙදෙනා ආරාධනය අනුව විගණන කමිටු රැස්වීම්වලට සහභාගි විය |
| | කමිටුවේ සභාපති හෝ එක් සාමාජිකයෙක් පිළිගත් වෘත්තිය ගිණුම්කරණ ආයතනයක සාමාජිකයෙක් විය යුතුය. | ✔ | සමාලෝචිත වසර තුළ කමිටුවේ සභාපති ලෙස සේවය කළ විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනා පිළිගත් වෘත්තිය ගිණුම්කරණ ආයතනයක සාමාජිකයින් විය. |
| 7.10.6 (b) | විගණන කමිටුවේ කාර්යයන් ලැයිස්තුගත නියමයන් 7.10 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතුය. | | පිටු අංක 118 සහ 119 හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |
| 7.10.6 (c) | වාර්ෂික වාර්තාව තුළ: | | |
| | විගණන කමිටුව සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේනම් | ✔ | පිටු අංක 118 සහ 119 හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |
| | විගණන කමිටුව විගණකවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කළ යුතු අතර එකී තීරණය කිරීම සඳහා පදනම අනාවරණය කළ යුතුය. | ✔ | පිටු අංක 118 සහ 119 හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |
| | ලැයිස්තුගත නියමයන් 7.10 වගන්තියේ දක්වා ඇති කාර්යයන් පිළිබඳ අනුකූලතා ආකාරය දක්වා ඇති විගණන කමිටුවේ වාර්තා | ✔ | පිටු අංක 118 සහ 119 හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. |

## ලැයිස්තුගත නියමයන් 9.3.2 හි අවශ්‍යතාවන්ට අනුව වාර්ෂික වාර්තාව තුළ අනාවරණ අනුකූලතාව

| රීති අංකය | අනාවරණය කළ යුතු තොරතුරු | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| 9.3.2 (a) | විගණන මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයේ ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම්වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන **පුනරාවර්තන** නොවන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු | ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම්වලින් 5% ඉක්මවන පුනරාවර්තන නොවන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නොමැත. |
| 9.3.2 (b) | විගණන මූල්‍ය ප්‍රකාශන අනුව දළ අයභාරය/ආදායමෙන් 10% ඉක්මවන **පුනරාවර්තන** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු | 2019/20 මූල්‍ය වසර තුළ සීමාව ඉක්මවන ලද පුනරාවර්තන ගනුදෙනුවල විස්තර මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 58 සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ යටතේ අනාවරණය කෙරේ. |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 168 වගන්තියේ අවශ්‍යතාව පරිදි සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කෙරේ. එමෙන්ම එය 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත සහ ඒ යටතේ නිකුත්කළ විධාන සහ, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නියමයන්හි අවශ්‍ය කරන තොරතුරු ලබා දේ.

## 1 – පොදු කරුණු

සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් තහවුරු කරමින් 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් සහ සමූහය සදහා වූ විගණනය කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් සහ මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ වාර්තාව සමඟ කොටස්හිමියන් වෙත ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය සතුටට පත් වේ. මෙම වාර්තාව 2020 ජුලි මස 8 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 2 – ව්‍යාපාරයේ ස්වභාවය

**2007 අංක 07 දරන සමාගම් පනතෙහි [168 වගන්තියේ (1) (අ)]**

### 2.1 දැක්ම, මෙහෙවරම හා ආයතනික චර්යාව

සමාගමේ දැක්ම හා මෙහෙවර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 5 හි දක්වා ඇත. එම දැක්ම සහ මෙහෙවර ඉටුකර ගැනීම සදහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ සේවකයින් සමාගමේ ව්‍යාපාර සහ සදාචාර සංග්‍රහයේ දක්වෙන ඉතා උසස් මට්ටමේ සදාචාර ආචාරධර්ම ප්‍රමිතීන්ට අනුකූලව සහ අවංකව තම කටයුතු කරගෙන යනු ලැබේ.

### 2.2 මුඛ්‍ය ව්‍යාපාර කාර්යයන්

සමාගමේ මූඛ්‍ය ව්‍යාපාර කාර්යයන්ට මූල්‍ය කල්බදු, කාලීන ණය ලබාදීම, ඉස්ලාමීය මූල්‍යකරණය, ආන්තික වෙළෙඳාම, ණය සාධකකරණය, රන් ණය, ණය උපකරණ නිකුතුව සහ මහජන තැන්පතු එක්රැස් කිරීම යන කටයුතු අයත් වේ. 2020 මාර්තු මස 31 දිනට, සමාගමට පරිපාලිත සමාගම් හයක් තිබුණු අතර මෙම පරිපාලිත සමාගම්වල ව්‍යාපාර කටයුතුවල ස්වභාවය 155 පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ දක්වා ඇත. සමාගම හෝ එහි පරිපාලිත සමාගම් සමාලෝචිත වසර තුළ නිති හෝ රෙගුලාසි කඩකරන ආකාරයේ කටයුතුවල නිරත වී නොමැත.

### 2.3 සමූහයේ ව්‍යුහයට වෙනස්වීම්

සමාලෝචිත වසර තුළ  සමූහයේ ව්‍යූහයට කිසිදු වෙනසක් සිදු කර නොමැත.

පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. හි පුද්ගලික ස්ථාපන සහ හිමිකම් නිකුතුවට පසුව, පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් හී පීපල්ස් ලීසිං හි අයිතිය 11.86% දක්වා අඩුවිය. ඒ අනුව. ආශ්‍රිත සමාගමේ තත්ත්වය විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයේ මූල්‍ය ආයෝජන ලෙස වෙනස් විය.

### 2.4 ශාඛා ජාලය

2020 මාර්තු මස 31 දිනට, සමාගමේ මුළු ශාඛා ජාලය අංග සම්පූර්ණ ශාඛා 103 කින් සහ සේවා මධ්‍යස්ථාන 101 කින් සමන්විත විය.

### 2.5 මෙහෙයුම් කටයුතු සමාලෝචනය

2019/20 වර්ෂය ඇතුළත සිදුවූ වැදගත් සිද්ධීන් ද ඇතුළත් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ සමස්ත ඇගයීමක් සිදුකර ඇත.

ඒ අනුව මෙම වාර්තාව තුළ සභාපතිවරයාගේ පණිවිඩය පිටු අංක 10 සහ 11 දක්වාද. ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය පිටු අංක 12 සිට 14 දක්වාද සහ කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය පිටු අංක 28 සිට 66 දක්වාද ඇතුළත් වෙති. මෙකී වාර්තා සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි සංඝටනීය කොටසක් බවට සැලකිය යුතුයි. සමූහයේ ආදායම, ප්‍රතිඵල, වත්කම් සහ වගකිම්වලට අංශ අනුව දායකත්වය මෙම වාර්තාවේ 255 සහ 256 පිටුවල මූල්‍ය ප්‍රකාශවල සටහන්වල අනාවරණය කෙරේ.

### 2.6 අනාගත දැක්ම

ගෝලීය සංදර්භයක් තුළ මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ අභියෝග, අවස්ථා සහ සංවර්ධනයන් මත පදනම් වන සමාගමේ අනාගත දැක්ම මෙම වාර්තාවේ එක් එක් කොටස තුළ දක්වා ඇත.

## 3 – මූල්‍ය ප්‍රකාශයන්

**[168 වගන්තියේ (1) (ආ) සහ (2)]**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කොට ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇති ප්‍රධාන මූල්‍ය කළමනාකරු සහ ප්‍රධාන විධායක නිලධාරී විසින් විධිමත් පරිදි සහතික කළ සභාපතිගේ අනුමැතිය සහිත සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් මෙම වාර්ෂික වාර්තාවේ 149 සිට 288 දක්වා පිටුවල දක්වේ.

### 3.1 මූල්‍ය ප්‍රතිඵල හා විසර්ජනයන්

**පොළී ආදායම**

2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමාගමේ සහ  සමූහයේ මුළු පොළී ආදායම පිළිවෙළින් රු. මිලියන 31,459.11 ක් (2018/19 හි රු. මිලියන 30,836.30) ක් සහ රු. මිලියන 33,282.88 (2018/19 හි රු. මිලියන 32,234.34)ක් විය. පොළී ආදායම පිළිබඳ වඩාත් විස්තරාත්මක තොරතුරු 165 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 6.1 සහ 6.1.1 හි විස්තර කෙරේ.

**කාර්යසාධනය හා විසර්ජනයන්**

2019/20 මූල්‍ය වසර සඳහා සමාගම සහ සමූහය පිළිවෙළින් රු. මිලියන 2,942.51 ක සහ රු. මිලියන 3,591.75ක (2018/19 දී රු. මිලියන 4,416.12ක් සහ රු. මිලියන 5,011.27ක්) ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී. මේ තුළින් පසුගිය වසරට සාපේක්ෂව සමාගමේ සහ සමූහයේ ශුද්ධ ලාභයේ පිළිවෙළින් 33.37%ක සහ 28.33%ක පහත වැටීමක් පෙන්නුම් කරයි.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සමාගමේ කාර්යසාධනය සහ ලාභය විසර්ජනය කර තැනි ආකාරයේ සවිස්තරාත්මක තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

| සමාගම | 2019/20 රු. මිලියන | 2018/19 රු. මිලියන |
|---|---|---|
| ආදායම් බදු පෙර ලාභය | **4,551.83** | 6,585.26 |
| ආදායම් බදු වියදම | **(1,609.32)** | (2,169.14) |
| වසර සඳහා ලාභය | **2,942.51** | 4,416.12 |
| පසුගිය වසරෙන් ඉදිරියට ගෙනා ලාභය | **13,361.81** | 11,502.16 |
| ආරම්භක ශේෂය නැවත සඳහන් කිරිම | – | (755.91) |
| විසර්ජනය සඳහා ගතහැකි ලාභය | **16,304.31** | 15,162.38 |
| **විසර්ජනයන්** | | |
| පසුගිය/වර්තමාන වසර සඳහා ලාභාංශ | **(1,929.32)** | (1,974.83) |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | **0.12** | (4.94) |
| සංචිතවලට මාරු කිරීම් | **(147.12)** | (220.81) |
| සංචිතවලින් මාරු කිරීම් | – | 400.00 |
| මුළු විසර්ජනයන් | **(2,076.32)** | (1,795.63) |
| ඉදිරියට ගෙනගිය විසර්ජනය නොකළ ලාභය | **14,227.99** | 13,361.80 |

## බදුකරණය සඳහා වෙන්කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කල නිවේදන පරිදි, අදාළ පනතට විධිමත් සංශෝධන සිදුවනතුරු පහත සඳහන් වෙනස්වීම් ක්‍රියාත්මක කරන ලදී.

- **ණය නැවතගෙවීම් බද්ද (DRL)**

  2020 ජනවාරි මස 1 දින සිට DRL අවලංගු කරන ලදී, මූල්‍ය සේවා සැපයිම හා අදාළවන අගය එකතු කිරීම මත මූල්‍ය වසරේ පළමු මාස නවය සඳහා පමණක් 7% බැගින් DRL අයකර ඇත. අවසාන කාර්තුව සඳහා සමාගමේ ලාභදායිත්වය කෙරෙහි ධනාත්මක බලපෑමක් මින් ඇති විය.

- **එකතුකළ අගයමත බද්ද (VAT)**

  2020 ජනවාරි මස 1 දින සිට 15% සිට 8% දක්වා VAT අනුපාතය ප්‍රතිශෝධනය කරන ලදී. ලාභදායිත්වය කෙරෙහි එහි බලපෑම අඩුවුවත් මෙය ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී.

- **ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)**

  2019 දෙසැම්බර් මස 1 දින සිට NBT අවලංගු කරන ලදී, අවලංගු කිරීමට පෙර එය 2%ක් විය. ගනුදෙනුකරු වෙනුවෙන් සමාගම බදු වියදම දරමින් සිටි බැවින්, මෙයද ඉපයීම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කර ඇත.

- **ආර්ථික සේවා ගාස්තු (ESC)**

  සමාගමේ ආදායමෙන් 0.5% බැගින් අයකරන ලද ESC 2020 ජනවාරි මස 1 දින සිට අවලංගු කරන ලදී, මෙය ඉදිරි ආදායම් බදු ගෙවීමක් ලෙස සලකන ලද බැවින් සමාගමේ ඉපයීම් සම්බන්ධයෙන් එහි බලපෑම අවම විය.

- **ආදායම් බදු (IT)**

  මූල්‍ය වසරේ පළමු මාස නවය තුළ 28%ක්ව පැවති ආදායම් බදු සමාලෝචිත මූල්‍ය වසරේ අවසාන කාර්තුවේ සිට 24% දක්වා ප්‍රතිශෝධනය කරන ලදී. මෙය සමාගමේ ලාභදායිත්වය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී.

කෙසේවෙතත්. ශ්‍රීලංගිප්‍ර 12 (LKAS 12) – "ආදායම් බදු" විධිවිධානයන්ට අනුව, විලම්බිත බදු වත්කම් සහ වගකීම් බදු අනුපාතවලට අගය කරනු ලබන අතර එම අනුපාත වත්කම් මුදාහරින හෝ වගකීම් නිරවුල් කරන කාලසිමාවට වාර්තාකරන කාලසීමාව අවසානය වන විට පනවා ඇති හෝ පනවනු ලැබිය හැකි බදු අනුපාත (සහ බදු නීති) මත පදනම් වි අදාළ කරගැනීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම, 24% නව අනුපාතය මූල්‍ය වසරේ මාස තුනක් සඳහා පමණක් අදාළ වන බැවින් සහ අනුපාතය මේ දක්වා පනවා නොමැති බැවින්, මූල්‍ය වසර සඳහා සමාගම 28% භාවිතා කරන ලදී.
ඒ අනුව, අවසාන කාර්තුව සඳහා බදු අනුපාතවල ධනාත්මක බලපෑම සැලකිල්ලට ගෙන නොමැත. අඩුකළ අනුපාතය බදු ගෙවීම් අවස්ථාවේදී සැලකිල්ලට ගනු ලැබේ.

මූල්‍ය සේවා මත VAT අනුපාතය සමාලෝචිත වසර සඳහා 15%ක් විය.(2018/19 දි 15%)

## දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්

2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වන වසර සඳහා සමාගම සහ සමූහයේ දේපල, පිරියත හා උපකරණ මත (නොනිමි ප්‍රාග්ධන වැඩ ඇතුළුව) දරන ලද මුළු ප්‍රාග්ධන වියදම පිළිවෙළින් රු. මිලියන 213.93ක් සහ රු. මිලියන 282.22ක් විය (2018/19 දී රු. මිලියන 147.67ක් සහ රු. මිලියන 257.37කි).

2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වන වසර තුළ, සමාගම සහ සමූහය රු. මිලියන 15.12 ක් අස්පෘශ්‍ය වත්කම් අත්කරගැනීමට ආයෝජනය කරන ලදී. (2018/19 දි අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීමට සමාගම රු. මිලියන 8.62ක් ආයෝජනය කර ඇති අතර සමූහය රු. මිලියන 12.19ක් ආයෝජනය කරන ලදී).

224 පිටුවේ 32.4 හි අනාවරණය කරන පරිදි පොතේ වටිනාකමින් සැලකියයුතු ලෙස වෙනස්වන සමාගමේ හෝ එහි පරිපාලිත සමාගම්වල ස්ථාවර වත්කම් සහ ඉඩම්වල වෙළෙඳපොල වටිනාකම තුළ සැලකියයුතු වෙනසක් නොමැති බවට අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී.

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර 220 සිට 227 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 32 සහ 33 හි ඉදිරිපත් කෙරේ.

## සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි

ආයතනයේ ඉඩම්වල ඇති ගොඩනැගිලි ප්‍රමාණ, ස්ථාන සහ සංඛ්‍යාව මෙම වාර්ෂික වාර්තාවේ 224 පිටුවේ සටහන් 32.4 හි විස්තර කරන අතර මූල්‍ය ප්‍රකාශයනයන් හී ඇතුළත් කර ඇති පරිදි 2020 මාර්තු මස 31 දිනට සමාගම සහ සමූහයට අයත්වන සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල ශුද්ධ පොත් අගය රු. මිලියන 571.08ක් විය.

## ආයෝජන

සමාගම විසින් දරන ආයෝජන පිළිබඳ විස්තර සටහන්  198, 190, 212, 214 සහ 216 පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 22, 23, 24, 27, 28, 29 මගින් අනාවරණය කෙරේ.

## ස්කන්ධය

### ප්‍රකාශිත ප්‍රාග්ධනය

2020 මාර්තු 31 දිනට සමාගමේ සහ සමූහයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය 2019 මාර්තු මස 31 දිනට පැවති රු. මිලියන 13,236.07ට සාපේක්ෂව රු. මිලියන 13,915.41ක් විය. කොටස් ලාභාංශයක ආකාරයෙන් ගෙවන ලද 2018/19 වසර සඳහා අවසාන ලාභාංශයට පසුව, ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 679.34කින් වැඩි විය.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව



**සංචිත**

2020 මාර්තු මස 31 දිනට දිනට සමාගමේ සහ සමූහයේ මුළු සංචිත පිළිවෙළින් රු. මිලියන 16,331.22 ක් සහ රු. මිලියන 19,038.00 ක් විය. සමාලෝචිත මූල්‍ය වසර තුළ, රඳවාගත් ඉපයීම්වලින් රු. මිලියන 147.12 ක් සංචිතවලට මාරුකරන ලදී. සංචිතවලට මාරු කිරීම පිළිබඳ තොරතුරු පිටු අංක 152 සහ 153 හි "ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය" හි සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 46 සිට 48 දක්වා විස්තර කෙරේ.

**ණය ප්‍රාග්ධනය**

ණය ප්‍රාග්ධනය පිළිබඳ විස්තර සටහන් 38 හි දක්වෙන අතර සමාගමේ ණයකර පිළිබඳ වඩා විස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 38.2 හි දක්වා ඇත

**ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ 2018 අංක 03 දරන මූල්‍ය ව්‍යාපාර පනත් නියෝගයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතා පරිදි, සමාගමේ පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය සහ මුළු ප්‍රාග්ධන අනුපාතය 2020 මාර්තු 31 දිනට පිළිවෙළින් 15.12%ක් සහ 15.99%ක් විය. අවම ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 32 පිටුවෙහි දක්වේ.

## 4 —බාහිර විගණක

[168 (1) (ඇ) සහ ඒ වගන්තිය]

### 4.1 විගණක සහ ඔහුගේ ස්වාධීනත්වය

2018 අංක 19 දරන ජාතික විගණන පනට අනුකූලව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. "විගණනලාභි ආයතනය" ක් පිළිබඳ නිර්වචනය යටතට අයත් වන අතර විගණකාධිපති හෝ විගණකාධිපති විසින් පත්කරන ලද වෙනත් පුද්ගලයෙක් විසින් සමාගමේ විගණනය සිදුකරන අතර මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම පිටු අංක 145 සිට 147 දක්වා "ස්වාධීන විගණකගේ වාර්තාව" තුළ දක්වේ.

### 4.2 විගණකගේ වාර්තාව

සමාගමේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වාර්තාව 145 සිට 147 දක්වා පිටුවල දක්වා ඇත.

### 4.3 විගණකගේ පාරිශ්‍රමිකය

විගණන සහ ආදාළ සේවා සඳහා මෙන්ම බදු ආශ්‍රිත සේවා ඇතුළුව විගණන නොවන සේවා සඳහා සමාගම සහ එහි සමූහය විසින් විගණකවරුන්ට පහත සඳහන් මුදල් ගෙවන ලදී:

| ගාස්තු | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019/20 රු. මිලියන | 2018/19 රු. මිලියන | 2019/20 රු. මිලියන | 2018/19 රු. මිලියන |
| විගණන සහ ආදාළ සේවා | **7.38** | 6.47 | **13.49** | 12.05 |
| විගණන නොවන සේවා | **1.64** | 1.49 | **4.91** | 3.85 |

## 5 —ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වසර තුළ වෙනස්වීම්

[168 (1) (ඈ) වගන්තිය]

මූල්‍ය ප්‍රකාශනවල අධික සහ අනවශ්‍ය අනාවරණ අවම කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමේදී විකල්ප ආකෘතියක් භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (LKAS 1) "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ 168 (1) (ඈ) වගන්තියට අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගනු ලැබූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 155 සිට 288 පිටුවල දක්වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම තුළ යොදා ගනුලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට වැදගත් වෙනස්වීම් (ඇත්නම්) 159 සිට 160 දක්වා පිටුවල සටහන් 3.4 හි දක්වේ.

## 6 —අධ්‍යක්ෂ මණ්ඩලය

[168 (1) (ඉ), (ඊ), (ළු) වගන්ති]

### 6.1 අධ්‍යක්ෂවරුන්ගේ විස්තර

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සමඟ දක්ෂතා සහ පළපුරුද්ද ඇතුළුව ඔවුන්ගේ විස්තර මෙම වාර්තාවේ 68 සිට 71 දක්වා පිටුවල දක්වේ.

### 6.2 අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම සඳහා භාවිතා කළ ක්‍රමය 81 වැනි පිටුවේ "ආයතනික පාලනය" හි ඉදිරිපත් කෙරේ.

### 6.3 අධ්‍යක්ෂවරුන්ගේ වෙනත් අධ්‍යක්ෂ තනතුරු/වැදගත් තනතුරු

සමාගමේ වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ වෙනත් අධ්‍යක්ෂ තනතුරු/වැදගත් තනතුරු පිළිබඳ තොරතුරු 68 සිට 71 දක්වා පිටුවල දක්වේ.

### 6.4 ඉල්ලා අස්වීම් සහ පත්කිරීම්

2008 අංක 03 දරන මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනත් නියෝගයේ 5 (1) වගන්තියට අනුව, සමාගමේ විධායක නොවන ස්වාධීන නොවන සභාපති, හේමසිරි ප්‍රනාන්දු මහතා 2019 ඔක්තෝබර් මස 12 දින සිට විශ්‍රාම යන ලදී.

මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා 2019 ඔක්තෝබර් මස 25 දින සිට සමාගමේ විධායක නොවන ස්වාධීන සභාපති ලෙස පත් කරන ලදී.

ජෙහාන් ප්‍රසන්න අමරතුංග මහතා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ), මොහමඩ් අනීස් මොහමඩ් රිස්වාන් මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ), ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ), ආචාර්ය කෙනඩි දීගල්ල ගුණවර්ධන මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ),සහ නමුගොඩ විජේසිංහ අතපත්තු මුදියන්සේලාගේ උඩවත්ත කීර්ති කුමාර එඩ්වඩ් වීරසිංහ (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) 2019 දෙසැම්බර් මස 30 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරුවලින් ඉල්ලා අස්විය.

මහවලගේ ඇන්තනි බොනිෆස් සිල්වා මහතා, රංජිත් කොඩිතුවක්කු මහතා සහ අසාම් ඒ අහමට් මහතා 2019 දෙසැම්බර් මස 30 දින සිට සමාගමේ (විධායක නොවන ස්වාධීන නොවන) අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරු ලෙස පත්කරන ලදී.

මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා (විධායක නොවන ස්වාධීන සභාපති/අධ්‍යක්ෂ), රංජිත් කොඩිතුවක්කු මහතා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ) සහ මහවලගේ ඇන්තනි බොනිෆස් සිල්වා මහතා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ) 2020 පෙබරවාරි මස 19 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරුවලින් ඉල්ලා අස්විය.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සුජීව රාජපක්ෂ මහතා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ/සභාපති), සුදර්ශන් අහංගම මහතා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ), කුරුකුලසූරිය කැනීසියස් ක්ලයිව් ෆොන්සේකා මහතා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ), චතුර ජයන්ත විජේතිලක මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) සහ උපුල් ලක්ෂ්මන් අශෝක වික්‍රමසිංහ බණ්ඩාර මහතා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) 2020 පෙබරවාරි මස 19 දින සිට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරු ලෙස පත්කරන ලදී.

මීරියම් කොරලි පීටර්ස් මහත්මිය 2020 මාර්තු මස 1 දින සිට සමාගමේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

### 6.5 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම සහ සමූහය විසින් ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ වේතන පිළිවෙළින් රු. මිලියන 6.69 ක් සහ රු. මිලියන 13.56 ක් විය. තුලනාත්මක සංඛ්‍යා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 15 හි දැක්වේ.

### 6.6 බැඳියාවන් ලේඛනය/ගනුදෙනු තුළ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන්

2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව, සමාගම බැඳියා ලේඛනයක් පවත්වාගෙන යන අතර මෙය පරීක්ෂා කිරීම සඳහා ලබාගත හැකිය. සමාගමේ අධ්‍යක්ෂවරු 2007 අංක 07 දරන සමාගම් පනතේ 192 (2) වගන්තිය පරිදි සමාගමේ ගනුදෙනු සම්බන්ධයෙන් ඔවුන්ගේ බැඳියාවන් පිළිබඳ පොදු ප්‍රකාශන සිදුකර ඇත. ඒ තුළින් අනාවරණය කරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු යටතේ 257 සිට 262 දක්වා පිටුවල දැක්වේ. එමෙන්ම, සමාගමේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරි පොදු ප්‍රකාශ සිදුකර ඇති අතර, 2008 අංක 03 දරන මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනත් නියෝගය අනුව අනාවරණය කිරීමට අවශ්‍ය පරිදි, අධ්‍යක්ෂවරුන් අතර මූල්‍යමය, ව්‍යාපාර, පවුල්, හෝ වෙනත් වැදගත්/අදාළ සම්බන්ධතාවක් (සම්බන්ධතා) කිසිවක් නොමැත.

### 6.7 කොටස් තුළ අධ්‍යක්ෂවරුන්ගේ අයිතිය

2007 අංක 07 දරන සමාගම් පනතේ 200 වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරුන් විසින් සමාගම තුළ තමන්ට ඇති කොටස් හිමිකම සහ එහි යම් අත්කරගැනීම් හෝ බැහැරකිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට අනාවරණය කර ඇත. සමාගම තුළ අධ්‍යක්ෂවරුන්ගේ තනි කොටස් හිමිකම සමඟ ප්‍රධාන විධායක නිලධාරිගේ තනි කොටස් හිමිකම් මෙම වාර්ෂික වාර්තාවේ 294 සිට 295 දක්වා පිටුවල "ආයෝජන සම්බන්ධතා" යනුවෙන් නම්කළ කොටස තුළ දැක්වේ.

### 6.8 රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල රැස්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 80 සිට 81 දක්වා පිටුවල ආයතනික පාලන වාර්තාව තුළ දක්වා ඇත.

## 7 — කොටස් තොරතුරු

වැදගත් කොටස්හිමියන්ගේ තොරතුරු සමඟ සැලකියයුතු කොටස් හිමියන්ගේ විස්තර සහ කොටස්වලට අදාළ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 290 සිට 296 දක්වා පිටුවල "ආයෝජන සම්බන්ධතා" මාතෘකාව යටතේ ඉදිරිපත් කෙරේ.

### 7.1 කොටස්හිමියන්ට සමාන අයුරින් සැලකීම

සමාගම සෑම අවස්ථාවකදීම කොටස්හිමියන්ට සමානව සලකනු ලබන බව සහතික කරයි.

### 7.2 සාමාන්‍ය කොටස්හිමියන්ට ලාභාංශ

කොටසකට රු. 0.70ක් වන අතුරු ලාභාංශයක් 2020 ජනවාරි මස 23 දින සාමාන්‍ය කොටස්හිමියන් වෙත ගෙවන ලදී. සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 56 (3) වගන්තිය, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන්ට අනුව නුබුන්වත්භාවය පිළිබඳ අවශ්‍යතාව සපුරා ඇති බව සහ 56 (2) වගන්තිය විසින් නියම කරන පරිදි එකී අතුරු ලාභාංශ ගෙවීමත් සමඟ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත නීති රෙගුලාසිවලට අනුකූල වෙමින් ලාභාංශ ගෙවීම් සම්බන්ධයෙන් නුබුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශය පිළිබඳ විගණකගෙන් සහතිකයක් ලබා ගෙන ඇත.

## 8 — පරිත්‍යාග

[168 (1) (උ) වගන්තිය]

2019/20 මූල්‍ය වසර තුළ, සමාගම පසුගිය වාර්ෂික මහ සභා රැස්වීමේදී සම්මත කරනු ලබන යෝජනාවට අනුව, රු. මිලියන 58.85ක (2018/19 දි රු. මිලියන 122.23) පරිත්‍යාග සිදුකරන ලදී. සමාගමේ ආයතනික සමාජීය වගකීම් දෙපාර්තමේන්තුව ආයතනික සමාජීය වගකීම් (CSR) වැඩසටහන් සහ කටයුතු මෙහෙයවනු ලබයි. සමාගමේ CSR වැඩසටහන් පිළිවෙළින් 54 සිට 59 දක්වා සහ 60 සිට 66 දක්වා පිටුවල සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය සහ ස්වාභාවික ප්‍රාග්ධනය යන කොටස තුළ ඉදිරිපත් කෙරේ.

## 9 — ආයතනික පාලනය

[මනා පරිච සංග්‍රහයේ D.6, D.6.1, D.2, D.1.4]

අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ආයතනික පාලන මූලධර්ම සංවර්ධනය කිරීමට කැප වී සිටින අතර, ඉහළම ආයතනික පාලන මූලධර්ම ආයතනය තුළ පවත්වා ගන්නා බව සහතික කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරුවන්, කොටස්හිමියන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වැනි විවිධ සහභාගිකයින් පාලනය කරන ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි ඇතුළත් ආයතනික පාලන ප්‍රඥප්තියක් යොදා ගෙන ඇත.

ඉහත කී ආයතනික පාලන ප්‍රඥප්තිය යොදා ගැනීම තුළ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ නිර්දේශ, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නියමයන් සහ 2008 අංක 03 දරන මූල්‍ය සමාගම් (ආයතනික පාලන) නියෝගයේ විධිවිධානවලට සමාගම අනුකූල වි ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර ඇත.

අධ්‍යක්ෂවරු පහත ප්‍රකාශ සිදුකර සිටී.

1. සමාගම නීති සහ රෙගුලාසි කඩවෙන කිසිදු කටයුත්තක යෙදී නොමැති බව
2. සමාගම පාර්ශ්වකරුවන්ට සමානව සැලකීමට සියලුම උත්සාහ දරා ඇති බව
3. ව්‍යාපාරය අඛණ්ඩව පවතින බව
4. අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණයේ ඵලදායිත්වය සහ ඒවා සාර්ථකව පිළිපැදීම සමාගම විසින් සිදුකර ඇති බවට මේ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර මෙම වාර්ෂික වාර්තාවේ 77 සිට 111 දක්වා පිටුවල "ආයතනික පාලන වාර්තාව" තුළ දැක්වේ.
5. අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුමට අනුව, සමාගමේ ව්‍යාපාර සහ සදාචාර සංග්‍රහයේ කිසිදු කඩකිරීමක් සිදුකර නැත.

### 9.1 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ ආපදා කළමනාකරණ කමිටුව, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අධ්‍යක්ෂවරු සහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ලෙස ක්‍රියාත්මක වේ.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව


මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ
**කළමනාකාරිත්වය >>**
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු


එකී කමිටුවල සංයුතිය මෙම වාර්ෂික වාර්තාවේ අදාළ කමිටු වාර්තාවල දක්වා ඇත.

## 9.2 නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, සමාගම සහ සමූහය නීති සහ රෙගුලාසි කඩවෙන කිසිදු කටයුත්තක යෙදී නොමැත

## 9.3 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, රජයට, වෙනත් ආයතනවලට සහ සේවකයින් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වේ.

## 9.4 පාරිසරික ආරක්ෂාව

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම අනුව, සමාගම සහ සමූහය පරිසරය විනාශයට පත්කරන කිසිදු කටයුත්තක යෙදී නොමැති බව අධ්‍යක්ෂවරු සහතික කරයි.

## 9.5 ESG වාර්තාකරණය

පාරිසරක, සමාජීය සහ පාලන ප්‍රතිෂ්ඨාවන්ට සමාගම එහි ව්‍යාපාර ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සහ වටිනාකම එකතු කිරීම කෙරෙහි බලපෑම් කළ හැක. සමාගමේ වාර්ෂික වාර්තාව තුළ ESG අවදානම් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඇතුළත්වන අතර, අවස්ථාවන් හඳුනාගෙන කළමනාකරණය කර තක්සේරු කරන අතර 95 පිටුවේ දක්වා ඇති පරිදි වාර්තා කරනු ලැබේ.

## 10 — පිළිගැනීම

[168 (1) (ඔ) වගන්තිය]

අධ්‍යක්ෂ මණ්ඩලය 117 පිටුවේ අනාවරණය කරන පරිදි වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය පිළිගෙන ඇත.

## 11 — දැනට පවත්නා නඩු කටයුතු

සමාගමේ නීතිඥයින්ගේ උපදේශකත්වය ඇතිව ගොඩනැගුණු අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගමට විරුද්ධව දැනට පවත්නා නඩු කටයුතු වාර්තාකරණ ලද මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි හෝ සමාගමේ අනාගත මෙහෙයුම් කෙරෙහි යම් වැදගත් කිසිදු බලපෑමක් ඇති නොවේ. සමාගමට විරුද්ධව දැනට පවත්නා නඩු කටයුතු පිළිබඳ විස්තර 250 සිට 252 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 53 හි දැක්වේ.

## 12 — මානව සම්පත්

සමාගම විසින් සම්පූර්ණයෙන්ම වෙනස් ලෙස නොසලකන සේවා නියුක්ති ප්‍රතිපත්තියක් යොදා ගෙන ඇති අතර, ඒ තුළින් ස්ත්‍රීපුරුෂභාවය, ජාතිය හෝ ආගම පිළිබඳ නොසලකා පුද්ගලයින්ට ගරුකරන අතර සමාන වෘත්තීය අවස්ථා ලබා දේ.

2020 මාර්තු මස 31 දිනට, සමාගම තුළ පුද්ගලයින් 2,401ක් රැකියාවන් හි නියුක්ත විය. (2019 මාර්තු මස 31 දිනට 2,329කි)

## 13 — වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම් පිළිබඳ විස්තර 288 පිටුවේ මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 61 හි දැක්වේ.

## 14 — ලැයිස්තුගත නියමයන් 7.6 නියමය අනුව වාර්ෂික වාර්තාවේ අන්තර්ගතයේ අවශ්‍යතා සමඟ අපගේ අනුකූලතාවය

| රීති අංකය | අනාවරණය කළයුතු තොරතුරු | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| 7.6 (i) | මූල්‍ය වසර තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන් වී සිටි පුද්ගලයින්ගේ නම් | ✓ |
| 7.6 (ii) | වසර තුළ සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ප්‍රධාන කටයුතු | ✓ |
| 7.6 (iii) | වසර අවසානයේදී විශාලතම කොටස්හිමියන් 20 දෙනා පිළිබඳ තොරතුරු | ✓ |
| 7.6 (iv) | ජනතාව දරන ප්‍රතිශතය | ✓ |
| 7.6 (v) | අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන විධායක නිලධාරි දරන කොටස් ගණන | ✓ |
| 7.6 (vi) | දැකියහැකි ප්‍රමාණාත්මක අවදානම් සාධකවලට අදාළ වැදගත් තොරතුරු | ✓ |
| 7.6 (vii) | සේවක සහ කාර්මික සම්බන්ධතාවලට අදාළ වැදගත් ගැටලු පිළිබඳ විස්තර | ✓ |
| 7.6 (viii) | වසර අවසානයේදී අයත් ඉඩම්/ගොඩනැගිලි ආයෝජන දේපල පිළිබඳ තොරතුරු | ✓ |
| 7.6 (ix) | වසර අවසානයේදී ප්‍රකාශිත ප්‍රාග්ධනය නියෝජනය කරන කොටස් ගණන | ✓ |
| 7.6 (x) | එක් එක් පන්තියේ ස්කන්ධ සුරැකුම්පත්වල හිමිකරුවන් ගණන පිළිබඳ බොදාහැරීම් උපලේඛනය සහ ඔවුන්ගේ මුළු අයිතියේ ප්‍රතිශතය | ✓ |
| 7.6 (xi) | ස්කන්ධය, ණය පිළිබඳ අනුපාත සහ වෙළෙඳපොල මිල තොරතුරු, ණය ශ්‍රේණිගතකරණයේ සිදු වූ වෙනස්කම් | ✓ |
| 7.6 (xii) | සමාගමේ හෝ පරිපාලිත සමාගම්වල ස්ථාවර වත්කම්වල සැලකියයුතු වෙනස්කම් | ✓ |
| 7.6 (xiii) | වසර තුළ මහජන නිකතුව, හිමිකම් නිකුතුව සහ පුද්ගල ස්ථාපනයන් තුළින් රැස්කරන ලද අරමුදල්වල විස්තර | ✓ |
| 7.6 (xiv) | සේවක කොටස්හිමිකාරත්වය හෝ කොටස් විකල්ප යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු | ✓ |
| 7.6 (xv) | ලැයිස්තුගත නියමයන් 7 වගන්තියේ 7.10.3, 7.10 | ✓ |
| 7.6 (xvi) | ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම්වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු | ✓ |

වැඩි විස්තර සඳහා 109 පිටුව බලන්න.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

## 15 — අඛණ්ඩ පැවැත්ම

[මනා පරිච සංග්‍රහය D1.4]

සමූහයේ කළමනාකාරිත්වය අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාම සඳහා එහි හැකියාව පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර ඇති අතර දකියහැකි අනාගතයක් සඳහා ව්‍යාපාරය කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමට පත්වේ. එමෙන්ම, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාම සඳහා සමූහයේ හැකියාව මත සැලකියයුතු සැකයක් ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයන් පිළිබඳ කළමනාකාරිත්වය දැනුවත් නැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩතා පදනමක් මත අඛණ්ඩව පිළියෙල කරනු ලබයි.

2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම තීරණය කිරීමේදී, කළමනාකාරිත්වය සමූහයේ සමාගම් කෙරෙහි කොවිඩ්-19 හි දැනට පවත්නා සහ අපේක්ෂිත බලපෑම් සහ ලබාගත හැකි තොරතුරු මත පදනම් වී අඛණ්ඩතා පදනම භාවිතයේ සුදුසුකම ඇගයීමට ලක් කර ඇත.

සමූහය අපේක්ෂිත ආදායම, පිරිවැය කළමනාකරණය, ලාභදායිතාව, අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් විලම්බනය කිරීමේ හැකියාව, භාවිත නොකළ ණය මාර්ග, හැකිතරම් බලපෑම් අවමකර ව්‍යාපාරයේ අඛණ්ඩතාව සහතික කිරීමට ලබාදෙන සේවා ඉදිරියට ගෙන යාමේ හැකියාවට අදාළ වන්නා වූ විවිධ පීඩන පරීක්ෂණ ක්‍රියාදාම යටතේ සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් එහි ව්‍යාපාරයට ඔරොත්තු දීමේ හැකියාව ඇගයීමට ලක් කර ඇත. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට සමූහයේ එක් එක් කර්මාන්තය සඳහා අනාගත දැක්ම ඉදිරිපත් කරමින් සහ කළමනාකරණය විසින් ඉහත දෑ ඇගයීමෙන් පසු, සහ ප්‍රතිඵලවල පරාශය සහ වියහැකි බව පිළිබඳ නිසි සලකා බැලීමෙන් පසු, දකියහැකි අනාගතයක් සඳහා මෙහෙයුම්වල පැවැත්ම ඉදිරියට ගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සහ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේදී ඉදිරියට අඛණ්ඩතා පැවැත්ම යොදාගත හැකිබවට කළමනාකරණය සෑහීමට පත් වේ.

## 16 — වාර්ෂික මහ සභා රැස්වීම

24 වැනි වාර්ෂික මහ සභා රැස්වීම කොළඹ 5, හැව්ලොක් පාර, අංක 07 හි පීපල්ස් ලීසිං ගොඩනැගිල්ලේ 11 වැනි මහලේ මහජන බැංකුවේ සේවක පුහුණු ආයතනයේ රැස්වීම් ශාලාවේදී 2020 සැප්තැම්බර් මස 11 දින පස්වරු 3.00ට පවත්වනු ලබන අතර 24 වැනි වාර්ෂික මහ සභා රැස්වීමට අදාළ රැස්වීම් නිවේදනය මෙම වාර්ෂික වාර්තවේ 201 පිටුවේ දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි



**කොරලි පීටර්ස්**
අධ්‍යක්ෂ



**සුජීව රජපක්ෂ**
සභාපති



**ලක්මිණී කෝට්ටේගොඩ**
සමාගම් ලේකම්

2020 ජූලි 8

කොළඹ

# අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව



සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව ("විගණන කමිටුව හෝ කමිටුව") 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි වාර්තාව ඉදිරිපත් කරයි. මෙම වාර්තාව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## පරමාර්ථ සහ යොමු නිර්දේශ

සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ පරමාර්ථය අධ්‍යක්‍ෂ මණ්ඩලයට මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අභ්‍යන්තර හා බාහිර විගණනයට අදාළ කාර්යයන් සහ නීති සහ රෙගුලාසි අවශ්‍යතාවන්ට අනුකූලතාව නියාමනය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ එහි සාමාන්‍ය පාලනය සඳහා සහයවීමයි. කමිටුව අධ්‍යක්‍ෂ මණ්ඩලයට වගකීමට බැඳී සිටින අතර එහි කටයුතු නිරතුරුව වාර්තා කරයි.

කමිටුවේ යොමු නිර්දේශ විගණන කමිටුවේ ප්‍රඥප්තිය තුළ පැහැදිලිව දක්වා ඇත. කමිටුවේ කාර්යයන් සහ ගැටලුවල නව සංවර්ධනයන් ප්‍රමාණවත් පරිදි ආමන්ත්‍රණය කිරීම සඳහා, විගණන කමිටුව විසින් 2019 ජූලි මස පවත්වන ලද රැස්වීමේදී විගණන කමිටුවේ ප්‍රඥප්තිය සමාලෝචනය කරන ලද අතර එම මාසයේදි ම අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය සමඟ එය ප්‍රතිශෝධනය කරන ලදී

## බලාධිකාරය

අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පත්කරයි. සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය 2020 පෙබරවාරි මස 19 දින නැවත සකස් කළ අතර ඒ අනුව අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව නැවත ස්ථාපිත කරන ලදී.

2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයේ අවසාන දිනයට, අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව සමාගමේ පහත සඳහන් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| **මීරියම් කොරලි පීටර්ස් මහත්මිය –**<br>කමිටුවේ සභාපතිනි/ස්වාධින විධායක නොවන අධ්‍යක්‍ෂ<br>2020 මාර්තු මස 1 දින සිට අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්කරන ලදී. | කමිටුවේ සභාපතිනි එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවක් ද වේ. ඇයට රාජ්‍ය සහ පුද්ගලික යන අංශයන්හි ආයතන කිහිපයක විගණනය, මූල්‍යකරණය සහ ගිණුම්කරණය පිළිබඳ ජ්‍යෝෂ්ඨ මට්ටමේ වසර 25කට අධික පළපුරුද්ද ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාවේ සාමාජිකාවක් වන අතර එම ආයතනයේ කමිටු ගණනාවක ඇය සේවය කර ඇත. |
| **යූ.එල්. ආශෝක බණ්ඩාර මහතා –**<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂ<br>2020 පෙබරවාරි මස 19 දින සිට අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්කරන ලදී. | අශෝක බණ්ඩාර මහතාට MNC's සහ ප්‍රමුඛ පෙළේ දේශීය ආයතනවල ඉල්ලුම උත්පාදන කාර්යය සහ ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ වසර 30කට අධික පළපුරුද්ද ඇත. වර්තමානයේ ඔහු ප්‍රමුඛපෙළේ සම්පිණ්ඩිත සමාගම් සඳහා කළමනාකරණ උපදේශන සේවා ක්‍රියාත්මක කරයි. ඔහුට කොළඹ විශ්ව විද්‍යාලයෙන් MBA සහ අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (CIM-UK) ඇත. |
| **අසාම් ඒ අහමට් මහතා –**<br>ස්වාධීන නොවන<br>විධායක නොවන අධ්‍යක්‍ෂ<br>2019 දෙසැම්බර් මස 30 දින සිට අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්කරන ලදී. | අසාම් ඒ අහමට් මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) අධි සාමාජිකයෙක් මෙන්ම වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) අධි සාමාජිකයෙක්ද වේ. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක්ද වේ. ක්‍රමෝපායික මූල්‍යකරණ කළමනාකරණය, විකල්ප ආයෝජන සහ අවදානම් කළමනාකරණය පිළිබඳ දේශිය සහ ජාත්‍යන්තරව වසර 18 කට අධික පළපුරුද්ද ඇත. |

අභ්‍යන්තර විගනනයේ ප්‍රධානී, උදේශ් ගුණවර්ධන මහතා අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව නැවත සකස් කිරීමට පෙර, අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගෙන් සමන්විත විය.

**ජෙහාන් පී අමරතුංග මහතා**
කමිටු සභාපති
(2019 දෙසැම්බර් 30 දින සිට තනතුර අවසන් කරන ලදී)

**එම්. ප්‍රදීප් අමිර්තනායගම් මහතා**
(2020 පෙබරවාරි 19 දින සිට තනතුර අවසන් කරන ලදී)

**එම්.ඒ.එම්. රිස්වාන් මහතා**
(2020 පෙබරවාරි 19 දින සිට තනතුර අවසන් කරන ලදී)

## රැස්වීම්

කමිටුව එක් මූල්‍ය වසරක් තුළ අවම වශයෙන් හතරවරක් කාර්තුමය වශයෙන් රැස්වීමට අවශ්‍ය වන අතර අවශ්‍යතාවක් ඇති වූ විට අධිකාරිය සහිතව අමතර රැස්වීම් කැඳවිය හැකිය. සමාලෝචිත මූල්‍ය වසර තුළ කමිටුව හතර වරක් රැස්වී ඇත.

රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත දක්වේ.

| සාමාජිකයාගේ නම | කමිටු රැස්වීමට සහභාගිත්වය |
|---|---|
| ජෙහාන් පී අමරතුංග මහතා | 4/4 |
| මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා | 3/4 |
| මොහමඩ් අනීස් මොහමඩ් රිස්වාන් මහතා | 4/4 |

සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෝෂ්ඨ කළමනාකරණය/කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් ආරාධනය අනුව රැස්වීම්වලට සහභාගි වෙති.

අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා කරන අතර අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

## මූල්‍ය වර්ෂය තුළ කටයුතු පිළිබඳ විස්තර

### මූල්‍ය වාර්තාකරණය

සමාගමේ ගිණුම්කරණ වාර්තා අනුව, සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, කොළඹ කොටස් හුවමාරුවේ සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නියමයන් සහ රෙගුලාසිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග යන්ට අනුකූලව සමාගමේ කටයුතු පිළිබඳව සාධාරණ සහ පැහැදිලි අදහසක් පිළිබිඹුවීමට කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල වගකීම් මුදාහැරීමේදී මෙම කමිටුව සහය වේ.

කමිටුව සමාගමේ අතුරු සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර සමාලෝචනය කරයි. එමෙන්ම විගණන කමිටුව ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්, සහ LKAS/ SLFRS මත පදනම් වූ ලාභ සැසඳීම සහ ලාභාංශ ප්‍රකාශ කිරීමෙන් විචක්ෂණ අනුපාතවලට වන බලපෑම අදාළ රෙගුලාසිවලට අනුකූලව සමාලෝචනය කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

එමෙන්ම, කමිටුව මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කළ යුතු ප්‍රකාශනය සමාලෝචනය කර අනුමත කරයි.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යය කරගෙන යාමට සහ විගණන කමිටුව වෙත වාර්තා කිරීම සඳහා විශේෂ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ඇත. වසර තුළ, විගණන කමිටුව අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ඵලදායිත්වය සහ විෂයමූලිකබව වර්ධනය කිරීම පිණිස අභ්‍යන්තර විගණන අත්පොත සමාලෝචනය කර යාවත් කරන ලදී. තවද, කමිටුව අභ්‍යන්තර විගණන සැලැස්ම සහ මූල්‍ය වසර සඳහා ක්‍රමෝපාය සමාලෝචනය කර අනුමත කරන ලද අතර අභ්‍යන්තර විගණන නිර්දේශවල ක්‍රියාත්මකවීම සහතික කරන ලදී.

## බාහිර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතට අනුව, විගණකාධිපති විසින් හෝ විගණකාධිපති විසින් පත්කරනු ලබන යම් පුද්ගලයෙක් විසින් විගණනය සිදුකරනු ලබන බව විගණකාධිපති විසින් දන්වා ඇත. සමාගමේ විගණනය ඉටුකිරීම සඳහා විගණකාධිපති විසින් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් විගණකවරුන් පත් කර ඇත.

කමිටුව පසුගිය වසරේ විගණනය සහ එයට කළමනාකරණයේ ප්‍රතිචාරවලට අදාළ බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපිය සමාලෝචනය කරන ලදී. කළමනාකරණ ලිපිය තුළ ඇති නිර්දේශ කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරන ලද බව සහතික කිරීමට කමිටුව පියවර ගනු ලැබිය.

## සදාචාර සහ යහපාලනය

අභ්‍යන්තර විගණන ප්‍රතිපත්ති ප්‍රඥප්තියක් හඳුන්වා දෙමින් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය අතර සහ තොරතුරු දනුම් දෙන්නන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වාදෙමින් සියලුම කාර්ය මණ්ඩලය අතර කමිටුව විසින් යහපාලනය ප්‍රවර්ධනය කරයි.

කමිටුව ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිති සමාගමේ සදාචාර සංග්‍රහය පිළිපැදීම සහතික කරයි. තොරතුරු දනුම්දීම තුළින් වාර්තා කරන ලද හෝ වෙනත් මාර්ග යන්ගෙන් හඳුනාගත් සිදුවීම් පිළිබඳව ස්වාධීන විමර්ශන පැවැත්වීමට සියලුම ක්‍රියාපටිපාටි ක්‍රියාවට නංවා ඇත.

## තොරතුරු දනුම්දීම සහ වංචාව

සමාගමේ තොරතුරු දනුම්දෙන්නන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය මගින් ආයතනික වංචා අවදානම් කළමනාකරණය සඳහා පුළුල්ව පැතිරුණු අවිධිමත් මාර්ගයක් ලෙස සේවය කිරීම අපේක්ෂා කරයි. මෙම ප්‍රතිපත්තිය සමාගමේ අභ්‍යන්තර ජාලයේ ප්‍රකාශයට පත්කර ඇති අතර තොරතුරු දනුම් දෙන්නන්ගේ දැඩි රහස්‍යතාව පවත්වා ගැනීම සහතික කරයි.

සමාගම තුළ යම් අවිධිමත් හෝ නීති විරෝධී ක්‍රියාවක් හෝ සදාචාර විරෝධී ව්‍යවහාරයක් දකින හෝ එවැනි දෙයක් පිළිබඳ විශ්වාසී තොරතුරු ලැබෙන යම් සේවකයෙක් තොරතුරු දනුම්දීම ක්‍රියාවේ යෙදවීම සඳහා දිරිගන්වනු ලබයි. මෙය භාවිතා කිරීම දිරි ගැන්වීමට සහ යම් අවංක ගැටලු මතු කිරීමට සේවකයින් අතර දනුවත්කම ඉහළ දැමීමට කටයුතු කරයි.



**කොරළි පීටර්ස්**
**ස්වාධීන අධ්‍යක්ෂ/සභාපති**
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2020 ජූලි මස 8
කොළඹ

# පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව



අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සමාගමේ පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත යොමු නිර්දේශ මත ක්‍රියාත්මක වේ.

## කමිටු රැස්වීම්වල සංයුතිය

2020 මාර්තු මස 31 දිනට, කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් දෙදෙනෙක් ස්වාධීන විය.

2019/20 මූල්‍ය වසර තුළ, සහ 2020 පෙබරවාරි මස 19 වන දින සිට කමිටුව නැවත සකස් කිරීමට පෙර, කමිටුව රැස්වීම් පහක් පවත්වන ලදී. කොවිඩ්-19 වයිරසය පැතිරීමේ තර්ජනය හේතු කොට ගෙන රජය විසින් දිවයින පුරා ඇඳිරි නිතිය පැනවීම නිසා කමිටුවට 2020 මාර්තු 16 දින පැවැත්වීමට නියමිත රැස්වීම කැඳවීමට නොහැකි විය.

සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරි ඔවුන්ට අදාළ කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවලදී පමණක් ආරාධනය මත කමිටු රැස්වීම්වලට සහභාගි වෙති. ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සාමාජිකයින් අවශ්‍ය අවස්ථාවලදී සහභාගි විය. කමිටුවේ කටයුතු විධිමත්ව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

2019 ඔක්තෝබර් මස 25 දින සිට ප්‍රදීප් අමිර්තනායගම් මහතා සමාගමේ සභාපති ලෙස පත්කිරීම සමඟ, රසිත ගුණවර්ධන මහතා ප්‍රදීප් අමිර්තනායගම් මහතා වෙනුවට කමිටුවට පත්කරන ලදී.

### සාමාජිකයින්ගේ පැමිණීම

| අධ්‍යක්ෂගේ නම | තනතුර | සාමාජිකත්වය | රැස්වීමට පැමිණීම |
|---|---|---|---|
| ජෙහාන් පී අමරතුංග මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සභාපති | 5/5 |
| ප්‍රදීප් අමිර්තනායගම් මහතා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සාමාජික | 3/4 |
| ජොන්සන් ප්‍රනාන්දු මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික | 4/5 |
| රසිත ගුණවර්ධන මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික | 1/1 |

2020 පෙබරවාරි මස 19 දින සිට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කිරීමත් සමඟ, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව නැවත සකස් කරන ලද අතර, 2020 මාර්තු 31 මස දිනට පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුවේ සාමාජිකයින් පහත පරිදි වේ:

| අධ්‍යක්ෂගේ නම | තනතුර | සාමාජිකත්වය |
|---|---|---|
| අශෝක බණ්ඩාර මහතා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සභාපති |
| කොරලි පීටර්ස් මහත්මිය | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සාමාජික |
| රොහාන් පතිරගේ මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික |

2020 මාර්තු මස 31 මස දිනට, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුවේ සාමාජිකයින් පිළිබඳ කෙටි විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ 68 සිට 71 දක්වා පිටුවල දක්වේ.

### 2019/20 වසරේ වැදගත් සිදුවීම්

- සේවකයින්ට ප්‍රසාද දීමනා ගෙවීමට නිර්දේශ කිරීම,
- සේවකයින්ට වැටුප් වර්ධක නිර්දේශ කිරීම,
- විස්තීර්ණ කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය මත පදනම් වී වාර්ෂික උසස්වීම් නිර්දේශ කිරීම.

## කමිටුවේ විෂය පථය

### විධිනියෝගය

සමාගමේ පාරිශ්‍රමික වැඩපිළිවෙළ කාර්යසාධනය මත පදනම් වූ ප්‍රදාන සමඟ පෙළ ගැසී ඇති බව සහතික කිරීමට කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයින් තෝරා ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත යොමු නිර්දේශ යටතේ කමිටුවට ඇති බලය අනුව කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යුහය, ප්‍රමාණය සහ සංයුතිය සමාලෝචනය කරන අතර, හඳුන්වා දිය යුතු යම් වෙනස්වීම් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ සිදුකරයි.

කමිටුවේ අනුමත යොමු නිර්දේශ අනුව තමාගේ පත්කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම තුළ අදාළ අධ්‍යක්ෂ සහභාගිවීමෙන් වළක්වනු ලබයි.

### බලාධිකාරිය

කමිටුවට එහි බලය යටතේ ඇති කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට සහ නිර්දේශ කිරීමට සහ අවසාන තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබාදීමට බලය ඇත. අවශ්‍ය විට සහ අවශ්‍ය අවස්ථාවලදි වෘත්තීමය උපදේශ ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට බලය ලබා දි ඇත.

## කමිටුවේ කාර්යසාධනය ඇගයීම

අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ස්වයං ඇගයීමේ කොටසක් ලෙස, කමිටුවේ කාර්යසාධනය සහ ඵලදායිත්වය සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කරන ලදී.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ස්වයං ඇගයීම පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 81 පිටුවෙන් ලබාගත හැක.

## පාරිශ්‍රමික ප්‍රතිපත්තිය

### ප්‍රධාන ක්‍රමෝපාය

අපගේ ප්‍රදාන ක්‍රමෝපාය ඉහළ තරඟකාරී පරිසරයක් තුළ ඉහළ හැකියාව සහිත සේවකයින් ආකර්ෂණය කර රඳවා ගැනීම සඳහා සැලසුම් කරනු ලබයි. තනි තනි පුද්ගලයින් සඳහා පාරිශ්‍රමික ප්‍රතිලාභ තීරණය කිරීමේදී, ඔහුගේ/ඇයගේ කාර්යසාධනය මෙන්ම දක්ෂතාව, පළපුරුද්ද සහ එම පුද්ගලයාගේ වගකීම් මට්ටම ද සැලකිල්ලට ගනී.

# පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වාර්තාව

## පාරිශ්‍රමික ප්‍රතිපත්ති මූලධර්ම

- ක්‍රමෝපාය මත සේවය ලබාදීමට පළපුරුද්ද, දක්ෂතාව සහ දැනුම පිළිබඳ නිවැරදි මුසුවක් සමඟ ඉහළ හැකියාව සහිත පුද්ගලයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට හැකියාව ඇති කිරීම.
- අපගේ අපේක්ෂිත සංස්කෘතියට සහයවීම හා එය සවිබලගැන්වීම සහ අපගේ වටිනාකම්වලට අනුකූල හැසිරීම දිරිගැන්වීම.
- අපගේ පාර්ශ්වකරුවන් සඳහා දීර්ඝ කාලීන වටිනාකම් නිර්මාණය සහතික කිරීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂා අතර සුදුසු තුලනය සහ පෙළගැසීම නිර්මාණය කිරීම
- ඉහල මට්ටමේ කාර්යසාධනය ලබාදීම සහ රඳවාගැනීම සඳහා සහ අපගේ ක්‍රමෝපායික ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා සේවකයින් දිරිගැන්වීම
- යහපාලන මූලධර්ම සමඟ පෙළ ගැසීම

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ වෙනත් ප්‍රතිලාභ

### ගාස්තු

පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුවේ නිර්දේශ මත පදනම් වී, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සමස්තයත් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල කමිටු රැස්වීම්වලට පැමිණීම සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ස්ථිර දීමනාවක් ගෙවා ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද ගාස්තු කාර්යසාධනය මත හෝ විශ්‍රාම වැටුප හිමිවීමකට අදාළ නොවේ.

අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 257 පිටුවේ දක්වේ.

## සේවකයින්ගේ පාරිශ්‍රමිකය සහ වෙනත් ප්‍රතිලාභ

### පාරිශ්‍රමික පැකේජය සහ වෙනත් ප්‍රතිලාභ

සේවකයින්ගේ පාරිශ්‍රමික පැකේජය සමාගමේ කාර්යසාධනය, පුද්ගලයා, තරඟකරුවන් සමඟ ගැලපීම, ආයතනික මාර්ගෝපදේශ සහ විශේෂ උපදේශකයින්ගේ වාර්තා සලකා බලමින් තීරණය කරනු ලබයි.

සේවකයින්ට ලබාදෙන වෙනත් ප්‍රතිලාභවලට රථවාහන ණය, කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ ආවරණය, බරපතල රෝග ආවරණය සහ පුද්ගල අනතුරු ආවරණය ඇතුළත් වේ.

### සේවක කොටස් යෝජනා ක්‍රමය

සමාගමේ සේවකයින්ට යම් කොටස් විකල්ප යෝජනා ක්‍රම ලබාගැනීමට හිමිකම නැත.



**අශෝක බණ්ඩාර**
සභාපති

පාරිශ්‍රමික සහ
නාමයෝජනා කමිටුව

2020 ජූලි මස 8
කොළඹ

# සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව



අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පාලනය කරන නියමයන් සහ රෙගුලාසිවලට දැඩි අනුකූලතාව සහතික කරයි.

## සංයුතිය සහ කමිටු රැස්වීම්

2020 මාර්තු මස 31 දිනට, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් දෙදෙනෙක් ස්වාධීන විය.

2019/20 මූල්‍ය වසර තුළ, සහ 2020 පෙබරවාරි මස 19 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කිරීමට පෙර, කමිටුව රැස්වීම් දෙකක් පවත්වන ලදී. 2019 දෙසැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කරමින් සිටි බැවින් සහ කොවිඩ්-19 වයිරසය පැතිරීමේ තර්ජනය හේතු කොට ගෙන රජය විසින් දිවයින පුරා ඇඳිරි නීතිය පැනවීම හේතු කොට ගෙන කමිටුවට 2019 දෙසැම්බර් මස රැස්වීම කැඳවීමට නොහැකි වූ අතර 2020 මාර්තු මස 16 දින පැවැත්වීමට නියමිත රැස්වීම කැඳවීමට ද නොහැකි විය.

සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ආරාධනය මත කමිටු රැස්වීම්වලට සහභාගි වෙන අතර ජ්‍යෝෂ්ඨ කළමනාකරණයේ සාමාජිකයින් වෙත අවශ්‍ය අවස්ථාවලදී සහභාගි වීම සඳහා ආරාධනය කරනු ලබයි. කමිටුවේ කටයුතු විධිමත්ව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

රොහාන් පතිරගේ මහතා 2019 ඔක්තෝබර් මස 25 දින සිට කමිටුව වෙත පත්කරන ලදී.

### මූල්‍ය වසර තුළ රැස්වීම්වලට පැමිණීම

| අධ්‍යක්ෂගේ නම | තනතුර | සාමාජිකත්වය | රැස්වීමට පැමිණීම |
|---|---|---|---|
| ප්‍රදීප් අමිර්තනායගම් මහතා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සභාපති | 2/2 |
| ජොන්සන් ප්‍රනාන්දු මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික | 0/2 |
| එම්.ඒ.එම්. රිස්වාන් මහතා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සාමාජික | 2/2 |
| රොහාන් පතිරගේ මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික | 1/1 |

2020 පෙබරවාරි මස 19 දින සිට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කිරීමත් සමඟ, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව නැවත සකස් කරන ලද අතර, 2020 මාර්තු මස 31 දිනට සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සාමාජිකයින් පහත පරිදි වේ:

| අධ්‍යක්ෂගේ නම | තනතුර | සාමාජිකත්වය |
|---|---|---|
| චතුර ජයන්ත විජේතිලක මහතා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සභාපති |
| සුදර්ශන් අහංගම මහතා | විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික |
| උපුල් ලක්ෂමන් අශෝක වික්‍රමසිංහ බණ්ඩාර මහතා | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | සාමාජික |

2020 මාර්තු මස 31 දිනට, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සාමාජිකයින් පිළිබඳ කෙටි විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ 68 සිට 71 දක්වා පිටුවල දැක්වේ.

## 2019/20 වසරේ වැදගත් සිදුවීම්

- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සඳහා සංශෝධිත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු (RPT) මගපෙන්වීම් සහ අත්පොත නිර්දේශ කිරීම
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කරන ලදී.

## කමිටුවේ විෂය පථය

### විධිනියෝගය

කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත යොමු නිර්දේශ මගින් (TOR) කමිටුවේ අරමුණ දක්වා ඇති අතර, ඒ තුළින් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් සමඟ අනුකූලවන යොමු නිර්දේශ තුළ පැහැදිලිවම ඉවත් කළ ගනුදෙනු හැර යෝජිත ඉදිරි සියලුම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කළ යුතුය.

## කමිටුවේ කාර්යභාරයට ඇතුළත් දෑ

- යොමු නිර්දේශ මගින් පැහැදිලිවම ඉවත් කළ ගනුදෙනු හැර සමාගමේ යෝජිත ඉදිරි සියලුම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කිරීම.
- සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කිරීමට ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි යොදා ගැනීම සහ දැනට පවත්නා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පරීක්ෂා කිරීම.
- සමාගම විසින් ඇතුළත්වීමට නියමිත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ කොටස්හිමියන්ගේ අනුමැතිය අවශ්‍ය ද යන්න තීරණය කිරීම.
- දැනට කරගෙන යන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සම්බන්ධයෙන් ජ්‍යෝෂ්ඨ කළමනාකරණය විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම
- සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් ඔහු හෝ ඇය සම්බන්ධිත පාර්ශ්වයක් වන යෝජිත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක යම් සාකච්ඡාවක් සඳහා සහභාගි නොවන බවත්, එසේ සහභාගි වන්නේ ඒ සම්බන්ධ තොරතුරු ලබාදීමට එම අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා සිටින්නේනම් පමණක් බව සහතික කිරීම.
- අප්‍රමාදව වෙළෙඳපොළ අනාවරණ සහ අදාළ නීති සහ රෙගුලාසිවලින් අවශ්‍ය කරන පරිදි මෙම වාර්තාව තුළ අනාවරණ කාලීන සහ විස්තරාත්මක ආකාරයකින් සිදුකරන බව සහතික කිරීම.

### බලාධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩලයට තීරණ ගැනීමට සහ නිර්දේශ වාර්තා කිරීමට කමිටුවට එහි බලය යටතේ අයත්වන කරුණු සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුව වෙත බලය ලබාදෙන අතර කරුණු සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ඇති කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය අවස්ථාවලදී වෘත්තිමය උපදෙස් ලබා ගැනීමට මෙම කමිටුවට බලය පවරා ඇත.

# සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

## සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි

### ප්‍රතිපත්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය තුළින් "සම්බන්ධිත පාර්ශ්ව" ලෙස සලකනු ලබන පුද්ගල වර්ගීකරණ නිර්වචනය කරයි.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය යටතේ ඔවුන්ට අදාළ සම්බන්ධිත පාර්ශ්ව හඳුනාගැනීම සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගෙන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් ස්වයං ඇගයීම් ලබාගනී.

සමාගමේ ව්‍යාපාර සහ සදාචාර සංග්‍රහය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් පුද්ගලික සම්බන්ධතා, බාහිර සංවිධානවලින් ඇතිවන වියහැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් සහ ඔහුගේ/ඇයගේ ස්වාධීන විනිශ්චය මත සම්බන්ධයක් තිබිය හැකි වැදගත් කරුණු තුළ බැඳියාවන් ඔහුට/ඇයට තිබේද යන්න තීරණය කිරීම අවශ්‍ය වේ. එමෙන්ම සංග්‍රහයෙන් වියහැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් ඇති අධ්‍යක්ෂවරුන් විසින් තමන් ඒ පිළිබඳ දැනගත් වහාම අධ්‍යක්ෂ මණ්ඩලයට එය අනාවරණය කිරීමට අවශ්‍ය වේ.

### ක්‍රියාපටිපාටි

සමාගම මාර්ගගත වැළැක්වීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇති අතර සම්බන්ධිත පාර්ශ්වයන්ට හිතකර සැලකීමක් සිදු නොකරන බව සහතික කරයි. මෙම ක්‍රමයෙන් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමනය කර වාර්තා කිරීමට සහ සමාගමේ ජාලය පුරා ඒ සම්බන්ධ දත්ත සොයා ලබා ගැනීමට සමාගමට හැකියාව ඇති කරයි.

## 2019/20 තුළ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

2019/20 වසර තුළ සම්බන්ධිත පාර්ශ්ව සමඟ සිදු වූ ගනුදෙනු පිළිබඳ විස්තර කමිටුව විසින් සමාලෝචනය කරන ලදී, 2019/20 මූල්‍ය වසර තුළ සීමාව ඉක්මවා යන පුනරාවර්තන නොවන ගනුදෙනු සිදුනොවීය.

2019/20 මූල්‍ය වසර තුළ සීමාව ඉක්මවා ඇති පුනරාවර්තන ගනුදෙනුවල විස්තර මූල්‍ය ප්‍රකාශවලට සටහන් 58 "සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය" යටතේ අනාවරණය කර ඇත.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශවල 257 සිට 262 දක්වා පිටුවල සටහන් 58 හි අනාවරණය කෙරේ.

### ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 58 "සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය" යටතේ අනාවරණය කරන පරිදි 2019/20 මූල්‍ය වසර තුළ සීමාව ඉක්මවන ලද පුනරාවර්තන ගනුදෙනු නොවන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කිසිවක් 112 සිට 117 දක්වා පිටුවල සමාගමේ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව තුළ අඩංගු නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය.



**චතුර විජේතිලක**
සභාපති

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව

2020 ජූලි මස 8
කොළඹ

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වැඩසටහන් සඳහා මූලිකවම වගකීමට බැඳී ඇති පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය 2008 අංක 03 දරන මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනත් නියෝගයේ 8 (3) වගන්තියට අනුව, සමාගමේ සහ සමූහයේ අවදානම් පැතිකඩ තුළ ප්‍රමාණවත්බව සහ ඵලදායිත්වය සමාලෝචනය කර ඇගයීම සඳහා එහි බලතල අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (“BIRMC” හෝ කමිටුව) වෙත පවරා ඇත.

## යොමු නිර්දේශය (TOR)

ඉහත සඳහන් පනත් නියෝගයට අනුකූල වෙමින්, යොමු නිර්දේශ (TOR) මගින් කමිටුව වෙත පැවරි ඇති බලය/බලාධිකාරිය, සංයුතිය, වගකීම්, රැස්වීම් වාර ගණන සහ සනපූරණය කමිටුවේ වාර්තාකරණය සහ වෙනත් ක්‍රියාපටිපාටි පැහැදිලිවම දක්වා ඇත.

## සංයුතිය

ආයතනික පාලන වාර්තාවේ 79 පිටුවේ සඳහන් පරිදි 2020 පෙබරවාරි මස 19 දින සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සකස් කිරීමෙන් පසු, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 පෙබරවාරි 20 දින පවත්වන ලද රැස්වීමේදී BIRMC නැවත සකස් කරන ලද අතර වර්තමානයේ එය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ:

| BIRMC සාමාජිකයාගේ නම | අධ්‍යක්ෂ තත්ත්වය |
|---|---|
| චනුර විජේතිලක මහතා | කමිටුවේ සභාපති (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) 2020 පෙබරවාරි 20 දින සිට කමිටුවට පත්කරන ලදි. |
| අසාම් අහමට් මහතා | කමිටු සාමාජික (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ) 2020 පෙබරවාරි 20 දින සිට කමිටුවට පත්කරන ලදි |
| ක්ලයිව් ෆොන්සේකා මහතා | කමිටු සාමාජික (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ) 2020 පෙබරවාරි 20 දින සිට කමිටුවට පත්කරන ලදි |
| ඒ.එස්. ඊබ්‍රහීම් මහතා (ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී) | අධ්‍යක්ෂ නොවන |
| සංජීව බණ්ඩාරණායක මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මෙහෙයුම්) | අධ්‍යක්ෂ නොවන |
| ලයනල් ප්‍රනාන්දු මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මෙහෙයුම්) | අධ්‍යක්ෂ නොවන |
| රොහාන් තෙන්නකෝන් මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් සහ පාලන) | අධ්‍යක්ෂ නොවන |

### ආරාධනය අනුව නිරතුරු සහභාගිවන්නන්

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අලෙවිකරණය
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අයකිරීම් සහ පරිපාලන
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අභ්‍යන්තර විගණන
- අනුකූලතා නිලධාරි
- පීපල්ස් ලීසිං පරිපාලිත සමාගම්වල ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය
  - ප්‍රධාන විධායක නිලධාරී – පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.
  - තාක්ෂණික උපදේශක – පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.
  - ජ්‍යෙෂ්ඨ කළමනාකරු – පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හි ප්‍රධානී
  - කාර්යභාර නිලධාරී පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්

අකිලා සමරසිංහ මහත්මිය – නියෝජ්‍ය කළමනාකරු, අවදානම් සහ පාලන BIRMC හි ලේකම් ලෙස කටයුතු කරයි.

කමිටුව නියෝජනය කරන අධ්‍යක්ෂවරුන් පිළිබඳ කෙටි විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ 68 සිට 73 දක්වා පිටුවල දැක්වේ.

## රැස්වීම්

BIRMC හි යොමු නිර්දේශ අනුව නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව, කමිටුව අවම වශයෙන් කාර්තුමය පදනමක් මත වසරකට හතර (04) වරක් පැවැත්විය යුතුය. සමාලෝචිත කාලසීමාව තුළ, කමිටුව රැස්වීම් දෙකක් (02) පමණක් පවත්වන ලද අතර ඒ සඳහා හේතු 106 පිටුවේ "රැස්වීම් වාර ගණන" යටතේ පැහැදිලි කෙරේ.

| නම | සහභාගිවූ/සහභාගිවීමට |
|---|---|
| එම්.පී. අමීර්තනායගම් මහතා | *2/2 |
| රසිත ගුණවර්ධන මහතා | *2/2 |
| එම්.ඒ.එම්. රිස්වාන් මහතා | *2/2 |
| ඒ.එස්. ඊබ්‍රහීම් මහතා | 2/2 |
| සංජීව බණ්ඩාරණායක මහතා | 2/2 |
| ලයනල් ප්‍රනාන්දු මහතා | 2/2 |
| රොහාන් තෙන්නකෝන් මහතා | 2/2 |

*එම්.පී. අමීර්තනායගම් මහතා – කමිටු සභාපති (විධායක නොවන ස්වාධීන නියෝජ්‍ය සභාපති/ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ) සහ එම්.ඒ.එම්. රිස්වාන් මහතා – කමිටු සමාජික 2019 ඔක්තෝබර් මස 24 දක්වා පිළිවෙළින් කමිටු සභාපති සහ කමිටු සාමාජික ලෙස කටයුතු කරන ලදී. රසිත ගුණවර්ධන මහතා – විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ 2020 පෙබරවාරි මස 19 දක්වා කමිටු සාමාජිකයෙක් ලෙස කටයුතු කරන ලදී.

## අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

සාකච්ඡා සහ ලගා වූ නිගමනයන් ඇතුළත් කමිටුවේ වාර්තා තහවුරු කිරීම සහ යොදා ගැනීම සඳහා පසුකාලීන BIRMC රැස්වීමට ඉදිරිපත් කරන ලදී. රැස්වීම්වල සියලුම වාර්තා කමිටුවේ සභාපති විසින් විධිමත්ව අනුමත කරන ලදී. අනුමත කළ වාර්තා BIRMC රැස්වීමෙන් සතියක් තුළ අදහස්, එකඟතාව සහ/හෝ විශේෂ උපදෙස් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

## කටයුතු

BIRMC විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට එහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී සමාගම විසින් මුහුණපාන ලද අභ්‍යන්තර/බාහිර අවදානම්වලට අදාළ කාර්යයන් පාලනය කිරීමේ කාර්යය තුළ ඵලදායීව සහය විය. මාසික පදනමක් මත ප්‍රධාන අවදානම් දර්ශක (KRIs) තුළින් හඳුනාගෙන ඇති සියලුම ප්‍රධාන අවදානම් කමිටුව විසින් එහි රැස්වීම්වලදී සමාලෝචනය කරන ලදී.

## ප්‍රධාන සාකච්ඡා ක්ෂේත්‍ර සහ වෙන්කළ කාලය




- අවදානම් පුවරුව සහ අවදානම් වාර්තා (පීපල්ස් ලීසිං සහ පරිපාලිත සමාගම්)
- ALCO ආශ්‍රිත
- EIRMC ආශ්‍රිත
- අනුකූලතාව ආශ්‍රිත

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

## කළමනාකරණ මට්ටමේ කමිටු ඇගයීම

- රැස්වීම්වල වැදගත් සිදුවීම් වාර්තා සහ යොමු නිර්දේශ අනුව වත්කම් වගකීම් කමිටුව (ALCO) සිදුකළ වාර්ෂික ඇගයීම සමාලෝචනය කරමින් ALCO විසින් සිදුකළ කාර්යයන් හි ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීම.
- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (EIRMC) රැස්වීම්වල වැදගත් සිදුවීම්/වාර්තා සමාලෝචනය කරමින් EIRMC හි ඵලදායි ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම. මෙයට ණය අවදානම් සහ මෙහෙයුම් අවදානම් කරුණු පිළිබඳ විශේෂයෙන් සිදුකළ විචාරණයන් ඇතුළත්ය. EIRMC මෙහෙයවන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් සහ පාලන කමිටුව වෙත EIRMC හි කටයුතු කෙටියෙන් පැහැදිලි කරයි.

## ණය අවදානම

- ක්ෂේත්‍රය තුළ ණය සංකේන්ද්‍රණය වැනි අනෙකුත් ණය දර්ශක සමඟ වත්කම් සහ නිෂ්පාදන මත පදනම් වී සහ තනි ණය ගැනුම් සීමාවට අනුකූලව අක්‍රීය ණය විශ්ලේෂණ තුළින් කළඹ තුළ ගුණාත්මකභාවය සමාලෝචනය කරන ලදී. කමිටුව සමාගමේ වත්කම්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අවශ්‍ය කාර්යයන් පිළිබඳව විස්තර ලබාදෙන ලදී.
- 2020 පෙබරවාරි මස, ණය ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලද අතර එහි යෝජිත සංශෝධන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.
- ණය අවදානම සඳහා පවත්වන ලද හානිකරණ ආවරණයේ ප්‍රමාණවත්බව සහ පීඩන පරීක්ෂණ ප්‍රතිඵල සමාලෝචනය කරන ලදී.

## ද්‍රවශීලතාව සහ වෙළෙඳපොල අවදානම

- පවත්වාගන්නා ද්‍රවශීල වත්කම්වල ප්‍රමාණාත්මකබව සහ කල්පිරීම් නොගැලපීම්, සංවේදී විශ්ලේෂණ සහ පොළී අනුපාත ප්‍රමිතිකරණ පරතර සමාලෝචනය කරන ලදී.
- ද්‍රවශීල වත්කම් පීඩන පරීක්ෂණ සහ අසම්භාව්‍ය අරමුදල් මාර්ගවල ප්‍රමාණවත්බව සමාලෝචනය කිරීම.
- ද්‍රවශීලතා සහ වෙළෙඳපොල අවදානම් කළමනාකරණයේ ඵලදායිත්වය ඇගයීමේදී කමිටුවට ඉදිරිපත්කළ ALCO රැස්වීම්වල වැදගත් වාර්තා සමාලෝචනය කරන ලදී.

## මෙහෙයුම් අවදානම

- ICT, මානව සම්පත්, වංචා යනාදිය සම්බන්ධයෙන් ස්ථාපිත කළ ප්‍රධාන මෙහෙයුම් දර්ශක සමාලෝචනය කරන ලදී.
- ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ආපදා පිළියම් සැලසුම්වල ප්‍රමාණාත්මකබව සමාලෝචනය කරන ලදී.

## නියාමන සහ අනුකූලතා අවදානම

- නියාමන අවශ්‍යතා සමඟ සමාගමේ අනුකූලතාව සමාලෝචනය කිරීම සහ අවදානම් ඉවසුම් මට්ටම්වලට අනුව නියාමනය කිරීම
- නීති, රෙගුලාසි, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන සහ සමාගමේ මෙහෙයුම් පිළිබඳ සියලුම ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්තිවලට සමාගමේ අනුකූලතාව ඇගයීම සඳහා අනුකූලතා නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද අනුකූලතා වාර්තා සමාලෝචනය කිරීම.
- 2018 ජූලි මස 1 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා මහ බැංකුවේ නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතාවන්ට අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සමාලෝචනය කිරීම.

## ක්‍රමෝපායික අවදානම

- ව්‍යාපාර පරිසරිය තුළ සිදු වූ වෙනස්වීම්වලට ප්‍රතිචාරාත්මකව ක්‍රියාත්මක කරන ලද ක්‍රමෝපායන්ගේ ඵලදායීත්වය සමාලෝචනය කිරීම
- අවදානම් ඉවසුම් මට්ටම්වලට අනුව ක්‍රමෝපායික අවදානම් දර්ශක සමාලෝචනය කිරීම.

## පරිපාලිත සමාගම්වල අවදානම් පැතිකඩ ඇගයීම්

සමාලෝචිත වසර තුළ, 2008 මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනත් නියෝගයේ 8 (3) (ආ) වගන්තියට අනුව, පහත සඳහන් පරිපාලිත සමාගම් BIRMC වෙත අවදානම් උපකරණ පුවරුව/ප්‍රධාන අවදානම් දර්ශක වාර්තා ඉදිරිපත් කරන ලද අතර ඒ තුළින් කමිටුවට එක් එක් පරිපාලිත සමාගමේ අවදානම් පැතිකඩ සහ පිපල්ස් ලීසිං සමූහයේ සමස්ත අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීමට හැකිවිය. පරිපාලිත සමාගම්වල වැදගත් සිදුවීම් සමාලෝචන පහතින් දැක්වේ:

### පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. (PI)

- කාර්තුමය පදනමක් මත පැහැර හැරීමේ අවදානම, මෙහෙයුම් අවදානම, ක්‍රමෝපායික අවදානම, අනුකූලතා අවදානම පිළිබඳ ප්‍රධාන අවදානම් දර්ශක සමඟ ප්‍රාරක්ෂණවල තත්ත්වය සහ ආයෝජන සංකේන්ද්‍රණ කමිටුව සමාලෝචනය කරන ලදී.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (කලින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය නමින් හඳුන්වන ලදී) විසින් නියාමනය කරන අවදානම් පදනම් ප්‍රාග්ධන ආදර්ශයට අනුව PI' හි අනුකූලතාව කමිටුව සමාලෝචනය කරන ලදී

### පීපල්ස් මයික්‍රෝ කොමර්ස් එල් ටී ඩී (PML)

- PML වරප්‍රසාද නොලත්, ග්‍රාමීය සහ නාගරික ජනතාව වෙත මූල්‍ය අන්තර්කරණය සහතික කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාදීම හා සම්බන්ධ වන අතර විවිධ අවදානම් පැතිකඩක් සමඟ ක්‍රියාත්මක වේ.
- සමාගමේ අවදානම් පැතිකඩ අවදානම් ඉවසුම් සීමාවලට අනුව කමිටුව විසින් කාර්තුමය වශයෙන් සමාලෝචනය කරන ලදී.

### අනෙකුත් පරිපාලිත සමාගම්

- පිපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් උපකරණ පුවරු වාර්තා BIRMC විසින් කාර්තුමය වශයෙන් සමාලෝචනය කරන ලදී.
- පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් දර්ශක වාර්තා සමාලෝචනය කරන ලදී.

පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සහ ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (පීපල්ස් ලීසිං බංග්ලාදේශ පරිපාලිත සමාගම) 2019 සිට ඉදිරියට පිළිවෙළින් අවදානම් දර්ශක වාර්තා සහ අවදානම් උපකරණ පුවරු වාර්තා පිළියෙල කිරීම ආරම්භ කරන ලදී. 2020 ජූනි මස පවත්වන ලද රැස්වීමේදී අදාළ පත්‍රිකා සාකච්ඡා කරන ලදී.

අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුව පීපල්ස් ලීසිං හි ඉහත සඳහන් කරන ලද පරිපාලිත සමාගම් සම්බන්ධිකරණය කරන ලද අතර විවිධ අවදානම් දර්ශක සහ අමතර තොරතුරු මගින් අදාළ තොරතුරු කමිටුව සාකච්ඡා කරන ලදී.

සමූහයේ අවදානම් පිළිබඳ විස්තරාත්මක තක්සේරු කිරීම මෙම වාර්ෂික වාර්තාවේ 137 සහ 138 පිටුවල විස්තර කෙරේ.

### වෙනත්

- පුළුල් අවදානම් වර්ගීකරණ (ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම්) අධීක්ෂණය කරන ආයතනික කළමනාකරණය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ ප්‍රධාන කළමනාකරණය කාර්ය මණ්ඩලය සමඟ සම්පව කටයුතු කරන ලද අතර බලතල රාමුව තුළ සහ කමිටුව වෙත පවරන ලද වගකීම තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගන්නා ලදී.

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව



- අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිවලට අදාළ වන්නා වූ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වගකීම් පිළිබඳ ක්‍රියාපටිපාටිය අධීක්ෂණය කරන ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අවදානම් ඉවසුම් සීමාව ඉක්මවන මට්ටම් සහ සමාගමේ ප්‍රතිපත්ති, නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතාවන්ගේ පදනම මත විශේෂිත අවදානම්වල බලපෑම් අවම කිරීමට නිවැරදි කිරීමේ කාර්යය නිර්දේශ කරන ලදී.

සමාලෝචිත වසර තුළ, සමාගම කෙරෙහි බලපෑමක් තිබිය හැකි උඩුකුරු සහ යටිකුරු අවදානම් අවධාරණය කරමින් සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමේදී අවදානම් පැතිකඩ සහ ඉවසුම් රාමුවට අනුව BIRMC එහි සහයෝගය ලබා දී ඇත.



**චානුර විජේතිලක**
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබදධ අවදානම් කළමනාකරණ කමිටුව

2020 ජූලි මස 8
කොළඹ

# අවදානම් කළමනාකරණය

## දළ විශ්ලේෂණය

මෙහෙයුම් පරිසරය වෙනස්වන සහ පුරෝකථනය කළ නොහැකි සන්දර්භයක් තුළ, අවදානම් කළමනාකරණය කිරීමට සහ යටිකුරු අවදානම්වල බලපෑම් අවම කරමින් සහ අවදානම සහ ප්‍රතිඵල අතර විශිෂ්ට විභව සමතුලිතතාව තීරණය කරමින් කොටස්හිමියන්ගේ වටිනාකම ප්‍රශස්ථ කිරීමට සමාගමට මනාව නිශ්චිත අවදානම් කළමනාකරණ රාමුවක් තිබීම අත්‍යවශ්‍ය වේ.

සමාගමේ ව්‍යාපාර ආකෘතියේ ස්වභාවය නිසා එය අවදානම් ගණනාවකට මුහුණපානු ලබයි. පීපල්ස් ලීසිං, මූල්‍ය ආයතනයක් ලෙස සහ එහි ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම ණයදීම නිසා ණය අවදානම සමාගම නිරාවරණය වන ප්‍රධාන අවදානම වන අතර ඉන්පසුව මෙහෙයුම්, වෙළෙඳපොළ, ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව වැනි අනෙකුත් අවදානම්වලට නිරාවරණය වේ.

වාර්තාකරණ වර්ෂය ප්‍රධාන වශයෙන් පාස්කු ප්‍රහාරය, 2019 නොවැම්බර් ජනාධිපතිවරණය වටා පැන නැගුණු දේශපාලන අවිනිශ්චිතතාව, සහ අහිතකර කාලගුණ තත්ත්වයන් හේතු කොට ගෙන රටේ ආර්ථිකය කලබලකාරී සහ පීඩාකාරී විය. වාර්තාකරණ වසරේ අවසාන කොටසේදී ඇති වූ කොවිඩ්-19 වසංගතය පැතිරීම ආර්ථිකය කෙරෙහි තවදුරටත් සෘණාත්මක බලපෑම් ඇති කරන ලදී.

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයට ද ආර්ථික පසුබැසීම සෘණාත්මකව බලපාන ලද අතර, එය අඩු වූ ණය වර්ධනයකට හේතු විය. ක්ෂේත්‍රයේ වත්කම්වල ගුණාත්මකභාවය, ගනුදෙනුකරුවන්ගේ ණය ගෙවීම් පැහැරහැරීම හේතු කොට ගෙන අඛණ්ඩව පිරිහීමට ලක් විය. නියාමකයින් විසින් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පවත්වා ගත යුතු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතාව වැඩි කරන ලදී. කෙසේවෙතත්, කොවිඩ්-19 වසංගතය පැතිරීම නිසා, ශ්‍රී ලංකා මහ බැංකුව වැඩිකළ අවම ප්‍රාග්ධන ප්‍රමණාත්මතා අවශ්‍යතාවයට අනුකූලවීම සඳහා එක් වසරකින් කාලය දීර්ඝ කරන ලදී.

| අවදානම් | බලපෑම් | සමාගමේ ප්‍රතිචාරාත්මත ක්‍රමෝපායන්/අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් |
|---|---|---|
| **පරිහානි ආර්ථික වර්ධනය** | අහිතකර ණය වාතාවරණය නිසා ණයවලට ඇති ඉල්ලුම අඩුවීම. | ආර්ථිකය පහත වැටීමත් සමග එම අවදානමට භාජනය වන වත්කම්වලට ණය දීමේදී පරීක්ෂාකාරී වීම හා අඩු අවදානම් නිෂ්පාදිත වර්ධනය කිරීමට යොමු වීම. |
| **පාස්කු ඉරිදා ප්‍රහාරය** | සංචාරක කර්මාන්තය බරපතල ලෙස පීඩාවට පත්වීම ආර්ථිකයට දැඩි ලෙස බලපාන ලද අතර ව්‍යාපාර විශ්වාසය දුර්වල කරන ලදී. | විස්තරාත්මක විශ්ලේෂණය මත පදනම් වී බලපෑම තක්සේරු කරමින්, සමාගම සංචාරක සහ අනෙකුත් පීඩාවට පත් ක්ෂේත්‍ර සඳහා විලම්භන කාලසීමා ලබාදෙන ලදී. අනෙකුත් ආරක්ෂිත ක්ෂේත්‍ර මත අඛණ්ඩව ව්‍යාපාර වර්ධනය කරන ලදී. |
| **ජනාධිපති/පාර්ලිමේන්තු මහ මැතිවරණ** | දේශපාලන අවිනිශ්චිතතාව සාමාන්‍ය ව්‍යාපාර අභිප්‍රායන් කෙරෙහි සෘණාත්මකව බලපාන ලදී. | අයවැයගත ඉලක්ක අත්කර ගැනීමට උත්සාහ දරමින්, අභ්‍යන්තර පිරිවැය ප්‍රශස්ථකරණය මත අවධානය යොමු කරන ලදී. |
| **මූල්‍ය සමාගම් සහ සදාචාර විරෝධි මූල්‍ය සේවා සපයන්නන්ගේ බලපත්‍ර අවලංගු කිරීම** | ගනුදෙනුකාර විශ්වාසය අහිමිවීම තැන්පත් පිළිබඳ කල්නොමේරූ ආපසු ගැනීම් වැඩිවීම. | ශක්තිමත් සන්නාම වටිනාකමක් සහ පාර්ශ්වකාර විශ්වාසය ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කිරීම. |
| **සයිබර් ප්‍රහාර** | ව්‍යාපාරික කටයුතුවලට බාධා ඇතිවීම සහ රහසිගත දත්ත අහිමිවීම. | කාර්ය මණ්ඩලය අතර සයිබර් ප්‍රහාර පිළිබඳ දැනුවත්කම සහ හුවමාරු දැනුම ගොඩනැගීම. සයිබර් ආරක්ෂක අවදානම් මැඩපැවැත්වීමට පද්ධති සහ ක්‍රියාවලි තුළ ආයෝජනය. |
| **කොවිඩ්-19 නිසා දිවයින පුරා සංචරණ සීමා කිරීම** | සමාජයේ විශාල කොටසක් සඳහා ආදායම් සහ ජීවනෝපාය අහිමිවීම.<br>අක්‍රීය වත්කම් සහ හානිකරණ අයකිරීම් වැඩිවීම. | සය මාසික ණය විලම්බන කාලසීමාව පීඩාවට පත් ගනුදෙනුකරුවන් සඳහා ලබාදීම.<br>විශේෂයෙන් ණය හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීමට කෙටිකාලීන කාර්ය සැලැස්මක් සකස් කරන ලදී. |

# අවදානම් කළමනාකරණය

මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ
**කළමනාකාරිත්වය >>**
මූල්‍ය වාර්තා
අතිරේක තොරතුරු

## අවදානම් කළමනාකරණ රාමුව

### අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම තුළ ඵලදායී අවදානම් කළමනාකරණය සඳහා ස්වරය සකස් කරන ඉහළම ආයතනය වේ. ආරක්ෂාව පිළිබඳ තෙවැදෑරුම් මාර්ග ආදර්ශය මගින් පාලන ව්‍යුහය තුළ පාර්ශ්වයන් ඔවුන්ගේ විශේෂිත කාර්යභාරයන් සහ වගකීම්වලට අනුව වෙනස් වන ආකාරය පැහැදිලි කරයි. ආරක්ෂාවේ එක් එක් ස්ථරයට එයටම අයත් සුවිශේෂී කාර්යභාරයක් ඇති අතර, ඉන් සුදුසු ක්‍රමෝපායික උපායක් යෙදීම සඳහා ඇතිවන අවදානම් දූන හඳුනාගනිමින් අවදානමේ වේගවත් පහරදීම අවම කිරීමට ආරක්ෂක පලිහක් සපයයි.




### කමිටුවල කාර්යභාරය

**අධ්‍යක්ෂ මණ්ඩල මට්ටම**

| අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) |
|---|---|
| **සභාපති:**<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | **සභාපති:**<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක |
| **සාමාජිකයින්:**<br>ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක්,<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් දෙදෙනෙක් – මෙහෙයුම්<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් සහ පාලන<br>නිරන්තර ආරාධිතයින්: නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අලෙවිකරණ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අයකිරීම් සහ පරිපාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අභ්‍යන්තර විගණන, පීපල්ස් ලීසිං පරිපාලිත සමාගම්වල නිලධාරී නියෝජනය ද ඇතුළත් වෙති | **සාමාජිකයින්:**<br>විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්<br>ආරාධිතයින්ට ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය. බාහිර විගණකවරු ඇතුළත්ය |
| **ප්‍රධාන කාර්යය:**<br>සමාගම/සමූහයේ සමස්ත අවදානම් පැතිකඩ සමාලෝචනය | **ප්‍රධාන කාර්යය:**<br>මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ විගණකගේ ස්වාධීනත්වය අධීක්ෂණය කිරීම |
| **රැස්වීම් වාර ගණන:**<br>කාර්තුමය | **රැස්වීම් වාර ගණන:**<br>කාර්තුමය |
| **වාර්තාකරණය:**<br>BIRMC රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට | **වාර්තාකරණය:**<br>BAC රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට |
| විස්තරාත්මක වාර්තාව 124 – 126 පිටුවල | විස්තරාත්මක වාර්තාව 118 සහ 119 පිටුවල |

# අවදානම් කළමනාකරණය

## කළමනාකරණ මට්ටම

| වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) | විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC)<br>(පෙර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව ලෙස හඳුන්වන ලදී) |
|---|---|
| **සභාපති**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී | **සභාපති**<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් සහ පාලන |
| **සාමාජිකයන්**<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී දෙදෙනෙක් – මෙහෙයුම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් සහ පාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අයකිරීම් සහ පරිපාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අලෙවිකරණ, ප්‍රධාන කළමනාකරු – ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්, ප්‍රධාන කළමනාකරු – මූල්‍ය, භාණ්ඩාගාර ප්‍රධානී | **සාමාජිකයින්**<br>ආයතනික කළමනාකරණයේ සාමාජිකයින්, ප්‍රධාන කළමනාකරුවන් – මෙහෙයුම්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් – මෙහෙයුම්, ක්‍රියාත්මක ක්ෂේත්‍රවල අවදානම් හිමිකරුවන් |
| **ප්‍රධාන කාර්යයන්**<br>සමාගමේ භාණ්ඩාගාරය, වත්කම් සහ වගකීම් කාර්යයන් සමාලෝචනය කිරීම | **ප්‍රධාන කාර්යයන්**<br>ණය ආශ්‍රිත අවදානම් සහ මෙහෙයුම් අවදානම් සමාලෝචනය කිරීම |
| **රැස්වීම් වාර ගණන**<br>මාසික පදනමක් මත විධිමත් රැස්වීම් පැවැත්වේ. කෙසේවෙතත්, හදිසි අවශ්‍යතා ඇතිවුවහොත්, විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ. | **රැස්වීම් වාර ගණන**<br>කාර්තුමය |
| **වාර්තාකරණය**<br>රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහ රැස්වීම් වැදගත් සිදුවීම් පිළිබඳ වාර්තාවක් කාර්තුමය පදනමක් මත BIRMC වෙත | **වාර්තාකරණය**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීට නිර්දේශකිරීම රැස්වීමේ වාර්තා BIRMC වෙත |

## අවදානම් සංස්කෘතිය

ආයතනයක් තුළ යහපත් අවදානම් සංස්කෘතියක් ගොඩනැගීම අඛණ්ඩ ක්‍රියාවලියකි. පීපල්ස් ලීසිං යහපත් අවදානම් සංස්කෘතියක් පෝෂණය කිරීමට බැඳී ඇති අතර එවැනි සංස්කෘතියක් තුළ, සියලුම සේවකයින් අවදානම පිළිබඳ දැනුවත් අතර දැනුවත් අවදානම් තීරණ අරගනී. සමාගමේ අවදානම් සංස්කෘතියට අවදානම් පාලන ව්‍යුහය, අවදානම් රුචි රාමුව, ප්‍රතිපත්ති රාමුව, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන රාමුව ඇතුළත්ය. අවදානම් පාලන දෙපාර්තමේන්තුව (RCD) සේවකයින්ට, ණය නිලධාරීන්ට සුදුසු විශේෂයෙන් අවදානම් පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි කරන පුහුණු/දැනුවත් කිරීම් ලබා දේ.

## අවදානම් රාමුව

සමාගම තුළ ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීම සඳහා අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. වාර්තාකරණ වසර තුළ, සමාගමේ ප්‍රතිපත්ති මෙහෙයුම් පරිසරයට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සංශෝධනය කරන ලද අතර එයට අවශ්‍ය සංශෝධන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනා කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය ඉක්මන් භාවිතය සඳහා මෙම ප්‍රතිපත්ති සංශෝධන අනුමත කරන ලදී. නව ප්‍රතිපත්ති ද හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා සකස් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ඒවා යොදා ගනු ලබයි.

**2019/20 සමාලෝචන සහ යාවත්කාලීන කළ ප්‍රතිපත්තීන්**

- ණය ප්‍රතිපත්තිය
- ස්ථාවර දේපල පරීක්ෂණය මත ඇගයීම් පිළිබඳ ප්‍රතිපත්තිය
- ව්‍යාපාර මෙහෙයුම් බාහිරට ලබාදීමේ ප්‍රතිපත්තිය
- දේපල අත්කර ගැනීමේ සහ බැහැර කිරීමේ ප්‍රතිපත්තිය
- පීපල්ස් ලීසිං තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය
- විගණන නොවන සේවා ලබාදීමට බාහිර විගණකවරුන්ගේ සහභාගිත්වය සඳහා ප්‍රතිපත්තිය
- මූල්‍ය පහසුකම් කපාහැරීම පිළිබඳ ප්‍රතිපත්තිය
- භාණ්ඩාගාර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි
- ද්‍රවශීල වත්කම් මත ආයෝජන ප්‍රතිපත්තිය
- තොරතුරු ආරක්ෂාව, ආපදා පිළියම, සයිබර් ආරක්ෂාව යනාදිය පිළිබඳ ප්‍රතිපත්ති ඇතුළත් සියලුම තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තීන්

**2019/20 දී සකස් කරන ලද නව ප්‍රතිපත්ති**

- ලාභාංශ ප්‍රතිපත්තිය
- පශ්චාත් ණය ලබාදීම් සමාලෝචනය පිළිබඳ ප්‍රතිපත්තිය
- මිලකරණ ප්‍රතිපත්තිය

## අවදානම් රුචිය

ව්‍යාපාර සඳහා අවදානම් රුචිය සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර ඒවා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ අධීක්ෂණය යටතේ පවතී. සමාගම එහි ව්‍යාපාර පරමාර්ථ කරා ළඟාවීමේදී පිළිගැනීමට කැමති වන මට්ටම මත අවදානම් රුචිය තීරණය කරනු ලබන අතර මැනියහැකි බව අවදානම් ඉවසුම් සීමා තුළින් ප්‍රකාශ කරනු ලබයි.

කාර්තුමය පදනමක් මත BIRMC වෙත ඉදිරිපත් කරන අවදානම් උපකරණ පුවරු වාර්තාව තුළින් අවදානම් ඉවසුම් සීමාවන්ට අනුව කාර්යසාධනය නියාමනය කෙරේ. ක්‍රමෝපායික පරමාර්ථ, මෙහෙයුම් පරිසරය, නියාමන අවශ්‍යතා සහ ප්‍රාග්ධන සැලසුම්වල වෙනස්වීම්වලට සමගාමීව අවම වශයෙන් වාර්ෂිකව අවදානම් ඉවසුම් සීමා සමාලෝචනය කිරීම සඳහා BIRMC වගකීමට බැඳී සිටී. 2020 ජූනි මස, BIRMC විසින් අවදානම් ප්‍රකාශනය සමාලෝචනය කරන ලද අතර BIRMC හි නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය එය අනුමත කරනු ලැබීය.

| අවදානම් වර්ගය | අවදානම් දර්ශකය | ඒකක | අවම අවදානම් ඉවසුම් සීමාව | 2019 මාර්තු මස 31 දිනට තත්ත්වය | **2020 මාර්තු මස 31 දිනට තත්ත්වය** |
|---|---|---|---|---|---|
| **ණය අවදානම** | අක්‍රීය ණය අනුපාතය (දළ) | % | < 5 | 3.91 | **7.62** |
| | මාස තුනේ අයිරා අනුපාතය (දළ) | % | <10 | 7.57 | **20.34** |
| | ලාභ සහ අලාභ අයකිරීම් අනුපාතය (ලාභ මත) | % | <20 | 28.02 | **58.61** |
| **ණය සංකේන්ද්‍රණ අවදානම** | තනි/සමූහ ණයකරුවෙකුගේ සීමාව | | CBSL අනුව | අනුකූලයි | **අනුකූලයි** |
| | HHI ලකුණු | ලකුණු | <0.40 | 0.21 | **0.22** |
| **ද්‍රවශීලතා අවදානම** | ද්‍රවශීල වත්කම් අනුපාතය | % | >100 | 108.90 | **110.59** |
| | කල්පිරීම් නොගැලපීම් අනුපාතය (එක් වසරක් දක්වා) | % | >-45 | -20.04 | **-21.94** |
| | ස්ථාවර මූලාශ්‍රවලින් ලබාදෙන ලද පහසුකම් | % | <150 | 114.96 | **105.29** |
| | කෙටි කාලීන වගකීමට ද්‍රවශීල වත්කම් අනුපාතය | % | >30 | 78.19 | **203.57** |
| | උපරිම තනි තැන්පත්කාර සංකේන්ද්‍රණය | % | <5 | 4.33 | **4.20** |
| | තොග තැන්පතුවලට නිරාවරණය (රු. මිලියන 50ට වැඩි) | % | <20 | 21.89 | **24.17** |
| **වෙළෙඳපොල අවදානම** | පොළී අනුපාත සංවේදීතාව | % | <6 | 0.37 | **0.29** |
| | ප්‍රතිමිලකරණ පරතර අනුපාතය (මාස තුනක් දක්වා) | % | >-20 | -7.43 | **4.13** |
| **මෙහෙයුම් අවදානම** | සොයා ගත් වංචා (මෙහෙයුම් වියදමෙන් ප්‍රතිශතයක් ලෙස වටිනාකම) – 2019/20 මූල්‍ය වසර | % | <0.5 | ශුන්‍ය | **ශුන්‍ය** |
| | අසතුටුදායක විගණන (මුළු විගණන සමාලෝචනයෙන් ප්‍රතිශතයක් ලෙස) – 2019/20 මූල්‍ය වසර | % | <15 | ශුන්‍ය | **8.70** |
| | පිරිවැයට ආදායම් අනුපාතය | % | <50 | 37.81 | **36.53** |
| | සේවක පිරිවැටුම් අනුපාතය (වාර්ෂික) | % | <15 | 11.15 | **9.18** |
| **නියාමන අවදානම** | ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය | | | | |
| | – පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | % | >6 | 14.36 | **15.12** |
| | – මුළු ප්‍රාග්ධන අනුපාතය | % | >12.5 | 15.20 | **15.99** |
| | ප්‍රාග්ධන අරමුදල් අනුපාතය | % | >12.5 | 32.39 | **28.33** |
| **ක්‍රමෝපායික අවදානම** | ස්කන්ධය මත ඉපයීම් අනුපාතය | % | >15 | 15.88 | **10.00** |
| | වත්කම් මත ඉපයීම් අනුපාතය | % | >3.5 | 3.95 | **2.64** |
| | ශුද්ධ පොළී ආන්තිකය | % | >7.5 | 9.70 | **9.68** |
| | තෝලන අනුපාතය | වාර ගණන | <7 | 4.75 | **4.38** |

## පීපල්ස් ලීසිං හි ප්‍රධාන අවදානම් කළමනාකරණය

### ණය අවදානම

මූල්‍ය ගනුදෙනුවක ඇපකාර පක්ෂය විසින් ඔහුගේ/ඇයගේ ඇපකරුවන්ගේ බැඳීම් මුදාහැරීමට අසමත්වන අවස්ථාවක ඇතිවිය හැකි මූල්‍ය අලාභවලට ණය අවදානම සම්බන්ධ වේ. එවැනි අවස්ථාවන් ඇති වීමෙන් ණය මත පොළී හඳුනාගැනීම අත්හිටුවීම, අක්‍රීය ණය වර්ගීකරණයට ණය වර්ගීකරණය, හානිකරණ අයකිරීම්, වියෝජක සහ පොළිය අහිමිවීම සහ අක්‍රීය ණය පහසුකම් කපාහැරීම් සහ නැවත අයකරගත් වත්කම් බැහැර කිරීම මගින් සමාගමේ ලාභදායීතාවය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි. පීපල්ස් ලීසිං හි, ණය අවදානම කල්බදු, ණය සහ අනෙකුත් ණය නිෂ්පාදන වන ආන්තික වෙළෙඳාම, සාධකකරණය, රන් ණය යන ආදියෙන් ඇතිවන අතර, ඒවා මුළු වත්කම්වලින් 85%කට වඩා දායක වේ.

ක්ෂේත්‍රය තුළ අත්විඳි ප්‍රවණතා පිළිබිඹු කරමින්, සමාගමේ වත්කම්වල ගුණාත්මකභාවය වාර්තාකරණ වසර තුළ පිරිහීමට ලක් වූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් එහි මූල්‍ය වත්කම් රටේ දුර්වල ආර්ථික කාර්යසාධනය මත උවදුරට ලක්වීම හේතු විය. 2019/20 මූල්‍ය වසර මුලදී, පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරය සංචාරක ක්ෂේත්‍රයට සෘණාත්මකව බලපාන ලද අතර රජයේ උපදෙස්වලට අනුකූලව, ණය විලම්බන කාලසීමාව සහ අනෙකුත් සහන සමාගම විසින් සංචාරක සහ පීඩාවට පත් අනෙකුත් ක්ෂේත්‍ර වෙත ලබා දෙන ලදී.

පූර්ව කොවිඩ්-19 කාලසීමාව තුළ, ආර්ථික පසුබැසීම සඳහා අඩුවෙන් උවදුරට පත්වන ණය නිෂ්පාදන සහ අඩු ණය අවදානම් සහිත නිෂ්පාදන වර්ධනය කිරීම පිළිබඳව සමාගම අවධානය යොමු කරන ලදී.

ණය බලතල සීමා පැවරීම සඳහා තනිපුද්ගල ණය නිලධාරී පදනමක් මත ණය හැකියා ලකුණු ගණනය කරන යාන්ත්‍රණයක් RCD හඳුන්වාදෙන ලදී. ණය හැකියා ලකුණු තෝරාගත් ණය තත්ත්ව නිර්ණායක මත පදනම් වී ගණනය කරන ලදී. දේපල පදනම් ණය සඳහා සියුම්ව පරීක්ෂා කිරීමේ මට්ටම වර්ධනය කිරීමේ අදහස ඇතිව, දේපල පදනම් ණය සඳහා ණය අනුමැතිය මධ්‍යගතකරන ලද අතර ණය ලබාදීම් ඉහළ මට්ටමේ සියුම් පරීක්ෂාවෙන් අනතුරුව සිදුකරන ලදී.

ණය තක්සේරු කිරීම හා බැඳුණු දැනුම වැඩි කිරීම සමාලෝචිත වසර තුළ ඉහළ ප්‍රමුඛතාවයක් විය. RCD විසින් අලෙවිකරණ කාර්ය මණ්ඩලය සඳහා ණය තක්සේරු කිරීම සහ ඇගයීම පිළිබඳ ඔවුන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා ඔවුන්ට අඛණ්ඩව පුහුණු පවත්වනු ලබයි.

# අවදානම් කළමනාකරණය

RCD විසින් කලින් කල පදනමක් මත සක්‍රීය පහසුකම් පිළිබඳ පශ්චාත් ණය ලබාදීමේ සමාලෝචන පවත්වනු ලබයි. පශ්චාත් ණය ලබාදීමේ සමාලෝචනවලට ණය දීමේ තීරණයක් ආපසු හැරවීමට නොහැකි වුවද, අවශ්‍ය අවස්ථාවලදී එය යම් දෝෂවලට පිළියම් සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් ඇති කරයි. සමාලෝචනයෙන් අනාවරණය වන සාධක කඩිනමින් පහළ මට්ටමේ සිට ඉහළ මට්ටම දක්වා මැදිහත් වූ අදාළ ණය නිලධාරීන් වෙත දැනුම් දෙනු ලබන අතර සමාලෝචනයේ සොයා ගැනීම්වල සාරාංශ වාර්තාවක් ද කාර්තුමය වශයෙන් EIRMC වෙත ඉදිරිපත් කෙරේ. සමාලෝචිත වසර තුළ, පශ්චාත් ණය ලබාදීමේ සමාලෝචනය ක්‍රියාත්මක කිරීම ප්‍රමිතිගත කිරීමේ අදහස ඇතිව, පරමාර්ථ, විෂය පථය, කාර්යභාරයන් හා වගකීම් සහ වාර්තාකරණ මාර්ග යනාදිය නියම කරමින් එහි ප්‍රතිපත්තිය සකස් කරන ලදී.

සමාගම හඳුනාගත් ඉහළ අවදානම් සහිත වත්කම් සඳහා CBSL විසින් නියමකළ වටිනාකමට ණය අනුපාතයට (LTV) පහළ අභ්‍යන්තර LTV යොදා ගනු ලැබූ අතර එමනිසා, ණය ලබාදීම් වඩා ඉහළ මට්ටමේ සියුම් පරීක්ෂාවක් සහිතව තෝරාගනිමින් සිදුකරන ලදී.

2020 පෙබරවාරි මස, සමාගමේ ණය ප්‍රතිපත්තිය මෙහෙයුම් වාතාවරණය සහ නියාමන අවශ්‍යතා පිළිබිඹු කිරීම සඳහා සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදී.

2020 මාර්තු මස මැද දී රටතුළ ඇති වූ කොවිඩ්-19 වසංගතය පැතිරීම දේශීය වශයෙන් පෙර නොවූ විරූ වෙනස්වීම්වලට හේතු විය. අක්‍රීය ණය 2020 මාර්තු මාසයේදී පමණක් සැලකියයුතු ලෙස වැඩි විය. කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට සහන ලබාදීම සඳහා සය මාසික විලම්බන කාලසීමාව පිළිබඳ උපදේශයක් CBSL නිකුත් කළේය. කොවිඩ්-19 වසංගතය පැතිරීමේ බලපෑම තක්සේරු කිරීමට, සමාගමේ දැනට පවත්නා ණය කළඹ අඩු බලපෑම සිට වැඩි බලපෑම දක්වා වර්ගීකරණය කරන ලදී.

| අනාගත බලපෑම | විස්තරය |
|---|---|
| **වැඩි** | ව්‍යාපාරය තුළ ව්‍යුහගත විතැන්වීමක් අපේක්ෂිත සහ ඉහළ යන ණය අවදානම් පීඩාවට පත් ගනුදෙනුකරුවන් |
| **මධ්‍යම** | වසර 1 ට වඩා වැඩි කාලයක් පවත්නා පීඩනය අත්විඳින ගනුදෙනුකරුවන් |
| **අඩු** | කෙටි කාලයක් තුළ ආපසු යථා තත්ත්වයට පැමිණීමට හැකි ගනුදෙනුකරුවන් |
| **බලපෑම් නොමැති** | වසංගතයෙන් කිසිදු බලපෑමක් නොමැති ගනුදෙනුකරුවන් |

වර්තමානයේ, සමාගම ගනුදෙනුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ණය විලම්බන කාලසීමා අයදුම්පත් අවසන් කිරීමේ ක්‍රියාවලිය තුළ නිරත වී සිටී. සමාගම තවදුරටත් කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත්වී නොමැති සහ අඩුවෙන් පීඩාවට පත් වූ හඳුනාගත් ගනුදෙනුකාර අංශ සඳහා එහි පිළියම් ක්‍රියාපටිපාටි ඉටුකරමින් සිටී. අක්‍රීය ණය අත්තිකාරම් සහ හානිකරණය අනුව සැබෑ බලපෑම ණය විලම්බන ඉල්ලීම් අවසාන කිරීම මත තක්සේරු කිරීමට නියමිතය.



# අවදානම් කළමනාකරණය

## ණය ලබාදීමේ ක්‍රියාවලිය

| කාර්යය | විස්තරය | 2019/20 දී ගනු ලැබූ වර්ධන ක්‍රියාමාර්ග |
|---|---|---|
| **ණය ඇගයීම** | ණය යෝජනා ශාඛා මට්ටමින් ඇති වන අතර ආයතනික කළමනාකරණය විසින් ණය ප්‍රතිපත්තිය සහ කලින් කල නිකුත් කරන ලද මෙහෙයුම් මාර්ගෝපදේශවලට අනුව ඇගයීමට ලක් කෙරේ. | RCD විසින් ණය තක්සේරු කිරීම් සහ ඇගයීම් පිළිබඳ දැනුම වැඩි කිරීමට ණය පුහුණු පවත්වන ලදී. |
| **ණය අවදානම් ප්‍රතිකාර** | මුදල් ප්‍රවාහ නැවත ගෙවීමේ ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස සලකනු ලැබේ. ද්විතියික උපයෝජනයක් ලෙස, චංචල දේපල, නිශ්චල දේපල, වෙළෙඳ ණයගැතියන් හෝ පුද්ගල ඇපයන් ආකාරයේ ඇප ලබාගනී. අදාළ අවස්ථාවලදී ඇප තක්සේරු කිරීම සඳහා වෘත්තීය තක්සේරුකරුවන්ගෙන් සහය ලබාගනී. හැකි සෑම අවස්ථාවකදීම දෙවැනි අදහස් ද ලබා ගනී. ශාඛාවල වගකීම්සහගත නිලධාරීන් මෝටර් රථ සහ දේපල පිළිබඳ පරීක්ෂා කිරීම් සිදු කිරීම ද අවශ්‍යය. | දේපල පදනම් ණය සඳහා සියුම්ව පරීක්ෂා කිරීමේ මට්ටම වැඩිකරන ලදී.<br>දේපල ඇගයීම සම්බන්ධයෙන්, ඇගයීම් නිලධාරීන්ගේ යෝග්‍යතා නිර්ණායක සහ අනෙකුත් අවශ්‍යතා ප්‍රතිශෝධනය කරමින් විධානයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. නිශ්චල දේපල ඇගයීම සම්බන්ධයෙන් පීපල්ස් ලිසිං ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලද අතර  අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු එය යොදාගනු ලැබීය. |
| **ණය අනුමැතිය** | ණය අනුමැතීන් පවරනු ලබන බලාධිකාරියට අනුකූළ වේ.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් – මෙහෙයුම් සහ ආයතනයේ වඩා පහළ මට්ටමේදී අඛණ්ඩව තෝරාගත් නිලධාරීන්ගෙන් ශාඛා කළමනාකරණ මට්ටමට වනතෙක් බලතල පවරනු ලැබේ. නියමිත සීමාවට ඉහළ ඉදිරිපත් කරන ලද ණය යෝජනා RCD විසින් ස්වාධීනව අගයනු ලබන අතර ඊලඟ අධිකාරී මට්ටම දක්වා ඒ පිළිබඳ නිර්දේශ ලබා දේ. | RCD විසින් වත්කම්වල ගුණාත්මක බවේ නිර්ණායක මත පදනම් වී තනි පුද්ගල ණය ලකුණු ගණනය කිරීමේ ක්‍රමයක් ආරම්භ කරන ලද අතර ණය බලතල සීමා ඒ අනුව ගලපන ලදී. |
| **ණය බෙදාහැරීම** | අනුමත පහසුකම් පිළිබඳ සියලුම ණය බෙදාහැරීම මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ලියවිලි සහ සැපයුම්කාර ගෙවීම් ඒකකය මගින් සහතික කිරීමෙන් පසු ප්‍රධාන කාර්යාලයේ ගෙවීම් ඒකකය මගින් මුදාහරිනු ලැබේ. | මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට අතින් සිදුකළ ක්‍රියා වෙනුවට ස්වයංක්‍රීය ක්‍රියාවලි ආරම්භ කරන ලදී. |
| **ණය අවදානම් නියාමනය සහ සමාලෝචනය** | ණය අවදානම නියාමනය RCD විසින් අඛණ්ඩ පදනමක් මත සිදුකරන අතර, ඒ සම්බන්ධ සොයාගැනීම්, නිර්දේශ කිරීම සහ පියවර ගැනීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ EIRMC වෙත වාර්තා කරයි.<br>RCD විසින් මාසික පදනමක් මත ණයවල ප්‍රධාන අවදානම් දර්ශක (KRIs) සමාලෝචනය කරන අතර, හඳුනාගත් යම් සෘණාත්මක ප්‍රවණතා ඉක්මන් අවධානය සහ පියවර ගැනීම සඳහා ආයතනික කළමනාකරණය වෙත දැනුම් දෙනු ලබයි.<br>කාර්තුමය වශයෙන්, ණය කළඹ තුළ තත්ත්වය සහ ප්‍රවනතා විස්තර කරන අවදානම් උපකරණ  පුවරු වාර්තා RCD විසින් සමාලෝචනය සහ නිර්දේශ කිරීම සඳහා BIRMC වෙත ඉදිරිපත් කරනු ලබයි. | EIRMC සහ BIRMC රැස්වීම් සම්බන්ධීකරණය සඳහා RCD වගකීමට බැඳී සිටී. කමිටුවේ සලකා බැලීම සහ සාකච්ඡාවන් සඳහා විස්තරාත්මක අවදානම් විශ්ලේෂණයන් සමන්විත කමිටු පත්‍රිකා RCD විසින් සකස් කර ඉදිරිපත් කරන ලදී.<br>පසුගිය මාස 12 තුළ ලබාදෙන ලද පහසුකම් මත පදනම් වී සංක්‍රමික කළඹ නියාමනය RCD විසින් ආරම්භ කරන ලදී. |

## ණය අයකර ගැනීම

සමාගමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙක්ගේ මූලිකත්වයෙන් කැප වූ ණය අයකරගැනීමේ දෙපාර්තමේන්තුවක් ඇති අතර, ඒ යටතේ විශේෂ අයකිරීම් හා නෛතික අයකිරීම් යන මධ්‍යගත ඒකක දෙකක් ක්‍රියාත්මක වේ. සමාගමේ ණය අයකර ගැනීම, ශාඛා මට්ටමින් සහ ප්‍රධාන කාර්යාල මට්ටමින් සිදුවන අඛණ්ඩ සමාලෝචන ක්‍රියාවලියකින් බැඳී පවතී.

කුලී අයකරගැනීම නියාමනය කිරීමට සහ පශ්චාත් ණය ලබාදීමේ අයකිරීම් ගැටලු හඳුනා ගැනීමට ශාඛාවල අයකරගැනීම් නිලධාරීන් ක්‍රියාත්මක වේ. ප්‍රධාන කාර්යාලයේ විශේෂ අයකිරීම් සහ නෛතික අයකිරීම් ඒකක තවදුරටත් හඳුනාගත් අක්‍රීය ණය පහසුකම් සඳහා අයකර ගැනීමේ කාර්යයට පහසුකම් ඇති කරයි. මාස 6 – 9 ට වැඩි අක්‍රීය ණය පහසුකම් සඳහා නීතිමය ක්‍රියාමාර්ගයන් ගැනීම ආරම්භ කෙරේ.

### ක්ෂේත්‍රයට අනුව පීපල්ස් ලිසිං අක්‍රීය ණය අනුපාතය

(%)




* 2020 දෙසැම්බර් මස 31 දිනට 2019/20 අක්‍රීය ණය අනුපාතය

### නිෂ්පාදන අනුව අක්‍රීය ණය අනුපාතය සැසඳීම

(%)




* කුලීපිට ගැණුම් නතර කළ නිෂ්පාදනයකි. 2020 මාර්තු මස 31 දිනට ශුද්ධ කළඹ මිලියන 133ක් පමණක් වූ අතර මුළු ණය කළඹට සාපේක්ෂව එය නොසැලකිය හැකි අගයකි.

# අවදානම් කළමනාකරණය

## හානිකරණ ආවරණ අනුපාතය




## ලාභාලාභ අයකිරීම් අනුපාතය සහ ශුද්ධ කළඹ




■ ශුද්ධ කළඹ** (රු. බිලියන) –o– ලාභාලාභ අයකිරීම් අනුපාතය* (%)

* ලාභාලාභ අයකිරීම් අනුපාතය-(හානිකරණ අයකිරීම+බැහැරහැරි අලාභ+කපාහැරීම්/ශුද්ධ කළඹ)
** හානිකරණයෙන් පසු ශුද්ධ කළඹ

## වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානම යනු වෙළෙඳපොළ පදනම් සාධක නිරාවරණය හේතු කොට ගෙන සමාගමක වටිනාකම හෝ ඉපයීම් පහත වැටීමේ අවදානමයි. මෙම අවදානම යටතේ, සමාගමේ මෙහෙයුම් කෙරෙහි බලපාන උප වර්ගීකරණ හතරක් (04) ඇත. ඒවානම් පහත විස්තර කරන පොළී අනුපාත අවදානම්, වෙළෙඳ ද්‍රව්‍ය මිල අවදානම, ස්කන්ධ ආයෝජන අවදානම සහ විනිමය හුවමාරු අවදානමයි.

| වෙලෙපොල අවදානම් වර්ගය | විස්තරය | සමාගමට අවදානම් නිරාවරණය |
|---|---|---|
| **පොළී අනුපාත අවදානම** | මෙය වෙළෙඳපොළ පොළී අනුපාතවල වෙනස්වීම්වලට, පොළී අනුපාත සංවේදී නිෂ්පාදන වල වටිනාකම උච්චාවචනය වීම හා අනාගත ආදායම් හා වියදම් වෙනස් වීමට ඇති සංවේදීතාවයයි. | ඉහළ |
| **වෙළෙඳ ද්‍රව්‍ය මිල අවදානම** | වෙළෙඳ ද්‍රව්‍යවල මිලගණන් වෙනස්වීම නිසා අනාගත වෙළෙඳපොළ වටිනාකම් සහ අනාගත ආදායමේ අවිනිශ්චිතතාව | පහළ |
| **ස්කන්ධ ආයෝජන අවදානම** | ස්කන්ධ මිල ගණන්වල උච්ඡාවචනය සහ අහිතකර වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි අලාභ | ඉතා සුළු |
| **විනිමය හුවමාරු අනුපාතිකය** | විනිමය හුවමාරු අනුපාත අවදානම, අහිතකර ලෙස හුවමාරු අනුපාත වෙනස්වීමෙන් ඇතිවන අලාභ හා සම්බන්ධ වේ. | ඉතා සුළු |

## පොළී අනුපාත අවදානම

සමාගමේ වත්කම් සහ වගකීම්වලින් බහුතරය පොළී අනුපාත සංවේදී වන බැවින් සමාගම ප්‍රධාන වශයෙන් පොළී අනුපාත අවදානමට නිරාවරණය වේ. භාණ්ඩාගාරය සහ ALCO පොළී අනුපාත අවදානම කළමනාකරණය කර ගැනීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. භාණ්ඩාගාරය නිරතුරුව පොළී අනුපාත පරිසරය සහ සාමාන්‍ය බරතබනලද මූලික ණය දීමේ අනුපාතය (AWPLR) සහ රජයේ සුරැකුම්පත් අනුපාතය වැනි ප්‍රධාන පොළී අනුපාත දර්ශකවල විතැන්වීම නියාමනය කරන අතර ඒ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක්, අපේක්ෂිත ආන්තික සහ ණය දීමේ අනුපාත පවත්වා ගැනීම සඳහා තැන්පතු අනුපාත හා ණය අනුපාත පිළිබඳ තීරණ ගැනීමට ALCO වෙත ලබා දේ.

ALCO විසින් පොළී සංවේදී වත්කම් සහ පොළී සංවේදී වගකීම් මත පදනම් වී සකස් කරන පොළී නැවත මිලකිරීමේ පරතර විශ්ලේෂණ ඒවායේ කල්පිරීම අනුව විවිධ කාලපරාසයන්ට (ඒවා ස්ථාවර අනුපාත නම්) හෝ ඒවායේ ඉදිරියේ නැවත මිලකිරීමේ (ඒවා පාවෙන අනුපාතනම්) මාසිකව සමාලෝචනය කරයි. පොළී අනුපාත තුළ 1% වෙනස සඳහා ශුද්ධ පොළී ආදායම මත බලපෑම තක්සේරු කිරීමට සංවේදිතා විශ්ලේෂණ සිදු කරනු ලැබේ. සමාලෝචිත වසර තුළ, පොළී අනුපාත ප්‍රතිමිලකරණ අනුපාත පරතර විශ්ලේෂණ තුළ එක් එක් කාල පරාසය සඳහා සහ පොළී අනුපාත සංවේදී විශ්ලේෂණ සඳහා ALCO විසින් අවදානම් නිරාවරණ ඵලදායිව තක්සේරු කිරීමට නියාමන සීමා නියම කර ඇත.

පොළී අනුපාත සංවේදිතා සහ ප්‍රතිමිලකරණ පරතර අනුපාත වැනි ප්‍රධාන වෙළෙඳපොල අවදානම් දර්ශක BIRMC විසින් පෙර නිශ්චිත අවදානම් ඉවසීම් සීමා අනුව කාර්තුමය ලෙස සමාලෝචනය කරයි. ශුද්ධ පොළී ආන්තිකය මත බලපෑම පරීක්ෂා කිරීමට පීඩන පරීක්ෂණය කාර්තුමය වශයෙන් කරනු ලබන අතර පොළී අනුපාත විතැන්වීමේ විවිධ පීඩන ක්‍රියාදාම යටතේ ශුද්ධ පොළී ආන්තිකය සහ ලාභ BIRMC විසින් සමාලෝචනය කරනු ලබයි.

පොළී අනුපාත ප්‍රතිමිලකරණ විශ්ලේෂණ 280 සහ 281 පිටුවල ඉදිරිපත් කෙරේ.

## AWPLR විතැන්වීම (සාමාන්‍ය)




## 1 වසරේ TB අනුපාත (සාමාන්‍ය)



## පොළී අනුපාත කම්පන මත NII මත පීඩන පරීක්ෂණ

| NII මත බලපෑම | 2020 | | 2019 | |
|---|---|---|---|---|
| රු. '000 | වැඩිවීම | අඩුවීම | වැඩිවීම | අඩුවීම |
| 1% | **(52,577)** | **52,577** | (53,540) | 53,540 |
| 3% | **(105,154)** | **105,154** | (160,619) | 160,619 |
| 5% | **(157,732)** | **157,732** | (267,698) | 267,698 |

### වෙළෙඳ ද්‍රව්‍ය මිල අවදානම

තනි තනි වෙළෙඳ ද්‍රව්‍යවල මිල ගණන්වල වල වෙනස්වීම් සහ අස්ථාවරත්වයන්ගෙන් මෙම අවදානම ඇති වේ. සමාගම එහි රන් ණය නිෂ්පාදනය හේතු කොට ගෙන වෙළෙඳ ද්‍රව්‍ය මිල අවදානමට මුහුණ දේ. විශේෂිත රන් ණය ඒකකයක්, ශාඛා ජාලය තුළ රන් ණය ඒකක මෙහෙයුම් නියාමනය සහ සම්බන්ධීකරණය කිරීමට කේන්ද්‍රීයව ස්ථාපිත කර ඇත. RCD විසින් දෛනිකව රන් මිල වෙනස්වීම් නියාමනය කරන අතර වඩා පැරණි මිල වෙනස්වීම් මත බර තැබීම අවම කරමින් මෑතකාලීන මිල වෙනස්වීම් මත ඉහළ බරක් තබන අධික බරතබන විතැන්වීම් සාමාන්‍ය (EWMV) මත පදනම් වී රන් මිල වෙනස්වීම් ඇගයීමට ලක් කරයි. ALCO විසින් මාසිකව රන්මිල වෙනස්වීම, මිලේ අස්ථාවරත්වය සහ නිෂ්පාදන කාර්යසාධනය සමාලෝචනය කරයි.

### ස්කන්ධ ආයෝජන අවදානම

මෙය ස්කන්ධ මිල ගණන්වල අස්ථාවරත්වයේ ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් දරන යම් ස්කන්ධ ආයෝජනයක වටිනාකම තුළ අහිතකර වෙනස්වීම් වලින් ඇතිවන අලාභ හා සම්බන්ධ වේ. සමාගමේ ආන්තික වෙළෙඳ දෙපාර්තමේන්තුව කොටස් වෙළෙඳපොළ මිලගණන් වඩා පුළුල් ආර්ථික කොන්දේසි සහ කොටස් මිල කෙරෙහි අනාගත බලපෑමක් තිබිය හැකි දේශපාලන වාතාවරණය තුළ වෙනස්වීම් නිරතුරුව සමාලෝචනය කරයි. අවදානම් අවම කිරීමට සුදුසු පියවර තීරණය කිරීමට විස්තරාත්මක ස්කන්ධ ආයෝජන වාර්තාව මාසිකව සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත විරාම අලාභ ප්‍රතිපත්තිය ස්කන්ධ ආයෝජන අවදානම් නිරාවරණය කළමනාකරණය කර ගැනීමට ක්‍රියාවට නංවා ඇත. එමෙන්ම ALCO විසින් විරාම අලාභ සීමාව ඉක්මවන ස්කන්ධ මත සුදුසු පියවර තීරණය කරන ලදී. ස්කන්ධ කළඹ වසර අවසානයේදී රු. මිලියන 13.5ක් වාර්තා කල අතර සමාගමේ ප්‍රමාණයට සාපේක්ෂව නොවැදගත් වේ.

### විනිමය හුවමාරු අවදානම

ව්‍යවහාර මුදලක් තුළ විවෘත තත්ත්වයක් ඇති කාලසීමාවක් තුළ අහිතකර විනිමය හුවමාරු අනුපාත වෙනස්වීමකින් ඇතිවන අලාභ හා විනිමය හුවමාරු අනුපාත අවදානම සම්බන්ධ වේ. විදේශීය ව්‍යවහාර මුදල් කිසිදු විවෘත තත්ත්වයක් යටතේ තබා නොගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. ඒ අනුව, කිසිදු විදේශීය ව්‍යවහාර මුදලක් වාර්තා කරන වසර තුළ විවෘත තත්ත්වයක් තුළ දරාගෙන නොමැත.

### ද්‍රවශීලතා අවදානම

| පීපල්ස් ලීසිං ණය ශ්‍රේණිගතකරණය |
|---|
| A+ (lka) ෆිච් රේටින් ශ්‍රී ලංකා විසිනි |

සමාගම ගෙවියයුතු මට්ටමට පත්වීම හෝ අධික පිරිවැයක් දරා එසේ කිරීමට සිදුවන අවස්ථාවකදී සමාගමේ බැඳීම් සපුරාලීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම නිසා ද්‍රවශීලතා අවදානම ඇති විය හැකිය. මුදල් ප්‍රවාහයන්ගේ කාලසීමා නොගැලපීම තුළින් මෙම අවදානම ඇති වේ. ඕනෑම වාතාවරණයක් යටතේ කාරක ප්‍රාග්ධනය උත්පාදනය කිරීමට විශ්වාස සහ පහසු මෙහෙයුම් සහතික කිරීමට ද්‍රවශීලතාව ඵලදායීව කළමනාකරණය වැදගත් වේ.

CBSL හි පනත් නියෝගයේ දක්වා ඇති පරිදි, සමාගම විසින් ස්ථාවර තැන්පතු, ඉතුරුම් තැන්පතු. සහ සුරකුම් නොලත් ණය ගැනීම් සම්බන්ධයෙන් ද්‍රවශීල වත්කම් පවත්වා ගැනීම අවශ්‍ය වේ. ALCO විසින් නියම කරන පරාමිති තුළ දෛනික ද්‍රවශීලතා කළමනාකරණය ක්‍රියාත්මක කිරීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. තැන්පතු පදනම අරමුදල් මූලාශ්‍රයක් ලෙස ප්‍රධාන වන අතර, එහි වර්ධනය සමාගමේ ද්‍රවශීලතා අවදානම් නිරාවරණය වැඩි කරනු ලබයි. වාර්තාකරණ වසර පුරා, සමාගම නියාමන අවශ්‍යතාවන්ට ඉහළ ද්‍රවශීල වත්කම් පවත්වා ගෙන ඇත. සමාගම ද්‍රවශීලතා අවදානම අවම කිරීම සඳහා බාහිර මුදල් ප්‍රවාහ බැඳීම් හිඟ බවට පත්වන විට ඒවා ප්‍රතිග්‍රහණය කිරීමට ප්‍රමාණවත් භාවිතා නොකළ පහසුකම් ද පවත්වා ගෙන ඇත. සමාගමේ බැඳීම් සපුරාලීමට ද්‍රවශීලතාව ලබාගැනීම මෙයින් සහතික කරන අතර ද්‍රවශීලතාව තුළ යම් ඌණතාවන්ට සහය වීමට ස්වාරක්ෂකයක් ලෙස කටයුතු කරයි.

භාණ්ඩාගාරය විසින් සමාගම දැනුවත් කිරීම සඳහා ද්‍රවශීල වත්කම් කළමනාකරණය, මුදල් ප්‍රවාහ පුරෝකථන, ණයවල කල්පිරීම් විශ්ලේෂණ පිළිබඳ තොරතුරු ALCO වෙත වාර්තා කරයි. කල්පිරීම් නොගැලපීම් විශ්ලේෂණ, ද්‍රවශීල වත්කම් අනුපාතය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය වැනි ද්‍රවශීලතා අවදානම් දර්ශක පිළිබඳව ALCO විසින් එහි රැස්වීම්වලදී මාසිකව සමාලෝචනය කරයි. වාර්තාකරණ වසර තුළ, ALCO විසින් කල්පිරීම් විශ්ලේෂණයේ එක් එක් කාල පරාසයන් සඳහා ඒවා ඵලදායීව මාසික රැස්වීම්වලදී සමාලෝචනය කිරීමට සීමා නියම කරන ලදී.

කල්පිරීම් විශ්ලේෂණ 275 පිටුවේ ඉදිරිපත් කෙරේ.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමේදී ස්ථාවර අරමුදල් මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව ALCO විසින් අවධාරණය කරන ලදී. අරමුදල් පිළිබඳ විකල්ප මූලාශ්‍රයක් ලෙස විදේශීය වාර ණය සොයා බැලීමට කමිටුව තවදුරටත් නිර්දේශ කරන ලදී. ALCO අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර ද්‍රවශීලතා අවදානම් සීමා කිරීමට හෝ අවම කිරීමට සහ කළමනාකරණය කර ගැනීමට අවශ්‍යයැයි කල්පනා කරන සුදුසු පියවර නිර්දේශ කරයි.

පීඩන පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල කාර්තුමය පදනමක් මත BIRMC වෙත වාර්තා කරයි. වාර්තාකරණ වසර තුළ, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය මත දැනට පවත්නා අනුමත ප්‍රතිපත්ති සමාලෝචනය කරන ලදී.

කොවිඩ්-19 පැතිරීම හේතුකොට ගෙන, තැන්පතුකරුවන් විසින් හදිසියේ මුදල් ඉවත්කරගැනීම සහ ණය වාරික ආපසු ගෙවීමේ ප්‍රමාදය නිසා වියහැකි පීඩනය අවම කිරීමේ අදහස ඇතිව බලපත්‍රලාභී මූල්‍ය ආයතන සඳහා ද්‍රවශීල වත්කම් පවත්වා ගැනීමේ නියාමන අවශ්‍යතාව CBSL විසින් සැහැල්ලු කරන ලදී. ඒ අනුව, කාලීන තැන්පතු, ඉතුරුම් තැන්පතු සහ සුරකුම් නොලත් ණය ගැනීම් පිළිබඳ ද්‍රවශීල වත්කම් අවශ්‍යතාව පිළිවෙළින් 6%, 10% සහ 5% දක්වා අඩුකරන ලදී. සමාගම වර්තමානයේ අවශ්‍යතා ඇතිවුවහොත් අරමුදල් කරා ක්ෂණික පිවිසීම ඇති බව සහතික කරගනිමින් පහසු මට්ටමේ ද්‍රවශීල වත්කම් පවත්වා ගනී.

### ද්‍රවශීලතා වත්කම් හා ද්‍රවශීල වත්කම් අනුපාතය




* ද්‍රවශීල වත්කම් අනුපාතය : පවතින ද්‍රවශීල වත්කම්/CBSL පනත් නියෝගය අනුව අවශ්‍ය ද්‍රවශීල වත්කම්.

# අවදානම් කළමනාකරණය

## අරමුදල් විවිධාංගීකරණය




## ද්‍රවශීල වත්කම් පීඩන පරීක්ෂණය

### තැන්පතු ඉක්මණින් ඉවත්කර ගැනීම

| ක්‍රියාදාමය | 1 % | 2 % | 3 % |
|---|---|---|---|
| කම්පනයේ විශාලනය | 10 | 15 | 20 |
| ද්‍රවශීල වත්කම් අනුපාතය* | 31.63 | (13.64) | (63.54) |
| ද්‍රවශීල වත්කම් අනුපාතය* – අසම්භාව්‍ය අරමුදල් ගැලපීමෙන් පසු | 194.81 | 157.51 | 116.38 |

* ද්‍රවශීල වත්කම් අනුපාතය : පවත්වාගෙන යන ද්‍රවශීල වත්කම්/CBSL පනත් නියෝගය අනුව අවශ්‍ය ද්‍රවශීල වත්කම්

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

2018 දී, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා රාමුවක් CBSL විසින් හඳුන්වාදෙන ලදී. මෙම රාමුව තුළින්, බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව විසින් නියම කරන ලද පිළිවෙළින් සම්මතකරණ ප්‍රවේශය සහ මූලික දර්ශක ප්‍රවේශය මත පදනම් වී ණය අවදානම සහ මෙහෙයුම් අවදානම සඳහා බරතබන ලද වත්කම් ගණනය කිරීම අවශ්‍ය වේ.

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව




## අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා

| ප්‍රාග්ධන සංරචකය | 01.07.2018 | 01.07.2019 | 01.07.2020 | 01.07.2021 |
|---|---|---|---|---|
| පළමු පෙළ ප්‍රාග්ධනය | 6.00% | 7.00% | 8.00% | 10.00% |
| මුළු ප්‍රාග්ධනය | 10.00% | 11.00% | 12.00% | 14.00% |

ALCO විසින්, නියාමන අවශ්‍යතා වැඩි කිරීමට සමගාමීව සමාගමේ අනුකූලතා තත්ත්වය පරීක්ෂා කිරීමට ඉදිරි මූල්‍ය වසර තුන සඳහා පුරෝකථන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත සමාලෝචනය කරන ලදී. සමාගම පහසු මට්ටමක පවතින අතර පුරෝකථන අනුපාත අවම නියාමන අවශ්‍යතාවන්ට වඩා ඉහළින් පවතී. මෙය ALCO විසින් එහි මාසික රැස්වීමේදී සමාලෝචනය කරයි.

2019 ජූලි මස නිකුත් කරන ලද සමාගමේ කොටස්කර ලාභාංශ සමාගමේ ප්‍රාග්ධනය වැඩි කිරීමට හේතු විය. වසර පුරාම සමාගම පහසුවෙන්ම එහි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව නියාමන අවශ්‍යතාවන්ට ඉහළින් පවත්වා ගනු ලැබීය.

කොවිඩ්-19 තත්ත්වය සහ එහි බලපෑම් සලකා බැලීමේදී, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතා මත CBSL විසින් සැහැල්ලු ක්‍රියාමාර්ග තීරණය කරන ලදී. ඒ අනුව, 2020 ජූලි මස 1 සහ 2021 ජූලි මස 1 දිනට තිබිය යුතු ප්‍රාග්ධනය වැඩි කිරීමේ අවශ්‍යතාව පිළිවෙළින් 2021 ජූලි මස 1 සහ 2022 ජූලි මස 1 දක්වා එක් වසරක කාලසීමාවක් සඳහා තවදුරටත් කල් දමන ලදී.

එමෙන්ම, CBSL විසින් අවම මධ්‍ය ප්‍රාග්ධන අවශ්‍යතාවයකට අනුකූලවීමට එක් වසරක දීර්ඝ කිරීමක් ලබා දෙන ලදී. ඒ අනුව, පිළිවෙළින් රු. බිලියන 2 සහ රු. බිලියන 2.5 දක්වා ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා දැනට නියම කරන ලද 2020 ජනවාරි මස 1 සහ 2021 ජනවාරි මස 1 හි කාලසීමා 2020 දෙසැම්බර් මස 31 සහ 2021 දෙසැම්බර් මස 31 දක්වා දීර්ඝ කරනු ලැබේ. කෙසේවෙතත්, සමාගමේ ප්‍රාග්ධනය ඉහත සීමාවට වඩා ඉහළ බැවින් පීපල්ස් ලීසිං කෙරෙහි මෙම අවශ්‍යතාව හා සමබන්ධතාවක් නොමැත.

## මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම අප්‍රමාණවත් සහ නුසුදුසු අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති සහ සේවකයින්ගෙන් හෝ බාහිර සිදුවීම් හේතු කොට ගෙන ඇති වේ. එය සියලුම ව්‍යාපාරවලට ආවේණික වන අතර, සමාගමේ පරමාර්ථය වන්නේ පිරිවැය, ඵලදායී ආකාරයකින් අවදානම අවම කර ගැනීමයි. අවදානම් ඵලදායීව හඳුනාගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා, මෙහෙයුම් අවදානම යටතේ වංචා අවදානම, ICT සම්බන්ධ අවදානම් සහ මානව සම්පත් අවදානම් වැනි උප වර්ගීකරණ හඳුනාගෙන ඇති අතර ඒවා පහත විස්තර කරනු ලැබේ.



# අවදානම් කළමනාකරණය



සමාගම පැහැදිලිව ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, විධිමත් අවදානම් තක්සේරු කිරීම් සහ පාලන ක්‍රියාමාර්ග තුළින් මෙහෙයුම් අවදානම කළමනාකරණය කරයි. KRIs සහ විගණන සොයා ගැනීම් වැනි මෙවලම් මෙහෙයුම් අවදානම් හඳුනාගෙන ඇගයීම සඳහා භාවිතා කෙරේ.

සමාගමේ මෙහෙයුම් අවදානම අවම කිරීමේ වැඩපිළිවෙළට ශක්තිමත් අභ්‍යන්තර පාලන රාමුවක් සකස් කිරීම, තොරතුරු සහ පද්ධති ආරක්ෂාව, රක්ෂණ ආවරණය, ව්‍යාපාර කටයුතු බාහිරින් කරගැනීමට අදාළ ක්‍රියාපටිපාටි, විස්තරාත්මක ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP) සහ ආපදා පිළියම් සැලැස්ම (DRP), අවදානම් දැනුවත් සංස්කෘතියක් නිර්මාණය, මෙහෙයුම් අවදානම නියාමනය සහ වාර්තාකිරීම ඇතුළත්ය.

## අභ්‍යන්තර පාලන රාමුව

සමාගම රාජකාරි, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල මනාව නියම කළ බෙදා වෙන්කිරීම සහිත ශක්තිමත් පාලනයක් ස්ථාපිත කර ඇත. මෙම අභ්‍යන්තර පාලනයට කාර්ය සංග්‍රහය සහ උපයෝග පාලනය ඇතුළත් වන අතර, ඒ තුළින් රාජකාරි බෙදාහැරීම සහතික කරමින් නියමිත ක්‍රියාපටිපාටි පිළිපැදීම සහතික කරයි. වඩා ඉහළ මට්ටම දක්වා මෙහෙයුම් ගැටලු ගෙනයාම සඳහා අධිකාරී මට්ටම් ස්ථාපිත කර ඇත. ගෙවීම් අනුමැතිය ඇතුළුව සමාගමේ සියලුම කාර්යයන් සඳහා බලතල සහ අනුමත සීමා ක්‍රියාත්මක වන අතර, මේ මගින් සේවකයින්ට ඔවුන්ගේ කාර්යයන් සඳහා වගවීම පහසු කරයි. සියලුම ප්‍රධාන කාර්යයන් වෙනත් සුදුසු දක්ෂ සහ බලය සහිත සේවකයෙකුගේ පරීක්ෂාවට යටත් වේ. අභ්‍යන්තර විගණක, වංචා සිදුවේයයි සැකසහිත ක්ෂේත්‍රවල නිරන්තර පදනමක් මත විගණන පවත්වනු ලබයි.

## තොරතුරු පද්ධති ආරක්ෂාව

සමාගම මනාව ස්ථාපිත IT අවදානම් කළමනාකරණ රාමුවක් පවත්වා ගනී. හඳුනාගත් අවදානම් සඳහා විස්තරාත්මක IT ප්‍රතිපත්ති සකස් කර ඇති අතර වාර්ෂිකව යාවත්කාලීන කෙරේ. සමාගම ISO 27001:2013 ප්‍රමිතියට අනුකූලව එහි IT ක්‍රියාවලි පවත්වා ගන්නා අතර විගණනයකින් පසු එම සහතික කිරීම සෑම වසර 3ක් සඳහා අළුත් කරනු ලබයි. සමාගමේ පරිගණක පද්ධතියට ද්වේශ සහගත පිවිසීම ලබා ගැනීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වෙනම උවදුරු ඇගයීමේ සහ විනිවිදයාම පරීක්ෂාවක් ද (VAPT) ISO/IEC 27001:2013 ට අනුකූලව පවත්වන ලබන අතර එහි සොයා ගැනීම් මත පදනම් වී හඳුනාගත් යම් අඩුපාඩු නිවැරදි කරනු ලබයි.

ආපදා පිළියම් වැඩභූමිය සහ වෙනත් පහසුකම් එකී ප්‍රමිතිවලට අනුකූලව පවත්වා ගන්නා අතර ඒ සම්බන්ධ විගණනය බාහිර විගණකවරු (DNV) විසින් සිදු කරනු ලබයි. ආපදා පිළියම් ප්‍රතිගුණය දිනකට දෙවරක් (පෙ.ව.8.00 – පෙ.ව.8.30) සහ සෑම දින දෙකකට වරක් (ප.ව.3.00 සහ ප.ව.3.30) පවත්වනු ලැබේ.

ICT දෙපාර්තමේන්තුව නිරතුරුව දත්ත සම්බන්ධතා සහ ඒවායේ බිඳවැටීම් නියාමනය කරන අතර, යම් බිඳවැටීමක් ඇත්නම්, සුදුසු පියවර ගැනීම සඳහා ඒ පිළිබඳ කඩිනමින් සන්නිවේදන සපයන්නා වෙත වාර්තා කෙරේ. පද්ධති දෝෂ, සයිබර් ප්‍රහාර, දත්ත සම්බන්ධතා බිඳවැටීම්, සජීවි දත්ත පදනම්වල DR අඩවි අනුරූකරණයේ තත්ත්වය වැනි තොරතුරු තාක්ෂණ අවදානම් සිදුවීම් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත ඔවුන්ගේ සමාලෝචනය සඳහා කාර්තුමය වශයෙන් වාර්තා කරනු ලබයි.

## මානව සම්පත් අදාළ අවදානම්

සමාගම ප්‍රදාන ලබාදීමෙන් සහ පිළිගනිමින් ක්‍රමෝපායික අරමුණු අත්කර ගැනීමේදී අවශ්‍ය වන හැකියාවන් සහ කැපකිරීම් සහිත සේවකයින් ආකර්ෂණය කර, සංවර්ධනය කර රඳවා ගනු ලබයි. පුහුණු අවශ්‍යතා විධිමත්ව හඳුනා ගන්නා අතර ඉහළ ප්‍රමිතියේ සදාචාර සහ අවංකකම ඇතුළුව දැනුවත් කිරීම සඳහා අවධානිත පුහුණු පවත්වනු ලබයි. කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට ඕනෑම අවස්ථාවල ඔවුන්ගේ සේවයට අදාළ කරුණු සාකච්ඡා කිරීමට හෝ ඔවුන්ගේ මැසිවිලි ආමන්ත්‍රණය කිරීමට ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හමුවීමට නිදහස ඇත.

කළමනාකරණය විසින් විෂමාචාර අධෛර්යමත් කිරීමේ උත්සාහයක් ලෙස කාර්ය මණ්ඩලය වටමාරු කිරීමට සුදුසු පියවර ගනී. වංචාවක් සොයාගත් අවස්ථාවකදී, ක්ෂණික පිළියම් විනය ක්‍රියාමාර්ගයක් ශූන්‍ය ඉවසුම් ස්ථාවරය සමඟ අරගනී. තොරතුරු දැනුම් දීමේ සම්බන්ධය (whistleblower link) තුළින් වංචා සහ විෂමාචාරය සම්බන්ධ අදහස් වාර්තා කිරීමට සේවකයින් දිරි ගන්වනු ලබයි. මෙම සම්බන්ධතාවය පීපල්ස් ලීසිං අභ්‍යන්තර ජාලයට ඇතුළත් කර ඇති අතර තොරතුරු දැනුම් දෙන පුද්ගලයාගේ නිර්ණාමික බව සහතික කරනු ලබයි.

පීපල්ස් ලීසිං සේවක සම්බන්ධතා මෙහෙයුම් අවදානමේ කොටසක් ලෙස සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව තුළ වැදගත්කම හඳුනාගෙන ඇත. සේවයට අදාළ අනතුරු අවම කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂිත ක්‍රියාමාර්ග සමාගම ස්ථාපිත කර ඇත. කොවිඩ්-19 පැතිරීම නිසා සංචරණ සීමා කාලසීමාව තුළ අත්‍යවශ්‍ය සේවාවක් ලෙස සමාගමේ මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමේදී, කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සලකා බලමින් හැකි සෑම අවස්ථාවකදීම නිවසේ සිට වැඩකිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාවට නංවන ලදී. විද්‍යුත් ලිපි සහ පීපල්ස් ලීසිං අභ්‍යන්තර ජාලය තුළින්, සෞඛ්‍යය බලධාරීන් විසින් දෙන ලද උපදෙස්වලට අනුකූලව සේවකයින් විසින් පිළිපැදිය යුතු ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සිදුකරන ලදී. සෞඛ්‍යය බලධාරීන් විසින් නිර්දේශ කරන ලද ආරක්ෂක ක්‍රියාමාර්ග කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සේවා පරිශ්‍රයේ දී ක්‍රියාත්මක කරන ලදී.

## රක්ෂණ වැඩපිළිවෙළ

පීපල්ස් ලීසිං සතුව දේපල, ගෘහභාණ්ඩ සහ සවිකිරීම්, ස්ථාවර වත්කම්, මුදල්, විද්‍යුත් උපකරණ යනාදිය පිළිබඳ අවදානම් ආවරණය කිරීමට පරිපූර්ණ රක්ෂණ ඔප්පු පවතී. මෙම ඔප්පු කාලීනව අලුත් කරනු ලබන අතර සක්‍රීය මට්ටමේ පවත්වා ගනී.

## ව්‍යාපාර කටයුතු බාහිරින් ලබා ගැනීම

CBSL විසින් නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලව ව්‍යාපාර මෙහෙයුම් පිළිබඳ බාහිරින් ලබා ගැනීම පිළිබඳ විස්තරාත්මක ප්‍රතිපත්තියක් සමාගම සකස් කර ඇත. මෙම ප්‍රතිපත්තියේ බාහිරින් ලබාගන්නා සේවා සඳහා හඳුනාගත් සේවා ප්‍රධාන වශයෙන් දක්වා ඇති අතර එයට බාහිරින් ලබාගන්නා සේවා, බාහිර සේවා ලබාගත නොහැකි සේවා, බාහිර සේවා සපයන්නන් හඳුනාගැනීමේ ක්‍රියාපටිපාටිය සහ ඔවුන්ගේ කාර්යභාරයන් සහ වගකීම් ඇතුළත්ය. මෙම ප්‍රතිපත්තියට අනුව, බාහිරින් ලබාගන්නා වැඩපිළිවෙල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. අනුකූලතා දෙපාර්තමේන්තුව වාර්ෂිකව බාහිරින් ලබාගන්නා සේවාවන් ලැයිස්තුවක් CBSL වෙත දැනුම් දෙනු ලබයි.

## ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය

පීපල්ස් ලීසිං වෙත මෙම විෂය පිළිබඳ ලෝකයේ ඉහළම ආයතනවලින් එකක් වන එක්සත් ජනපදයේ ආපදා පිළියම් ආයතන ජාත්‍යන්තරය විසින් නියම කළ වෘත්තිය ව්‍යවහාරවලට අනුකූලව සෝමරත්න කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (SCL) හි උපදේශකත්වයෙන් සංවර්ධනය කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් (BCP) ඇත.

ආපදා අවස්ථාවක් සඳහා නිවැරදිව සූදානම් වීම ස්ථාපිත කිරීමට අවශ්‍යවන සැලසුම් රාශියක් BCP හි ඇතුළත් වන අතර BCP කළමනාකරණ BCPM කණ්ඩායම සහ ඔවුන්ගේ විශේෂිත රාජකාරි සහ වගකීම් විස්තර කරයි.

BCPM කණ්ඩායම ආයතනික කළමනාකරණය, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සාමාජිකත්වයෙන් සහ BCPහි සම්බන්ධිකාරකවරුන්ගෙන් සමන්විත වේ. කොවිඩ්-19 පැතිරීම හේතු කොට ගෙන සංචරණ සීමා ක්‍රියාදාමය මත පදනම් වී සමාගම තුළ සූදානම් වීම පිළිබඳ සාකච්ඡා කර තීරණ ගැනීම සඳහා රට තුළ සංචරණ සීමා කිරීමට පෙර 2020 මාර්තු මස මුලදී මෙම කණ්ඩායම මුණ ගැසුණි.

# අවදානම් කළමනාකරණය

කොවිඩ්-19 වසංගතය පැතිරීමේ ක්‍රියාදාමය සඳහා මෙහෙයුම් සැලසුම් සකස් කිරීමට දනට පවත්නා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP) ප්‍රයෝජනවත් විය. මෙම රැස්වීමේදී සලකා බලන ලද ප්‍රධාන කාර්යයන් වූයේ ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි සහ සේවා ප්‍රමුඛතාකරණය, නිවසේ සිට වැඩකිරීමේ වැඩපිළිවෙළ, සේවා පරිශ්‍රයන් හි ආරක්ෂක වැඩපිළිවෙළ සහ අර්බුද සන්නිවේදනය යන ආදියයි.

## මෙහෙයුම් අවදානම සමාලෝචනය

ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශකවල තත්ත්වය අවදානම් ඉවසුම් සීමාවලට අනුව ඒවා සමාලෝචනය කිරීම සඳහා කාර්තුමය වශයෙන් BIRMC වෙත වාර්තා කෙරේ. අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මතාව, ශාඛා සහ ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තු මත කෙරෙන අභ්‍යන්තර විගණන මගින් විශ්ලේෂණය කරයි. විගණන වාර්තා මත පදනම් වී, RCD විසින් මෙහෙයුම් අවදානම් අවස්ථා හඳුනාගනු ලබන අතර ඒ සම්බන්ධව සකස්කළ සාරාංශ වාර්තාව අවශ්‍ය සාකච්ඡා කිරීම සහ තීරණ ගැනීම සඳහා කාර්තුමය වශයෙන් EIRMC වෙත ඉදිරිපත් කරයි.

## අනුකූලතාව සහ නියාමන අවදානම්

සමාගමට අදාළ වන යම් නීති හෝ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීමට අසමත්වීම හේතු කොට ගෙන අනුකූලතා අවදානම ඇතිවිය හැකිය. ව්‍යාපාර මෙහෙයුම තුළ සියලුම ක්ෂේත්‍රවල අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්ති සමඟ සමාගමේ අනුකූලතාව, අනුකූලතා නිලධාරී විසින් කලින් කල නියාමනය කරන අතර අනුකූලතා තත්ත්වය පිළිබඳ තහවුරු කිරීම් කාර්තුමය පදනමක් මත අදාළ දෙපාර්තමේන්තුවෙන් ලබාගනී. අනුකූලතා නිලධාරී නිරන්තරව සමාගම සඳහා අදාළ වන නීති, රෙගුලාසි, නිකුත් කළ නව උපදෙස්, නියමයන් සහ නියාමන මාර්ගෝපදේශවලට සමාග මේ අනුකූලතාව ඇගයීමට ලක් කරන අතර ඒ පිළිබඳ තත්ත්වය අවශ්‍ය සාකච්ඡා කිරීම සඳහා කාර්තුමය වශයෙන් BIRMC වෙත වාර්තාවක් ඉදිරිපත් කරයි.

අනුකූලතා නිලධාරී රෙගුලාසිවල වෙනස් වීම් සමාලෝචනය කරන අතර සමාගම නියාමන අවශ්‍යතා සමඟ අනුකූලව සිටින බව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගනියි. සම්පූර්ණයෙන් අනුකූල ආයතනික පාලනය සහ අවදානම් අවම කිරීමේ සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව වාර්තාකරණය හා සියලුම අත්‍යවශ්‍ය වාර්තාකරණ අවශ්‍යතාවයන් නියාමනය කිරීම සඳහා යහපත් නියාමන යාන්ත්‍රණයක් යොදාගෙන ඇත. තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග ලබාදෙමින්, අභ්‍යන්තර විගණනය වාර්ෂිකව අනුකූලතා විගණනය පවත්වන අතර එහි වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරයි.

අනුකූලතා කාර්යය පිළිබඳ විස්තරාත්මක වාර්තාව 75 සහ 76 යන පිටුවල දක්වේ.

## නීතිමය අවදානම

නීතිමය අවදානම වැරදියට කෙටුම්පත්කළ ගිවිසුම් හෝ ලියවිලි, ලිඛිත ගිවිසුම් නොමැතිකම හෝ ප්‍රමාණවත් නොවන ගිවිසුම් හේතු කොට ගෙන ගිවිසුම් හෝ ලියවිලි බලාත්මක කිරීමට නොහැකිවීම නිසා ඇතිවන අවදානම ලෙස දක්විය හැක. නීතිමය අවදානම සමාගමේ නීති දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරන අතර, ඒ මගින් අදාළ රෙගුලාසි ගනුදෙනුකරුවන් සමඟ සියලුම සම්බන්ධතා සහ ගිවිසුම්වලදී සම්පූර්ණයෙන්ම සැලකිල්ලට ගනු ලබන බව සහතික කරයි. නීති දෙපාර්තමේන්තුව ඇප ලේඛනගතකිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ නෛතික ගැටලු සහ කරුණු මෙහෙයවිය හැකි පළපුරුදු නීතිඥවරුන්ගෙන් සමන්විත වේ. අවශ්‍ය තෙවැනි පාර්ශ්වවල උපදෙස් අවශ්‍ය අවස්ථාවලදී ලබාගෙන නීතිමය අවදානමට නිරාවරණය අවම කරගැනීම සිදුකරනු ලබයි.

## ක්‍රමෝපායික අවදානම

අහිතකර ව්‍යාපාරික තීරණ, තීරණ අවිධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාර පරිසරිය තුළ සිදුවන වෙනස්වීම්වලට අඩු ප්‍රතිචාරාත්මක බව තුළින් ක්‍රමෝපායික අවදානම ඇති වේ. ඵලදායී ක්‍රියාත්මක කිරීම සමඟ නිවැරදි ක්‍රමෝපාය තෝරා ගැනීම ක්‍රමෝපායික පරමාර්ථ අත්කර ගැනීමේදී පූර්ව අවශ්‍යතාවක් බව පීපල්ස් ලීසිං විශ්වාස කරයි.

ක්‍රමෝපායික අරමුණු අත්කර ගැනීමට ක්‍රමෝපායික උපාය යෙදවීම සඳහා ක්‍රමෝපායික සැලසුම්කරණ සැසිය වාර්ෂිකව පවත්වනු ලැබුවෙමු. ඒ අනුව තීරණය කරන අයවැය සහ කාර්යය සැලසුම් වසර තුනක ක්‍රමෝපායික සැලැස්ම තුළ ලේඛනගත කළ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු යොදා ගන්නා ලදී.

අයවැය සහ කාර්යය සැලසුම් අත්කර ගැනීම ඒ සම්බන්ධ කළමනාකාරීත්වයේ යාවත්කාලීන කිරීම සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී සමාලෝචනය කරනු ලබයි. එමෙන්ම, පරිපාලිත සමාගම්වල ඵලදායිත්වය සහ කාර්යසාධනය ද විවිධාංගීකරණයේ ක්‍රමෝපායික අවදානම් අවම කිරීම සඳහා තක්සේරු කරනු ලැබේ.

## කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යනු සමාගමේ ඉපයීම්, වත්කම් සහ වගකීම් සහ සන්නාම නාමයට අහිතකර ලෙස බලපෑ හැකි සිදුවීමක් හෝ සිද්ධියකි. අවදානම් අතර අන්‍යෝන්‍ය රඳාපැවැත්ම කීර්තිනාම අවදානම වශයෙන් සහ එය ණය, වෙළෙඳපොල සහ මෙහෙයුම් අවදානම් වැනි අනෙකුත් අවදානම් රාශියක් මගින් ක්‍රියාත්මක වන බව සමාගම අවබෝධ කරගෙන සිටියි.

කීර්තිනාම අවදානම සඳහා විෂය පථය සමාජ මාධ්‍ය භාවිතය සමඟ පුළුල් වී ඇත. සමාගමේ කීර්තිනාම අවදානම ණය, වෙළෙඳපොල සහ මෙහෙයුම් අවදානම වැනි ප්‍රධාන අවදානම් ඵලදායි අයුරින් කළමනාකරණය තුළින් පුළුල්ව පාලනය කරයි.

ආයතනික පාලන ක්‍රියාවලිය අනුව, සන්නිවේදන ප්‍රතිපත්ති, චර්යා සහ සදාචාර සංග්‍රහය ක්‍රියාත්මක කර ඇති අතර, ඒවා යම් අත්හැරීම් නොමැතිව සියලුම සේවකයින් විසින් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආයතනික ක්‍රමෝපායේ කොටසක් ලෙස, ආයතනික සමාජීය වගකීම්සහගත (CSR) වැඩසටහන්වල සමාගම ඵලදායි ව සම්බන්ධ වේ. සදාචාර ව්‍යාපාරික කටයුතු සහ දේශීය ප්‍රජාව සහ පරිසරය කෙරෙහි බැඳීම මෙහෙයුම්වල අවශ්‍යම කොටසකි. එමෙන්ම සමාගම අඛණ්ඩ ප්‍රවර්ධන කටයුතු තුළින් එහි සන්නාම ස්වශක්තතාව වර්ධනය කර ගැනීමට සමාජ මාධ්‍ය අවකාශ ඇතුළුව එහි මාධ්‍ය පැවැත්ම පවත්වා ගනී.

සමාගම විසින් ගනුදෙනුකාර පැමිණිලි සහ මැසිවිලි මෙහෙයවන ප්‍රතිපත්තියක් සහ ක්‍රියාපටිපාටියක් යොදාගෙන ඇත. ප්‍රධාන කාර්යාලයේ මධ්‍යම අලෙවිකරණ ඒකකය නිරන්තර පදනමක් මත ගනුදෙනුකාර පැමිණිලි නියාමනය කරයි.

## සමූහ අවදානම

සමූහ අවදානම එහි පරිපාලිත සමාගම් හය තුළින් පිපල්ස් ලීසිං විසින් දරන ලද අලාභය (මූල්‍ය හෝ මූල්‍ය නොවන) හා සම්බන්ධ වේ. BIRMC විසින් එහි පරිපාලිත සමාගම්වල අවදානම් උපකරණ පුවරු වාර්තා සහ අවදානම් දර්ශක වාර්තා තුළින් සමූහයේ අවදානම් සමාලෝචනය කරයි. එක් එක් පරිපාලිත සමාගමෙන් නියෝජිතයින් කාර්තුමය පදනමක් මත පවත්වනු ලබන BIRMC රැස්වීම්වලට සහභාගි වෙති.

# අවදානම් කළමනාකරණය



| සමාගම | සම්බන්ධතාව | ව්‍යාපාර මෙහෙයුම් | BIRMC වෙත ඉදිරිපත් කරන වාර්තා | වාර්තාකරණ කාලය |
|---|---|---|---|---|
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. (PI) | පරිපාලිත | ජීවිත නොවන (පොදු) රක්ෂණ | අවදානම් උපකරණ පුවරු වාර්තාව සහ සැසඳීම් වාර්තාව | කාර්තුමය |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් (PLFML) | සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගම | මෙහෙයුම් කල්බදු, තක්සේරු සේවා, රථවාහන සේවා පහසුකම්, රථවාහන කුලියට දීමේ ඒකකය, ෆ්ලීට් මැනේජ්මන්ට ඒකකය වැනි මෙහෙයුම් | කාර්තුමය සැසඳීම් සමඟ අවදානම් උපකරණ පුවරු වාර්තාව | කාර්තුමය |
| පීපල්ස් මයික්‍රො – කොමර්ස් ලිමිටඩ් (PML) | සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගම | වරප්‍රසාද නොලත් ග්‍රාමීය සහ නාගරික ජනතාව වෙත ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාදීම සහ කුලී පිට ගැණුම් පහසුකම් ලබාදිම | අවදානම් උපකරණ පුවරු වාර්තාව සහ සැසඳීම් වාර්තාව | කාර්තුමය |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් (PLPDL) | සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගම | දේපල සංවර්ධනය | කාර්තුමය සැසඳීම් සමඟ අවදානම් දර්ශක වාර්තාව | කාර්තුමය |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් (PLHPL) | සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගම | දේපල සංවර්ධනය | කාර්තුමය සැසඳීම් සමඟ අවදානම් දර්ශක වාර්තාව | කාර්තුමය |
| ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (LAFL) | පරිපාලිත | බංගලාදේශයේ මූල්‍ය ව්‍යාපාර | අවදානම් උපකරණ පුවරු වාර්තාව සහ සැසඳීම් වාර්තාව | කාර්තුමය |

## ප්‍රධාන අවදානම් වර්ග

| පරිපාලිත සමාගම | ණය | සංකේන්ද්‍රණ | වෙළෙඳපොල | ද්‍රවශීලතාව | මෙහෙයුම් | අනුකූලතා | ක්‍රමෝපායික | ප්‍රාරක්ෂණ |
|---|---|---|---|---|---|---|---|---|
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. (PI) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් (PLFML) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | – |
| පීපල්ස් මයික්‍රො – කොමර්ස් ලිමිටඩ් (PML) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | – |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් (PLPDL) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | – |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් (PLHPL) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | – |
| ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (LAFL) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | – |

එක් එක් පරිපාලිත සමාගමේ අවදානම් පැතිකඩ වෙනස් වන්නේ එකිනෙකට වෙනස් ව්‍යාපාර ආදර්ශ සමඟ වෙනස් ක්ෂේත්‍රවල ඔවුන් මෙහෙයවෙන බැවින්ය. එම නිසා, අවදානම් වෙන වෙනම තක්සේරු කර අවම කළ යුතුය. පීපල්ස් ඉන්ෂුවරන්ස් පීපල්ස් ලීසිං හි විශාලතම පරිපාලිත සමාගම වන අතර එය ශ්‍රී ලංකාවේ රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියාමනය කරයි.

පීපල්ස් ලීසිං හි ප්‍රධාන විධායක නිලධාරී සියලුම පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය තුළ පිපල්ස් ලීසිං නියෝජනය කරයි. මෙය පරිපාලිත සමාගම්වල මෙහෙයුම් සහ අවදානම් පැතිකඩ පිළිබඳ සම්පූර්ණ සහ ප්‍රමාණවත් දැනුම සහතික කරයි. සියලූම අන්තර් සමාගම් ගනුදෙනු අතේ දුරින් කරගෙන යනු ලබයි. පීපල්ස් ලීසිං හිමිකාර සමාගම වන අතර විශාලතම ශේෂ පත්‍රයට හිමිකම් කියයි. එනම් එය සමූහයේ මුළු වත්කම් සහ වගකීම්වලින් 90%ට වැඩිය.

සමූහ අවදානම අවම කිරීමේදී ව්‍යාපාර මෙහෙයුම් පරිසරය තුළ, මූල්‍ය, රක්ෂණය, මයික්‍රො ෆිනෑන්ස්, සහ දේපල සංවර්ධන කර්මාන්තවල වෙනස්වීම් පිළිබඳ එහි දැනුවත් කම පීපල්ස් ලිසිං සහතික කරයි.

# මූල්‍ය වාර්තා

140 මූල්‍ය දින දර්ශනය
141 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
142 ස්වාධීන සහතික කිරීමේ වාර්තාව
143 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
144 ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීම් ප්‍රකාශය
145 ස්වාධීන විගණකගේ වාර්තාව
148 මූල්‍ය ප්‍රකාශන - පටුන
149 ලාභ හෝ අලාභ ප්‍රකාශනය
150 විස්තීරණ ආදායම් ප්‍රකාශනය
151 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
152 ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය
154 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
155 මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

# මූල්‍ය දින දර්ශනය

| | | 2019/20 | 2020/21 |
|---|---|---|---|
| අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම | ජූනි මස 30න් අවසන් වූ 1 වන කාර්තුව | **2019 ජූලි මස 31** | 2020 අගෝස්තු මස 15 ට පෙර |
| | සැප්තැම්බර් මස 30න් අවසන් වූ/අවසන් වන 2වන කාර්තුව | **2019 ඔක්තෝබර් මස 25** | 2020 නොවැම්බර් මස 15 ට පෙර |
| | දෙසැම්බර් මස 31න් අවසන් වූ/අවසන් වන 3වන කාර්තුව | **2020 පෙබරවාරි මස 20** | 2021 පෙබරවාරි මස 15 ට පෙර |
| | මාර්තු මස 31න් අවසන් වූ/අවසන් වන 4වන කාර්තුව | **2020 ජූනි මස 25** | 2021 මැයි මස 30 ට පෙර |
| මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම | 2019 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වසර | **2019 ජූනි මස 29** | |
| | 2019 සැප්තැම්බර් මස 30න් අවසන් වූ හය මාසය | **2019 නොවැම්බර් මස 26** | |
| | 2020 මාර්තු මස 31න් අවසන් වූ වසර | | 2020 ජූලි මස 15 ට පෙර |
| | 2020 සැප්තැම්බර් මස 30න් අවසන් වූ හය මාසය | | 2020 දෙසැම්බර් මස 31 ට පෙර |
| වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කිරීම | වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කිරීම | **2020 අගෝස්තු මස** | 2021 ජූනි මස |
| වාර්ෂික මහ සභා රැස්වීම් | වාර්ෂික මහ සභා රැස්වීම | **24 වැනි වාර්ෂික මහ සභා රැස්වීම – 2020 සැප්තැම්බර් මස 11** | 25 වැනි වාර්ෂික මහ සභා රැස්වීම 2021 ජූනි මසට පෙර |
| ලාභාංශ ගෙවීම | **අතුරු ලාභාංශ – මුදල්** | | |
| | 2020 මාර්තු මස 31න් අවසන් වූ වසර සඳහා ගෙවන ලද | **2020 ජනවාරි මස 23** | |
| | **අවසන් ලාභාංශ – කොටස්කර** | | |
| | 2019 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා කොටස්කර ලාභාංශ | **2019 අගෝස්තු මස 9** | |

# මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම මෙම ප්‍රකාශයෙහි දක්වා ඇත.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 මාර්තු මස 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයේ කාර්යසාධනය පිළිබඳ සැබෑ සහ සාධාරණ අදහසක් ලබාදෙන බව සහ එය වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී. මෙම මූල්‍ය ප්‍රකාශවල පහත දෑ ඇතුළත් වේ:

- – මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
- – ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය
- – විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය
- – ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය
- – මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- – මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

මෙම වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණත්වය සහ විෂය මූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත කරුණු පිළිබඳව අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී:

- – යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන ඒවා නොවෙනස්ව ක්‍රියාත්මක කිරීම සහ ඉන් බැහැරවීමක් වී ඇත්නම් හා ඒවා වැදගත් කොට සලකන්නේ නම්, ඒවා හෙළිදරව් කර පැහැදිළි කර ඇති බව,
- – අදාළ පරිදි අවශ්‍ය සියලුම ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇති බව, සහ
- – සාධාරණ හා විචක්ෂණ විනිසුම් හා තක්සේරු කිරීම් සිදු කර ඇති බව.

2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1), 151, 152 සහ 153 (1) සහ (2) වගන්ති පරිදි සමාගම සහ සමූහය සියලුම ගනුදෙනුවල ගිණුම් සුදුසු පරිදි ගිණුම් ගත කර ඇති බව සහතික කිරීම සඳහා සමාගමේ සහ සමූහයේ අධ්‍යක්ෂවරුන්ට වගකීම ඇත.

එමෙන්ම, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පදනම යොදා ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අධ්‍යක්ෂකවරු සහතික කරයි. තවද, සමාගමේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළි කිරීමට ප්‍රමාණවත් ගිණුම් වාර්තා සමාගම සතුව ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂවරුන්ට වගකීමක් ඇත.

2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) සහ 152 (1) (ආ) වගන්තිවලට අනුව පිළියෙල කිරීම සඳහා වගකිව යුතු නිලධාරියා වන සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා විසින් සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සහතික කර ඇත. මීට අමතරව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) (ඇ) සහ 152 (1) (ඇ) වගන්තිවලට සහ වෙනත් නියාමන අවශ්‍යතා අනුව සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජූලි මස 8වන දින අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර ඇත.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 148 වන වගන්තියට අනුකූලව, සමාගමේ ගනුදෙනු පැහැදිලි කරන සහ නිසි වේලාවට සමාගමේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් ඇති බව තීරණය කිරීමට සහාය වන නිසි ගිණුම් වාර්තා සමාගම විසින් පවත්වාගෙන යන බව සහ සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමට සහ මූල්‍ය ප්‍රකාශන පහසුවෙන් හා නිසි ලෙස විගණනය කිරීමට ඉඩ සලසන බව සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි. මෙම වාර්ෂික වාර්තාව සකස්කර ඉදිරිපත් කරන ලද 2019/20 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, අදාළ වන ගිණුම් පොත්වලට අනුකූල වන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත සහ ඒ යටතේ නිකුත් කළ උපදෙස්, කොළඹ කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයට අනුකූල වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ නිත්‍ය රැස්වීම්වලදී සහ අධ්‍යක්ෂමණ්ඩල විගණන කමිටුව (BAC) හරහා සෘජුවම මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සමාලෝචනය කරයි. සමාගම සහ සමූහය නිසි ගිණුම් පොත් පවත්වාගෙන යන බව සහතික කිරීම එම වාර්තාව 118 සහ 119 පිටුවල දක්වා ඇත. සමාගම සහ සමූහය විසින් ප්‍රකාශයට පත්කරන ලද අතුරු මූල්‍ය ප්‍රකාශන ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සමාලෝචනයකින් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.

සමාගමේ සහ සමූහයේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවර ගැනීම සහ මේ සම්බන්ධයෙන් සමාගම සහ සමූහය තුළ සැලකිය යුතු අවදානම් කළමනාකරණය සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 143 වන පිටුවේ දක්වා ඇත.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 56 (2) වගන්තිය යටතේ නියම කර ඇති පරිදි, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 57 වන වගන්තිය ප්‍රකාරව ලාභාංශ බෙදාහැරීමක් සිදු කිරීමට පූර්වාසන්නයෙන් සමාගම නුබුන්වත්කම පිළිබඳ පරීක්ෂණය සපුරා ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු කළ 2020 ජනවාරි මස 23 දින ගෙවන ලද අතුරු ලාභාංශ බෙදාහැරීමට බලය පවරා ඇති බව සහ ගෙවා ඇති ලාභාංශ සම්බන්ධයෙන්, නුබුන්වත් සහතිකය බාහිර විගණක වෙතින් ලබාගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සනාථ කර සිටී.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 166 (1) සහ 167 (1) වගන්ති යටතේ නියම කර ඇති පරිදි, මෙම වාර්ෂික වාර්තාව නියමිත වේලාවට සකස් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සනාථ කරන අතර, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීති අංක 7.5 (අ) සහ (ආ) අනුව, නියමිත කාල සීමාව තුළ එහි පිටපතක් කොටස් හිමියන්ට යවන බවට සහතික වී තිබේ. සියලුම කොටස්හිමියන්ට මුල් නිකුතුවට අනුකූලව සමාන අයුරින් සලකා ඇති බව අධ්‍යක්ෂවරුන් තහවුරු කරයි.

අධ්‍යක්ෂවරුන්ට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ විගණන මතය ලබා දීමට හැකිවන පරිදි විගණකට ඕනෑම පියවරක් ගැනීමට හා සුදුසු යැයි ඔවුන් සලකන ඕනෑම පරීක්ෂණයක් කිරීමට සෑම අවස්ථාවක්ම ලබා දිය යුතුය. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. "විගණනලාභි ආයතනය" යන්නෙහි අර්ථ දැක්වීම යටතට ගැනෙන අතර විගණකාධිපතිවරයා හෝ විගණකාධිපති විසින් බලය පවරනු ලැබූ ඕනෑම අයෙකු සමාගමේ විගණනය සිදු කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම් 145 සිට 147 දක්වා පිටුවල "ස්වාධීන විගණකගේ වාර්තාව" තුළ දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුමට අනුව, සමාගම සහ සමූහය විසින් ගෙවිය යුතු සියලුම බදු, තීරුබදු සහ ගාස්තු, සමාගමේ සහ සමූහයේ සේවකයින්ට අදාළව ගෙවිය යුතු සියලුම දායක මුදල්, ගාස්තු සහ බදු සහ සමාගම සම්බන්ධයෙන් රජය සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන වෙත වාර්තා කරන දිනට හෝ අදාළ කාලය සඳහා ගෙවිය යුතු මුදල් ගෙවා ඇති බව අධ්‍යක්ෂවරු සනාථ කරති.

ඒ අනුව මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන් සිය වගකීම් ඉටු කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



**ලක්මිණී කෝට්ටේගොඩ**
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2020 ජූලි මස 8
කොළඹ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAF/D/PLF/2020/01
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2020 ජූලි 15

සභාපති
පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

## පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිගේ ස්වාධීන වාර්තාව

### හැඳින්වීම

මෙම වාර්තාව 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ("සමාගම") හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය ("ප්‍රකාශය") පිළිබඳ සහතික කිරීම ලබා දේ.

### කළමනාකරණයේ වගකීම

2008 අංක 3 දරණ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනත් නියෝගයේ 10 (2) (ආ) වගන්තිය/2009 අංක 4 දරන මූල්‍ය කල්බදු (ආයතනික පාලන) පනත් නියෝගයේ 10 (2) (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බලපත්‍රලාභී මූල්‍ය සමාගමේ/මූල්‍ය කල්බදු සමාගමේ අධ්‍යක්ෂවරුන් සඳහා මඟපෙන්වීමට අනුකූලව ප්‍රකාශය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### මගේ වගකීම සහ SLSAE 3051 සමඟ අනුකූලවීම

මගේ වගකීම වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද ලියකියවිලි මගින් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සැලසුම සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් යොදා ගෙන ඇති ක්‍රියාවලිය නිසි ලෙස පිළිබිඹු කිරීමට සහය දක්වනවාද යන්න තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සහතික කිරීමේ සහභාගිත්වයන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති (SLSAE) 3051, අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බලපත්‍රලාභී මූල්‍ය සමාගම/මූල්‍ය කල්බදු සමාගම සඳහා සහතික කිරීමේ වාර්තාවට අනුකූලව මම මෙම කාර්යය ඉටුකළෙමි.

මෙම ප්‍රමිතියට අනුව කළමනාකරණය විසින් සියලු කරුණු සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය සකස් කර තිබේද යන්න පිළිබඳව සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා වන ක්‍රියාපටිපාටි මා විසින් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුය.

මෙම කාර්ය පිළිබඳ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මම වගකීමට බැඳී නොමැති අතර, මෙම කාර්යය අතරතුර මම මූල්‍ය තොරතුරු විගණනය කිරීම හෝ සමාලෝචනය කිරීම සිදුකර නොමැත.

### ඉටු කරන ලද කාර්යයේ සාරාංශය

අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද ලියකියවිලි මගින් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සැලසුම සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් යොදා ගෙන ඇති ක්‍රියාවලිය නිසි ලෙස පිළිබිඹු කිරීමට සහය දක්වනවාද යන්න තක්සේරු කිරීම සඳහා මම මෙම කාර්යය ඉටු කළෙමි.

සිදු කරන ලද ක්‍රියාපටිපාටීන් මූලික වශයෙන් සමාගමේ සේවකයින්ගේ විමසීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලියට සහාය වන නියැදි පදනමක් මත ලේඛනවල පැවැත්ම සඳහා සීමා විය.

SLSAE 3051 අනුව මා විසින් ප්‍රකාශනය සියලු අවදානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න සලකා බැලීමට හෝ සමාගමේ අවදානම් සහ පාලන ක්‍රියා පටිපාටිවල ඵලදායීතාවය පිළිබඳ මතයක් සැකසීම අවශ්‍ය නැත. එමෙන්ම SLSAE 3051 අනුව, මා විසින් වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කරන කිසියම් වැදගත් ගැටලුවක වැදගත් අභ්‍යන්තර පාලන අංශ සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කර ඇති ක්‍රියාවලි ඇත්ත වශයෙන්ම ගැටලුවලට පිළියම් සපයන්නේද යන්න සලකා බැලීම ද අවශ්‍ය නැත.

තෝරාගත් ක්‍රියාපටිපාටි සමාගමේ ස්වභාවය, ප්‍රකාශය සකස්කර ඇති සිද්ධිය හෝ ගනුදෙනුව පිළිබඳ මගේ අවබෝධය සැලකිල්ලට ගනු ලැබූ මගේ විනිශ්චය මත රඳා පවතී.

මගේ නිගමනයට පදනමක් සැපයීමට මා ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

### නිගමනය

සිදුකරන ලද ක්‍රියාපටිපාටි මත පදනම්ව, සමාගමේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගෙන ඇති ක්‍රියාවලිය පිළිබඳ මගේ අවබෝධය වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය සමඟ නොගැලපෙන බව මාහට විශ්වාස කිරීමට හේතු වන කිසිවක් මගේ අවධානයට යොමු වී නොමැත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

## වගකීම

2013 අංක 06 දරන මූල්‍ය සමාගම් (ආයතනික පාලනය – සංශෝධනය) පනත් නියෝගය මගින් සංශෝධනය කරන ලද 2008 අංක 03 දරණ මූල්‍ය සමාගම් පනත් නියෝගයේ 10 (2) වගන්තියට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව ඉදිරිපත් කරයි.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ("සමාගම") තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") වගකිව යුතුය.

සමාගම මුහුණ දී ඇති සැලකිය යුතු අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩ ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇති අතර, මෙම ක්‍රියාවලියට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇතුළත් වන අතර එය ව්‍යාපාරික පරිසරය සහ නියාමන මාර්ගෝපදේශවල වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කර වැඩි දියුණු කරනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා දැනට ක්‍රියාත්මක මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය යහපත් සහ ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල බවත් අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයට අදාළව මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී කළමනාකාරීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ලේඛනගතකිරීම අඛණ්ඩව වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියේ කළමනාකාරීත්වය නිරත වී සිටී. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය තක්සේරු කිරීමේදී, සමාග මේ හඳුනාගත් නිලධාරීන් විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සැලකිය යුතු ගිණුම් හා අනාවරණයන් සමඟ සම්බන්ධ වී ඇති සියලුම ක්‍රියාපටිපාටි සහ පාලනයන් ඒකාබද්ධ කරන ලදී.

සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ යෝග්‍යතාව සඳහා සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මේවා අඛණ්ඩ පදනමක් මත නිරීක්ෂණය කරමින් සිටී.

පිළිගැනීම, මිනුම්, වර්ගීකරණය සහ අනාවරණය කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ක්‍රියාවලි පිළිබඳ SLFRSs සහ LKAS ප්‍රගාමී වෙනස්වීම්වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමාගම විසින් යොදා ගන්නා අතර එහි මූල්‍ය වාර්තාකරණ සහ කළමනාකරණ තොරතුරුවල ක්‍රියාවලි තවදුරටත් ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදුකරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය SLFRS 9 – "මූල්‍ය උපකරණ" හි අවශ්‍යතා සඳහා නිසි සැලකිල්ලක් දක්වා ඇත. අවශ්‍ය මොඩියුලයන් ක්‍රියාවට නංවා ඇති අතර, ආදර්ශය වලංගු කිරීම සහ SLFRS 9 ට අනුකූලවීම සඳහා අවශ්‍යවන කළමනාකරණ තොරතුරු පද්ධති හා වාර්තා වටා ක්‍රියාවලි සහ පාලනයන් ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාවලි සහ පාලනයන්හි ප්‍රගාමී වැඩිදියුණු කිරීම් සිදු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ අවශ්‍යතාවන් ද සැලකිල්ලට ගෙන ඇත: LAKS 17 - "කල්බදු" වෙනුවට 2019 ජනවාරි මස 1 වන දින සිට වාර්ෂික මූල්‍ය කාල සීමාවන් සඳහා බලපැවැත්වෙන පරිදි "කල්බදු" පිළිබඳ SLFRS 16 නිකුත් කර ඇත. 2020 මාර්තු මස 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය සියලු වෙනස්කම් සිදු කර ඇත.

## තහවුරු කිරීම

ඉහත ක්‍රියාදාමයන් මත පදනම්ව, සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සැලසුම් කර ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා වන බවත් බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ කොළඹ කොටස් වෙළෙඳපොළේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදුකර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

## බාහිර විගණක විසින් ප්‍රකාශය සමාලෝචනය කිරීම

බාහිර විගණකවරුන් විසින් 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් ඉහත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කර ඇති අතර, සමාගමේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලසුම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගනු ලැබූ ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය සමඟ මෙම ප්‍රකාශය පටහැනි බව ඔවුන්ට විශ්වාස කිරීමට තරම් හේතු ඔවුන්ගේ අවධානයට යොමු නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,



**කොරලී පීටර්ස්**
සභාපතිනි
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව



**සුජීව රාජපක්ෂ**
සභාපති



**රොහාන් පතිරගේ**
අධ්‍යක්ෂ

2020 ජූලි මස 15
කොළඹ

# ප්‍රධාන විධායක නිලධාරිගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ වගකීම් ප්‍රකාශය

2020 මාර්තු මස 31 වන දිනට පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර පහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ:

- – ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති:
- – 2007 අංක 07 දරන සමාගම් පනත;
- – 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත;
- – 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත නිකුත් කරන ලද පනත් නියෝග;
- – කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීති; සහ
- – ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය.

කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුකූලව සමූහය ත්‍රෛමාසික පදනමක් මත සිය කොටස්හිමියන්ට අතුරු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරයි.

සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – SLFRS 16 "කල්බදු" යොදා ගන්නා ලද අතර එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන LKAS 17 "කල්බදු" වෙනුවට 2019 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වේ. නව ප්‍රමිතිය මඟින් මෙහෙයුම් කල්බදු සහ මූල්‍ය කල්බදු අතර වෙනස ඉවත් කර ඇත. පෙර ශේෂ පත්‍රයේ වාර්තා කර තිබූ මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරන ලද බොහෝ ගිවිසුම් දැන් භාවිතයට අයිතිය ඇති (ROU) වත්කම් සහ මූල්‍ය වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගෙන තිබේ. 227 වන පිටුවේ 34 වන සටහනෙහි දක්වා ඇති පරිදි වෙනත් මූල්‍ය නොවන වත්කම්වලට (දේපල, පිරියත සහ උපකරණ වැනි) සමාන ව භාවිතයට අයිතිය ඇති වත්කම් සහ 238 වන පිටුවේ 41 වන සටහනෙහි දක්වා ඇති පරිදි අනෙකුත් මූල්‍ය වගකීම්වලට සමානව කල්බදු වගකීම් බදුකරු විසින් මනිනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, බදුකරු විසින් භාවිතයට අයිතිය ඇති වත්කම්වල ක්ෂය කිරීම සහ කල්බදු වගකීම සඳහා පොළිය හඳුනාගනී. ක්ෂයවීම සරල රේඛීය පදනමක් මත සාමාන්‍යයෙන් සිදුවේ.

IFRIC 23 – ආදායම් බදු ප්‍රතිකාර පිළිබඳ අවිනිශ්චිතතාවය මඟින් බදු ප්‍රතිකාර LKAS 12 "ආදායම් බදු" යොදා ගැනීම කෙරෙහි බලපාන අවිනිශ්චිතතාවයට සම්බන්ධ වන අවස්ථාවක ආදායම් බදු ගණනය කිරීම ආමන්ත්‍රණය කරයි. ආදායම් බදු ප්‍රතිකාර පිළිබඳ අවිනිශ්චිතතාවයන් හඳුනාග ැනීමේදී සමාගම සැලකිය යුතු විනිශ්චයක් ලබා දෙයි. සමාගම සංකීර්ණ පරිසරයක ක්‍රියාත්මක වන බැවින්, අර්ථ නිරූපණය එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇති කරන්නේ දැයි තක්සේරු කර ඇත. සමාගම එහි බදු අනුකූලතාවය සහ හුවමාරු මිල අධ්‍යයනය මත පදනම්ව බලධාරීන් විසින් එහි බදු පිළිගනු ලබන බවට සමාගම තීරණය කර ඇත. අර්ථ නිරූපණය සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇති කර නොමැත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසු වන අතර ඒවා සමූහය විසින් ස්ථිරව යොදා ගනු ලැබේ. ඒවා යොදා ගැනීම තුළ නියමිත ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් ඉවත්ව නොයනු ඇත. අනාවරණය කර පැහැදිලි කර ඇතිනම්, වර්තමාන ඉදිරිපත් කිරීම හා වැදගත් බැහැරකිරීම්වලට අනුකූල වීමට අවශ්‍ය තැන්හිදී සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත. ඉහළ මට්ටමේ විනිශ්චයක් සහ සංකීර්ණත්වයක් හා සම්බන්ධවන සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු සමාගමේ බාහිර විගණක සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමඟ සාකච්ඡා කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශනවල අවංකකම සහ විෂයමූලිකත්වය පිළිබඳ වගකීම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය භාරගනී. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඇස්තමේන්තු හා විනිශ්චයන් විචක්ෂණශීලී හා සාධාරණ පදනමක් මත සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ ආකාරයකින් පිළිබිඹු වන බව සහතික කිරීම සඳහා, ගනුදෙනුවල ස්වරූපය සහ ස්වභාවය සහ සමාගමේ කටයුතුවල තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලැබේ. අඛණ්ඩව මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සමූහයට ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පදනම යොදා ගෙන ඇති බවත් අපි තහවුරු කරමු.

මෙය සහතික කිරීම සඳහා, සමාගම සහ සමූහය විසින් වත්කම් ආරක්ෂා කිරීම සහ වංචා මෙන්ම අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන හා ගිණුම් වාර්තා පද්ධතියක් ස්ථාපනය කිරීම පිළිබඳව නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇති අතර ඒවා අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය, ඇගයීම සහ යාවත්කාලීන කෙරේ.

සමාගමේ සහ සමූහයේ ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි අනුරූපව අනුගමනය කරන බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වරින් වර විගණන පවත්වා ඇත. කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන සහ ගිණුම්කරණ පද්ධතියක් විසින් සපයනු ලබන සහතික සලකා බැලීමේදී හඳුනාගත යුතු ආවේණික සීමාවන් තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සියලුම අභ්‍යන්තර හා බාහිර විගණන හා පරීක්ෂණ වැඩසටහන්, අභ්‍යන්තර පාලන ක්‍රම හා ක්‍රියාපටිපාටිවල කාර්යක්ෂමතාව, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ගුණාත්මකභාවය සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා පිළිපැදීම, බාහිර විගණන සැලැස්ම සහ කළමනාකරණ ලිපි සහ සමාලෝචනය කළ අතර ව්‍යවස්ථාපිත විගණනයේදී මතු කරන ලද ගැටලු පිළිබඳව පසු විපරම් කිරීම කරන ලදී. ඒ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 118 සහ 119 පිටුවල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව තුළ දක්වා ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර ඔහුගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 145 සිට 147 දක්වා පිටුවල දක්වා ඇත.

අපි පහත දෑ තහවුරු කරමු:

- – සමූහය අදාළ වන සියලුම නීති, රෙගුලාසි සහ දූරදර්ශී අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇතිබව, සැලකියයුතු අනුකූල නොවූ අවස්ථා නොමැතිබව;
- – මෙම වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනවල 250වන පිටුවේ 53 වන සටහනෙහි අනාවරණය කරන කරුණු හැරුණු විට සමූහයට එරෙහිව කිසිදු සැලකියයුතු නඩු විභාගයක් නොමැතිබව.

2020 මාර්තු මස 31 වන දිනට සමූහය විසින් සියලුම බදු, තීරුබදු සහ ගාස්තු සහ සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල්, බදු සහ ගාස්තු අදාළ කාලසීමාවන් සඳහා ගෙවා ඇත.



**ඒ. එස්. ඉබ්‍රයිම්**
ප්‍රධාන විධායක නිලධාරි



**ඔමාල් සුමනසිරි**
ප්‍රධාන කළමනාකරු – මූල්‍ය

2020 ජූලි මස 8
කොළඹ

# ස්වාධීන විගණකගේ වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | BAF/D/PLF/2020/01 | |
| ඔබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2020 ජුලි මස 13 | |

සභාපති
පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තියට අනුව 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.**

## 1 — මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2020 මාර්තු මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයන් ඇතුළත්වන 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පිපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) සහ පිපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. එහි පරිපාලිත සමාගම්වල (සමූහය) මූල්‍ය ප්‍රකාශන විගණනය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මගේ මෙහෙයවීම යටතේ සිදුකරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථායේ විධිවිධානවලට අනුව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය කර ගෙන යාම සඳහා, පොදු ව්‍යවහාරය තුළ වරලත් ගණකාධිකාරී ආයතනයක් මා වෙත සහය විය.

මගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2020 මාර්තු මස 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වසර සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය සාධාරණ දැක්මක් ලබා දේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මම මාගේ විගණනය පැවැත්වූයෙමි. මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටස තුළ විගණකගේ වගකීම් හි එම ප්‍රමිති යටතේ මාගේ වගකීම තවදුරටත් විස්තර කෙරේ. මම ලබාගත් විගණන සාක්ෂිය මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට මම විශ්වාස කරමි.

### 1.3 මූලික විගණන කරුණු

මූලික විගණන කරුණු වන්නේ පවත්නා කාලසිමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය තුළ වඩාත් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමස්තයක් ලෙස සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ අන්තර්ගතය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර ඒ සම්බන්ධව මගේ විගණන මතය සකස් කිරීම තුළ මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් මම ලබා නොදෙමි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துாவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාව පිළිබඳව
පීපල්ස් ලීසිං සමාගම පිළිබඳව
වැදගත් සිදුවීම්
පණිවිඩ
ව්‍යාපාර ආකෘතිය
කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ
කළමනාකාරිත්වය
මූල්‍ය වාර්තා >>
අතිරේක තොරතුරු


| මූලික විගණන කරුණු | මූලික විගණන කරුණු අපගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය |
| --- | --- |
| **ණය සහ ලැබීම් සඳහා හානිකරණ දීමනා**<br>මාගේ විගණනයේදී ණය සහ ලැබීම් සඳහා හානිකරණ දීමනාව මූලික විගණන කරුණක් ලෙස සලකන ලදී. ණය සහ ලැබීම් සමඟ ඒ සම්බන්ධ හානිකරණ දීමනාව සඳහා වාර්තාකළ මුදලේ වැදගත්කම, කළමනාකරණයේ හානිකරණ තක්සේරුව ආශ්‍රිත විෂය සම්බන්ධතාව, අතින් සිදුකළ සංකීර්ණ ගණනය කිරීම සමඟ සම්බන්ධතාව සහ රටේ කොවිඩ්-19 පැතිරීම නිසා කළමනාකරණ ආවරණ තුළ වැඩිවීම, එය මූලික විගණන කරුණක් ලෙස සැලකිම සඳහා මාගේ පදනම් තහවුරු කරන ලදී.<br><br>2020 මාර්තු මස 31 වන දිනට, සමූහයේ මුළු වත්කම්වලින් 83%ක් රු. මිලියන 154,135ක් වූ ණය සහ ලැබිම්වලින් සමන්විත විය. (සටහන 25) රු. මිලියන 9,170ක් ශුද්ධ හානිකරණ දීමනාව (සටහන 25).<br><br>මූල්‍ය ප්‍රකාශන වලට සටහන් 25.7 හානිකරණ දීමනාවේ පදනම සහ එය ගණනය කිරීම තුළ කළමනාකරණය විසින් භාවිතා කරන උපකල්පන විස්තතර කෙරේ. | හානිකරණ දීමනාව පිළිබඳ සාධාරණත්වය ඇගයීම සඳහා, මගේ විගණන ක්‍රියාපටිපාටිවල (අනෙකුත් කරුණු අතර) පහත දෑ ඇතුළත් විය:<br>• – ණය සහ ලැබීම් පිළිබඳ හානිකරණය තක්සේරු කිරීම සම්බන්ධ පාලනයේ සැලසුම් ඵලදායිත්වය මම ඇගයීමට ලක්කල අතර එයට සැලකියයුතු විනිශ්චයන් පිළිබඳ පාලනය, සමාලෝචනය සහ අනුමත කිරීමේ මට්ටම ඇගයිම, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ කළමනාකරණය විසින් හානිකරණයට අදාළව තක්සේරු සහ උපකල්පන ඇතුළත් විය.<br>• – පාදක වූ ගණනය කිරීම සහ දත්ත පරීක්ෂා කිරීම.<br>• – ඉහත සඳහන් කරුණුවලට අමතරව, පහත සඳහන් ප්‍රධාන ක්‍රියාපටිපාටි ද ඉටුකරන ලදී:<br><br>හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කළ ණය සහ ලැබීම් පිළිබඳ නියැදියක් සඳහා:<br>• – හානිකරණයක් සිදු වී තිබේද යන්න තිරණය කිරීම සඳහා කළමනාකරණය විසින් භාවිතා කළ ප්‍රධාන නිර්ණායක මම තක්සේරු කළෙමි.<br>• – හානිකරණ දර්ශක පවතින අවස්ථාවලදී, නියැදි පදනමත් මත රජයේ සහන ක්‍රියාමාර්ග, වට්ටම් අනුපාත සහ දරන ලද ඇපවල වටිනාකම සලකා බලමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ ඇතුළුව කළමනාකරණයේ ඇස්තමේන්තුගත අනාගත අයකිරීම්වල සාධාරණත්වය මම ඇගයිමට ලක්කළෙමි.<br><br>හානිකරණය සඳහා සාමුහිකව තක්සේරු කළ ණය සහ ලැබීම් සඳහා:<br>• – අදාළ මූලාශ්‍ර ලේඛන තොරතුරු තාක්ෂණ පද්ධතිවල තොරතුරු සහ ගණනය කිරීම් නැවත සිදුකිරීම පිළිබඳ විස්තරවලට එකඟ වෙමින් පාදක තොරතරු සහ ඒ සම්බන්ධ ගණනය කිරීම්වල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාව මම පරීක්ෂා කළෙමි.<br>• – පොදුවේ ලබාගත හැකි දත්ත සහ තොරතුරු මූලාශ්‍ර සමඟ සන්සන්දනය කරමින් කළමනාකරණයේ විවේචනාත්මක ආවරණ තුළ ඔවුන් විසින් භාවිතා කළ සාර්ව ආර්ථික සහ අනෙකුත් සාධක මම සලකා ලැබුවෙමි.<br>• – එමෙන්ම මම ECL ගණනය කිරීම සඳහා CA ශ්‍රී ලංකා විසින් නිකුත්කරන ලද තාවකාලික ප්‍රයෝගික ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකරණයේ භාවිතය මම ඇගයීමට ලක්කළෙමි.<br>• – සටහන් 11.25 සහ 59.2 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණවල ප්‍රමාණාත්මකභාවය මම ඇගයීමට ලක්කළෙමි. |
| **මූල්‍ය උපකරණ සහ අදාළ අනාවරණයන්ගෙන් ඇතිවන අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ කොවිඩ්-19 පැතිරීමෙන් වියහැකි බලපෑම් කළමනාකරණයේ තක්සේරු කිරීම.**<br>මූල්‍ය උපකරණ ඇතිවන අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ කොවිඩ්-19 පැතිරීමෙන් වියහැකි බලපෑම් කළමනාකරණයේ තක්සේරු කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනයේ 59.1 වගන්තිය තුළ සම්පූර්ණයෙන් විස්තර කර ඇති පරිදි තක්සේරු දිනය දක්වා ලබාගතහැකි හොඳම තොරතුරු සැලකිල්ලට ගනිමින් අදාළ මූල්‍ය ප්‍රකාශන අනාවරණ සිදුකරන ලබයි.<br><br>ව්‍යාපාරයේ ස්වභාවය සහ වැදගත් කළමනාකරණ විනිශ්චයන් සලකා බලමින් සහ අනාගත සිදුවීම් සහ වාතාවරණ සලකා බලන ඇස්තමේන්තු සලකා බලමින් එවැනි කළමනාකරණයේ තක්සේරු කිරීම සහ අදාළ අනාවරණ ප්‍රධාන විගණන කරුණු ලෙස මම සලකා බැලුවෙමි. | වෙනත් කරුණු ඇතුළත් මගේ ක්‍රියපටිපාටිවලට පහත දෑ ඇතුළත්ය:<br>• – මූල්‍ය උපකරණවලින් ඇතිවන අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ කොවිඩ්-19 පැතිරීමෙන් වියහැකි බලපෑම් කළමනාකරණයේ තක්සේරු කිරීම සහ සමූහයේ සංවර්ධනය ආශ්‍රිත ආනාවරණ පිළිබඳ මම අවබෝධයක් ලබා ගතිමි.<br>• – එමෙන්ම SLFRS හි පරමාර්ථයට අනුව ණය අවදානම් සහ ද්‍රවශීලතා අවදානම පිළිබඳ අවධානය යොමු කරමින් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 59.1, 59.2 සහ 59.3 හි සිදුකළ ගුණාත්මක අනාවරණවල ප්‍රමාණාත්මතාව ද මම ඇගයිමට ලක්කළෙමි.<br>• – එකි අනාවරණ තහවුරු කරන වැදගත් විනිශ්චයන් සහ ඇස්තමේන්ත සම්බන්ධයෙන්, අදාළ වෙළෙඳපොල තොරතුරු සහ සමූහය විසින් ගනු ලැබූ අභ්‍යන්තර තීරණ පිළිබඳ සැලකිල්ලට ගනිමින් එවැනි ප්‍රධාන උපකල්පන මම ඇගයිමට ලක්කළෙමි. |

## 1.4 වෙනත් කරුණු

2019 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාග මේ මූල්‍ය ප්‍රකාශන විගණක විසින් විගණනය කරන ලද අතර 2019 ජූනි මස 13 දින එම ප්‍රකාශන සම්බන්ධයෙන් වෙනස් නොකළ මතය ඔහු ප්‍රකාශ කළේය.

## 1.5 සමූහයේ 2020 වාර්ෂිත වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

මූල්‍ය ප්‍රකාශන සහ එහි මගේ විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු 2020 සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරුවලින් සමන්විත වේ. කළමනාකරණය වෙනත් තොරතුරු සඳහා වගකීමට බැඳි ඇත. සමූහයේ 2020 වාර්ෂික වාර්තාව මෙම විගණකගේ වාර්තාවේ දිනයෙන් පසු දිනයක ලබාදීමට අපේක්ෂා කෙරේ.

පොදුවේ පාලනය කරන ව්‍යාපාර සංයෝජන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද පොදුවේ පාලනය කරන ව්‍යාපාර සංයෝජන සඳහා නිර්දේශිත හා විනය පිළිබඳ ප්‍රකාශනය (SoRP) යටතේ නිකුත්කළ මාර්ගෝපදේශ භාවිතා කර ගණනය කරනු ලබයි.

### 3.1.3 පාලනය අහිමිවීම

පාලනය අහිමිවීම මත, සමූහය පරිපාලිත සමාගමේ වත්කම් සහ වගකීම්, පාලනය නොවන අයිතිය සහ පරිපාලිත සමාගමට අදාළ ස්කන්ධයේ අනෙකුත් සංරචක හඳුනා නොගනී. පාලනය අහිමිවීම මත ඇතිවන යම් අතිරික්ත හෝ හිඟ ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී. සමූහය පෙර පරිපාලිත සමාගම තුළ යම් හිමිකමක් රඳවා ගන්නේනම්, එවිට එකී හිමිකම පාලනයට අහිමි වූ දිනයට සාධාරණ අගයේදී මනිනු ලබයි.

### 3.1.4 ඒකාබද්ධ කිරීම මත ඉවත්කළ ගනුදෙනු

අන්තර් සමූහ ශේෂ සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනුවලින් ඇතිවන යම් උපලබ්ධි නොවූ ආදායම සහ වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි ඉවත් කෙරේ. ස්කන්ධය ගණනය කළ ආයෝජකයෙක් සමඟ කරන ගනුදෙනුවලින් ඇති වන උපලබ්ධි නොවූ ලාභ ආයෝජකයා තුළ සමාගමේ බැඳියාවන්ගේ ප්‍රමාණයට ආයෝජනයෙන් ඉවත් කෙරේ. උපලබ්ධි නොවූ අලාභ එම ආකාරයෙන්ම ඉවත් කරනු ලැබූවත් එහි ප්‍රමාණය වන්නේ හානිකරණය පිළිබඳ කිසිදු සාක්ෂියක් නොමැති ප්‍රමාණය දක්වා පමණි

## 3.2 විදේශ ව්‍යවහාර මුදලින් ගනුදෙනු සහ ශේෂ

සියලුම විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනු ගනුදෙනුව බලාත්මක වූ දිනයේ පැවති විනිමය හුවමරු අනුපාතයට අනුව ක්‍රියාත්මක මුදල වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලට මාරුකරනු ලැබේ. මේ සම්බන්ධයෙන්, සමූහයේ ව්‍යවහාරය වන්නේ ගනුදෙනුවේ දිනයට පාලනය වන මධ්‍යම විනිමය හුවමාරු අනුපාතය භාවිතා කිරීමයි.

වාර්තාකරණ දිනයට විදේශ ව්‍යවහාර මුදලින් නම් කරන ලද මූල්‍යමය වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනයට පැවති විනිමය හුවමාරු අනුපාතයට අනුව ක්‍රියාත්මක ව්‍යවහාර මුදලට මාරු කෙරේ. මූල්‍යමය අයිතම මත විදේශ ව්‍යවහාර මුදලින් ලාභ හෝ අලාභ වසර තුළ බලාත්මක පොළිය සහ ගෙවීම් සඳහා ගලපනලද වසර ආරම්භයේදී ක්‍රියාත්මක ව්‍යවහාර මුදල ක්‍රමක්ෂය පිරිවැය සහ වාර්තාකරණ දිනයට විනිමය හුවමාරු අනුපාතයට පරිවර්තනය කරන ලද විදේශ ව්‍යවහාර මුදල තුළ ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස වේ.

විදේශ ව්‍යවහාර මුදල තුළ ඓතිහාසික පිරිවැය අනුව ගණනය කරන මූල්‍ය නොවන අයිතම පිළිගන්නා දිනයේ පැවති විනිමය හුවමරු අනුපාතය භාවිතා කරමින් පරිවර්තනය කරනු ලබයි. විදේශ ව්‍යවහාර මුදල තුළ සාධාරණ අගයේදී මනින ලද මූල්‍ය නොවන අයිතම සාධාරණ අගය තීරණය කරන ලද දිනයේ පැවති විනිමය හුවමාරු අනුපාතය භාවිතා කරමින් පරිවර්තනය කරනු ලබයි.

## 3.3 SLFRS 15 – ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් තුළින් ආදායම

LKAS 18 "ආදායම", LKAS 11 "ඉදිකිරීම් ගිවිසුම්" සහ IFRIC 13 "ගනුදෙනුකාර පක්ෂපාති වැඩසටහන්" ඇතුළු ආදායම හඳුනාගැනීමේ මාර්ගෝපදේශ වෙනුවට SLFRS 15 හඳුන්වාදුන් අතර 2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භවන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

SLFRS 15 මගින් ආදායම කොපමණ ප්‍රමාණයක් කුමණ අවස්ථාවේදී හඳුනාගන්නේද යන්න තීරණය කිරීම සඳහා විස්තරාත්මක රාමුවක් ලබා දේ. SLFRS 15 අනුව නව තුලනාත්මක සහ ප්‍රමාණාත්මක අනාවරණවලින් ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් හී ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාව අවබෝධ කරගැනීමට මූල්‍ය ප්‍රකාශ භාවිතා කිරීමට පරිශීලකයින්ට හැකියාව ඇති කිරීම අරමුණු කිරීම අවශ්‍ය වේ.

ආයතනය ආදායම හඳුනාගන්නා අවස්ථාව සහ ප්‍රමාණය කොපමණද යන්න තීරණය කිරීමට පස් වැදෑරුම් ආදර්ශය යොදා ගැනීම අවශ්‍ය වේ. මෙම ආදර්ශයෙන් යම් ආයතනයන් භාණ්ඩ හෝ සේවාවන් හී පාලනය ආයතනය ලබාගැනීමට අපේක්ෂිත ප්‍රමාණයට මාරුකරන අවස්ථාවේදී ආදායම් හඳුනාගන්නා බව විස්තර කරයි.

SLFRS 15 යොදා ගැනීමෙන් සමාගම සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇති වූ කිසිදු සැලකියයුතු බලපෑමක් නොමැත.

## 3.4 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මෙම මූල්‍ය ප්‍රකාශනවල, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – SLFRS 16 "කල්බදු" (SLFRS 16) සහ පළමු වරට 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක බවට පත් වූ IFRIC නිර්වචන 23 – "ආදායම් බදු සංග්‍රහය සම්බන්ධ අවිනිශ්චිතතාව" සමූහය යොදා ගෙන ඇත. සමූහය මෙයට පෙර නිකුත් කර තිබුනද බලාත්මක නොවූ යම් වෙනත් ප්‍රමිති, නිර්වචන හෝ සංශෝධන යොදාගෙන නොමැත.

### 3.4.1 IFRIC 23 – ආදායම් බදු ප්‍රතිකාර සම්බන්ධ අවිනිශ්චිතතාව

බදු ප්‍රතිකාර LKAS 12 – "ආදායම් බදු" යොදා ගැනීමට බලපාන ලද අවිනිශ්චිතතාව හා සම්බන්ධ වන ආදායම බදු ගණනය කිරීම මෙම නිර්වචනය තුළින් ආමන්ත්‍රණය කරයි. එය LKAS 12 විෂය පථයෙන් පරිබාහිර බදු හෝ ගාස්තුවලට අදාළ නොවන අතර, විශේෂයෙන් අවිනිශ්චිත බදු ප්‍රතිකාර ආශ්‍රිත පොළී හෝ දණ්ඩන අදාළ අවශ්‍යතාවය ද ඇතුළත් කර නැත. මෙම නිර්වචනය විශේයෙන් පහත කරුණු ආමන්ත්‍රණය කරයි:

- – යම් ආයතනයක් අවිනිශ්චිත බදු ප්‍රතිකාර වෙන වෙනම සලකා බලන බව
- – බදු බලධාරීන්ගේ බදු ප්‍රතිකාර පරීක්ෂණය සම්බන්ධයෙන් යම් ආයතනයක් උපකල්පනය කරන බව
- – යම් ආයතනයක් බදුකළ හැකි ලාභය (බදු අලාභ), බදු පදනම්, භාවිතා නොකළ බදු, භාවිතා නොකළ බදු බැර සහ බදු අනුපාත තීරණය කරන ආකාරය
- – යම් ආයතනයක් සාධක සහ වාතාවරණට තුළ වෙනස්වීම් සලකා බලන ආකාරය

එක් එක් අවිනිශ්චිත බදු ප්‍රතිකාර වෙන වෙනම හෝ එකක් හෝ වෙනත් අවිනිශ්චිත බදු ප්‍රතිකාර කිහිපයක් සමඟ සලකා බලන්නේද යන්න සමාගම තීරණය කරන අතර අවිනිශ්චිතාවයේ විසඳුම වඩාත් හොඳින් පුරෝකථනය කරන ප්‍රවේශය භාවිතා කරයි.

සමාගම ආදායම් බදු ප්‍රතිකාර සම්බන්ධ අවිනිශ්චිතතා හඳුනාග ැනීමේදී වැදගත් විනිශ්චයන් යොදා ගනු ලබයි. සමාගම සංකීර්ණ පරිසරයක් තුළ ක්‍රියාත්මක වන බැවින්, එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව නිර්වචනයෙන් බලපෑමක් තිබේද යන්න ඇගයීමට

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ලක් කරන ලදී. සමාගම, එහි බදු අනුකූලතාවය සහ මිල හුවමාරුකරණ අධ්‍යයනය මත පදනම් වී බදු බලධාරීන් විසින් එහි බදු පිළිගනු ලබනු ඇති බවට තීරණය කර ඇත. මෙම නිර්වචනය සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් බලපෑමක් තිබී නොමැත.

### 3.4.2. SLFRS 16 – "කල්බදු"

LKAS 17 – "කල්බදු" වෙනුවට නව ප්‍රමිතිය – SLFRS 16 "කල්බදු" 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසු බලාත්මක බවට පත්විය. නව ප්‍රමිතිය මෙහෙයුම් කල්බදු සහ මූල්‍ය කල්බදු අතර වෙනස ඉවත් කර ඇත. පෙර ශේෂ පත්‍රයේ මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කළ බොහොමයක් ගිවිසුම් වර්තමානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි භාවිතයට අයිතිය ඇති (ROU) වත්කම් සහ කල්බදු වගකීම් ලෙස හඳුනාගනී. SLFRS 16 යටතේ බදුකරුගේ ගිණුම්කරණය LKAS 17 න් සැලකියයුතු ලෙස වෙනස් වී නැති අතර එහිදී බදුහිමියන් LKAS 17 හි සමාන මූලධර්ම භාවිතා කරමින් මෙහෙයුම් හෝ මූල්‍යමය කල්බදු ලෙස තවදුරටත් කල්බදු වර්ගිකරණය කරයි. එමනිසා, සමූහය බදු හිමියා වන අවස්ථාවේදී කල්බදු සඳහා බලපෑමක් තිබී නොමැත. කෙසේවෙතත්, සමූහය ගිවිසුමේ බදු ගැණුම්කරු බවට පත්වන අවස්ථාවේදි ගිණුම්කරණ මූලධර්මවලට මූලික වෙනස්වීම් SLFRS 16 හඳුන්වාදී ඇත.

බදුකරු අනෙකුත් මූල්‍ය නොවන වත්කම්වලට (දේපල, පිරියත හා උපකරණ) සමාන ආකාරයකින් භාවිතයට අයිතිය ඇති වත්කම් මැනීම සිදු කරන අතර කල්බදු වගකිම් අනෙකුත් මූල්‍ය වගකීම්වලට සමාන ආකාරයෙන් අගය කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, බදුකරුවෙක් භාවිතයට අයිතිය ඇති වත්කමේ ක්ෂය කිරිම සහ කල්බදු වත්කමේ පොළිය හඳුනාගනී. ක්ෂය කිරීම සාමාන්‍යයෙන් සරල මාර්ගික ක්‍රමයට සිදුවේ.

SLFRS 16 ප්‍රමිතිය යොදා ගැනීම තුළ සංක්‍රාන්ති ක්‍රමය තෝරා ගැනීමේදි තෝරා ගැනීම් ගණනාවකට ඉඩ ලබා දේ. සමාගම 2B (සරල කළ) විකල්පය තෝරා ගෙන ඇති අතර ඒ තුළින් සංක්‍රාන්තියේදී කල්බදු වගකීම ගණනය කිරීම සහ ඉන්පසුව භාවිතයට අයිතිය ඇති වත්කම වගකීමට සමාන කිරීම අවශ්‍ය වේ. මෙම ප්‍රවේශය තුළ ස්කන්ධ ගැලපීමක් නොමැත. කරුණාකර 227 පිටුවේ සටහන 34 බලන්න.

## 3.5 මූල්‍ය උපකරණ – ආරම්භක හඳුනාගැනීම සහ පසු ඇගයීම

### 3.5.1 හඳුනාගැනීමේ දිනය

"විධිමත් මාර්ගයේ වෙළෙඳාම්" හැර සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් විකුණුම් දිනයට එනම් සමූහය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙක් බවට පත්වන දිනයේදී මූලිකමව හඳුනාගනී. "විධිමත් මාර්ගයේ වෙළෙඳාම්" යන්නෙන් වෙළෙඳපොල තුළ රෙගුලාසිය හෝ සම්මුතිය මගින් පොදුවේ ස්ථාපිත කර ඇති කාල රාමුව තුළ වත්කම ලබා දීම අවශ්‍යවන මිලදී ගැනිම හෝ මූල්‍ය වත්කම් විකිණීම අදහස් වේ. එවැනි වෙළෙඳාම් මූලිකවම නිරවුල් කරන දිනයේදී හඳුනාගනී.

### 3.5.2 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පසු ඇගයීම

SLFRS 9 අනුව, සමූහය වත්කම් සහ පහත සඳහන් ක්‍රමයක් අනුව මනින ලද ගිවිසුම්ගත නියමයන් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාර ආදර්ශය මත පදනම් වී එහි සියලුම මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි:

- – ක්‍රමක්ෂය පිරිවැය
- – අනෙකුත් විස්තරාත්මක ආදායම් තුළින් සාධාරණ අගය (FVOCI)
- – ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)

මූල්‍ය වත්කම් පසු ඇගයීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

**ව්‍යාපාර ආදර්ශය තක්සේරු කිරීම**

සමූහය යම් වත්කමක් කළඹ මට්ටමින් දරා ගන්නා සහ උපකරණයෙන් උපකරණය යන පදනම මත ඇගයීමට ලක් නොකරන ව්‍යාපාර ආදර්ශයක පරමාර්ථය පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකරයි. එයට හේතුව මේ මගින් ව්‍යාපාරය කළමනාකරණ සහ තොරතුරු ලබාදෙන ආකාරය කළමනාකරණයට වඩාත් හොඳින් පිළිබිඹු වන බැවිණි. සලකා බලන තොරතුරුවලට පහත දෑ ඇතුළත් වේ:

- – ප්‍රකාශික ප්‍රතිපත්ති සහ කළඹ සඳහා පරමාර්ථ සහ එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම. විශේෂයෙන් කළමනාකරණයේ ක්‍රමෝපාය විශේෂ පොළී අනුපාත පැතිකඩක් පවත්වා ගනිමින්, මූල්‍ය වත්කම්වල කාලසීමාව එවැනි වත්කම්වලට අරමුදල් ලබා දෙන හෝ වත්කම් අලෙවිය තුළින් මුදල් ප්‍රවාහ උපලබ්ධිකරන වගකිම්වල කාලයට ගැලපීම මගින් ගිවිසුම්ගත පොළී ආදායම ඉපයීම කෙරෙහි අවධානය යොමු කරන්නේද යනවග;
- – කළඹක කාර්යසාධනය අගයනු ලබන සහ සමූහයේ කළමනාකරණයට වාර්තා කරන ආකාරය;
- – ව්‍යාපාර ආදර්ශයේ (සහ එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්) කාර්යසාධනයට බලපාන අවදානම් සහ එවැනි අවදානම් කළමනාකරණය කරන ආකාරය;
- – ව්‍යාපාරයේ කළමනාකරුවන්ට වන්දි ගෙවන ආකාරය එනම් වන්දි ගෙවීම කළමනාකරණය කරන වත්කම්වල සාධාරණ අගය මත හෝ රැස්කරන ලද ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම් වන්නේද යන වග, සහ
- – පෙර කාලසිමාවන් හි වාරගණන, පරිමාව සහ කාලසීමාව, එවැනි විකුණුම් සඳහා හේතු සහ අනාගත විකුණුම් කාර්යය පිළිබඳව අපේක්ෂාවන්. කෙසේවෙතත්, විකුණුම් කාර්යය පිළිබඳව තොරතුරු හුදකලාව නොව මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමූහයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අත්කර ගන්නා ආකාරය සහ මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නා ආකාරය පිළිබඳ සමස්ත ඇගයීමේ කොටසක් ලෙස සලකනු ලබයි.

ව්‍යාපාර ආදර්ශය තක්සේරු කිරීම "වඩාත් නරක සිදුවීම" හෝ "පීඩන සිදුවීම" යන ක්‍රියාදාමයන් සැලකිල්ලට නොග නිමින් සාධාරණව අපේක්ෂිත ක්‍රියාදාමයන් මත පදනම් වේ. මූලික හඳුනාගැනිමෙන් පසු සමූහයේ මුල් අපේක්ෂාවන්ගෙන් වෙනස්වන ආකාරයකින් මුදල් ප්‍රවාහ උපලබ්ධි වන්නේනම්, සමූහය එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන ලද ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය වෙනස් කරනු නොලැබුවත්, එම තොරතුරු අළුතින් ඇතිවූ හෝ අළුතින් මිලදී ගනු ලැබූ මූල්‍ය වත්කම්වල ඉදිරිය තක්සේරු කිරීමේදි ඇතුළත් කරනු ලබයි.

### ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම මූලික සහ පොළිය ගෙවීම සඳහා ගෙවීම් පමණක්ද යන්න ඇගයිම (SPPI test)

සිය වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවැනි පියවරක් ලෙස. සමූහය මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් SPPI පරීක්ෂණය සපුරාලන්නේද යන්න හඳුනාගැනීම සඳහා ඒවා ඇගයීමට ලක් කරයි.

මෙම ඇගයීමේ අරමුණ සඳහා, "මුල් මුදල" මූලික හඳුනාගැනීම මත මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස අර්ථ දක්වන අතර මූල්‍ය වත්කමේ ජීව කාලය පුරා වෙනස් විය හැකිය. (නිදසුනක් ලෙස, මූලධනය ආපසු ගෙවිම් හෝ වාරිකය/වට්ටම්වල ක්‍රමක්ෂය පැවතීම)

මුදලේ කාලීන වටිනාකම සඳහා සහ විශේෂිත කාලසීමාවක් තුළ හිඟව පවත්නා මූලධන මුදල හා අදාළ ණය අවදානම සඳහා සහ අනෙකුත් මූලික ණය අවදානම්, පිරිවැය මෙන්ම ලාභ ආන්තික සඳහා ප්‍රතිෂ්ඨාව ලෙස "පොළිය" නිර්වචනය කරයි.

මෙයට වෙනස්ව, මූලික ණයදිමේ වැඩපිළිවෙළකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තුළ අවදානම් හෝ අස්ථාවරත්වයට නිරාවරණය අවම කිරීම වැඩි කිරීමට හඳුන්වාදෙන ගිවිසුම්ගත නියමයන් හිඟව පවත්නා මූලධනය මත මූලධනය සහ පොළී ගෙවීම් පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඇති කරනු නොලබයි. එවැනි අවස්ථාවලදී, මූල්‍ය වත්කම් FVTPL දී අගය කිරීම අවශ්‍ය වේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු හිඟව පවත්නා මූලධනය මත මූලධනය සහ පොළී ගෙවීම් පමණක්ද යන්න ඇගයීමේදී, සමූහය උපකරණයේ ගිවිසුම්ගත නියමයන් සලකා බලයි. මූල්‍ය වත්කමට මෙම කොන්දේසිය සපුරාලන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ කාලය සහ ප්‍රමාණය වෙනස් කළ හැකි ගිවිසුම්ගත නියමයක් ඇතුළත්ද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුළත්ය. මෙම තක්සේරු කිරීමේදී සමූහය පහත කරුණු සලකා බලයි.

- – මුදල් ප්‍රවාහයේ කාලය සහ ප්‍රමාණය වෙනස් කරන අසම්භාව්‍ය සිදුවීම්;
- – තෝලන ගතිලක්ෂණ;
- – පෙර ගෙවීම සහ දීර්ඝ කිරීමේ නියමයන්;
- – විශේෂිත වත්කම්වලින් මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම සීමාකරන නියමයන්, සහ
- – මුදලේ කාලීන වටිනාකමේ ප්‍රතිෂ්ඨාව වෙනස්කරන ලක්ෂණ;

කලින් කල නැවත නියම කරන දිනවලදී පොළී අනුපාත ප්‍රතිශෝධනය කිරීමේ අරමුණ සඳහා සමූහයට විකල්පයක් ඇති දිගු කාලීන ස්ථාවර අනුපාත ණය කළඹක් සමූහයට අයත්ය. මෙම නැවත නියම කිරීමේ හිමිකම් ප්‍රතිශෝධනය කරනු ලබන අවස්ථාවේ දි වෙළෙඳපොල අනුපාතයට සීමා වේ. ණයගැතියන්ට ප්‍රතිශෝධිත අනුපාතය පිළිගැනීමට හෝ කිසිදු දඩ මුදලක් නොමැතිව ණය මුදා හැරීමේ විකල්පයක් ඇත. මෙම ණයවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හුදෙක් මූලධනය සහ පොළිය ගෙවීම වන බව සමූහය තීරණය කර ඇත. එයට හේතුව, මෙම විකල්පය මුදලේ කාලීන අගය, ණය අවදානම, අනෙකුත් මූලික ණය අවදානම් සහ හිඟව පවත්නා මූලධනයට අදාළ පිරිවැය සඳහා ප්‍රතිෂ්ඨාවක් වන ආකාරයකින් පොළී අනුපාතය වෙනස් කිරීමයි.

SOFP මත හඳුනාගත් විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් පිළිබඳ විස්තර.

#### ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් සහ FVTPL දී නම්කර නොමැතිනම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි.

- – ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීමට වත්කම් දරා ගැනීම පරමාර්ථය වන ව්‍යාපාර ආදර්ශයක් තුළ වත්කම දරාගෙන සිටීම, සහ
- – මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් හිඟව පවත්නා මූලධනය මත මූලධනය සහ පොළී ගෙවීම් පමණක් ගෙවීම වන මුදල් ප්‍රවාහ සඳහා විශේෂිත දින ඇති කිරීම.

ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් සටහන් 22, 23, 25, 26 සහ 35 හි දැක්වේ.

#### FVOCI ට මනින ලද මූල්‍ය වත්කම්

FVOCI ට මූල්‍ය වත්කම්වලට අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය සහ ස්කන්ධ උපකරණ ඇතුළත් වේ. FVOCI ට මනින ලද මූල්‍ය වත්කම් 212 සහ 213 දක්වා පිටුවල සටහන් 27 හි දැක්වේ.

#### FVTPL ට මනින ලද මූල්‍ය වත්කම්

SLFRS 9 අනුව, ක්‍රමක්ෂය පිරිවැයට හෝ FVOCI ට වර්ගීකරණය කරන ලද ඒවා හැර සියලුම මූල්‍ය වත්කම් FVTPL ට මනින ලද ඒවා ලෙස වර්ගීකරණය කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්වලට අලෙවිය සඳහා තබා ඇති හෝ කළමනාකරණය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් ඇතුළත්වන අතර, එම වත්කම්වල කාර්යසාධනය සාධාරණ අගය පදනමක් මත අගයනු ලබයි. එයට හේතුව එම වත්කම් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ නොදරන බැවින් සහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීමට සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූලික හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් අලෙවි කිරීමට තබා නොගන්නා බැවින්ය. මේ පිළිබඳ 190 සිට 192 දක්වා පිටුවල සටහන් 24 හි සාකච්ඡා කරනු ලබයි.

#### ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්

SLFRS 9 – "මූලික හඳුනාගැනීම" අනුව, සමූහය ක්‍රමක්ෂය පිරිවැයට හෝ FVOCIට හෝ FVTPL ට මැනිය යුතු අවශ්‍යතාවන් වෙනත් ආකාරයකින් සපුරාලන මූල්‍ය වත්කමක් වෙනස් කළ නොහැකි ලෙස නම් කරනුයේ එකී නම් කිරීමෙන් වත්කම් හෝ වගකීම් මැනීමෙන් වෙනත් ආකාරයකින් හෝ වෙනස් පදනමක් මත ඒවායෙහි ලාභ හෝ අලාභ හඳුනාග ැනිමෙන් ඇති වියහැකි ගිණුම්කරණ නොගැලපීමක් ඉවත්කරන හෝ සැලකියයුතු ලෙස අඩුකරන අවස්ථාවලදී පමණි.

සමූහය වාර්තාකරණ කාලසීමාව අවසානයේදී ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූලික හඳුනාගැනීම මත මූල්‍ය වත්කම් නම් කර නොමැත.

### 3.5.3 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනානොගැනීම

#### මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවලදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පහත අවස්ථාවල දී හඳුනානොගනී.

- – කල්පිරී ඇති වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීමට අයිතිය ඇති අවස්ථාව;
- – සමාගම හෝ සමූහය වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීමට එහි අයිතිය මාරු කර ඇති හෝ "පසුකර යැවීමේ" වැඩපිළිවෙලක් යටතේ යම් තෙවැනි පාර්ශ්වයකට සැලකියයුතු ප්‍රමාදයක් නොමැතිව සම්පූර්ණයෙන් ලබාගත් මුදල් ප්‍රවාහ ගෙවීමට යම් බැඳීමක් භාරගෙන ඇති අවස්ථාව සහිත
  - සමාගම හෝ සමූහය වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන සැලකියයුතු ලෙස මාරුකර ඇති අවස්ථාව, හෝ
  - සමාගම හෝ සමූහය වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන සැලකියයුතු ලෙස මාරු නොකර සහ රඳවා නොගෙන ඇතත්, වත්කමේ පාලනය මාරුකර ඇති අවස්ථාව

මූල්‍ය වත්කමක් හඳුනානොගැනීම මත, වත්කමේ ධාරණ අගය සහ ලද ප්‍රතිෂ්ඨාව සහ විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇති සමුච්චිත ලාභය හෝ අලාභය අතර වෙනස ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනා නොගනී.

සමාගම හෝ සමූහය වත්කමකින් මුදල් ලබා ගැනීමේ එහි අයිතිය මාරු කර ඇති අවස්ථාවක හෝ පසුකර යැවීමේ වැඩපිළිවෙළකට ඇතුළත් වී ඇති අවස්ථාවක සහ වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන සැලකියයුතු ලෙස මාරු නොකර සහ රඳවා නොගෙන ඇති අවස්ථාවක හෝ වත්කමේ පාලනය මාරු කර නොමැති අවස්ථාවක, වත්කම තුළ සමූහයේ අඛණ්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණයට එම වත්කම හඳුනාගනී. එම අවස්ථාවේදී, සමූහය ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනී. මාරුකළ වත්කම සහ ආශ්‍රිත වගකිම සම්බන්ධයෙන් රඳවාගෙන ඇති හිමිකම් සහ බැඳීම් පිළිබිඹු කරන පදනමක් මත අගය කරනු ලබයි.

මාරුකළ වත්කමක් සම්බන්ධ ඇපයක ආකාරයකින් ලබාගන්නා අඛණ්ඩ සම්බන්ධතාව වත්කමේ මුල් ධාරණ අගයේ අවමයට සහ සමූහයට ආපසු ගෙවීමට අවශ්‍ය වියහැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම මුදලට අගය කරනු ලබයි.

#### මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීමක් හඳුනානොගන්නේ වගකිම යටතේ බැඳිම මුදාහරින හෝ අවලංගුකරන හෝ කල්පිරෙන අවස්ථාවේදීය. දැනට පවත්නා මූල්‍ය වගකීමක් සැලකියයුතු වෙනස් නියමයන් මත හෝ දැනට පවත්නා වගකීමේ නියමයන් මත එම ණය හිමියා විසින් වෙනස් කරනු ලබන අවස්ථාවක, වගකීම සැලකියයුතු ලෙස වෙනස් කරන අතර, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනානොගැනීමක් ලෙස සහ වගකීමක් හඳුනාගැනීම ලෙස සලකනු ලබයි. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

### 3.5.4 මූල්‍ය උපකරණ හිලව්කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනාගත් ප්‍රමාණයක් හිලව්කිරීමට වර්තමානයේ බලාත්මක නීතිමය අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ එකවර වත්කම මුදාහැර වගකීම නිරවුල් කිරීමට අපේක්ෂාවක් ඇත්නම් පමණක් හිලව්කරන අතර ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කරනු ලබයි. මෙය සාමාන්‍යයෙන් ප්‍රධාන

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

හිලව්කිරීම පිළිබඳ ගිවිසුම් සහිත අවස්ථාව නොවේ. එමනිසා, ආශ්‍රිත වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දළ වශයෙන් ඉදිරිපත් කෙරේ.

LKASs/ SLFRSs, හෝ සමූහයේ වෙළෙඳ කාර්යයක් වැනි සමාන ගනුදෙනු සමූහයකින් ඇතිවන ලාභ හෝ අලාභ යටතේ අවසර දී ඇත්නම් පමණක් ආදායම් සහ වියදම් ශුද්ධ පදනමකින් පමණක් ඉදිරිපත් කෙරේ.

### 3.5.5 සාධාරණ අගය තීරණය කිරීම

වාර්තා කරන දිනයට සක්‍රීය වෙළෙඳපොල තුළ විකුණන ලද මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය ඒවායේ ලැයිස්තුගත වෙළෙඳපොල මිල මත හෝ ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩුවීමක් නොමැතිව වෙළෙන්ඳාගේ මිල ඉදිරිපත්කිරීම් (දීර්ඝ ස්ථාන සඳහා ලංසු මිල සහ කෙටි ස්ථාන සඳහා ඉල්ලා සිටි මිල) මත පදනම් වේ.

මූල්‍ය උපකරණවල සාධාරණ අගය පිළිබඳ විශ්ලේෂණ සහ ඒවා අගය කරන ලද ආකාරය පිළිබඳ වැඩි විස්තර 182 සිට 189 දක්වා පිටුවල සටහන් 21 හි විස්තර කෙරේ.

## 3.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

විලම්බිත බදු වත්කම් නොවන සමූහයේ මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයන් වත්කමක් හානි වියහැකිබවට සඳහනක් තිබේද යන්න එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කෙරේ. යම් සඳහන් කිරීමක් ඇත්නම්, හෝ වත්කමක් පිළිබඳ වාර්ෂික හානිකරණ පරීක්ෂණය අවශ්‍ය වන අවස්ථාවක, සමූහය වත්කමේ අයකරගතහැකි මුදල තක්සේරු කරයි. වත්කමක අයකරගතහැකි මුදලක් යනු වත්කමක හෝ මුදල් උපයන ඒකකයේ සාධාරණ අගය සඳහා විකිණීමේ පිරිවැය ගැලපූ අගය සහ භාවිතය තුළ එහි වටිනාකම යන දෙකෙන් වඩා ඉහළ අගය වේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් උපයන ඒකකය එහි අයකරගතහැකි මුදල ඉක්මවන අවස්ථාවක, වත්කම හානි වී ඇති බවට සලකනු ලබන අතර එහි අයකරගත හැකි මුදලට ගිණුම්ගත කෙරේ.

භාවිතය තුළ වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මුදලේ කාලීන වටිනාකම පිළිබඳ වර්තමාන වෙළෙඳපොල තක්සේරු කිරීම සහ වත්කමට විශේෂිත අවදානම පිළිබිඹු කරන පෙර බදු වට්ටම් අනුපාතයක් භාවිතයෙන් ඒවායේ වර්තමාන වටිනාකම වට්ටම් කරනු ලැබේ. විකිණීමේ පිරිවැයට අඩු සාධාරණ අගය තීරණය කිරීමේදී, සුදුසු ඇගයීම් ආදර්ශයක් භාවිතා කෙරේ. මෙවැනි ගණනය කිරීම් තක්සේරු ගුණාකාර, ප්‍රසිද්ධියේ අලෙවිකරන ලද පරිපාලිත සමාගම් සඳහා ලැයිස්තුගත කොටස් මිල හෝ අනෙකුත් ලබාගතහැකි සාධාරණ අගයේ දර්ශක මගින් තහවුරු කරනු ලබයි.

වත්කම් සඳහා, තක්සේරු කිරීමක් එක් එක් වාර්තාකරන දිනයට සිදුකරනු ලබන්නේ පෙර හඳුනාගත් හානිකරණ අලාභ අඩු වී ඇති බවට සඳහනක් ඇත්නම් පමණී. යම් සඳහනක් ඇත්නම්, සමූහය වත්කමේ හෝ මුදල් උපයන ඒකකයේ අයකරගත හැකි මුදල තක්සේරු කරයි. පෙර හඳුනාගත් අලාභ ආපසු හැරවීම සිදු කරන්නේ අවසාන හානිකරණ අලාභය හඳුනාගැනීමේ සිට වත්කමේ අයකරගතහැකි මුදල තීරණය කිරීමට භාවිතාකළ උපකල්පනයන් හී වෙනසක් ඇත්නම්, වත්කමේ ධාරණ අගය එහි අයකරගතහැකි මුදල ඉක්මවා නොයන හෝ ක්ෂයකිරීම/ක්‍රමක්ෂයෙන් පසු තීරණය කර ඇති, පෙර වර්ෂයන් හි වත්කම සඳහා හානිකරණ අලාභ හඳුනාගෙන නොමැති ධාරණ අගය ඉක්මවා නොයන තරම් ආපසු හැරවීම සීමාසහිතනම් පමණී. එකී ආපසු හැරවීම ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

## 3.7 වෙන්කිරීම්

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමාන බැඳීමක් (නෛතික හෝ හිතකර) ඇති අවස්ථාවක වෙන්කිරීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනාගනී. ආර්ථික ප්‍රතිලාභවල ඇතුළත් සම්පත්වල පිටවයාමක් බැඳීමක් නිරවුල් කිරීමට අවශ්‍ය වියහැකි අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS 37 "අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් වෙන්කිරීම" අනුකූලව විශ්වාශ කළ හැකි ඇස්තමේන්තුවක් බැඳීමේ ප්‍රමාණයට සිදුකළ හැකිය. හඳුනාගනු ලබන මුදල එම දිනයට බැඳීම වටා අවදානම් සහ අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින් වාර්තා කරන දිනයට වර්තමාන බැඳීම නිරවුල් කිරීමට අවශ්‍ය වන ප්‍රතිෂ්ඨාවේ විශිෂ්ටතම ඇස්තමේන්තුව වේ. යම් වෙන්කිරීමකට අදාළ වියදම යම් ප්‍රතිපූරණයන්ගෙන් ශුද්ධව ලාභාලාභ ප්‍රකාශනය තුළ ඉදිරිපත් කෙරේ.

## 3.8 ණයගැනීමේ පිරිවැය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS 23 "ණය ගැනීමේ පිරිවැය" අනුකූලව, සමූහය වත්කම අත්කර ගැනීම, ඉදිකිරීම හෝ වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස සුදුසුකම් ලබන වත්කම නිෂ්පාදනය හා සෘජුවම ආරෝපණය වන ණයගැනීමේ පිරිවැය ප්‍රාග්ධනනීයකරණය කරයි. සුදුසුකම් ලබන වත්කමක් යනු එහි අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සූදානම් කිරිම සඳහා සැලකියයුතු කාලසීමාවක් ලබා ගන්නා වත්කමකි. අනෙකුත් ණයගැනීමේ පිරිවැය ඒවා සුදානම් කාලසීමාවේ දී ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

## 3.9 වර්තන බදු

"ආදායම් බදු වියදම්" පිළිබඳ විස්තර 175 සිට 178 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 17 හි දක්වේ.

## 3.10 විලම්බිත බදු

"විලම්බිත බදු" පිළිබඳ විස්තර 240 සිට 242 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 43 හි දක්වේ.

## 3.11 වගා රක්ෂණ බදු (CIL)

2013 අංක 12 දරන මූල්‍ය පනතේ 14 වගන්තියේ විධිවිධානවලට අනුව, වගා රක්ෂණ බදු 2013 අප්‍රේල් මස 1 වන දින සිට හඳුන්වා දෙන ලද අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවිය යුතුය. වර්තමානයේ, බදු පසු ලාභයෙන් 1% ක් CIL ගෙවිය යුතුය.

## 3.12 මූල්‍ය සේවා මත බදු

"මූල්‍ය සේවා මත VAT, NBT සහ ණය ආපසු ගෙවීමේ බදු" පිළිබඳ විස්තර 175 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 16 හි දක්වේ.

# 4 – නිකුත් කළ නමුත් බලාත්මක නොවූ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අර්ථ නිරූපණ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූවත් 2020 මාර්තු මස 31 වන දිනට බලාත්මක නොවීය. ඒ අනුව, ගිණුම්කරණ ප්‍රමිති 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගෙන නොමැත.

## SLFRS 17 – රක්ෂණ ගිවිසුම්

SLFRS 17 – "රක්ෂණ ගිවිසුම්" යනු හඳුනාගැනීම සහ අගය කිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණ ආවරණය කරන රක්ෂණ ගිවිසුම් සඳහා නව ගිණුම්කරණ ප්‍රමිතියකි. එය බලාත්මක වූ පසු, දැනට පවත්නා SLFRS 4 "රක්ෂණ ගිවිසුම්" වෙනුවට SLFRS 17 ක්‍රියාත්මක වේ. SLFRS 17 හි සමස්ත පරමාර්ථය වන්නේ යම් ආයතනයක් සියලුම ගිවිසුම් සම්බන්ධ විශ්වාසවන්තව නියෝජනය කරන අදාළ තොරතුරු ලබාදෙන බව සහතික කිරීමයි. මෙම තොරතුරු රක්ෂණ ගිවිසුම් ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ මත ඇති බලපෑම තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් සඳහා පදනමක් ලබාදේ.

SLFRS 17 2021 ජනවාරි මස 1 වන හෝ ඊට පසු ආරම්භවන වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා බලාත්මකය. ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – SLFRS 9 "මූල්‍ය උපකරණ" සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 15 "ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්තුළින් ආදායම" යන ප්‍රමිති SLFRS 17 පළමුව යොදා ගන්නා දිනට හෝ ඊට පෙර යොදා ගන්නේනම්, කලින් යොදා ගැනීම සඳහා අවසර ලබා දේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### SLFRS 3: ව්‍යාපාරයක් පිළිබඳ නිර්වචනයට සංශෝධන

2018 නෙවැම්බර්, CA ශ්‍රී ලංකා විසින් ආයතනවලට අත්කරගත් කටයුතු සහ වත්කම් රාශියක් ව්‍යාපාරයක්ද නැද්ද යන්න තීරණය කිරීමට සහයවීම සඳහා SLFRS 3හි ව්‍යාපාරයක් පිළිබඳ නිර්වචනයට සංශෝධන නිකුත් කළේය. මෙම සංශෝධන මගින් ව්‍යාපාරයක් සඳහා අවශ්‍ය අවශ්‍යතා පැහැදිලිකර, වෙළෙඳපොල සහභාගිවන්නන් යම් අහිමි අංග නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ හැකියාව ඇත යන තක්සේරු කිරීම ඉවත් කරමින්, අත්කරගත් ක්‍රියාවලිය ව්‍යාපාරයක් සහ යෙදවුම් පිළිබඳ නිර්වචනය පටුබව ඇගයීමට ආයතනවලට සහයවීමට මඟපෙන්වීම් එකතු කරමින්, විකල්ප සාධාරණ අගයේ සංකේන්ද්‍රණ පරීක්ෂණයක් හඳුන්වා දේ. නව පැහැදිලි කිරීමේ නිදසුන් සංශෝධන සමඟ ලබාදෙන ලදී.

වත්කම අත්කරගැනීම් අදාළ කාලසීමාව හෝ ඉන්පසු සිදුවේනම්, 2020 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික මූල්‍ය කාලසීමාවන් සඳහා සමාගම මෙම සංශෝධන අතීතානුයෝගීව ව්‍යාපාර සංයෝජනවලට යොදා ගනු ඇත.

### LKAS 1 සහ LKAS 8: ද්‍රව්‍ය පිළිබඳ නිර්වචනයට සංශෝධන

2018 නොවැම්බර් මස, CA ශ්‍රී ලංකා විසින් ප්‍රමිති තුළ වැදගත්, පිළිබඳ නිර්වචනය හා ගැලපීමට සහ "නිර්වචනය" යන වචනයයේ සමහර අංග පැහැදිලි කිරීම සඳහා LKAS 1 සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS 8 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂ තුළ වෙනස්වීම්" සඳහා සංශෝධන නිකුත් කරන ලදී. "විශේෂිත වාර්තාකරණ ආයතනයක් පිළිබඳව මූල්‍ය තොරතුරු ලබාදෙන මූල්‍ය ප්‍රකාශනවල පදනම සකස් කරන මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන පරිශීලකයින්ගේ තීරණවලට බලපෑම් කිරීමේ අපේක්ෂාවෙන් තොරතුරු ඉවත් කරන්නේනම්, වැරදියට සඳහන් කරන්නේනම් හෝ අඩුකර දක්වන්නේනම් එය වැදගත් වන බව" නව නිර්වචනය සඳහන් කරයි. සමූහය 2020 ජනවාරි මස 1 වන දින හෝ ඊටපසු ආරම්භ වන කාලපරිච්ඡේදයන් සඳහා එවැනි සංශෝධන අතීතානුයෝගිව යොදා ගනු ඇත.

### මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පමය රාමුවට සංශෝධන

CA ශ්‍රී ලංකා විසින් ප්‍රතිශෝධිත සංකල්පමය රාමුවක් නිකුත් කර ඇති අතර එය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රමිති සැකසීමේ තීරණ තුළ භාවිතා කරනු ලැබේ ප්‍රධාන වෙනස්වීම්වලට පහත කරුණු ඇතුළත්ය:

- – මූල්‍ය වාර්තාකරණයේ පරමාර්ථය තුළ කළමනාකරණයේ ප්‍රමුඛත්වය වැඩි කිරීම
- – නීතිමය ආයතනයක් හෝ ආයතනයක කොටසක් විය හැකි වාර්තාකරණ ආයතනයක් අර්ථ දැක්වීම
- – මධ්‍යස්ථභාවය පිළිබඳ සංරචකයන් ලෙස විචක්ෂණබව නැවත පිහිටුවීම
- – වත්කමක් සහ වගකීමක් පිළිබඳ නිර්වචන ප්‍රතිශෝධනය
- – හඳුනාගැනීම සඳහා සසම්භාවී සීමා ඉවත් කිරීම සහ හඳුනා නොගැනීම පිළිබඳ මඟපෙන්වීම් එකතු කිරීම
- – විවිධ ඇගයීම් පදනම් පිළිබඳ මඟපෙන්වීම් එකතු කිරීම, සහ
- – ලාභය හෝ අලාභය මූලික කාර්යසාධන දර්ශකය වන බවත්, මූලිකවම, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ආදායම සහ වියදම ප්‍රතිචක්‍රිය කළ යුතු අතර එහිදී මූල්‍ය ප්‍රකාශනවල අදාළ සහ විශ්වාසී නියෝජනය වැඩිකරන බවත් සඳහන් කිරීම

පවත්නා ගිණුම්කරණ ප්‍රමිති සඳහා කිසිඳු වෙනස්වීමක් සිදු නොකරනු ලැබේ. කෙසේවෙතත්, ගනුදෙනු සඳහා සමහර ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කිරීමේ රාමුව කෙරෙහි සමූහය විශ්වාසය තබන්නේනම්, ගිණුම්කරණ ප්‍රමිති යටතේ වෙනත් ආකාරයකින් ගනුදෙනු නොකරන සිදුවීම් හෝ කොන්දේසි 2020 ජනවාරි මස 1 වන දින සිට ප්‍රතිශෝධිත රාමුව යොදා ගැනීම අවශ්‍ය වේ. එම ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රතිශෝධිත රාමුව යටතේ තවමත් සුදුසුද යන්න සලකා බැලීම සමූහයට අවශ්‍ය වනු ඇත.

## 5 — දළ ආදායම

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගම/සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒම සිදුවියහැකි ප්‍රමාණයට සහ ආදායම විශ්වාසවන්තව මැනියහැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනී. එක් එක් ආදායම් වර්ගය සඳහා විශේෂ හඳුනාගැනීමේ නිර්ණායක අදාළ ආදායම සටහන් යටතේ දක්වා ඇත.

| | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| පොළී ආදායම | 6.1 | 165 | **31,459,108** | 30,836,300 | **33,282,879** | 32,234,340 |
| ශුද්ධ ඉපයූ වාරිකය | 7 | 166 | **–** | – | **5,202,030** | 4,728,573 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 8 | 167 | **1,694,014** | 1,508,952 | **1,165,632** | 1,004,297 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) – FVTPL | 9 | 168 | **11,017** | (27,887) | **19,586** | (44,351) |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | 10 | 168 | **435,175** | 418,274 | **384,703** | 433,346 |
| **එකතුව** | | | **33,599,314** | 32,735,639 | **40,054,830** | 38,356,205 |

## 6 — ශුද්ධ පොළී ආදායම

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

### ආදායම් සහ වියදම් හඳුනාගැනීම

සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒම සිදුවියහැකි ප්‍රමාණයට සහ ආදායම විශ්වාසවන්තව මැනියහැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනී.

### පොළී ආදායම සහ වියදම

ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද සියලුම මූල්‍ය උපකරණ සඳහා, පොළී ආදායම හෝ වියදම ඵලදායී පොළී අනුපාතය (EIR) භාවිතා කරමින් වාර්තා කෙරේ. මූල්‍ය වත්කම හෝ මූල්‍ය වගකීමේ ශුද්ධ ධාරණ අගයට මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීවකාලය හෝ සුදුසු පරිදි කෙටි කාලයක් තුළින් අපේක්ෂිත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් පැහැදිලිව වට්ටම් කරන අනුපාතය EIR වේ. මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම්ගත නියමයන් (උදා-පෙර ගෙවුම් විකල්ප) ගණනය කිරීමේදී සැලකිල්ලට ගන්නා අතර, උපකරණයට සෘජුවම ආරෝපණය වන ගාස්තු හෝ වැඩිවන පිරිවැය එයට ඇතුළත් වේ. ගිවිසුම්ගත නියමයන් EIR හි අත්‍යවශ්‍ය කොටසකි.

සමූහය එහි ගෙවීම් හෝ ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු වෙනස් කරන්නේනම් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වගකීමේ ශුද්ධ ධාරණ අගය ගලපනු ලැබේ. ගලපන ලද ධාරණ අගය මුල් EIR මත පදනම් වී ගණනය කරන අතර, ධාරණ අගය තුළ වෙනස මූල්‍ය වත්කම් සඳහා පොළී ආදායම සහ මූල්‍ය වගකීම් සඳහා පොළී වියදම ලෙස වාර්තා කෙරේ. කෙසේවෙතත්, සමාගම මුදල් ලැබීම්වල වර්ධිත අයකරගැනීමේ හැකියාවේ ප්‍රතිඵලයක් ලෙස, අනාගත මුදල් ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පසුකාලීනව වැඩිවන නැවත වර්ගීකරණය කළ මූල්‍ය වත්කමක් සඳහා, එම වැඩිකිරීමේ බලපෑම ඇස්තමේන්තුව වෙනස් කළ දිනයේ සිට EIR ට ගැලපීමක් ලෙස හඳුනාගනී.

SLFRS 9 යටතේ, පොළී ආදායම සහ පොළී වියදම් ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද සියලුම මූල්‍ය වත්කම් සඳහා සහ ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද සියලුම මූල්‍ය වගකීම් සඳහා පිළිවෙළින් ඵලදායී පොළී අනුපාතය (EIR) භාවිතා කරමින් වාර්තා කරනු ලබයි.

ගනුදෙනුව හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සිදුවියහැකි ප්‍රමාණයට පමණක් ආදායම හඳුනාගත හැකිය. කෙසේවෙතත්, අයකරගැනීමේ හැකියාව පිළිබඳව අවිනිශ්චිතතාව ඇතිවන අවස්ථාවක, ආදායම හඳුනාගැනීම නතර කළ යුතුය. SLFRS 9 – "මූල්‍ය උපකරණ" යොදා ගැනීමත් සමඟ, ගනුදෙනුකාර පැහැර හැරීමේ සීමාව (අයකරගැනීමේ හැකියාව පිළිබඳව අවිනිශ්චිතතාව) අතීත හිඟ දින 90කට වෙනස් කර ඇත. ඒ අනුව, SLFRS 9 ට අනුකූලව පොළී ආදායම අතීත හිඟ දින 90කට පමණක් හඳුනාගත හැකිය.

## කල්ගිය කුලී මත පොළිය

කල්ගිය කුලීවල පොළී මුදල් ලැබීමේ පදනමක් මත ගණනය කරනු ලැබ ඇත.

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොළී ආදායම | 6.1 | 165 | **31,459,108** | 30,836,300 | **33,282,879** | 32,234,340 |
| පොළී වියදම | 6.2 | 165 | **15,786,586** | 15,646,099 | **16,110,935** | 15,891,298 |
| **ශුද්ධ පොළී ආදායම** | | | **15,672,522** | 15,190,201 | **17,171,944** | 16,343,042 |

## 6.1 පොළී ආදායම – මූල්‍ය වත්කම් අනුව

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| මුදල් සහ මුදලට සමාන දෑ | | | **40,471** | 27,906 | **70,219** | 57,654 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ශේෂ | | | **385,414** | 355,787 | **510,760** | 485,967 |
| ණය සහ ලැබිය යුතු දේ | 6.1.1 | 165 | **30,280,577** | 29,835,673 | **31,530,367** | 30,765,517 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ඇති ණය උපකරණ | | | **752,646** | 616,934 | **1,171,533** | 925,202 |
| **මුළු පොළී ආදායම** | | | **31,459,108** | 30,836,300 | **33,282,879** | 32,234,340 |

### 6.1.1 පොළී ආදායම – ණය සහ ලැබීම්

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | **17,767,878** | 17,887,342 | **17,770,273** | 17,887,448 |
| කුලීපිට ගැණුම්/මුරබා ලැබිය යුතු දේ | **34,709** | 146,178 | **822,222** | 806,600 |
| කාලීනණය සහ ලැබිය යුතු දේ | **12,477,990** | 11,802,153 | **12,937,872** | 12,071,469 |
| **එකතුව** | **30,280,577** | 29,835,673 | **31,530,367** | 30,765,517 |

## 6.2 පොළී වියදම – මූල්‍ය වගකීම් අනුව

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| බැංකු සඳහා ගෙවිය යුතු | 6.2.1 | 166 | **1,736,221** | 4,569,420 | **2,066,943** | 4,857,611 |
| ගනුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු | 6.2.1 | 166 | **11,530,604** | 8,682,552 | **11,595,328** | 8,654,771 |
| නිකුත්කළ ණය සුරැකුම්පත් | 6.2.1 | 166 | **2,281,180** | 2,394,127 | **2,264,940** | 2,378,916 |
| SLFRS 16 – වැඩිවන ණයගැනීමේ පිරිවැය | 41 | 238 | **238,581** | – | **183,724** | – |
| **මුළු පොළී වියදම** | | | **15,786,586** | 15,646,099 | **16,110,935** | 15,891,298 |

### 6.2.1 පොළී වියදම – නිෂ්පාදනය අනුව

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| **බැංකුව සඳහා ගෙවිය යුතු** | | | | |
| බැංකු අයිරා මත පොළිය | **2,511** | 74,473 | **31,811** | 102,062 |
| කෙටි කාලීන ණය මත පොළිය | **286,526** | 1,770,898 | **286,659** | 1,770,901 |
| කාලීන ණය මත පොළිය | **402,721** | 1,525,581 | **704,009** | 1,786,180 |
| සුරැකුම්පත්කරණ ණය මත පොළිය | **1,044,463** | 1,198,468 | **1,044,464** | 1,198,468 |
| **අනු එකතුව** | **1,736,221** | 4,569,420 | **2,066,943** | 4,857,611 |
| **ගනුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු** | | | | |
| තැන්පතු මත පොළී පිරිවැය | **11,530,604** | 8,682,552 | **11,595,328** | 8,654,771 |
| **අනු එකතුව** | **11,530,604** | 8,682,552 | **11,595,328** | 8,654,771 |
| **නිකුත්කළ ණය සුරැකුම්පත්** | | | | |
| ණයකර මත පොළිය | **2,281,180** | 2,394,127 | **2,264,940** | 2,378,916 |
| **අනු එකතුව** | **2,281,180** | 2,394,127 | **2,264,940** | 2,378,916 |
| **කල්බදු වගකීම්** | | | | |
| SLFRS 16 – වැඩිවන ණයගැනීමේ පිරිවැය | **238,581** | – | **183,724** | – |
| **අනු එකතුව** | **238,581** | – | **183,724** | – |
| මුළු පොළී වියදම | **15,786,586** | 15,646,099 | **16,110,935** | 15,891,298 |

## 7 — ශුද්ධ ඉපයුම් වාරිකය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

### රක්ෂණය සහ ආයෝජන ගිවිසුම් නිෂ්පාදන වර්ගීකරණය

SLFRS 4 – "රක්ෂණ ගිවිසුම්" අනුව මාරුකරන ලද රක්ෂණ අවදානම මත පදනම් වෙමින් "රක්ෂණ ගිවිසුම්" හෝ "ආයෝජන ගිවිසුම්" ලෙස වර්ගීකරණය කිරීම සඳහා රක්ෂකයාගෙන් ලිඛිත ගිවිසුම් අවශ්‍ය වේ.

රක්ෂණ ගිවිසුම් යනු විශේෂිත අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීම) අහිතකර ලෙස ඔප්පුහිමියන් කෙරෙහි බලපාන්නේනම්, ඔප්පු හිමියන්ට වන්දි ගෙවීමට එකඟවෙමින් වෙනත් පාර්ශ්වයක (ඔප්පු හිමියන්) සැලකියයුතු රක්ෂණ අවදානම සමාගම (රක්ෂකයා) භාරගෙන ඇති ගිවිසුම් වේ. සාමාන්‍ය මගපෙන්වීමක් ලෙස, රක්ෂිත සිදුවීම සිදුනොවූයේනම් ගෙවිය යුතු ප්‍රතිලාභ සමඟ ගෙවනු ලබන ප්‍රතිලාභ සංසන්දනය කරමින් සැලකියයුතු රක්ෂණ අවදානමක් තිබේද යන්න සමාගම තීරණය කරයි.

ආයෝජන ගිවිසුම් යනු සැලකියයුතු මූල්‍ය අවදානමක් මාරුකරන සහ සැලකියයුතු රක්ෂණ අවදානමක් නොමැති ගිවිසුම්ය. මූල්‍ය අවදානම යනු මූල්‍ය නොවන විචල්‍යතා ගිවිසුමක පාර්ශ්වයකට විශේෂ නොවන අවස්ථාවක, විශේෂිත පොළී අනුපාත, මූල්‍ය උපකතරණ මිල, වෙළෙඳ ද්‍රව්‍ය මිල, විනිමය හුවමාරු අනුපාතය, මිල දර්ශක හෝ අනුපාත, ණය ශ්‍රේණිගතකරණය හෝ ණය දර්ශක හෝ වෙනත් විචල්‍යතාවන් එකක හෝ කිහිපයක වියහැකි අනාගත වෙනසක් පිළිබඳ අවදානමයි.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කිරීමෙන් පසු, සියලුම අයිතිවාසිකම් සහ බැඳීම් ශුන්‍ය වන හෝ කල්පිරෙන්නේනම් මිස මෙම කාලසීමාව තුළ රක්ෂණ අවදානම සැලකියයුතු ලෙස අඩුවුවද, එහි ජීව කාලයේ ඉතිරි කාලසීමාව සඳහා රක්ෂණ ගිවිසුමක් පවතී. කෙසේවෙතත්, ආයෝජන ගිවිසුම්වල රක්ෂණ අවදානම් වැදගත් බවට පත්වන්නේනම් ආරම්භයෙන් පසු රක්ෂණ ගිවිසුමක් ලෙස නැවත වර්ගීකරණය කළ හැකිය.

පීපල්ස් ලීසිං ඉන්ෂුවරන්ස් පී.එල්.සී. (PLC හි පාරිපාලිත සමාගම) විසින් අලෙවිකළ සියලුම නිෂ්පාදන රක්ෂණ ගිවිසුම්වන අතර එමනිසාම SLFRS 4 – "රක්ෂණ ගිවිසුම්" යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කෙරේ. මේ අනුව, වාර්තාකරණ දිනයට සමාගමට එහි නිෂ්පාදන කළඹ තුළ කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

## දළ කපාහරින ලද වාරිකයේ ආදායම් හඳුනාගැනීම

දළ කපාහරින ලද වාරිකයේ (GWP) යන්නෙන් ප්‍රතිරක්ෂණ අවදානම් සඳහා සමාගම විසින් අයකළ වාරික නියෝජනය කරයි. GWP උපචිත පදනම මත ගණනය කරනු ලබයි.

ගිණුම්කරණ කාලසීමාව තුළ ඇතුළත් වූ ගිවිසුම් මගින් ලබාදෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව සඳහා ලද/ලැබියයුතු මුළු වාරිකවලින් දළ ලිඛිත වාරිකය සමන්විත වන අතර ඔප්පුව හඳුනාගන්නා දිනය මත හඳුනාගනී.

හිමිකම් නොකියන ලද ප්‍රතිදාන වැනි වාරිකවල කොටසක් සාදන ප්‍රතිදාන වලින් GWP අඩු කෙරේ.

## රක්ෂණය – දළ කපාහරින ලද වාරිකයේ ආදායම් හඳුනාගැනීම

ගිණුම්කරණ කාලසීමාව තුළ ඇතුළත් වූ ගිවිසුම් මගින් ලබාදෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව සඳහා ලැබියයුතු මුළු වාරිකවලින් ජීවිත නොවන රක්ෂණ ලිඛිත වාරිකය සමන්විත වන අතර ඔප්පුව හඳුනාගන්නා දිනය මත හඳුනාගනී.

## ප්‍රතිරක්ෂණ වාරිකය

කාලසීමාව තුළ ඇතුළත් වූ ගිවිසුම් මගින් ලබාදෙන සම්පූර්ණ ආවරණය සඳහා ගෙවියයුතු මුළු වාරිකවලින් ජීවිත නොවන ප්‍රතිරක්ෂණ ලිඛිත වාරිකය සමන්විත වන අතර, ඔප්පුව හඳුනාගන්නා දිනය මත හඳුනාගනී. පෙර ගිණුම්කරණ කාලසීමාව තුළ ආරම්භ කළ ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාලසීමාව තුළ ඇතිවන යම් ගැලපීම් වාරිකවල ඇතුළත්ය.

## නොඉපයූ වාරික සංචිතය

නොඉපයූ වාරික සංචිතය වසර තුළ ලියන ලද නමුත් ආවරණයේ කල් ඉකුත් නොවූ කාලයට අදාළවන වාරිකයේ කොටස නියෝජනය කරයි. නොඉපයූ වාරික 365 පදනම මත ගණනය කෙරේ.

## නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතය

නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය යනු වාර්තා කරන දිනයෙන් පසු අවදානමේ කාලසීමාවන්ට අදාළ වසරක් තුළ ලියන ලද වාරික වල කොටස වේ. නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික පාදක වූ ඍජු රක්ෂණ ඔප්පුවේ කාලය පුරා විලම්බනය කෙරේ.

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | **2020 රු. '000** | 2019 රු. '000 | **2020 රු. '000** | 2019 රු. '000 |
| දළ කපාහරින ලද වාරිකය | **–** | – | **5,958,629** | 5,666,450 |
| අඩුකළා: ප්‍රතිරක්ෂකයින්ට පවරා දෙන ලද වාරිකය | **–** | – | **631,221** | 525,790 |
| අඩුකළා: නොඉපයූ වාරික සංචිතය තුළ වෙනස | **–** | – | **125,378** | 412,087 |
| **එකතුව** | **–** | – | **5,202,030** | 4,728,573 |

## 8 ගාස්තු සහ කොමිස් ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

### ගාස්තු සහ කොමිස් ආදායම

සමූහය ගනුදෙනුකරුවන්ට ලබාදෙන විවිධ සේවා රාශියක් තුළින් ගාස්තු සහ කොමිස් ආදායම උපයනු ලබයි. කොමිස් ආදායම උපචිත පදනම මත හඳුනාගනී. ගාස්තු ආදායම පහත සඳහන් වර්ගීකරණ දෙකට බෙදා දැක්විය හැක:

### නිශ්චිත කාලසීමාවක් පුරා ලබාදෙන සේවාවන්ගෙන් උපයන ලද ගාස්තු ආදායම

යම් කාලසීමාවක් තුළ සේවා ලබාදීම වෙනුවෙන් උපයන ගාස්තු එම කාලය තුළ රැස් කරනු ලබයි.

### ගනුදෙනු සේවා ලබාදීමෙන් ලැබෙන ගාස්තු ආදායම

මෝටර් රථයක ලියකියවිලි සූදානම් කිරීම සහ පරීක්ෂණය වැනි යම් තෙවැනි පාර්ශ්වයක් සඳහා ගනුදෙනුවක සාකච්ඡාව තුළ සාකච්ඡා කිරීම හෝ සහභාගිවීමෙන් ඇතිවන ගාස්තු පාදක ගනුදෙනුව සම්පූර්ණවීම මත හඳුනාගනී. කිසියම් කාර්යසාධනකයට සම්බන්ධ ගාස්තු හෝ සංරචක අනුරූප නිර්ණායක සම්පූර්ණ කිරීමෙන් පසු හඳුනාගනී.

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| සේවා ගාස්තු | **642,507** | 620,031 | **201,485** | 197,171 |
| වෙනත් ගාස්තු සහ කොමිස් | **1,051,507** | 888,921 | **964,147** | 807,126 |
| **එකතුව** | **1,694,014** | 1,508,952 | **1,165,632** | 1,004,297 |

## 9 – ගාස්තු සහ කොමිස් ආදායම – FVTPL

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය වත්කම් – ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම් සඳහා උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ සාධාරණ අගයේ වෙනස්වීම් ඇතුළුව සාධාරණ අගය තුළ වෙනස්වීම්වලින් ඇතිවන සියලුම ලාභ හෝ අලාභ මෙහි ඇතුළත්ය.

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| **මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය)** – FVTPL | | | | |
| ශුද්ධ වෙළෙඳපොලට සලකුණු (අලාභ)/ඉපයීම් | **4,772** | (24,915) | **11,448** | (57,981) |
| ශුද්ධ ප්‍රාග්ධන ඉපයීම් | **6,245** | (2,972) | **8,138** | 13,630 |
| **එකතුව** | **11,017** | (27,887) | **19,586** | (44,351) |

## 10 – අනෙකුත් මෙහෙයුම් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් මෙහෙයුම් ආදායමට සමූහයේ සාමාන්‍ය මෙහෙයුම්වලට සෘජුවම අදාළ නොවන වෙනත් මූලාශ්‍රවලින් උපයනු ලබන ආදායම ඇතුළත් වන අතර උපචිත පදනම මත හඳුනාගනී.

### ලාභාංශ ආදායම

ලාභාංශ ආදායම ගෙවීම ලබාගැනීමේ අයිතිය තහවුරු වන අවස්ථාවේදී හඳුනාගනී.

### මෝටර් රථ අලෙවියෙන් ශුද්ධ වෙළෙඳ ආදායම

ආනයනය කළ මෝටර් රථ අලෙවියෙන් ලද ආදායම සාමාන්‍යයෙන් මෝටර් රථය බැහැර කරන එනම් මිලදී ගන්නා වෙත මෝටර් රථයේ හිමිකාරත්වයේ වැදගත් අවදානම් සහ ප්‍රදාන මාරුකර ඇති අවස්ථාවේදී හඳුනාගනී.

### මෙහෙයුම් කල්බදු ආදායම

මෙහෙයුම් කල්බදු මත ඇතිවන ආදායම ඉදිරියට යන කල්බදු මත කල්බදු කාසීමාව පුරා සරල මාර්ගික පදනමක් මත ගණනය කරනු ලබන අතර අනෙකුත් මෙහෙයුම් ආදායම තුළ ලාභාලාභ ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ.

### අයකරගත් බොල් ණය

බොල් සහ අඩමාණ ණය ලෙස කපාහරින ලද ප්‍රමාණය අයකරගැනීම මුදල් පදනමක් මත හඳුනාගනී.

### දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලාභ හෝ අලාභ

දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ඇති වූ ලාභ හෝ අලාභ එම විකිණීම සිදු වූ කාලසීමාව තුළ ලාභාලාභ ප්‍රකාශනයෙහි මුදල් පදනමක් මත ගණනය කෙරේ.

### කුලී ආදායම

මෝටර් රථ කුලියට දීමෙන් ලද කුලී ආදායම වසර සඳහා හිමිකරු සහ කුලීකරු අතර ඇතුළත් වූ ගිවිසුම මත පදනම් වි ලාභාලාභ ප්‍රකාශනයෙහි හඳුනාගනී.

### තක්සේරු කිරීමේ ආදායම

තක්සේරු කිරීමේ ආදයම මුදාහරින හෝ මුදාහැරිය හැකි අවස්ථාවේදී හඳුනාගනී.

### රක්ෂණ ගාස්තු ආදායම

රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් ඔප්පු පරිපාලන සේවා සහ වෙනත් ගිවිසුම් ගාස්තු අයකරනු ලබයි. මෙම ගාස්තු ලැබීම හෝ එසේ පත්වන අවස්ථාවේදී ආදායම ලෙස හඳුනාගනී.

### වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමක් මත හඳුනාගනී.

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020<br>රු. '000 | 2019<br>රු. '000 | 2020<br>රු. '000 | 2019<br>රු. '000 |
| දේපල, පිරියත සහ උපකරණ අලෙවිය මත ලාභය | **6,183** | 19,645 | **6,183** | 26,625 |
| කුලී ආදායම | **–** | – | **26,583** | 26,888 |
| මෙහෙයුම් කල්බදු ආදායම | **–** | – | **29,061** | 23,074 |
| ආයෝජන දේපලවලින් කුලී ආදායම | **–** | – | **90,284** | 92,884 |
| මෝටර් රථ අලෙවියෙන් ශුද්ධ වෙළෙඳ ආදායම | **301** | 2,704 | **301** | 3,575 |
| ලාභාංශ ආදායම – FVOCI | **14,658** | 10,508 | **14,658** | 10,508 |
| – පරිපාලිත සමාගම් | **406,750** | 375,766 | **–** | – |
| – FVTPL | **1,683** | 2,671 | **2,622** | 6,061 |
| ආයෝජන දේපල අලෙවිය මත ලාභ /(අලාභ) | **–** | 6,980 | **–** | 6,980 |
| තක්සේරු කිරීමේ ආදායම | **–** | – | **108,448** | 100,969 |
| රක්ෂණ ගාස්තු ආදායම | **–** | – | **54,838** | 51,224 |
| වෙනත් ආදායම් | **5,600** | – | **51,725** | 84,558 |
| **එකතුව** | **435,175** | 418,274 | **384,703** | 433,346 |

## 11 ණය සහ ලැබීම් සඳහා අපහායනය සහ වෙනත් අලාභ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමාගම සහ සමූහය SLFRS 9 – "මූල්‍ය උපකරණ" යටතේ තක්සේරු කරන ණය සහ ලැබීම් සඳහා අපහායන වෙන්කිරීම තුළ වෙනස්වීම් හඳුනාගනී. සමාගම සහ සමූහය භාවිතා කළ ක්‍රමවේදය මෙම මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 25 හි පැහැදිලි කෙරේ.

### කපාහැරීම් ඇතුළුව ඇප බැහැරකිරීමේ අලාභ

අයකරගැනීම සම්බන්ධයෙන් යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට ණය සහ ලැබීම් (සහ අදාළ හානිකරණ දීමනා ගිණුම්) සම්පූර්ණයෙන් හෝ කොටස් ලෙස සාමාන්‍යයෙන් කපා හරිනු ලබයි. ණය සහ ලැබීම් ඇපවලින් සුරකින අවස්ථාවක, ඇප මුදාහැරීමෙන් ලැබෙන මුදල් ලබාගැනීමෙන් පසුව සාමාන්‍යයෙන් සිදුවේ.

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| ණය සහ ලැබිය යුතු දේ මත අපහායනය | | | | | | |
| තනි තනි අපහායනය | 11.3/11.4 | 171 | **839,570** | 194,262 | **952,300** | 194,262 |
| සාමූහික අපහායනය | 11.3/11.4 | 171 | **2,966,326** | 799,059 | **2,940,618** | 905,371 |
| අනෙකුත් ලැබිය යුතු දේ | | | **–** | – | **34,346** | 15,385 |
| කපාහැරීම් ඇතුළුව ඇප මුදාහැරීම මත අලාභ | | | **953,786** | 728,458 | **1,090,659** | 728,458 |
| කපාහැරි ණය/බැහැරකිරීමේ අලාභ අයකරගැනිම් | | | **(112,999)** | (135,273) | **(116,021)** | (135,273) |
| **එකතුව** | 11.1/11.2 | 170 | **4,646,683** | 1,586,506 | **4,901,902** | 1,708,203 |

## 11.1 ණය සහ ලැබීම් සඳහා අපහායන අයකිරීම (ආපසු හැරවීම) සහ වෙනත් අලාභඃ විස්තරාත්මක ප්‍රභේදනය) – සමාගම

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2020 බැහැරහැරීමේ අලාභ/කපාහැරීම් (අයකරගැනීමෙන් පසු) රු. '000 | හානිකරණ අයකිරීම රු. '000 | හානිකරණය (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ මුදල රු. '000 |
|---|---|---|---|---|
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | **586,795** | **2,524,239** | **(829,916)** | **2,281,118** |
| කුලීපිට ගැණුම්/මුරබා ලැබිය යුතු දේ | **(9,027)** | **58,737** | **(11,526)** | **38,184** |
| කාලීනණය සහ ලැබිය යුතු දේ | **263,019** | **3,065,761** | **(1,001,399)** | **2,327,381** |
| **එකතුව** | **840,787** | **5,648,737** | **(1,842,841)** | **4,646,683** |

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2019 බැහැරහැරීමේ අලාභ/කපාහැරීම් (අයකරගැනීමෙන් පසු) රු. '000 | හානිකරණ අයකිරීම රු. '000 | හානිකරණය (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ මුදල රු. '000 |
|---|---|---|---|---|
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | 402,752 | 1,207,248 | (822,962) | 787,038 |
| කුලීපිට ගැණුම්/මුරබා ලැබිය යුතු දේ | 38,955 | 26,602 | (75,634) | (10,077) |
| කාලීනණය සහ ලැබිය යුතු දේ | 151,478 | 1,747,013 | (1,088,946) | 809,545 |
| **එකතුව** | 593,185 | 2,980,863 | (1,987,542) | 1,586,506 |

## 11.2 ණය සහ ලැබීම් සඳහා අපහායන අයකිරීම (ආපසු හැරවීම) සහ වෙනත් අලාභඃ විස්තරාත්මක ප්‍රභේදනය) – සමූහය

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2020 බැහැරහැරීමේ අලාභ/කපාහැරීම් (අයකරගැනීමෙන් පසු) රු. '000 | හානිකරණ අයකිරීම රු. '000 | හානිකරණය (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ මුදල රු. '000 |
|---|---|---|---|---|
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | **720,646** | **2,524,239** | **(829,916)** | **2,414,969** |
| කුලීපිට ගැණුම්/මුරබා ලැබිය යුතු දේ | **(9,027)** | **210,150** | **(11,526)** | **189,597** |
| කාලීනණය සහ ලැබිය යුතු දේ | **263,019** | **3,089,724** | **(1,089,753)** | **2,262,990** |
| අනෙකුත් ලැබිය යුතු දේ | **–** | **34,346** | **–** | **34,346** |
| **එකතුව** | **974,638** | **5,858,459** | **(1,931,195)** | **4,901,902** |

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2019 | | | |
|---|---|---|---|---|
| | බැහැරහැරීමේ අලාභ/කපාහැරීම් (අයකරගැනීමෙන් පසු) රු. '000 | හානිකරණ අයකිරීම රු. '000 | හානිකරණය (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ මුදල රු. '000 |
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | 402,752 | 1,207,248 | (822,962) | 787,038 |
| කුලීපිට ගැණුම්/මුරබා ලැබිය යුතු දේ | 38,955 | 26,602 | (11,982) | 53,575 |
| කාලීනණය සහ ලැබිය යුතු දේ | 151,478 | 1,853,325 | (1,152,598) | 852,205 |
| අනෙකුත් ලැබිය යුතු දේ | – | 15,385 | – | 15,385 |
| **එකතුව** | 593,185 | 3,102,560 | (1,987,542) | 1,708,203 |

## 11.3 ආදායම් ප්‍රකාශයට අපහායන අයකිරීම (ආපසු හැරවීම) – සමාගම

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2020 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 රු. '000 | අදියර 2 රු. '000 | අදියර 3 රු. '000 | එකතුව රු. '000 |
| **ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ ලැබීම්** | | | | |
| තනි තනි හානිකරණය | **–** | **–** | **839,570** | **839,570** |
| සාමූහික හානිකරණය | **(18,943)** | **499,561** | **2,485,708** | **2,966,326** |
| **එකතුව** | **(18,943)** | **499,561** | **3,325,278** | **3,805,896** |

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2019 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 රු. '000 | අදියර 2 රු. '000 | අදියර 3 රු. '000 | එකතුව රු. '000 |
| **ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතු දේ** | | | | |
| තනි තනි අපහායනය | – | – | 194,262 | 194,262 |
| සාමූහික අපහායනය | 49,497 | 172,842 | 576,720 | 799,059 |
| **එකතුව** | 49,497 | 172,842 | 770,982 | 993,321 |

## 11.4 ආදායම් ප්‍රකාශයට අපහායන අයකිරීම (ආපසු හැරවීම) – සමාගම

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2020 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 රු. '000 | අදියර 2 රු. '000 | අදියර 3 රු. '000 | එකතුව රු. '000 |
| **ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතු දේ** | | | | |
| තනි තනි අපහායනය | **–** | **–** | **952,300** | **952,300** |
| සාමූහික අපහායනය | **9,901** | **602,968** | **2,327,749** | **2,940,618** |
| **එකතුව** | **9,901** | **602,968** | **3,280,049** | **3,892,918** |

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2019 අදියර 1 රු. '000 | අදියර 2 රු. '000 | අදියර 3 රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතු දේ** | | | | |
| තනි තනි අපහායනය | – | – | 194,262 | 194,262 |
| සාමූහික අපහායනය | 71,080 | 200,328 | 633,963 | 905,371 |
| **එකතුව** | 71,080 | 200,328 | 828,225 | 1,099,633 |

## 12 — කාර්ය මණ්ඩල වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කාර්ය මණ්ඩල වියදම්වලට වැටුප්, ප්‍රසාද දීමනා, අවසාන ප්‍රතිලාභ අයකිරීම් සහ අනෙකුත් අදාළ වියදම් ඇතුළත්ය. ප්‍රසාද දීමනාව සඳහා වෙන්කිරීම බැඳීම නිරවුල් කිරීමට අවශ්‍ය කරන ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටවයාමක් සිදුවියහැකි සහ බැඳීමේ ප්‍රමාණය මත විශ්වාසවන්ත ඇස්තමේන්තුවක් සිදුකළ හැකි අවස්ථාවේදී හඳුනාගනී.

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව, සේවකයින් අදාළ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවානියුක්ති භාරකාර අරමුදල (ETF) සඳහා දායකවීමට හිමිකම් ලබයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 19 – "සේවක ප්‍රතිලාභ" වලට අනුකූලව පාරිතෝෂික වගකීම සඳහා සිදුකරන ආයුගණක තක්සේරුවක් මත පදනම් වී ලාභාලාභ ප්‍රකාශනය තුළ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම හඳුනාගනී.

| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | | | **3,361,639** | 3,143,641 | **4,152,846** | 3,813,087 |
| සේවක ප්‍රතිලාභය අර්ථ දක්වන ලද දායක සැලසුම් – EPF | | | **182,755** | 163,148 | **227,447** | 200,849 |
| සේවක ප්‍රතිලාභය – අර්ථ දක්වන ලද දායක සැලසුම් – ETF | | | **45,666** | 40,784 | **56,229** | 51,347 |
| සේවක ප්‍රතිලාභය – විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් – පාරිතෝෂික | 44.1 | 244 | **111,325** | 90,594 | **124,504** | 101,335 |
| **එකතුව** | | | **3,701,385** | 3,438,167 | **4,561,026** | 4,166,618 |

## 13 — ක්ෂයවීම සහ ක්‍රමක්ෂය

### ක්ෂය කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ජීව කාලය පුරා සරල මාර්ගික පදනමක් මත ක්ෂයකිරීම ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගන්නා අතර මෙම පදනම වත්කමේ ඇතුළත් අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාවන් වඩාත් සමීපව පිළිබිඹු කරයි. ඉඩම් ක්ෂය නොකරනු ලැබේ.

ඇස්තමේන්තුගත ජීව කාලය පහත පරිදි වේ:

| වත්කම පන්තිය | වර්ෂයකට ප්‍රතිශතය | කාලසීමාව අවුරුදු |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2 | 50 |
| සින්නක්කර දේපල හානිකරණය | 25 | 4 |
| මෝටර් රථ | 12.5-20 | 5-8 |
| පරිගණක දෘඩාංග | 20 | 5 |
| කාර්යාල උපකරණ | 10-20 | 5-10 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 20 | 5 |

ඉහත සඳහන් අනුපාත සමූහයේ සියලුම ආයතන විසින් ස්ථිරව භාවිතා කරයි. ක්ෂයකිරීමේ අනුපාත දේපල, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් සැලකියයුතු කොටසක් සඳහා වෙන වෙනම තීරණය කරන අතර එය භාවිතයට ලබාගන්නා අවස්ථාවේදී ක්ෂයකිරීම ආරම්භ කරයි. එනම් කළමනාකරණය විසින් අපේක්ෂා කරන ආකාරයෙන් මෙහෙයුම් කිරීම සඳහා අවශ්‍යවන ස්ථානය සහ හැකියාව තුළ එය පවතින අවස්ථාවයි. යම් වත්කමක් ක්ෂයකිරීම එම වත්කම අලෙවිය සඳහා තබා ඇති බවට වත්කම වර්ගීකරණය කරන දිනයට පෙර හෝ වත්කම හඳුනානොගන්නා දිනයේදී නතර කරනු ලබයි. ක්ෂයකිරීමේ ක්‍රම, ඵලදායී ජීව කාල සහ සුන්බුන් වටිනාකම් වාර්තාකරණ දිනයට ඇගයීමට ලක් කරන අතර අවශ්‍යනම් ගැලපුම් සිදු කෙරේ.

සියලුම පන්තිවල දේපල, පිරියත සහ උපකරණ සමඟ ඒවායේ ධාරණ අගයන් සැසඳීම සහ වර්ෂය ආරම්භයේදී සහ වර්ෂය අවසානයේදී සමුච්චිත ක්ෂයකිරීම 220 සිට 225 දක්වා පිටුවල සටහන් 32 හි දැක්වේ.

### අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය

පහත දකවා ඇති අනුපාතවලට වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා ඒවායේ සුන්බුන් වටිනාකමට අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය පොතට ඇතුළත් කිරීම සඳහා සරල මාර්ගික ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලබයි:

| වත්කම පන්තිය | වර්ෂයකට ප්‍රතිශතය | කාලසීමාව අවුරුදු |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | **20** | 5 |

සීමිත ජීව කාලය සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය නොකළ ශේෂ වාර්ෂිකව සහ හානිකරණය පිළිබඳ සඳහනක් ඇති අවස්ථාවලදී සමාලෝචනය කරනු ලබන අතර, අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ තවදුරටත් අයකරගත නොහැකි ප්‍රමාණයට ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

සියලුම පන්තිවල අස්පෘශ්‍ය වත්කම් සමඟ ඒවායේ ධාරණ අගයන් සැසඳීම සහ වර්ෂය ආරම්භයේදී සහ වර්ෂය අවසානයේදී සමුච්චිත ක්ෂයකිරීම 225 සිට 227 දක්වා පිටුවල සටහන් 33 හි දැක්වේ.

| | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | **2020 රු. '000** | 2019 රු. '000 | **2020 රු. '000** | 2019 රු. '000 |
| දේපල, පිරියත සහ උපකරණවල ක්ෂයකිරීම | 32 | 220 | **164,492** | 166,006 | **292,404** | 286,193 |
| ක්‍රමක්ෂය – භාවිතයට අයිතිය ඇති වත්කම් | 34 | 227 | **538,230** | 3,066 | **332,830** | 3,066 |
| අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය | 33 | 225 | **14,299** | 10,535 | **10,764** | 13,101 |
| **එකතුව** | | | **717,021** | 179,607 | **635,998** | 302,360 |

## 14 ප්‍රතිලාභ, හිමිකම් සහ ප්‍රාරක්ෂණ වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

### දළ හිමිකම් හඳුනාගැනීම

ජීවිත නොවන රක්ෂණය සඳහා දළ හිමිකම්පෑම්වලට වාර්තා වුවද, නොවුවද වසර තුළ සිදුවූ සියලුම හිමිකම්පෑම්, හිමිකම්පෑම් පිරිසැකසුම සහ නිරවුල් කිරීමට සෘජුව සම්බන්ධවන අදාළ බාහිර හිමිකම්පෑම් මෙහෙයවීමේ පිරිවැය, ගොඩගැනුමේ වටිනාකම සඳහා අඩුකිරීමක් සහ අනෙකුත් අයකරගැනීම සහ පසුගිය වසරේ සිට හිඟව පවත්නා හිමිකම්පෑම් සඳහා යම් ගැලපීම් ඇතුළත් වේ. හිඟව පවත්නා හිමිකම්පෑම් තනි තනි හිමිකම්පෑම් ගොනු සමාලෝචනය කරමින් සහ හිමිකම්පෑම් නිරවුල් කිරීමේ අවසාන පිරිවැයෙහි වෙනස්වීම ඇස්තමේන්තු කරමින් අගය කරනු ලබයි.

අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ පසුකාලීන වියදම ප්‍රාග්ධනනීය කරනු ලබන්නේ එයට අදාළ විශේෂිත වත්කමේ ඇතුළත් අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි වන්නේනම් පමණි.

### ඵලදායී ආර්ථික ජීව කාලය, ක්‍රමක්ෂය සහ හානිකරණය

අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ආර්ථික ජීව කාලය නියත හෝ අනියත වේයයි තක්සේරු කෙරේ.

නියත ජීව කාලය සහිත අස්පෘශ්‍ය වත්කම් ඵලදායී ආර්ථික ජීව කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. නියත ජීව කාලය සහිත අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය එක් එක් මූල්‍ය වසරේදී සමාලෝචනය කෙරේ. වත්කමට ඇතුළත් අපේක්ෂිත ඵලදායී ජීව කාලය හෝ එහි අනාගත ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් ගණනය කරන අතර LKAS 8 ට අනුව ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස සලකනු ලබයි. නියත ජීව කාලය සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය පිරිවැය අස්පෘශ්‍ය වත්කමක කාර්යයට අනුරූප වියදම් වර්ගීකරණය තුළ ලාභාලාභ ප්‍රකාශනයෙහි හඳුනාගනී.

පහත දක්වා ඇති අනුපාත පරිදි අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ආර්ථික ජීව කාලය තුළ ඒවායේ සුන්බුන් වටිනාකමට අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය ලියාහැරීම සඳහා සරල මාර්ගික ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය ගණනය කරනු ලබයි:

| වත්කම් පන්තිය | වර්ෂයට % | කාලසීමාව |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 20 | 5 වසර |

නියත ජීව කාලය සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය නොකළ ශේෂ වාර්ෂිකව සහ හානිකරණය පිළිබඳ සඳහනක් ඇති අවස්ථාවලදී හානිකරණය සඳහා සමාලෝචනය කරන අතර අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ තවදුරටත් ලබාගත නොහැකි වන ප්‍රමාණය දක්වා ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

පරිපාලිත සමාගම අත්කර ගැනීම මත ඇතිවන කීර්තිනාමය අස්පෘශ්‍ය වත්කම්වල ඇතුළත් කෙරේ. කීර්තිනාමය මූලිකවම පිරිවැයට මනිනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසු, සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට කීර්තිනාමය මනිනු ලබයි. ස්කන්ධයට වගකියන ආයෝජකයින් සම්බන්ධයෙන්, කීර්තිනාමයේ ධාරණ අගය ආයෝජනයේ ධාරණ අගය තුළ ඇතුළත් කරන අතර, එවැනි ආයෝජනයක හානිකරණයක් ස්කන්ධයට වගකියන ආයෝජකයින්ගේ ධාරණ අගයේ කොටසක් සදන කීර්තිනාමය ඇතුළුව ඕනෑම වත්කමකට වෙන් කරනු ලබයි.

නියත ජීව කාලය සහිත කීර්තිනාමය වාර්ෂිකව හානිකරණය සඳහා තක්සේරු කෙරේ. නියත ජීවිතය පිළිබඳ තක්සේරුව නියත ජීවිතය අඛණ්ඩව සහයවන්නේද යන්න තීරණය කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

## හඳුනානොගැනීම

අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීම මත හෝ එහි භාවිතය තුළ කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපෙක්ෂා කළ නොහැකි අවස්ථාවේදී හඳුනා නොගනී. වත්කම හඳුනානොගැනීම මත ඇතිවන ලාභ හෝ අලාභ (බැහැර කිරීමේ ලද ශුද්ධ මුදල් සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම හඳුනානොගන්නා වර්ෂය තුළ ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

| | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | පරිගණක මෘදුකාංග රු. '000 | කීර්තිනාමය රු. '000 | එකතුව රු. '000 | පරිගණක මෘදුකාංග රු. '000 | කීර්තිනාමය රු. '000 | එකතුව රු. '000 |
| **පිරිවැය** | | | | | | |
| 2019 අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | 184,794 | 308,545 | 493,339 | 206,765 | 417,099 | 623,864 |
| එකතුකිරීම් | 15,120 | – | 15,120 | 15,120 | – | 15,120 |
| විනිමය අනුපාත වෙනස්වීම | – | – | – | 336 | – | 336 |
| **2020 මාර්තු මස 31 වන දිනට ශේෂය** | **199,914** | **308,545** | **508,459** | **222,221** | **417,099** | **639,320** |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයකිරීම** | | | | | | |
| 2019 අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | 148,854 | 19,580 | 168,434 | 171,944 | 19,580 | 191,524 |
| ක්‍රමක්ෂය | 14,299 | – | 14,299 | 10,764 | – | 10,764 |
| හානිකරණය | – | 68,145 | 68,145 | – | 68,145 | 68,145 |
| විනිමය අනුපාත වෙනස්වීම | – | – | – | 313 | – | 313 |
| **2020 මාර්තු මස 31 වන දිනට ශේෂය** | **163,153** | **87,725** | **250,878** | **183,021** | **87,725** | **270,746** |
| **2020 මාර්තු මස 31 වන දිනට ශුද්ධ පොත් වටිනාකම** | **36,761** | **220,820** | **257,581** | **39,200** | **329,374** | **368,574** |

| | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | පරිගණක මෘදුකාංග රු. '000 | කීර්තිනාමය රු. '000 | එකතුව රු. '000 | පරිගණක මෘදුකාංග රු. '000 | කීර්තිනාමය රු. '000 | එකතුව රු. '000 |
| **පිරිවැය** | | | | | | |
| 2018 අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | 176,170 | 308,545 | 484,715 | 194,533 | 417,099 | 611,632 |
| එකතුකිරීම් | 8,624 | – | 8,624 | 12,195 | – | 12,195 |
| විනිමය අනුපාත වෙනස්වීම | – | – | – | 37 | – | 37 |
| **2019 මාර්තු මස 31 වන දිනට ශේෂය** | 184,794 | 308,545 | 493,339 | 206,765 | 417,099 | 623,864 |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයකිරීම** | | | | | | |
| 2018 අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | 138,320 | – | 138,320 | 158,749 | – | 158,749 |
| ක්‍රමක්ෂය | 10,534 | – | 10,534 | 13,101 | – | 13,101 |
| හානිකරණය | – | 19,580 | 19,580 | – | 19,580 | 19,580 |
| විනිමය අනුපාත වෙනස්වීම | – | – | – | 94 | – | 94 |
| **2019 මාර්තු මස 31 වන දිනට ශේෂය** | 148,854 | 19,580 | 168,434 | 171,944 | 19,580 | 191,524 |
| **2019 මාර්තු මස 31 වන දිනට ශුද්ධ පොත් වටිනාකම** | 35,940 | 288,965 | 324,905 | 34,821 | 397,519 | 432,340 |

අස්පෘශ්‍ය වත්කම්වලට 2020 මාර්තු මස 31 වන දිනට සමාගම වෙනුවෙන් රු. 136,106,914.00 සහ සමූහය වෙනුවෙන් රු. 136,401,914.00 ක් වන සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද මෘදුකාංග ඇතුළත් කරන අතර (2019 මාර්තු මස 31 වන දිනට සමාගම වෙනුවෙන් රු. 127,667,967.00 සහ සමූහය වෙනුවෙන් රු. 127,962,967.00 කි) මේවා වාර්තා කරන දිනයට භාවිතය තුළ පැවතිණ.

## කීර්තිනාමය සඳහා හානිකරණ පරීක්ෂණ

ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් අනුමත කරන මූල්‍ය අයවැය මත මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණ භාවිතා කරමින් භාවිතය තුළ වටිනාකම ගණනය කිරීම මත පදනම් වී හානිකරණය සඳහා වාර්ෂික පරීක්ෂණයන් සමූහය විසින් සිදුකරයි. 17.86%ක වට්ටම් අනුපාතය සහ දළ දේශීය නිෂ්පාදිතය (GDP) මත පදනම් ප්‍රක්ෂේපිත වර්ධන අනුපාතය මෙම අරමුණ සඳහා භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන වෙති. වට්ටම් අනුපාතය සමාගමේ ස්කන්ධවල පිරිවැයේ සාමාන්‍ය ප්‍රතිශතයක් මත පදනම් වී ඇස්තමේන්තු කරන ලදී. ප්‍රධාන උපකල්පනවල සාධාරණව වියහැකි කිසිදු වෙනසක් ඒකකවල ධාරණ අගය ඒවායේ අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවීම සඳහා හේතු වී නොමැති බව කළමනාකරණය විශ්වාස කරති.

වාර්තා කරන දිනයට සමූහයේ/සමාගමේ අස්පෘශ්‍ය වත්කම්වල හිමිකම පිළිබඳව කිසිදු සීමා වීමක් නොතිබුණි. එමෙන්ම, වගකීම් සඳහා ඇප ලෙස ඔඩපනය කළ අයිතම ද නොතිබුණි. 2019/20 වසර තුළ අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීමට අදාළව කිසිදු ප්‍රාග්ධනීයකරණය කළ ණය පිරිවැය නොපැවතිණ.

## 34 – භාවිතයට අයිතිය ඇති වත්කම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය කල්බදුවල කාලය ක්‍රියාත්මක කිරීම සාධාරණව නිශ්චිතනම් කල්බද්ද දීර්ඝ කිරීමේ විකල්පයක් මගින් ආවරණය කරන යම් කාලයක් සමඟ හෝ කාලය ක්‍රියාත්මක කිරීම සාධාරණව අවිනිශ්චිතනම් කල්බද්ද අවසන් කිරීමට විකල්පයක් මගින් ආවරණය කරන යම් කාලයක් සමඟ අවලංගුකළ නොහැකි කාලයක් ලෙස තීරණය කරයි. සමූහයට දීර්ඝකිරීම සහ අවසන් කිරීමේ විකල්ප ඇතුළත් ශාඛා/ප්‍රධාන කාර්යාලය සඳහා කල්බදු ගිවිසුම් කිහිපයක් ඇත.

කල්බද්ද අළුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පයක් ක්‍රියාත්මත කළ හැකිද නොහැකිද යන්න සාධාරණව නිශ්චය කරගන්නා ඇගයීම තුළ සමූහය විනිශ්චයන් යොදා ගනී. මෙහිදී, අළුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථික දිරිදීමනාවක් නිර්මාණය කරන අදාළ සියලුම සාධක සලකා බලයි. ආරම්භක දිනෙන් පසු, සමූහය අළුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පයක් ක්‍රියාත්මත කළ හැකිද නොහැකිද යන්න පිළිබඳව එහි හැකියාවට බලපාන එහි පාලනය තුළ ඇති වාතාවරණයන් හි වැදගත් සිදුවීමක් හෝ වෙනසක් තිබේද යන්න පිළිබඳව කල්බදු කාලය නැවත ඇගයීම් සිදුකරයි. (උදා- වැදගත් බදුකර වැඩි දියුණුකිරීම් ඉදිකිරීම හෝ කල්බදු වත්කම පිළිබඳ වැදගත් ගැලපීම් සිදුකිරීම.

ඉඩම් පරිහරණ හිමිකම් අත්කර ගැනීමට ගෙවන ලද පෙරගෙවූ කල්බදු කුලී ලබාදෙන ලද ප්‍රතිලාභවල රටාවට අනුකූලව කල්බදු කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. ඉඩම් පරිහරණ හිමිකම්වලින් සමන්විත කල්බදු දේපල ඉතිරි කල්බදු කාලය තුළ සරල මාර්ගික පදනමකට ක්‍රමක්ෂය කෙරේ.

| මාර්තු මස 31 වන දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | **2020 රු. '000** | 2019 රු. '000 | **2020 රු. '000** | 2019 රු. '000 |
| **පිරිවැය** | | | | |
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | **91,985** | 91,985 | **91,985** | 91,985 |
| 2019 අප්‍රේල් මස 1 වන දිනට SLFRS 16 යොදා ගැනීමේ බලපෑම | **2,080,315** | – | **1,547,546** | – |
| අනෙකුත් වත්කම්වලින් මාරු කිරීම (පෙර ගෙවූ කුලී) | **143,322** | – | **170,723** | – |
| **අප්‍රේල් මස 1 වන දිනට ශේෂය – ගලපනලද** | **2,315,622** | 91,985 | **1,810,254** | 91,985 |
| එකතුකිරීම් | **206,943** | – | **206,943** | – |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | **2,522,565** | 91,985 | **2,017,197** | 91,985 |
| **(අඩුකළා): සමුච්චිත ක්‍රමක්ෂය** | | | | |
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | **7,920** | 4,854 | **7,920** | 4,854 |
| 2019 අප්‍රේල් මස 1 වන දිනට SLFRS 16 යොදා ගැනීමේ බලපෑම | **–** | – | **–** | – |
| **අප්‍රේල් මස 1 වන දිනට ශේෂය – ගලපනලද** | **7,920** | 4,854 | **7,920** | 4,854 |
| ක්‍රමක්ෂය | **538,230** | 3,066 | **332,830** | 3,066 |
| හානිකරණය | **36,965** | – | **36,965** | – |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | **583,115** | 7,920 | **377,715** | 7,920 |
| **මාර්තු මස 31 වන දිනට ශුද්ධ පොත් වටිනාකම** | **1,939,450** | 84,065 | **1,639,482** | 84,065 |

## 35 – අනෙකුත් වත්කම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමාගම සහ සමූහය ඔවුන්ගේ සියලුම අනෙකුත් වත්කම් අනෙකුත් මූල්‍ය වත්කම් සහ අනෙකුත් මූල්‍ය නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරයි. අනෙකුත් මූල්‍ය නොවන වත්කම් ප්‍රධාන වශයෙන් අත්තිකාරම් ගෙවීම්, VAT අයකරගැනීම්, භාණ්ඩ තොග සහ වෙනත් ලැබීම්වලින් සමන්විත වේ. අත්තිකාරම් ගෙවීම් ඓතිහාසික පිරිවැයට ඉදිරියට ගෙන යයි.

| මාර්තු මස 31 වන දිනට | සටහන | පිටු අංකය. | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| අනෙකුත් මූල්‍ය වත්කම් – රක්ෂණ කොමිස් මුදල් | | | **232,692** | 143,817 | **–** | – |
| මූල්‍ය නොවන වත්කම් | 35.1 | 228 | **914,309** | 880,827 | **1,235,329** | 1,164,884 |
| **එකතුව** | | | **1,147,001** | 1,024,644 | **1,235,329** | 1,164,884 |

### 35.1 මූල්‍ය නොවන වත්කම්

| මාර්තු මස 31 වන දිනට | සටහන | පිටු අංකය. | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | | | **145,383** | 242,023 | **124,859** | 213,488 |
| ලාභාංශ අයකරගැනීම් | | | **310,000** | 142,102 | **–** | – |
| භාණ්ඩ තොග | | | **49,596** | 26,881 | **57,920** | 37,125 |
| පෙර ගෙවූ වියදම් | | | **67,914** | 110,847 | **76,409** | 123,577 |
| සේවක ණය මත ක්‍රමක්ෂය නොකළ පිරිවැය (දින 1 වෙනස) | 35.2 | 228 | **123,264** | 128,906 | **123,264** | 129,509 |
| විලම්බිත වියදම් | | | **–** | – | **244,874** | 221,842 |
| අනෙකුත් ලැබීම් | | | **218,152** | 230,068 | **608,003** | 439,343 |
| **එකතුව** | | | **914,309** | 880,827 | **1,235,329** | 1,164,884 |

### 35.2 සේවක ණය මත ක්‍රමක්ෂය නොකළ පිරිවැය (දින 1 වෙනස)

| මාර්තු මස 31 වන දිනට | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | **128,906** | 81,441 | **129,509** | 83,165 |
| වසර සඳහා අයකිරීම් | **(5,642)** | 47,465 | **(6,245)** | 46,344 |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | **123,264** | 128,906 | **123,264** | 129,509 |

## 36 බැංකු සඳහා ගෙවියයුතු

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකු සඳහා ගෙවියයුතු දෑ හි බැංකු අයිරා සහ බැංකුවෙන් ලබාගත් දිගු කාලීන සහ කෙටි කාලීන ණය ඇතුළත් වේ. හඳුනාගැනීමෙන් පසුව, මේවා ඵලදායි පොළී අනුපාතය භාවිතයෙන් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. නිකුතුව මත වට්ටම් හෝ වාරිකය සහ ඵලදායි පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. ඵලදායි පොළී අනුපාත ක්‍රමක්ෂයකරණය ලාභාලාභ ප්‍රකාශනය තුළ "පොළී වියදම්" වලට ඇතුළත් කෙරේ. ලාභ හෝ අලාභ ඵලදායි පොළී අනුපාත ක්‍රමක්ෂයකරණ ක්‍රියාවලිය තුළින් වගකීම් හඳුනා නොගැනීමේදී ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

| මාර්තු මස 31 වන දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| අයිරා | **24,683** | 353,074 | **694,954** | 1,274,127 |
| කෙටි කාලීන ණය | **500,127** | 11,344,182 | **500,127** | 11,687,811 |
| දිගු කාලීන ණය | **456,546** | 6,401,039 | **2,826,136** | 8,337,750 |
| වත්කම් පිටුබලය සහිත සුරැකුම්පත් | **6,956,829** | 9,175,638 | **6,956,829** | 9,175,638 |
| **එකතුව** | **7,938,185** | 27,273,933 | **10,978,046** | 30,475,326 |
| සාධාරණ අගය | **8,057,554** | 27,260,329 | **11,097,415** | 30,118,093 |

### 36.1 බැංකුවලට ගෙවියයුතු දෑ හි වෙනස්වීම

| මාර්තු මස 31 වන දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | **27,273,933** | 39,921,789 | **30,475,326** | 41,834,394 |
| වසර තුළ ණයට ගත් ප්‍රමාණය | **12,950,000** | 59,966,000 | **12,950,000** | 59,966,000 |
| වසර තුළ ආපසු ගෙවීම් | **(34,046,652)** | (77,536,350) | **(35,209,177)** | (77,456,806) |
| වසර තුළ පොළී වියදම් | **1,736,221** | 4,569,420 | **2,066,943** | 4,857,611 |
| **අනුඑකතුව** | **7,913,502** | 26,920,859 | **10,283,092** | 29,201,199 |
| අයිරා | **24,683** | 353,074 | **694,954** | 1,274,127 |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | **7,938,185** | 27,273,933 | **10,978,046** | 30,475,326 |

### 36.2 දිගුකාලීන ණය විස්තර

| ණයකරුගේ නම | ලබාදුන් දිනය | පහසුකමේ ප්‍රමාණය රු. '000 | කාලසීමාව | පොළී අනුපාතය % | ඇපවල තත්ත්වය |
|---|---|---|---|---|---|
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2015.07.04 | 2,000,000 | වසර 4 | 7.25-10.5 | සුරැකුම් ලත් |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2016.09.08 | 1,000,000 | වසර 4 | 14.00 | සුරැකුම් ලත් |
| සම්පත් බැංකුව පී.එල්.සී. | 2014.12.31 | 2,000,000 | වසර 5 | 7.00-8.5 | සුරැකුම් ලත් |
| ඇක්සිස් බැංකුව | 2017.03.27 | 150,000 | වසර 4 | AWPLR + 1.25 | සුරැකුම් ලත් |
| ඇක්සිස් බැංකුව | 2017.03.27 | 250,000 | වසර 4 | AWPLR + 1.25 | සුරැකුම් ලත් |
| මහජන බැංකුව | 2015.05.26 | 4,250,000 | වසර 4 | 8.50 | සුරැකුම් ලත් |
| මහජන බැංකුව | 2015.11.27 | 2,000,000 | වසර 4 | 10.00 | සුරැකුම් ලත් |
| මහජන බැංකුව | 2016.03.15 | 2,000,000 | වසර 4 | AWPLR + 1.75 | සුරැකුම් ලත් |
| මහජන බැංකුව | 2016.06.02 | 2,500,000 | වසර 4 | මාස 6 SLIBOR + 1.75 | සුරැකුම් ලත් |
| ලංකා බැංකුව | 2016.07.07 | 3,000,000 | වසර 4 | 11.50 | සුරැකුම් ලත් |
| ආර්එච්බී බැංකුව/ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 2017.04.27 | 5,355,000 | වසර 3 | 13.50 | සුරැකුම් ලත් |
| එම්සීබී බැංකුව | 2017.09.26 | 500,000 | වසර 4 | AWPLR+1.5 | සුරැකුම් ලත් |

### වත්කම් පිටුබලැති සුරකුම්

| ණයකරුගේ නම | ලබාදුන් දිනය | පහසුකමේ ප්‍රමාණය රු. '000 | කාලසීමාව | පොලී අනුපාතය* % | ඇපවල තත්ත්වය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 2016.09.30 | 2,146,200 | වසර 4 | 13.81 | සුරකුම් ලත් |
| ඩොයිෂ් බැංකුව | 2015.07.03 | 3,000,000 | වසර 4 | 8.82 | සුරකුම් ලත් |
| ඩොයිෂ් බැංකුව | 2016.10.28 | 1,769,900 | වසර 4 | 14.47 | සුරකුම් ලත් |
| ඩොයිෂ් බැංකුව | 2016.02.25 | 4,250,700 | වසර 4 | 11.75 | සුරකුම් ලත් |
| හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. | 2018.06.29 | 2,000,000 | වසර 5 | 12.27 | සුරකුම් ලත් |
| හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. | 2019.03.13 | 2,000,000 | වසර 5 | 13.08 | සුරකුම් ලත් |
| මහජන බැංකුව | 2016.08.18 | 3,000,000 | වසර 4 | 13.32 | සුරකුම් ලත් |
| මහජන බැංකුව | 2018.02.09 | 1,000,000 | වසර 2 | 11.71 | සුරකුම් ලත් |
| මහජන බැංකුව | 2018.09.10 | 2,000,000 | වසර 2 | 13.15 | සුරකුම් ලත් |
| මහජන බැංකුව | 2019.05.23 | 1,000,000 | වසර 3 | 11.16 | සුරකුම් ලත් |

* එක් එක් සුරකුම්කරණය සඳහා පොලී අනුපාතය සාමාන්‍ය බරතබන ලද පොලී අනුපාතය ලෙස දක්වා ඇත.

සුරකුම්පත් පිළිබඳ විස්තර 257 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 57 – "ඔඩපනය කළ වත්කම්" හි අනාවරණය කර ඇත.

## 36.3 ශිවිසුම්ගත කල්පිරීම් විශ්ලේෂණය

### 36.3.1 බැංකුවලට ගෙවියයුතු දෑ හි ගිවිසුම්ගත කල්පිරීම් විශ්ලේෂණය – සමාගම

| මාර්තු මස 31 වන දිනට | 2020 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| අයිරා | **24,683** | – | – | **24,683** |
| කෙටි කාලීන ණය | **500,127** | – | – | **500,127** |
| දිගු කාලීන ණය | **456,546** | – | – | **456,546** |
| වත්කම් පිටුබලය සහිත සුරකුම්පත් | **2,588,636** | **4,368,193** | – | **6,956,829** |
| **එකතුව** | **3,569,992** | **4,368,193** | – | **7,938,185** |

| මාර්තු මස 31 වන දිනට | 2019 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| අයිරා | 353,074 | – | – | 353,074 |
| කෙටි කාලීන ණය | 11,344,182 | – | – | 11,344,182 |
| දිගු කාලීන ණය | 5,137,102 | 1,263,937 | – | 6,401,039 |
| වත්කම් පිටුබලය සහිත සුරකුම්පත් | 4,246,088 | 4,929,550 | – | 9,175,638 |
| **එකතුව** | 21,080,446 | 6,193,487 | – | 27,273,933 |

### 36.3.2 බැංකුවලට ගෙවියයුතු දෑ හි ගිවිසුම්ගත කල්පිරීම් විශ්ලේෂණය – සමූහය

| මාර්තු මස 31 වන දිනට | 2020 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| අයිරා | **694,954** | – | – | **694,954** |
| කෙටි කාලීන ණය | **500,127** | – | – | **500,127** |
| දිගු කාලීන ණය | **1,479,347** | **1,346,789** | – | **2,826,136** |
| වත්කම් පිටුබලය සහිත සුරැකුම්පත් | **2,588,636** | **4,368,193** | – | **6,956,829** |
| **එකතුව** | **5,263,064** | **5,714,982** | – | **10,978,046** |

| මාර්තු මස 31 වන දිනට | 2019 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| අයිරා | 1,274,127 | – | – | 1,274,127 |
| කෙටි කාලීන ණය | 11,687,811 | – | – | 11,687,811 |
| දිගු කාලීන ණය | 4,211,827 | 4,125,923 | – | 8,337,750 |
| වත්කම් පිටුබලය සහිත සුරැකුම්පත් | 4,246,088 | 4,929,550 | – | 9,175,638 |
| **එකතුව** | 21,419,853 | 9,055,473 | – | 30,475,326 |

## 37 ගනුදෙනුකරුවන් සඳහා ගෙවියයුතු

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

ගනුදෙනුකරුවන් සඳහා ගෙවියයුතු දෑ හි ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, මේවා ඵලදායි පොළී අනුපාතය භාවිතයෙන් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. නිකුතුව මත වට්ටම් හෝ වාරිකය සහ ඵලදායි පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. ඵලදායි පොළී අනුපාත ක්‍රමක්ෂයකරණය ලාභාලාභ ප්‍රකාශනය තුළ "පොළී වියදම්" වලට ඇතුළත් කෙරේ. ලාභ සහ අලාභ වගකීම් හඳුනානොගැනීමේදී ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

| මාර්තු මස 31 වන දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | **2020** රු. '000 | 2019 රු. '000 | **2020** රු. '000 | 2019 රු. '000 |
| ස්ථාවර තැන්පතු | **99,930,391** | 83,033,465 | **100,929,548** | 83,608,860 |
| ඉතුරුම් තැන්පතු | **6,770,636** | 5,335,191 | **6,756,044** | 5,314,336 |
| **එකතුව** | **106,701,027** | 88,368,656 | **107,685,592** | 88,923,196 |
| සාධාරණ අගය | **106,798,094** | 87,918,010 | **106,796,726** | 87,486,543 |

### 37.1 ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු දෑ හි ඉතිරි ගිවිසුම්ගත කල්පිරීම් විශ්ලේෂණය – සමාගම

| මාර්තු මස 31 වන දිනට | 2020 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| ස්ථාවර තැන්පතු | **74,874,182** | **25,056,209** | **–** | **99,930,391** |
| ඉතුරුම් තැන්පතු | **6,573,515** | **53,391** | **143,730** | **6,770,636** |
| **එකතුව** | **81,447,697** | **25,109,600** | **143,730** | **106,701,027** |

| මාර්තු මස 31 වන දිනට | 2019 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| ස්ථාවර තැන්පතු | 62,819,140 | 20,214,325 | – | 83,033,465 |
| ඉතුරුම් තැන්පතු | 5,166,435 | 49,237 | 119,519 | 5,335,191 |
| **එකතුව** | 67,985,575 | 20,263,562 | 119,519 | 88,368,656 |

### 37.2 ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු දෑ හි ඉතිරි ගිවිසුම්ගත කල්පිරීම් විශ්ලේෂණය – සමූහය

| මාර්තු මස 31 වන දිනට | 2020 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| ස්ථාවර තැන්පතු | **75,873,339** | **25,056,209** | **–** | **100,929,548** |
| ඉතුරුම් තැන්පතු | **6,558,923** | **53,391** | **143,730** | **6,756,044** |
| **එකතුව** | **82,432,262** | **25,109,600** | **143,730** | **107,685,592** |

| මාර්තු මස 31 වන දිනට | 2019 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| ස්ථාවර තැන්පතු | 63,394,535 | 20,214,325 | – | 83,608,860 |
| ඉතුරුම් තැන්පතු | 5,145,580 | 49,237 | 119,519 | 5,314,336 |
| **එකතුව** | 68,540,115 | 20,263,562 | 119,519 | 88,923,196 |

## 38 නිකුත්කළ ණය සුරැකුම්පත්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

නිකුත්කළ ණය සුරැකුම්පත් සමාගම සහ සමූහය විසින් දිගු කාලීන සහ කෙටි කාලීන ද්‍රවශීල අරමුදල් අවශ්‍යතා සඳහා ණයට ගත් අරමුදල් නියෝජනය කරයි. මූලික හඳුනාගැනීමෙන් පසුව, මේවා ඵලදායි පොළී අනුපාතය භාවිතයෙන් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. නිකුතුව මත වට්ටම් හෝ වාරිකය සහ ඵලදායි පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. ඵලදායි පොළී අනුපාත ක්‍රමක්ෂයකරණය ලාභාලාභ ප්‍රකාශනය තුළ "පොළී වියදම්" වලට ඇතුළත් කෙරේ. ලාභ සහ අලාභ වගකීම් හඳුනා නොගැනීමේදී ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

| මාර්තු මස 31 වන දිනට | සටහන | පිටු අංකය. | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොරොන්දු නෝට්ටු | | | **17,087** | 14,928 | **17,087** | 14,928 |
| ලැයිස්තුගත ණයකර | 38.2 | 233 | **18,462,173** | 21,260,103 | **18,320,952** | 21,119,112 |
| **එකතුව** | | | **18,479,260** | 21,275,031 | **18,338,039** | 21,134,040 |
| **සාධාරණ අගය** | | | **18,759,201** | 20,824,768 | **18,616,227** | 20,683,777 |

## 38.1 නිකුත්කළ ණය සුරැකුම්පත්වල වෙනස්වීම

| මාර්තු මස 31 වන දිනට | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | **21,275,031** | 15,783,502 | **21,134,040** | 15,783,502 |
| වසර තුළ ණයට ගත් ප්‍රමාණය | **–** | 6,000,000 | **–** | 5,874,220 |
| නිකුත්කළ ණය සුරැකුම්පත් මුදාහැරීම | **(3,338,413)** | (1,164,060) | **(3,338,413)** | (1,164,060) |
| නිකුත්කළ ණය සුරැකුම්පත් මත පොළී වියදම් | **2,281,180** | 2,394,127 | **2,264,940** | 2,378,916 |
| නිකුත්කළ ණය සුරැකුම්පත් මත ගෙවූ පොළිය | **(1,738,538)** | (1,738,538) | **(1,722,528)** | (1,738,538) |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | **18,479,260** | 21,275,031 | **18,338,039** | 21,134,040 |

## 38.2 ලැයිස්තුගත ණයකර

2015 දී, සමාගම විසින් රු. මිලියන 6,000ක් වටිනා ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, A'A(-) ශ්‍රේණිගත, අවුරුදු හතරේ (2015/2019) සහ අවුරුදු පහේ (2015/2020) එකක් රු. 100ක් වන ණයකර නිකුත් කරන ලදී. 2016 දී, සමාගම විසින් රු. මිලියන 8,000ක් වටිනා ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, A'A(-) ශ්‍රේණිගත, අවුරුදු තුනේ (2016/2019), අවුරුදු හතරේ (2016/2020) සහ අවුරුදු පහේ (2016/2021) එකක් රු. 100ක් වන ණයකර නිකුත් කරන ලදී.

2018 දී, සමාගම විසින් රු. මිලියන 6,000ක් වටිනා ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, A'A(-) ශ්‍රේණිගත, අවුරුදු හතරේ (2018/2022) සහ අවුරුදු පහේ (2018/2023) එකක් රු. 100ක් වන ණයකර නිකුත් කරන ලදී.

| මාර්තු මස 31 වන දිනට | සාධාරණ අගය රු. '000 | පොළී අනුපාතය % | නැවත ගෙවීමේ කාලය | නිකුත්කළ දිනය | කල්පිරෙන දිනය | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත් නිදහස් කළ හැකි, AA(-) ශ්‍රේණිගතකළ | | | | | | | | | |
| අ වර්ගය | 2,175,780 | 9.60 | අර්ධ වාර්ෂික | 2015.11.13 | 2019.11.12 | **–** | 2,249,381 | **–** | 2,249,381 |
| ආ වර්ගය | 3,824,220 | 9.95 | වාර්ෂික | 2015.11.13 | 2020.11.12 | **3,961,709** | 3,958,778 | **3,961,709** | 3,958,778 |
| අ වර්ගය | 542,040 | 11.90 | අර්ධ වාර්ෂික | 2016.11.16 | 2019.11.16 | **–** | 564,286 | **–** | 564,286 |
| ආ වර්ගය | 659,350 | 12.25 | අර්ධ වාර්ෂික | 2016.11.16 | 2020.11.16 | **686,167** | 686,985 | **686,167** | 686,985 |
| ඇ වර්ගය | 6,798,610 | 12.60 | අර්ධ වාර්ෂික | 2016.11.16 | 2021.11.16 | **7,104,422** | 7,093,615 | **7,104,422** | 7,093,615 |
| අ වර්ගය | 704,600 | 12.40 | වාර්ෂික | 2018.04.18 | 2022.04.18 | **783,316** | 783,895 | **783,316** | 783,895 |
| ආ වර්ගය | 5,295,400 | 12.80 | වාර්ෂික | 2018.04.18 | 2023.04.18 | **5,926,559** | 5,923,163 | **5,785,338** | 5,782,172 |
| **එකතුව** | 20,000,000 | | | | | **18,462,173** | 21,260,103 | **18,320,952** | 21,119,112 |

## 38.2.1 ප්‍රාග්ධන වෙළෙඳපොල හරහා රැස්කළ අරමුදල් භාවිතා කිරීම

| සංස්ථා ප්‍රකාශය පරිදි පරමාර්ථ | සංස්ථා ප්‍රකාශය පරිදි වෙන්කළ ප්‍රමාණය රු. '000 | සංස්ථා ප්‍රකාශය පරිදි භාවිතා කිරීමේ යෝජිත දිනය | ලද මුදල්වලින් වෙන්කළ ප්‍රමාණය රු. '000 (A) | ලද සියලු මුදල්වල ප්‍රතිශතය | භාවිතා කළ ප්‍රමාණය රු. '000 (B) | වෙන්කිරීමට අනුව භාවිතා කිරීමේ ප්‍රතිශතය | මුදල් ආයෝජනය කිරීම ඇතුළුව සම්පූර්ණයෙන් භාවිතා නොකිරීම පිළිබඳ පැහැදිලි කිරීම |
|---|---|---|---|---|---|---|---|
| **2015/16 වසර තුළ ලැයිස්තුගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස්කළහැකි, ශ්‍රේණිගත ණයකර නිකුතුව** | | | | | | | |
| මෙම ණයකර නිකුතුව තුළින් රැස්කළ අරමුදල් PLC හි මධ්‍ය කාලයේ සිට දිගු කාලය දක්වා ණයදිම ගැලපීමට සහ පොළී අනුපාත අවදානම අවම කිරීමට කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට මූල්‍යකරණය සඳහා භාවිතා කරනු ලැබේ. | 6,000,000 | වෙන්කිරීමේ දිනයේ සිට ඉදිරි මාස 12 ඇතුළත | 6,000,000 | 100 | 6,000,000 | 100 | N/A |
| **2016/17 වසර තුළ ලැයිස්තුගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස්කළහැකි, ශ්‍රේණිගත ණයකර නිකුතුව** | | | | | | | |
| මෙම ණයකර නිකුතුව තුළින් රැස්කළ අරමුදල් අයවැයගත ණය කළඹ සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට මූල්‍යකරණය සඳහා භාවිතා කරනු ලැබේ. | 8,000,000 | වෙන්කිරීමේ දිනයේ සිට ඉදිරි මාස 12 ඇතුළත | 8,000,000 | 100 | 8,000,000 | 100 | N/A |
| **2018/19 වසර තුළ ලැයිස්තුගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස්කළහැකිල ශ්‍රේණිගත ණයකර නිකුතුව** | | | | | | | |
| මෙම ණයකර නිකුතුව තුළින් රැස්කළ අරමුදල් 2018 මාර්තු 26 දින කල්පිරුණු ණයකරනිරවුල් කිරීමට ලබාගත් කෙටි කාලීන පහසුකම් නැවත ගෙවීමට සහ සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා භාවිතා කරන ලදී. | 6,000,000 | වෙන්කිරීමේ දිනයේ සිට ඉදිරි මාස 12 ඇතුළත | 6,000,000 | 100 | 6,000,000 | 100 | N/A |

## ලැයිස්තුගත ණයකරවල ඉතිරි ගිවිසුම්ගත කලපිරීම් විශ්ලේෂණය – සමාගම

| මාර්තු මස 31 වන දිනට | 2020 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| පොරොන්දු නෝට්ටු | **17,087** | **–** | **–** | **17,087** |
| ලැයිස්තුගත ණයකර | **5,696,827** | **12,765,346** | **–** | **18,462,173** |
| **එකතුව** | **5,713,914** | **12,765,346** | **–** | **18,479,260** |

| මාර්තු මස 31 වන දිනට | 2019 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| පොරොන්දු නෝට්ටු | 14,928 | – | – | 14,928 |
| ලැයිස්තුගත ණයකර | 4,031,808 | 17,228,295 | – | 21,260,103 |
| **එකතුව** | 4,046,736 | 17,228,295 | – | 21,275,031 |

**ලැයිස්තුගත ණයකරවල ඉතිරි ගිවිසුම්ගත කල්පිරීම් විශ්ලේෂණය – සමූහය**

| මාර්තු මස 31 වන දිනට | 2020 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| පොරොන්දු නෝට්ටු | **17,087** | **–** | **–** | **17,087** |
| ලැයිස්තුගත ණයකර | **5,696,828** | **12,624,124** | **–** | **18,320,952** |
| **එකතුව** | **5,713,915** | **12,624,124** | **–** | **18,338,039** |

| මාර්තු මස 31 වන දිනට | 2019 | | | |
|---|---|---|---|---|
| | වසර 1 ක් තුළ රු. '000 | වසර 1-5 රු. '000 | වසර 5 ට වැඩි රු. '000 | එකතුව රු. '000 |
| පොරොන්දු නෝට්ටු | 14,928 | – | – | 14,928 |
| ලැයිස්තුගත ණයකර | 4,031,808 | 17,087,304 | – | 21,119,112 |
| **එකතුව** | 4,046,736 | 17,087,304 | – | 21,134,040 |

## 39 අනෙකුත් මූල්‍ය වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

අනෙකුත් මූල්‍ය වත්කම්වලට සැපයුම්කරුවන්ට ගෙවියයුතු, ගෙවියයුතු රක්ෂණ, ගෙවියයුතු ලාභාංශ සහ ගෙවියයුතු වෙනත් දෑ ප්‍රමාණ ඇතුළත් වේ.

### ගෙවියයුතු ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ වගකීමක් ලෙස හඳුනාගන්නා අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශකර ප්‍රකාශයට පත් කිරීමෙන් සහ කොටස්හිමියන් විසින් ඒවා අනුමත කිරීමේ අවස්ථාවේදී ස්කන්ධයෙන් අඩු කරනු ලබයි. අතුරු ලාභාංශ ප්‍රකාශ කරන අවස්ථාවේදී අධ්‍යක්ෂ මණ්ඩලයෙ අභිමතයට ස්කන්ධයෙන් අඩු කෙරේ.

### සමාගම සහ පරිපාලිත සමාගම් විසින් බෙදාහැරි ලාභාංශ මත රඳවාගැනීමේ බදු

සමූහය විසින් ලාභාංශ බෙදාහැරීමෙන් ඇතිවන රඳවාගැනීමේ බදු අදාළ ලාභාංශ ගෙවීමට වගකීම හඳුනාගන්නා අවස්ථාවේදී හඳුනාගනී. පරිපාලිත සමාගම විසින් බෙදාහැරි ලාභාංශ සහ පරිපාලිත සමාගම සහ ආශ්‍රිත සමාගම්වලින් සමූහය විසින් ලබාගත් සමූහ සමාගම ලාභාංශ මත රඳවා ගැනීමේ බදු 2020 වසර තුළ මූලාශ්‍රයේදී 14%ක (2019 – 14%) අඩුකිරීමක් ආකර්ෂණය කරගෙන ඇත. රඳවා ගැනීමේ බදු 2020 ජනවාරි මස 1 වන දින සිට අවලංගු කර ඇත.

| මාර්තු මස 31 වන දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ප්‍රමාණය | **2,079,540** | 1,650,408 | **2,378,782** | 1,804,026 |
| ගෙවිය යුතු රක්ෂණය | **645,306** | 605,843 | **–** | – |
| ගෙවිය යුතු ලාභාංශ | **23,272** | 21,788 | **23,272** | 21,788 |
| ගෙවිය යුතු අනෙකුත් දෑ | **265,999** | 202,338 | **427,654** | 639,122 |
| **එකතුව** | **3,014,117** | 2,480,377 | **2,829,708** | 2,464,936 |

## 40 – රක්ෂණ වගකීම් සහ ගෙවියයුතු ප්‍රතිරක්ෂණ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

### ශුද්ධ නොඉපයූ වාරිකය සඳහා වෙන්කිරීම

නොඉපයූ වාරික සඳහා වෙන්කිරීම කල්පිරී නොමැති අවදානම් සඳහා ලද වාරික නියෝජනය කරයි. පොදුවේ, ගිවිසුමේ කාලය තුළ සංචිතය නිදහස් කරන අතර වාරික ආදායමක් ලෙස හඳුනාගනී. එක් එක් වාර්තා කරන දිනයට, සමූහය කල්ඉකුත්නොවූ අවදානම සමාලෝචනය කරන අතර අපේක්ෂිත හිමිකම්පෑම්වල සමස්ත අතිරික්තයක් සහ නොඉපයූ වාරික තුළ විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය තිබේද යන්න තීරණය කිරීම සඳහා වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම ගණනය කිරීමට අදාළ ජීවිත නොවන රක්ෂණ තාක්ෂණික විධිවිධානවලට අදාළව වත්කම් මත ඇතිවේයයි අපේක්ෂා කරන ආයෝජන ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමෙන් පසු අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පිළිබඳ වර්තමාන ඇස්තමේන්තු භාවිතා කරයි. නොඉපයූ වාරිකවල ධාරණ අගය ප්‍රමාණවත් නොවන බව මෙම ඇස්තමේන්තුවලින් පෙන්නුම් කරයිනම්, වගකීම් ප්‍රමාණාත්මතාව සඳහා වෙන්කිරීමක් සිදුකරමින් ලාභාලාභ ප්‍රකාශනය තුළ මෙම වෙනස හඳුනාගනී.

SLFRS 4 – "රක්ෂණ ගිවිසුම්" අනුව, සමූහය බාහිර ආයුගණකයෙකුගේ සහය ඇතිව ජීවිත නොවන ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් (LAT) පවත්වනු ලබයි.

### හිඟව පවත්නා දළ හිමිකම්පෑම් සඳහා වෙන්කිරීම

ජීවිත නොවන ගිවිසුම් වගකීම් ගිවිසුමට ඇතුළත් වන අවස්ථාවේදී සහ වාරික අයකරන අවස්ථාවේදී හඳුනාගනී. මෙම වගකීම් හිඟව පවත්නා හිමිකම්පෑම් වෙන්කිරීම ලෙස හඳුන්වන අතර අදාළ හිමිකම් මෙහෙයවීමේ පිරිවැය සහ අපේක්ෂිත ගොඩගැණුම් සහ අනෙකුත් ලැබීම්වල වටිනාකම සඳහා අඩුකිරීම සමඟ වාර්තා කරන දිනයට වාර්තා වී තිබුනද නොතිබුනද දරන ලද නමුත් නිරවුල් කර නොමැති සියලුම හිමිකම්පෑම්වල ඇස්තමේන්තුගත අවසන් පිරිවැය මත පදනම් වේ.

මුදලේ කාලීන වටිනාකම සඳහා වගකීම් වට්ටම් නොකරයි. සමතකරණය හෝ විපත්ති සංචිත සඳහා කිසිදු වෙන්කිරීමක් හඳුනානොගනී. ගිවිසුම කල්පිරෙන, මුදාහරින හෝ අවලංගු කරන අවස්ථාවේදී වගකිම් හඳුනානොගනී.

### දරන ලද නමුත් වාර්තා නොකළ දළ හිමිකම් සඳහා වෙන්කිරීම

සමහර වර්ගවල හිමිකම්පෑම් දැනුම්දීම සහ නිරවුල් කිරීම තුළ ප්‍රමාදයන් සිදුවිය හැකි අතර එමනිසා මේවායේ අවසාන පිරිවැය වාර්තා කරන දිනයට නිශ්චිතව දැනගත නොහැක. ප්‍රත්‍යක්ෂමූලික දත්ත සහ වර්තමාන උපකල්පන මත පදනම් වී සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපණ ශිල්ප රාශියක් භාවිතා කරමින් වාර්තාකරන දිනයට වගකීම ගණනය කරනු ලබන අතර එය අහිතකර අපගමනය සඳහා අන්තයක් ඇතුළත් කළ හැකිය.

ජීවිත නොවන ගිවිසුම් වගකීම් සඳහා, වාර්තාකරන දිනයට වාර්තාකළ හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය සහ වාර්තා කරන දිනයට දරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය යන දෙවර්ගය සඳහා ඇස්තමේන්තු සකස් කළ යුතුය. අවසාන හිමිකම් පිරිවැය අවිනිශ්චිතතාව සමඟ නියම කළ හැකිවීමට පෙර සැලකියයුතු කාලසීමාවක් මෙයට ගත විය හැකි අතර, සමහර වර්ගයේ ඔප්පු සඳහා IBNR හිමිකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වගකිමේ බහුතරය සකස් කරයි.

හිඟව පවත්නා හිමිකම්පෑම්වල අවසාන පිරිවැය දාම ඉනිමඟ ක්‍රමය, බෝන්හීටර් – ෆර්ගසන් ක්‍රමය සහ වාර ගණන/දරුණුකම ක්‍රමය වැනි සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපණ ශිල්ප රාශියක් භාවිතා කරමින් ඇස්තමේන්තු කෙරේ.

මෙම ශිල්පවලට පාදක වූ ප්‍රධාන උපකල්පනය වන්නේ සමාගමේ අතීත හිමිකම්පෑම් සංවර්ධන අත්දැකීමක් අනාගත හිමිකම්පෑම් සංවර්ධනය මෙන්ම අවසාන හිමිකම්පෑම් පිරිවැය ප්‍රක්ෂේපණය කිරීමට භාවිතා කළ හැකි බවයි. එබැවින්, මෙම ක්‍රම මුල් වර්ෂවල නිරීක්ෂිත සංවර්ධනය සහ අපේක්ෂිත අලාභ අනුපාත මත පදනම් වී ගෙවූ සහ දරන ලද අලාභ, හිමිකමක සාමාන්‍ය පිරිවැය සහ හිමිකම් ගණන පිළිබඳ තක්සේරු සිදු කරනු ලබයි. ඓතිහාසික හිමිකම් සංවර්ධනය අනතුරු වර්ෂ අනුව ප්‍රධාන වශයෙන් විශ්ලේෂණය කරනු ලැබූවද, භූගෝලීය ප්‍රදේශය අනුව මෙන්ම වැදගත් ව්‍යාපාර මාර්ග සහ හිමිකම් වර්ග අනුව තවදුරටත් විශ්ලේෂණය කළ හැක. විශාල හිමිකම් සාමාන්‍යයෙන් අලාභ ගැලපුමේ ඇස්තමේන්තුවේ මුහුණත් අගයට වෙන් කිරීම මගින් වෙන වෙනම ආමන්ත්‍රණය කරනු ලබයි. නැතිනම් ඒවායේ අනාගත සංවර්ධනයන් පෙන්නුම් කරන ආකාරයකින් වෙන වෙනම ප්‍රක්ෂේපණය කරයි. බොහෝ අවස්ථාවලදී. හිමිකම්පෑම් උද්ධමනයේ අනාගත අනුපාත හෝ අලාභ අනුපාත සම්බන්ධයෙන් උපකල්පන සිදු කරනු ලබයි. ඒ වෙනුවට, භාවිතාකළ උපකල්පන යනු ප්‍රක්ෂේපණ පදනම් වූ ඓතිහාසික හිමිකම් සංවර්ධන දත්ත තුළ ගම්‍යමාන උපකල්පන වේ.

අමතර ගුණාත්මක විනිශ්චයන් භාවිතා කරනු ලබන්නේ සම්බන්ධිත සියලුම අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින් සිදුවිහැකි ප්‍රතිඵල රාශියකින් සිදුවියහැකි ප්‍රතිඵලය ඉදිරි පත් කරන හිමිකම්වල ඇස්තමේන්තුගත අවසාන පිරිවැය ගණනය කිරීම පිණිස පසුගිය ප්‍රවණතා අනාගතය (නිදසුනක් ලෙස. හිමිකම් සඳහා ජනතා ආකල්ප, ආර්ථික කොන්දේසි, හිමිකම්වල උද්ධමන මට්ටම්, අධිකරණ තීරණ සහ නීතිකරණ වැනි බාහිර හෝ වෙළෙඳපොල සාධකවල වෙනස්වීම්වල එක් සිදුවීමක් පිළිබිඹු කිරීමට) මෙන්ම කළඹ තුළ මුසුව, ඔප්පුවල ලක්ෂණ සහ හිමිකම් මෙහෙයවන ක්‍රියාපටිපාටි වැනි අභ්‍යන්තර සාධක තුළ භාවිතා කළ නොහැකි ප්‍රමාණය තක්සේරු කිරීමටය.

සමාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන නොඉපයූ වාරික සඳහා වෙන්කිරීමේ ප්‍රමාණාත්මතාව අගය කිරීමේදී යොදා ගනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## රක්ෂණ ගිවිසුම් වගකීම්

### ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම්

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම් ගිවිසුමට ඇතුළත් වන අවස්ථාවේදී සහ වාරික අයකරන අවස්ථාවේදී හඳුනාගනී. මෙම වගකීම් හිඟව පවත්නා හිමිකම්පෑම් වෙන්කිරීම ලෙස හඳුන්වන අතර, අදාළ හිමිකම් මෙහෙයවීමේ පිරිවැය සහ අපේක්ෂිත ගොඩගැණුම් සහ අනෙකුත් ලැබීම්වල වටිනාකම සඳහා අඩුකිරීම සමඟ වාර්තා කරන දිනයට වාර්තා වී තිබුනද නොතිබුනද දරන ලද නමුත් නිරවුල් කර නොමැති සියලුම හිමිකම්පෑම්වල ඇස්තමේන්තුගත අවසන් පිරිවැය මත පදනම් වේ. සමහර වර්ගවල හිමිකම්පෑම් දැනුම්දීම සහ නිරවුල් කිරීම තුළ ප්‍රමාදයන් සිදුවිය හැකි අතර එමනිසා මේවායේ අවසාන පිරිවැය වාර්තාකරන දිනයට නිශ්චිතව දැනගත නොහැක. සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපණ ශිල්ප රාශියක් භාවිතා කරමින් වාර්තාකරන දිනයට වගකීම ගණනය කරනු ලබයි. මුදලේ කාලීන වටිනාකම සඳහා වගකීම් වට්ටම් නොකරයි. සමතකරණය සහ විපත්ති සංචිත සඳහා කිසිදු වෙන්කිරීමක් හඳුනානොගනී. ගිවිසුම කල්පිරෙන, මුදාහරින හෝ අවලංගු කරන අවස්ථාවේදී වගකීම් හඳුනානොගනී.

නොඉපයූ වාරික සඳහා වෙන්කිරීම කල්පිරී නොමැති අවදානම් සඳහා ලද වාරික නියෝජනය කරයි. පොදුවේ, ගිවිසුමේ කාලය තුළ සංචිතය නිදහස් කරන අතර වාරික ආදායමක් ලෙස හඳුනාගනී. එක් එක් වාර්තා කරන දිනයට, සමූහය කල්ඉකුත්නොවූ අවදානම සමාලෝචනය කරන අතර අපේක්ෂිත හිමිකම්පෑම්වල සමස්ත අතිරික්තයක් සහ නොඉපයූ වාරික තුළ විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය තිබේද යන්න තීරණය කිරීම සඳහා වගකීම් ප්‍රමාණාත්මතාව පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම ගණනය කිරීමට අදාළ ජීවිත නොවන රක්ෂණ තාක්ෂණික විධිවිධානවලට අදාළව වත්කම් මත ඇතිවේයයි අපේක්ෂා කරන ආයෝජන ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමෙන් පසු අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පිළිබඳ වර්තමාන ඇස්තමේන්තු භාවිතා කරයි. නොඉපයූ වාරිකවල ධාරණ අගය ප්‍රමාණවත් නොවන බව මෙම ඇස්තමේන්තුවලින් පෙන්නුම් කරයිනම්, වගකීම් ප්‍රමාණාත්මතාව සඳහා වෙන්කිරීමක් සිදුකරමින් ලාභාලාභ ප්‍රකාශනය තුළ මෙම වෙනස හඳුනාගනී.

### ගෙවියයුතු රක්ෂණ හඳුනානොගැනීම

ගෙවියයුතු රක්ෂණ වගකීම යටතේ බැඳීම මුදාහරින, අවලංගුවන හෝ කල්පිරෙන අවස්ථාවේදී හඳුනානොගනී.

### කල් නොපිරූ අවදානම් සංචිතය

රක්ෂණ වගකීම ගණනය කිරීමේදී විලම්බිත අත්කරගැනීමේ පිරිවැය අඩුකළ සමාගම දරන නොඉපයූ වාරිකය සැලකියයුතු කළමනාකරණ විනිශ්චයන් මත පදනම් වී තීරණය කළ අපේක්ෂිත ප්‍රමාණය සමඟ සැසැඳීමක් අවශ්‍ය වේ. නොඉපයූ අවදානම් වගකීම ඇස්තමේන්තු කිරීමේදී, එක් එක් ව්‍යාපාරය සඳහා අපේක්ෂිත ශුද්ධ හිමිකම් අනුපාතය සහ මෙම ඔප්පු හිමිකම් සඳහා නිරාවරණව පවතින අතර දරන ලද හිමිකම් කළමනාකරණ වියදම් මත උපකල්පන සිදු කරනු ලබයි.

### ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම්

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා, වාර්තා කරන දිනයට වාර්තාකළ හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය සහ වාර්තා කරන දිනයට දරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය යන දෙවර්ගය සඳහා ඇස්තමේන්තු සකස් කළ යුතුය. අවසාන හිමිකම් පිරිවැය අවිනිශ්චිතතාව සහ සමහර වර්ගයේ ඔප්පු සමඟ සැලකියයුතු කාලසීමාවක් මෙයට ගත විය හැකිය.

හිඟව පවත්නා හිමිකම්පෑම්වල අවසාන පිරිවැය දාම ඉනිමඟ ක්‍රමය, බෝන්හීටර්-ෆර්ගසන් ක්‍රමය සහ වාර ගණන/දරුණුකම ක්‍රමය වැනි සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපණ ශිල්ප රාශියක් භාවිතා කරමින් ඇස්තමේන්තු කෙරේ.

මෙම ශිල්පවලට පාදක වූ ප්‍රධාන උපකල්පනය වන්නේ සමාගමේ අතීත හිමිකම්පෑම් සංවර්ධන අත්දැකීමක් අනාගත හිමිකම්පෑම් සංවර්ධනය මෙන්ම අවසාන හිමිකම්පෑම් පිරිවැය ප්‍රක්ෂේපණය කිරීමට භාවිතා කළ හැකි බවයි. එබැවින්, මෙම ක්‍රම මුල් වර්ෂවල නිරීක්ෂිත සංවර්ධනය සහ අපේක්ෂිත අලාභ අනුපාත මත පදනම් වී ගෙවූ සහ දරන ලද අලාභ, හිමිකමක සාමාන්‍ය පිරිවැය සහ හිමිකම් ගණන පිළිබඳ තක්සේරු සිදු කරනු ලබයි. ඓතිහාසික හිමිකම් සංවර්ධනය අනතුරු වර්ෂ සහ සැලකියයුතු ව්‍යාපාර මාර්ග අනුව ප්‍රධාන වශයෙන් විශ්ලේෂණය කරනු ලැබුවද, භූගෝලීය ප්‍රදේශය අනුව මෙන්ම හිමිකම් වර්ග අනුව තවදුරටත් විශ්ලේෂණය කළ හැක. විශාල හිමිකම් සාමාන්‍යයෙන් අලාභ ගැලපුමේ ඇස්තමේන්තුවේ මුහුණත් අගයට වෙන් කිරීම මගින් වෙන වෙනම ආමන්ත්‍රණය කරනු ලබයි. නැතිනම් ඒවායේ අනාගත සංවර්ධනයන් පෙන්නුම් කරන ආකාරයකින් වෙන වෙනම ප්‍රක්ෂේපණය කරයි. බොහෝ අවස්ථාවලදී, හිමිකම්පෑම් උද්ධමනයේ අනාගත අනුපාත හෝ අලාභ අනුපාත සම්බන්ධයෙන් උපකල්පන සිදු කරනු ලබයි. ඒ වෙනුවට, භාවිතා කළ උපකල්පන යනු ප්‍රක්ෂේපණ පදනම් වූ ඓතිහාසික හිමිකම් සංවර්ධන දත්ත තුළ ගම්‍යමාන උපකල්පනය වේ.

අමතර ගුණාත්මක විනිශ්චයන් භාවිතා කරනු ලබන්නේ සම්බන්ධිත සියලුම අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින් සිදුවිහැකි ප්‍රතිඵල රාශියකින් සිදුවියහැකි ප්‍රතිඵලය ඉදිරිපත් කරන හිමිකම්වල ඇස්තමේන්තුගත අවසාන පිරිවැය ගණනය කිරීම පිණිස පසුගිය ප්‍රවණතා අනාගතය (නිදසුනක් ලෙස. හිමිකම් සඳහා ජනතා ආකල්ප, ආර්ථික කොන්දේසි, හිමිකම්වල උද්ධමන මට්ටම්, අධිකරණ තීරණ සහ නීතිකරණ වැනි බාහිර හෝ වෙළෙඳපොල සාධකවල වෙනස්වීම්වල එක් සිදුවීමක් පිළිබිඹු කිරීමට) මෙන්ම කළඹ තුළ මුසුව, ඔප්පුවල ලක්ෂණ සහ හිමිකම් මෙහෙයවන ක්‍රියාපටිපාටි වැනි අභ්‍යන්තර සාධක තුළ භාවිතා කළ නොහැකි ප්‍රමාණය තක්සේරු කිරීමටය.

සමාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන නොඉපයූ වාරික සඳහා වෙන්කිරීමේ ප්‍රමාණාත්මතාව අගය කිරීමේදී යොදා ගනු ලැබේ. එමෙන්ම, ගිවිසුමක් මගින් ලබාදෙනලද රක්ෂණ සේවාවේ රටාව කාල අනුපාතනය කිරීම නොවන පදනමක් මත නොඉපයූ වාරික ක්‍රමක්ෂයකරණය අවශ්‍යද යන්න තීරණය කිරීමේදී විනිශ්චයන් අවශ්‍ය වේ.

සියලුම පොදු රක්ෂණ ගිවිසුම් වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයකට (LAT) යටත් වේ. සිංගප්පූරුව, එන්එම්ජී මූල්‍ය සේවා පුද්ගලික උපදේශන සමාගම විසින් LAT සිදුකරන ලදී.

රක්ෂණ සමාගම්වලට ගෙවියයුතු ශේෂ ප්‍රතිරක්ෂණ වගකීම් නියෝජනය කරයි. ප්‍රතිරක්ෂණ වත්කම් හෝ වගකීම් ගිවිසුම්ගත හිමිකම් ශුන්‍යවන හෝ කල්පිරෙන අවස්ථාවේදී හෝ ගිවිසුම වෙනත් පාර්ශ්වයකට මාරු කරන අවස්ථාවේදී හඳුනානොගනී.

| මාර්තු මස 31 වන දිනට | සටහන | පිටු අංකය. | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| රක්ෂණ වගකීම් | 40.1 | 238 | – | – | **5,026,503** | 4,799,808 |
| ගෙවියයුතු ප්‍රතිරක්ෂණ | | | – | – | **38,717** | 81,065 |
| **එකතුව** | | | – | – | **5,065,220** | 4,880,873 |

## 40.1 රක්ෂණ වගකීම්

| මාර්තු මස 31 වන දිනට | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| හිඟව පවත්නා හිමිකම් වෙන්කිරීම | – | – | **1,462,009** | 1,353,366 |
| නොඉපයූ වාරික සඳහා වෙන්කිරීම (ශුද්ධ) | – | – | **3,564,494** | 3,446,442 |
| **එකතුව** | – | – | **5,026,503** | 4,799,808 |

## 41 කල්බදු වගකීම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගම කල්බද්දේ ආරම්භක දිනයේදී කල්බද්දේ කාලය තුළ සිදුකළ යුතු කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට මනින ලද කල්බදු වගකීම් හඳුනාගනී.

2019 අප්‍රේල් මස 1 වන දිනට කල්බදු බැඳීම්වල වර්තමාන අගය 12.45%ක බරතබනලද සාමාන්‍ය වර්ධනීය ණය අනුපාතය භාවිතයෙන් ගණනය කර ඇත.

සමූහය භාවිතයට අයිතිය ඇති වත්කම් සහ කල්බදු වගකීම් සඳහා ගිණුම්කරණයේදී SLFRS 16 අනුකූලව, වෙනස් කරන ලද අතීතානුයෝගී ප්‍රවේශය යොදා ගෙන ඇත.

| මාර්තු මස 31 වන දිනට | සටහන | පිටු අංකය. | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | | | – | – | – | – |
| 2019 අප්‍රේල් මස 1 වන දිනට SLFRS 16 යොදා ගැනීම මත බලපෑම | | | **2,080,315** | – | **1,547,546** | – |
| | | | **2,080,315** | – | **1,547,546** | – |
| වසර තුළ කල්බදු ගිවිසුම් එකතුකිරීම/අඵත්කිරීම | | | **206,943** | – | **206,943** | – |
| පොළිය වර්ධනය | 6.2 | 165 | **238,581** | – | **183,724** | – |
| කල්බදු ණයකරුවන්ට ගෙවීම් | | | **(616,741)** | – | **(343,968)** | – |
| වසර තුළ කල්බදු ගිවිසුම් කල්පිරීම | | | – | – | – | – |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | | | **1,909,098** | – | **1,594,245** | – |

## 42 ප්‍රවර්තන බදු වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමූහය සහ සමාගම මූල්‍ය සේවා මත VAT සහ NBT ඇතුළුව ආදායම් බදු සහ වෙනත් බදුවලට යටත් වේ. සැලකියයුතු ගැලපීම් ප්‍රවර්තන, විලම්බිත සහ අනෙකුත් බදු සඳහා මුළු වෙන්කිරීම තීරණය කිරීමට අවශ්‍ය වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන අවස්ථාවේදී, බදු නීතිය යොදා ගැනීම පිළිබඳ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් අවිනිශ්චිතතා තිබුණි.

සමූහය සහ සමාගම අමතර බදු ගෙවීමට සිදුවන්නේද යන්න ඇස්තමේන්තු මත පදනම් වී වර්තන, විලම්බිත සහ අනෙකුත් බදු සඳහා වත්කම් සහ වගකීම් හඳුනාගනී. මෙම කාරණා පිළිබඳ අවසාන බදු ප්‍රතිඵලය මූලිකව වාර්තා කරන ලද ප්‍රමාණයෙන් වෙනස් වන අවස්ථාවේදී, එවැනි වෙනස්වීම් තීරණය කිරීම සිදුකරන කාලසීමාව තුළ ආදායම් බදු, විලම්බිත බදු ප්‍රමාණ මත බලපානු ඇත.

| මාර්තු මස 31 වන දිනට | සටහන | පිටු අංකය. | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|---|---|
| ගෙවියයුතු ප්‍රවර්තන බදු | 42.1 | 239 | **1,803,309** | 2,238,257 | **2,077,418** | 2,323,647 |
| **එකතුව** | | | **1,803,309** | 2,238,257 | **2,077,418** | 2,323,647 |

### 42.1 ප්‍රවර්තන බදු වගකීම්

| මාර්තු මස 31 වන දිනට | සමාගම 2020 රු. '000 | සමාගම 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | **2,238,257** | (89,849) | **2,323,647** | 62,673 |
| වසර තුළ වෙන්කිරීම | **2,822,836** | 3,442,009 | **3,259,538** | 3,601,824 |
| පසුගිය වසර සම්බන්ධයෙන් අඩුවෙන්/ (වැඩිපුර) වෙන්කිරීම | **–** | (90,583) | **(781)** | (90,046) |
| ආදායම් බදු ගෙවීම | **(3,071,709)** | (805,705) | **(3,339,472)** | (907,945) |
| බදු බැර | | | | |
| WHT/වෙනත් ණය | **(18,416)** | (21,552) | **(18,416)** | (106,898) |
| ආර්ථික සේවා ගාස්තුව | **(141,084)** | (196,063) | **(147,098)** | (235,961) |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | **1,803,309** | 2,238,257 | **2,077,418** | 2,323,647 |

### 42.2 ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (ESC) පනතේ විධිවිධාන එයට සිදුකළ සංශෝධන පරිදි, නිදහස් පිරිවැටුම" මත 0.5%ක් ESC ගෙවිය යුතු අතර ආදායම් බදු ගෙවීම්වලින් අඩුකළ යුතුය. හිමිකම් නොකියවූ ESC (ඇත්නම්) ඉදිරියට ගෙන යා හැකි අතර ඉදිරි වසර තුන තුළ ගෙවියයුතු ආදායම් බදුවලින් හිලව් කරනු ලබයි. පනතට සිදුකළ සංශෝධනයකින් 2020 ජනවාරි මස 1 වන දින සිට ESC අවලංගු කරන ලදී.

### 42.3 ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු මත රඳවා ගැනීමේ බදු (WHT)

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 137 වගන්තිය සහ එයට සිදුකළ සංශෝධන පරිදි, සමාගමක් ගෙවීම සිදුකරන හෝ ගිණුමට බැරකරන අවස්ථාවේදී වාර්ෂිකව 10% බැගින් අඩුකර ඇති WHT මත ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම් පොළී ආදායම සිදුකරන ලදී. මෙම බදු අඩුකිරීම ආදායම් බදු ගෙවීම්වලට බදු බැර ලෙස හිමිකම් කිව හැක. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වගන්තිය පරිදි, පුද්ගලයෙක්ට ගෙවන ලද පොළී හෝ වට්ටම් මත WHT 2018 අප්‍රේල් මස 1 වන දින සිට 5% දක්වා අඩුකරන ලදී.

## 43 – විලම්බිත බදු වගකීම්/(වත්කම්)

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

විලම්බිත බදු වත්කම් සහ වගකීම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා ඒවායේ ධාරණ අගය අතර වාර්තාකරන දිනයට තාවකාලික වෙනස්වීම් මත ලබා දේ. විලම්බිත බදු වගකීම් පහත දෑ හැර සියලුම බදුකළහැකි තාවකාලික වෙනස්වීම් සඳහා හඳුනාගනී:

- විලම්බිත බදු වගකීම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක් තුළ කීර්තිනාමය හෝ වත්කමක් හෝ වගකීමක් මූලික හඳුනාගැනීමේ සිට ඇති වන අවස්ථාව, සහ ගිණුම්කරණ ලාභයට හෝ බදුකළ හැකි ලාභයට හෝ අලාභයට බලපෑමක් නොවන ගනුදෙනු අවස්ථාවත සහ
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා බැඳුණු බදුකළ හැකි තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්වීම් ආපසුහැරවීමේ කාලය පාලනය කළ නොහැකි සහ තාවකාලික වෙනස්වීම් දැකියහැකි අනාගතය තුළ ආපසු හැරවිය නොහැකි අවස්ථාව

විලම්බිත බදු වත්කම් සියලුම අඩුකළහැකි තාවකාලික වෙනස්වීම්, ඉදිරියට ගෙනා භාවිතා නොකළ බදු බැර සහ භාවිතා නොකළ බදු සඳහා අඩුකළහැකි තාවකාලික වෙනස්වීම් අනුව බදුකළහැකි ලාභය ලබාගතහැකිවන ප්‍රමාණයට හඳුනාගන්නා අතර, ඉදිරියට ගෙනා භාවිතා නොකළ බදු බැර සහ භාවිතා නොකළ බදු පහත අවස්ථා හැර භාවිතා කළ හැකිය:

- අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම්වලට අදාළව විලම්බිත බදු වත්කම් ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක් තුළ වත්කමක් හෝ වගකිමක් මූලික හඳුනාගැනීමේ සිට ඇතිවන අවස්ථාව, සහ ගිණුම්කරණ ලාභයට හෝ බදුකළ හැකි ලාභයට හෝ අලාභයට බලපෑමක් නොවන ගනුදෙනු අවස්ථාවත සහ
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා බැඳුණු අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්වීම් දැකියහැකි අනාගතය තුළ ආපසුහැරවීය හැකි සහ බදුකළ හැකි ලාභය තාවකාලික වෙනස්වීම් භාවිතා කිරීමට අනුව ලබාගතහැකි ප්‍රමාණයට විලම්බිත බදු වත්කම් හඳුනාගන්නා අවස්ථාව.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය එක් එක් වාර්තා කරන දිනයට සමාලෝචනය කරන අතර, විලම්බිත බදු වත්කම සම්පූර්ණයෙන් හෝ කොටසක් භාවිතා කිරීමට ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදුකළ හැකි ලාභය ලබාගතහැකිවීම තවදුරටත් නොහැකිවන ප්‍රමාණයට අඩුකරයි. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් එක් එක් වාර්තා කරන දිනයට ප්‍රත්‍යාගණනය කරන අතර, අනාගත බදුකළ හැකි ලාභය විලම්බිත බදු වත්කම අයකරගැනීමට ඉඩදියහැකි බවට පත්වන ප්‍රමාණයට හඳුනාගනී.

විලම්බිත බදු වත්කම් සහ වගකිම් වාර්තා කරන දිනයට පනවා ඇති හෝ පසුව පනවනු ලැබූ බදු අනුපාත (බදු නීති) මත පදනම් වී වත්කම මුදාහරින හේ වගකීම් නිරවුල් කරන වසර තුළ යොදා ගැනීමට අපේක්ෂිත බදු අනුපාතවලට අගය කරනු ලබයි.

ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගන්නා අයිතමයන්ට අදාළ වර්තන බදු සහ විලම්බිත බදු ලාභාලාභ ප්‍රකාශනය තුළ නොව ස්කන්ධය තුළ හඳුනාගනී.

විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකිම් හිලව් කරනු ලබන්නේ එකම බදුකළ හැකි ආයතනයට සහ එකම බදුකරණ අධිකාරියට අදාළ වර්තන බදු වගකීම් සහ විලම්බිත බදු වර්තන බදු වත්කම් හිලව්කිරීමට නීතියෙන් බලාත්මක හිමිකම පවතීනම් පමණි.

| මාර්තු මස 31 වන දිනට | සටහන | පිටු අංකය. | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | **2020 රු. '000** | 2019 රු. '000 | **2020 රු. '000** | 2019 රු. '000 |
| වත්කම් යටතේ හඳුනාගත් | 43.1 | 241 | **(376,291)** | – | **(471,841)** | (47,584) |
| වගකීම් යටතේ හඳුනාගත් | 43.1 | 241 | **–** | 837,179 | **418,132** | 1,141,973 |
| **විලම්බිත බදු වගකීම්/(වත්කම්)** | 43.1 | 241 | **(376,291)** | 837,179 | **(53,709)** | 1,094,389 |

හිලව්කිරීම සඳහා නීතියෙන් බලාත්මක හිමිකම නොමැති බැවින් එක් ආයතනයක ශුද්ධ විලම්බිත බදු වත්කම්/වගකිම් වෙනත් ආයතනයක වත්කම්/වගකීම් අනුව හිලව් කිරීමට නොහැක. එමනිසා, විවිධ ආයතනවල ශුද්ධ විලම්බිත බදු වත්කම් සහ වගකිම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වෙන වෙනම හඳුනාගනී.

## 43.1 විලම්බිත බදුවල වෙනස්වීම්

| මාර්තු මස 31 වන දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2020 රු. '000 | 2019 රු. '000 | 2020 රු. '000 | 2019 රු. '000 |
| අප්‍රේල් මස 1 වන දිනට ශේෂය | **837,179** | 2,275,868 | **1,094,389** | 2,310,652 |
| සංක්‍රාන්තිමය ගැලපීම මත විලම්බිත බදු | **–** | (250,729) | **–** | (266,494) |
| වසර සඳහා අයකිරීම | **(1,213,519)** | (1,182,290) | **(1,148,189)** | (935,741) |
| විස්තරාත්මක ආදායම ප්‍රකාශනයේ සංරචකවලට අදාළ විලම්බිත බදු අයකිරීම | **49** | (5,670) | **91** | (14,028) |
| **මාර්තු මස 31 වන දිනට ශේෂය** | **(376,291)** | 837,179 | **(53,709)** | 1,094,389 |

| 2020 මාර්තු මස 31 වන දිනට | සමාගම | | | | | සමූහය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විලම්බිත බදු වත්කම් රු. '000 | විලම්බිත බදු වගකීම් රු. '000 | ලාභාලාභ ප්‍රකාශනය රු. '000 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය රු. '000 | ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය රු. '000 | විලම්බිත බදු වත්කම් රු. '000 | විලම්බිත බදු වගකීම් රු. '000 | ලාභාලාභ ප්‍රකාශනය රු. '000 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය රු. '000 | ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය රු. '000 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 166,020 | – | (28,087) | (49) | – | 176,625 | – | (36,483) | (91) | – |
| ඉදිරියට ගෙනා බදු අලාභ | – | – | – | – | – | 227 | – | 13,158 | – | – |
| ණය සහ ලැබීම් සඳහා හානිකරණ දීමනාව | 1,933,299 | 439,714 | (589,257) | – | – | 1,998,246 | 440,392 | (660,265) | – | – |
| සංක්‍රාන්තිමය ගැලපීම් මත විලම්බිත බදු | 250,729 | – | – | – | 250,729 | 266,494 | – | – | – | 266,494 |
| බදු අරමුණ (කල්බදු) සඳහා වේගය වැඩිකළ ක්ෂයකිරීමේ දීමනාව | – | 1,487,393 | (596,118) | – | – | – | 1,487,393 | (596,118) | – | – |
| බදු අරමුණ සඳහා වේගය වැඩිකළ ක්ෂයකිරීමේ දීමනාව (PPE) | – | 4,488 | (57) | – | – | – | 131,656 | 11,659 | – | – |
| SLFRS 16 මත විලම්බිත බදු | – | 42,162 | – | – | – | 5,763 | 42,162 | 36,399 | – | – |
| සාධාරණ අගයේ ලාභ/අලාභ – සින්නක්කර ගොඩනැගිලි | – | – | – | – | – | – | – | 42,155 | – | – |
| සාධාරණ අගයේ ලාභ/අලාභ – ආයෝජන දේපල | – | – | – | – | – | 41,073 | 333,116 | 41,306 | – | – |
| **එකතුව** | **2,350,048** | **1,973,757** | **(1,213,519)** | **(49)** | **250,729** | **2,488,428** | **2,434,719** | **(1,148,189)** | **(91)** | **266,494** |
| වසර සඳහා ලාභය හෝ අලාභය සහ අනෙකුත් විස්තරාත්මක ආදායම | – | – | (1,213,519) | (49) | – | – | – | (1,148,189) | (91) | – |
| ස්කන්ධය යටතේ හඳුනාගත් | – | – | – | – | 250,729 | – | – | – | – | 266,494 |
| වත්කම් යටතේ හඳුනාගත් | – | (376,291) | – | – | – | – | (471,841) | – | – | – |
| වගකීම් යටතේ හඳුනාගත් | – | – | – | – | – | – | 418,132 | – | – | – |
| **මාර්තු මස 31 වන දිනට ශුද්ධ විලම්බිත බදු වගකීම** | – | (376,291) | – | – | – | – | (53,709) | – | – | – |

| 2019 මාර්තු මස 31 වන දිනට | සමාගම | | | | | සමූහය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විලම්බිත බදු වත්කම් රු. '000 | විලම්බිත බදු වගකීම් රු. '000 | ලාභාලාභ ප්‍රකාශනය රු. '000 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය රු. '000 | ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය රු. '000 | විලම්බිත බදු වත්කම් රු. '000 | විලම්බිත බදු වගකීම් රු. '000 | ලාභාලාභ ප්‍රකාශනය රු. '000 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය රු. '000 | ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය රු. '000 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 137,884 | – | (22,160) | (5,670) | – | 140,042 | – | (6,583) | 14,028 | – |
| ඉදිරියට ගෙනා බදු අලාභ | – | – | – | – | – | 13,385 | – | 13,238 | – | – |
| ණය සහ ලැබීම් සඳහා හානිකරණ දීමනාව | 868,209 | 5,945 | (430,436) | – | – | 903,724 | 5,945 | (444,376) | – | – |
| සංක්‍රාන්තිමය ගැලපීම් මත විලම්බිත බදු | 250,729 | – | – | – | 250,729 | 266,494 | – | – | – | 266,494 |
| බදු අරමුණ (කල්බදු) සඳහා වේගය වැඩිකළ ක්ෂයකිරීමේ දීමනාව | – | 2,083,511 | (635,299) | – | – | – | 2,083,511 | (635,299) | – | – |
